අංක 21
2023 කලාපය

# සමාජ විමසුම

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# සමාජ විමසුම

## කලාප අංක 21, 2023

*සංස්කරණය*

*උපාලි වීරකෝන්*

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පේරාදෙණිය

© සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව - 2023 පේරාදෙණිය විශ්වවිද්‍යාලය පේරාදෙණිය, ශ්‍රී ලංකාව

ISBN 978-624-5709-37-3 (විද්‍යුත් සඟරාව)

ISSN : 2012-7308 (මුද්‍රිත සඟරාව)

© සියලු හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය හෝ මෙහි කොටසක් හෝ ප්‍රකාශකයාගේ පූර්ව අනුමැතියකින් තොරව නැවත පිටපත් කිරීම හෝ විද්‍යුත් මාධ්‍යයෙන් පළකිරීම සපුරා තහනම් වේ.

මෙහි පළවන ලිපි ලේඛනයන්හි අන්තර්ගත අදහස් ඒ ඒ ලේඛකයාගේ නිදහස් මතවාදයන් බව සලකන්න. එම අදහස් අවශ්‍යයෙන් ම සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව හෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය නො කෙරේ.

## සංස්කාරක සටහන

සමාජ විද්‍යාව අද්‍යතන සමාජයේ විෂය පථ රැසක භාවිත වන විෂයයකි. එහෙයින් සමාජීය විද්‍යා විෂය අංශ වල පමණක් නොව ස්වභාවික විද්‍යා සහ සෞන්දර්ය විද්‍යා විෂය ක්ෂේත්‍රයන් හී දැනුමෙ හි නිම් වළලු පුළුල් කරනු වස් සමාජ විද්‍යාව විෂයයෙන් ලබා දෙන ශාස්ත්‍රීය දායකත්වය අතිශය උත්කෘෂ්ට වු එකකි. බොහොමයක් දුරට න්‍යායාත්මක තලයේ හිඳිමින් අධ්‍යයනය කෙරෙන විෂය ප්‍රස්තුතයන් ප්‍රායෝගික තලයට රැගෙන විත් ඒවා පර්යේෂණාත්මක විශ්ලේෂණයන් ට විචක්ෂණභාවයෙන් යුතුව විග්‍රහ කිරීම සහ එමඟින් යථාර්ථවාදී නිගමන වලට පිවිසීම සමාජ විද්‍යාව විෂයයෙන් සිදුවන අනභිභවනීය වු මෙහෙවරකි.

එවන් වු අධ්‍යයන මෙහෙවරෙහි තවත් සංධිස්ථානයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් 1980 දශකයේ සිට වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ‟සමාජ විමසුම" සඟරාව අවිවාදයෙන් යුතුව පිළිගත හැකි එකකි.

මෙතෙක් මුද්‍රණද්වාරයෙන් එළිදැක්වුණු මෙම මාහැඟි ශාස්ත්‍රීය සඟරාවේ 21 වල කලාපය විද්‍යුත් සඟරාවක් ලෙස දෙවන වරටත් ඔබ අතට පත් වේ. සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රවල විවිධ අංශ අළලා සිදුකරනු ලැබු පර්යේෂණාල ගවේෂණ හා ශාස්ත්‍රීය විචාර වලින් සමුච්චිත ලිපි 8ක් මෙම කලාපයේ අන්තර්ගත ය. නව ශාස්ත්‍රීය දැනුම සොයන විද්‍යාර්ථයින්ට පමණක් නොව සාමාන්‍ය පාඨකයාට ද මෙම සඟරාවෙන් ලබා දෙන නව දැනුම ඉමහත් සේ ප්‍රයෝජනවත් වනු නිසැක ය. එබැවින් මෙවැනි ශාස්ත්‍රීය කර්තව්‍යයක් උදෙසා නිරන්තරයෙන් කැපවීම් සිදුකරන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව ඇඳුරු මඩුල්ලටත්ල ලිපි සපයා දුන් සැමටත්ල විද්‍යුත් සඟරාවක් ලෙස පළ කිරීමට සහාය ලබා දුන් අනධ්‍යයන සේවක සැමටත් මාගේ භක්ත්‍යාදර කෘතඥතාව හිමිවේ.

**සංස්කාරක**

**උපාලි වීරකෝන්**

# පටුන

බුදු දහමේ ලෞකිකකරණයඃ කොළඹ නගරයේ මහාමාර්ග ආශ්‍රිතව පිහිටුවා ඇති බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීම පිළිබඳ මානවවංශලේඛික අධ්‍යයනයක්

**ඇන්ටන් පියරත්න** **01 - 31**

අසම්මතයේ සම්මතයඃ වතු කම්කරු ප්‍රජාවේ බහුවිවාහක සම්බන්ධතා නිර්මාණයට බලපෑ උපසංස්කෘතික පදනම

**එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර සහ සී. පී. රාජකරුණා** **32 - 66**

සිංහල බෞද්ධ මතවාදය තුළ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාවඃ පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ භික්ෂූන්ගේ සමාජ-දේශපාලන ක්‍රියාකාරකම් ඇසුරින්

**නිශාන්ත හෙට්ටිආරච්චි** **67 - 112**

ස්ත්‍රීත්වය නිරූපිත උපදේශාත්මක ජනශ්‍රැති වත්මන් මානව සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතාව

**විමල්සිරි මුණසිංහ** **113 - 155**

ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ පාරිසරික සංජානන විෂමතා පිළිබඳ අධ්‍යයනය

**ජේ. එන්. ඩී. ජයතුංග සහ**

**එස්. යූ. කේ. ඒ. එන්. සුහර්ශන** **156 - 211**

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදය වී වගාකරුවන්ට ඇති කරන ලද සමාජ, ආර්ථික බලපෑම.

**එන්. පී. පෙරේරා සහ පී. කොඩිතුවක්කු** **212 - 269**

සමාජ වැඩ හා පද්ධති න්‍යාය

**ඕමල්පේ සෝමානන්ද හිමි** **270 - 289**

අද්‍යතන පවුල් සංස්ථාවෙහි මාතෘ භූමිකාව සහ සිංහල ගීතයඃ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්

**ඩබ්ලිව්. එම්. නදීශා දර්ශනී වීරසිංහ** **290 - 341**

# ලේඛකයෝ


## ඇන්ටන් පියරත්න

*බී.ඒ. (කොළඹ), එම්.ඒ. (කොළඹ), පී. එච්. ඩී. (Macquarie University-ඕස්ට්‍රේලියාව) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය*

## එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර[1], සී. පී. රාජකරුණා[2]

*1 බී.ඒ. (රුහුණ), එම්.ඒ. (පේරාදෙණිය), එම්. ඒ. (කැළණිය), එම්. ෆිල් (රුහුණ) පී. එච්. ඩී. (රුහුණ) රුහුණු විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය*

*2 බී. එස්. සී. (කොළඹ), එම්. ඒ. (රුහුණ), ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම්*

## නිශාන්ත හෙට්ටිආරච්චි

*බී. ඒ. (පේරාදෙණිය), එම්. ෆිල් (පේරාදෙණිය), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය*

## විමල්සිරි මුණසිංහ

*බී. එස්. ඒ. (කැළණිය), එම්. ඒ. (කැළණිය), එම්. ෆිල්. (UVPA කොළඹ), පී. එච්. ඩී. (UVPA කොළඹ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා අධ්‍යයන අංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය*

## ජේ. එන්. ඩී. ජයතුංග[1], එස්. යූ. කේ. ඒ. එන්. සුහර්ශන[2],

*1 බී. ඒ. (කොළඹ) එම්. එස්. සී. (මොරටුව) කොළඹ විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය*

*2 (බී. ඒ.) කොළඹ විශ්ව විද්‍යාලය*

## එන්. පී. පෙරේරා[1], පී. කොඩිතුවක්කු[2]

*1 බී.ඒ. (රුහුණ), රුහුණු විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ සහය කථිකාචාර්ය*

*2 (බී.ඒ.) රුහුණු විශ්ව විද්‍යාලය*

## ඕමල්පේ සෝමානන්ද හිමි

*බී.ඒ. (බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), එම්.එස්. ඩබ්ලිව්. (බැංගලෝර්), පී. එච්. ඩී. (Shukutoku University- ජපානය) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය*

## ඩබ්ලිව්. එම්. නදීශා දර්ශනී වීරසිංහ

*බී. ඒ. (කොළඹ), රුහුණු විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාර්ය*

# බුදු දහමේ ලෞකිකකරණය: කොළඹ නගරයේ මහාමාර්ග ආශ්‍රිතව පිහිටුවා ඇති බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීම පිළිබඳ මානවවංශලේඛික අධ්‍යයනයක්

ඇන්ටන් පියරත්න

## හැදින්වීම

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුළ ගමන් කරන ඕනෑම අයෙකුට ප්‍රධාන මාර්ගයන්හි, හන්දි ආශ්‍රිතව" දුම්රිය ස්ථාන අසල, උද්‍යාන, රෝහල්, පාසල්, රජයේ කාර්යයාල සහ වෙනත් විවිධ පොදු ස්ථානවල කුඩා බෞද්ධ, කතෝලික සහ හින්දු සිද්ධස්ථාන සංඛ්‍යාව වැඩි වීම නිසැකවම නිරීක්ෂණය කරනු ඇත. කොළඹ නගරයද මෙම විවිධ ආගමික විශ්වාසවලට අනුබද්ධ කුඩා සිද්ධස්ථාන ඉදිකිරීමේ ප්‍රවණතාවයට ව්‍යතිරේකයක් නොවේ. මෙම කුඩා සිද්ධස්ථාන බුදුරජාණන් වහන්සේගේ, හින්දු දෙවිවරුන්ගේ හෝ කතෝලික සාන්තුවරයන්ගේ පිළිම වලින් සමන්විත වේ. 2009 වසරේ මෙම කුඩා පූජනීය ස්ථානයන් නිරීක්ෂණය කිරීමේදී කතුවරයාගේ සිතට නැගුණු ප්‍රශ්න කිහිපයක් නම්: මෙම සිද්ධස්ථාන හුදකලාව පවතින්නේ ද? මිනිසුන් මෙසේ මාර්ගය අසල සිද්ධස්ථාන ඉදිකිරීමට පෙළඹෙන්නේ කුමක් නිසාවෙන් ද? ඒවා එසේ පවතින්නේ ඇයි? මිනිසුන් හට මෙම සිද්ධස්ථාන වලින් ලැබෙන ප්‍රයෝජනයන් මොනවාද? මෙම සිද්ධස්ථාන සංවර්ධනය පිටුපස සිටිනා මිනිසුන් කවුරුන්ද? කොහොමද මෙම සිද්ධස්ථාන දියුණු වෙන්නේ? යන්නයි. මෙම ප්‍රශ්නයන් නගරවාසීන්ගේ ආගමික හැසිරීම් සහ සමාජ සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් අවබෝධ කර ගැනීම සඳහා ඉතා ප්‍රයෝජනවත් විය. මෙම පසුබිම පාදක කර ගනිමින් කතුවරයා විසින් වත්මන් පර්යේෂණය සිදු කරනු ලැබුවේ නගර වැසියන් කොළඹ මාර්ගය අසල සිද්ධස්ථාන ඉදිකර වන්දනාමාන කිරීමට හේතුව සහ එය සිදුවන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමට සහ නැගී එන විකල්ප ආගමික පිළිවෙත් හඳුනා ගැනීම අරමුණු කර ගෙනය. මේ අශ්‍රිත මානවවංශලේඛික දත්ත (ethnographic data) එකතු කිරීම 2009 වර්ෂයේදී සහ එයට හරියටම වසර 10 කට පසුව 2019 වර්ෂයේදී ද සිදු විය. ප්‍රථමයෙන්ම

කුඩා ප්‍රශ්නාවලියකට ප්‍රතිචාර දැක්වූවන් පාදක කොටගෙන මූලික සමාජ-ආර්ථික දත්ත එකතු කරන ලදී. ඉන් අනතුරුව, පුද පූජා රටාවේ ස්වභාවය සහ මාර්ගය අසල සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට හේතුසාධකයන් පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා පුද්ගලයන් සමඟ තනි තනිව සහ කණ්ඩායම් වශයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මීට අමතරව, පර්යේෂක කණ්ඩායම ක්‍රියාවලියන් පිළිබඳව සහභාගීත්ව විශ්ලේෂණයක් ලබා ගැනීම උදෙසා අදාළ කමිටු විසින් සංවිධානය කරන ලද විවිධ ප්‍රජා ක්‍රියාකාරකම් සහ ආගමික ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය. තවද, පර්යේශණ කණ්ඩායම් සාමාජිකයන් විවිධ පාර්ශවයන් මෙම වන්දනාමානයන්හි නියැලෙන ආකාරය නිරීක්ෂණය කිරීම තුළින් විවිධ වන්දනාමාන රටාවන්, බැතිමතුන්ගේ ස්වභාවයන් ආදී කරුණු නිරීක්ෂණය කරන ලදි. සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සහ වෘත්තාන්තයන් විශ්ලේෂණය කරන ලද අතර එමගින් මෙම කුඩා සිද්ධස්ථාන ආශ්‍රිතව බැතිමතුන්ගේ ආගමික හැසිරීම් තුළ පවත්නා පොදු තේමාවන් එකතු කර ගැනීමට හැකි විය. බොහෝ විට එකම සිද්ධස්ථානය පර්යේෂණ අවස්ථා දෙකේදීම නිරීක්ෂණය කරන ලදී.

මෙම පර්යේෂණ පත්‍රය කොළඹ නගරයේ නාගරික වැසියන් මාර්ගය අසල ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම සහ ඒවාට වන්දනාමාන කිරීමේ අරමුණු සහ ක්‍රමවේදයන් හඳුනා ගැනීමටත්, විකල්ප නව ආගමික පිළිවෙත් හඳුනාගැනීම පිළිබඳවත් අවධානය යොමු කරයි. මෙම පර්යේෂණ පත්‍රය ආරම්භ වන්නේ කොළඹ නගරයේ බහු සංස්කෘතික ස්වභාවය පිළිබඳ කෙටි හැඳින්වීමකින් ය. ඕනෑම අයෙකු හට නාගරික ආගමික සම්ප්‍රදායන් ග්‍රහණය කර ගැනීමට පහසු වීම සඳහා කුඩා සිද්ධස්ථාන පිළිබඳ විස්තරයක් මීළඟ කොටසෙන් විස්තර කරන අතර ඊට පසු සිද්ධස්ථානයන් හි සංවර්ධනය සහ පැතිරීම ක්‍රියාවලියේදී බෝ ගසෙහි කාර්යභාරය පිළිබඳ විවේචනාත්මක සාකච්ඡාවක් හා සම්බන්ධ වේ. ඉන් පසු, මෙම පර්යේෂණ පත්‍රය නගරය, ආගම සහ නගරයෙහි මිනිස් ගැටළු හා සම්බන්ධ වූ න්‍යායාත්මක පසුබිම පිළිබඳව අවධානය යොමු කරයි. අවසාන වශයෙන් මෙම පර්යේෂණ පත්‍රය මිනිසුන් ආගමික සිද්ධස්ථාන ඉදිකර ඒවාට වන්දනාමාන කිරීමට හේතුව සහ එය

සිදුවන්නේ කෙසේද යන්න  කෘත්‍යවාදී දෘෂ්ටිකෝණයකින් න්‍යායාත්මකව පැහැදිලි කිරීමට උත්සහ දරයි.

## කොළඹ නගරයේ බහු සංස්කෘතික ස්වභාවය

කොළොම්බො (Colombo) ලෙස ඉංග්‍රීසි බසින් හා කොළුම්බූ (கொழும்பு) ලෙස දෙමළ බසින් හඳුන්වනු ලබන කොළඹ නගරය දිගුකාලීන යටත්විජිත උරුමකමකට හිමිකම් කියන අතර විවිධ වාර්ගික, ආගමික, සංස්කෘතික හා සමාජ කණ්ඩායම් වලින් යුක්ත මිලියනයකට ආසන්න ජන කොට්ටාශයකගේ නිවහන වේ. කොළඹ මහ නගර සභාව (කො.න.ස.) වර්ග කිලෝමීටර් 37.5 ක ප්‍රදේශයක පැතිරී ඇති අතර තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවත්නා ග්‍රාම නිලධාරී වසම් 35 කින් හා කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවත්නා ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වන අතර 2012 ජන හා නිවාස සංගණන අවසන් වාර්තාවට අනුව විවිධ ජනවාර්ගික පසුබිම් නියෝජනය කරන පුද්ගලයින් 561,314 කින් සමන්විත වේ. ඊට අමතරව කොළඹ නගරයට දෛනිකව රැකියාව සඳහා විවිධ ජනවාර්ගික ආගමික පසුබිම් වලින් යුක්ත පුද්ගලයින් 500,000 ට ආසන්න ප්‍රමාණයක් පැමිනේ . කොළඹ නගරය බහු ආගමික ජන කොට්ටාශයකට  වාසස්ථානය වේ. 2012 වසරේ කරන ලද සංගණනයකට  අනුව, 1,632,225 (70.2%) බෞද්ධයන්, 186,454 (8.0%) හින්දූ, 274,087 (11.8%) මුස්ලිම්වරු, 162,314 (7.0%) රෝමානු කතෝලිකයන්, 66,994 (2.9%) කිතුනුවන් සහ 2,275 (0.1%) අනෙකුත් ආගමික අනුගාමිකයන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත් වේ.  කොළඹ මහ නගර සභා නිළ වෙබ් අඩවියෙහි වාර්තා කර ඇති පරිදි නේවාසික දේපල 106,068ක් සමඟින් ද, වාණිජ දේපල 35,604 ක් සහ රජයේ දේපළ 155,501 ක මුළු දේපළකින් යුක්තව රු. බිලියන 16.9ක වාර්ෂික අයවැයකින් යුක්ත වේ. කොළඹ නගරවාසීන් ප්‍රධාන වශයෙන් දෙමළ සහ සිංහල එදිනෙදා  සන්නිවේදනයන්හීදී භාවිත කරන අතර ඉංග්‍රීසි ද මෙරට නිල භාෂාවකි. ශ්‍රී ලාංකිකයන් සෑම විටම එක ආගමකට සීමා වන්නේ නැති අතර බොහෝ දුරට ආගමික සමමුහුර්තකරණයේ (religious syncretism) යෙදෙන්නන් වේ. ඔවුන් අන්‍යාගමික සිද්ධස්ථාන වෙත ගොස් තමන්ගේ අවශ්‍යතා සහ තත්ත්වයන්ට අනුකූලව වන්දනාමාන කර එම

ආගම්වලට ආවේණික අධ්‍යාත්මික බලවේගයන්ගෙන් උපකාරයන් ලබා ගැනීමට නැඹුරුවක් පෙන්වයි. උදාහරණ වශයෙන්, බහුතරයක් බෞද්ධයන් හින්දු කෝවිල් වන්දනාමාන කර එම හින්දු දේවස්ථානයන්හි දෙවි දේවතාවුන්ගේ ආශිර්වාදය අපේක්ෂා කරයි. 2019 පාස්කු ඉරිදා ඉස්ලාමීය ත්‍රස්තවාදී කණ්ඩායම විසින් දියත් කරන ලද හොඳින් සම්බන්ධීකරණ මරාගෙන මැරෙන ප්‍රහාරයක ඉලක්කයක් වූ පල්ලි තුනෙන් එකක් වූ කොළඹ කොච්චිකඩේ පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථනය සමෘද්ධිය සහ යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා බැතිමතුන්ගේ ආශාවන් ඉෂ්ට කිරීමට ප්‍රසිද්ධවීම හේතුවෙන් බෞද්ධ, මුස්ලිම්, හින්දු සහ අනෙකුත් බැතිමතුන්ගේ වන්දනමානයන්ට ලක්වූ සිද්ධස්ථානයකි. 2001 සහ 2012 සංගණන දත්ත සංසන්දනය කිරීමේදී කොළඹ, ශ්‍රී ලංකාවේ අගනුවර, බෞද්ධ නොවන ආගමික කණ්ඩායම්වල වර්ධනයක් ද නිරීක්ෂණය කළ හැකිය. කොළඹ නගරය ජනගහනය අධිකම නගරය බවට පත් වීමට බලපෑ හේතු රාශියක් ඇත. ඒවා අතුරින් වඩාත් වැදගත්කමක් දීමට හැකි වන්නේ දශක තුනක් පමණ කාලයක් තිබූ යුද්ධය, ග්‍රාමීය ප්‍රදේශ හා වතුකර ක්ෂේත්‍රය (estate sector) අතර පවතින ආර්ථික පීඩනය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාන ප්‍රදේශයන් හා සසඳන විට කොළඹ නගරයේ පවතින ආර්ථික සංවර්ධනය යන හේතු දැක්විය හැක. මෙම ජනවාර්ගික වෙනස "අප අනුගමනය කරන්නේ ආගමික බහුත්වවාදය ද (religious pluralism) නැතහොත් එය වෙනත් යමක් ද?" යන ප්‍රශ්නය ඇති කරයි.

## කුඩා බෞද්ධ සිද්ධස්ථානවල නෛසර්ගික ලක්ෂණයන්

මෙම සිද්ධස්ථාන කුඩා සිද්ධස්ථාන ලෙස හැඳින්වූව ද, ඒවාටම ආවේණික වූ විශාලත්වයන්ගෙන් යුක්ත වේ. සමහර සිද්ධස්ථානයන් ප්‍රමාණයෙන් ඉතා කුඩා වේ; අඩි 3-6 ක උස ප්‍රමාණයකින් යුක්ත කොන්ක්‍රීට් කනුවක් මත අඩි 2.5X2.5 වීදුරු පෙට්ටියක් තුළ තබා ඇති කුඩා බුදු පිළිමයක් විය හැක. පිටකොටුව (කොළඹ කොටුව), පුංචි බොරැල්ල, නාරාහේන්පිට සහ බොරැල්ල හංදිය යන ස්ථානයන්හි පිහිටි සිද්ධස්ථානයන් විශාලතම

සිද්ධස්ථානයන් සඳහා උදාහරණ ලෙස හැඳින්විය හැක. තවද, මෙම සිද්ධස්ථාන බොහොමයක් නගර සභාවේ, මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ අදාළ රාජ්‍ය බලධාරීන්ගේ අවසරයකින් තොරව බොහෝ විට රාත්‍රියක් හෝ රාත්‍රී කිහිපයක් ඇතුළත ඉතා කෙටි කාලයක් තුළ ඉදිකර තිබීම සාමාන්‍ය සංසිද්ධියකි. මෙම ක්‍රියාකලාපය පසුපස පවතින තර්කය නම් ඉදිකිරීම් සම්පූර්ණ කළ පසු එය මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හෝ වෙනත් කිසිදු පරිපාලන ආයතනයකට ඉවත් කිරීමට නොහැකි වූයේ එය සමාජය විසින් පවිකාර ක්‍රියාවක් ලෙස හෙලා දකින බැවිනි. එපමණක් නොව, නීත්‍යානුකූලභාවය පවතින අවස්ථාවන්හිදී වුවද ඒවා ඉවත් කිරීමට තැත් කිරීම මහජන උද්ඝෝෂණයන්ට තුඩු දිය හැකිය. මෙය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ පාලන සමයේදී පුංචි බොරැල්ලේ පිහිටි සිද්ධස්ථානය ඉවත් කිරීමට රජය විසින් දරන ලද උත්සාහයෙන් මනාව පැහැදිලි වේ. මෙම පර්යේෂණය සිද්ධස්ථාන 16ක් නියැදිය වශයෙන් තෝරාගත් අතර එයින් 10ක් පමණ 2001 වර්ෂයෙන් අනතුරුව ඉදිකරන ලදි. ඉන් එකක් ප්‍රසිද්ධ රජයේ පාසලක් ඉදිරිපස ඉදිකර ඇති අතර අනෙක් තුන 1980 සහ 1983 වර්ෂයන් අතර ඉදි කරන ලදි. මේවා අතුරින් පිටකොටුව, පුංචි බොරැල්ල සහ නාරාහේන්පිට සිද්ධස්ථානයන් දීර්ඝ ඉතිහාසයක් සහිත පැරණිම සිද්ධස්ථානයන් වේ. පිටකොටුවේ පිහිටි සිද්ධස්ථානයෙහි 1958 වර්ශයේ සිට සාර්ථක ලෙස දන්සැල් පැවත්වීම ආරම්භ කර ඇති අතර එහි දිගු ඉතිහාසය එමගින් පිළිඹිබු වේ. මෙම කාලය තුළ සිද්ධස්ථාන ඉදිකිරීමෙහි වර්ධනය සහ එකල හටගත් සමාජ ආර්ථික වෙනස්කම් පිළිබඳව සලකා බලන විට ඒවා එකිනෙකට යම් ආකාරයක සබඳතාවන් ඇති බව දක්නට ලැබේ. බර්ක්විට්ස් (2003,70); සඳහන් කරන ආකාරයට මෙම සිද්ධස්ථාන එකිනෙකට වෙනස් වූ නව ගෘහ නිර්මාණ ශිල්පයන්, ආලෝක හා ශබ්ද පද්ධති වැනි නව තාක්ෂණය උපයෝගී කර ඇති බවට සාක්ෂි දරයි. ආගමික පිළිවෙත් හැඩගස්වීම සඳහා නව තාක්ෂණයෙහි බලපෑම වඩා පුළුල් අර්ථයකින් මෙමගින් පෙන්වයි.

මෙම සිද්ධස්ථාන සංවර්ධනය කිරීම ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකිය. විවිධ හේතූන් මත විවිධ යුගයන්හි (different epochs) විවිධ පුද්ගලයින්

විසින් ඒවා ස්ථාපිත කර ඇත. පැරණි සිද්ධස්ථානයන් සහ අලුත් සිද්ධස්ථානයන් සන්දර්භයන් (context) දෙකක සංවර්ධනය කරන ලද අතර නව සිද්ධස්ථානයන් ත්‍රී රෝද රථ සංගම් හි සමාජ සේවයන් ලෙස ඉදිකරන ලදි. ත්‍රිරෝද රථ රියදුරන් තම වාහන නැවැත්වීමේ ස්ථාන ("පාක් එක") කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගය දෙපස මෙන්ම  දුර බැහැර ප්‍රදේශවල සෑම හන්දියක්ම පාහේ ස්ථාපිත කර තිබීම සාමාන්‍ය සංසිද්ධියකි. එක් අතකට ත්‍රිරෝද රථ නැවැත්වීමේ ස්ථානයන්ට ආසන්නව කුඩා සිද්ධස්ථාන ඉදිකිරීම හෝ ත්‍රිරෝද රථ රියදුරන් සිද්ධස්ථාන පිහිටුවීම සඳහා අනුග්‍රහය දැක්වීම තම ව්‍යාපාරික අවකාශය සුරක්ෂිත කර ගැනීමේ සාමකාමී ප්‍රයත්නයක් සහ පොදු ස්ථානවල තම පැවැත්ම සාධාරණීකරණය කර ගැනීමේ මාර්ගයක් ලෙස අර්ථ දැක්විය හැකිය. මෙම ඉදිකිරීම් ඔවුන්ගේ සමාජ හා ප්‍රජා ක්‍රියාකාරකම්වල (civic engagement) කොටසක් සලකනු ලබයි. බහුතරයක් පූජනීය ස්ථානයන් සාමූහික ප්‍රයත්නයක් ලෙස ගොඩනඟා ඇත්තේ බොහෝ දෙනෙකුගේ උදව් උපකාරයන් සහිතවය.

බොහෝ බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීමට දායකත්වය සපයා ඇත්තේ කොළඹ  නගරයේ අලුතින් දියුණු වූ මධ්‍යම පංතිය විසිනි. මෙම සිද්ධස්ථානයන්හී සංවර්ධනය පිළිබඳ හැදෑරීම කොළඹ නගරයේ සමාජ විකාශනය හා වෙනස්වීම විග්‍රහ කිරීමට  ප්‍රයෝජනවත් වනු ඇත. නාරාහේන්පිට, බොරැල්ල, පුංචි බොරැල්ල සහ රාජගිරිය ප්‍රදේශයන්හී පවතින සිද්ධස්ථානයන් මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය හා සම්බන්ධ කළ හැක. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි විසින් මෙහෙයවන ලද බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ආගම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කළ පුද්ගලයන්ගේ (imperialists)  සහයෝගයට එරෙහිව කොළඹ  නගරය තුළ බෝ පැල සිටවන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ස්ථානවල විවිධ පුද්ගලයන් විසින් පූජකවරුන්ගේ සහ දේශපාලනඥයන්ගේ  සහය ඇතිව සිද්ධස්ථාන සංවර්ධනය කර ඇත. නැගී එන මධ්‍යම පාංතිකයන්ගේ ද සහයෝගය ඇතිව පැරණි සිද්ධස්ථාන ද වැඩිදියුණු කිරීම සිදුවිය.

මැතකදී සංවර්ධනය කරන ලද සිද්ධස්ථානවලට ත්‍රිරෝද රථ සේවා සපයන්නන් වැනි නගරයේ සුළු ධනේශ්වර (petty bourgeoisie) පන්තියේ වැඩි සහයෝගයක් ලැබී ඇත. එමෙන්ම මෙම සිද්ධස්ථාන සංවර්ධනය සඳහා ප්‍රදේශයේ සාමාන්‍ය මහජනතාවගේ සහය ලැබී තිබේ. පැරැණි සිද්ධස්ථානවල පරිපාලනය කාලයත් සමඟ එක් පිරිසකින් තවත් පිරිසකට මාරු වී ඇත. මැතකදී සංවර්ධනය කරන ලද කුඩා සිද්ධස්ථාන ප්‍රධාන වශයෙන් නගරයේ සුළු ධනේශ්වර පිරිස විසින් ආරම්භ කරන ලද්දකි. විශේෂයෙන්ම එම ප්‍රදේශවල ත්‍රිරෝද රථ රියදුරන් විසිනි. මේ යටතේ විශේෂයෙන්ම ඉන්දියානු නිෂ්පාදිත ත්‍රිරෝද රථ මිලදී ගත් පුද්ගලයින් පාරිභෝගිකයෙකු ලැබෙන තුරු රැඳී සිටින ඇතැම් නම් කරන ලද භෞතික අවකාශයන් ඔවුන්ගේ උද්‍යාන ලෙස සලකයි. බලධාරීන් නගරයේ ඇතැම් කොටස් ත්‍රිරෝද රථ නැවතුම්පොළවල් ලෙස වෙන් කර ඇත; මෙම ත්‍රිරෝද රථ නැවතුම්පොළවල රියදුරන් පාරිභෝගිකයන් එනතුරු ත්‍රිරෝද රථ නවත්වා ඇති ස්ථානයන් ය. සමහර රියදුරන් හෝ ත්‍රිරෝද රථ හිමියන් එම ප්‍රදේශයේම පදිංචිකරුවන් වන අතර එසේත් නැතිනම් ඔවුන් සැලකිය යුතු කාලයක් එම ප්‍රදේශයේ සේවයට පැමිණි පිටස්තර පුද්ගලයන් වේ. මෙම අන්තර් සබඳතා පවත්වන ක්‍රියාවලියේදී බොහෝ ත්‍රිරෝද රථ රියදුරන් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ආදී සම්මත වූ තනතුරු සහිත සංගම් පිහිටුවාගෙන ඇත. මෙම තනතුරු සඳහා ඔවුන්ගේ වාරය එන තෙක් බලා සිටීමට ඔවුන් පිළිගත හැකි යාන්ත්‍රණයක් ද සකස් කර ඇත. සමහර ත්‍රිරෝද රථ සංගම්, සංගමයේ දියුණුව සඳහා සාමාජික ගාස්තුව ලෙස දිනකට ත්‍රිරෝද රථයකින් රුපියල් 10ක ප්‍රමාණයක් එකතු කර ඇත. මෙම පර්යේෂණයට යොදා ගත් සිද්ධස්ථාන දහසයෙන් අටක් ත්‍රිරෝද රථ සංගම් මඟින් ඉදිකරන ලද අතර එයින් හතරක් ඔවුන් විසින් නඩත්තු කර කර පවත්වගෙන යනු ලැබේ.

## බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය ක්‍රියාවලියේදී බෝ ගසෙහි භූමිකාව

ඇතැම් සිද්ධස්ථාන සංවර්ධනය වී ඇත්තේ ඒ වන විටත් එහි තිබූ බෝ ගසක් පදනම් කර ගනිමිනි. මෙම අධ්‍යයන නියැදියට නියැදියට ඇතුළත් පූජනීය ස්ථාන හයකට වැඩි ගණනකට මෙම තත්ත්වය අදාළ වේ. සම්ප්‍රදායිකව බෞද්ධ හා හින්දු භක්තිකයන් බෝධීන් වහන්සේ වන්දනා කිරීමට

නැඹුරුවක් දක්වයි. පන්සලක බෞද්ධයන් වන්දනාමාන කරන වැදගත් වස්තූන් තුනක් තිබේ; ඒවා බුද්ධ ප්‍රතිමා, චෛත්‍ය සහ බෝධිය වේ. බෞද්ධයන් බෝ ගස හඳුන්වනු ලබන්නේ බෝධීන් වහන්සේ ලෙසය. බෞද්ධයන් බෝධීන් වහන්සේ වැඳපුදා ගැනීමට හේතු දෙකක් තිබේ. පළමු හේතුව බුදුන් වහන්සේ බුද්ධත්වය සාක්ෂාත් කර ගත්තේ එහි සෙවණේ වන නිසාවෙනි. ඉන් අනතුරුව බුදුරජාණන් වහන්සේ අනිමිස ලෝචන පූජාව සිදුකොට බුද්ධත්වයට පත්වීමට සෙවණ දුන් බෝධීන් වහන්සේට ගෞරව දැක්වූහ. දෙවන හේතුව නම් බුදුන් වහන්සේ විහාරස්ථානයේ නොමැති අවස්ථාවන්හී එහි පැමිණෙන සැදැහැවතුන්ට වන්දනාමාන කිරීම සඳහා දෙව්රම් වෙහෙර විහාර භූමියේ බෝ පැළයක් සිටුවන ලෙස බුදුරදුන් ආනන්ද හිමියන්ට අනුදැන වදාළේ බුදුන්වහන්සේගේ බණ ඇසීමේ අභිප්‍රායෙන් දෙව්රම් වෙහෙරට වැඩම කරන සැදැහැවතුන්  උන්වහන්සේ පන්සලේ නොසිටීම නිසා මහත් කලකිරීමකින් ආපසු යන බව ආනන්ද හිමියන් නිරීක්ෂණය කළ බැවිනි. බෝධි පූජා වත්පිළිවෙත බෞද්ධයන් අතර දීර්ඝ කලක සිට පවත්නා සම්ප්‍රදායකි. බෝධි පූජා පැවැත්වීම තුළින් ගිහි ජීවිතයට බෝධීන් වහන්සේ ගේ ආශිර්වාදය ලබා ගැනීම ඔවුහු අපේක්ෂා කරති. නිදසුනක් වශයෙන්, රෝගීන් සුවපත් කිරීම සඳහා , සුව පහසු දරු උපතක් සඳහා, විභාග සමත් වීම සඳහා, හොඳ රැකියාවක් ලබා ගැනීම සඳහා, අපළ හා භූත දෝශයන්ගෙන් මිදීමට සහ උසාවි නඩු ජයග්‍රහණය කිරීමට යනාදිය සඳහා බෝධීන් වහන්සේ ගේ ආශිර්වාදය අපේක්ෂා කරති. බෝධි පූජාව පවත්වන විට බැතිමතුන් සුවඳ පැන් හෝ කිරි යොදා බෝධීන් වහන්සේගේ මුල් සෝදා, මල්මාලා පලන්දා, බෝධීන් වහන්සේගේ අතු මත කොඩි එල්ලා, කඳ මත සිවුරු ඔතා, පහන් දල්වා මල් පූජා කරති. සෙනෙවිරත්න (1980) දැක්වූ පරිදි මෙය  සමාජ තත්වය කුමක් වුවත් නාගරික මෙන්ම ග්‍රාමීය බෞද්ධයන් විසින් මනාව තහවුරු වූ සම්ප්‍රදායකි. බෝධි පූජාවන්හි ඉතිහාසය පිළිබඳ සලකා බලන විට එය මුලින්ම ආරම්භ කර ඇත්තේ ඉන්දියාව පාලනය කළ අශෝක රජුගේ පාලන සමයේදී ය. මීට අමතරව, පාර අසබඩ පිහිටි විශාල ගස් වන්දනාමාන කිරීම අවුරුදු ගණනාවක සිට පැවත එන පිළිවෙතකි. ඇතැම් විට මෙම පිළිවෙත ඉන්දියාවේ සිට ලංකාවට බුදුදහමේ ආගමනයත් ඒ සමඟ පැවති දේශීය ආගමික පිළිවෙත් හා

සම්ප්‍රදායන් සමඟ මිශ්‍ර වීම බෝ ගස් ආශ්‍රිත කොටගෙන සිද්ධස්ථානයන් ඉදිකිරීමට බලපා ඇත. සමහර සිද්ධස්ථාන අලුතින් පිහිටුවා ඇති අතර අලුතින් පිහිටුවන ලද සිද්ධස්ථාන බහුතරයක ද බෝධීන් වහන්සේලා රෝපණය කොට ඇත.

**නගරය, ආගම සහ මානව අරගලය**

මෙම පර්යේෂණයට අනුව කොළඹ නගරයේ නාගරික ජනතාව වර්ධනය වෙමින් පවත්නා ආගමික අවකාශයක ජීවත් වීමට ලැදියාවක් දක්වන බව පෙනේ. මෙයට වෙනස්ව, බටහිර සමාජයේ නාගරික වැසියන් වඩ වඩාත් ලෞකික සමාජයක ජීවත් වීමට ප්‍රියතාවයක් දක්වයි. බටහිර නිර්වචන වලට අනුව නගරයක් යනු හොඳින් සැලසුම් කළ, මූලික යටිතල පහසුකම් නඩත්තුවේ සිට සංකීර්ණ මූල්‍ය  ක්‍රියාකාරකම් දක්වා විහිදෙන මධ්‍යගත අධීක්ෂණ පද්ධතියකින් යුක්ත ලෞකික අවකාශයක් වේ. කොළඹ නගරවාසීන් තම ලෞකික ජීවිතය වැඩි දියුණු කර ගැනීම සඳහා සම්පත් එකතු කිරීමේ තරඟයක නියැලෙන අතර, ඉහළ අවධානමක් සහ අවධානමට භාජනය වීමට ඉහළ ප්‍රවණතාවයක් පවතින්නේ පුරෝකථනය (predictability) කිරීමේ හැකියාවක් සහිත පද්ධතීන්ගේ අඩුවක් පවතින බැවිනි. මල්ලිකාරච්චි (1998) මහනුවර නගරයේ සිංහල-බෞද්ධ වෙළෙන්දන් විසින් සිදුකරන ලද එදිනෙදා ආගමික චාරිත්‍ර අධ්‍යයනය කළ අතර එහිදී ආගමික හා ආර්ථික ක්‍රියාකාරකම් අතර පවත්නා සමීප සම්බන්ධතාවය ඉස්මතු කර වෙළඳාම සහ ආගමික චාරිත්‍ර අතර සහජීවනය විදහා දක්වයි. සංවර්ධිත රටවල් හා සසඳන විට රටේ සාමාන්‍ය මිනිසුන්ගේ ජීවන රටාවේ හැඩය තීරණය කරනු ලබන්නේ ක්‍රමානුකූලව වැඩිවන අපේක්ෂාවන් අභිලාෂයන් හෝ ආශාවන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මාධ්‍යයන් අතර නොගැලපීම හේතුවෙන් බහුතරයක් ජනතාව ආතතියට පත්වීම හරහාය. අධ්‍යාපන ක්‍රමය, මාධ්‍ය, ගෝලීයකරණය සහ ලෝකයට පහසුවෙන් අවතීර්ණ වීමේ මාර්ගයන්ගෙන් යුක්ත හෙයින් කොළඹ නගරයේ වෙසෙන මිනිසුන්ට අපේක්ෂාවන් රාශියක් ඇත. කෙසේ වෙතත්, මේ සඳහා පැහැදිලි මාධ්‍යයක් දැක ගැනීමට අපහසු ය. එවැනි සංදර්භයක් තුළ මිනිසුන් කුමන ආගමික වත්පිළිවෙත් අනුගමනය කරන්නේවූවද, කුමන ආගමික කණ්ඩායමකට අයත්වුවද, කාගේ හෝ මොනම

දේශනයක් වුවද වඩා "හාස්කම්" වලින් යුක්ත වේ නම්, උපතේ දී තමාට හිමි ආගම නොසලකා එය අනුගමනය කිරීමට පෙළඹේ. මෙය කොළඹ නගරය තුළ ආගමික සමමුහුර්තකරණය (religious syncretism) හැඩගැස්වීමට බලපෑවේ ය. ලෞකික අභිලාෂයන් සපුරාලීම සඳහා බෞද්ධයන් සහ සිංහලයන් තම තමන්ගේ ආගම් අදහන ආකාරය මෙම අධ්‍යයනයෙන් සාකච්ඡා කෙරේ.

ආගම යනු නිර්වචන තුළින් පැහැදිලි කරන දෙයකට වඩා අප මිනිසුන් ලෙස අත්දකින සජීවී මානව අත්දැකීමක කොටසකි. මානව විද්‍යාත්මක ප්‍රවේශයට අනුව "ආගම මිනිසුන් විසින් ඔවුන්ගේ සැබෑ සමාජීය වශයෙන් ව්‍යුහගත ජීවිත තුළ ක්‍රියාවට නංවන්නේ සහ උපයෝගී කර ගන්නේ කෙසේද" යන්න සොයා බැලීමට උනන්දුවක් දක්වයි (Eller 2007, 28). ආගම මිනිස් පැවැත්මේ කොටසකි. එමිල් ඩර්කයිම් (1858-1917) 1915 දී ප්‍රකාශයට පත් කරන ලද ඔහුගේ "The Elementary Forms of Religious Life" නම් කෘතියෙහි ශුද්ධ සහ ලෞකික ලෙස අගමෙහි මූලික කාර්යයන් දෙකක් විස්තර කරයි. ඩර්කයිම් ට අනුව ආගම යනු ඉහල සාමාජීයත්වයකින් යුක්ත දෙයක් වන අතර එම පිළිගැනීම සමාජ ඒකාබද්ධතාවය (social solidarity) සඳහා පදනමක් ලෙස ගත හැක. ආගම තුළින් සාමූහික සමාජ යථාර්ථය නියෝජනය කෙරේ. ආගම සමාජ පද්ධතියේ වැදගත් කොටසක් වන මිනිසුන්ගේ ජීවිතයට අර්ථයක් ලබා දෙයි. එය සමාජ සංශක්තිකභාවයේ (social cohesion) ස්වභාවය, ජීවිතයේ අරමුණ, සන්නිවේදනයේ සමාජ අවකාශය, අන්තර්ක්‍රියා, එක්රැස් කිරීම් සහ සමාජ සම්මතයන් යලි තහවුරු කිරීම් හැඩගස්වයි. ඉහත දක්වා ඇති ඩර්කයිම් ගේ න්‍යාය ඉතා සරල වුවද, රැඩ්ක්ලිෆ්-බ්‍රවුන්ගේ සිට මේරි ඩග්ලස් දක්වා අනෙකුත් මානව විද්‍යාඥයින් ආගම පිළිබඳ අධ්‍යයනයන්හි එය භාවිතා කර ඇත (Eller 2007, 148). සමස්ථයක් ලෙස, බුද්ධාගමේ ශුද්ධ වූ ජීවිතයට වැඩි අවධානයක් ලබා දෙන නමුත් වර්තමාන නාගරික සන්දර්භය තුළ වැඩි වැඩියෙන් මිනිසුන් පූජනීය අවශ්‍යතාවයන්ට වඩා ලෞකික ප්‍රතිලාභ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර එය මාතෘකාව තුළ අන්තර්ගත කිරීමට මා පෙළඹවූයේද එම නිසා ය. මෙයින් පෙන්නුම් කරන්නේ ලෞකික අවශ්‍යතාවයන් ආගමේ ශුද්ධ හෝ අධ්‍යාත්මික ලෙස හඳුන්වන දෑ මඟින්

ආදේශ වීමක් සිදු වී ඇති බවයි (Henslin 2004, 366-380). ඩුර්කයිම් ආගමෙහි ශුද්ධ සහ ලෞකික ස්වභාවයන් දෙක විස්තර කරනු ලබන්නේ " ශුද්ධ යනු විශේෂ, බලගතු, වෙනස් ක්ෂේත්‍රයකි - අප ස්පර්ශ කිරිමට හෝ නොසැලකිලිමත් ලෙස ළඟා කර ගැනීමට නොසිතන්නේ එනිසායි. ලෞකික යනු සාමන්‍ය, භෞතික, එදිනෙදා ක්ෂේත්‍රය ය- අප බොහෝ විට එහි වාසය කරන නමුත් එහි ස්පර්ශය මඟින් ශුද්ධත්වයට අගෞරවයක් හෝ අපවිත්‍ර වීමක් සිදු වේ" (Eller 2007, 21). අප රටෙහි පර්යේෂකයෙක් වූ ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි ශ්‍රී ලංකාවේ කන්ද උඩරට අගනුවර වන මහනුවර නගරයේ දේශීය වෙළඳුන් පිළිබඳ අධ්‍යයනයේදී මෙම සංකල්ප දෙක භාවිතා කළේය. සුවඳ දුම් දැල්වීමේ චාරිත්‍රය හරහා පූජනීයත්වය සමඟ මුදල් කෙලින්ම සම්බන්ධ කරන අතර පහන් දැල්වීමේ චාරිත්‍රය සෞභාග්‍යය පිළිබඳ අදහස සමඟ සම්බන්ධ වී ඇත (1998, 149). මෙහිදී ඔහු වෙළඳාම (ජීවනෝපාය/ලෞකික ක්‍රියාකාරකම් mundane) සහ ආගම හෝ චාරිත්‍ර ශුද්ධ (Supramundane) අතර සම්බන්ධය යෝජනා කරයි.

ඔබේසේකර (1970) මිනිස් අවශ්‍යතාවයන්ගේ හෝ චේතනාවන්ගේ පීඩනය සැලකිල්ලට ගනිමින් හෝ සමාජ, ව්‍යුහාත්මක සහ ආර්ථික විචල්‍යයන් ක්‍රියාත්මක කිරීම හරහා ආගමික මූලධර්ම හා න්‍යායාත්මක ආගමික පරිවර්ථනය පිළිබඳව සාකච්ඡා කරයි. වර්තමානයේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික සන්දර්භය තුළ ජීවත් වන ජනතාවගේ වෙනස්වන අවශ්‍යතාවලට ප්‍රතිචාරයක් ලෙස බැතිමතුන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ථෙරවාදී බුදුදහමේ පරිවර්ථනය හඳුනාගත හැක. මැක්ස් වෙබර් න්‍යායමය බුදු දහම වෙනස් කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත. ඔබේසේකර (1970) සිය "Religious Symbolism and Political Change in Ceylon" යන ලිපියේ දැවැන්ත සමාජ විපර්යාස, විශේෂයෙන්ම දේශපාලනික වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස බුදුදහමේ ඇති වූ වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කරයි. ඔහු ප්‍රධාන වශයෙන් තම සාකච්ඡාව නාගරික සන්දර්භය තුළ සිදු කරයි . 1956 කාලය තුළ, ක්‍රිස්තියානි මධ්‍යම පන්තියේ දේශපාලන බලය අතුරුදහන් වී සිංහල කතා කරන බෞද්ධ ජනතාව වෙත බලය පැවරී තිබිණි. ඔහුගේ

සාකච්ඡාව පදනම් වී ඇත්තේ කොළඹ මාර්ග කිහිපයක් නැවත නම් කිරීම සහ කොළඹ නගරයේ වටරවුමේ සමහර බෞද්ධ ආචාර ධර්ම ප්‍රදර්ශනය කිරීම මතය. එය 1956 න් පසු දේශපාලන බලය සිංහල බෞද්ධයන් අතට මාරු වීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකේ. ඔබේසේකරයන් (1970) බුදුන් වහන්සේ විවිධ උත්සව අවස්ථාවන්ට අදාල කර ගැනීමේ ක්‍රියාවලිය හේතුන් තුනක් යටතේ සාකච්ඡා කළේය. 1) ශ්‍රී ලංකාව බෞද්ධ ජාතියක් ලෙස ප්‍රක්ෂේපණය කිරීම සඳහා, 2) දේශපාලන බලවේගයක් ලෙස බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ඉස්මතුවීම හොවා දැක්වීම සඳහා, 3) එය ස්වදේශික කටයුත්තක් ලෙස පෙන්නුම් කිරිම සඳහා වැනි මනෝවිද්‍යාත්මක හේතු දැක්විය හැක. ඔබේසේකර පෙන්වා දෙන්නේ නාගරික ප්‍රදේශවල වෙළෙදපොළවල් ආශ්‍රිතව බුද්ධ ප්‍රතිමා මගින් බුදුදහමත් සෙසු ලෝකය සමඟ සම්බන්ධතාවයත් විදහා දක්වා දේශපාලන බලය බෞද්ධයන් විසින් අත්පත් කර ගැනීම පෙන්නුම් කරන අතර නිවෙස්වල සිද්ධස්ථාන ඉදිකිරීමෙන් නාගරික බෞද්ධයන් තුළ ඇති වූ ආකල්පමය වෙනස පෙන්නුම් කරයි. අවසාන වශයෙන්, නගරයේ බෞද්ධ සංකේත පෙනුමෙන් යම් වෙනස්කම් පවතින බව ඔහු නිගමනය කළේය. මෙම වෙනස්කම් බුදුදහම ලෝකයට අවතීර්ණ වීම පෙන්නුම් කරන මාරුවීම සනිටුහන් කරයි; දේශපාලනික සහ සමාජීය අරමුණු මෙහෙයවමින් මෙම ලෞකික කාරණා කෙරෙහි ආගමේ භූමිකාව පෙන්නුම් කරයි; සහ අවසාන වශයෙන්, ආගමික ජීවිතය තාර්කීකරණය කිරීම කුඩා සිද්ධස්ථානවල කාර්යයන් සැලකිල්ලට ගනිමින් විශ්ලේෂණ රාමුව සකස් කර ඇත. එමිල් ඩර්කයිම්, බ්‍රොනිස්ලොව් මැලිනොව්ස්කි, ඒ.ආර්. රැඩ්ක්ලිෆ්-බ්‍රවුන් විසින් සාකච්ඡා කරන ලද සිද්ධස්ථාන ඉදිකිරීමේ සංසිද්ධිය විස්තර කිරීම සඳහා කෘත්‍යවාදී විශ්ලේෂණයක් භාවිතා කරන ලදී.

සිද්ධස්ථානවල එකතු කරන ලද වෘත්තාන්තයන්ට (narratives) අනුව මෙම සිද්ධස්ථානයන්හී ඉදිකිරීම් සහ නඩත්තු කිරීම් සම්බන්ධ නගරයේ අනුග්‍රාහකයින් සහ ගනුදෙනුකරුවන් ලෙස කණ්ඩායම් දෙකක සම්බන්ධතාවයක් පෙන්නුම් කෙරේ. අනුග්‍රාහකයන් මෙම සිද්ධස්ථානයන්හි ක්‍රියාකාරකම්වල ප්‍රධාන සංවිධායකයින් වන අතර ඒවා ප්‍රදේශයේ සමිති ලෙස

ද විග්‍රහ කළ හැක. මෙම සමිතීන් සමන්විත වන්නේ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සමන්විත වූ මංසන්දි වල ත්‍රී රෝද රථ සංගම් වලින් ය. ප්‍රධාන සංවිධායකයින්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් නගරයේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම දෛනිකව අවශ්‍ය වන ද්‍රව්‍ය අලෙවි කරන ආපනශාලා සහ කුඩා අලෙවිසැල් පවත්වාගෙන යන කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගෙන් ද සමන්විත වේ. ඊට අමතරව මෙම ප්‍රදේශයන්හී දිගු කාලීනව වාසය කරන ජනතාව මෙම වත්පිළිවෙත් ආරක්ෂා කොට නඩත්තු කර ඉටු කරන ප්‍රධාන පුද්ගලයන් ලෙස කටයුතු කරයි. අසල්වාසීන්ගේ සහ අදාළ ප්‍රදේශවලට පැමිණෙන අමුත්තන්ගේ සහයෝගය සහ දායකත්වය සහිතව අනුග්‍රාහකයන් මෙම සිද්ධස්ථාන කුටීන් හී කටයුතු මෙහෙයවන ප්‍රධාන පුද්ගලයින් ය. සිද්ධස්ථාන කුටීන් වන්දනාමාන කිරීමට බොහෝ පුද්ගල කණ්ඩායම් සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් අසල්වැසි ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සමහරු කොළඹ සිට විවිධ නගරාශ්‍රිත ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර අනෙක් අය දිනපතා කොළඹ නගරයට පැමිණෙන අය වෙති. විවිධ අවශ්‍යතා සඳහා දිනකට ලක්ෂ පහකට අධික පිරිසක් කොළඹ නගරය වෙත පැමිණෙති. මෙම දෛනික මගී ජනතාවගෙන් සැලකිය යුතු කොටසක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන් වේ. රජයේ සහ පෞද්ගලික අංශයේ ප්‍රධාන කාර්යාල බොහොමයක්, විවිධ අමාත්‍යාංශ, හොඳම පෞද්ගලික සහ රජයේ රෝහල්, රාජ්‍ය හා පෞද්ගලික පාසල්, ගුවන් තොටුපළ සහ වරාය ඇතුළු පෞද්ගලික අංශ, විශාල යන්ත්‍ර සූත්‍ර මෙන්ම නිවෙස්වලට දෛනික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අලෙවි කරන විශාල ව්‍යාපාරික ආයතන කොළඹ පිහිටා ඇති අතර ජනතාව මෙම ස්ථාන වෙත පැමිණ තම අවශ්‍යතා සම්පූර්ණ කර ගනිති. දෛනික ස්වීප් ටිකට් (daily sweep ticket) හෝ ලොතරැයි අලෙවි කරන්නන් වැනි කුඩා පරිමාණ ව්‍යාපාර කරන පුද්ගලයන් සහ කුඩා කඩ සාප්පු පවත්වාගෙන යන පුද්ගලයන් ද මෙම සිද්ධස්ථානවල අනුග්‍රාහකයන් වන අතර ප්‍රදේශයේ සාමාන්‍ය වැසියන් ද මෙම සිද්ධස්ථානයන් වන්දනාමාන කිරීමට පැමිණෙති. කෙසේ වෙතත්, අතිශයින්ම භක්තියෙන් වත්පිළිවෙත් කරන්නා වූ අනුග්‍රාහකයන් ලෙස සේවය කරන්නේ එම ප්‍රදේශයන්හී අසල්වැසියන්ය. වඩාත් සිතගන්නාසුළු කරුණ නම්, කොළඹ නගරයේ වෙනත් අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් පවා

විවිධ සිද්ධස්ථානවල පවතින බෝධීන්ගේ විශේෂ හාස්කම් හේතුවෙන් ඒවාට බෝධි පූජා කොට වැඳපුදා ගැනීමට පැමිණිය හැක. වාර්තාවන්හි මැනවින් නිරූපණය වන ආකාරයට භික්ෂූන් වහන්සේලා හෝ වෙනත් පුද්ගලයින් දොරටු පාලකයන් ලෙස නොමැති මෙම නිදහස් ආගමික අවකාශයන්හි අනුශාසකයෙකු වීමට වාර්ගිකත්වය හෝ ආගම කිසිසේත් වැදගත් නොවේ.

මෙම ලිපියේ ප්‍රධාන අවධානය යොමු කරන නගර වැසියන්ගේ ලෞකික කටයුතු සඳහා ආගම ලෞකිකකරණය කිරීමේ ක්‍රියාවලිය පුළුල් ක්ෂේත්‍ර තුනක් සම්බන්ධ කර සාකච්ඡා කෙරේ. එනම්, 1) ආරක්ෂාව හෝ රැකවරණය, 2) යහපැවැත්ම, සහ 3) මිනිසුන් තුළ අනන්‍යතාවය ගොඩනැගීම වේ. බුදුදහම ලෞකිකකරණය කිරීමේ ක්‍රියාවලිය නිරූපණය කරන මෙම ක්ෂේත්‍ර තුන වෙන වෙනම පහත සාකච්ඡා කෙරේ.

## මිනිසුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කුඩා සිද්ධස්ථානයන්හි භූමිකාව

මෙහිදී, ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ සංකල්පය වඩාත් පුළුල් ලෙස සලකා බලනු ලබන්නේ දෘශ්‍යමාන මිනිසුන්ගෙන් මෙන්ම අදෘශ්‍යමාන නරක ආත්මයන්ගෙන් (evil spirits) පුද්ගලයා හා ඔහුගේ පවුලේ සාමාජිකයින්ට සහ සම්බන්ධිත කණ්ඩායම්වලට පවත්නා වූ තර්ජනයන් ද ඇතුලත් කිරීම සඳහා ය. තවද, මෙම අවස්ථාවේදී කතුවරයා අවධානය යොමු කරන්නේ ග්‍රහ වස්තූන්ගේ පිහිටීම හේතුවෙන් පුද්ගලයෙකුට ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳවය. පොදුවේ ගත් කල, බහුතරයක් සිද්ධස්ථනයන්හී බෝධීන් පවතින අතර බැතිමතුන් එහි බෝධි පූජා පැවැත්වීමට පුරුදු වී සිටී. පුද්ගල ජීවිතයට අපල හා අයහපත් බලපෑම් ඇති කරන කේන්ද්‍රවල ඇති නවග්‍රහ දෝෂ, එසේත් නැත්නම් ග්‍රහලෝක පිහිටීමේ පවතින දෝෂ නැති කර ගැනීමට මිනිසුන් මෙම චාරිත්‍ර සිදු කරයි. මෙම නවග්‍රහ දෝශ සූර්යයා, සඳු, බුධ, සිකුරු, අඟහරු, බ්‍රහස්පති, සෙනසුරු, රාහු සහ කේතු ලෙස ග්‍රහලෝක නවයක චලනයන් හා සම්බන්ධව පවතී. මිනිසුන්ට අපල කාලයන් පවතින විට, ඔවුන් විසින්ම හෝ ඥාතීන් විසින් බෝධි පූජාවන් චාරිත්‍ර සිදු කරනුයේ අදාළ පුද්ගලයා හදිසි අනතුරුවලට, ජීවනෝපායන් අහිමිවීමට හෝ පුද්ගලයාට

මෙන්ම පවුලේ අනෙක් සාමාජිකයන්ට මෙම ග්‍රහ චලනයන් නිසා සහ වෙනත් ඕනෑම හානිකර තත්ත්වයකට ගොදුරු වීම වැළැක්වීම සඳහා ය. නවග්‍රහ දසාවේ බලපෑම නිසා අපල කාලයන් ඇති අය තම කේන්දර කියවා මිනිසුන්ට සිදුවන අපල ගැන අනාවැකි  කියන සහ ඒවායෙන් වැළකී සිටීමට පියවරයන් නිර්දේශ කරන ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රඥයන්ගේ උපදෙස් මත මේවා සිදු කිරීමට පෙළඹේ. ඔවුන් බෝධි පූජාව කරන අවස්ථාවේදී කියවීමට "සෙත් කවි" (ආශිර්වාද සඳහා ගායනා කරන කවි) නමින් නිශ්චිත කවි ලබා දෙයි. දරුණු රෝගාබාධ/අනෙකුත් නිදන්ගත රෝග, උසාවි නඩු හෝ සමාජයේ වෙනත් තර්ජනවලින් පෙළෙන තම දූ පුතුන් සහ අනෙකුත් ඥාතීන්ගේ ආරක්ෂාව අපේක්ෂාවෙන් පුද්ගලයන් මෙම සිද්ධස්ථානවලට පුද පූජා පවත්වන බව නිරීක්ෂණය විය. අනෙක් අතට, ජනතාවගේ විශේෂිත වු ගැටලු විසඳීම සඳහා මෙම සිද්ධස්ථානවලට පවතින ප්‍රසිද්ධිය සලකා බලා කිලෝමීටර් 20 ත් 30 ත් අතර දුර බැහැර ප්‍රදේශවල වෙසෙන අය ද මෙම සිද්ධස්ථානවලට පැමිණ බෝධි පූජා පවත්වා යහපැවැත්ම අපේක්ෂා කරයි. බොරැල්ල, පුංචි බොරැල්ල, රාජගිරිය සහ නාරාහේන්පිට පිහිටි සිද්ධස්ථාන වලට බැතිමතුන් අතර ඉතා ප්‍රසිද්ධත්වයක් පවතී. පුංචි බොරැල්ල පුදබිමේ කපු මහත්මයා සෙත් කවි වඩාත් බලගතු ආකාරයෙන් ජප කිරීම හේතුවෙන් ඉතා ජනප්‍රිය විය. මෙම ක්‍රියාවන් සතුරන්ගෙන් හා අනතුරුවලින් මෙන්ම පිළිකා වැනි නිදන්ගත රෝගවලින්ද ආරක්ෂාව ලබා දේ. පුංචි බොරැල්ල සිද්ධස්ථානයෙහි බැතිමතෙකු වන 55 හැවිරිදි කුසුමාවතී පවසන ආකාරයට මහ රෝහලට විශේෂයෙන්ම හෘද රෝග අංශයට යන බොහෝ රෝගීන් වෛද්‍ය ප්‍රතිකාරවලින් පසු යහපත් සෞඛ්‍යයක් අපේක්ෂාවෙන් සිද්ධස්ථානයේ බෝධි පූජා පවත්වන බව පැහැදිලි කළා ය. රාජගිරියේ පිහිටා ඇති බෝධියට රෝග සුව කිරීමේ බලයක් ඇතැයි විශ්වාස කරන බැවින් දුර බැහැර ප්‍රදේශවලින් ද මිනිසුන් පැමිණේ. බෝධි පූජා කොට පවුලේ යම් සාමාජිකයන් හට වඩා යහපත්  සෞඛ්‍යය තත්ත්වයන් අපේක්ෂාවෙන් බාරයක් වීමට බෝධියේ අතු මත එල්ලන ලද කුඩා කොඩි පර්යේෂක කණ්ඩායමට දැකගත හැකි විය. මෙම සිද්ධස්ථානයන් හි බුද්ධ ප්‍රතිමාවට අමතරව දේව ප්‍රතිමාවන් ද පවතින බව නිරීක්ෂණය විය.

ලීච් (1962) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ සිංහල-බෞද්ධයන් පිල්ලෙයාර් දෙවියන් නමස්කාර කිරීම ගැන සාකච්ඡා කරන විට හින්දු දේවස්ථානයන්හී දෙවියෙකු වන පිල්ලෙයාර් සහ බුදුන් වහන්සේ අතර සම්බන්ධතාවයක් ඇති බව ප්‍රකාශ කර ඇත. ගණ දෙවියන් සහ ඔහුගේ සහෝදර අයියනාර් යන දෙවිවරු බුදුරජාණන් වහන්සේගේ "යැපෙන්නන් වන අතර බුදුරජාණන් වහන්සේ උත්තරීතර වූ ශ්‍රමණයාණන් වේ" (Leach 1962, 83), එමගින් බුදුදහමේ සමමුහුර්ත ස්වභාවය (syncretic nature) පෙන්නුම් කරයි. මෙම දෙවිවරුන් අතර නරක පුද්ගලයන්ගෙන් හොඳ මිනිසුන් ආරක්ෂා කරන මුරකාර දේවතාවුන් සිටින අතර හොඳ රැකියාවක් හෝ ජීවන සහකරුවෙකු සොයා ගැනීමට උපකාර කිරීමෙන් සමෘද්ධිය අත්කර ගැනීමට ආශිර්වාද කරන දෙවිවරු ද සිටිති. පොදුවේ ගත් කළ, දුප්පත්, ශිෂ්ට සම්පන්න මිනිසුන්ට එරෙහිව බොහෝ අසාධාරණයන් සිදුවන බව මිනිසුන් විශ්වාස කරන අතර බොහෝ දූෂිත ආයතන සමග ගනුදෙනු කිරීමට ඔවුන්ට සිදු වන බැවින් ඔවුන් හට යුක්තිය අපේක්ෂා කළ නොහැකි බව ඔවුන්ගේ මතය යි. ඒ සන්දර්භය තුළ ඔවුන් යුක්තිය පතා මෙම දෙවිවරුන්ගේ උපකාරය බලාපොරොත්තු වේ. පුංචි බොරැල්ල සිද්ධස්ථාන පරිශ්‍රය මධ්‍යයේ විශාල බුද්ධ ප්‍රතිමාව ද, එහි දෙපස කුඩා දේවතාවන්ගේ ප්‍රතිමාවන් ද පිහිටුවා තිබුණි. මේ අතර පත්තිනි, කාලි, ශ්‍රියා කන්තාව සහ සරස්වතී යන දෙවිවරුන් ද, නාථ, විභීෂණ, දැඩිමුණ්ඩ, කතරගම, විෂ්ණු, ගණ [පිල්ලෙයාර්], සමන් සහ සූනියම් වැනි දෙවිවරු ද වූහ. පුංචි බොරැල්ලේ කපු මහත්තයා ඉතා වෘත්තීයමය වශයෙන් "දේව පූජාව" [දෙවියන්ට පුද පූජා] සිදුකරන බවත්, පුද්ගලයාගේ ප්‍රශ්නය දෙසට දෙවියන්ගේ අවධානය දිනා ගැනීමේ බලයක් ඇති බවත් කුසුමාවතී පැහැදිලි කළාය.

මාර්ග අනතුරු, මාර්ග තදබදය සහ වෙනත් අපරාධ ක්‍රියාකාරකම් අවම කිරීමට එය දායක වන බව සිද්ධස්ථානවල බැතිමතුන් විශ්වාස කරයි. පිටකෝට්ටේ මංසන්දිය, ආනන්ද බාලිකා මාවත, නාරාහේන්පිට මංසන්දිය සහ ආනන්ද විද්‍යාලය ඉදිරිපිට ඉදිකර ඇති සිද්ධස්ථානය අසල ත්‍රිරෝද රථ රියදුරන් සමඟ කළ සාකච්ඡාවකදී මේ බව අවධාරණය විය. ප්‍රතිචාරකයන්ට අනුව

නාරාහේන්පිට හන්දියේ රිය අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වූ කාලයක් තිබූ අතර ඒවා බුදු මැදුර ඉදිකිරීමෙන් පසු අවම විය. මරදාන ආනන්ද විද්‍යාලය ඉදිරිපිට බුදු මැදුර ඉදිකරන ලද මංසන්දියෙහි බරපතළ රිය අනතුරු සිදු වූ අතර එයින් මරණ රැසක් සිදු වූ නමුත් එම සිද්ධස්ථානය ඉදිකිරීමෙන් පසු එම අනතුරු සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ජාතික අර්බුදකාරී අවස්ථාවන්හිදී ද බෞද්ධ ජනතාව රටේ නායකයින්ට සහ ත්‍රිවිධ හමුදාවට ආශිර්වාද කිරීම සඳහා විහාරස්ථානවල මෙන්ම මෙම කුඩා සිද්ධස්ථානවල ද විවිධ පුද පූජා පවත්වති. මෙරට අභ්‍යන්තර යුද සමයේදී නාරාහේන්පිට, බොරැල්ල, රාජගිරිය යන ප්‍රදේශවල පිහිටි සිද්ධස්ථානයන්ට යුද බිමේ සිටින තම පවුලේ සාමාජිකයන්ට ආරක්ෂාව පතා සහ තුවාල ලැබූ සෙබළුන්ට සුවය ප්‍රාර්ථනා කරමින් විවිධ පුද පූජා පවත්වා ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානයට (දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය) එරෙහිව රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සටන් වැදුණු සොල්දාදුවන්ට ආශිර්වාද කරමින් බැනරයන් මෙම සිද්ධස්ථානවල ප්‍රදර්ශනය කර තිබුණි. විජේරාම මංසන්ධියේ සංවිධායකයින් විසින් ශ්‍රී ලංකා හමුදා සෙබළුන්ට ආශිර්වාද කර බැනරයක් ප්‍රදර්ශනය කර ඇති බව නිරීක්ෂණය විය. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්ද මෙම සිද්ධස්ථානවල සංවිධායකවරුන් හට පවතින අදහස් සහ කැපවීම මෙයින් පෙන්නුම් කෙරේ.

ආගන්තුකයන් ලෙස නගරයට පැමිණෙන අය විවිධ හේතු නිසා මෙම සිද්ධස්ථානවල පිං කැට වලට මුදල් දමා වන්දනාමාන කරති. ඔවුන් කොළඹ නගරයේ රැඳී සිටින කාලය තුළ ආරක්ෂාව ලබාගැනීම සහ තම නිවෙස් වෙත ආරක්ෂිතව ආපසු යාම අපේක්ෂාවෙන් මෙම වන්දනාමානයන් සිදුකළා විය හැක.

ත්‍රිරෝද රථ සංගම් තමන් විසින් ඉදිකරන ලද බොහෝ සිද්ධස්ථානවල විවිධ පුද පූජා පවත්වමින් ආරක්ෂාව අපේක්ෂා කරති. මැටි පාර්ක් (Mati park) මංසන්දියේ එක් ත්‍රිරෝද රථ රියදුරෙක් (three wheel driver) 2009 දී මෙසේ පැවසීය. "අපි රෝද තුනක් උඩ දුවන නිසා සෑම විටම ඉහළ අවධානමක්

තිබෙනවා. අපගේ වෘත්තීය තුළ ඕනෑම දෙයක් සිදු විය හැකියි. අපි අපේ දෛනික වැඩකටයුතු පටන් ගන්න කලින් උදේම සිද්ධස්ථානය වැඳපුදාගන්නේ අපේ ආරක්ෂාව වගේම මගීන්ගේ ආරක්ෂාවත් බලාපොරොත්තුවෙන්. රෝමානු කතෝලිකයන් පවා ඔවුන්ගේ දවසේ වැඩ ආරම්භ කිරීමට පෙර සිද්ධස්ථානයට නමස්කාර කරනවා. මගියා මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුද අපරාධකරුවෙකුද යන්න දන්නේ කවුද? "(පුරුෂ, 50). එකල පෑලියගොඩ දී ත්‍රිරෝද රථයකින් යමින් සිටියදී අත්බෝම්බයක් සමඟ මරාගෙන මැරෙන කොටි සාමාජිකයකු අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය.මීට අමතරව සිද්ධස්ථානයන් අසල වාහන නවතා තැබූ ත්‍රිරෝද රථ රියැදුරන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලදීත් මෙයට සමාන අදහස් ප්‍රකාශිත විය. තව ත්‍රී රෝද රථ රියැදුරෙක් මාර්ග අනතුරකින් ගැලවුනු තම අත්දැකීම ප්‍රකාශ කළේය.

"අපි කුලියට ගමනක් ආරම්භ කරන සෑම විටම ආරක්ශාව අපේක්ශා කරමින් වඳිනවා. මම කිහිප වතාවක්ම අනතුරුවලට මුහුණ දුන්නා, නමුත් මම සුළු තුවාල වලින් බේරුණා. මේ සිද්ධස්ථානය මාව ආරක්ෂා කළා කියලා විශ්වාස කරන්න මට හේතු තියෙනවා" (පුරුෂ, 45)

ඊට සමානව, කොළඹ කුඩා කතෝලික සිද්ධස්ථානවල බැතිමතුන් ද මාර්ග අනතුරු අවම කිරීම සඳහා තම සිද්ධස්ථානවලට වැඳ පුදාගැනීමේ සුවිශේෂී බලපෑමක් ඇති බව අවධාරණය කළහ. ඔවුන්ට අනුව ඇතැම් සිද්ධස්ථාන හේතුවෙන් මාර්ග අනතුරු පමණක් නොව දුම්රිය අනතුරු වල ද අඩුවක් දැකගත හැක. වත්තල අල්විස් නගරයේ පිහිටි පූජනීය හදවතේ ප්‍රතිමාව ( ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ) සිද්ධස්ථානය (The statue of the Sacred Heart Shrine) පිහිටුවීමෙන් පසු එම ප්‍රදේශයේ මාර්ග අනතුරු විශාල ලෙස අඩු වී ඇති බව එම සිද්ධස්ථානය භාරව කටයුතු කළ වත්තල කතෝලික සංගමයේ කමිටු සාමාජිකයන් වන මාර්ටින් (67) සහ ජෝර්ජ් (47) සඳහන් කළහ. මෙම ප්‍රතිමාව කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගය හරහා මාර්ගයක් පිහිටා ඇති මංසන්ධියක පිහිටා ඇත. ගල්වල හන්දියේ පිහිටා ඇති ශාන්ත ජේම්ස් මුනිඳුන් වෙනුවෙන් කැප කර ඇති කුඩා සිද්ධස්ථානයට ද එවැනිම බලපෑම් ඇත. ශාන්ත අන්තෝනි සහ මරියා මවුතුමියට කැප කර බොරැල්ල

"බී" වත්තෙහි (කොළඹ නගරයේ වෙසෙන නාගරික මුඩුක්කු සහ පැල්පත් ප්‍රජාවන් වැඩි වශයෙන් මෙම නමින් හඳුන්වයි) කුඩා සිද්ධස්ථාන පිහිටවීම හේතුවෙන් ප්‍රදේශයේ සිදුවන දුම්රිය අනතුරු සංඛ්‍යාව අඩු වී ඇත. 47 හැවිරිදි දෙමළ කතෝලිකයෙකු වන බොන්ඩ් පවසන පරිදි, ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ සහ මරියා මවුතුමියගේ ප්‍රතිමා සහිත සිද්ධස්ථාන ස්ථාපිත කිරීමෙන් බොරැල්ල බී වත්තෙහි ජීවත් වන සාමාජිකයින් දුම්රිය අනතුරු වලින් ආරක්ෂා වී ඇත. තවද, දුම්රිය අනතුරු හේතුවෙන් මිය ගිය පුද්ගලයන් අශුද්ධාත්මයන් හෝ අවතාර බවට පත්වන බවත්, රාත්‍රියේදී මෙම අවතාර රේල් පාරෙහි ඇවිද යන අයුරු දුටු පුද්ගලයන්ට විවිධ මානසික රෝග හටගන්නා බවත් මෙම පිරිස විශ්වාස කළහ.

## මිනිසුන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා සිද්ධස්ථානයන්හි දායකත්වය

බර්ක්විට්ස් පුරෝකථනය කළ පරිදි, "ආර්ථික හා සංස්කෘතික ගෝලීයකරණයේ බලපෑම් සමකාලීන ශ්‍රී ලාංකේය බුදු දහමට විශාල ලෙස බලපානු ඇතැයි අපට අපේක්ෂා කළ හැක" (Berkwitz 2003, 70). පවතින ආර්ථික පීඩනය සහ ගෝලීය පරිභෝජනවාදය (Global Mass consumerism) බෞද්ධ ආගමික වත්පිළිවෙත් වෙනස් කර ඇති බව වර්තමාන පර්යේෂණවලින් පෙන්නුම් කරයි. යහපැවැත්ම යටතේ කෙරෙන සාකච්ඡාව පුද්ගලික, විස්තෘත පවුල්, පවුලේ මිතුරන්, ප්‍රජාව සහ රටේ සමස්ත ජනතාවට අදාල වන සේ සැලකිය හැක. දරුවන්ගේ ජීවිතවල දියුණුව, තම ව්‍යාපාරයේ දියුණුව, විභාග සමත්වීම, සාර්ථක විවාහ ජීවිතය යනාදිය අපේක්ෂාවෙන් මිනිසුන් බෝධි පූජා සිදු කරයි. ජනතාවගේ විවිධ ප්‍රශ්නවලට උපකාර කිරීමේ බලයක් සිද්ධස්ථානයන්ට සහ විශේෂයෙන්ම බෝ ගසට තිබේද යන්න පිළිබඳවවන දර්ශකයක් ලෙස බෝ ගසෙහි ප්‍රමාණය ඔවුන් සලකයි.

වත්තේගෙදර හන්දියේ පිහිටි සිද්ධස්ථානයෙහි නඩත්තු කටයුතු සිදු කර ඇත්තේ ප්‍රදේශයේ ඔරේන්ජ් නමැති සමාගමක් විසින් බව මෙහිදී සටහන් විය. ඔවුන් වසරකට වරක් එහි තීන්ත ගල්වා වර්ණවත් කර ප්‍රතිසංස්කරණය කරති. ක්ෂේත්‍ර චාරිකාවේ නියැලෙන අතරතුර එම ආයතනයේ සේවකයන්

දෙදෙනකු තිල ඇඳුමින් සැරසී සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කරමින් සිටින අයුරු අපට නිරීක්ෂණය විය. සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හෝ සමාගමේ නායකත්වය වසරක් පාසා මෙම ප්‍රතිසංස්කරණය දිගටම සිදු කිරීමට හේතු වන්නේ දෙවියන්ගේ ආශිර්වාදය හෝ වෙනත් අද්භූත බලයක් පිළිබඳ විශ්වාසයක් විය හැකිය. පුංචි බොරැල්ල පුදබිමට නිතර යන එන 55 හැවිරිදි කුසුමාවතී මහත්මිය සඳහන් කළේ තම කාර්යාලයන්ට හෝ සේවා ස්ථානයන්ට යන බොහෝ පුද්ගලයන් එම සිද්ධස්ථානයෙහි පිං කැටයට යම් මුදලක් දමා තමන් කරන කුමන කටයුත්තකට හෝ හොඳ ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් වන්දනාමාන කරයි. 50 හැවිරිදි වැදගත් ව්‍යාපාරිකයෙකු වන සිරිසෝම පවසා සිටියේ කොළඹ ජාතික රෝහලේ නේවාසික රෝගීන්ගේ ඥාතීන් මෙන්ම ගැබිණි මව්වරුන්ද පුංචි බොරැල්ල බෝධියට පැමිණෙන බවයි.

සාමාන්‍යයෙන්, මෙම සිද්ධස්ථානවලට වන්දනාමාන කරන පුද්ගලයන් විශ්වාස කරන්නේ ඔවුන්ට සිද්ධස්ථානවලට (හෝ සිද්ධස්ථාන වල පවතිනවා යැයි විශ්වාස කෙරෙන අද්භූත බලවේගයන්ගෙන්) ඔවුන් විසින් සිදු කරනු ලබන වත්පිළිවෙත් හේතුවෙන් පිහිටක් (උදව් / රැකවරණය/ආශිර්වාදය) ඇති බවයි. සියලුම සිද්ධස්ථානවල පාහේ සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වූ පුද්ගලයන් තමන්ට එම සිද්ධස්ථානයන්ගෙන් පිහිටක් ලැබෙන බව හෙළිදරව් කළ ද වැඩිදුර තොරතුරු හෙළි කිරීමට ඔවුහු මැලි වූහ. මෙම අකමැත්ත සඳහා බලපෑ හේතූන් රාශියක් ඇතත් පොදුවේ ගත් කළ අද්භූත බලවේග සමඟ ඇති සම්බන්ධය අද්විතීය සම්බන්ධයක් (unique connection) යැයි විශ්වාස කරන බැවින් ඒවා හෙළිදරව් කිරීම හෝ ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ යුතු බවට විශ්වාසයක් පවතී. රත්තනපිටිය පුදබිමේ විවිධ පුද පූජා පැවැත්වූ පුද්ගලයෙක් හට රුපියල් ලක්ෂ 10ක ලොතරැයියක් හිමි වූ බව එම පුදබිම පිහිටුවීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ සුමනරත්න මහතා පවසයි. සිද්ධස්ථානය ඉදිකිරීමෙන් පසු දිගින් දිගටම දේවාලයේ විදුලි පහන් දැල්වීම සහ නිවා දැමීමේ කාර්යය මෙම පුද්ගලයා භාරයේ තිබී ඇත. ඔහු එම ස්ථානය වෙනුවෙන් කළ යහපත් සේවය වෙනුවෙන් ඔහුට මෙම ත්‍යාගය ලැබුණු බව ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරති.

ත්‍රිරෝද රථ රියැදුරන්ගේ සංගම් සම්බන්ධ වූ සියලුම සිද්ධස්ථානවල පාහේ රියැදුරන් බහුතරයක් උදෑසන රාජකාරි ආරම්භ කිරීමට පෙර එම කුඩා සිද්ධස්ථානවලට තම සංවර්ධනය, ආරක්ෂාව හා රැකවරණය පතා මල් පූජා කර හෝ තෙල් පහන් දල්වා හෝ වෙනත් පුද පූජා පවත්වමින් වන්දනා කරති. මැටි පාර්ක් සිද්ධස්ථානයේ (Mati Park shrine) බැතිමතුන් තනි තනිව ද විවිධ චාරිත්‍ර ඉටු කරයි. රබර්වත්ත පාර මංසන්දියෙහි කුඩා බුදු මැදුරක් ඉදිකිරීමට මුල් වූ කුමාර තමාට ලැබුණු ආශිර්වාදයන් ගැන මෙසේ ප්‍රකාශ කරයි: "මම දරුවන් හය දෙනෙකුගේ පියෙක්. අපට ඇති ආදායම සීමිතයි. මට මෙතන කුඩා සිද්ධස්ථානයක් හදන්න ඕන වෙලා මම ඒක කළා. ඒක හැදුවට පස්සේ මට ත්‍රීවීල් දෙකක් ගන්න පුළුවන් වුණා, ලැබෙන ආදායමෙන් මම සෑහීමකට පත් වෙනවා. මට මෙයින් ආශීර්වාදයක් ඇති බව විශ්වාස කිරීමට මට හේතු තියනවා" (පුරුෂ, 40).

රාජගිරිය පුදබිම වන්දනාමාන කරන 65 හැවිරිදි ගුණසේකර මහත්මිය සඳහන් කළේ මෙම සිද්ධස්ථානයෙන් තම පවුලට ආශිර්වාදයන් ලැබී ඇති බවයි. 1986 දී සිය සැමියාගේ අභාවයෙන් පසු ඇය තම පුතුන් දෙදෙනා සහ දියණිය තනිවම ඇති දැඩි කර ඇත. දැන් ඇගේ එක් පුතෙක් ජපානයේ ජීවත් වන අතර අනෙකා ලන්ඩන් නගරයෙහි ජීවත් වේ. ඇයගේ එකම දියණිය රාජගිරියේ පදිංචිව සිටින අතර රාජගිරියේ එක්සත් ජාතික පක්ෂ (එ.ජා.ප) සංවිධායකවරියක් ලෙස කටයුතු කරයි. 1970 දී බෝධීන් වහන්සේ වැඳපුදා ගැනීමට පටන් ගත් දා සිට ඇයට එහි ආශිර්වාදය ලද බව විශ්වාස කිරීමට හේතු තිබුණි. තවද, එහි පවතින ජනප්‍රියත්වය සහ හාස්කම් බලය පෙන්නුම් කරමින් දිනපතා විශාල පිරිසක් එම සිද්ධස්ථානයට පැමිණෙන බවද ඇය වාර්තා කළාය. දේශපාලන ප්‍රශ්නවලට මුහුණ දීම එම පුදබිම තමන්ට උපකාර කළ ආකාරය ඇය තවදුරටත් පැහැදිලි කළාය.

"අපි එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයින් විදියට මුල ඉඳලම ගොඩක් දුක් වින්දා. අපිට තිබුණු තර්ජන ගැන සාකච්ඡා කරන්නවත් බෙදාගන්නවත් කවුරුත් හිටියේ නැහැ. අපි ඒ දවස් වල එක දිගට අඬනවා. දේශපාලන තර්ජන සහ බිය ගැන්වීම්වලින් මිදෙන්නට අද්භූත බලවේගවල පිහිට පතා බෝධිය ළඟ

පැය ගණන් හඬා වැළපුණු අවස්ථාද තිබුණා. අද වැඩිපුරම අපට හිරිහැර කළ අය ජීවතුන් අතර නෑ; ඔවුන් දඬුවම් වින්දේ මම සිද්ධස්ථානයේ බොහෝ වන්දනාමාන කළ නිසායි" (කාන්තා, 40).

පත්වීම් භාර ගැනීමට පෙර මැතිවරණයට තරඟ කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී; සහ සම්මුඛ පරීක්ෂණ ආදියට මුහුණ දීමට පෙර මිනිසුන් සිද්ධස්ථානයට පැමිණෙන බව රාජගිරියේ බෝධි ආරක්ෂක සමිතියේ සභාපති ජීවානන්ද පවසයි. කෝට්ටේ මහනගර සභාවේ නගරාධිපතිවරයා මැතිවරණයට නාමයෝජනා භාරදීමට පෙර මෙම සිද්ධස්ථානය වැඳ පුදාගත් ආකාරය පිළිබඳව ඔහු සඳහන් කළේය. කුසුමාවතී පුංචි බොරැල්ල පුදබිමේදී කළ බාරයෙන් තම බලාපොරොත්තු ඉටු වූ අයුරු පැහැදිලි කළාය. ඇගේ පුතා සහ දුව ද ආශීර්වාද ලැබූහ:

"ඉස්සර මම හැමදාම මේ සිද්ධස්ථානයට ගියත් දැන් අසනීප නිසා එහෙම කරන්න බැහැ. ඒත් මම හැම මාසෙම මහ රෝහලේ සායනයට එන හැම අවස්ථාවකම මේ සිද්ධස්ථානයට යනවා.මම මෙතනට බාර තුනක් කළා. මගේ පුතාට රස්සාවක් ලැබිලා දුවට බබාලා දෙන්නෙක් ලැබුනා, අපිට මෙතන භාර වෙලා අපේ වාහනය විකුණගන්න පුළුවන් වුණා. ඒ නිසා මේ සිද්ධස්ථානයෙන් අපිට පිහිට (ආශිර්වාද) ගොඩක් තියෙනවා කියලා මම විශ්වාස කරනවා" (කාන්තා, 55).

ඔවුන් තම වාහනය විකුණා ගැනීමට බොහෝ වෙහෙස මහන්සි වී ඇතත්, ඔවුන් පූජා භූමියේ භාරයක් වූ පසු, වාහනය හොඳ මිලකට විකිණීමට හැකිව ඇත. ඇය පවසන පරිදි, සිද්ධස්ථානවල භාරයක් වූ පසු මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ පුරුද්ද අත්හැර දැමූ සමහර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් ද සිටියහ. ඇය තම දරුවන්ට තම විභාග සමත් වීමට භාර වී එය සාර්ථක වූයේ මෙම මැදුරෙන් ලැබුණු ආශිර්වාදය හේතුවෙන් ය. මිනිසුන්ගේ මෙම අත්දැකීම් සරලව ඉවත දැමිය නොහැකි අතර, මෙතුළින් පෙනී යන්නේ මෙම සිද්ධස්ථානයන්හී වන්දනාමාන කොට පිහිට අපේක්ෂා කරන මිනිසුන්ගේ ඕනෑ එපාකම් සහ අවශ්‍යතාවල අතිශය සංකීර්ණ ස්වභාවයයි.

මෙම සිද්ධස්ථානවලට පැමිණෙන විවිධ බැතිමතුන් පිළිබඳව අපගේ අවධානය යොමු කළ විට අපට කණ්ඩායම් කිහිපයක් හඳුනාගත හැකිය. ඇඟලුම් කම්හල්වල හෝ වෙනත් ආයතනවල සේවය කිරීමට ගමෙන් නගරයට පැමිණි තරුණ පිරිස් ද ආරක්ෂාව සහ යහපැවැත්ම අපේක්ෂාවෙන් මෙම සිද්ධස්ථාන වෙත පැමිණෙති. දිනපතා කාර්යාලවලට හෝ සේවා ස්ථානවලට යන විට මෙම සිද්ධස්ථාන පසුකර යන අවට නිවෙස් හිමියන් නගරය තුල සිටිනා කාළය තුළ ඔවුන්ට යහපැවැත්ම සහ ආරක්ෂාව අපේක්ෂා කොට මෙම පොදු ස්ථානවලට නොගොස් මුදල් කැටයට දමා භාරයක් කර නිශ්ශබ්දව වන්දනාමාන කරති.

මෙම කුඩා සිද්ධස්ථාන මගින් ප්‍රදේශයේ ජනතාව සහ සමාන ක්‍රියාකාරකම් කරන පුද්ගලයන් අතර එකමුතුකමක් ගොඩනැගී ඇත. උදාහරණයක් ලෙස මැටි පාර්ක් (Mati Park) හන්දියේ කතෝලික ත්‍රිරෝද රථ රියදුරන් පවා වැඩ ආරම්භ කිරීමට පෙර බෞද්ධ සිද්ධස්ථානය වැඳ පුදා ගනී. ත්‍රිරෝද රථ රියදුරන් කවුරුන් හෝ වේවා වෙනත් අයකු මෙම චාරිත්‍ර ඉටු කරන තෙක් බලා නොසිට බුදු මැදුර පිරිසිදු කර තෙල් පහන දල්වා ගැනීමට කාලය සොයා ගනී. ඇතැම් විට ප්‍රතිමා ඉදි කර ඇත්තේ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, සුරාපානය වැනි අයහපත් දේ ඉවත් කරන යහපත්, සාමකාමී වාතාවරණයක් ඇති කිරීමේ අරමුණින් ය. එය හේතු කොටගෙන සංවිධායකයින්ට අවශ්‍ය වූයේ සමාජීය වශයෙන් නොපිළිගත් හැසිරීම් වල යෙදෙන තරුණ තරුණියන් වෙනස් කිරීමේ අපේක්ෂාවෙන් සෑම තැනකම ප්‍රතිමා ඉදිකිරීමටයි.

ප්‍රජාවගේ යහපැවැත්ම සම්බන්ධයෙන් බෞද්ධ සිද්ධස්ථානවල විටින් විට කෙරෙන වැඩසටහන් රාශියක් පිළිබඳව අපට සාකච්ඡා කළ හැක. වෙසක් සහ පොසොන් උත්සවයන් හී දී දන්සැල් පැවැත්වීම, බෞද්ධ උත්සවවලදී තොරණ් සකස් කිරීම සහ සිද්ධස්තානයන් හා ඒ අවට වර්ණ බල්බ සහ කොඩිවලින් අලංකාර කිරීම, සෑම පුර පසළොස්වක පොහොය දිනයකම බණ දේශනා (බුදුරජාණන් වහන්සේගේ ධර්මය) සංවිධානය කිරීම ආදිය මෙම සිද්ධස්ථාන රැක බලා ගන්නා කණ්ඩායම් විසින් සංවිධානය කරනු ලබන පොදු කටයුතු කිහිපයකි. දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සිද්ධස්ථානයන්ට විවිධ

හේතුන් මත පැමිණි බැතිමතුන්ගෙන් විශාල මුදලක් එකතු වී ඇති බැවින් ප්‍රජා සේවය කිරීමට වඩා හොඳ මූල්‍යමය හැකියාවක් ඇත. පුංචි බොරැල්ල සිද්ධස්ථානය භාර කමිටු සාමාජික සිරිසෝම අනාවරණ කළ පරිදි 2009 වසරේ තමන් කමිටු සාමාජිකයෙකු ලෙස සිටි කාලයේ සිද්ධස්ථානයේ කැටයෙන් එකතු වූ මුදලින් මසකට රුපියල් 500 බැගින් දුප්පත් පවුල්වල සිසුන් 20 දෙනෙකුට සහ වයෝවෘද්ධ පුද්ගලයන් 20 දෙනෙක්ට ද ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කළ බවයි. විශේෂයෙන් 2009 බෝම්බ පිපිරීම් ආදී විවිධාකාර වූ ත්‍රස්තවාදී ප්‍රහාරවලදී ජාතික අවශ්‍යතාවයක් ලෙස යුද බිමේ තුවාල ලැබූ සොල්දාදුවන්ට හා සිවිල් තුවාල ලැබූවන්ට ප්‍රතිකාර කිරීමට රෝහල් සූදානම්ව තැබීමට ලේ අවශ්‍ය වූ විට, වනාත පුදබිම අවට ජනතාව එකතු වී ලේ දන්දීමේ කඳවුරු සංවිධානය කළහ.

නාරාහේන්පිට පුදබිම පදනම් කරගත් බෝධිරාජ සමිතිය මගින් වෛද්‍ය සායන සංවිධානය කිරීම, ඇස් කණ්නාඩි බෙදාදීම, මධ්‍යසාර භාවිතයට සහ දුම්පානයට එරෙහිව ව්‍යාපාර පැවැත්වීම සිදුකරයි. එම සේවාවන් තවත් වර්ධනය කරමින් ගව ඝාතකාගාරයේ සිටින මස් සඳහා වෙළඳාමට සිටින ගවයින් නිදහස් කිරීමට සංවිධායකයින් සෑම වසරකම පියවර ගෙන ඇත. මෙම ගවයින් ප්‍රදේශයේ ගොවීන් වෙත භාරදීම සිදුකෙරෙන අතර එමගින් ඇතැම් පවුල්වල ආදායම ද ඉහළ නැංවේ. සංවිධායකයින් විවිධ මාතෘකා යටතේ විවිධ දේශන මහජනතාව සඳහා පවත්වයි. වෛද්‍ය විද්‍යාව සහ බුද්ධාගම මැයෙන් පවත්වන ලද එක් දේශනයකට 70 දෙනෙකු පමණ සහභාගී විය. ඔවුන් සැලකිය යුතු අධ්‍යාපනික ජයග්‍රහණ පෙන්වන අවශ්‍යතා සහිත දරුවන්ට ශිෂ්‍යත්ව ද ප්‍රදානය කරති (එනම් පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් වීම). තවද බෝධිරාජ සමිතිය ඔවුන්ගේ සේවය වැඩිදියුණු කිරීම සඳහා ඉන්දියාවේ මහාබෝධි සමාගම සමග සමීප සම්බන්ධයක් ඇති කර ගැනීමට උත්සාහ කරයි. තවද, ඔවුන් "සිංහල බෞද්ධයා" නම් බෞද්ධ පුවත්පත ඔවුන්ගේ සාමාජිකයන් අතර බෙදාහරින ලදි. එම සංගමයේ ලේකම්වරයා සඳහන් කළේ පාසල් මගින් සංවිධානය කරන ලද ආගමික කටයුතු සඳහා ද ඔවුන් අනුග්‍රහය දක්වන බවයි.

එලෙසම කතෝලික සිද්ධස්ථානවල සංවිධායක කමිටු සහ අනුශාසකවරුන්ද සමාජ සේවා සහ සුබසාධන කටයුතු රාශියක නිරත වෙති. වේළුවන පාරේ සාමාජිකයින් 50 දෙනෙකුගෙන් සමන්විත ශාන්ත අන්තෝනි සමිතිය එම දේවස්ථානයට අදාළ කටයුතු වල නිරත වෙන අවස්ථාවන්හීදී බොහෝ ප්‍රජා සේවයන් ඉටු කළ බව දක්නට ලැබේ. එම ප්‍රජා සේවාවන් අතර මූල්‍ය ගැටලු ඇති කිතුනු භක්තිකයන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට උපකාර කිරීම, ඔවුන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා උපකාර කිරීම, සිද්ධස්ථානයේ දානයන් දීම, ලේ දන්දීම, සහ වැඩිහිටි නිවාස සඳහා උපකාර කිරීම ඉතා වැදගත් වේ. ඇලකන්ද සිද්ධස්ථානයේ සංවිධායක කමිටුව මගින් ද එවැනිම සුබසාධන කටයුතු සිදු කරන ලදී. වත්තල පූජනීය හදවතේ ප්‍රතිමාව (ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ) (The statue of the Sacred Heart Shrine) ඉදිකළ වත්තල කතෝලික සංගමය විසින් සෑම වසරකම පෙබරවාරි 13 වැනි දින එම සිද්ධස්ථානයේ පැවැත්වෙන උත්සවයකදී දිළිඳු පවුල් නියෝජනය කරන සිසුන් 200කට පමණ පාසල් නිල ඇඳුම් පරිත්‍යාග කිරීම සිදුකරන ලදී.

### අනන්‍යතා ගොඩනැගීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සිද්ධස්ථානයන් ගොඩනැගීම

සමස්තයක් ලෙස ගත් කල, සිද්ධස්ථාන ඉදිකිරීමේ සමස්ත ක්‍රියාවලියම අනන්‍යතා ගොඩනැගීමේ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය. මෙම අනන්‍යතාවයට මූලික වශයෙන් ආකාර දෙකක් ඇත: 1) පුද්ගලික හෝ පුද්ගල අනන්‍යතාවය සහ 2) කණ්ඩායම් හෝ ප්‍රජා අනන්‍යතාවය (ආගමික, වාර්ගික, සදාචාරාත්මක, ආදිය). ප්‍රථමයෙන් පුද්ගල අනන්‍යතාවය ගැන පැහැදිලි කරමි. පුද්ගල අනන්‍යතාවය පිළිබඳ සාකච්ඡාවේ දී සිද්ධස්ථානයන් ඉදිකිරීමට හෝ විවිධ පුද පූජා පැවැත්වීමට නායකත්වය ගන්නා පිරිස් උත්සාහ කරනුයේ තමන් "හොඳ මිනිසුන්" ලෙස බාහිර ලෝකයට ප්‍රක්ෂේපණය කිරීමට ය. ඔවුන්ට ඔවුන්ගේ "යහපත් සදාචාරාත්මක හැසිරීම" මහජනතාවට ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාවයක් ඔවුන් සතුව ඇත. මෙම අනන්‍යතා ප්‍රක්ෂේපණය ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් වන සමාජ අවස්ථාවන් (social niche) නිර්මාණය කරයි. බුදු මැදුරක් ස්ථාපිත කළ එවැනි අනුග්‍රාහකයෙකු වෙත ත්‍රිරෝද රථ රියදුරන් පිරිසක්

තුළ පැවැති අදහස් මෙවැනි තත්ත්වයකට සාක්ෂි විය. ඔවුන්ට අනුව බුදු මැදුර ඉදිකිරීමට සහ එහි නඩත්තුව සඳහා මූලිකත්වය ගත් ව්‍යාපාරිකයා සත්‍ය වශයෙන්ම එකතු වූ මුදල් අවභාවිතා කරන බොරුකාරයෙකි. ඔහු සෑම විටම බලයේ සිටින දේශපාලන පක්ෂය සමඟ ගනුදෙනු කළ අතර සැබවින්ම දූෂිත පුද්ගලයෙක් විය. ඔහුගේ නීති විරෝධී මත්පැන් අලෙවිය සහ මෙවැනි ආගමික කටයුතුවල නියැලීම අතර සමාන්තරයක් දැකීමට ඔවුන්ට අපහසු විය. ඔවුන් ව්‍යාපාරිකයා "හොඳ" දේවල නිරත වූ බව උපකල්පනය කරන්නේ හොර අරක්කු අලෙවි කිරීමේ ව්‍යාපාරය සහ ඔහුගේ දූෂිත ස්වභාවය වසන් කිරීමට දරන උත්සාහයක් වශයෙනි.

ආරම්භයේ දක්වා ඇති පරිදි කණ්ඩායම් අනන්‍යතා බොහෝ ආකාරයන් පවතී. මෙම සිද්ධස්ථාන ඉදිකිරීම් බොහොමයක් ප්‍රදේශයේ ආගමික අනන්‍යතාවය ස්ථාපිත කිරීමේ හෝ තහවුරු කිරීමේ කොටසක් ලෙස සැලකිය හැකිය. පුංචි බොරැල්ල සහ බොරැල්ල සිද්ධස්ථානයන් පිහිටුවීමේ මුල් අවධියේදීම මෙය පැහැදිලිව පෙනෙන්නට තිබුණි. සෝම හාමුදුරුවන්ගේ නායකත්වයෙන් එකල ආගමික ප්‍රබෝධයක් ඇති වූ අතර බෞද්ධයන් නගා සිටුවීමේ දේශපාලන ව්‍යාපාරය ලෙස ජාතික හෙළ උරුමය පක්ෂය සෝම හාමුදුරුවන්ගේ අපවත් වීමෙන් පසුවද බෞද්ධයන් කිතුනුවන් මෙන්ම මුස්ලිම්වරුන් බවට පත්කිරීමේ ක්‍රියාවන්ට එරෙහිව ආගමික අනන්‍යතාවය ගොඩනැගීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළහ. සෝම හිමි ජීවමානව සිටියදී උන්වහන්සේ දේවත්වය පිළිබඳ සංකල්පයට එරෙහිව ඉදිරිපත් කළ තර්ක කිතුනුවන්ට සහ මුස්ලිම්වරුන්ට තර්ජනයක් වූ අතර උන්වහන්සේගේ හදිසි අපවත්වීම රටේ බෞද්ධ ජනතාවගේ සිත් තුළ විශාල සැකයක් ඇති කළේය. තම අනන්‍යතාවය තහවුරු කිරීමේ මාර්ගයක් වශයෙන් කොළඹ නගරයේ බෞද්ධ සිද්ධස්ථාන ගොඩනැගීමට ද මෙම තත්ත්වය බලපා ඇත. සෝම හාමුදුරුවන්ගේ ගුණ සමරුව සඳහා වාර්ෂිකව සාංඝික දානමය පිංකමක් සංවිධානය කරමින් සැමරුමට විජේරාම හන්දියේ පිහිටි සිද්ධස්ථාන සංවිධායකයන් කටයුතු කර ඇත.

ත්‍රිරෝද රථ රියදුරන් "යහපත් කණ්ඩායමක්" ලෙස ප්‍රක්ෂේපණය කිරීමට දරන උත්සාහය ද මෙම අනන්‍යතා ගොඩනැගීමේ එක් අංගයකි. අද සාමාන්‍යයෙන් ගත් කළ ත්‍රිරෝද රථ රියදුරන් තුළ කපටි, කෛරාටික , බොරුකාර, අශෝභනවත් බව වැනි නුසුදුසු ගුණාංග පවතින බවට විශ්වාස කරන නිසාත්, විශේෂයෙන් ඔවුන් අවදානම් සහගත රියැදුරන් ලෙස සමාජය දකින නිසාත් ඔවුන් කෙරෙහි විශ්වාසය නැති වී ඇත. එබැවින් මෙම තත්ත්වය විනීත රියදුරන් හට අනෙක් අයට වඩා වැඩි සේවාලාභීන් ලබා ගැනීමට හැකි වූ අතර පුද්ගලයින් අතර ඉල්ලුමක් ඇති විය. එහෙයින් ත්‍රිරෝද රථ රියදුරන් සිද්ධස්ථාන ඉදිකිරීම වැනි ක්‍රියාවන් සිදු කරන, අනුන්ගේ මානව හිමිකම්වලට ගරු කරන "විනීත මිනිසුන්" ලෙස ප්‍රක්ෂේපණය කිරීමට උත්සාහයක් දැරීම මෙයට හේතු විය.

ධර්මපාල චින්තනය ප්‍රචලිත කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍ය රජයෙන් රට නිදහස් කර ගැනීමට සටන් කළ බෞද්ධ පුනරුදවාදියෙකු (Buddhist revivalist) වූ අනගාරික ධර්මපාලතුමා අනුස්මරණය කිරීම සඳහා නාරාහේන්පිට පුදබිම පදනම් කරගත් බෝධිරාජ සමිතිය සෑම වසරකම උත්සවයක් සංවිධානය කරයි. සංවිධායකයින් විසින් සිද්ධස්ථානය ඉදිරිපිට ධර්මපාලතුමාගේ ප්‍රතිමාවක් ඉදිකර ඇත්තේ බුදුමැදුරට අයත් වූ භෞතික අවකාශය පුළුල් කරමිනි. රාජ්‍ය අනුග්‍රහය සහිතව පැවති උත්සවයකදී ප්‍රතිමාව විවෘත කරන ලද්දේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එවකට අගවිනිසුරුවරයා වූ සරත් එන් සිල්වා මහතා ගේ සහභාගීත්වයෙනි. එම බුදු මැදුර ඉදිකිරීම රටේ බෞද්ධ අනන්‍යතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකිය. මල්ලිකාරච්චි (1998) මහනුවර සිංහල-බෞද්ධ වෙළෙන්දන් අතර පවතින ජාතිකවාදී හැඟීම් පිළිබඳව ද පැහැදිලි කළේය. ප්‍රදේශයේ ප්‍රබල ව්‍යාපාරිකයකු වන සිරිසෝම මහතා ඔහුගේ අදහස් මෙසේ දැක්වීය.

"අපි බෞද්ධ රටක්; එය වටිනා මැණිකක් (It is a precious stone). පොදු ස්ථානවල පූජනීය ස්ථාන ඉදිකිරීමෙන් හානියක් නෑ, ඒත් එය දිගටම රැකබලා ගැනීමේ වගකීම අපට තියනවා. අපට එයින් මිදිය නොහැකියි. බුදුමැදුරක්

ස්ථාපිත කිරීමට අවශ්‍ය නම්, එසේ කරන්න, නමුත් එහි චාරිත්‍ර ඉටු කිරීම නොසලකා හැරිය යුතු නැත " (පුරුෂ, 60)

පූජනීය ස්ථානවල සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ වැදගත් පුද්ගලයන් සියලු දෙනා මෙම මතවාදය දැරූහ. මෙය බෞද්ධ රටක් බැවින් එය ආරක්ෂා කර පවත්වාගෙන යාම අපගේ යුතුකම බව ඔවුහු විශ්වාස කළහ. පූජනීය ස්ථානවල සංවිධායකයින් මෙන්ම බැතිමතුන් ද අයිතිය පදනම් කරගත් ප්‍රවේශයක් දරයි. ඊට වෙනස්ව, එම පර්යේෂණයේ අනෙක් කොටස වූ ක්‍රිස්තියානි, හින්දු සිද්ධස්ථාන පිළිබඳව , ජනවාර්ගික / ආගමික පක්ෂ පදනම් දේශපාලනය විශ්ලේෂණය කිරීමේදී ඉහත සඳහන් ප්‍රකාශය සඳහා සුළු වෙනස්කමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, කතෝලික ප්‍රදේශවල විවිධ සාන්තුවරයන්ගේ, කුරුසයේ සහ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සිද්ධස්ථාන ඉදිකරමින් ක්‍රිස්තියානි ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ ප්‍රවණතාවක් මතුවෙමින් තිබේ. එපමණක් නොව, හින්දු භක්තිකයන් ද කොළඹ ඔවුන්ට අදාල ප්‍රජාවන්හි විවිධ දෙවි දේවතාවුන්ට කැප වූ කුඩා හින්දු සිද්ධස්ථාන නිර්මාණය කර ඇත.

## නිගමනය

අවසාන වශයෙන්, මෙය 'බෞද්ධ ක්‍රමයට ජීවත්වීම' ලෙස අර්ථ දැක්විය හැකියː නගරයේ එදිනෙදා අරගලයන් සහ සම්බන්ධ වෙමින් වෙනස් වන සමාජ, දේශපාලන-ආර්ථික අවකාශය මධ්‍යයේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව සදාචාරාත්මකව හා යුක්ති සහගත ලෙස ඔහු/ඇය ජීවත් වීම. නොපැහැදිලි ක්‍රමවේදයන්ගෙන් යුත් ජයග්‍රහණ වලින් හැඩගැසුණු ඉතා තරඟකාරී ලෝකයක, විවිධ ද්‍රව්‍යමය අපේක්ෂාවන් සහ සුවපහසු ජීවිතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා මිනිසුන් එක්රැස් වූ නගරයක, ඔවුන් තම ආගම්වලින් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට නැඹුරු වෙති. මෙම පසුබිම පොදුවේ සියලුම ආගමික කණ්ඩායම් සඳහා ආගමික අවකාශයක ජීවත් වීමට වැඩි ඉල්ලුමක් නිර්මාණය කර ඇති අතර, මෙම පර්යේෂණය කොළඹ නගරයේ බෞද්ධයන් මුහුන දෙන ගැටළු වල ස්වභාවය හොවා දක්වයි. මෙම පර්යේෂණයේ විග්‍රහයෙන් යෝජනා වූයේ බෞද්ධ සිද්ධස්ථාන වන්දනා කිරීමේදී දැකගත හැකි ලෝකෝත්තර (ශුද්ධ) අරමණු වලට වඩා ලෞකික

ප්‍රතිලාභ සඳහා මාධ්‍යයක් ලෙස ථේරවාදී බෞද්ධ මතවාදය භාවිතා කරන්නේ ඇයි සහ කෙසේද යන්නයි. එය බුදුදහමේ ලෞකිකකරණය (secularization of Buddhism) ලෙස හඳුනාගත හැකි වේ. 2009 සහ 2019 දී එකතු කරන ලද මානවවංශලේඛික දත්ත සංසන්දනය කිරීමේදී මෙහි වර්ධනයක් ඇති බව පෙනේ. නුදුරු අනාගතයේදී මෙම රටාව වෙනස් වන බවට පැහැදිලි ඇඟවීමක් ද නොමැත. එබැවින්, නව ආගමික ප්‍රවණතා, පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල තමන්ට අනන්‍ය වූ අත්දැකීම් සහ විශ්වීය බලවේග සහ ආගම පිළිබඳ පැහැදිලි කිරීම් සහ ඔවුන්ගේ සමාජ ජීවන ලෝකයට ඒවායේ බලපෑම පිළිබඳ වැඩිදුර ගවේෂණය කිරීම සිත්ගන්නා කරුණකි.

## ආශ්‍රිත මූලාශ්‍ර

Berkwitz, C. S. (2003). “Recent Trends in Sri Lankan Buddhism.”*Religion* 33, 57-71.

Carter, J. R. (1979). *Religiousness in Sri Lanka*. Colombo: Marga Institute.

Eller, J. D. (2007). *Introducing Anthropology of Religion*. New York: Routledge.

Gombrich, R. and Gananath, O. (1990). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press City: Publisher.

Gombrich, F. R. (2006). *Theravāda Budd hism: A Social History from Ancient Benares to Modern Colombo.* Oxon: Routledge.

Henslin, J. M. (2004). *Essentials of Sociology: A Down-to-Earth Approach*. Pearson: New York.

Leach, E. R. (1962). “Pulleyar and the Lord Buddha: An Aspect of Religious Syncretism in Ceylon.” *Psychoanalysis and the Psychoanalytic Review* 49 (2), 81-102.

Mallikarachchi, D. (1998). “The Scrambling of the Sacred and the Profane by the Contemporary Sinhalese Buddhist Traders in the City of Kandy, Sri Lanka: A Case Study.” *Sri Lanka Journal of Social Sciences* 21 (1&2), 135-166.

Obeyesekere, G. (1963). “The Great Tradition and the Little in the Perspective of Sinhalese Buddhism.” *The Journal of Asian Studies* 22 (2), 139-153. Available at: <http://www.jstor.org/stable/2050008> (accessed August 2020).

Obeyesekere, G. (1970). “Religious Symbolism and Political Change in Ceylon.” *A Journal of Social Sciences* 1 (1), 43-63. Obeyesekere, G. (1977). “Social Change and the Deities: Rise of the Kataragama Cult in Modern Sri Lanka.” *The Man* 12 (3/4), 377-396. Available at: <http://www.jstor.org/stable/2800544> (accessed August 2020).

Piyarathne, A. (2017) “Collective Ritual as a Way of Transcending Ethno-religious Divide: The Case of Kataragama Pāda Yātrā, in Sri Lanka.” *Sri Lanka Journal of Social Sciences* 40 (1), 41-52. Available at: <http://doi.org/10.4038/sljss.v40i1.7500> (accessed August 2020).

Piyarathne, A. (2018). *Constructing Commongrounds: Everyday Lifeworlds Beyond Politicized Ethnicities in Sri Lanka*. Nugegoda (Colombo): Sarasavi Publishers.

Seneviratne, H. L. (1980). “Bodhipuja: Collective Representations of Sri Lanka Youth.” *American Ethnologist* 7 (4), 734-743. Available at: <http://www.jstor.org/stable /643479> (accessed August 2020).

Stirrat R. L. (1979). “The Shrine of St Sebastian at Mirisgama: An Aspect of the Cult of the Saints in Catholic Sri Lanka.” *The Man* 16 (2), 183-200. Available at: <http://www.jstor.org/stable/2801394> (accessed August 2020).

*The Official Website of the Colombo Municipal Council.* Available at: <https://www.colombo.mc.gov.lk/colombo.php> (accessed July2020).

# අසම්මතයේ සම්මතයː වතු කම්කරු ප්‍රජාවේ බහුවිවාහක සම්බන්ධතා නිර්මාණයට බලපෑ උපසංස්කෘතික පදනම

එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර සහ සී. පී. රාජකරුණා

## හැඳින්වීම

වේතනයක් සඳහා තම ශ්‍රමය යොදවමින් කය වෙහෙසා වැඩෙහි නිරත වන සාපේක්ෂ ලෙස සුවිශේෂ නිපුණතාවක් නොමැති පුද්ගලයා කම්කරුවෙකු ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. විවිධ ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු කම්කරුවන් දක්නට ලැබෙන අතර, වැවිලි සමාගම් හා පුද්ගල වතු ආශ්‍රිතව තම ශ්‍රමය වැය කරන කම්කරුවන් වතු කම්කරුවන් ලෙස සමාජය විසින් හඳුන්වනු ලබයි. වතු කම්කරුවන් හැර වෙනත් සාමාන්‍ය කම්කරුවන් බොහෝ විට තමන් වැඩ කරන බිමෙන් පරිබාහිරව තමන්ගේ හෝ තම ඥාතීන් සතු එසේත් නොමැති නම් තමන් විසින් කුලියට ගත් ස්ථානයක සිය පවුල සමග ජීවත් වන නමුත්, වතු කම්කරුවා වතු තුළම ජීවත් වන අතර, නිවාස පද්ධති (ලයින් කාමර) හෝ නිවාස සේවා විසින් සපයා දී තිබේ. ඒවාට අයත් පොදු වැසිකිළි, පොදු ජල සැපයුම් ඔවුන් විසින් පොදුවේ භාවිත කරනු ලබයි (ඊරියගම,2011). මෙම වතු ප්‍රජාවෙහි න්‍යෂ්ටික සහ විස්තෘත යන පවුල් ඒකකයන්හි සිටින වැඩ කළ හැකි සියලු දෙනාම පාහේ වතු කම්කරුවන් ලෙස කටයුතු කිරීම සාමන්‍යයෙන් සිදුවෙමින් පැවතියද වර්තමානයේ ඉන් පරිබාහිර වෘත්තීන්හි නිරත සුළුතරයක්ද දැකිය හැකිය. මොවුන්ගේ උපසංස්කෘතික ජීවන රටාව හේතු කොට ගෙන ඔවුහු වතු ඒකක තුළ බැහැර සමාජයෙන් වෙන්ව ආන්තිකව සිටින කණ්ඩායමක් වී ඇත. ඒ නිසා ඔවුන්ගේ බොහෝ ක්‍රියාකාරකම් නිවසට සහ වැඩ බිමට පමණක් සීමා වී පවතී.

මෙම පර්යේෂණයට නියැදිය ලෙස තෝරා ගත් වතු කම්කරු ප්‍රජාව අතර සිදුවන නීතිමය විවාහ හෝ අන් කවර ආකාරයක විවාහ බොහෝ විට ඉතා සරල චාරිත්‍ර ක්‍රමයකට අනුගතව සිදු වීමද දක්නට ලැබේ. අඩු වයස් විවාහ, අඩු වයසින් දරුවන් ලැබීම, කෙටි කාලයකින් එම විවාහ සන්ධානය බිඳ වැටීම, වෙනත් විවාහයක් නැවත සිදු කර ගැනීම යනාදිය මෙම වතු කම්කරු ප්‍රජාව අතර ඉතා සුලභ කරුණකි. ඒ පසුබිම තුළ බහු විවාහ සම්බන්ධතා යන්න මෙම ප්‍රජාව ඇසුරින් පහත පරිදි අර්ථ දැක්විය හැකිය. එනම් එක් විවාහ සන්ධානයක් බිඳ දමා වෙනත් සන්ධානයක් ගොඩ නඟා ගැනීම, නීත්‍යානුකූල නොවන විවාහ කිහිපයක් එක් පුද්ගලයෙකු විසින් සිදුකර ගැනීමය.

**පර්යේෂණ ගැටලුව**

මෙම වතු කම්කරුවන්ගෙන් බහුතරය වන වතු දමිළ ප්‍රජාව හින්දු භක්තිකයන්ය. මොවුන් වතු ආශ්‍රිතව ඔවුන් සඳහාම ඉදිකරන ලද කෝවිල්හි ආගමානුකූලව හා එකී චාරිත්‍රමය ලෙස විවාහ වීම පැරණි ක්‍රමය විය. එහිදී විවාහය සිදු කළ බවට ලියවිල්ලක් ද කෝවිල් පූජකවරයා විසින් නිකුත් කරනු ලබයි (ඇමුණුම 01 බලන්න). නමුත් වර්තමානයේදී රාජ්‍ය ආයතන විසින්, ප්‍රායෝගික කටයුතුවලදී මෙම දෙමළ ප්‍රජාවට ඒ ක්‍රමයේ විවාහ නිසා මතුවන ගැටලු වළකා ගැනීමට ඔවුන්ගේ විවාහ නීතිමය ලෙස ලියාපදිංචි කිරීමට දිරි ගන්වා ඇත. මෙසේ ආගමානුකූලවත් නීත්‍යානුකූලවත් විවාහ ගිවිස ගැනීමට එම ප්‍රජාවට ඉඩ ප්‍රස්තාව තිබියදීත් ඒවා නොසලකා "කට වචනයෙන් දෙන පොරොන්දු" ප්‍රකාරව විවාහ ගිවිස ගැනීමත්, එම බොහෝ විවාහ දෙදරා යාමත්, වෙනත් පුද්ගලයන් සමඟ "නැවත පවුල් වීම" සහ "පළමු පවුල අත්හැර දැමීම" යන සමාජ සංසිද්ධිද බොහෝ විට සිදු වන බව දැකිය හැකිය. ඒ අනුව පළමු විවාහක සම්බන්ධතාව නීතිමය ලෙස අවසන් නොකර තිබියදීත් මෙම වතු කම්කරු ප්‍රජාව බහු විවාහක

සම්බන්ධතාවලට පෙළඹී ඇත්තේ ඇයි? යන කරුණ විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**අධ්‍යයනයේ අරමුණ**

වතු කම්කරු ප්‍රජාව අතර බහුලව සිදුවන බහු විවාහක සම්බන්ධතාවලට බලපාන සමාජසංස්කෘතික පදනම කුමක්දැයි පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. එකී අරමුණ පසුගාමී හා ගැටුම්කාරී උපසංස්කෘතිමය සංකල්පීය රාමුව කෙරෙහි සුවිශේෂ අවධානයක් සහිතව මෙම සාකච්ජාව සිදු කරන ලදි.

**සංකල්පීය හා න්‍යායයික රාමුව**

**වතු කම්කරුවා**

ශ්‍රී ලකා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට අනුව සේවකයා හෙවත් කම්කරුවා යනුවෙන් අදහස් කරනුයේ ප්‍රකාශිතව හෝ ව්‍යවස්ථාගතව යම් සේවායෝජකයෙකු සමඟ සේවා ගිවිසුමකට ඇතුළත්ව එම සේවායෝජකයාගේ ව්‍යාපාර කර්මාන්ත හෝ වෙළෙඳාමේ වැඩ කරන අය වේ. මේ සඳහා ආධුනිකයින් ද අයත් වේ. මීට අමතරව "කම්කරුවා" පිළිබඳව තවත් නිර්වචනයක් වන්නේ වේතනයක් සඳහා තම ශ්‍රමය යොදවමින් කය වෙහෙසා වැඩෙහි නිරත වන සාපේක්ෂ ලෙස සුවිශේෂී නිපුණතාවක් නොමැති පුද්ගලයන්ය යනුවෙනි. මේ නිර්වචනමය පදනම ඇසුරෙන් සලකා බලන විට විවිධ ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු කම්කරුවන් දක්නට ලැබේ. ඉන් වැවිලි සමාගම් හා/හෝ පෞද්ගලික වතු ආශ්‍රිතව තම ශ්‍රමය වැය කරන කම්කරුවන්/ සේවකයින් "වතු කම්කරුවන්" ලෙස හඳුන්වයි (http://www.compensation.gov.lk).

**බහු විවාහක සම්බන්ධතා**

ශ්‍රී ලංකාවේ දැනට බල පවත්නා 1907 අංක 19 විවාහ (සාමාන්‍ය) ආඥා පනතට අනුව විවාහයක් යනු පාර්ශ්වයන් දෙකක් (ස්ත්‍රී සහ පුරුෂ) ඔවුනොවුන්ගේ වෛවාහික වගකීම්, යුතුකම් සහ අයිතිවාසිකම් සැලසෙන පරිදි ඇති කර ගන්නා නීතිමය ගිවිසුමකි. බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන්ගේ සංගමය අර්ථ දක්වන අන්දමට "විවාහය යනු සිය දරුවන් නීත්‍යානුකූල දාරකයන් වන පරිදි ස්ත්‍රියක හා පුරුෂයෙකු අතර ඇතිවන සම්බන්ධයයි"(හේමන්ත කුමාර ඃ 2017). වත්මන් ශ්‍රී ලංකාවේ වතු කම්කරු ප්‍රජාව අතර පවතින විවාහක සම්බන්ධතා ද මෙම අර්ථය මත හඳුනා ගැනීම සුදුසු වනුයේ එය නීතිමය වශයෙන්ද පිළිගත් තත්ත්වය බැවිනි. ඉහත දැක්වූ 1907 අංක 19 විවාහ (සාමාන්‍ය) ආඥා පනතෙහි 19 වන වගන්තිය අනුව, සිදු කරන ලද විවාහයක් විසුරුවා හැරීම දික්කසාදය ලෙස හැඳින්වේ (හේමන්ත කුමාර, 2015).

ඒ අනුව විවාහක සබඳතාවයක් නැවතත් විවාහයක් කර ගැනීමට ඉඩ සැලසෙන පරිදි නීත්‍යානුකූල ස්වරූපයකින් අවසන්වීම දික්කසාදය ලෙස දැක්විය හැකිය. මෙකී නීතිමය පසුබිම හඳුන්වාදීමට පෙර පැරණි ශ්‍රී ලාංකීය සමාජයේ චාරිත්‍රමය ස්වරූපයකින් විවාහවීමත්, නීත්‍යානුකූල නොවන ලෙස වෙන්ව යාමත් දක්නට ලැබුණි. සාම්ප්‍රදායික උඩරට සමාජයේ දික්කසාදය සිදු වූයේ දෙදෙනාගේ කැමැත්තෙන් වෙන් වීමෙනි (පීරිස් ඃ 2015). වත්මන් වතු කම්කරු ප්‍රජාව අතර පවතින බහු වෛවාහික සබඳතා ආශ්‍රිත වෙන්වීම් සිදු වන්නේද මීට සමාන ස්වරූපයෙනි.

**අධ්‍යයනයේ න්‍යායයික පදනමඃ**

ට්‍රැවිස් හර්ස්චි (Travis Hirschi) ඉදිරිපත් කරන සමාජ පාලන න්‍යාය (Social Control Theory) මෙම අධ්‍යයනයේ ප්‍රධාන න්‍යායයික පදනමකි. සමාජ පාලන න්‍යායකට අනුව අපගාමී හැසිරීම් ප්‍රදර්ශනය

වන්නේ කණ්ඩායමක හෝ පුද්ගලයෙකුගේ හෝ සමාජ සම්බන්ධතා දුර්වල වූ විටය (https://www.sagepub.com, Accessed on 22.10.2022). සමාජයේ පිළිගත් ස්වරූපයෙන් පුද්ගලයා බැහැර වීම අපගාමී නොහොත් සම්මත නොවන හැසිරීම් සඳහා පුද්ගලයා යොමු කරයි. සමාජ පාලන න්‍යායට අනුව සමාජ සබඳතා නිර්මාණයට ඕනෑම සමාජයක ක්‍රියාත්මක වන සමාජ පාලන ආයතන බලපෑම් කෙරේ. ආගම, පවුල, අධ්‍යාපනය එවැනි බලපෑමක් කළ හැකි ආයතන වේ. එම ආයතන බිඳවැටීම සමාජ සම්න්ධතා දුර්වල කිරීමට හේතු වේ.

මෙයට අමතරව එමිල් ඩර්කයිම් විසින් ඉදිරිපත් කොට පසුව තවත් අය අතින් වර්ධනය වූ "අනෝමීය න්‍යාය (Anomic Theory) "ද වතු කම්කරු ප්‍රජාවගේ බහුවිවාහ සඳහා බලපාන සමාජ පසුබිම හඳුනාගැනීමට න්‍යායාත්මක වශයෙන් මඟ පෙන්වීමක් කළ න්‍යායයකි. ඩර්කයිම්ගේ අදහස වන්නේ සමාජ වෙනස් වීමත් සමග ඇති වන ප්‍රතිමාන විරහිත වීම (Normlessness) අපගාමී හැසිරීම් වර්ධනයට හේතුවක් විය හැකි බවයි (ජයසිංහ, 2017; හේමන්ත කුමාර,2015; ජයවීර, 2015; 2015; Neubeck, K. J. and et al. 2007). වතු කම්කරු ප්‍රජාව ශ්‍රී ලංකා සමාජයට එකතු වන්නේ වැවිලි කර්මාන්තයත් සමඟය. මොවුන් ආරම්භයේ සිටම සිංහල සහ දෙමළ ප්‍රජාව සමඟ එකතු වීම පහළ මට්ටමක පැවතුණි (නගුලේස්වරන්, 1963). මෙම අධ්‍යයනයට ලක්වන වතු කම්කරු ප්‍රජාවේද මෙම ස්වරූපය දක්නට ලැබුණි. එනම් මොවුන් විසින් නිර්මාණය කර ගනු ලබන මේ බහුවිවාහක සබදතා මහා සමාජයට අනුකූලව සැලකීමේදී (Etic view/පිටස්තරයාගේ දෘෂ්ටිය) අසම්මත/අපගමනය වූ හැසිරීමකි. නමුත් වතු කම්කරු ප්‍රජාවේ උප සංස්කෘතිය තුළ (Emic view/ අභ්‍යන්තරිකයාගේ දෘෂ්ටිය) එය පිළිගත් / සම්මත හැසිරීමකි. මහා සමාජයේ දෘෂ්ටිකෝණය අනුව මෙම වතු

කම්කරු ප්‍රජාව ඔවුන් අයත් ප්‍රදේශයේම හුදකලා වී ඇති අතර, ඒ නිසාම මොවුන් අතර ඇති වූ සාමූහික හැසිරීම් පොදුවේ මහා සමාජය පිළිගත් සමාජ සබඳතාවලට අනුව අපගාමී හැසිරීම් ලෙස නිර්වචනය වීමටත් හේතු වෙයි.

ඉහත අදහස රිචඩ් ක්ලවුඩ් (Richard Cloward) ඉදිරිපත් කළ අපගාමී උපසංස්කෘතිය පිළිබඳ න්‍යාය (Theory of Deviant Subcultures) සමග සමපාත වේ. එහිදී ඔහු මෙබඳු උපසංස්කෘති තුනක් ඉදිරිපත් කර තිබේ. එනම් අපරාධකාරී උපසංස්කෘතිය (Criminal subcultures), ගැටුම්කාරී උපසංස්කෘතිය (Conflict subculture), හා පසුගාමී උප සංස්කෘතිය (Retreatist subculture) ලෙසිනි. මෙම තුනෙන් මෙකී වතු ප්‍රජාව ගැටුම්කාරී හා පසුගාමී උපසංස්කෘති සමග සමපාත වේ (https://revisessociology.com, Accessed on 22.10.2022). මෙම වතු කම්කරු ප්‍රජාවේ බහුවිවාහ පදනමද මේ අනුව විග්‍රහ කිරීමට හැකි වේ.

කෙසේ වෙතත් මෙම අධ්‍යයනයේ සුවිශේෂීතාව වන්නේ වතු කම්කරු ප්‍රජාව ආශ්‍රිතව සිදුවන බහුවිවාහක සම්බන්ධතාවන්හි පදනම පසුගාමී හා ගැටුම්කාරී උපසංස්කෘතික කාරණා මත තේරුම් කිරීමට යොමු වී ඇති බැවිනි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි පර්යේෂණ ක්‍රමවේදය වූයේ මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයයි. තෝරාගත් සුවිශේෂ ප්‍රජාවක වෙනස් විවාහ සම්බන්ධතා පිළිබඳව මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනය කිරීම නිසා ප්‍රමාණාත්මක දිශානතියකින් පමණක් නොව ගුණාත්මක ප්‍රවේශයකින්ද බැලීම අවශ්‍ය වූ හෙයින් මේ සඳහා මිශ්‍ර ක්‍රමවේදය උචිත බව කිව හැකිය. අපගාමී උපසංස්කෘතිය පිළිබඳ න්‍යාය, සමාජ පාලන න්‍යාය හා අනෝමීය න්‍යාය මෙම

පර්යේෂණයේ න්‍යායයික රාමු වේ. මීට අදාළ ප්‍රාථමික දත්ත සම්පාදනය 2021 වසරේ ජනවාරි සිට 2021 අප්‍රේල් දක්වා මාස හතරක කාල සීමාවක (කෝවිඩ් 19 ව්‍යසනකාරි පසුබිම තුළ) සිදු විය. අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබුවේ ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හගරන්වල සහ හෝමදොළ ග්‍රාම නිලධාරී වසම්වලට අයත් නාකියාදෙණිය හා හෝමදොළ වතු ආශ්‍රිත ප්‍රදේශයයි. එහිදී සිද්ධි අධ්‍යයනය (06), නිරීක්ෂණ, නියමු තොරතුරු සපයන්නන් සමඟ සාකච්ඡා (03), ප්‍රශ්නාවලිගත සම්මුඛ සාකච්ඡා (22) පදනම් කර ගනිමින් ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සිදුවුණි. මෙහිදී ප්‍රශ්නාවලිගත සම්මුඛ සාකච්ඡා (22)ට සීමා වූයේ මෙබඳු විවාහ බැඳීම් ඇති කරගත් පවුල් ඒකකවල පුද්ගලයන් අතර තොරතුරු සැපයීමට කැමැත්ත දැක්වූ පිරිස එපමණක් වීමය. එහිදී දත්තදායකයින්ගේ ඇතැම් අදහස් ව්‍යාකරණමය ලෙස ලිවීම/ඉදිරිපත් කිරීම නොව "ඔවුන් කියූ දෙය ඔවුන්ගේ වචනවලින් ම" විශ්ලේෂණයේදී ඉදිපත් කරන ලදි. එහිදී නිලධාරීන්ගේ හැර දත්තදායකයින්ගේ පුද්ගල අනන්‍යතාව හෙළි නොවන ලෙස ව්‍යාජ නම් භාවිතයට ගැනිණ.

**වගු අංක 01 - අධ්‍යයන ප්‍රදේශයේ ජනගහණ විවිධත්වය**

| ග්‍රාම නිලධාරී වසම | ජනගහනය | | |
|---|---|---|---|
| | සිංහල | දෙමළ | වෙනත් |
| හෝමදොළ | 1148 | 1197 | 15 |
| හගරන්වල | 1844 | 220 | 15 |

මූලාශ්‍රයː නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - සම්පත් පැතිකඩ වාර්තාව, 2020

සිංහල හා දෙමළ ජන වර්ග දෙකම නියෝජනය වන ලෙස නාකියාදෙණිය හා හෝමදොළ වතු දෙකෙහි බහුවිවාහක සබඳතා

ගොඩනගාගත් පවුල් ඒකක 22 ක් අධ්‍යයන නියැදිය ලෙස "විනිශ්චයගත හෙවත් පරමාර්ගත නියැදීම" මඟින් තෝරා ගනු ලැබීය. නියැදි රාමුව පැහැදිලි නැති, සංගහනය දැඩි අසමජාතීය වූ හා පර්යේෂකයන්ගේ විශේෂ දැනුම මත කුඩා නියැදියක් තෝරා ගත යුතු බැවින් විනිශ්චයගත නියැදි ක්‍රමය යොදා ගැනෙ.

**වගු අංක 02 - අධ්‍යයන නියැදිය ජනවර්ගය අනුව හඳුනා ගැනීම**

| ජන වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 10 | 45.5 |
| දෙමළ | 12 | 54.5 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

එමෙන්ම අධ්‍යයන නියැදිය රැකියාව මත ද හඳුනා ගැනීම පහත වගුවෙන් දක්වා ඇත.

**වගු අංක 03 - අධ්‍යයන නියැදිය රැකියාව අනුව හඳුනා ගැනීම**

| රැකියාව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| වතු කම්කරු | 12 | 54.5 |
| වෙනත් දෛනික කුලී කම්කරු | 05 | 22.7 |
| ස්වයං රැකියා | 03 | 13.6 |
| විදෙස් රැකියා | 01 | 4.6 |
| වෙනත් අය මත යැපීම | 01 | 4.6 |
| එකතුව | 22 | |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

මෙම අධ්‍යයනයේදී සාකච්ඡාවට ලක් කරන ප්‍රධාන කරුණක් වන්නේ ප්‍රජාවේ අධ්‍යාපනික පසුබිම බහුවිවාහය පදනම් කර ගත්

මතවාදය මෙකී සමාජයේ ස්ථාපිත කිරීමට කර ඇති බලපෑමයි. ඒ හේතුවෙන් මෙම වතු ප්‍රජාවේ අධ්‍යාපන මට්ටමද සැලකිල්ලට ගැනීමද සිදු කරන ලදි.

**වගු අංක 04 - අධ්‍යයන නියැදිය අධ්‍යාපන මට්ටම අනුව හඳුනා ගැනීම**

| අධ්‍යාපන මට්ටම | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 3 ශ්‍රේණියට අඩු | 06 | 27.3 |
| 5 - 7 ශ්‍රේණි | 08 | 36.4 |
| 7 - 9 ශ්‍රේණි | 05 | 22.7 |
| 11 ශ්‍රේණියට අඩු | 03 | 13.6 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

ඉහත කරුණු පිළිබඳ අවබෝධය පර්යේෂණ ගැටලුව වඩාත් පුළුල් ආකාරයෙන් විග්‍රහ කිරීමේදී වැදගත් විය.

**විශ්ලේෂණය**

බහුවිවාහ පිළිබඳ මතවාදයට ලාංකීය සමාජයේ පවතින්නේ දිගු ඉතිහාසයකි. මෙරට ආර්ය ජනාවාසීකරණයේ ආරම්භක අවස්ථාව සමගින් බහුවිවාහය පදනම් කර ගත් සබඳතා ආරම්භ වන්නට ඇති බව සැලකේ (හේමන්ත කුමාර, 2017).නමුත් අධ්‍යයන ප්‍රදේශයේ දක්නට ලැබෙන බහුවිවාහ සබඳතාවන්ගේ ස්වරූපය එයට වඩා වෙනස් වන්නකි. එහිදී දක්නට ලැබුණේ එක් සබඳතාවක් විධිමත් ස්වරූපයකින් අවසන් නොකළ අවස්ථාවලදී පවා වෙනත් සබඳතාවක් නිර්මාණය වීමයි. නීතිමය දික්කසාදවල ස්වරූපයෙන් මේවා වෙනස් වන්නේ නීත්‍යානුකූල සබඳතාව පවතින අතරතුරම වෙන්වීම හා නව සබඳතා ඇති වීමයි. මෙම

තත්ත්වය සහ එයට බලපෑම් කළ සාධක මේ අධ්‍යයනයේදී සැලකිල්ලට ගනු ලැබීය.

**වතු කම්කරු ප්‍රජාවේ විවාහයට අදාළ මූලික ස්වරූප හඳුනා ගැනීම**

වතු කම්කරු ප්‍රජාවේ විවාහය පිළිබඳ මතවාද හඳුනා ගැනීමේදී ඊ.ඒ. වෙස්ටර් මාර්ක් දක්වන අදහස වැදගත්ය (හේමන්ත කුමාර : 2017). ඒ නිර්වචනයට අනුව විවාහය ලෙසට හැඳින්වෙන්නේ එක් පුරුෂයකු හෝ පුරුෂයන් කිහිපදෙනෙකු හෝ පුරුෂයන් කිහිපදෙනෙකු ඒක් ස්ත්‍රියක හෝ ස්ත්‍රීන් වැඩි ගණනක් සමග සමාජයක් පිළිගන්නා ආකාරයේ සම්බන්ධතා පවත්වා නීත්‍යානුකූලව පිළිගත් ආකාරයට දරුවන් බිහි කිරීමේ ක්‍රියාවලියයි. වතු කම්කරු ප්‍රජාව අතර, පවතින්නේද මෙයට සමාන විවාහ සම්බන්ධතාය. එක් සබඳතාවක් පවතින අතරම සමාජය පිළිගන්නා ආකාරයෙන් වෙනත් සබඳතාවක් පවත්වා ගෙන යාම මේ ප්‍රජාවේ විවාහ ක්‍රමයේ මූලික ලක්ෂණයක් වී ඇත.

**වගු අංක 05 - පළමු විවාහයෙන් වෙන් වීමේ ස්වරූපය**

| ස්වරූපය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| නීත්‍යානුකූල | 03 | 13.6 |
| නීත්‍යානුකූල නොවන | 19 | 86.4 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

මෙම විස්තර අනුව පැහැදිලි වන්නේ බොහෝ දත්තදායකයන් එනම් 86% ක් පමණ දෙවන විවාහයට යොමු වී ඇත්තේ පළමු විවාහය විධිමත් ලෙස අවසන් කර නොමැතිවය.

සිද්ධි අධ්‍යයන අංක 01 - රාණි (අවුරුදු 30)

...............අපේ පළමු සම්බන්ධයත් නීතියෙන් සිදු වූයේ නෑ. දරුවා ලැබුණු පස්සේ තමයි දැන ගත්තෙ එයා වෙන ගෑනු කෙනෙකු සමග විවාහ වූ කෙනෙක් බව, පස්සෙ මන් එයාව අතහැරියා.......

මෙයින් පැහැදිලි වන්නේ පළමු විවාහය මෙන්ම අතහැරීමද සිදු වී ඇත්තේ නීත්‍යානුකූලව නොවන ස්වරූපයෙන් බවයි.

සිද්ධි අධ්‍යයන අංක 02 - සුගත් (අවුරුදු 42)

....................................අපි බැන්දේ නීතියෙන්. ඒත් ටික දොහකට පස්සේ දැන ගත්තේ මගේ පවුලට (බිරිඳ) වෙනත් අයකු සමග සම්බන්ධයක් තියෙනව කියලා. ඒ නිසා මන් ගෑනි අතහැරියා. හැබැයි පොලීසියට උසාවියට ගියේ නෑ. ඉන්අවුරුදු 14කට පස්සේ මම නැවත නීතියෙන් වෙන ගෑනියෙක් එක්ක විවාහ වුණා. ඊට කලින් තව තව සම්බන්ධකම් තිබුණා......

මෙහිදී දත්තදායකයා දැක්වූයේ පළමු විවාහය සිදු වූයේ නීත්‍යානුකූලව වුවත් වෙන් වීම සිදු වූයේ නීත්‍යානුකූල නොවන ස්වරූපයකින් බවයි. එම නීත්‍යානුකූල නොවන වෙන්වීම පවතින අතරතුරම දෙවන විවාහයකට නැවතත් නීත්‍යානුකූල ස්වරූපයකින් සම්බන්ධ වීම විශේෂ ලක්ෂණයකි. පර්යේෂකයන් එය ගැටලුවක් ලෙසට ඉස්මතු කරන තෙක්ම දත්තදායකයා එය ගැටලුවක් ලෙසට හඳුනා ගෙන නොතිබුණි. ඌන අධ්‍යාපන මට්ටම මේ සඳහා බලපා ඇති එක් ප්‍රධාන සාධකයක් විය හැකිය. එම දත්තදායකයා හතරවන ශ්‍රේණිය දක්වා පමණක් පාසල් ගොස් තිබුණි. ඒ අනුව, විවාහයේ නීත්‍යානුකූල ස්වරූපය ආදී කාරණා පිළිබඳව බොහෝ වතු කම්කරු ප්‍රජාවට අවබෝධයක් නොමැති බව දක්නට විය. එයට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනා ගත හැක්කේ ඌන අධ්‍යාපන මට්ටමයි. මෙම නියැදියට අනුව විවාහය

පිළිබඳව ඔවුන්ගේ ආකල්පය වී ඇත්තේ එය ස්ථිරව පවත්වා ගෙන යා යුතු බැඳීමක් ලෙසට නොවන බව පහත අදහසෙන්ද තහවුරු වේ. සිද්ධි අධයයන අංක 03 බලන්න.

සිද්ධි අධ්‍යයන අංක 03- මීනාක්ෂි (අවුරුදු 52)

.............. කසාදය අතරමග කැඩිලා ගියා. ඒක ගැන ප්‍රශ්නයක් නෑ. කොහොමත් ඕවා ස්ථිර ඒවා නෙවේ නේ. ඔය කිව්වට ජීවිතේ තියෙනකම් එක කසාදයක කව්ද ඉන්නේ.....

අධ්‍යයන ප්‍රජාවේ විවාහ සබඳතා නිර්මාණයට බලපා ඇත්තේ පෙම් සබඳතා මඟින් විවාහයට ඇතුළු වීමයි. එය පළමු විවාහයට ඇතුළත් වීමේදී ප්‍රමුඛ වූ අතර දෙවන විවාහයේදී අවස්ථා 02කදී හැර පෙම් සබඳතා වැදගත් වී ඇත. එහිදී පෙම් සබඳතා නිර්මාණය වීම තුළ දක්නට ලැබුණේ කෙටිකාලීන අහඹු සිදුවීම් මත ඒවා නිර්මාණය වීමය. මේ තත්ත්වය පැහැදිලි කර ගැනීමට සිද්ධි අධ්‍යයන අංක 02 බලන්න.

සිද්ධි අධ්‍යයන 02 - සුගත් (අවුරුදු 42)

..... මුලින්ම මම එයාව දැක්කේ මේෂන් බාස් කෙනෙකුට අත්වැඩ දෙන අතරතුරේදි. එයා මේෂන් බාස්ගේ ඥාතියෙක්. එයා හැඩයි. අපි යාලු උණා. පස්සේ වැඩිය හෙව්වෙ නෑ. එහෙමම කසාද බැන්දා..........

මෙයින් පැහැදිලි වන්නේ විවාහ සම්බන්ධතා නිර්මාණය පිළිබඳව පවතින අදහස සාමාන්‍ය සරල ස්වරූපයක් ගන්නා බවයි. එහිදී විවාහය සඳහා සහකරුවන් තෝරා ගැනීමේදී හෝ පෙම් සබඳතා ඇති කර ගැනීමේදී සලකා ඇත්තේ ස්ථිර විවාහ ජීවිතයක් පවත්වා ගෙන යාමට වැදගත් වන සාධක නොවේ (එටික් විග්‍රහය). පහත වගු අංක 07 බලන්න.

**වගු අංක 06 - විවාහ සබඳතා නිර්මාණය සඳහා බලපා ඇති සාධක**

| සාධක | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ශාරීරික පෙනුම/ රූපය | 07 | 31.8 |
| රැකියාව | 01 | 4.5 |
| ජන වර්ගය/කුලය | 12 | 54.5 |
| ප්‍රදේශය | 01 | 4.5 |
| වෙනත් | 01 | 4.5 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

වර්තමානයේ විවාහයක් ඇති කර ගැනීමේදී අත්‍යවශ්‍ය ලෙස විග්‍රහයට ලක් වන ආර්ථික මට්ටම, අධ්‍යාපන මට්ටම, වයස, පවුල් පසුබිම, දෙදෙනෙකු අතර පැවතිය යුතු විශ්වාසය හා අවබෝධය සහ අන්තර්සම්බන්ධතා වතු කම්කරු ප්‍රජාව සැලකිල්ලට ගෙන නොතිබුණි බව පෙනී යයි.

විවාහය සිදු කිරීමේදී වයස පිළිබඳව දක්නට ලැබෙන ස්වරූපයද වතු කම්කරු ප්‍රජාව අතර සුවිශේෂී වන්නකි. ශ්‍රී ලංකාවේ විවාහ වන වයස් සවරූපය හඳුනා ගැනීමේදී, මූලික ලක්ෂණය වී ඇත්තේ පුරුෂයින් වැඩි වයස් මට්ටමක් සහ ස්ත්‍රීන් එයට අඩු වයස් මට්ටමක් ගැනීමයි.

ශ්‍රී ලංකාවේ විවාහ වන වයස් මට්ටමේ සාමාන්‍ය ස්වරූපය නාගරික සහ ග්‍රාමීය අංශයන්ට සාපේක්ෂව එය වතු අංශයේ පහළ අගයක් ගෙන ඇත.

**වගු අංක 07 - අංශ අනුව විවාහ වීමේ සාමාන්‍ය වයස**

| අංශය | විවාහ වීමේ සාමාන්‍ය වයස (අවුරුදු) | |
|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී |
| නාගරික | 28.1 | 24.8 |
| ග්‍රාමීය | 27.0 | 23.1 |
| වතු | 26.2 | 22.8 |

මූලාශ්‍රය :- ජන සංගණන වාර්තා 2022 - ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

**වගු අංක 8 - අධ්‍යයන වතු කම්කරු ප්‍රජාවේ පළමු විවාහයේ වයස් මට්ටමේ සාමාන්‍ය**

| වයස් මට්ටම (අවු) | ස්ත්‍රී | ප්‍රතිශතය | පුරුෂ | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 15 ට අඩු | 02 | 9.1 | - | |
| 15 – 20 | 08 | 36.4 | 6 | 27.3 |
| 20 – 25 | 07 | 31.8 | 14 | 63.7 |
| 25 -30 | 04 | 18.2 | 01 | 4.5 |
| 30ට වැඩි | 01 | 4.5 | 01 | 4.5 |
| එකතුව | 22 | | 22 | |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

අඩු වයසකදී විවාහය සිදු වීමත් එය අතරමගදී අසාර්ථක වීමත් අතර සම්බන්ධයක් පවතී (හේමන්ත කුමාර,2015). අධ්‍යයනයට ලක් වූ ප්‍රජාව ආශ්‍රිතවද මෙම ස්වරූපය දක්නට තිබිණ.

සිද්ධි අධ්‍යයන අංක 04 - කදිරේෂන් කෝවිලේ පූජක

.........නීත්‍යානුකූලව විවාහ වෙලා තිබුණෙ නැතත් කෝවිලේ විවාහය සිදු කළ හැකියි. අවශ්‍ය වෙන්නෙ දෙන්නගෙ කැමැත්ත. වෙන විරෝධතා නැත්නම් විවාහය සිදු කරනවා. කෝවිලෙන් ලියවිල්ලකුත් ලබා දෙනව (ඇමුණුම 01 බලන්න ).

සිද්ධි අධ්‍යයන අංක 04-කදිරේෂන් කෝවිලේ පූජක

.............. රත්තරං තැල්ලක් කරේ බැඳීම හරි එහෙම නැත්තනම් අමු කහ කැල්ලක් කරේ බැන්දත් හරි. ඒක විවාහය සිදු වූ බව සංකේතවත් කරන්නවා. .........

වතු කම්කරු ප්‍රජාවේ විවාහය පිළිබඳ අදහස නම්‍යශීලීවීමට මෙම චාරිත්‍රය මත සිදු වන විවාහය පිළිබඳ මතයද, අන්තර්ආශ්‍රය මත එකිනෙකා විසින් අභ්‍යන්තරීකරණය කර ගන්නා අදහස්ද බලපෑම් කර ඇත.

**වතු කම්කරු ප්‍රජාවේ වෛවාහික සබඳතා බිඳවැටීම සඳහා බලපා ඇති සාධක**

අධ්‍යයන ප්‍රජාව ආශ්‍රිතව විමසා බැලූ මූලිකම තත්ත්වය වූයේ පළමු විවාහය බිඳ වැටීම හා වෙනත් විවාහ සබඳතා පසුව ගොඩනැගීමට පෙළඹෙන හේතුය. එහිදී විශේෂ ලක්ෂණය වූයේ දෙවන විවාහයකට අමතරව ඇතැම් අවස්ථාවන්හි තුන් වන විවාහයකට ඇතුළත් වීමද දක්නට ලැබීමයි.

**වගු අංක 9 - ප්‍රජාවේ විවාහ වාර සංඛ්‍යාව**

| ස්ත්‍රී පුරුෂභාවය | විවාහ වාර සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | පළමු | දෙවන | තෙවන |
| ස්ත්‍රී | 04 | 17 | 01 |
| පුරුෂ | - | 21 | 01 |

මූලාශ්‍රය ඃ ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

ඒ අනුව, අධ්‍යයන ප්‍රජාවේ මූලික ලක්ෂණය එක් විවාහ ගණනාවක් ඇති කර ගැනීමේ ප්‍රවණතාවක් පැවතීමය. එහිදී පළමු විවාහය බිඳ වැටීමට බලපා ඇති ප්‍රධානම සාධකය වී ඇත්තේ අනියම් සබඳතාය.

**වගු අංක 10 - වතු කම්කරු ප්‍රජාවේ විවාහ සම්බන්ධතා (පළමු) බිඳ වැටීමට බලපෑ සාධක**

| සාධකය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අනියම් සබඳතා | 19 | 86.4 |
| නොසලකා හැරීම් | 2 | 9.1 |
| ආදායම් ගැටලු | 01 | 4.5 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

සිද්ධි අධ්‍යයන 02-සුගත් (අවුරුදු 42)

.............. පොඩි දරුවට මාස 1 ½ යන්න ඉස්සරවෙලා එයා පරණ සම්බන්ධයක් අලුතින් පටන් ගත්තා. අවවාද කළාට ඇහුවෙ නෑ....පස්සෙ දරුවොත් දාලා එයා ඒ මිනිහත් එක්ක ම ගියා ......

අනියම් සබඳතා නම් ප්‍රධාන කරුණ හැරුණු විට නොසලකා හැරීම් (කන්න බොන්න නොදීම/ අග හිඟකම්), සැක කිරීම්, දරුවන් නොමැතිවීම, දරුවන් අතහැර දැමීමද විවාහය බිඳවැටීම කෙරෙහි බලපා ඇති සාධක වී ඇත. සිද්ධි අධ්‍යයන 05 බලන්න.

සිද්ධි අධ්‍යයන 05 -ශිරෝමි (අවුරුදු 27)

....... ටික කාලයක් යන කොට එයා මාව සැක කරන්න පටන් ගත්තා. දරුවන්ට සැලකුවෙත් නෑ. එහෙමම අපේ කසාදේ කැඩිලා ගියා ......

පළමු විවාහයේ බිඳ වැටීම සඳහා බලපා ඇති සාධකයන්ම දෙවන විවාහයක් ඇති කර ගනීමට බලපා ඇති සාධකම බව මූලික වශයෙන් පෙනුණි. නමුත් ඊට වෙනස් සාධක දෙවන සහ තුන්වන විවාහ සබඳතා ඇති කර ගැනීම කෙරෙහි බලපා ඇති බවත් අධ්‍යයනයේදී හෙළි විය. ඉදිරියේදී මෙම තත්ත්වය වඩාත් පුළුල්ව විග්‍රහයට ලක් වනු ඇත.

## වතු කම්කරු ප්‍රජාවේ බහු විවාහක සබඳතා ඇති වීම කෙරෙහි බලපා ඇති සාධක

අධ්‍යයනයට ලක් වූ ප්‍රජාවෙන් එනම් දත්ත දායකයන්ගෙන් කාන්තාවන් 17 ක් සහ පිරිමි 21 දෙවන විවාහයකට එළඹ තිබූ අතර, තුන්වන විවාහයකටද එළඹ සිටි අවස්ථාවන් දක්නට ලැබුණි. පළමු විවාහයට බලපෑම් කළ සාධකයන් මෙන්ම එයට වඩා වෙනස් වූ සාධකයන්ද දෙවන විවාහය සඳහා බලපා ඇත.

දෙවන විවාහය සඳහා සහකරු/ සහකාරිය තෝරා ගෙන ඇත්තේ ද අවස්ථා 02 කදී හැරුණු විට පෙම් සබඳතා පදනම් කර ගනිමිනි. අධ්‍යයන ප්‍රජාව අතර, යෝජිත විවාහයන්ට වඩා පෙම් සබඳතා නිර්මාණය කර ගැනීම මගින් විවාහයට ඇතුළත් වීම කෙරෙහි නැඹුරුවක් පවතින බව පැහැදිලි විය.

**වගු අංක 11 - දෙවන විවාහයේ ස්වරූපය**

| ස්වරූපය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| පෙම් සබඳතා | 18 | 81.8 |
| යෝජිත | 04 | 18.2 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

ඒ අනුව, දෙවන විවාහ ආශ්‍රිතව සලකා බැලෙන ස්වරූපය වන්නේද පෙම් සබඳතා බව පැහැදිලිය. මෙම අධ්‍යයනයට ලක් වූ

ප්‍රජාවේ දෙවන, තෙවන විවාහ නිර්මාණය වීමට අදාළ කාරණා පිළිබඳව වඩාත් පුළුල්ව සලකා බැලීම මඟින් ඊට බලපෑම් කළ ප්‍රමුඛ සාධක කීපයක් මෙහිදී හඳුනා ගැනීමට ඉඩ ලැබුණි.

**වගු අංක 12 - අධ්‍යයන ප්‍රජාවේ දෙවන විවාහය සඳහා බලපෑ සාධක**

| සාධකය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| දුගීභාවය | 08 | 36.4 |
| දරුවන්ගේ රැකවරණය | 03 | 13.6 |
| ආරක්ෂාව | 05 | 22.7 |
| සමාජ ආකල්ප/බලපෑම් | 06 | 27.3 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

**බහුවිවාහ සඳහා ආර්ථික සාධක බලපෑම**

වතු කම්කරු ප්‍රජාවේ බහුවිවාහ සඳහා බලපා ඇති ප්‍රධාන සාධකයක් ලෙසට හඳුනා ගත හැකි වූයේ එම ප්‍රජාවේ රැකියා ස්වරූප හා සම්බන්ධ ආර්ථික කරුණුය. මෙම ප්‍රජාව සමාජයීය වශයෙන් පුද්ගලයා හුදකලාවීමටත්, මහා සමාජය පිළිගත් සමාජ සම්මතයන්ගෙන් දුරස් කිරීමටත් බලපාන ප්‍රධාන සාධකයක් ලෙසට මොවුන්ගේ මෙම පහළ ආර්ථික පසුබිම හඳුනා ගත හැකි වේ. ඒ නිසාම එම ආර්ථික කාරණා මත පදනම් වූ සංස්කෘතියක්ද මෙම ප්‍රජාව අතර පැවතීම අමතක කළ නොහැකිය. පහත වගුවේ දැක්වෙන පරිදි මෙම අධ්‍යයන ප්‍රජාවේ මූලික ආදායම ප්‍රධාන වශයෙන්ම කම්කරු රැකියා සමගබැඳී තිබෙන බව පෙනී යයි.

**වගු අංක 13 - අධ්‍යයන ප්‍රජාවේ රැකියා ස්වරූප**

| **රැකියාව** | **සංඛ්‍යාව** | **ප්‍රතිශතය** |
|---|---|---|
| වතු කම්කරු | 12 | 54.5 |
| වෙනත් දෛනික කුලී කම්කරු | 05 | 22.7 |
| ස්වයං රැකියා | 03 | 13.6 |
| විදෙස් රැකියා | 01 | 4.6 |
| වෙනත් අය මත යැපීම | 01 | 4.6 |
| එකතුව | 22 | 100 |

මූලාශ්‍රය ː ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

ඒ අනුව සමාජ පිළිගැනීමක් සහිත රැකියා අධ්‍යයන ප්‍රජාව අතර දක්නට නොවීම විශේෂ ලක්ෂණයක් විය. බැහැර සමාජයෙන් පිළිගැනීමක් නොමැති, කුඩා ආදායමක් පමණක් ලැබෙන රැකියා මෙම ප්‍රජාවේ ප්‍රධාන ලක්ෂණයක් වී ඇති අතර, එමඟින් ඇති කරන ලද සීමාවන් විවාහ බිඳ වැටීමටත්, වෙනත් සබඳතා නිර්මාණයටත් ප්‍රධාන වශයෙන්ම හේතුව වී ඇත. ඒ හේතු කොටගෙන වතු ප්‍රදේශයෙන් බැහැර කම්කරු වෘත්තීන් සඳහා ආසන්න හෝ ප්‍රධාන නගරවලට යොමු වීමට, විදේශ ගතවීමට පෙළඹෙන සුළු ප්‍රතිශතයක් මෙම වතු ප්‍රජාව අතර සිටී. එම කරුණම වෙනත් විවාහ ඇති කර ගැනීම සඳහා යොමු කරන ලද සාධක අතර වැදගත් වී ඇත.

සිද්ධි අධ්‍යයන අංක 05 - ශිරෝමි (අවුරුදු 27)

........එයා මේෂන් කෙනෙක්ට අත්වැඩ දෙන්න කොළඹ ගියාට පස්සේ මන් ගැන හෙව්වේ නෑ. එහේ ගෑනු කෙනෙකු සමග සම්බන්ධ වෙලා

කියලා ආරංචි උණා. දන්නෙම නැතිව එයා මගෙන් අයින් වෙලා ගියා. පස්සෙ මටත් වෙනත් කෙනෙකු එක්ක යන්න සිද්ධ වුණා......

මෙම අධ්‍යයන නියැදිය තුළ එක් විදේශ ගතවීමක්ද දක්නට ලැබුණු අතර, නැවත ඇය පැමිණෙන විට ස්වාමිපුරුෂයා වෙනත් අයකු සමග විවාහ සබඳතාවක් අරඹා තිබිණ. රැකියාව මත ප්‍රදේශයෙන් බැහැර වීම මෙන්ම ස්ථිර රැකියා නොමැති වීමද මෙම ගැටලුව සංකීර්ණ කර ඇත. රැකියාව නොමැති අවස්ථා පවුල් සබඳතා බිඳ වැටීම මෙන්ම වෙනත් සබඳතා නිර්මාණයටද හේතු වී ඇත.

සිද්ධි අධ්‍යයන අංක 02 - සුගත් (අවුරුදු 42)
....... රැකියාවක් නැති හින්දා මට කොළඹට යන්න සිද්ධ වුණා. ඒ අතරේ තමයි මගේ බිරිඳ වෙනත් අයෙකු සමග ගියේ .....

මෙහි හඳුනාගත හැකි තවත් ස්වරූපයක් වන්නේ පවුල් ඒකකයේ ආර්ථික ගැටලු හේතුවෙන් අධ්‍යාපනයෙන් ඉවත් වී අඩු වයසින් වතු කම්කරු ප්‍රජාවේ දරුවන්ට කුමන හෝ අංශයක රැකියාවන්වල නිරත වීමට සිදුවන බවයි. ඒ මත ඇති වන සබඳතා විවාහය දක්වා ගමන් ගන්නා බව මූලික ලක්ෂණයකි.

සම්මුඛ සාකච්ඡා - සහකාර වතු කළමනාකරු - නාකියාදෙණිය වත්ත
.......... මෙහෙ ගොඩක් පවුල්වල දෙමාපියන්ට හරියට රැකියාවක් නෑ. ආදායමක් නෑ. කන්න බොන්න අඩුපාඩු එමටයි. මේ හේතුවෙන් දරුවන්ටත් සිද්ධ වෙනවා කීයක් හරි හොයා ගන්න මොකක් හෝ රැකියාවක් සොයා ගන්න. ඒ අවස්ථාවන් ගොඩක්ම ඉවර වෙලා තියෙන්නේ විවාහයෙන් හරි, වෙන අසම්මත සම්බන්ධතාවයකින්...

ඒ අනුව, පැහැදිලි වන්නේ දිළිඳුකම හා බැඳුණු ආර්ථික සාධකයන් බහු විවාහක සබඳතා නිර්මාණය කිරීමට බලපෑමක් කර ඇති බවයි. රැකියා නොමැති වුවද ප්‍රජාවේ පරිභෝජන අපේක්ෂා සරල

නොවීම මත විවාහයෙන් වෙන්වීම් සිදු වීම තවත් විශේෂ ලක්ෂණයක් විය. එම අවශ්‍යතා වෙනත් අය මගින් සම්පූර්ණ කර ගැනීමට හුරු වීම මෙම අධ්‍යයන මඟින් මතු කර ගත් ප්‍රබල සාධකයක් විය.

**ප්‍රජාවගේ ඌන අධ්‍යාපන තත්ත්වය නම් සංස්කෘතික සාධකය බහුවිවාහ සබඳතා සඳහා කළ බලපෑම**

අධ්‍යයනයට ලක් කළ දත්තදායකයන්ගේ අධ්‍යාපන පදනම පසුබිම් කර ගෙන විවාහය පිළිබඳ මතවාදය හඳුනාගැනීමට අවස්ථාවක් ලැබුණි. ආර්ථිකමය වශයෙන්ද මෙම ප්‍රජාව ආන්තීකරණයට ලක් වී සිටි අතරම අධ්‍යාපනික වශයෙන්ද මෙම කණ්ඩායම වරප්‍රසාද අහිමි පිරිසක් විය. එය මෙම ප්‍රජාවේ සංස්කෘතික ලක්ෂණයක් වේ. මේ බව තහවුරු වනුයේ දත්තදායකයන්ගෙන් සාමාන්‍ය පෙළ සමත් මට්ටමේ කිසිවෙකු නොවීම මතය. වගු අංක 05 මගින් දැක්වූ ආකාරයට දත්තදායකයන්ගෙන් 10 ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය හදාරා තිබුණේ 03 ක් පමණි. නියැදියෙන් 14 දෙනෙක්ම 07 වන ශ්‍රේණියට වඩා පහළ පාසල් අධ්‍යාපනය ලැබූ පිරිසක් විය. ඒ හේතුවෙන් මෙම කණ්ඩායමේ සමාජ අවබෝධයද පැවතියේ පහළ මට්ටමකය. එය විවාහය වැනි ශක්තිමත් සම්බන්ධතා ගොඩනගන සමාජ සංස්ථාවක් නිර්මාණය කර ගැනීමට බාධාවක් විය. එම හේතුව මුල් විවාහයෙන් බැහැර වෙනත් සබඳතා ඉක්මනින් ඇති කර ගැනීමට පොළඹවන ලද සාධකයක්ද විය.

සම්මුඛ සාකච්ඡා 01- සහකාර වතු කළමනාකරු - නාකියාදෙණිය වත්ත ........ දරුවන්ට අධ්‍යාපනය හදාරන්න සුදුසු පසුබිමක් මෙම පවුල් ඇතුළේ නෑ. ලයින් කාමරවල දෙමළ මිනිස්සු ඉන්නේ. සිංහල වතු කම්කරුවන් ලයින් කාමරවල පදිංචි වී නැතත් එයාලගේ ගෙවල්වල තත්වයත් දරුවන්ට ඉගෙන ගන්න දිරිමත් කරන හෝ ඊට සුදුසු පසුබිමක් නෑ. මේ සිංහල මිනිස්සුත් දෙමළ මිනිස්සුත් දෙගොල්ලන්ම

ඉහළට ඉගෙන ගෙන නෑ. දෙමාපියන් ඉහළ අධ්‍යාපනයක් නොලැබීම නිසා දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ කියා අවශ්‍යතාවක් එයාල හඳුනාගන්නේ නැහැ. ඊළගට ඒගොල්ලන්ගේ දුප්පත්කම. මේ කරුණු පාසල් අධ්‍යාපනය වතු කම්කරු දරුවන්ගෙන් ඈත් වීමට හේතු වී තිබෙනවා.....

මේ හේතුවෙන් විවාහය වැනි සමාජ සංස්ථා පිළිබඳව අවබෝධය පවතින්නේ අවම වශයෙනි. විවාහයට ඇතුළුවීම මෙන්ම ඉන් බැහැරවීමද සරල කරුණක් වී ඇත්තේ මේ හේතුවෙනි. නීත්‍යාකූල නොවන වෙන්වීම් මෙන්ම ඉන් පසුව නීත්‍යානුකූල නොවන විවාහ සබඳතා ඇති කර ගැනීමටද එය ප්‍රධාන සාධකයක් ලෙසට බලපා ඇත.

සිද්ධි අධ්‍යයනය අංක 02 -සුගත් (අවුරුදු 42)
............ මං දෙවැනි පාරට විවාහ වුණේ කලින් විවාහය තිබියදීමයි. ඔය අහනකම් ඒක වැරැද්දක් විදියට මන්නම් දැක්කෙ නැහැ....

මෙයට හේතුව වන්නේද අඩු අධ්‍යාපනික පසුබිමයි. මෙම තොරතුරු සැපයූ දත්ත දායකයා අධ්‍යාපනය හදාරා තිබුණේ 04 ශ්‍රේණිය දක්වා පමණකි. ඔහුගේ පළමු බිරිඳ ද 04 වන ශ්‍රේණිය දක්වා අධාපනය ලබා තිබූ අතර දෙවන බිරිඳ 07 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබූ බව ප්‍රකාශ කරයි. අධ්‍යාපනය මගින් නිර්මාණය කෙරෙන පෞරුෂත්ව වර්ධනය මෙන්ම, දැනුම්වත්භාවය මෙම පිරිස අතර ඌනය. ඒ හේතුවෙන් විවාහ සම්බන්ධතාවලින් කඩිනමින් වෙන් වීමත් ඒ සමඟ වහාම වෙනත් සබඳතා ඇති කර ගැනීමද සරල මට්ටමකින් මෙම ප්‍රජාව තුළ ක්‍රියාත්මකය. එසේම මොවුන්ගේ අධ්‍යාපනය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් තම දරුවන් මුහුණ දෙන අසීරුතා, නොසලකා හැරීම්, සමාජ බැහැරකරණය, වෙනත් සමාජීය බලපෑම් පිළිබඳව මොවුන් සැලකිල්ලට ගෙන නොතිබුණි. ඒ කරුණුද බහුවිවාහ සඳහා මොවුන්ගේ

යොමු වීම පහසු කර ඇත. එසේම මොවුන්ගේ විනෝදාත්මක කටයුතු සරල මට්ටමේ වින්දනාත්මක අවශ්‍යතා සපුරන ඒවා විණ. රූපවාහිනිය නැරඹීම, ජංගම දුරකථන ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම ප්‍රජාව අතර ජනප්‍රියව දක්නට ලැබුණි. අධ්‍යයන නියැදියේ පහත තොරතුරු මගින් මෙම තත්ත්වය පෙන්නුම් කෙරේ.

**වගු අංක 14 - අධ්‍යයන ප්‍රජාවේ මාධ්‍ය භාවිතය**

| මාධ්‍ය | සංඛ්‍යාව |
|---|---|
| රූපවාහිනි නැරඹීම | 22 |
| ජංගම දුරකථන භාවිතය | |
| සාමාන්‍ය ජංගම දුරකථන | 07 |
| පහසුකම් සහිත (Smart Phone) ජංගම දුරකථන | 15 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

මෙම ප්‍රජාවේ රූපවාහිනී සියල්ලට චන්ද්‍රිකා හෙවත් සැටලයිට් සම්බන්ධතා පහසුකම් සහිත වීම විශේෂ ලක්ෂණයක් විය (ඇමුණුම අදක 02 බලන්න). එහිදී ඔවුන් ප්‍රධාන වශයෙන්ම රූපවාහිනිය භාවිතයට ගෙන තිබුණේ සිංහල සහ හින්දි චිත්‍රපට සහ ටෙලි නාට්‍ය නැරඹීමටය. එම මාධ්‍ය මඟින් ඇති කරන බලපෑමද ඇතැම් බහුවිවාහ සම්බන්ධතා නිර්මාණය වීමට හේතුවක් වන්නට ඇත. විශේෂයෙන් හින්දි, දකුණු ඉන්දීය දෙමළ සහ එහි අනුකරණ සහිත සිංහල ටෙලි නාට්‍ය මෙම ප්‍රජාව අතර ජනප්‍රියව පැවතිණි. එමගින් ඇති කරන ජීවන විලාසිතා සහ සම්බන්ධතා විවාහය පිළිබඳ මතවාද සකස් වීමටද හේතු වී ඇතැයි අනුමාන කළ හැකිය. එය සිද්ධි අධ්‍යයන මගින් ප්‍රදර්ශනාත්මකව දැක්නොවුවද, ඔවුන් නැරඹීමට ඉහළ කැමැත්තක් දක්වන වැඩසටහන් අනුව ඉහත අනුමානයට එළඹීම අපහසු නොවීය.

**සමාජ සංස්කෘතික ආකල්ප හා විශ්වාස බහුවිවාහ සබඳතා නිර්මාණයට බලපෑම**

සමාජයේ මතවාද හා විශ්වාස ගොඩනැගීමේදී අධ්‍යාපනය, මාධ්‍ය හා ආගම යන ආයතන ප්‍රබල බලපෑමක් සිදු කරයි. දෙවන විවාහයකට එළඹීමේදී අධ්‍යයන ප්‍රජාව සැලකිල්ට ගෙන තිබූ කරුණක් වූයේ සමාජීය වශයෙන් ඒ සඳහා කර ඇති බලපෑමයි.

සිද්ධි අධ්‍යයනය 06 - ප්‍රකාෂ් (අවුරුදු 44)
.......පළවෙනි විවාහය අසාර්ථක උණාම නැවත විවාහ වෙන්න අදහසක් තිබුණෙ නැහැ. ඒත් ගෙදර අයගෙ බල කිරීමට නැවතත් විවාහ වෙන්න සිදු වුණා....

ලාංකීය ග්‍රාමීය සමාජයේ මෙන්ම වතු සමාජයේද "තනිකඩව සිටීම" ගැටලුවකි. විවාහයකට ඇතුළු වීම ජීවිතයේ පරිපූර්ණත්වයට පත්වන අවස්ථාවක් ලෙස සැලකේ. එසේම මෙම වතු කම්කරු කාන්තාවන්ගේ පාර්ශ්වයෙන් බලන කල විවාහයට එළඹීම ආරක්ෂණ අවශ්‍යතාවක්ද වේ. විවාහය මත ගොඩනැගෙන රැකවරණය, ආරක්ෂාව යන මෙම අදහස් පෙරළා බහු විවාහක සම්බන්ධතා සඳහා ප්‍රධාන සාධකයක් ලෙසට බලපෑම් කරන්නේද වේ.

වගු අංක 14 ට අනුව අධ්‍යයන ප්‍රජාවේ දෙවන විවාහය සඳහා බලපෑ ප්‍රධාන සාධකයක් ලෙසට හඳුනා ගනු ලැබුවේ ආරක්ෂාවයි. එය 22.2% කි. මෙම අදහස ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවේ දෙවන විවාහයකට එළැඹුණ කාන්තාවන්ය. කාන්තාවන් පුරුෂයන් යටතේ ආරක්ෂාව සපයාගත යුතුය යන සමාජ මතවාදය මේ සඳහා හේතු වී ඇත.

සිද්ධි අධ්‍යයන 01- රාණි (අවුරුදු 30)

.............. තනියම ජීවත් වෙන්න හැමදාම බැරි නිසා පවුලේ අය කිව්වෙ ආරක්ෂාවට හොඳයි නැවතත් විවාහ වෙන එක කියලා...

ඒ අනුව දෙවන විවාහයට පොළඹවන සාධකයක් ලෙස සමාජ මතවාද හඳුනා ගත හැකි වේ.

**දරුවන්ගේ රැකවරණය පිළිබඳ සංස්කෘතික ආකල්ප බහුවිවාහ සබඳතා නිර්මාණයට බලපෑම**

දකුණු ආසියාතික සමාජයන්හි සංස්කෘතික ලක්ෂණයක්/ආකල්පයක් වන්නේ දරුවන්ගේ රැකවරණය පවුල පදනම් කර ගෙන ක්‍රියාත්මක වීමයි. එහිදී මව මෙන්ම පියාගේද භූමිකාව වැදගත් වේ.දකුණු ආසියාතික පැරණි සමාජයේ පළමු විවාහය බිඳී ගිය අවස්ථාවන්හි කාන්තාව මෙන්ම පිරිමියාද රැඳී සිටියේ විස්තෘත පවුල ආශ්‍රිතවය. එහිදී ඔවුන්ට දරුවන්ද සමග විස්තෘත පවුල සමග රැඳී සිටීමට සිදු විය.

සිද්ධි අධ්‍යයන අංක 01 - රාණි (අවුරුදු 30)

...... පළවෙනි සම්බන්ධයෙන් මට ලැබුණු දරුවා මගේ අම්ම ළඟ තියල තමයි මම රට ගියේ. ආපසු ලංකාවට ඇවිල්ලත් මම හිටියේ අම්මලත් එක්ක එකට....

ඒ අනුව තමන් දරුවෙක් ලෙස උපන් පවුලේ බලපෑම සහ රැකවරණය විවාහය බිඳී ගිය අවස්ථාකදී පවා වැදගත් විය. දරුවන්ගේ රැකවරණය පිළිබඳ ගැටලුව කාන්තාවන් වෙනත් විවාහයක් සඳහා යොමු වීමට බලපෑම් කළ ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගත හැකි විය. පළමු විවාහය අසාර්ථක වූ අවස්ථාවේදී දරුවන්ගේ අයිතිය මව වෙත මෙන්ම පියා වෙතද පැවරී තිබුණි. එය සිද්ධි අධ්‍යයන ආශ්‍රිතව පැහැදිලි විය.

සිද්ධි අධ්‍යයන අංක 02 - සුගත් (අවුරුදු 42)

.......මාස 1 ½ ක දරුවාගේ අයිතිය මම භාර ගත්තා. දරුවට අවුරුදු 14 ක් යනකම් මගේ දෙමව්පියෝ ගාව තමයි දරුවා හැදුණෙ......

**වගු අංක 15 - විවාහය අසාර්ථක වීමෙන් පසු දරුවන්ගෙ අයිතිය පැවරීම**

| මව | පියා | පවුලේ ඥාතීන් |
|---|---|---|
| 08 | 07 | 07 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

නැවත විවාහයක් කරා යොමු වීමට ප්‍රධාන හේතුවක් වූයේ දරුවන් රැක බලා ගැනීමට තනිවම කළ නොහැකි වීමේ ගැටලුවයි. එය වෙනත් සබඳතා සහ විවාහයන් සඳහා ගොනු කළ කරුණක් විය.

සිද්ධි අධ්‍යයනය අංක 01- රාණි (අවුරුදු 30)

............ දරුවා තනියම හදා ගන්නවට වඩා ආපහු පවුලක් වෙලා දරුවා බලා ගන්න එක හොඳයි කියල මට හිතුණා. දරුවගේ වගකීම් බෙදාගන්න ඕනෑ නිසා දෙවන විවාහයකට ගියේ. ඒකට මගේ දෙමාපියන්ගෙ අකැමැත්තක් තිබුණෙත් නෑ.........

එයින් පැහැදිලි වන්නේ දරුවන්ගේ රැකවරණය පිළිබඳ පැවති අපේක්ෂාවන්ද වතු කම්කරු අධ්‍යයන ප්‍රජාවේ දෙවන විවාහයක් සඳහා පසුබිම සකස් කර ඇති බවයි.

**බහුවිවාහ ක්‍රමය සාම්ප්‍රදායිකව පැවත එන සංස්කෘතික සාධකයක් වීම යන්නේ බලපෑම**

දකුණු ආසියාතික සමාජයන්හි අතීතයේදී සාම්ප්‍රදායිකව ජනප්‍රියව පැවතියේ බහුවිවාහ ක්‍රමයයි. එය ඒකවිවාහ ක්‍රමයක් බවට පත් වන්නේ බටහිර බලපෑම් සමඟිනි. වතු කම්කරු ප්‍රජාව ඉන්දීය සම්භවයක්

සහිතව ශ්‍රී ලංකාවේ ගත කරන කණ්ඩායමක් වීම මත තම මුල් සමාජයන්හි සබඳතා වර්තමානයේදීත් ප්‍රදර්ශනය කරයි. විවාහය පිළිබඳ අදහස් ගොඩනැගී ඇත්තේද ඒ අනුවය. ඒකවිවාහ ක්‍රමය පිළිබඳව ස්ථිර අදහසක් නොවීමටත් එය සංස්කෘතික වශයෙන් හේතුවක් වී ඇති බව අධ්‍යයනයේදී හේතු විය. අධ්‍යයනයට ලක් වූ ප්‍රජාව බහුවිවාහය ගැටලුවක් ලෙසට නොදක්වන්නේ මේ හේතුවෙනි. මේ අනුව පැහැදිලි වන්නේ වතු කම්කරු ප්‍රජාවේ බහුවිවාහක සබඳතා සඳහා එකිනෙකට වෙනස් සාධක රාශියක් බලපෑම් කර ඇති බවයි.

මෙම අධ්‍යයනය අනුව පෙනී ගියේ වතු ප්‍රජාව ඉතා පහළ ආදායම් ලබන, සමාජීය වශයෙන් ආන්තීකරණයට ලක් වූ කණ්ඩායමක් ලෙසට හඳුනාගත හැකි බවයි. ඔවුන්ගේ රැකියාව සහ පරිභෝජන රටාවද සකස් වී ඇත්තේ එම ආර්ථික, සමාජීය පරිසරයට ගැළපෙන ආකාරයටය. ලාංකික මහා සමාජය පිළිගනු ලබන අදහස් අනුව, අපොස සාමාන්‍ය පෙළ මට්ටමට අධ්‍යාපනය හැදෑරූ එක් පුද්ගලයෙකු හෝ දත්තදායකයින් අතර නොවීය. ඔවුන්ගේ ඌන අධ්‍යාපන මට්ටම සමාජීය වශයෙන් පිළිගත් ආර්ථික මට්ටමක් ළඟා කර ගැනීමට බාධවක් වී ඇති බව පැහැදිලි විය. විශේෂයෙන් කම්කරු රැකියාවට වඩා එහා ගිය රැකියාවන් මෙම වතු කම්කරු ප්‍රජාවට විවෘත වීම වළක්වා ඇත. මොවුන් අඩු කාලයකින් විධිමත් අධ්‍යාපනයෙන් බැහැර වීම මෙන්ම වෙනත් වෘත්තිය අධ්‍යාපනයක් වෙත යොමු නොවීම මත නිරන්තරයෙන් ඔවුන් යොමු වී ඇත්තේ අඩු ආදායම් ලබන රැකියා වෙතය.

සම්මුඛ සාකච්ඡා 01 -සහකාර කළමනාකරු - නාකියාදෙණිය වත්ත

............වතු කම්කරු ප්‍රජාව අතර අධ්‍යාපනයට ඇති නැඹුරුව අඩු වෙන්නේ ප්‍රධාන වශයෙන්ම ඒ පවුල්වලින් ඉගෙන ගන්න බලපෑමක් නොකරන නිසා. දරුවන් අඩු වයසින් රැකියාවට යොමු වෙනවා. අනෙක් අතට නිවසින් දරුවන්ට ආදරයක් ලැබෙන වටපිටාවකුත් නැහැ. ඒ

හින්දා පිටස්තර සමාජයට දරුවන් විවෘත වූ ගමන්ම අසම්මත සබඳතාවලටත් පෙළඹෙනවා...

රැකියා සඳහා අඩු වයසින් යොමු වීමත් සමඟම විධිමත් නොවන ආකාරයෙන් විවාහ සබඳතා සඳහා යොමු වීමට කැමැත්තක් දැක්වීම දක්නට ලැබෙන්නකි. නමුත් පසුව මුහුණ දෙන ආර්ථික ප්‍රශ්න විවාහ සබඳතා දීර්ඝකාලීන නොවී බිඳී යාමට හේතුවක් වී ඇත.

ඌන අධ්‍යාපන මට්ටමේ ප්‍රතිඵලයක් ලෙස වතු කම්කරු ප්‍රජාවගේ මාධ්‍ය භාවිතයේ ස්වභාවය, මත්පැන් භාවිතය ආදී කරුණු මහා සමාජය පිළිගත් නීතිමය ඒකීය විවාහය පිළිබඳ මතය ස්ථිරසාර නොවීමට හේතුවක් වී ඇත. මෙම අධ්‍යයන ප්‍රජාවේ ලක්ෂණයක් වූයේ චන්ද්‍රිකා තාක්ෂණය යටතේ ක්‍රියාත්මක වන රූපවාහිනී සබඳතා මෙන්ම පහසුකම් සහිත ස්මාර්ට් හෙවත් සුහුරු (Smart) ජංගම දුරකථන ඔවුන් අතර භාවිතයේ පවතින බවයි. ඔවුන් මෙම මාධ්‍ය භාවිතයට ගෙන ඇත්තේ ඉතා සරල මට්ටමේ වින්දනීය අවශ්‍යතා සපුරා ගැනීම සඳහාය. සිංහල, හින්දි, දෙමළ චිත්‍රපට, ටෙලිනාට්‍ය ඔවුන් අතර ජනප්‍රිය වීම මඟින් තම පෞද්ගලික ජීවිතයද ඊට අනුකූලව සකස් කර ගැනීමට අධ්‍යයන ප්‍රජාවේ කැමැත්තක් පවතින බව හෙළි විය. විවාහ සම්බන්ධතා පිළිබඳ මතවාද සකස් වීම සිදුවන්නේද මෙම භාවිතවල ස්වරූපය අනුවය. අඩු වයස්ගත විවාහ සඳහා යොමුවීමටත්, ඒ විවාහ අසාර්ථක වීමටත් මෙකී භාවිතයන් හේතු වී ඇත. එය ට්‍රැවිස් හර්ස්චි ඉදිරිපත් කරනු ලැබූ සමාජ පාලන න්‍යායටද අනුකූල වේ. සමාජ පාලන න්‍යායට අනුව අපගාමී හැසිරීම් ප්‍රදර්ශනය වන්නේ කණ්ඩායමක හෝ පුද්ගලයෙකුගේ හෝ සමාජ සම්බන්ධතා දුර්වල වූ අවස්ථාවන්හිදීය. එකී සමාජ පාලන න්‍යාය මගින් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ සමාජ සබඳතා නිර්මාණයට බලපෑම් කරන්නේ ඕනෑම සමාජයක් තුළ ක්‍රියාත්මක වන ආගම, පවුල, අධ්‍යාපනය වැනි සමාජ ආයතනයන්ය. අධ්‍යයනයට ලක් වූ මෙම

ප්‍රජාවේ ලක්ෂණයක් වූයේ ඒවැනි ආයතන සමග පවත්වනු ලබන සබඳතා අවම මට්ටමක පැවතීමයි. ආගමික ආයතන සමග සම්බන්ධ වීම ඉතා පහළ අගයක් ගනු ලැබූ අතර, අධ්‍යාපනික පසුබිමද අනුව පැහැදිලි වූයේ ඒ ආයතනික සබඳතාද දුර්වල මට්ටමක තිබීමයි. මේ හේතුවෙන් විවාහය පිළිබඳව පවතින්නේද පොදු සමාජයේ පිළිගත් සමාජ ආයතන මඟින් තහවුරු කරනු ලැබූ මතවාද නොවේ. ඒ අනුව මෙම වතු ප්‍රජාව විවාහය ස්ථිර පැවැත්මක් සහිත ආයතනයක් ලෙස හඳුනා නොගනී.

එය අඩු වයස් විවාහ සඳහා යොමුවීමට මෙන්ම එම විවාහ කෙටි කාලයකින් බිඳී යාමටත් හේතු වී ඇත. ඒ අනුව සමාජ පාලන න්‍යාය මඟින් ඉදිරිපත් කර ඇති තර්කය මේ පර්යේෂණය මඟින් තහවුරු වී ඇත. එමිල් ඩර්කයිම්, රොබර්ට් කේ. මර්ටන්, රිචඩ් ක්ලවුඩ් වැනි සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද අනෝමිය න්‍යායද මෙම අධ්‍යයනය සඳහා න්‍යායයක් ලෙස භාවිතයට ගනු ලැබීය. අස්ථාවර රැකියා ස්වරූපයන්, ඌන අධ්‍යාපන මට්ටමේ බලපෑම ආදි සාධක මත බහුවිවාහක සබඳතා වතු ප්‍රජාවේ උපසංස්කෘතියක් බවට පත් වීම මඟින් එම න්‍යාය තහවුරු කිරීමට හැකියාව ලැබී ඇත.

වතු කම්කරු ප්‍රජාව ඔවුන් අයත් සමාජීය පරිසරය මගින් බහුවිවාහක සබඳතා නිර්මාණයට යොමු වීම මගින් නිර්මාණය වී ඇති සමාජ ගැටලු අධ්‍යයනය කිරීමටද මෙම පර්යේෂණයේදී උත්සාහ දරනු ලැබීය. එහිදී විශේෂයෙන්ම අවධානයට ලක් කරනු ලැබුවේ දෙවන පරම්පරාවේ එනම් බහුවිවාහක කණ්ඩායම්වල දරුවන්ගේ ගැටලු කෙරෙහිය. බහුවිවාහ හේතුවෙන් ඉතා සංකීර්ණ ගැටලු රාශියකට එම දරුවන් මුහුණදී ඇත. ළමා අවධිය තුළ අත්‍යවශ්‍ය වන ළමා රැකවරණය, චිත්තවේගීය පෝෂණය හා සුබසාධනය අහිමි වීම් මේ අතර ප්‍රමුඛ වේ. දෙමාපියන් නීතිමය ආකාරයෙන් විවාහ නොවීම හේතුවෙන් උප්පැන්න සහතික ආශ්‍රිත ගැටලු පැන නැගීම, එලෙස නීතිමය ලියකියවිලි නැතිවීම

නිසා දරුවන් පාසල් වෙත ඇතුළත් කිරීමට නොහැකිවීමටද මේ තත්ත්වය බලපා ඇත. ඒ මත පාසල් අධ්‍යාපනයෙන් ගිලිහුණු දරුවන් මෙන්ම, පවුලේ රැකවරණය හා අවධානම නොමැති වීම හේතුවෙන් අධ්‍යාපනය අතහැර යාමද දක්නට ලැබේ.

**වගු අංක 16 - නියැදිය ආශ්‍රිත දරුවන්ගේ අධ්‍යාපන මට්ටම**

| අධ්‍යාපන මට්ටම | දරුවන් සංඛ්‍යාව | |
|---|---|---|
| | ගැහැනු | පිරිමි |
| පාසල් නොගිය | | 2 |
| 5 - 7 ශ්‍රේණි | 12 | 10 |
| 5 – 7 ශ්‍රේණි | 11 | 8 |
| 7 - 10 ශ්‍රේණි | 6 | 8 |
| 11 ශ්‍රේණිය දක්වා | 2 | 1 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය - 2021

පාසල් අධ්‍යාපනය හැර යාමෙන් පසුව දරුවන් ළමා ශ්‍රමිකයින් බවට පත් වීමද අධ්‍යාපනයේදී හඳුනා ගනු ලැබූ තත්ත්වයක් විය.

නිර්මාණය කර ගත් විවාහ සබඳතා වෙනස්වීම්වලට/ බිඳ වැටීමට ලක්වීමට මත්ද්‍රව්‍ය සහ මත්පැන් පානය ආශ්‍රිත ගැටලු හේතු වී ඇති බවද අනාවරණය විය. මෙය පවුල් ඒකක අතර ගැටුම් ඇති කළ සාධකයක්ද විය. ගෘහස්ථ හිංසනය සහ පවුල් ඒකක අත්හැරීම්/බිඳදැමීම සඳහා බලපෑ ප්‍රධාන සාධකයක් ලෙසටද එය හඳුනාගත හැකි විය.

වතු ප්‍රජාවේ බහුවිවාහ සබඳතා හේතුවෙන් බැහැර සමාජය තුළ මොවුන් සමාජීය වශයෙන් කොන් වීමද හඳුනාගත හැකි වූ ගැටලුවක් විය. වතු ප්‍රජාව අවට සාමාන්‍ය ග්‍රාමීය සමාජයේ නීතිමය ඒකීය විවාහයට ප්‍රමුඛතාවය දීම හේතුවෙන් වතු කම්කරුවන් ආශ්‍රිතව ඒ සමාජයෙන්

කොන්වීම සිදුව ඇත. එය ඔවුන්ගේ අනෙකුත් ආර්ථික හා සමාජ සම්බන්ධතා කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබේ.

සම්මුඛ සාකච්ඡා 02-ග්‍රාම නිලධාරී - හෝමදොළ

..... වතුවල වැඩ කරන අය නිරන්තරයෙන් ගමේ අනෙක් අයගෙන් වෙන් වෙලා ඉන්නේ. සමහර විට ගමේ අය කොන් කරනවා වගේ අදහසක් ඔවුන්ට ඇති. අනෙක් අයට තිබෙන ප්‍රශ්නම ඔවුන්ට තිබුණත් ඒවා විසඳගන්න ඔවුන් අනුගමනය කරන්නෙ සමාජ සම්මත නොවන ක්‍රියාමාර්ග. බහුවිවාහ ඒ වගේ එක් පැත්තක්. ඒ විදියේ නිල නොවන විවාහ නිසාම අපේ ගම්වල  සාමාන්‍ය මිනිස්සු මොවුන්ව විශ්වාස කරන්න අමාරු කට්ටියක් වශයෙන් දකිනවා...........

සම්මුඛ සාකච්ඡා 03 - ග්‍රාම නිලධාරී - හගරන්වල

....දෙමළ සිංහල කියල වෙනසක් නෑ, වතුවල කුලී වැඩ කරන මිනිස්සු දිහා අනෙක් අය බලන්නේ වෙනස් විදියකට. ඒ ගොල්ල චාරයක් නැති අය කියල අනෙක් මිනිස්සු හිතනව. ඇත්ත කථාව වෙන්නෙත් එයාල හැම ප්‍රශ්නයකටම උත්තර හොයන්නේ ප්‍රොපර් චැනල් එකේ නීතියට අනුව නොවෙයිනේ. මේ කසාද ගොඩක් කර ගන්න එකත් එකේම කොටසක්. එයාලට තේරුමක් නෑ. ඒ වැරදි ක්‍රමේටම ඒ ගොල්ලා හුරු වෙලා......

අනෙක් අතට බහුවිවාහක සබඳතා පවුල් ඒකක අතර අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමටත්, පවුල් ඒකක ආශ්‍රිතව දරිද්‍රතාවය ගැටලුවක් ලෙස වර්ධනය වීමටත් හේතුවක් වී ඇත.

සිද්ධි අධ්‍යයන 02 - සුගත් (අවුරුදු 42)

.................. එයා වෙන අයෙක් සමඟ සම්බන්ධයක් ඇති කර ගැනීම අපි අතරේ රණ්ඩු සරුවල් ඇති වෙන්න හේතුව වුණා. අවසානයේ එයා උගත් එක්කම ගියා..

ඒ අනුව මෙම බහුවිවාහක සබඳතා එකිනෙකට වෙනස් ගැටලු රාශියක් පැන නැගීමට බලපෑම් කරන්නක් ලෙසට හඳුනා ගත හැකිය.

**නිගමනය**

වතු කම්කරු ප්‍රජාව ශ්‍රී ලංකාවට වැවිලි ආර්ථිකය හඳුන්වාදීමත් සමඟම එකතු වන අතර, ඔවුන්ට අනන්‍ය උපසංස්කෘතික ලක්ෂණ වර්තමානය දක්වාම වෙනස් නොවී පවතී. ඒ අතර වැදගත් වන්නේ වතු කම්කරුවන් ලෙසට සිටින සිංහල ජන කොටස් අතරටද එම උපසංස්කෘතිකය විසරණය වී තිබීමයි. ඒ අනුව ජනවාර්ගික ප්‍රභේදයකින් තොරව මෙම බහුවෛවාහික සබඳතා මෙම ප්‍රජාව අතර ක්‍රියාත්මක වේ. ඒ හේතුවෙන් මෙකී බහුවිවාහ සබඳතා දෙමළ කම්කරුවන්ට පමණක් සීමා වූ ගැටලුවක් ලෙසට දැක්විය නොහැකිය. මෙම බහුවිවාහක සබඳතා නිර්මාණය වීමට බලපෑ සාධක අධ්‍යයනයේදී ආර්ථික සාධක, ඌන අධ්‍යාපන මට්ටම, මාධ්‍යවල බලපෑම ආදී සමාජ සංස්කෘතික හා ආර්ථික සාධක මෙකී බහුවිවාහ සඳහා පසුබිම සකසා තිබෙන බව පෙනී යන ලදි. මේ කරුණු සියල්ල මත වතු කම්කරුවන් සුවිශේෂ උපසංස්කෘතියක් ලෙස අඛණ්ඩව පැවතීගෙන යන ආකාරයත් එය ඔවුන් අතර බහුවිවාහක සබඳතා නිර්මාණය සඳහාත් බලපා තිබේ. පර්යේෂකයන්ගේ දැක්ම හෙවත් එටික් දෘෂ්ටිය මත එම සුවිශේෂ උපසංස්කෘතිය ගැටුම්කාරී හා පසුගාමී උපසංස්කෘති ලෙස හඳුනා ගත හැකිය. එසේ නමුත් මෙකී ප්‍රජාවගේ දැක්ම හෙවත් එමික් දෘෂ්ටියට අනුව මෙම බහුවිවාහක සම්බන්ධතා සමාජ විරෝධී ඒවා ලෙස නොසලකනු ලැබේ. මෙම බහුවිවාහ සම්බන්ධතා යන කාරණාව සඳහා විසඳුම් සොයන්නන් මෙකී සංස්කෘතික උභතෝකෝටිකයට පිළිතුරු සපයා ගත යුතුය.

## ආශ්‍රිත මූලාශ්‍ර


ඊරියගම, තිස්ස. (2011). **ශ්‍රී ලංකාවේ වතු විප්ලවය**, කොළඹː සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ.

ජයවීර,සුධීර. (2015). **සමාජවිද්‍යාවː අපගාමී චර්යා**, කොළඹː නුවණි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

ජයසිංහ, ඒ.කේ.ජී.(2017). **උසස් විද්‍යාත්මක න්‍යාය**, කොළඹː ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නගුලේස්වරන්, පී. (1963). "**19 වැනි ශත වර්ෂයේ ඉන්දියානු සංක්‍රමණික ප්‍රශ්නය ː නූතන යුගය**" ශාස්ත්‍රීය ලිපි පළමු කාණ්ඩය, කොළඹː තිසර පොත් ප්‍රකාශකයෝ.

නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2020). **සම්පත් පැතිකඩ වාර්තාව**, සැලසුම් අංශය, නාගොඩː නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

පීරිස්, රැල්ෆ්. (2005). **සිංහල සමාජ සංවිධානය**ː මහනුවර යුගය, කොළඹː විසිදුනු ප්‍රකාශන.

හේමන්ත කුමාර, එන්.වී.ජී.ඒ. (2017). **පවුල - ඥාති ක්‍රමය සහ විවාහය පිළිබඳ සමාජවිද්‍යාව**, ගාල්ලː නිව් නැෂනල් ප්‍රින්ටර්ස්.

හේමන්ත කුමාර, ඒන්.වී.ජී.ඒ. (2015). **සමාජවිද්‍යා ප්‍රවේශය**, මාතරː රුහුණු අධ්‍යයන කවය.

හේමන්ත කුමාර, එන්.වී.ජී.ඒ. (2009). **ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්**, කොළඹː විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

D, L. (2022). Tamil Marriage Practices during the Sangam Period. International Research Journal of Tamil, 4(S-20), 226-230. https://doi.org/10.34256/irjt224s2033 Accessed on 27.04.2024

Neubeck,K.J., Neubeck, M.A. and Glasberg, D. S. (2007). **Social Problems: A Critical Approach**,New York: Higher Education Publication.

Phillips, A. (2003). "Rethinking Culture and Development: Marriage and Gender among the Tea Plantation Workers in Sri Lanka", Gender and Development, Taylor and Prancis

Vol. 11, No. 2, Marriage (Jul., 2003), pp. 20-29, from https://www.jstor.org/stable/4030637

Sinha, T.P. (2023). Human Rights of the Tea Garden Workers: A Study on Hamidia Tea Estate, Institutional Economic Policy Paper Series, Volume 15, Issue 03, February 2023.


http://www.compensation.gov.lk, Accessed on 29.03.2023.

https://www.sagepub.com, Accessed on 22.10.2022

https://revisessociology.com, Accessed on 22.10.2022.

***ස්තුතිය :*** *මෙම පර්යේෂණය පිළිබඳ මූලික අදහස රෝපණය කළ ඒෂියන් ක්‍රෙඩිට් සමාගමේ විධායක අධ්‍යක්ෂ සුදත් ජයසේකරට සහ භාෂා දෝෂහරණය කළ නාලක ජයසේනට කතුවරුන්ගේ ස්තුතිය හිමි වේ.*

ඇමුණුම් අංක 01 : කෝවිලෙන් ලබා දෙන විවාහ සහතිකය



ARAPPOLAKANDA SRI MUTHTHUMARI AMMAN KOVIL - THONDAR SABAI

ARAPPOLAKANDA ESTATE, TEBUWANA.

Reg.N676/KAL/90

Date: 2011/05/18

MARRIAGIE CERTIFICATE

I hereby Certify that according to the Arapolakande Sri Muthumari Amman Kovil

Marriage Register Book

Mr Selliah. Velayadum.

got Married

Miss Velayudam. Annapooranam

on

11th day of November. 1971

Hindu Cultural Custom

Presided by

Ven - Rengasamy.

Date:- 2011/05/1[illegible]

President/Secaratary

# සිංහල බෞද්ධ මතවාදය තුළ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව : පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ භික්ෂූන්ගේ සමාජ- දේශපාලන ක්‍රියාකාරකම් ඇසුරින්

**නිශාන්ත හෙට්ටිආරච්චි**

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය තුළ තියුණු වාද-විවාදයන්ට පාත්‍ර වී ඇති බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව බොහෝ අධ්‍යයන කරනු ලැබ ඇත (Deegalle 2006, Bartholomeusz & De Silva 2001, Seneviratne 1999, Tambiah 1992, Gombrich & Obeysekera 1988). බෞද්ධ භික්ෂූව පිළිබඳ සිදුකළ සමහර අධ්‍යයන මගින් ඉදිරිපත් කළ මතය වනුයේ ශ්‍රී ලංකාවාසී සිංහල බෞද්ධ භික්ෂූන්ගෙන් වැඩි පිරිසක් සිංහල-බෞද්ධ දෘෂ්ටිමය ස්ථාවරයක් දරන බවත්, එය පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ ඇතැම් දේශපාලන පක්ෂ වල කේන්ද්‍රීය මතවාදය බවට පත්ව ඇති බවත් ය (Dewasiri 2016, De Votta 2007, Uyangoda 2007, Seneviratne 1999). මේ පසුබිම තුළ ඔවුන් දේශපාලන බලය ලබා ගැනීම සඳහා එය ප්‍රචාරක උපකරණයක් ලෙස යොදා ගන්නා ආකාරය හඳුනාගත හැකිය. බෞද්ධ භික්ෂූන් විසින් අනුගමනය කරන මෙම සිංහල-බෞද්ධ මතවාදය සමගින් මතුව තිබෙන ජනවාර්ගික සහ ආගමික ගැටුම් ශ්‍රී ලංකාව මෑත ඉතිහාසයෙහි මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුවක් බවට සැකයක් නැත. එසේම භික්ෂුවගේ කාර්යභාරය සාකච්ඡාවට ලක් කිරීම සම්බන්ධයෙන් සලකා බලන විට මෙය වර්තමානයේදී ශ්‍රී ලංකික භික්ෂූන් වෙත එල්ලව ඇති ප්‍රධාන

අභියෝගවලින් එකක් බවට ද සැකයක් නැත. එබැවින් වර්තමානයේ භික්ෂුවගේ සමාජ හා දේශපාලන කාර්යභාරය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීම දේශපාලන වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් ද එකසේ වැදගත් වේ. මෙම අධ්‍යයනය පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ මතවාදය අනුගමනය කරන ලද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව නිවැරදි අවබෝධයක් සඳහා තබන පියවරකි.

සිංහල-බෞද්ධ දෘෂ්ටියෙහි අභාෂය ලැබූ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන භූමිකාව සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති කථිකාවෙහි ප්‍රධාන අංශ දෙකක් මෑත කාලයේදී විද්වතුන් හඳුනා ගෙන තිබේ (උයන්ගොඩ, 2018). ඉන් පලමු අදහසින් ප්‍රකාශ වන්නේ පශ්චාත්-නිදහස් අවධියේ මුල් කාලයේ සිට දේශපාලන හා සමාජ කටයුතු වල නිරතව සිටි භික්ෂූන් වහන්සේලා විසින් සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිය ප්‍රවර්ධනය කළ බවත්, එය පශ්චාත්-නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මතවාදය බවට පත්ව ඇති බවත්, එමගින් සිංහල-බෞද්ධ අනන්‍යතාවය රටෙහි ජීවත්වන සුළුතර ජනවර්ගවල අනන්‍යතාවලට වඩා ඉහළින් ඔසවා තබා ඇති බවත් ය. දෙවැනි අදහසින් ප්‍රකාශ වන්නේ එම සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන ක්‍රියාමාර්ග, පශ්චාත් සිවිල් යුධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ මතවාදය නියෝජනය කරන ප්‍රධාන දේශපාලන පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දේශපාලන අභිලාෂයන් සපුරා ගැනීම සදහා යොදාගත් බවත් එහි ප්‍රතිඵල වශයෙන් රාජපක්ෂ රෙජීමය ශ්‍රී ලංකාවේ සුළුතර ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් කෙරෙහි පිටස්තරවාදී ආකල්ප හා චර්යාවන් ගොඩනගා ගෙන ඇති බවත් ය.

මෙම අධ්‍යයනය විමසීමට ලක් කරන්නේ ශ්‍රී ලංකාවේ පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව ඇගයුම් කරන්නටය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ මුල් කොටසින් කරනු ලබනුයේ ශ්‍රී ලංකාවේ භික්ෂු දේශපාලනය පිලිබඳව ප්‍රකාශිත සාහිත්‍ය විමර්ශනයට ලක් කිරීමයි. ඉන් අනතුරුව පර්යේෂණ අරමුණු හා ක්‍රමවේදය පැහැදිලි කර, පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව තුලින් ඉස්මතු වන විවිධ පැතිකඩයන් සහ එමගින් පෙන්නුම් කරන ලද භික්ෂු දේශපාලනයේ විවිධ දිශානතීන් විග්‍රහ කරනු ලැබේ. එහිදී ශ්‍රී ලංකාවේ භික්ෂු දේශපාලනය පිළිබඳ ප්‍රකාශිත සාහිත්‍ය මෙන්ම සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අදහස් විමසීමට ලක් කරනු ලැබේ. අවසාන වශයෙන් අධ්‍යයනයට ලක් කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව ඇසුරින් එළඹෙන නිගමන සාකච්ඡා කර තිබේ.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව දීර්ඝ ඉතිහාසයක් මුළුල්ලේ පැවත එන්නකි. භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාවේ වැදගත් අවස්ථාවක් වන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබුන රාජ්‍ය අනුග්‍රහයයි. මේ පිළිබඳ අධ්‍යයනය කළ අය විසින් හෙළිදරව් කරන ලද්දේ දේශපාලන නායකයන් නිතිපතා භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් වැදගත්වූ උත්සවවල ප්‍රධාන චරිත බවට පත්ව තුබූ බවයි (ලියනගමගේ, 2010, Malalgoda 1976, Obeysekara 1972). සම්ප්‍රදායක් ලෙස භික්ෂූන් වහන්සේලා අතර විවිධ නිකායන්හි

අභිනවයෙන් පත් වූ මහ නාහිමිවරුන්ට අක්තපත්‍ර පිරිනැමුවේ රටේ ජනාධිපතිවරයා හෝ අගමැතිවරයාය. බොහෝ දේශපාලනඥයන් රටේ පාලන ක්‍රියාවලියේ වගකීම් භාරගැනීමෙන් පසු ප්‍රධාන සංඝයා වහන්සේලාගේ බැහැදැකීමට ගියහ. එපමණක්ද නොව, අනෙකුත් දේශපාලන ප්‍රභූ සාමාජිකයන්ද එවැනි ක්‍රියාවලට නොවරදවාම සහභාගී වූහ. බෞද්ධ භික්ෂූන් සහ දේශපාලන බලය අතර ඇති සමීප සබඳතාව වඩාත් පැහැදිලිව ප්‍රකාශ වන්නේ අලුතින් පත් වූ ආණ්ඩුවල ප්‍රධානින් මහනුවර ප්‍රධාන භික්ෂූන් වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගැනීමේ සම්ප්‍රදාය තුළ ය. එපමණක් නොව දේශපාලනඥයෝ සිංහල බෞද්ධ රාජ්‍යයේ පරම සංකේතය වන දළදාවේ ආශිර්වාදය ද පතති. එබැවින් මේ සියලු කාරණා වලින් පැහැදිලි වන්නේ ඉතිහාසය මුළුල්ලේම භික්ෂූන් නොමද රාජ්‍ය අනුග්‍රහය ලබා ගනිමින් ස්වකීය සමාජ හා දේශපාලන කටයුතු පවත්වා ගෙන ගිය ආකාරයයි.

මහාවංශය බෞද්ධ භික්ෂූන් සමඟ රාජ්‍යය පවත්වා ගෙන ගිය සබඳතාවල ස්වභාවය, අන්තර්ගතය සහ රටේ පාලන කටයුතු සඳහා ඔවුන්ගේ මැදිහත්වීම සඳහන් කර ඇත (Gombrich & Obeysekera 1988, Kemper 1991, Amunugama 1985). එක් එක් රජවරුන් සහ රාජවංශයන් සමඟ භික්ෂූන් වහන්සේලාට ඇති සුහද සබඳතාව පමණක් නොව ගැටුම් ද එහි සටහන් කර තිබුණි. එහෙත් මහාවංස කතුවරයා දේවානම් පියතිස්ස රාජ සමයේ සිට යටත් විජිත සමය දක්වා සංඝයා වහන්සේලාට හිමි වූ තත්ත්වය විස්තර කර ඇත්තේ අතිශයෝක්තියෙනි (සෙනවිරත්න, 2001: 33-44). මෙයින් පැහැදිලි වන්නේ රාජ්‍යය නමැති නූතන දේශපාලන ආයතනයේ පැනනැගීමත් සමඟ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය ගොඩනැගීමට මහාවංස කතුවරයා කටයුතු කළ ආකාරයයි.

සමහර විද්වතුන් සංඝ සමාජය අතර පවත්නා බෙදීම සහ ඒවායේ දේශපාලන හා සමාජීය බලපෑම් කෙරෙහි අවධානය යොමු කර ඇත (Abeysekera 2002, Wickremerathne 1995). ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේ ප්‍රධාන නිකායන් තුනකට බෙදී ඇති අතර, එයින් සියම් නිකාය එහි විශාලතම හා පැරණිතම නිකාය වේ. සියම් නිකාය ශ්‍රී ලංකාවේ ප්‍රභූ පැලැන්තියේ සංඝයා වහන්සේලා නියෝජනය කරන නිකාය වන නිසා ඔවුන්ට රජයේ දේශපාලනඥයින්ගෙන් ඉහළ වරප්‍රසාද හිමිවී තිබේ. එසේම ඔවුන්ට ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ගේ මුදුන් මුල්කඩ බඳු වූ ශ්‍රී දළදා මාලිගාවේ භාරකාරත්වය ලැබී තිබේ. දෙවැනි විශාලතම භික්ෂු කණ්ඩායම අමරපුර නිකාය වන අතර එය සිංහල සමාජයේ ගොවිගම නොවන නිර්ප්‍රභූ කුල කණ්ඩායම් වලින් සැකසී ඇත. සිංහල බෞද්ධ ජාතිකවාදයේ ප්‍රකාශකයන් බවට පත්වූ සංඝයා වහන්සේලා සැලකිය යුතු පිරිසක් අමරපුර නිකාය නියෝජනය කරති (Hettiaarachchi 2017). අමරපුර නිකායේ හිටපු උත්තරීතර මහා නායක මඩිහේ පඤ්ඤාසීහ හිමි සිංහල බෞද්ධ ජාතිකවාදයේ ප්‍රමුඛ චරිතයක් විය (Senevirathne 1999). භික්ෂු භූමිකාව ගැන අධ්‍යයනය කළ මුල් පරම්පරාවේ විද්වතුන් ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වූයේ සංඝයා වහන්සේලා අතර භේදයට හේතු, ඒවායේ සමාජ-දේශපාලන ප්‍රතිවිපාක සහ ශ්‍රී ලාංකේය සමාජය සමඟ ඔවුන්ගේ සබඳතාවල ස්වරූපය පරීක්ෂා කිරීම කෙරෙහිය (Kempers 1984, Gembrich & Obeysekera 1988, Malalgoda 1976).

ශ්‍රී ලාංකේය දේශපාලනයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය පිළිබඳ සිදුකළ පර්යේෂණ අතුරින් එච්.එල්.සෙනවිරත්නගේ The Work of Kings: The New Buddhism in Sri Lanka (රජවරුන්ගේ කාර්යයඃ ශ්‍රී ලංකාවේ නව බුද්ධාගම) (1999)

යන්න සුවිශේෂී අධ්‍යයනයකි. එය සංඝ සමාජය පිළිබඳව සිදුකරන ලද අනෙකුත් අධ්‍යයනයන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වූයේ නූතන ශ්‍රී ලංකාවේ සමාජ හා දේශපාලන කාර්යෙහි නිරත භික්ෂූන්ගේ නව භූමිකාව කෙරෙහි ඔහුගේ අවධානය යොමු වූ බැවිනි. ඔහු විසිවැනි සියවසේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ භූමිකාව කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කර ඇත (Senavirathna 1999: 25). එසේම සෙනවිරත්නගේ අධ්‍යයනය මගින් බෞද්ධ නූතනවාදය පැනනැගීමේ පුළුල් රාමුව සාකච්ඡා කර තිබේ. ඒ අනුව යටත් විජිත සමයේ ඇතිවූ සුවිශේෂී වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම නවීකරණය කිරීම සඳහා නැගී එන නව පංතියක් ඉදිරියට පැමිණීම සිදුවිය. මේ නව පංතියේ මූලික ලක්ෂණය වූයේ නූතන ධනේශ්වර ක්‍රමයේ භාවිතයන් තුළින් මතුවන අභියෝගවලට මුහුණ දීම සඳහා බෞද්ධයන් විසින් රෙපරමාදු ආගමේ අංගයන් සහ උපායමාර්ග වැළඳ ගැනීමයි (Gombrich & Obeysekera 1988: 202-240). ඔබේසේකර (1972) මෙම ක්‍රියාවලිය හැඳින්වූයේ "ප්‍රොතෙස්තන්ත බුදුදහම" යනුවෙනි. එමගින් ක්‍රිස්තියානි ධර්මය ඇදහිල්ලක් ලෙස ප්‍රතික්ෂේප කරන අතරම බෞද්ධයෝ දැනුවත්ව තම ආගම ආදර්ශයට ගනිමින් ස්වකීය ජීවිතය ඒ අනුව හැඩගස්වා ගත්හ. මේ අයුරින් බුදුදහම නවීකරණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් භික්ෂූන් වහන්සේලාට නව භූමිකාවක් නිර්මාණය කෙරිණි.

බෞද්ධ භික්ෂුත්වය පිළිබඳ නව සංකල්පයක් 1930 සහ 1940 ගණන් වලදී වර්ධනය විය. එය වල්පොල රාහුල හිමි (1907-97) ප්‍රමුඛ විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලදී. වල්පොල රාහුල හිමි විසින් 1946 දී ප්‍රකාශයට පත් කරන ලද 'The Heritage of the Bhikkhu' (භික්ෂුවගේ උරුමය) එහි අත්පොත විය. සෙනවිරත්න

(1999) විසින් තර්ක කරන පරිදි එය ශ්‍රී ලාංකේය ථෙරවාදී බුද්ධාගමේ මෑත ඉතිහාසයේ වෙනත් කිසිදු ප්‍රකාශනයකට වඩා බලපෑම් කර ඇත. වල්පොල රාහුල හිමිට අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛ කාර්යභාරය දේශපාලනික එකක් විය (රාහුල, 2012: 120-122). දේශපාලන භික්ෂුවගේ ක්‍රියාකලාපය ස්වාර්ථය සමඟ කිසිදු සම්බන්ධයක් නොමැති බවත්, ඔවුන්ගේ න්‍යාය පත්‍රය ආත්මාර්ථකාමී චර්යාවෙන් ඔබ්බට ගිය සේවයක් බවත් එය බලලෝභී දේශපාලකයන්ගේ අරමුණු සමඟ ගැටෙන බවත් උන්වහන්සේ තර්ක කළේය (රාහුල, 2012: 1-5). මෙම චින්තන මාර්ගය අනුගමනය කළ එම භික්ෂූන් තමන් දේශපාලන ක්ෂේත්‍රයේ නීත්‍යානුකූල ක්‍රියාකාරීන් ලෙසත්, ශ්‍රී ලංකාවේ බුදු සමයේ ආරක්ෂකයින් ලෙසත් දුටුවේය. කෙසේ වෙතත්, එදිනෙදා දේශපාලනයේ ප්‍රායෝගික යථාර්ථයන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන් බොහෝ හානි සිදුකර ගත්තේය.

සමස්තයක් ලෙස භික්ෂුවගේ උරුමය කෘතිය මගින් වල්පොල රාහුල හිමියන් ඉදිරිපත් කළ මතවාදය මගින් භික්ෂූන්ට ගිහි අධ්‍යාපනය නිර්දේශ කිරීම, සාම්ප්‍රදායික පූජා, චාරිත්‍ර විධි වලින් ඔවුන් ඈත් කිරීම සහ වර්තමානයේදී භික්ෂූන්ට සිය වෘත්තිය ලෙස සමාජ සේවය යෝජනා කිරීම සහ එමගින් භික්ෂූන් දේශපාලනය වෙත යොමු කිරීම සඳහා පෙළඹීම යන අංශ අවධාරණය කෙරිණි. රාහුල හිමිගේ භික්ෂුවගේ උරුමය රචනාව සම්බන්ධයෙන් සෙනවිරත්නගේ අවසාන නිගමනය වූයේ භික්ෂුවගේ උරුමය ප්‍රකාශනය භික්ෂු දේශපාලනයේ රැඩිකල් වෙනසක් ඇති කිරීමට මඟ පෑදූ බවයි (Senewirathne, 1999: 185-186).

ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් සමයේ ආරම්භයේ පැවති දේශපාලන වාතාවරණය ගැන සිංහල බෞද්ධ කණ්ඩායම්වල විශේෂිත දුක්ගැනවිල්ලක් විය (Phadnis 1976, Malalgoda 1972, Wriggins 1960).

එමගින් ප්‍රකාශ වූයේ නිදහස් ලංකාවේ දේශපාලන බලය හිමිකරගත් ආණ්ඩු යටත් විජිත යුගයට පෙර බුද්ධාගම හිමිකරගත් බලගතු ස්ථානය නිසි ලෙස ප්‍රතිෂ්ඨාපනය කර නොතිබුණු බවයි. එම පසුබිම තුළ රාජ්‍යය තුළ බුද්ධාගමේ විධිමත් භූමිකාව වැඩිදියුණු කිරීම සඳහා විශ්වාසය තැබිය හැකි වැඩ පිළිවෙලක් කෙරෙහි සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලනඥයන්ගේ අවධානය යොමු විය (Thambiah, 1992: 30-41). මේ අවධියේ එම අරමුණෙන් යුතුව කටයුතු කළ දේශපාලන කණ්ඩායමක් වූයේ මහජන එක්සත් පෙරමුණයි. ඔවුන් 1956 දී බලයට පත්වීමත් සමඟ සිංහල බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් වඩාත් පැහැදිලිව ප්‍රකාශ විය. මේ සඳහා බලපෑම් කළ එක්සත් භික්ෂු පෙරමුණ ද ඊට සමගාමීව බිහි විය (Weerawardana 1960). එය නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලන අරමුණක් සහිතව බිහි වූ පළමු භික්ෂු සංවිධානය වේ. එක්සත් භික්ෂු පෙරමුණ 1956 මැතිවරණයේදී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිංහල පමණක් ප්‍රතිපත්තිය හා බුදුදහම ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධ සටන් පාඨය සඳහා පූර්ණ සහයෝගය ලබා දුන්නේය (Thambiah, 1992: 30-41). එම වසරේම පවත්වන ලද බුදුන් වහන්සේගේ පිරිනිවන් පෑමේ 2500 වැනි සංවත්සරය ද ඔවුන්ගේ අරමුණට උපකාර විය (Obeysekera 1972). එම සැමරුම ශ්‍රී ලාංකේය

සමාජය සහ දේශපාලනය තුළ බුදුදහමේ ඇති වැදගත්කම පිළිබඳ ජනප්‍රිය හැඟීම්වලට ආයාචනා කළේය (Kearney 1976).

1956 මහ මැතිවරණය පිටුපස ඇති බලවේග අධ්‍යයනය කළ විද්වතුන් හෙළි කළේ ආගම සහ භාෂාව පදනම් කරගත් භික්ෂු සංවිධානවල භූමිකාව මැතිවරණයේ අවසාන ප්‍රතිඵලය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් බවයි (Phadnis 1976, Wriggins 1960, Vittaci 1958). එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංස්කෘතික අමාත්‍යාංශයක් ඇති කිරීම වැනි පියවර මගින් රාජ්‍යය බුද්ධාගමට අනුග්‍රහය දැක්වීමට පටන් ගත්තේය. අනතුරුව එළඹී කාල පරිච්ඡේදය තුළ බලයට පැමිණි ආණ්ඩු බුදුදහම සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග භික්ෂූන්ගේ අමන්දානන්දනයට හේතු විය. ඒ අනුව පළමු හා දෙවන ජනරජ ව්‍යවස්ථා යටතේ බුද්ධාගමට නිල පිළිගැනීමක් ලබාදීමෙන් ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම ආගමික රාජ්‍යයක් බවට පත් නොකළත්, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලැබෙන ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම සංඝයාගේ අතිමහත් සොම්නසට හේතුවක් විය (Wilson, 1974: 68).

ශ්‍රී ලාංකේය භික්ෂුව සහ දේශපාලනය පිළිබඳ තවත් සමහර විද්වතුන් අවධානය යොමු කළේ නැගී එන සීමාන්තික සිංහල-බෞද්ධ ජාතිකවාදී අදහස් මගින් භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කටයුතු කෙරෙහි සිදුකල බලපෑම කෙරෙහි ය (Kumar 2018, Dewasiri 2016, DeVotta 2007, Abeysekera 2001) සමකාලීන ශ්‍රී ලාංකේය බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි සිංහල ජාතිකවාදී මතවාදයේ දැඩි බලපෑම් එල්ල වී ඇත (Frydenlund 2005, Senevirathne 1999, Tambiah 1992, Mitchel 1979). භික්ෂූන් වහන්සේලාගේ මෙන්ම ගිහි පැවිද්දන් ගේ ද අනුග්‍රහය ලැබූ මෙම

මතවාදයට අනුව සිංහලයාගේ පැරණි ශ්‍රී විභූතිය යළි ඇති කිරීම භික්ෂුවගේ ප්‍රමුඛ කාර්යයක් විය. එමගින් ප්‍රකාශිත යථාර්තයක් වූයේ, සිංහල ජාතිය යනු , සරල බවින් අනුන හා බෞද්ධ සදාචාරයට අනුකූලව ජීවත් වූ ජනතාවක්ය යන්නයි.

පශ්චාත් සිවිල් යුධ සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ සාමය ගොඩනැගීම හා සංහිදියා ක්‍රියාවලිය බරපතල අභියෝගයක් බවට පත්ව තිබේ. බර්තොලමියුස් සහ සිල්වා යන අයගේ *The role of the Sangha in the Reconciliation* (සංහිදියා ක්‍රියාවලියේ භික්ෂුවගේ කාර්යභාරය) (2001) නමැති අධ්‍යයනය මගින් සාමය ගොඩනැගීම හා සංහිදියා ක්‍රියාවලිය තුළ සංඝයා වහන්සේලාගේ කාර්යභාරය සාකච්ඡා කරයි. මෙම අධ්‍යයනය මගින් කතුවරුන් ඉදිරිපත් කළ ප්‍රධාන තර්කය වන්නේ සිංහල හා දෙමළ ජනයා අතර දිර්සකාලින සාමයකට මගපාදන බලය බෙදාගැනීමේ ක්‍රියාවලියට භික්ෂූන් එරෙහි වීමට බොහෝ දුරට වගකිව යුත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලබන අධ්‍යාපනය බවයි (Bertholomeusz & Silva 2001: 1). භික්ෂු අධ්‍යාපන ක්‍රමයේ යෝග්‍ය වෙනස්කම් ඇතිකිරීමෙන් ශ්‍රී ලංකාවේ සංඝයා වහන්සේ දෙමළ සහ මුස්ලිම් ඇතුළු අනෙකුත් ප්‍රජාවන් කෙරෙහි වඩාත් සහනදායි ආකල්පයක් අනුගමනය කරනු ඇතැයි ඔවුහු විශ්වාස කරති. මේ පිළිබද අවධානය යොමු කළ ඇතැම් විද්වතුන් පවසන්නේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේදී භික්ෂූ අධ්‍යාපනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු බවත් දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයන් එහි විෂය මාලාවට ඇතුලත් කළ යුතු බවත්ය (Uyangoda 2007).

ශ්‍රී ලාංකේය බුද්ධාගමේ තුන්වන සහස්‍රකය භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන ඉතිහාසයේ වඩාත් අවේගකාරී අවධියක් සනිටුහන් කළේය. මෙහිදී සංඝ සමාජයෙන් කොටසක් සෘජුවම

දේශපාලනයට සම්බන්ධවීමත්, තවත් කොටසක් වක්‍රාකාරයෙන් දේශපාලනයට බලපෑම් කිරීමත් හඳුනාගත හැකිය. මෙම කාරණය පිළිබඳව අධ්‍යයන ගණනාවක් කෙරී ඇත (Dewasiri 2016, DeVotta 2007, Uyangoda 2007). ඒ අනුව සංඝයාගේ දේශපාලන ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් බවට පත්වෙමින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා මැතිවරණ දේශපාලනය හරහා (2001 සහ 2004 පාර්ලිමේන්තු මැතිවරණ) පාර්ලිමේන්තු දේශපාලනයට පිවිසුණු අතර, සමහරෙක් ශ්‍රී ලංකාවේ වාර්ගික හා ආගමික ගැටුම් වලට දායක වෙමින්, ප්‍රචණ්ඩකාරීව හැසිරෙමින්, ප්‍රධාන ධාරාවේ දේශපාලන බලවේගවල අතකොලු බවට පත් විය (Deegalle 2006: 233-234).

ඉහතින් සාකච්ඡා කරන ලද සාහිත්‍ය විමර්ශනයේ සෙනවිරත්න ගේ The Work of Kings: The New Buddhism in Sri Lanka හෙවත් රජවරුන්ගේ කාර්යය: ශ්‍රී ලංකාවෙහි නව බුදුසමය නම් කෘතිය සමකාලීන ශ්‍රී ලාංකේය භික්ෂු දේශපාලනය අධ්‍යයනය කිරීමට සහ මෙම අධ්‍යයනයට අදාළව භික්ෂුවගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමට විශාල දායකත්වයක් ලබා දුන්නේය. සිය කෘතියෙන් සෙනවිරත්න අපේක්ෂා කළේ ශ්‍රී ලංකාවේ නව බුදුසමය වෙතින් ඉවසීම, අවිහිංසාව, සහ බහුත්වවාදය, වැනි විශ්ව සාධාරණ ගුණාංගවලින් හෙබි ලෞකික සමාජයක් ඇති කිරීම සඳහා කැප වූ සංඝ සමාජයක් බිහි කිරීමට අපොහොසත් වුයේ ඇයි ද යන්න සාකච්ඡා කිරීමයි. එබැවින් පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය විශ්ලේෂණය කිරීමේදී සෙනවිරත්න ගේ කෘතිය මෙම අධ්‍යයනයට බොහෝ සේ උපකාරී වූ බව කිව යුතුය.

මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනයේ දක්වන ලද ප්‍රකාශිත සාහිත්‍ය මගින් විවිධ විද්වතුන් විසින් භික්ෂූන්ගේ සමාජ සහ දේශපාලන භූමිකාවේ විවිධ පැතිකඩයන් විශ්ලේෂණය කර තිබේ. ඒ අනුව ඔවුන් රාජ්‍ය - භික්ෂු සබඳතාවල ස්වභාවය; භික්ෂු සමාජය අතර පවත්නා බෙදීම සහ ඒවායේ දේශපාලන හා සමාජීය ප්‍රතිවිපාක; භික්ෂුවගේ නව දේශපාලන භූමිකාව; පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලනයේ ස්වභාවය; ජනවාර්ගික-ජාතිකවාදය මගින් භික්ෂු දේශපාලනයට සිදුකල බලපෑම; පශ්චාත් සිවිල් යුධ සමයේ ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම හා සංහිදියා ක්‍රියාවලිය සහ ශ්‍රී ලාංකේය බුද්ධාගමේ තුන්වන සහස්‍රකය තුළ භික්ෂූන්ගේ දේශපාලන කටයුතු යනාදී තේමාවන් සාකච්ඡා කර තිබේ. මේ අධ්‍යයනය මගින් භික්ෂු දේශපාලනය සම්බන්ධයෙන් මෙතෙක් අධ්‍යයනය නොකළ තේමාවක් සාකච්ඡා කරන්නට යෙදුනි. මෙහිදී අධ්‍යයනයට බඳුන් වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම් වූ භික්ෂූන් වහන්සේලා පශ්චාත් සිවිල් යුධ අවධියේ සිදුකළ සමාජ හා දේශපාලන කාර්යභාරය පිළිබඳවයි. මෙහිදී මින්පෙර කිසිදු පර්යේෂණයකින් සාකච්ඡාවට බඳුන් නොවූ ධාරාවන් දෙකක් ඉස්මතු විය. පළමුවැන්න වන්නේ පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ කේන්ද්‍රීය ප්‍රපංචයක් බවට පත්ව තිබූ රාජපක්ෂ සාධකය මගින් භික්ෂු දේශපාලනයට සිදුකළ බලපෑම ඇගයීමට ලක් කිරීමයි. දෙවැන්න මගින් අපේක්ෂා කරන්නේ පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය විශ්ලේෂණය කිරීමයි. එබැවින් මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම අපේක්ෂිතය.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය තේරුම් ගැනීමය. එම භික්ෂූන්ගේ කාර්යභාරය අධ්‍යයනය කිරීම තුළින් තේරුම් ගැනීමට අපේක්ෂා කරන්නේ, භික්ෂූන් තමන්ගේ කාර්යභාරය ලෙස සලකන්නේ කුමක්ද යන්න ඇගයීමය. මේ සඳහා පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් වල ප්‍රතිවිපාක විශ්ලේෂණය කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදී බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව විශ්ලේෂණය කරනු ලැබේ. මෙම අධ්‍යයනය ගුණාත්මක ක්‍රමවේදය මත පදනම් විය. අධ්‍යයනය සඳහා තොරතුරු ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රවලින් ලබා ගන්නා ලදී. බස්නාහිර පළාතේ තෝරාගත් විශ්ව විද්‍යාල කිහිපයක ත්‍රිවිධ නිකායන් නියෝජනය වන පරිදි තෝරාගත් අධ්‍යයන සහ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු සමග සිංහල-බෞද්ධ ජාතිකවාදය, සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන කාර්යභාරය සහ රාජපක්ෂ රෙජීමය සංඝ සමාජයට කළ බලපෑම යන ක්ෂේත්‍ර ඔස්සේ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. එමගින් සිංහල බෞද්ධ මතවාදය පිළිබඳව ඔවුන් තුළ ඇති විවිධ කතිකාවන් තේරුම් ගැනීමට උත්සාහයක් ගන්නා ලදී. මෙයට අමතරව බස්නාහිර පළාතේ තෝරාගත් බෞද්ධ උගතුන් කිහිප දෙනෙකු සමග පර්යේෂණයේ තේමාවට අදාළව පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මගින් දත්ත රැස් කරන ලදී.අධ්‍යයනය සඳහා යොදා ගත් ද්විතියික මූලාශ්‍ර වන්නේ බුදුදහම පිළිබඳ ලියවී ඇති

ග්‍රන්ථ, සගරා ලිපි, පුවත්පත් ලිපි, සහ අන්තර් ජාලයෙන් ලබාගත් විවිධ මූලාශ්‍ර යනාදියයි. මෙලෙස එකතු කරන ලද තොරතුරු සාහිත්‍ය සමීක්ෂණයේදී රැස් කරන ලද පුළුල් පරාසයක ලේඛන සමඟ විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත.

## සාකච්ඡාව

පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව තුළින් ප්‍රතිදානය වන අනුභූතික සොයාගැනීම් පිළිබඳව මෙහිදී විශ්ලේෂණයක් සිදු කරයි. ඒ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගේ දේශපාලන හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණයේදී හඳුනාගත් ප්‍රතිපල කිහිපයක් මෙහිදී සාකච්ඡා කරනු ලැබේ. එනම් සිංහල- බෞද්ධ ජාතිකවාදය සහ සංඝ සමාජය, ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය, සහ රාජපක්ෂ රෙජීමය මගින් සංඝ සමාජයට සිදු කල බලපෑම පිළිබඳව මෙහිදී අවධානය යොමු කළේය.

## සිංහල- බෞද්ධ ජාතිකවාදය සහ සංඝ සමාජය

රටක ජීවත්වන සෑම ජන වර්ගයකටම ඔවුන්ගේ ඓතිහාසික වර්ධනය සහ සංස්කෘතිය මත හැඩගැසුනු මතවාදයක් තිබේ. එක් එක් ජන වර්ගවලට සිය පැවැත්ම සඳහා එබඳු මතවාදයක් අත්‍යාවශ්‍ය වේ. මේ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය මගින් ප්‍රකාශ වන්නේ කුමක්ද යන්න සහ එය ස්වකීය මතවාදය බවට පත්කර ගත් සංඝ සමාජය හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ එක් පරමාර්ථයකි. ශ්‍රී ලංකාවේ වාසය කරන ජනයා වර්ගිකත්වයෙන්, භාෂාවෙන්, සහ ආගමෙන් විවිධ වෙති. ඉතිහාසය මුළුල්ලේම, රටේ බහුතරය වන සිංහල-බෞද්ධ කණ්ඩායම් විසින් අසිංහල, අබෞද්ධ යනුවෙන් හඳුන්වනු ලබන සුළුතරය හිංසනයට හා පීඩනයට භාජනය කර තිබේ. මේ අයුරින්

සිංහල බෞද්ධ බහුතරය විසින් ශ්‍රී ලංකාවේ ජීවත් වන සුළුතර කණ්ඩායම් වලට එරෙහිව ක්‍රියාත්මක කරන ලද හිංසනයට හා පීඩනයට දෘෂ්ටිමය පදනම සපයනු ලබන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය මගිනි. කෙසේවෙතත් සිංහල-බෞද්ධ ජාතිකවාදය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සමබන්ධයෙන් විද්වතුන් අතර පොදු එකගතාවයක් නොමැත.

බොහෝ ශාස්ත්‍රීය අධ්‍යයන මගින් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ අර්ථය, ඓතිහාසික විකාශනය හා මෑතකාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරීමට කටයුතු කර ඇත (Scott 1994, Gombrich & Obeysekera 1988, Malaloda 1976). ගොම්බ්‍රිජ් හා ඔබේසේකර ට අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදය යනු සිංහල සංස්කෘතිය පසුබිම් කොට ගොඩනැගූ බුදුදහමයි (Gombrich & Obeysekera 1988). ඔවුහු තවදුරටත් අවධාරණය කරන්නේ ථේරවාද බුදුදහම කෘෂිකාර්මික පදනමක් සහිත ලංකාවේ ග්‍රාමීය සමාජයට අනුකලනය වීමෙන් සිංහල-බෞද්ධ ජාතිකවාදය බිහි වූ බවයි. කෙසේවෙතත් ඔවුන්ගේ මතය වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදය යන්න එකිනෙකට වෙනස් ස්ථර ලෙස නොව ඒකීය ආගමික සම්ප්‍රදායක් ලෙස තේරුම් ගත යුතු බවයි. මේ අනුව ථේරවාදී බුදුදහමේ මූලික ඉගැන්වීම්, ග්‍රාමීය සිංහලයන්ගේ විශ්වාස හා මිත්‍යාමත වල සංකලනයෙන් සිංහල සංස්කෘතිය සහ වාර්ගිකත්වය කෙරෙහි අවධානය යොමු කරන ශ්‍රී ලාංකීය දේශපාලන දෘෂ්ටිවාදයක් ලෙස සිංහල-බෞද්ධ ජාතිකවාදය තේරුම් ගත හැකිය.

1970 ගණන්වල සුළුතර වාර්ගික ප්‍රජාවන්ට එරෙහිව කෙරුණු ප්‍රචාරක කටයුතු වල ප්‍රතිපලයක් වශයෙන් සිංහල-බෞද්ධ

ජාතිකවාදයේ ඇතිවූ වර්ධනයන් සම්බන්ධයෙන් කුමාරි ජයවර්ධන අදහස් දැක්වුයේ මෙසේය;

"සිංහල ජනවර්ගය ලංකාවේ පළමු ප්‍රථමික වැසියෝ වෙති. මේ ලක්බිමේ පූර්ණ අයිතිය ඔවුන් සතුය. කලාපිය වශයෙන් ගත් කළ සිංහල ජනතාව සුළුතරයකි. ඔවුන්ට ලංකාව හැරෙන්නට වෙන රටක් නැත. ලංකාවේ වාසය කරන අනිකුත් ජනවර්ගයන්ට වෙනත් රටවල්, ජනවාර්ගික සම්බන්ධතා හා අවශ්‍යතාවන් ඇත. සිංහලයන් හා බුද්ධාගම අතර විශේෂ සම්බන්ධතාවයක් ඇත. සිංහලයෝ බෞද්ධාගමේ ආරක්ෂකයෝය" (ජයවර්ධන, 2000: 63-64).

මේ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදයට පදනම්වූ ප්‍රධාන අදහස් කිහිපයකි. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන්ම බෞද්ධ රටකි. එහි අයිතිය ඇත්තේ සිංහල-බෞද්ධයන්ට පමණි. අනෙක් සිංහල-බෞද්ධ නොවන අය සිංහල-බෞද්ධයන්ගේ මෙම තනි අයිතිය පිළිගන්නා තාක් කල් කිසිදු ගැටලුවකින් තොරව මෙහි ජීවත් වීමට අවසර ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ගෙන් බහුතරය සිංහලයන් වන බැවින්, ඔවුන්ගෙන් බහුතරයකගේ ආගම බුදු දහම වන නිසා සිංහල-බෞද්ධ දෘෂ්ටිය රටේ ජාතික මතවාදය විය යුතුය යන්න මේ මතවාදයේ හරය වේ.

ඩි. වොට්ටා ට (DeVotta) අනුව සිංහල බෞද්ධ ජාතිකවාදය යනුවෙන් හැඳින්වෙන්නේ ඒකීය ශ්‍රී ලංකා රාජ්‍යය තුළ සිංහල බෞද්ධ ආධිපත්‍යය පුළුල් කිරීමට සහ චිරස්ථායී කිරීමට යොදාගත් ජාතිකවාදී මතවාදයකි (DeVotta 2007). ඔහු තවදුරටත් තර්ක කරන්නේ සිංහල බෞද්ධ ආධිපත්‍යය ආයතනගත කිරීම සඳහා නීති, රීති, ආයතනික ව්‍යුහයන් නිර්මාණය කිරීම සහ මෙම මතවාදයට එකඟ නොවන අය රාජ්‍යයේ සතුරන් ලෙස සලකා ප්‍රහාර එල්ල කිරීමද සිදු වූ බවයි.

එමෙන්ම, ශ්‍රී ලංකාව යනු ථේරවාදී බුද්ධාගමේ කේන්ද්‍රස්ථානය බවත් එය සිංහල බෞද්ධයන්ට අයිති බවත්, දෙමළ සහ වෙනත් අය එහි ජීවත් විය යුත්තේ සිංහල බෞද්ධ ආධිපත්‍ය පිළිගෙන දෙවැනි පංතියේ පුරවැසියන් ලෙස බවත් එම මතවාදයෙන් ප්‍රකාශ වේ. එපමණක් ද නොව දහනවවැනි සියවසේ අගභාගයේ සහ විසිවන සියවසේ වාසය කළ භික්ෂූන් සහ දේශපාලනඥයන් විසින් ඉදිරිපත් කරන ලද සිංහල බෞද්ධ මිථ්‍යා-ඉතිහාසය ද එහි සංවර්ධනයට බොහෝ සේ බලපා ඇත.

සිංහල-බෞද්ධ ජාතිකවාදය පිළිබඳ විග්‍රහයක යෙදෙන සෙනවිරත්නයන් (2001), එමගින් සංඝ සමාජයට ඇති කෙරෙන බලපෑම කුමක්දැයි විස්තර කළේය. ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන සිංහල-බෞද්ධ ජාතිකවාදය මගින් සංඝ සමාජය වෙත ඇති කරන ලද බලපෑම තල දෙකකින් විස්තර කළ හැකිය (සෙනවිරත්න, 2001). එනම් පළමුව බෞද්ධ රාජ්‍ය ගොඩනැගීමේ ක්‍රියාවලිය හෙවත් රාජ්‍ය, රාජ්‍යත්වය සහ මහජනයා බුද්ධාගම සමග අනන්‍යවීමේ ක්‍රියාවලිය තුළ භික්ෂුව ඉටුකරන කාර්යභාරයයි. දෙවනුව බෞද්ධ ආශ්‍රමය තුළ භික්ෂුව ඉටුකරන අධ්‍යාපන හා සංස්කෘතික කාර්යභාරයයි. මේ අනුව බෞද්ධ භික්ෂුව සාර්ව වශයෙන් බෞද්ධ රාජ්‍යය ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළත්, ක්ෂුද්‍ර වශයෙන් බෞද්ධ ආශ්‍රමය ඇසුරින් මහජනතාවගේ දෛනික ජීවිතය තුළට සමාජීය හා සංස්කෘතික වශයෙන් බලපෑම් කරනු ලබයි.

ඉහතින් සඳහන් කළ විග්‍රහයන්ට අනුව සිංහල බෞද්ධ ජාතිකවාදය හැඳින්විය හැක්කේ වාර්ගික ආගමික ස්වභාවයක් ගන්නා, සිංහල භාෂාව මෙන්ම බුද්ධාගම ද උකහා ගන්නා ජාතිකවාදයක් ලෙස ය. එහි අතිමූලික සූත්‍රගත කිරීම වන්නේ ශ්‍රී ලංකාව වනාහි සිංහල-බෞද්ධයන්ට පමණක් අයත් යැයි අවධාරණය කිරීමය. සිංහල-බෞද්ධ

ජාතිකවාදය අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් විද්වතුන් අතර විසම්මුතිකභාවයක් පැවතියත් සියලු දෙනා එමගින් ප්‍රකාශිත සිංහල-බෞද්ධ අනන්‍යතාවය සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය අතර වෙනසක් නොපවතින වාය යන අදහසට එකග වෙති. එසේම ඔවුන් අවධාරණය කරන්නේ, වෙනත් ආගමික හා වාර්ගික කණ්ඩායම්වලට රට තුළ වාසය කළ හැක්කේ, ඔවුන් බුද්ධාගමේ උත්තරීතරභාවය සහ සිංහල භාෂාවේ සහ සංස්කෘතියේ ප්‍රමුඛත්වය පිළිගන්නා තාක් කල් පමණක් බවයි.

කෙසේ වෙතත් සිංහල ප්‍රජාව තුළ සිය අනන්‍යතාවය තහවුරු කිරීම සහ අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සිංහල ජනතාව සංවිධානය කිරීම මගින් සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය යටත්විජිත යුගයේ ප්‍රගතිශීලි කාර්යභාරයක් ඉටු කළේය. එහෙත් නිදහසින් පසු අවධියේ එය ශ්‍රී ලංකික මතවාදයක් බවට පත්නොවී සිංහල බහුතරයේ මතවාදය බවට පත්විය. එනිසාම එය සුළුතර ජනවාර්ගික හා ආගමික කොටස් කෙරෙහි අනර්ථකාරී බලපෑම් ඇති කරන එමගින් ඔවුන්ගේ පැවැත්ම ප්‍රශ්න කරන එකක් බවට පත්වී තිබේ. මේ පසුබිම තුළ පශ්චාත් සිවිල් යුද්ධ සමයේ භික්ෂූන්ගේ කාර්යභාරය අවබෝධ කර ගැනීම සඳහා සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය යටත්විජිත යුගයේ සිට වර්තමානය දක්වා විකාශය වූ ආකාරය සාකච්ඡා කළ යුතුය.

සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ ප්‍රභවය සිදුවූයේ යටත් විජිත ශ්‍රී ලංකාවේ දේශීය ධනේශ්වර පංතියේ දේශපාලන ව්‍යාපෘතියක් ලෙසය (ජයවර්ධන 2000, උයන්ගොඩ 2000, ගුණසිංහ 2000). ආරම්භයේදී එය බෞද්ධ නොවන ආගමික විරෝධී ව්‍යාපාරයක් ලෙසත්, පසුකාලයේදී එය සුළුතර ජන වර්ග විරෝධී ව්‍යාපාරයක් ලෙසත් ගොඩනැගිණි (ජයවර්ධන 2000). මුල් අවස්ථාවේදී ඔවුන් තුළ පැවතියේ ක්‍රිස්තියානි විරෝධී නැඹුරුවකි. යටත් විජිත පාලනය විසින්

ක්‍රිස්තියානි ආගමිකයන්ට ලබා දී තිබූ වරප්‍රසාද සිංහල-බෞද්ධ මාධ්‍යම පංතිය නොරිස්සුහ. මේ පසුබිම තුළ ඔවුන් ක්‍රිස්තියානි විරෝධී ව්‍යාපාරයක් දියත් කළ අතර මේ කටයුත්ත සඳහා ලංකාව වූකලී ධර්මදිපයකි යන මතවාදය උපයොගී කරගත්හ (Scott 1994). එසේම ඔවුහු ක්‍රිස්තියානි මිෂනාරීන්ගේ ආගමික ප්‍රචාරණයට සහ ඔවුන්ගේ අධ්‍යපනික ආයතන පිහිටුවීමේ ක්‍රියාවලියට එරෙහි වෙමින් පානදුරාවාදයට පනදෙමින්, බෞද්ධ අධ්‍යාපනික ආයතන පිහිටවීමට කටයුතු කළේය. අනගාරික ධර්මපාල වැනි බෞද්ධ නායකයන් මෙහි මුලිකත්වය ගත් අතර විසිවන සියවසේ මුල් අවධිය වන විට එය පුළුල් බහුජන ව්‍යාපාරයක් බවට පත්වී තිබුණි.

ආරම්භයේදී සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ මූලික ලක්ෂණයක් වුයේ වෙළඳ තරගයයි (ජයවර්ධන 2000). 1915 මුස්ලිම් විරෝධී අරගලයෙන් එය මනාව පිලිබිඹු වේ. විසිවන සියවසේ ආරම්භය වන විට ලංකාවේ වෙළද ආධිපත්‍ය සිංහල නොවන පිරිස් සතුව පැවතීම මෙයට හේතුව විය. විසිවැනි සියවස ආරම්භය වන විට මෙරට වෙළද අධිපත්‍යය විදේශිකයන් සතුව තිබුණි (ජයවර්ධන 2000). එහෙත් මේ අවධිය වන විට නැගී එන වෙළඳ පංතියක් බවට පත්ව සිටි සිංහල වෙළඳුන්ගේ කෝපය විශේෂයෙන්ම එල්ලවී තිබුනේ මුස්ලිම් ව්‍යාපාරිකයන් වෙතටය. අනගාරික ධර්මපාල, පියදාස සිරිසේන වැනි සිංහල-බෞද්ධ පුනර්ජිවනවාදීන්ගේ අදහස් මේ සඳහා විශාල බලපෑමක් කර තිබේ. අවසානයේදී සිංහල-බෞද්ධ ව්‍යාපාරිකයන් ප්‍රමුඛ අන්තවාදී පිරිස් මුස්ලිම් ජනයාට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙමින් මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන වනසා දැමීමට කටයුතු කළේය. 1915 සිංහල-මුස්ලිම් කොලාහලය යනුවෙන් හැඳින්වුණු මෙය ආගමික හේතු මත

සාධාරණීකරණය කළත් එහි සැඟවුණු අර්ථය වෙළඳ තරගය විය (නවරත්න බණ්ඩාර 2001).

සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ශ්‍රී ලාංකික දෙමළ ජනයාට ද එරෙහි විය (Wriggins 1960). පළමුවෙන් ඔවුන් දෙමළ ජනයාට එරෙහිව හැඟීම් උත්සන්න කළේ භාෂා ප්‍රශ්නය පදනම් කරගෙනය. නිදහස් අධ්‍යාපනයෙන් ඉහළට ගිය සිංහල උගත්තු දෙමළ විරෝධී උද්ඝෝෂණයේ පෙරමුණේ සිටි අතර, මුලදී ද්වි භාෂා ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටි සිංහල දේශපාලඥයන්ද පසු කාලයේදී එයට එක් විය (De Silva 2008). 1950 දශකය ආරම්භයේ සිට භාෂා ප්‍රශ්නය ජනවර්ග දෙක අතර ගැටුම්කාරී තත්වය උත්සන්න කිරීමට හේතුවක් වූ අතර පසු කාලයේ භාෂා ප්‍රශ්නය ද ඇතුළු තවත් ප්‍රශ්න රාශියක බලපෑමෙන් ජන වර්ග දෙකේම ජීවිත දහස් ගණනක් බිලිගත් බිහිසුණු සිවිල් යුද්ධයක් දක්වා එය විකාශනය විය. එහෙත් සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු රටේ දීර්ඝකාලීන සාමයකට, සංහිඳියාවකට මගපාදන සම්මුතියක් ගොඩනැගුනේ නැත. සිදුවුනේ ජනවර්ග හා ආගමික කණ්ඩායම් තවදුරටත් ධ්‍රැවීකරණය කරමින් අවසානයේ ඔවුන් අතර විභේදනය තීව්‍ර කිරීමයි. පශ්චාත් සිවිල් යුද්ධ ශ්‍රී ලංකාවේ රාජපක්ෂ රෙජීමයේ පාලනය යටතේ සිදුවී ඇත්තේ මෙයයි.

ඉහතින් විස්තර කරන ලද යටත්විජිත යුගයේ ප්‍රභවය ලබා වර්ධනය වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිය පශ්චාත් සිවිල් යුද්ධ සමයේ භික්ෂූන්ගේ මග පෙන්නන්නා බවට පත්විය. එතැන් සිට වර්තමානය දක්වා භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් හැඩගස්වන කේන්ද්‍රීය සාධකය වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදයයි. ක්‍රි.පු තුන්වන සියවසේ මෙරටට ථේරවාද බුදුදහම හඳුන්වා දීමෙන් අනතුරුව එය ආරක්ෂා කොට පවත්වා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ

සංඝයා වහන්සේලාටය. එතැන් ඔවුන් රාජ්‍ය අනුග්‍රහය ඇතුව මේ කටයුත්තෙහි නිරත විය. මෙලෙස බුදුදහමේ භාරකරුවන් බවට පත්වූ සංඝ සමාජයට එදා සිට අද දක්වාම රාජ්‍ය විසින් අනේකවිධ උදව්-උපකාර ලබා දී ඇත. එදා සිටි රජවරුන් සෑම ගමක් ගානේ සඟ ආශ්‍රම පද්ධතියක් ගොඩනගන ලදී. ඉදින් මෙහිදී අප සිංහල-බෞද්ධ ජාතිකවාදයේ ප්‍රභවය සිදුවූ යටත්විජිත සමයේ සිට පශ්චාත් සිවිල් යුද්ධ සමය තෙක් එකී මතවාදය පෝෂණය කළ සංඝ සමාජය හදුනාගත යුතුය.

නූතන ශ්‍රී ලංකාවෙහි භික්ෂූන් කෙරෙහි අතිමහත් බලපෑමක් සිදුකළ බෞද්ධ නූතනවාදයේ පියා ලෙස සලකනු ලබන්නේ අනගාරික ධර්මපාල ය (Senevirathne 1999). සෙනවිරත්න සිය අධ්‍යයනයේදී ධර්මපාල බෞද්ධ නූතනවාදයේ පියා ලෙස අර්ථකථනය කළා පමණක් නොව බෞද්ධ භික්ෂුව රැක බලාගන්නා සහ සමාජ සේවකයා ලෙස ද නිර්වචනය කළේය (Senevirathne 1999: 27). ධර්මපාල විසින් භික්ෂූන් වෙතින් ප්‍රයෝගික සහ මතවාදී වශයෙන් අංශ දෙකක කාර්යභාරයක් අපේක්ෂා කළේය (අමුණුගම 1985). පළමුවැන්නෙන් අදහස් කළේ ජනතාවගේ ජිවන මට්ටම නංවාලීම සහ ඔවුන්ගේ ජිවිතයේ ගුණාත්මක අංශය වර්ධනය කිරීමයි. දෙවැන්නෙන් අදහස් කරන ලද්දේ පැරණි ලංකාවේ අනාදිමත් කාලයක් තිස්සේ පැවති සිංහල සංස්කෘතිය නැවත ගොඩනැගීමයි. මෙහිදී පළමු කාර්යය ඉටු කිරීම සදහා 1873 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් විද්‍යෝදය පිරිවෙන පිහිටුවිය. දෙවැන්න ඉටු කිරීම සදහා 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලදී. පූර්ව නිදහස් අවධියේ සිට මේ පිරිවෙන් දෙක ආශ්‍රිත භික්ෂු කණ්ඩායම් ස්වකිය කාර්යභාරය සපුරා ගැනීම සදහා කැප වුහ.

විද්‍යෝදය පිරිවෙන ආශ්‍රිත භික්ෂු කණ්ඩායමේ භික්ෂූන් වහන්සේලා අනගාරික ධර්මපාල විසින් තමන් වෙත ආරෝපණය කරන ලද මතවාදී කරුණු ප්‍රයෝගික කරුණු වලින් වෙන් කර ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය උදෙසා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් හඳුන්වා දුන්හ (Senevirathne 1999: 127). විද්‍යෝදය පිරිවෙන ආශ්‍රිත භික්ෂු කණ්ඩායමේ වඩාත් ක්‍රියාකාරී ලෙස ග්‍රාමීය ප්‍රදේශවල සමාජ සේවා කටයුතු වල යෙදුනු භික්ෂූන්ට නිදසුන් වන්නේ කලුකොඳයාවේ පඤ්ඤාසේකර, හීනටියන ධම්මාලෝක, හා හෙන්ඩියගල සීලරතන යන නා හිමිවරුන්ය. උන්වහන්සේලා මහණකම පිළිබඳ සම්ප්‍රදායික අදහස් දරූ කණ්ඩායමක් විය. මෙම භික්ෂූන් වහන්සේලා ධර්මපාල අනුව යමින් හැකිතාක් දුරට අල්පේච්ඡ ජීවන චර්යාවක් අනුගමනය කිරීමට උත්සාහ කළහ. එසේම මෙම භික්ෂූන් වඩාත් ප්‍රයෝගික වූ ජාතිකවාදී මතවාදයක් නියෝජනය කළ බැවින් උන්වහන්සේලා පටු ජාතිවාදයෙන් තොර ජාතිමාමක පිරිසක් වූහ. එහෙත් අවසාන විග්‍රහයේදී මෙම භික්ෂූන්ට අර්ථවත් ක්‍රියාකාරී සමාජ-දේශපාලන ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා අවශ්‍ය වූ දර්ශනයක් මෙන්ම සුදුසුකම් ද නොවිය (Senevirathne 1999: 127-128).

විද්‍යාලංකාර පිරිවෙන නියෝජනය කළ භික්ෂූන්, 1940 ගණන්වල ආරම්භයේ සිට ක්‍රියාකාරී විය. ඔවුන් ඉක්මනින් සමාජ-දේශපාලනික කටයුතු වලට නැඹුරු වූහ. විද්‍යාලංකාර පිරිවෙන ආශ්‍රිතව ක්‍රියාකාරීවූ භික්ෂූන් වහන්සේලා නම් ලුණුපොකුණේ ධම්මානන්ද, හැඩිපන්නල පඤ්ඤාලෝක, කොටහේනේ පඤ්ඤාකිත්ති, යක්කඩුවේ ප්‍රඥාරාම, වල්පොල රාහුල සහ බඹරැන්දේ සිරි සීවලී යන හිමිවරුන් ය (උයන්ගොඩ 2020). මේ භික්ෂූන් එළිපිටම දේශපාලනයේ නිරතවීම නිසා විද්‍යෝදය භික්ෂූන්ගෙන් වෙනස් විය. විද්‍යාලංකාර මතවාදය

ඔවුන්ගේ දේශපාලන මතවාදය බවට පත්විය. විද්‍යාලංකාර මතවාදයේ අත්පොත ලෙස හඳුන්වනු ලැබූ 'භික්ෂුවගේ උරුමය' වල්පොල රාහුල හිමියන් විසින් ලියනු ලැබිය. මේ කෘතිය පළකළේ භික්ෂූන් වහන්සේලා දේශපාලනයේ යෙදීම සුදුසුද නැතහොත් කැපද යනුවෙන් විවාදයක් තිබූ අවධියකය. එහදී විද්‍යාලංකාර භික්ෂූහු, භික්ෂූන් වහන්සේලා දේශපාලනයේ යෙදීම සුදුසුය යන මතවාදය වෙනුවෙන් පෙනී සිටියේය. 1940 දශකය ආරම්භයේ සිට විද්‍යාලංකාර භික්ෂූන් වාමාංශික පක්ෂ හා වෘත්තීය සමිති ව්‍යාපාරය සමග සම්බන්ධ වෙමින් රැඩිකල් දේශපාලන කටයුතු වල නිරත විය. ඔවුන්ට මගපෙන්වූ දේශපාලන මතවාදය වුයේ මාක්ස්වාදයයි.

මෙලෙස නිදහසට පෙර අවධියේ ධර්මපාල ගේ මතවාදී දර්ශනය අනුව සමාජ හා දේශපාලන කටයුතුවල නිරතව සිටි භික්ෂූන් 1950 දශකයේ මැද භාගයේ සිට අධිපතිවාදී සිංහල-බෞද්ධ ජාතිකවාදයේ මගපෙන්වන්නන් බවට පත්වී සමාජ හා දේශපාලන කටයුතුවල නිරත වූ ආකාරය හඳුනාගත හැකිය (ප්‍රඥාරාම, 1970). ආරම්භයේදී මෙම භික්ෂූන් ප්‍රකාශ කළේ 1948 දී ලැබුන නිදහස අසම්පූර්ණ බවත්, සිංහල-බෞද්ධ ජාතියේ නැති වූ අභිමානය එනයින් ප්‍රතිස්ථාපනය නොවූ බවයි (උයන්ගොඩ 2000). මේ වනවිට සිංහල ප්‍රභූ දේශපාලන පැලැන්තියේ දේශපාලන සටන් පාඨය බවට පත්ව තිබූ පූර්ණ දේශපාලන නිදහස දිනා ගැනීමේ ව්‍යාපාරය සඳහා මෙම භික්ෂු කණ්ඩායම අනගි සහායක් ලබා දෙන ලදී. එහෙත් මේ කණ්ඩායම විසින් දේශපාලන නිදහස සම්පූර්ණ කර ගැනීමේ ක්‍රියාදාමය ඉදිරිපත් කරන ලද්දේ ආගමික-දේශපාලන අර්ථයෙනි. ඔවුන්ගේ ඒකායන අරමුණ වුයේ සිංහල-බෞද්ධ ප්‍රභූන්ට දේශපාලන බලය ලබා ගැනීමට උදව් කිරීමයි. අවසානයේදී

ඔවුන් දීප ව්‍යාප්ත ලෙස සංවිධානය වෙමින්, 1956 මැතිවරණයේ දී මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණය සඳහා උර දුන්හ.

මේ අයුරින් නිදහසින් පසු අවදියේ සිට වර්ධනය වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ පෙරගමන්කරුවා වූයේ සංඝ සමාජයයි. ඔවුන්ගේ බලපෑමෙන් පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාව වේගයෙන් සිංහල-බෞද්ධ රාජ්‍ය ව්‍යාපෘතියකට අවතීර්ණ විය. එහිදී ඔවුන් බහුතර ප්‍රජාවේ ආගමත්, භාෂාවත් ප්‍රමුඛස්ථානයට පත් කිරීම සඳහා දේශපාලන පක්ෂ ගෙනගිය වැඩපිළිවෙලේ යුහසුළුව කටයුතු කරන ලදී. ඔවුන්ගේ වේගවත් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකා රාජ්‍යයේ හැඩරුව ලෙස හඳුනාගත හැකි වූයේ සිංහල-බෞද්ධ වාර්ගික ආධිපත්‍යධාරී ක්‍රමයකි. එය සැකසුනේ වාර්ගික ධුරාවලිය තුළ සිංහල ප්‍රජාව උත්තරීතර ස්ථානයක වැජඹෙන අයුරිනි.

**ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය**

ශ්‍රී ලංකා සමාජය තුළ වාසය කරන ප්‍රධාන ජන වර්ගය වන සිංහල බහුතරය අදහන ආගම් අතුරින් බුද්ධාගම ප්‍රධාන හෙයින් එය රටේ බහුතරයේ ආගම ලෙස හැඳින්විය හැකිය. බුද්ධාගම යන්න රටේ බහුතරයේ ආගම බවට පත්ව ඇත්තේ එය මෙරටට හඳුන්වා දුන් ක්‍රි.පු.තුන්වන සියවසේ සිටය (ලියනගමගේ 2010; 1993). එතැන් සිට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ඇතුව ලංකාවේ රාජ්‍ය ආගම බවට පත්වූ බුද්ධාගම බටහිර බලවතුන්ගේ අණසකට පත්වන තෙක් කිසිදු උපද්‍රවයකින් තොරව පැවතිණි. පහළොස්වන සියවසේ සිට ඇරඹි බටහිර පාලනය තුළදී අනෙක විධ බාධා මධ්‍යයේ වුවද එහි කේන්ද්‍රීය බව නොනැසී පැවතුනි. කෙසේ වෙතත් බටහිර බලවතුන්ගෙන් නිදහස දිනා ගැනීමෙන් අනතුරුව නැවතත් විසිවැනි සියවසේ අගභාගයේ සිට එය පූර්ණ අනුග්‍රහය ලබන රාජ්‍ය ආගම බවට පත්විය. ශ්‍රී ලංකා සමාජය

තුළ බුද්ධාගම ආරක්ෂා කොට එය වසර පන් දහසක කාලයක් නොනැසී ආරක්ෂා කොට පවත්වා ගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ සංඝයා වහන්සේලාටය. එබැවින් තත්කාලීන සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව විමසා බැලීමද මෙම අධ්‍යයනයේ තවත් පරමාර්ථයකි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ භික්ෂූන් දේශපාලන කාර්යභාරයක් ඉටු කරනු ලැබුවේය යන්න පොදුවේ පිළිගත් මතයකි (Deegalle 2006, Senevirathne 1999, Tambiah 1992, Gombrich & Obeysekera 1988).

එසේම ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ ප්‍රත්‍යක්ෂ වන කරුණක් නම් භික්ෂූන් සහ රාජ්‍ය අතර ස්ථාවර සම්බන්ධතාවයක් පැවති බවත් එම සම්බන්ධතාවය හරහා සිංහල ජාතික අනන්‍යතාවයක් ගොඩනැගුනු බවයි (Gombrich & Obeysekera 1988). ලියනගමගේ සංඝයා වහන්සේලා සහ රාජ්‍ය අතර ගොඩනැගුණු සම්බන්ධතාවය දෙපක්ෂයටම අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වූ ආකාරය මෙසේ නිරීක්ෂණය කළේය.

“නව ආගම පිහිටුවීමත් සමග ආරම්භ වූ රාජ්‍යය හා සංඝයා අතර සම්බන්ධතාවය, ඉන් පසුව එළඹී සියවස්වලදී අඛණ්ඩව වර්ධනය විය. යථෝක්ත ද්විපාර්ශවිය සම්බන්ධය දෙපක්ෂයටම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් විය. දේවානම්පිය තිස්ස රජතුමා සංඝයාට ඉඩකඩම් පූජා කළේය. විහාරස්ථාන හා දාගැබ් ඉදි කරවිය. එසේ කරන ලද්දේ දානමාන හා සෙසු පිරිකර සැපයීමට අමතරවය. මේ ප්‍රතිපත්තිය ඔහුගේ අනුප්‍රප්තිකයෝ ද මහත් උද්යෝගයකින් අනුගමනය කළහ” (ලියනගමගේ 2010: 119-120).

සිංහල රජවරුන්ගේ ත්‍යාගශීලි අනුග්‍රහය ලැබූ භික්ෂූන්, ස්වකිය හොද හිත හා ආශීර්වාදය නිරතුරුවම රජවරුන් කෙරෙහි යොමු කළ අතර, එහි ප්‍රතිපල වශයෙන් මහජනයාගේ පක්ෂපාතිත්වය රාජ්‍යය වෙත නැඹුරු වීමට අනුබලයක් ලැබිණි. මේ අනුව ජනතාව සහ බුදු දහම අතර ගොඩනැගෙන අත්‍යන්ත බැඳීමත්, එමගින් ආගම සහ ජාතික අනන්‍යතාවය නොබිඳිය හැකි අයුරින් පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් සංඝයා වහන්සේලා දැඩි බලපෑමක් සිදු කළ බව ප්‍රකාශ කිරීම අනුචිත නොවෙයි.

මේ අයුරින් සිංහල රජවරුන්ගේ නොමද අනුග්‍රහය ලැබූ භික්ෂූන් ස්වකීය කාර්යභාරය බටහිර ජාතින් මෙරටට පැමිණෙන තෙක් ඉතා කලාතුරකින් හටගත් දුෂ්කරතා හා ගැටුම් හැරුණු විට බාධාවකින් තොරව, නිරවුල්ව ඉදිරියට පවත්වා ගෙන ගියේය. එකල භික්ෂූන් ස්වකීය කාර්යභාරය පවත්වා ගෙන ගියේ ගම කේන්ද්‍ර කර ගෙනය. මේ නිසා භික්ෂුව/ගම යන පුරුක යටත්විජිත යුගය තෙක් ගම්දනව් පුරා දක්නට ලැබුණි. කෙසේ වෙතත් යටත්විජිත යුගයේ තත්වය මුළුමනින්ම වෙනස් විය. එයට හේතුව යටත්විජිත සමයේ සුපිරි භික්ෂු සමාජයක් ගොඩනැගීමයි. සම්ප්‍රදායික භික්ෂු භූමිකාව වන විමුක්ති මාර්ග ගවේෂණය අතැර දැමූ මේ භික්ෂු කණ්ඩායම වාණිජවාදයේ සරණ ගිය ජනවාර්ගික ජාතිකවාදය ස්වකීය මතවාදය බවට පත් කර ගත් පිරිසක් විය. මොවුන් ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන ප්‍රතිසංස්කරණ විරෝධී, ගතානුගතික දේශපාලන හා සමාජ බලවේග බවට පත්වී ඒ අනුව ස්වකීය කාර්යභාරය සකසා ගත් කණ්ඩායමක් විය. වර්තමානයේදී මෙම භික්ෂු කණ්ඩායම නියෝජනය කරන්නේ සමාජ හා දේශපාලන කටයුතු ඉටු නොකරන ප්‍රමාණාත්මක වශයෙන් කුඩා කණ්ඩායමක් වන වනවාසී භික්ෂූන් හැරුණුකොට විහාරස්ථානවල වැඩ වසන සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගෙන් අති-බහුතරයයි. මේ භික්ෂූන්ගෙන්

බොහෝ දෙනෙකු පැවිදි දිවියට එළඹී ඇත්තේ සිය කැමැත්තෙන් නොවේ. දෙමව්පියන්ගේ බලපෑම නිසාය. ගැමි සමාජයේ පහළ ස්ථරයෙන් පැමිණෙන මේ භික්ෂූන්ගෙන් බහුතරය උසස් අධ්‍යාපනය ලබා පශ්චාත් උපාධි පවා ලබා ගත් පිරිසකි.

මේ අනුව වර්තමානයේදී මෙම භික්ෂු ප්‍රජාව සම්භාව්‍ය බුද්ධාගමේ දක්නට ලැබෙන විමුක්ති මාර්ගය උදෙසා කැපවෙමින් කටයුතු කිරීම වෙනුවට සිංහල-බෞද්ධ ජාතිකවාදය සිය පරමාදර්ශ බවට පත්කර ගනිමින් එය ව්‍යාප්ත කරන පිරිසක් බවට පත්ව සිටිති. ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේ හඳුන්වනු ලබන්නේ 'ජාතියේ මුර දේවතාවුන්' හැටියටය. සිංහල ජාතිය අනතුරකට මුහුණ දෙන ඕනෑම අවස්ථාවකදී ජාතිය බේරාගැනීම සඳහා සංඝයා වහන්සේ ඉදිරියට පැමිණෙන අන්දම ගැන විවිධ මිත්‍යා කථා ජනමාධ්‍ය ඔස්සේ නිරතුරුවම ප්‍රචාරය කරති. එහෙත් මෙහිදී සත්‍ය වශයෙන්ම සිදුවී ඇත්තේ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය සම්බන්ධයෙන් ජනතාව අතර තිබෙන පිළිගැනීම යටපත් කරමින් ජනමාධ්‍ය යොදා ගනිමින් ඔවුන්ගේ ප්‍රතිරූප ඉහළ නැංවීම සඳහා දියත් කරන ව්‍යපෘති හේතුවෙන් අනවශ්‍ය වැදගත්කමක් සංඝයා වහන්සේලාට ලබා දීමයි.

සිංහල-බෞද්ධ ජාතිකවාදය පිළිගත් භික්ෂූන්ගේ කාර්යභාරය වූයේ සමාජ සේවයයි. එහෙත් ඔවුන්ගේ සමාජ සේවා කටයුතු ඉලක්ක කරන ලද්දේ දේශපාලනය ඇතුළු ගිහි සමාජ සේවා කටයුතුවල යෙදීමයි. මොවුන් පැවිදි ජීවිතය තුළ පැවතිය යුතු පරමාදර්ශ හුදෙක් වචනයට පමණක් සීමා කළ පිරිසක් විය. ඉදින්, මෙහිදී අප හඳුනා ගන්නේ තමා වටා වාඩිවී එකත්පස්ව සිටින පිරිසකට කිසියම් තේමාවකට ධර්මය දේශනා කරන සංඝයා වහන්සේලා නොව රූපවාහිනී හෝ ගුවන් විදුලියේ පෙනී සිටිමින් ජනතාව අමතන හෝ

පුවත්පත් ඔස්සේ නිවේදන නිකුත් කරන භික්ෂූන්ය. බොහෝ දුරට යම් යම් බලලෝභී දේශපාලන කණ්ඩායම් ජනතාව තුළ ඇතිවන සාමූහික අනාරක්ෂාව පිළිබඳ හැඟීම් ප්‍රයෝජනයට ගනිමින් සිදු කරන ප්‍රචාරක ව්‍යාපෘතියක කොටස් කරුවන් බවට පත්ව ඇත්තේ මෙකී භික්ෂූන් ය.

පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකා සමාජ-දේශපාලන ක්‍රමයේ දියත් වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘති නිසා භික්ෂු සමාජය තදබල වෙනස්කම්වලට භාජනය වී ඇත. විශේෂයෙන්ම 2019 ජනාධිපතිවරණ අවස්ථාව වන විට උච්චස්ථානයක පැවති සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව සිටියේ මෙකී භික්ෂූන් ය. කෙසේවෙතත් ගෝඨාභය රාජපක්ෂ පාලනය අනුගමනය කරන ලද අදූරදර්ශී ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්තිවල බලපෑමෙන් ආණ්ඩුව බිඳවැටුණි. එහි ප්‍රතිපල වශයෙන් එතෙක් අතිමහත් සමාජ හා දේශපාලන පිළිගැනීමක් හිමි කරගෙන සිටි සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන කාර්යභාරය අනුක්‍රමයෙන් ගරා වැටෙන්නට විය. මේ අනුව 2022 දී රාජපක්ෂ පාලනය බිඳ දැමීමට දියත් කළ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් සම්ප්‍රදායික බලාධිකාර ධූරාවලියේ සාමාජිකයෙකු වන භික්ෂුවගේ සමාජ තත්වය පමණක් නොව කාර්යභාරය ද පහළ වැටෙන්නට විය. සියලු බලාධිකාර ව්‍යුහ පිරිහීමට පත්වෙමින් තිබෙන පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සම්ප්‍රදායික බලාධිකාර ව්‍යුහයේ මූලික පාර්ශවකරුවෙකු වන සංඝයා වහන්සේලාගේ කාර්යභාරය ඒ හැටියෙන්ම ජනතාව පිළිගන්නවාද යන්න වඩාත් විවාද සම්පන්න තේමාවක් බවට පත්ව තිබේ.

**රාජපක්ෂ රෙජීමය සහ සංඝ සමාජය**

දේශපාලන විද්‍යාව තුළ රෙජීමය නැත්නම් පාලන තන්ත්‍රය (Regime) යන්න විවාද සම්පන්න යෙදුමකි (විතානවසම්, 2019;

උයන්ගොඩ, 2018). ඇතැම් අය එය ආණ්ඩුව යනුවෙන් හඳුන්වනු ලැබුවත්, එයට ඇත්තේ වෙනස් අර්ථයකි. මේ අනුව ආණ්ඩුවක්, එහි මතවාද, සමාජ පදනම සහ නායකත්වය පදනම් කරගෙන හැඳින්වීම සඳහා රෙජීම යන්න භාවිත කරනු ලැබේ. මේ පදනම මත ආණ්ඩුවේ නායකත්වය හොබවනු ලබන පුද්ගලයාගේ නමින් රෙජීමය යන්න හඳුන්වනු ලබන අතර එයට ලබා දිය හැකි නිදසුනක් වන්නේ රාජපක්ෂ රෙජීමය යන්නයි. මෙහිදී අපගේ පර්යේෂණය සිදුකළ කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩු බලය හොබවන ලද්දේ රාජපක්ෂ පවුලේ සාමාජිකයන් වූ බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුව හැඳින්වීම සඳහා රාජපක්ෂ රෙජීමය යන්න භාවිත කරන ලදී. මේ අධ්‍යයනයට පසුබිම් වුයේ රාජපක්ෂ රෙජීමයේ පාලන සමය (2010-2015 සහ 2019-2022) වන බැවින්, එම පාලනය සමය තුළ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව හැඩගැසුණු ආකාරය විමසා බැලීම ද මෙම අධ්‍යයනයේ තවත් පරමාර්ථයකි.

සිංහල-බෞද්ධ ජාතිකවාදයේ දේශපාලන පදනම බොහෝ දුරට සිංහලවාදී දේශපාලන පක්ෂ නතු කර ගෙන සිටින පසුබිමක, එයට නායකත්වය දෙනු ලබන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය (පසු කාලයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලෙස හඳුන්වන ) විසින් නායකත්වය දෙන ලද පාලන තන්ත්‍රයයි. රාජපක්ෂ රෙජීමයේ පාලනය ශ්‍රී ලංකාවේ සුළුතර ජනවර්ගවලට මෙන්ම ආගමික කණ්ඩායම් වලටද අභියෝගාත්මක කාල පරිච්ඡේදයකි. රාජපක්ෂ පාලනය යටතේ හඳුන්වා දුන් බොහෝ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් සුළුතර වාර්ගික සහ ආගමික කණ්ඩායම් සමකාලින දේශපාලන ක්‍රමය තුළ බරපතල වෙනස්කම් කිරීම් වලට ලක් කෙරිණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීමෙන් අනතුරුව මුස්ලිම්වරුන් ද සිංහල-බෞද්ධ ජාතිකවාදයේ වෛරය සහ

ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් විය. මේ අනුව රාජපක්ෂ රෙජීමයේ සිංහල-බෞද්ධ ජාතිකවාදී ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් පවත්වා ගෙන ගිය රාජ්‍ය පාලනයේ ප්‍රධාන මතවාදී හවුල්කරුවා බවට පත්ව සිටියේ බෞද්ධ භික්ෂූන් ය. මෙහිදී රාජපක්ෂ පාලනයේ අනුග්‍රහය ලබමින් සමාජ හා දේශපාලන කටයුතු වල නිරත වූ භික්ෂූන් වහන්සේලා කවුරුන්දැයි හඳුනාගැනීම පශ්චාත්-සිවිල් යුද්ධ අවධියේ භික්ෂු භූමිකාව සම්බන්ධයෙන් ඵලදායි සාකච්ඡාවකට මග හෙළි කිරීමකි.

භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන මතවාද ඉතා සංකීර්ණ සහ විසම්මුතික ස්වභාවයකින් යුක්ත වේ. උයන්ගොඩ (2018) පශ්චාත් සිවිල් යුධ කාලය තුළ සංඝයා අතර පැවති දේශපාලන ප්‍රවණතා පදනම් කරගෙන සංඝ සමාජය ප්‍රභේද කිහිපයකට බෙදා දැක්විය.

1. රාජ්‍ය සමග අනන්‍යවන භික්ෂූන්,
2. දේශපාලන පක්ෂවලට සම්බන්ධ භික්ෂූන්,
3. ප්‍රගතිශීලි භික්ෂූන් සහ
4. දේශපාලනය ගැන උනන්දුවක් නොදක්වන භික්ෂූන් (උයන්ගොඩ 2018).

මෙම භික්ෂු කණ්ඩායම් අතුරින් මෙම අධ්‍යයනයේදී පරික්ෂාවට ලක් කළේ පළමු ස්තරයයි. ප්‍රමාණයෙන් කුඩා වුවත් සමාජ හා දේශපාලන වශයෙන් වඩාත් බලපෑම් සහගත කණ්ඩායම වන්නේ මේ පිරිසයි. ඔවුන් ශ්‍රී ලංකික සංඝ සමාජය තුළ බලගතු කණ්ඩායම වී ඇත්තේ ආණ්ඩුවේ දේශපාලනඥයන්, ජනමාධ්‍ය හිමිකරුවන් සහ ගිහි ධනවතුන් සමග තිබෙන කිට්ටු සම්බන්ධතාවය නිසාය. මොවුන් රටේ සමාජ හා දේශපාලන ප්‍රශ්නවලට විශේෂයෙන්ම සුළුතර වාර්ගික හා

ආගමික කණ්ඩායම්වල ගැටළු සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා ප්‍රතිසංස්කරණ යන තේමාවලදී මතවාදීමය වශයෙන් පමණක් නොව දේශපාලනික වශයෙන් ද මැදිහත් වූ ආකාරය හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේදී මෙකී භික්ෂූන්ගේ කාර්යභාරය දේශපාලනික හා සමාජීය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා සාකච්ඡා කරනු ලැබේ.

පළමුවෙන් මෙම භික්ෂූන්ගේ දේශපාලන කාර්යභාරය සාකච්ඡා කිරීමේදී, පශ්චාත් සිවිල් යුධ සමයේ මෙම භික්ෂු කණ්ඩායම සිදුකරන ලද මැදිහත්වීමේ දේශපාලන පැතිකඩ කෙරෙහි අවධානය යොමු වේ. සමහර දේශපාලන විචාරකයන් මේ භික්ෂු කණ්ඩායම රාජපක්ෂ රෙජීමයේ දේශපාලන ව්‍යාපෘතියක නියමුවන් හැටියට හඳුනාගෙන තිබේ (Uyangoda 2007). එම භික්ෂූන්ගෙන් සමහරෙක් මහින්ද රාජපක්ෂගේ දේශපාලන වැඩසටහන් තුළ ද, තවත් සමහරෙක් ගෝඨාභය රාජපක්ෂ සමගද එක්ව කටයුතු කරන ලදී. මේ අනුව ඔවුන් 2015 දී යහපාලන ආණ්ඩුව ඉදිරිපත් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයට එරෙහිව මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම සමග එක්ව ප්‍රබල විරෝධයක් දැක්විය (De Votta 2021). එසේම ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ඉදිරිපත් කළ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට දැඩි ලෙසින් පක්ෂපාතී විය. මේ අනුව රාජපක්ෂවරුන් ස්වකීය දේශපාලන අභිලාෂයන් වෙනුවෙන් මෙම භික්ෂූන් දේශපාලන වශයෙන් උසිගන්වනු ලැබූ බව ඉතා පැහැදිලිය.

දේශපාලනිකව ස්වකීය අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පශ්චාත් සිවිල් යුධ සමය තුළ, මහජන ජීවිතයට ආක්‍රමණශීලී ලෙස මැදිහත් වූ භික්ෂු දේශපාලන සංවිධාන රාශියක ක්‍රියාකාරීත්වය හඳුනාගත හැකිය. එබඳු භික්ෂු සංවිධාන අතරින් වඩාත් සාකච්ඡාවට

භාජනය වන්නේ බොදු බල සේනා, සිහල රාවය සහ රාවණා බලය යන සංවිධානයි. මෙම සංවිධාන තුනේ නායකත්වය දරන්නේ අනුපිළිවෙලින් ගලගොඩඅත්තේ ඥානසාර, ඉත්තෑකන්දේ සද්ධාතිස්ස, සහ අක්මීමන දයාරතන යන භික්ෂූන්ය. මොවුන් මෑතකාලීනව බුදුදහම දේශපාලනීකරණය කිරීමේදී ක්‍රියාකාරී චරිත බවට පත්වූ තරුණ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙති. එපමණක් නොව තරුණ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ස්වකිය දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහභාගී කරවා ගැනීමට මෙම සංවිධාන සමත් වී තිබේ. ජනප්‍රියත්වයෙන් අඩු එහෙත් ඉහතින් සඳහන් සංවිධාන වලට සමාන එවැනි තවත් බෞද්ධ සංවිධාන කිහිපයක් තිබේ. එබඳු සංවිධානයකට නිදසුනක් ලෙස 'සිංහ-ලේ' නමින් හඳුන්වන කණ්ඩායම සඳහන් කළ හැකිය.

රාජපක්ෂ රෙජීමයේ මුල් අදියරේදී එනම් සිව්වැනි ඊළාම් යුද්ධයට පෙර කාලයේ මෙම භික්ෂූන් ජනවාර්ගික ගැටුම සාකච්ඡා මගින් විසඳීමේ ප්‍රවේශය, විදේශ මැදිහත්වීම් සහ රාජ්‍ය නොවන සංවිධාන (NGO) සම්න්ධයෙන් බරපතල විරෝධයක් දැක්විය (Dewasiri 2016, De Votta 2007). එහිදී ඔවුන්ගේ නිර්දය විවේචනයට ලක් වුයේ ජනවාර්ගික ගැටුම විසඳීම සඳහා වූ සාකච්ඡාමය ප්‍රවේශයයි. එසේම නෝර්වේ රාජ්‍යයේ සත්කාරකත්වයෙන් එල්ටීටීඊය සමග පැවැත්වූ සාම සාකච්ඡා ක්‍රියාවලිය විවේචනය කරමින් හැකි පමණින් එය කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයක ද නිරත විය (Uyangoda 2007). සටන් විරාම ගිවිසුම බිඳවටිමෙන් අනතුරුව එල්.ටි.ටි.ඊ. සංවිධානයට එරෙහිව පවත්වා ගෙන ගිය සිව්වැනි ඊළාම් යුද්ධයේ මතවාදී හවුල්කරුවන් ලෙස කටයුතු කළේ ද සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් ය. එපමණක්ද නොව ඔවුන් රාජපක්ෂ රෙජීමය එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය යුදමය

වශයෙන් පරාජය කිරීමේ යුධ ප්‍රයත්නයට කොන්දේසි විරහිතව සහාය දක්වමින්, එයට එරෙහිව කටයුතු කළ සියල්ලෝම ත්‍රස්තවාදීන්ගේ සහායකයින් සහ දේශද්‍රෝහීන් ලෙස සලකා හංවඩු ගසමින් සමාජයෙන් කොන් කිරීමේ ව්‍යාපාරයක් දියත් කළහ (Dewasiri 2016, De Votta 2008). මේ අයුරින් ගැටුම් සාමකාමී ලෙස විසඳා ගැනීම සම්බන්ධයෙන් බුදුදහමේ ඉදිරිපත් වී ඇති ප්‍රවේශයට එරෙහි වීම පශ්චාත් සිවිල් යුද්ධ සමයේ සිංහල බෞද්ධ ජාතිකවාදී භික්ෂු මතවාදයේ පැතිකඩකි.

පශ්චාත් සිවිල් යුධ සමය තුළ මෙම භික්ෂු කණ්ඩායම් රාජපක්ෂ රෙජීමයේ පූර්ණ අනුබලය සහිතව ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමික විරෝධයක් පවත්වා ගෙන ගිය අතර එහි ප්‍රතිඵල වශයෙන් සුළුතර ආගමික කණ්ඩායම්වල ආගමික ඇදහිලි, වත්-පිළිවෙත් හා චර්යාවන් කෙරෙහි තදබල විරෝධයක් සමාජය තුළ ජනිත කළේය. මේ අනුව ඔවුන් පළමුවෙන් ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම්වල ප්‍රචාරණ කටයුතු වලටද, දෙවනුව මුස්ලිම්වරුන්ගේ ආගමික චර්යාවන් හා සංස්කෘතිය කෙරෙහි ද ප්‍රචණ්ඩත්වය පදනම් කරගත් විරෝධයක් පළකළහ. මෙහිදී ඔවුන් මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියාත්මක කළ විරෝධය කෙළවර වුයේ ආගමික ගැටුම් මාලවකිනි. මේ කටයුත්තේදී බොදු බල සේනා, රාවණා බලය සහ සිහල රාවය යන භික්ෂු සංවිධාන සෘජුව මැදිහත් වූ අතර ජාතික හෙළ උරුමය, ජාතික නිදහස් පෙරමුණ, සහ පිවිතුරු හෙළ උරුමය, වැනි සමහර සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලන පක්ෂ තිරය පිටුපස සිටිමින් එම ක්‍රියාවන් සාධාරණීකරණය කළහ.

මෙම භික්ෂු කණ්ඩායම නියෝජනය කළ ඇතැම් භික්ෂුන් රටේ නීතියට සහ අධිකරණයට අභියෝග කරමින් ප්‍රචණ්ඩකාරීව හැසිරුණ ආකාරය හදුනාගත හැකිය (උයන්ගොඩ 2018). පශ්චාත් සිවිල් යුද්ධ

සමයේ මෙබඳු චර්යාවක් ප්‍රකට කළ භික්ෂූන් අතර ඉදිරියෙන්ම සිටියේ ගලබොඩඅත්තේ ඥානසාර භික්ෂුවයි. එම භික්ෂුව හැසිරුණු ආකාරයෙන් පැහැදිලි වන්නේ රටේ නීතියට, අධිකරණයට හා ව්‍යවස්ථාවට ඉහළින් සිටින පාර-පුරවැසි කණ්ඩායමක් (Supra-citizens) ලෙස පෙනීසිටීමට ඔවුන් තුළ වූ අභිලාෂයයි. භික්ෂූන් රටේ නීතිය කඩ කළ අවස්ථාවකදී ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයට අයිතියක් නැතැයි යන මතය සමාජගත කිරීම එමගින් අපේක්ෂිත ය. මෙය එක අතකින් රාජ්‍යයේ පරමාධිපත්‍ය බලය ඉක්මවා ගිය සුපිරි බලයක් සංඝයාට ඇතැයි යන්න ප්‍රකාශයට පත්කිරීමක් වන අතර තවත් අතකින් සිංහල බෞද්ධ රාජ්‍යයක් ගොඩනැගීමට තිබෙන අභිලාශය පෙන්නුම් කිරීමක් වේ. මේ පසුබිම තුළ 2019 පැවති ජනාධිපතිවරණයේදී පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂට සහාය දෙමින් ඔවුන් උත්සාහ කළේ ශ්‍රී ලංකා රාජ්‍යය සිංහල-බෞද්ධ රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමය (උයන්ගොඩ 2018).

එපමණක් නොව, මෙකී භික්ෂූන් බොහෝ අවස්ථාවලදී රාජපක්ෂ රෙජීමයේ ප්‍රචාරකයින් ලෙසින් ඉටු කළ කාර්යභාරය අතිමහත් ය. 2009 මැයි මාසයේදී මහින්ද රාජපක්ෂගේ දේශපාලන නායකත්වය යටතේ එල්.ටී.ටී.ඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් පසු අත්කර ගත් දිගුකාලීන යුද ජයග්‍රහණයේ ප්‍රීතිය සිංහල-බෞද්ධ සමාජය මහත් අභිමානයෙන් යුක්තව සැමරීම සඳහා වූ ප්‍රචාරක ව්‍යාපෘතිය සඳහා ඔවුහු අපමණ අයුරින් දායක විය. එසේම යුද්ධයේ අවසන් අදියරේදී සිදු වූ යුද අපරාධ සම්බන්ධයෙන් රාජපක්ෂ රෙජීමයට චෝදනා එල්ල කළ බටහිර බලවතුන් සහ මානව හිමිකම් කවුන්සලය කෙරෙහි ජනතා විරෝධයක් ජනිත කරවීමද ඔවුන්ගේ සැගවුණු න්‍යාය

පත්‍රයේ කොටසක් විය. පසු කාලයේ රාජපක්ෂ පවුලේ සාමාජිකයින් වෙත එල්ල වූ දූෂණ හා අපරාධ චෝදනා සම්බන්ධයෙන් මේ භික්ෂූහු ඔවුන්ගේ නිර්දෝෂීභාවය වෙනුවෙන් කරුණු දැක්විය. එමගින් රෙජීමයට එරෙහිව එල්ලවූ චෝදනා වල බැරෑරුම් භාවය කිසියම් දුරකට සමනය කෙරිණි. මේ සාධක සියල්ලම රාජපක්ෂ රෙජීමයේ වාසියට හේතු වූ අතර පසු කාලයේ පවත්වන ලද මැතිවරණ වලින් ඉහළ ජනවරමක් රාජපක්ෂ පාලනයට ලැබී ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මෙම ආක්‍රමණශීලි භික්ෂු කණ්ඩායමේ ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල වශයෙන් සිංහල-බෞද්ධ දෘෂ්ටිය අන්තවාදී ආගමික මතවාදයක් බවට පත්වූ ආකාරය හඳුනාගත හැකිය. ආණ්ඩුවෙන් ලැබුණු දේශපාලන රැකවරණය නිසා ඔවුන් පොදු ස්ථානවල පවා ප්‍රචණ්ඩකාරී හැසිරීම් ප්‍රදර්ශනය කළේය. කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් නිසා පොලිසිය ඉදිරියේ පවා ඔවුන් නීතිය අමු අමුවේ උල්ලංඝනය කළහ. රාජපක්ෂ රෙජීමය ඔවුන්ට ලබාදුන් දණ්ඩමුක්තිය සුළුතර වාර්ගික හා ආගමික කණ්ඩායම් වලට එරෙහි ක්‍රියාකාරකම් තවදුරටත් දිරිමත් කළේය. මෙම භික්ෂූන්ගේ ශාසන විරෝධී ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නායක භික්ෂූන් වහන්සේලා නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීමද විශේෂත්වයකි.

මේ ආකාරයට පශ්චාත් සිවිල් යුධ අවධියේ රාජපක්ෂ රෙජීමයේ දේශපාලන උපායමාර්ග වලට අවශ්‍ය මතවාදී හවුල්කරුවන් ලෙස මෙම භික්ෂූන් ඉටුකළ කාර්යභාරය අතිමහත්ය. අවසානයේදී මේ සියලු ක්‍රියාකාරකම් මගින් නිගමනය කළ හැක්කේ ඔවුන් දැඩි ලෙස දේශපාලනීකරණය වූ භික්ෂු කණ්ඩායමක් වන බවයි. ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් වෙතින් සිංහල-බෞද්ධ ජාතිකවාදය නව

අවධියකට ප්‍රවේශ විය. එය සිංහල-බෞද්ධ ජාතිකවාදයේ ප්‍රචණ්ඩ ප්‍රකාශනය වේ. එබැවින් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ නව ප්‍රකාශකයා වූ මෙම භික්ෂු කණ්ඩායම සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ රාජපක්ෂ රෙජීමයේ සිංහල බෞද්ධ ජාතිකවාදය කේන්ද්‍ර කර ගත් පාලනයේ පංගුකරුවන් ලෙස ඔවුන් හඳුන්වනු ලැබීමය. ශ්‍රී ලංකික සමාජය තුළ ඔවුන් 'රාජපක්ෂ නිකාය' හා 'වොයිස් කට් භික්ෂූන්' යනුවෙන් හැඳින්විමෙන් එය සනාථ වී තිබේ.

මීළඟට, අපගේ අවධානය යොමු වන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් ඉටුකළ සමාජ සේවය පිළිබඳ ඇගයුම් කරන්නටය. මෙකී භික්ෂූන්ගේ සමාජ කාර්යභාරය සාකච්චා කිරීමේදී පළමුකොටම පැවසිය හැක්කේ වල්පොල රාහුල හිමියන් ස්වකිය 'භික්ෂුවගේ උරුමය' කෘතියෙන් ඉදිරිපත් කළ, භික්ෂුවගේ භූමිකාව විය යුත්තේ සමාජ සේවය සඳහාය යන අදහස අතිමහත් සංවාදයකට විවර කර ඇති බවය. විසිවන සියවසේ මැද භාගයේ දී වල්පොල රාහුල හිමියන් ස්වකිය 'භික්ෂුවගේ උරුමය' කෘතියෙන් ඉදිරිපත් කළ මූලික අදහස වන, භික්ෂුවගේ භූමිකාව විය යුත්තේ සමාජ සේවය සඳහාය යන අදහස සම්බන්ධයෙන් කතිකාවක් මේ වනවිට ශ්‍රී ලංකේය සමාජය තුළ ගොඩනැගී තිබේ (Wijeratne 1990). මේ පදනම යටතේ, වර්තමානයේදී කිරිබත්ගොඩ ඥානානන්ද, පිටිදූවේ සිරිධම්ම යන භික්ෂූන් විසින් පවත්වා ගෙන යන සමාජ සේවා කටයුතු බොහෝ දෙනාගේ සංවාදයට ලක් වී ඇත. මෙහිදී එළඹිය හැකි නිගමනය වන්නේ වර්තමාන භික්ෂූන් වහන්සේලා විවිධ නම් වලින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ සේවා කටයුතු මගින් බුදුදහමේ මූලික පරමාර්ථ වලට හානි සිදුවන බවයි.

භික්ෂූන් වහන්සේලා සඳහා යොදා ගත හැකි, සිංහල-බෞද්ධ ප්‍රජාවට පිළිගත හැකි අන්දමේ සාරධර්ම පද්ධතියක් අඩංගු නව සමාජ

සේවයක් ගොඩනගා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් විසි එක්වන සියවසේ ආරම්භය වන විට පැන නැගී තිබිණි (Swaris 2000). එය කිසියම් ප්‍රමාණයකට රාජපක්ෂ රෙජීමයේ සිංහල-බෞද්ධ අධිපතිවාදී දේශපාලන ව්‍යපෘති සඳහා මග එළිපෙහෙළි කරන්නක් විය. මේ වන විටත් විවිධ සමාජ ක්‍රියාකාරකම්වල නියැලී සිටි භික්ෂුන් කිහිප දෙනෙක් මේ සඳහා මුලිකත්වය ගෙන කටයුතු කළ අතර ඔවුන් ප්‍රථමයෙන් අවධානය යොමු කළේ දුගී -දුප්පත්කමේ පහළ සීමාව නියෝජනය කළ ග්‍රාමීය සිංහල ජනයා සවිබලගැන්වීම කෙරෙහිය (Akimoto 2020). මේ අරමුණ වෙනුවෙන් කැපවුණු භික්ෂුන් බොහෝදුරට මිල-මුදල් අතින් ස්ථාවර වූ අති-සුඛෝපභෝගී දිවි පෙවතක් ගත කරන, එබඳු පැවැත්මක් සංකේතවත් කරන අංගෝපාංග වලින් අනූන පිරිසක් විය. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් උපාධිධාරීන් වන අතර ධනය, ඉඩකඩම්, ගොවිපලවල්, ආපනශාලා, පුද්ගලික පංති, ගොඩනැගිලි බදුදීම් වැනි කුඩා පරිමාණ ව්‍යාපාර පවත්වා ගෙන යයි. ඔවුන් නිරතුරුවම විදේශ රටවල සංචාරය කරන අතර එහිදී එම රටවලට සංක්‍රමණය වූ බෞද්ධයන්ගේ ආධාරයෙන් දේශනා පැවැත්වීම ද සිදු කරයි.

භික්ෂුවගේ සැබෑ අභිප්‍රාය විය යුත්තේ සංසාරික පැවැත්ම හා සම්බන්ධ වූ අරමුණු මුදුන් පමුණුවා ගැනීමයි. භික්ෂුව එයින් බැහැර වූ විට සිදු වන්නේ මහණකමේ පදනම නැති වී යාමයි. එවිට භික්ෂුන්ට තමන් කැමති ඕනෑම දෙයක් කළ හැකි වේ. සමාජ සේවය නමැති කඩතුරාව මගින් වාණිජකරණයෙහි වාන් දොරටු අරිනු ලැබ ඇති මෙම භික්ෂු කණ්ඩායම ප්‍රතිපත්තියට වඩා පර්යාප්තිය ඉහලට නංවන ලද ක්‍රියාකාරකම් වල නිරතව සිටි. මෙම තත්වය පිලිබඳව මානව විද්‍යාඥයන් තර්ක කරන්නේ පැවිදි ජීවිතයෙහි ශීලය පදනම් කරගත් අල්පේච්ඡ පරමාදර්ශය බැහැර කොට අභ්‍යන්තර පෙළඹවීමකින් තොර

සමාජ සේවයෙහි නිරතවීමක් ලෙසය (Senevirathne, 1999; Tambiah, 1992; Spencer, 1990).

**නිගමනය**

මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදී අදහස් දරනු ලැබූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව විමර්ශනයට ලක් කළේය. වර්තමානයේදී භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන භූමිකාව හැඩ ගැසීම කෙරෙහි සිංහල-බෞද්ධ ජාතිකවාදය ඉතා විශාල බලපෑමක් කර ඇත. ලංකාවේ බුද්ධාගම රාජ්‍යයේ නිල ආගම බවට පත්වීමෙන් පසු භික්ෂූන් රාජ්‍යය තුළ අසහාය තත්වයකට පත්වීම සිදුවිය. ශ්‍රී ලංකාවේ ථේරවාද බෞද්ධ ඉතිහාසය මුළුල්ලේම සමාජ-දේශපාලන කාර්යයෙහි යෙදෙන භික්ෂූන් දක්නට ලැබුනත් ග්‍රාමීය සහ නාගරික වශයෙන් සමාජ-දේශපාලන කාර්යයෙහි යෙදෙන සුපිරි භික්ෂු කණ්ඩායමක ප්‍රභවය සිදු වන්නේ යටත්විජිත පාලනයේ වර්ධනයත් සමගය. පශ්චාත් නිදහස් යුගයේ බලයට පත් ආණ්ඩු අනුගමනය කළ ප්‍රතිපත්ති තවදුරටත් මෙම සුපිරි සංඝයාගේ සමාජ-දේශපාලන ක්‍රියාදාමයන් වේගවත් කළේය. පශ්චාත් සිවිල් යුධ සමයේ රාජපක්ෂ රෙජීමය යටතේ තීව්‍ර කළ සිංහල-බෞද්ධ ජාතිකවාදී ප්‍රතිපත්ති මගින් මෙම භික්ෂූන්ගේ සමාජ-දේශපාලන ක්‍රියාකාරකම් ඉහලම තලයට ඔසවා තිබුණි.

ඉතිහාසය පුරාම භික්ෂූන් සමාජ හා දේශපාලන කටයුතුවල යෙදී ඇති බවට සැකයක් නැත. එපමණක් නොව භික්ෂූන් එසේ කළ යුතු බවට සමහරුන් තර්ක ද කරති. විශේෂයෙන්ම, අපගේ අධ්‍යයනයේදී සාකච්ඡා කළ පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් මගින් බොහෝ දෙනෙකු අපේක්ෂා කළ ආකාරයේ සමාජ හා දේශපාලන කාර්යභාරයක් ඉටුවූයේ නැති බවත් ඒ වෙනුවට

ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිංහල-බෞද්ධ ජාතිවාදී පක්ෂ වල අභිවෘද්ධියට හේතු වූ බව ඉතා පැහැදිලිය. එබැවින් මෙම පර්යේෂණයට අනුව නිගමනය කළ හැක්කේ එබඳු කටයුතු කිරීම හේතු කර ගෙන භික්ෂූන් කෙරෙහි ගිහියන් තුළ තිබෙන ගෞරවයට හානි සිදුවී ඇති බවයි. භික්ෂුවගේ කාර්යභාරය පිළිබඳ සැලකීමේදී ඔවුන් පැවිදි ජීවිතයෙහි ශිලය පදනම් කරගත් අල්පේච්ඡ පරමාදර්ශයන් ඉවත දමා සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලන පක්ෂවල පෙළඹීම් සහිත සමාජ හා දේශපාලන කටයුතු වල නිරතවන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. සමාජීය හා දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී භික්ෂූන් වහන්සේලා අනෙකුත් සංඝ පාර්ශවවල මෙන්ම ගිහියන්ගේ ද දැඩි විවේචනයට ලක්ව ඇත. ඇත්ත වශයෙන්ම, දේශපාලන භික්ෂූන් වහන්සේලාට එල්ල වන පොදු විවේචනයක් නම්, ඔවුන්ට දේශපාලන භූමිකාවක් ඉටු කිරීමට අවශ්‍ය නිපුණතාවය නොමැතිවීමයි. නිදසුන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන හෝ ආර්ථික ප්‍රතිපත්ති ගැන හෝ ප්‍රමාණවත් දැනුමක් ඔවුන් තුළ නොපැවතීම සඳහන් කළ හැකිය. එපමණක් නොව, ගිහියන් විශාල වශයෙන් සංඝ භූමිකාව දෙස බලන්නේ ආගමික වශයෙන් මිස දේශපාලනික වශයෙන් නොවේ. එබැවින් භික්ෂූන් වහන්සේලා කළ යුත්තේ යුද්ධය, සමාජ සුබසාධනය, ගැටුම් නිරාකරණය වැනි ජාතික ප්‍රශ්නවලදී සක්‍රීය බලවේගයක් ලෙස පක්ෂ දේශපාලනයට ඉහළින් සිටිමින් ස්වකීය සමාජ හා දේශපාලන කාර්යභාරය ඉටු කිරීමයි.

භික්ෂූන් වහන්සේලා සතුව අතිමහත් බලයක් ඇතැයි ශ්‍රී ලංකික දේශපාලඥයන් සහ සිංහල මැද පංතිය විශ්වාස කළත් එය සත්‍ය නොවන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය. ඔවුන්ට එබඳු අසහාය බලයක් නොමැති බවත්, හැකියාව ලැබී ඇත්තේ දේශපාලන බලවේග වල අතවැසියෙකු වීම පමණි. බලගතු පාලක ප්‍රභූ පැලැන්තියට අභියෝග කළ හැකි ඒකීය සමාජ පදනමක් සංඝ සමාජය තුළ

ගොඩනැගී නැත. ඔවුන් නිකාය පදනමින් බෙදීගොස් ඇත. එසේනම් සංඝයා වහන්සේලා සතුව පවත්නා බලාධිකාරය කුමක්ද. මානව විද්‍යාඥයන් තර්ක කරන්නේ සංඝයා සතු බලධිකරයේ වපසරිය උත්සවාකාර සහ සංකේතමය තත්වයන්ට සිමාවන බවයි. කෙසේ වෙතත් ඔවුන්ට ශ්‍රී ලංකේය දේශපාලනය තුළ 1956 සහ 2019 මැතිවරණ වලදී ජන්දදායකයාට සැලකිය යුතු බලපෑමක් කරමින් සිංහල බෞද්ධ ජාතිකවාදී පක්ෂවල දේශපාලන ජයග්‍රහණ තහවුරු කිරීමට හැකියාව ලැබිණි. එහෙත් වර්තමානයේදී එසේ කළ හැකිද. මෙම භික්ෂු කණ්ඩායමට වර්තමානයේ කළ හැකිව ඇත්තේ ආණ්ඩු බලයට පත් කරනවා හෝ පෙරලා දමනවා යනුවෙන් යථාර්තවාදී නොවන වහසිබස් දෙඩවීම පමණි. හැරත් මොවුන් වනාහි සමස්ත භික්ෂු සමාජයම නියෝජනය කරන හෝ බලය පතුරුවාගෙන සිටින කණ්ඩායමක් නොවේ. රාජපක්ෂ රෙජිමයේ බලය උත්සන්නව පැවති සමයේ ඇතැම් ජනමාධ්‍යවල සහායෙන් කිසියම් බලයක් හිමි කරගෙන සිටියත් වර්තමානයේ තත්වය වෙනස් වෙමින් පවතී. මේ අනුව ඔවුන් වඩා හොඳින් දේශපාලන බලවේග වල අතකොලු බවට පත්ව තිබේ. මෙය අන් කවර කලකටත් වඩා රාජපක්ෂ රෙජීමයේ පාලන සමයේදී සනාථව තිබේ. ප්‍රබුද්ධ සමාජය විසින් මෙම සංඝ කණ්ඩායම හැඳින්වීම සඳහා 'දේශපාලන අතකොළු, රාජපක්ෂ නිකාය" වැනි අන්වර්ථ යෙදුම් භාවිත කරන්නේ එබැවිනි.

මූලික වශයෙන් අධ්‍යයනය මගින් සාකච්ඡා කරන ලද භික්ෂු කණ්ඩායම ගිහි සමාජ සම්බන්ධතා වලට ලොල්වූ, වාණිජවාදයේ සරණ ගිය, ජාතික පිටස්තරවාදය ප්‍රවර්ධනය කරන, සිංහල ආධිපත්‍යය සඳහා ඇප කැප වූ සහ ආගම රැක ගැනීමේ නාමයෙන් ලේ හැලීමට වුවද සූදානම් වූ පිරිසකි. මොවුන්ගේ දේශනා මගින් කිසිවිටකත් ඉවසීම, අවිහිංසාව, බහුත්වවාදය, සහ විශ්ව සාධාරණත්වය වැනි ගුණාංග වලින්

හෙබි සිවිල් සමාජයක් බිහිවීමේ හැකියාවක් නොමැත. පෙනෙන විදියට ඔවුන් අතින් එබන්දක් අනාගතයේදී බිහවීමේ ඉඩක් ද නැත. සිංහල- බෞද්ධ නොවන කිසිවෙකු හට ශ්‍රී ලංකාවෙහි සම අවස්ථා සහිත පුරවැසියන් වීමට ඉඩ නොදෙන පිටස්තරවාදී සහ සිංහල- බෞද්ධ ජාතිකවාදී මතවාදයක් බිහිව ඇත්තේ මේ හේතුවෙනි.

## ආශ්‍රිත මූලාශ්‍ර


සෙනෙවිරත්න, එච්.එල්. (2001). බුද්ධාගම,සංඝයා සහ සිවිල් සමාජය. *ප්‍රවාද*, කලාප 17, 37-49. ජයවර්ධන, ජයවර්ධන, කේ. (2000). බෞද්ධ විඥානය සහ ජනවාර්ගික ප්‍රශ්නය. *ප්‍රවාද*, කලාප 16, 63-70.

ලියනගමගේ, ඒ. (2010). *පූර්ව නූතන ශ්‍රී ලංකාව: සමාජය, රාජ්‍යය සහ ආගම.* කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ගුණසිංහ, එන්. (2000). සංඝයාගේ සංකේතමය භූමිකාව. *ප්‍රවාද*, කලාප 16, 73-75.

ගුණවර්ධන, ආර්.ඒ.එල්.ඒ. (1993). *සිවුර සහ නගුල: මාධ්‍යතන යුගයේ මුල් භාගය තුළ ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශවයන් පිළිබඳ අධ්‍යයනයක්.* කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ධර්මදාස, කේ.එන්.ඕ. (2002). *ජාත්‍යානුරාගය: සමාජ ශාස්ත්‍රීය විමර්ශනයක්.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

නවරත්න බණ්ඩාර, ඒ. එම්. (2001). *බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය: සිංහල බෞද්ධ ජාතිකවාදය සහ ජාතික සංගමය.* කොළඹ, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ප්‍රඥාරාම, වයි. (1970). *පැවිදි මග, සසුන් මග සහ අපේ ගමන්මග,* පැලියගොඩ, විද්‍යාලංකාර සභාව.

උයන්ගොඩ, ජේ. (2018). භික්ෂූන්වහන්සේ සහ නව දක්ෂිණාංශික දේශපාලනය. *අනිද්දා* , 2018.07.01.

උයන්ගොඩ, ජේ. (2018). *දේශපාලනය සහ දේශපාලන විද්‍යාව: සමකාලීන හැඳින්වීමක්*, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

උයන්ගොඩ, ජේ. (2000). ශ්‍රී ලංකාවේ පශ්චාත්-විජිත දේශපාලනය තුළ ප්‍රතිසංස්කරණ විරෝධය ගැන විචාරාත්මක අවලෝකනයක්. *ප්‍රවාද*, කලාප 16, 17-29.

විතානවසම්, ඒ. (2019). *දේශපාලනය, රාජ්‍යය සහ ආණ්ඩුව.* මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

රාහුල, ඩබ්. (2012). *භික්ෂුවගේ උරුමය: මුල්කාලයේ පටන් අද දක්වා භික්ෂූන්ගෙන් සමාජයට සිදුවූ සේවය පිළිබඳ ලුහුඩු ඉතිහාසයක්.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Abeysekera, A. (2002). *Colors of the Robe: Religion, Identity and Difference*. Columbia: University of South Carolina Press.

Akimoto, T. (2020). *Buddhism Social Work in Sri Lanka: Past and Present*. Tokyo: Gakubunsha.

Arudpragasam, A. (2022). How the Rajapaksas Destroyed Sri Lanka Economy, *Foreign Policy*. 2022.04.28, Retrieved from www.foreignpolicy.com/ (Accessed Oct. 5, 2023).

Amunugama, S. (1985). Anagarika Dharmapala (1864-1933) and the Transformation of Sinhala Buddhist Organization in a Colonial Setting. *Social Science Information*, 24(4), 697-730.

Bartholomeusz, T.J., & De Silva, C.R. (2001). *The role of the Sangha in the Reconciliation*, London: Routledge.

Deegalle, M. (2006). *Buddhism, Conflict and Violence in Modern Sri Lanka*, London: Routledge.

De Silva, K.M. (1986). *Managing Ethnic Tension in Multi-ethnic Societies: Sri Lanka, 1880-1985*. Lanham: University Press of America.

De Silva, P. (2008). *Buddhism, State, and Monk: Sociological Study*. Colombo: Social Scientist Association.

DeVotta, N. (2007). *Sinhalese Buddhist Nationalist Ideology: Implications for Politics and Conflict Resolution in Sri Lanka*. Washington: East-West Center.

DeVotta, N. (2021). The Genesis Consolidation and Consequences of Sinhalese Buddhist Nationalism, *Research Gate*, May 2021, Retrieved from https://www.researchgate.net. (Accessed April 20, 2024).

Dewasiri, N.R. (2016). *New Buddhist Extremism and the Challenges to Ethno-Religious Coexistence in Sri Lanka*, Colombo: International Center for Ethnic Studies.

Edirisuriya, P. (2017). The rise and grand fall of Sri Lanka's Mahinda Rajapaksa: The end of era. *Asian Survey.* 57(2), 211-228.

Frydenlund, I. (2005). The Sangha and its relation to the peace process in Sri Lanka, *Peace Research Institute Oslo*. 2004- Feb. 2005, Retrieved from http://www.prio.org. (Accessed Sept. 15, 2023).

Gombrich, R. F., & Obeysekera, G. (1988). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press.

Grant, T. (2014). *Sri Lanka's Secrets: How the Rajapaksha regime gets away with murder*. Melbourne, Monash University Press.

Hettiarachchi, N. (2017). Role of Buddhist Monks in the Post-Conflict Reconciliation Process: The Case of Sri Lanka, In *Post-War Peace Building and Development in Sri Lanka*, Upali Pannilage (Eds.), 91-112, Gampola: Sitmini International Publishers.

Kearney, R.N. (1976). Religion and Politics in Sri Lanka. *The Journal of South Asian Studies*, 37(03), 597-598.

Kemper, S. (1991). *The Presence of the Past: Chronicles, Politics, and Culture in a Sinhalese Life*. Cornell: Cornell University Press.

Kumar, S.Y.S. (2018). *Ballots, Bullets and Bhikkhus: The role of the Buddhist Sangha in Sri Lankan Politics and Ethnic Politics*. New Delhi: Viva Books.

Malalgoda, K. (1976). *Buddhism in Sinhalese Society 1750-1900: A Study of Religious Revival and Change*. London: University of California Press.

Mukerji A. (2015). Sri Lanka correcting the wayward state. *World Affairs*, 19(2), 60-71.

Obeysekera, G. (1989). The Myth of Human Sacrifice: History, Story and Debate in a Buddhist Chronicle. *Social Analysis*.25, 78-93.

Obeysekera, G. (1972). Religious Symbolism and Political Change in Ceylon. *Modern Ceylon Studies*, 1(1), 156-169.

Phadnis, U. (1976). *Religion and Politics in Sri Lanka*. London: C. Hurst & Co.

Ramamurthy, A. (2022). The rise and fall of Sri Lankas powerful Rajapaksha dynasty. *DW*.

Retrieved from www.dw.com (Accessed Nov. 10, 2023).

Robert, M. (1979). *Collective Identities: Nationalism and Protests in Modern Sri Lanka*. Colombo. Marga Institute.

Scott, D. (1994). Religion in Colonial Civil Society: Buddhism and Modernity in 19th Century Sri Lanka. *Sage Journals*, Retrieved from https://journals.sagepub.com. (Accessed April 2, 2024).

Senevirathne, H.L. (2001). Buddhist Monks and Ethnic Politics: A War Zone in an Island Paradise. *Anthropology Today*, 17(2), 33-44.

Senevirathne, H.L. (1999). *The Work of Kings: The New Buddhism in Sri Lanka*. Chicago: University of Chicago Press.

Spencer, J. (1990). Tradition and Transformation: Recent Writing on the Anthropology of Buddhism in Sri Lanka. *Journal of the Anthropological Society of Oxford*, Vol. 21, 22.

Swaris, N. (2000). *Buddhism, Human Rights and Social Renewal*. Hong Kong: Asian Human Rights Commission.

Tambiah, S.J. (1992). *Buddhism Betrayed: Religion, Politics and Violence in Sri Lanka*. Chicago: University of Chicago Press.

Uyangoda, J. (ed.) (2007). *Religion in Context: Buddhism and Socio-Political Change in Sri Lanka*. Colombo: Social Scientist Association.

Vittachi, T. (1958). *Emergency 58*. London: Andre Deutsch Limited.

Weerawardana, I.D.S. (1960). *Ceylon General Election, 1956*. Colombo: M.D. Gunasena & Co. Ltd.

Wickramasinghe, N. (2006). *Sri Lanka in the Modern age: A History of Contested Identities*. London: C. Hurst & Co.

Wickremerathne, A. (1995). *Buddhism and Ethnicity in Sri Lanka: A Historical Analysis*. Delhi: Vikas Publishing House.

Wijeratne, M. (1990). *Buddhist Monastic Life: According to the Texts of the Theravada Tradition*. Cambridge: Cambridge University Press.

Wilson, A.J. (1974). *Politics in Sri Lanka: 1947-1973*. London: Billing & Sons Ltd.

Wriggins, H. (1960). *Dilemmas of New Nations*. Princeton: University of Princeton Press.

# ස්ත්‍රීත්වය නිරූපිත උපදේශාත්මක ජනශ්‍රැති වත්මන් මානව සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතාව

විමල්සිරි මුණසිංහ

**හැඳින්වීම**

සෑම මිනිස් සත්ත්වයෙකුගේ ම ජීවිතයෙහි එක් කාන්තාවක් හෝ ඊට වැඩි ගණනක් තම ජීවන ගමනේ දී හමු වේ. මව, සොහොයුරිය, මිතුරිය, බිරිඳ, මිත්තණිය යනාදී වූ කාන්තා චරිත මිනිස් ජීවිතය පුරාවට ම හමු වේ. මෙලෙස හමුවන කාන්තාවන් පිළිබඳ ගැමියා උපදේශාත්මක තේමාන්විත කවි ගයා ඇත. මාතෘත්වය, ප්‍රේමය, රාගය, ස්ත්‍රී වර්ණනා, මිත්තණිය, කුඩම්මා, මදසරු ස්ත්‍රීත්වය ආදී වැනුම් එම ජන කවි අතර සුලබ ය. කාන්තාව ලෝකය නිර්මාණය කරන අතර, පුරුෂයා හා සමාන දායකත්වයක් සපයමින් ප්‍රධාන භූමිකාවකට හිමිකම් කියයි. මේ අනුව ස්ත්‍රී පුරුෂ ලෙස බෙදීම සිදුවන්නේ ජීවියාගේ උපතේදී ම ය. එය මනුෂ්‍ය සමාජයට ද පොදු වූ ජීව විද්‍යාත්මක සත්‍යයකි.

ජීව විද්‍යාත්මක ප්‍රවේශයට අනුව ස්ත්‍රියකගේ ශරීරගත ස්වභාවය පුරුෂ ශරීර ස්වභාවයට වඩා වෙනස් වේ. මෙය ලිංගික ද්විරූපතාව (Sexual Dimorphism) ලෙස හඳුන්වන අතර, මේ නිසා ඇය හා ඔහු අතර ව්‍යුහාත්මක හා චර්යාත්මක විචල්‍යතා ඇති වේ. සත්ත්ව ලෝකයේ දී නම් පිරිමි සතා ගැහැනු සතාට සාපේක්ෂව අලංකාර, සුකොමළ වේ. නමුත් මිනිසාගේ ගැහැනු සතා ආකර්ෂණීය දේහයක් ලබන්නේ චර්යාව අනුව පමණක් නොව ඔහුට හෝ ඇයට උරුම ජීව විද්‍යාත්මක ලක්ෂණ හේතුකොටගෙන ය. කාන්තාව මාතෘත්වය පදනම් කරගෙන සමාජය තුළ මෙන් ම පවුල තුළ ද සුවිශේෂී සමාජ ඒකකයක් ඇය හා ඇයගේ කාර්යභාරය සැකසී තිබුණ ද කාන්තාව පුරුෂාධිපත්‍යය ඇති සමාජයේ

දී දැඩි සූරාකෑමකට හා පීඩනයකට භාජනය වේ. පුරුෂ මූලික දෘෂ්ටිමය සමාජය, කාන්තාව දෙවන පන්තියෙහි ලා කටයුතු කරන බව අතීත සාහිත්‍ය මූලාශ්‍රවලින් පමණක් නොව නූතන සමාජ නිරීක්ෂණ මතින් ගම්‍ය වන කාරණයකි. ජන කවි බොහොමයකට ස්ත්‍රී චරිත වස්තුවිෂය වූ බව ඒ පිළිබඳ විශ්ලේෂණයේ දී පහැදිලි වන කරුණකි. මුඛ පරම්පරාගතව පැවත එමින් ලිඛිත සාහිත්‍යයට එක් වූ යශෝදරාවත, වෙස්සන්තර ජාතක කාව්‍ය ආදිය ස්ත්‍රී චරිත ප්‍රධාන කොටගත් ජන කාව්‍ය ග්‍රන්ථයෝ වෙති. ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ කාන්තාව දියණියක, සොයුරියක, බිරිඳක. මවක වශයෙන් අනන්‍ය වූ භූමිකාවන් රඟ දක්වන ලදි. තව ද කාන්තාව විසින් පෙම්වතිය, වෛශ්‍යාව වශයෙන් ද ජීවත් වූවා ය. ඒ සෑම භූමිකාවකම සිටින කාන්තාව ජන ගී තුළින් හඳුනාගත හැකි ය.

දේශීය සම්ප්‍රදාය තුළ කාන්තාව හා ජන කවි අතර, වූ සබඳතාව සමාජයීය, ආර්ථික, දේශපාලනික හා ආගමික වශයෙන් හඳුනාගත හැකි ය. සමාජයේ බහුතරයක් පිරිමින් කාන්තාව යනු, තම අතකොළුවක්ය යන්න සලකා කටයුතු කිරීම. අතීතයේ සිට ම අද දක්වාම කාන්තාවට මුහුණ දීමට සිදුවන ප්‍රබල අභියෝගයකි. ගැහැණිය නාදුනන ස්පර්ශයන් ප්‍රතික්ෂේප කළ යුතු ය. ඒ සඳහා වන ධෛර්යය ගැහැනියකට අත්‍යවශ්‍යයෙන්ම පැවතිය යුත්තකි. ගැහැණිය වූ කලී සිය ජීවිතය තුළ විවිධ චරිතයන් නිරූපණය කරන්නියකි. සුකුමාල පෙම්වතියගේ සිට පවුලක ජීවන බර සියතට ගැනීමට තරම් ඇය සතුව පවතින්නේ අන් කිසිවෙකුටත් හිමි නොවූ ඉමහත් ධෛර්යයකි. ජනශ්‍රැතිය මඟින් ආවරණය නොකෙරන චින්තනයක්, දර්ශනයක්, සංකල්පයක් නැති තරමට ම එය අතිශය පුළුල් විෂයකි. ජනයා විසින් ජනයා උදෙසා ජනයා ඇසුරේ නිර්මිත, ශ්‍රැතිය මාධ්‍ය කොටගෙන එනම් මුඛ පරම්පරාගතව පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය වන සියලු අංග ජනශ්‍රැතියට අයත් ය.

අධ්‍යතනයමෙන් ලේඛන ව්‍යවහාරය හා දියුණු සන්නිවේදන විධික්‍රම භාවිත නොවූ චිරන්ත සමාජවල තම-තමන් රැස්කරගත් අත්දැකීම්, දැනුම් සම්භාරයන් හා චාරිත්‍ර-වාරිත්‍ර ආදී සියල්ල පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමට භාවිත කෙරුණු මාධ්‍ය වූයේ ද ජනශ්‍රැතිය යි. ජනශ්‍රැතියට අයත් ප්‍රමුඛාංගයක් වන ජන කවියේ උපදේශාත්මක ස්වරූපයන්, ජනශ්‍රැති ප්‍රකාශන තුළ වත්මන් මානව සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතාව ස්ත්‍රී නිරූපිත ජන කවි ඇසුරෙන් පර්යේෂණාත්මකව මෙම පත්‍රිකාව තුළ අධ්‍යයනය කෙරේ. ජන ගී ජන ජීවිතය හා පුළුල්ව බැඳී පවතින හෙයින්, ජන සාහිත්‍යයේ දී ජන ගීයට ප්‍රමුඛ ස්ථානයකත් හිමි වේ, ජන ගීත තුළින් ජීවිතයේ සියලුම පාර්ශවයන් චිත්‍රණය වේ. සෑම දේශයක ම සෑම ජාතියක ම ජන ගී ප්‍රචලිත ය, ඒ තුළින් ඒ සමාජයේ ජීවන අත්දැකීම්වල ප්‍රකාශනයක් සිදු වේ. මෙම විවරණයේ දී අපේක්ෂා කරන්නේ ස්ත්‍රීත්වය නිරූපිත ළඳරු අවධිය, මාතෘත්වය, යෞවන කාන්තාව තේමාන්විත උපදේශාත්මක ජනශ්‍රැති වත්මන් මානව සමාජයට දක්වන සම්බන්ධතාව සත්‍ය නොවන බව ප්‍රත්‍යක්ෂකොට දැක්විම ය.

ඉහත දැක්වූ ජන ගී ප්‍රවර්ග තුළ විඥාපනය වන සදුපදේශයන් සැබෑ ජීවිතයේ දී කාන්තා ජීවිතය තුළ යථාර්ථය ප්‍රතිනිරූපණය වේය යන්න අසත්‍යයකි යන්න මෙම රචනාවේ උපන්‍යාසය වේ. කාව්‍ය වර්ණනාවන්හි එන කාන්තාව නිරත්තරයෙන් සියුමැලි, සුකුමාල තැනැත්තියක් වුවත් සැබෑ ජීවිතයේදී කාන්තාවකගේ ජීවිතය එතරම්ම සුන්දර වූවක් නො වේ. උපතේ සිට මරණය දක්වා ම කාන්තාවට අනේකවිධ දුක්ඛ දෝමනස්සයන්ට මෙන් ම අභියෝගයන්ටද මුහුණ දීමට සිදු වේ.

කාන්තා ලාලිත්‍යය චිත්‍රණය වන සාහිත්‍ය, සැබෑ ලෝකය තුළ දැකිය හැක්කේ ද යන්න ද ගැටලුවකි. ''ඉඟසුඟ ගත හැකි මිටින'' වැනි

දැ යථාර්ථයෙන් දුරස් ය. සතුට සොම්නස වෙනුවට සුසුම, කඳුළ, ඉකිය අද බොහෝ කාන්තාවන්ට උරුමවී ඇති බව ප්‍රත්‍යක්ෂ ලෙසින් හඳුනාගත හැකි ය.

## ස්ත්‍රීත්වය, ජනශ්‍රැතිය, ජන කවිය සහ උපදේශනය පිළිබඳ සංකල්පීය ප්‍රවේශය

### ස්ත්‍රීත්වය

ඕනෑ ම සමාජයක පුද්ගලයන් අතර කුල, ආගම, ජාති, වර්ණභේද හා ලිංගිකත්වය පදනම් කරගෙන එක් කණ්ඩායමක් තවත් කණ්ඩායමකින් වෙනස්වන ආකාරය දැකිය හැකි ය. මෙම විෂමතාවන් (Inequality) පදනම් කර ගෙන සමාජය තුළ සමාජ ස්ථරායනයක් ගොඩ නැගේ. මෙයින් අදහස් කරන්නේ විවිධ වෙනස්කම් පදනම් කොටගෙන සමාජය තුළ කොටස් වශයෙන් පෙළ ගැසීමක් දක්නට ලැබීමයි. මෙවැනි විෂමතාවන් ලිංගිකත්වය ද පාදක කොටගෙන සිදුවන අතර, ඒ අනුව මානවයා ස්ත්‍රී හා පුරුෂ ලෙස වෙන් වේ. ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගිකත්වය පදනම් කරගෙන කරනු ලබන බෙදීම "තිඹිරි ගෙය" තුළදී ම කරන්නකි. ''තිඹිරි ගෙය'' යනුවෙන් පුද්ගලයාගේ උපන් ස්ථානය හඳුන්වයි. උපන් ගෙයිදී ම කරනු ලබන බෙදීම ජීව විද්‍යාත්මක වේ. " ලිංග භේදය සත්ත්වයාගේ පැවැත්මට වැදගත් වේ. ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගික චර්යාවන් හා ලිංගිකත්වය අතර සම්බන්ධයක් පවතී. මේ ප්‍රජනනය (Re Production) සමඟ සමීපතාවක් දක්වයි. ස්ත්‍රී පුරුෂ වශයෙන් ගත් කල ශාරීරික වෙනස්කම් පවතී. ඒ අනුව ජීව විද්‍යාත්මක (Biological) ලක්ෂණ තුළින් මොවුන් වෙන්ව හඳුනාගැනීමට හැකියාව ලැබේ. මෙම වෙනස්කම් ප්‍රජනන කාර්යයේ දී මූලික වන අතර, ඒ සඳහා කාන්තාව ජීව විද්‍යාත්මක ලෙස ද සබඳතාවක් පවත්වයි. ඒ අනුව දරුවන් දැරීම කාන්තාවට පැවරෙන කාර්යයක් වේ (මනුරත්න, 2004).

"ලෝකය තුළ නිර්මිත වී ඇති සෑම දෙයක් ම නිර්මාණය වී ඇත්තේ මව් කිරිවලින් හා හිරුගේ කිරණිනි." කාන්තාව ලෝකය නිර්මාණය කරන අතර, පුරුෂයා හා සමාන දායකත්වයක් සපයමින් ප්‍රධාන භූමිකාවකට හිමිකම් කියයි. "පුරුෂයා සේ ම වැදගත් කාර්ය කොටසක් සිදු කරන ස්ත්‍රිය පවුල් සංස්ථාව තුළ සිටින මූලික ඒකකයක් ය" (අත්තනායක,2005).

මේ අනුව ස්ත්‍රී පුරුෂ ලෙස බෙදීම සිදුවන්නේ ජීවියාගේ උපතේදීම ය. එය මනුෂ්‍ය සමාජයට ද පොදු වූ ජීව විද්‍යාත්මක සත්‍යයකි. මානව සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජ ස්ථර ගත් විට ආරෝපිත සාධක (Ascribed Status) මත තීරණය වන්නේ යැයි පිළිගනු ලබන්නේ එහෙයිනි. එහි දී ආරෝපිත සාධක යනුවෙන් හඳුන්වන්නේ උපතින් ම එන්නා වූ ලක්ෂණයන් ය. "පුමතිරිභාවය නැතහොත් ස්ත්‍රී පුරුෂ භාවය යන්නෙන් පිරිමියා සහ ගැහැනු අතර, සමාජය වශයෙන් ඇති වෙනස හැඟ වේ" (දිසානායක, 1998).

මෙයින් ගම්‍ය වන්නේ ස්ත්‍රියකු හෝ පුරුෂයෙකු වීම උපතින් ම ලැබෙන බෙදීමක් බවයි. ජීව විද්‍යාත්මක ප්‍රවේශයට අනුව ස්ත්‍රියකගේ ශරීරගත ස්වභාවය පුරුෂ ශරීර ස්වභාවයට වඩා වෙනස් වේ. මෙය ලිංගික ද්විරූපතාව (Sexual Dimorphism) ලෙස හඳුන්වන අතර, මේ නිසා ඇය හා ඔහු අතර ව්‍යුහාත්මක හා චර්යාත්මක විචල්‍යතා ඇති වේ. සත්ත්ව ලෝකයේ දී නම් පිරිමි සතා ගැහැනු සතාට සාපේක්ෂව අලංකාර, සුකොමළ වේ. නමුත් මිනිසාගේ ගැහැනු සතා ආකර්ෂණ දේහයක් ලබන්නේ චර්යාව අනුව පමණක් නොව ඔහුට හෝ ඇයට උරුම ජීව විද්‍යාත්මක ලක්ෂණ හේතුකොටගෙන බව ජීව විද්‍යාත්මක අදහසයි. ස්ත්‍රියගේ සම මෘදු ය. මොළයේ බර ග්‍රෑම් 1279 කි. ඇයගේ අස්ථිවල වැඩීම වයස 18 - 20 දීත් පිරිමින්ගේ වයස 20-30 දීත් නතරවන අතර ස්ත්‍රී කටහඬ පුරුෂයාගේ කටහඬ තරම් ගැඹුරු නොවේ. "ස්ත්‍රියගේ

ප්‍රජනන අවයව ද දරුවන් හැදීමට හා වර්ධනයට සුදුසු පරිදි පිහිටා තිබේ" (අත්තනායක, 2005).

විශේෂයෙන් ම කාන්තාව මාතෘත්වය පදනම් කරගෙන සමාජය තුළ මෙන් ම පවුල තුළ ද සුවිශේෂී සමාජ ඒකකයක් ලෙස සැලකිල්ලට භාජනය වේ. ඒ අනුව ඇය ලිංගිකත්වය හා සහයෝගීතාවය පදනම් කොටගත් පවුල තුළ දී දරුවන් හැදීම, වැඩීම හා සමාජානුයෝජනය, ස්වාමියාගේ කටයුතු, ගෘහයේ හා සමාජයේ කටයුතු යනා දී සියලු කාර්යයන්ට දායක වේ. ලිංගික වශයෙන් කාන්තාව හා පුරුෂයා අතර පවතින වෙනස ජීව විද්‍යාත්මක ලෙස සැලකෙන අදහස් බොහෝ කාලයක් තිස්සේ සමාජය තුළ පවතී. එහෙත් නූතන පර්යේෂකයන් ලිංග යන සංකල්පය දෙස නව දෘෂ්ටි කෝණයකින් බැලීමට උත්සාහ දැරීම නිසා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් තිබූ වෙනස ජීව විද්‍යාත්මක ප්‍රභේදයක් නිසා හටගත් එකක් නොවන බව විද්වත්තු පෙන්වා දෙති. මේ ආකාරයට පහත් කොට සලකන කාන්තාව ක්‍රිස්තු ධර්මය තුළ ආගමේ දී ද දෙවියන් වහන්සේ විසින් ලෝකය මවන ලද විට ආදම්ගේ ඉල ඇටයකින් මැවුවාය යන අදහස් සමාජය තුළ ස්ථාපිත කරමින් ඇය පිරිමියාට යටහත් පහත්ව සිටිය යුතු බව පෙන්වා දෙයි.

"බුදු දහම යනු කාන්තාවන්ට විශේෂ වරප්‍රසාද හා සුවිශාල නිදහසක් ලබා දුන් ආගමක් ලෙස සැලකිය හැකි ය. මූලික වශයෙන් බුද්ධ කාලීන භාරතයේ කාන්තාවට හිමිව තිබූ ස්ථානය ශෝචනීය වේ. මේ තත්ත්වය මත බුදුන් වහන්සේගේ පහළවීම, එදා කාන්තාවන්ගේ සුභසිද්ධිය සඳහා ම හේතු වූ බව නම් සත්‍යයකි. උන්වහන්සේගේ දේශනාවල ස්ත්‍රියට සුවිශේෂ ස්ථානයක් ලබා දී ඇත. පුරුෂ පක්ෂයේ ලබන සෑම ආධ්‍යාත්මික දියුණුවක් ම, ප්‍රතිඵලයක් ම ස්ත්‍රියට ලබා ගැනීමට දුෂ්කර නොවන්නේ ය. බුදුන් වහන්සේ ලෝකයෙහි උපත ලබන්නේ පුරුෂයන්ගේ නැත්නම් පුරුෂ පක්ෂයේ යහපත පමණක්

අපේක්ෂා කරගෙන නො වේ. නිර්වාණය පුරුෂ හෝ එක් පක්ෂයකට පමණක් හිමි නො වේ. බුදුන් වහන්සේගේ උපත ස්ත්‍රී පුරුෂ භේදයක් නැතුව සෑම සත්ත්වයෙකුට ම යහපත තකා සිදු වන්නේ ය" (රත්නපාල, 1999).

මේ අනුව පැහැදිලි වන්නේ ස්ත්‍රියක් වීම සමාජය තුළ පහත් තත්ත්වයක් අත්විඳීමට වැටීමට හේතුවක් නොවන බවයි. එමෙන් ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව නිවන ලබා ගත හැකි බව ද බෞද්ධ දර්ශනය මඟින් පෙන්වා දෙයි. "භාරතීය සමාජය තුළ කාන්තාව පහත් තත්ත්වයක සිටින විට ඇයට ද පුරුෂයා හා සම ස්ථානය ලැබිය යුතු බව බුදු දහමෙහි පැහැදිලි කරයි. උදාහරණ ලෙස තම අගමෙහෙසිය වූ මල්ලිකා දේවියට දුවක ලැබුණ බව දැනගත් කොසොල් රජු ඒ පිළිබඳ අසතුටට පත්ව බුදුන් වහන්සේට එය දැන්වී ය. එම අවස්ථාවේ දී උන්වහන්සේ දේශනා කළේ හොඳින් අධ්‍යාපනය ලබාදී ප්‍රඥාවන්ත වුවහොත් එවන් ගැහැනු දරුවෙකු පිරිමි දරුවෙකුට වඩා භාග්‍යවන්ත විය හැකි බවයි.'' (පෙරේරා, 1993).

මේ තුළින් පැහැදිලි වන්නේ ස්ත්‍රී පුරුෂ භාවය නොව, වඩා වැදගත් ප්‍රඥාව හා ගුණවත්භාවය යන්නයි. "බුදුන් වහන්සේගේ දේශනා වල කාන්තාවට සමාජයේ ලැබිය යුතු නිදහස හා ස්ථානය පිළිබඳව මනාව පැහැදිලි කර ඇත. එමෙන් ම සිගාලෝවාද සූත්‍රයේ දී ස්වාමි - භාර්යා සම්බන්ධය දක්වමින් ඔවුන්ට අන්‍යෝන්‍ය වශයෙන් ඉටු විය යුතු යුතුකම් පෙන්වා දී තිබේ. ස්වාමි පුරුෂයකු විසින් තම බිරිඳට ඉටු කළ යුතු කරුණු මේ අයුරින් දැක්විය හැක. සිය බිරිඳට ගරු කිරීම, අවමන් නොකිරීම, පර ස්ත්‍රීන් වෙත නොයාම, සම්පත් ලබාදීම (ආභරණ, වස්ත්‍ර ගෙනවිත් දීම) යන ඒවායි. එසේ ම භාර්යාව විසින් ස්වාමියාට ඉටුකළ යුතු යුතුකම් දක්වා ඇත්තේ ය. ඒවා නම්, පර පුරුෂයන් ආශ්‍රය නොකිරීම, ස්වාමියා රැස් කරන ධනය රැක බලා ගැනීම, අලස නොවී උද්යෝගිමත් වීම ලෙසයි" (රත්නපාල, 1999).

ඉහත සඳහන් යුතුකම් එකිනෙකා අතර ඉටු වීම තුළ ඔවුන් අතර සහයෝගය වර්ධනය වේ. කිසිවිටකත් ස්ත්‍රියට පමණක් යුතුකම් ඉටුකළ යුතුය යන නියමයක් නො වේ. වර්තමානයේ මානව අයිතිවාසිකම් ලෙස සලකන අධ්‍යාපන කටයුතු, ආගමික කටයුතු, රැකියාවක නිරතවීමේ අයිතිය ආදී බොහෝ කටයුතුවලින් පුරාණ කාන්තාව විතැන් කර තිබුණි. විවාහය නම් පිළිගත් සම්මත රීතියේදී ද කාන්තාව මුහුණ දෙන, මුහුණ දුන් ගැටළු බොහෝ ය. දැවැද්ද, රූපශ්‍රීයෙන් යුක්ත, පිරිසිදු, පවිත්‍ර කාන්තාවෝ පුරුෂ මූලික දෘෂ්ටියේ ප්‍රධාන ඉලක්කය වෙති. "සිය ගණන් අසම්මත චර්යාවන්වල යෙදෙමින් පාදඩ ජීවිත ගත කරන බොහෝ පුරුෂයෝ තමා විවාහ කරගත් ගැහැනියගේ කුමරි බඹසර නොදැක ඇය මරා දැමීම, එසේත් නැත්නම් මුළු ජීවිත කාලය තුළ ම ඇය දෙවන පන්තියෙහි ලා සැලකීමට තරම් රුදුරු වෙති" (ගුණසේකර,2001).

ස්ත්‍රිය විවාහය තුළ දී පිරිමියාට ලිංගික පහස ලබා දීම, දරුවන් වැදීම හා සැමියාගේ, දරුවන්ගේ කටයුතු ඇතුළු නිවසේ සියලු කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාම කළ යුතු යැයි පිළිගත් සමාජ චාරිත්‍රය විය. ඒ අනුව ඇයට බොහෝ විට ජීවත් වීමට සිදු වුයේ "සමාජශීලි සත්ත්වයකු ලෙස නොව සිරගත වූවකු ලෙසිනි" (වීරසේන,1997).

කාන්තාව පිළිබඳ සමාජ දෘෂ්ටිය මේ ආකාරයට ක්‍රියාත්මක වීමේ දී, "පාපයේ සංකේතය, මාරදූතිය, වෙසඟන, උරචක්‍රමාලය, ගැහැනිය, අම්මා, බිරිඳ, අඹුව, ගෙදර බුදුන්, මැහැල්ල, කුලකත, කුලඟන, කුලවමිය, පරට්ටි, ඉටු දේවිය, කුල කුමරිය, මූසලී" (ගුණසේකර,2001).

ආදී සියක් නම්වලින් හඳුන්වනු දැකිය හැකි ය. එමෙන් ම "ස්ත්‍රීහු පුරුෂයන් සමෘද්ධියෙන් ආඪ්‍ය වන කල්හි ඔවුන් ළඟ දැවටෙති. දුර්භාග්‍ය උදා වූ කල්හි ඔවුන් අතහැර යති. ස්ත්‍රීන්ට හරි වැරැද්ද නිශ්චය කරන්නට

නොහැකි ය. ස්ත්‍රීහු සැමියාගෙන් යැපුණත් ඔවුන්ගේ යහපතට වඩා තම ආශාවන්ට මුල්තැන දෙති" (ගම්ලත්,1998).

මේ අනුව ඇය අඥාන බවත්, ඇය සිය ආශාවන්ට මුල්තැන දී කටයුතු කරන බවත් පවසන පුරුෂ මූලික දෘෂ්ටිමය සමාජය, කාන්තාව දෙවන පන්තියෙහි ලා කටයුතු කරන බව අතීත සාහිත්‍ය මූලාශ්‍රවලින් පමණක් නොව නූතන සමාජ නිරීක්ෂණයෙන් පැහැදිලි වන කාරණයකි. මෙවන් මත ගැටුම් ස්ත්‍රිය පිළිබඳව සමාජය තුළ ගොඩ නැගීමේ දී " බුද්ධිය, පරිකල්පන ශක්තිය හා ඥානය සම්බන්ධව ඇය පුරුෂයා හා සමාන වන බව" (නෙස්තුර්හ්,1981) ෆෙඩ්රික් එංගල්ස් තම අධ්‍යයනයන්ගෙන් පෙන්වා දෙයි. ගෞතම බුදුන් වහන්සේ ද වරක් කොසොල් රජුට පවසන ලද්දේ ''ස්ත්‍රිය, සැදැහැතිය, බුද්ධිමත්ය, ඇය රාජ්‍ය පාලනයට සුදුසු ය. එබැවින් ඇයව ආදරයෙන් පෝෂණය කරන්න"යනුවෙනි.

ඉහත දැක්වූ බොහෝ කරුණුවල ඍණාත්මක බව අතික්‍රමණය කරන කාන්තා චරිත විශ්වය කළබන විස්මිත කරන දක්‍ෂතා පෙන්වමින් සුවිසල් සමාජ මෙහෙවරකට උරදෙන්නියක බව ද කිව හැකි ය.

**ජනශ්‍රැතිය හඳුනාගැනීම.**

ජනශ්‍රැතිය සැබැවින් ම සාමාන්‍ය ජන ජීවිතයෙන් වෙන් කොට වෙසෙසා දැක්වීම අතිශයින් දුෂ්කර කටයුත්තකි. නූතනය වන විට ජනශ්‍රැතිය අධ්‍යයනය න්‍යායාත්මකවත් ප්‍රායෝගිකවත් වඩා පුළුල් ක්ෂේත්‍ර කරා දියුණුව ස්වාධීනව පවතී. නමුත් මෙරට සරසවිවල තවමත් ජනශ්‍රැති විෂය ක්ෂේත්‍ර ඉහත හඳුනාගත් පරිදි ම ඓතිහාසික හෝ භාෂා ශාස්ත්‍ර පිළිබඳ අධ්‍යයනාංශවලට කොටුව පැවැතීමෙන් විෂය ක්ෂේත්‍රය වඩා පටු වපසරියක සීමා වී පවත්නා බව කිව යුතු ය. බස්කොම්ට අනුව ඕනෑ ම සංස්කෘතික සමාජයක ජනශ්‍රැතිය එම සමාජයෙහි,

- අඛණ්ඩ පැවැත්ම නොහොත් සංස්කෘතික චිරස්ථිතිය පවත්වා ගැනීම.
- සමාජ සන්දර්භය අවබෝධ කර ගැනීම.
- සංස්කෘතික සන්දර්භය අවබෝධ කර ගැනීම වෙයි.

ජනශ්‍රැතිකාංග, ඒවා ප්‍රකාශ කරන්නන්ගේ දෛනික ජීවන චක්‍රය තුළ දක්වන වැදගත් ම හා සංස්කෘතික සන්දර්භය තුළ එහි ඇති ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීම වැදගත් වේ. ''තෝරාගත් කතා ප්‍රවෘත්ති සන්දර්භය හා ඒවා බද්ධ වී ඇති බොහෝ සංස්කෘතිකාංගවල විවිධ ලක්ෂණ නිරීක්ෂණය කිරීමෙන් එම ජනශ්‍රැතිවල අන්තර්ගත අනන්‍යතා හා අඛණ්ඩ පැවැත්ම මෙන් ම එම ජන කණ්ඩායම්වල සංස්කෘතික වලංගුභාවය ඇති කිරීම කෙරෙහි ජනශ්‍රැතිය ක්‍රියාකරන ආකාරය අවබෝධ වේ'' (ප්‍රේමසිරි, 2019).

ආර්.ඞී. ජෙම්සන්ගේ අර්ථ දක්වීම්වලට අනුව ජනශ්‍රැතිය යනු ''දේශීය සිරිත් විරිත් කතා සහ සම්ප්‍රදායන් සමඟ කටයුතු කරන මානව විද්‍යාවේ ශාඛාවකි.'' බසඉර්රහ දෙ අදරකා ඤබජහජකදචැාස් හි මිථ්‍යාවන්, සම්ප්‍රදායන් සහ විශ්වාසයන් සලකන ජනවාර්ගිකයන්ගේ ආනුභාවයන් හා චාරිත්‍ර වාරිත්‍ර සම්බන්ධ ස්වභාවය හා බැඳී මානසික දෘෂ්ටිය අධ්‍යයනය කිරීම ජනශ්‍රැතිය ලෙස අර්ථ දක්වා ඇත. ටයිලර්ට අනුව ජනශ්‍රැතිය ''වාචික හෝ සිරිත් විරිත් මගින් සම්ප්‍රදායෙන් උරුම කරනු ලැබූ දෙයකි.'' ජනශ්‍රැතිය ජනයා විසින් නිර්මාණය කර ගත්ත ද එය ජන ජීවිතය කෙරෙහි මෙන් ම සමස්ත සමාජය කෙරෙහි ද බලපැවැත් වේ. සාක්ෂරතාවයෙන් තොර සමාජ පසුබිමක මිනිසා විසින් සම්මත හා ව්‍යවහාර කරගත් ආචාර, සාරධර්ම පද්ධතියක් ජනශ්‍රැතියෙහි ගැබ් වී ඇති අතර, ජනශ්‍රැතිය හුදෙක් පොදුජන විශ්වකෝෂයකට සමානය.ජනශ්‍රැතිය පිළිබඳ පුළුල් අදහස් දැක්වීමක් කරන ඔවුන් ජන

කවි, ජන කතා, ජනප්‍රවාද ආදියට අමතරව භාෂාව, සාහිත්‍ය, සංගීතය, නැටුම්, ක්‍රීඩා, චාරිත්‍ර, වාරිත්‍ර, අත්කම්, ගෘහ නිර්මාණ ආදී අංග රාශියක් ජනශ්‍රැති විෂයට අයත් වන බව දක්වමින් ජනශ්‍රැතිය පුළුල් ක්ෂේත්‍ර පථයක් බව නිරූපණය කිරීමට උත්සහකොට ඇත. එසේ ම දෙකනකදරු යන පදය හඳුන්වාදුන් විලියම් තෝමස් විසින් ජනසම්මත පුරාවස්තු සහ ජනසම්මත සාහිත්‍යය යන අංග ද පැරණි ජන කොටස් අතර පැවති සිරිත් විරිත්, වත්පිළිවෙත්, පාරම්පරික විශ්වාස ලෙස දක්වමින් ජනශ්‍රැති සංකල්පයේ පරාසය විග්‍රහකොට ඇත.

මුඛ පරම්පරාගතව පවත්වාගෙන ආ පාරම්පරික දැනුම ජනශ්‍රැති මගින් තහවුරු වී තිබේ. මේ දැනුම ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ පරපුරෙන් පරපුරට දායාද වූවකි. ඒ නිසා ම වර්තමානිකයින්ට අතීත මුතුන්මිත්තන් අනුගමනය කළ මුඛ පරම්පරාගත දැනුම භාවිතයට ගත හැකි ය. ජනශ්‍රැතියේ සමාරම්භය කවටවහර ඔස්සේ ප්‍රභවය ලබන අතර, ප්‍රභව බීජ මිනිසා විසින් දෛනික ජීවිතයේ දී ලබන ලද අත්දැකීම් මගින් පෝෂණය වේ. අත්විඳි අනුභූතීන් පුද්ගලයා විසින් රෝපණය කරනු ලබන්නේ ස්වකීය කුටුම්භය හෙවත් න්‍යෂ්ටික පවුලෙහි ය. ඒ සඳහා ඔහු දෛනික ජීවිතයේ දී ලැබෙන කාල අතිරික්තය උපයෝගී කර ගන්නා ලද බව පැහැදිලි වේ. ''ජන ජීවිතයේ විවිධ අංශ ආශ්‍රිතව නිපැයුණු අංග ගණනාවක් ජනශ්‍රැතියේ දක්නට ලැබේ. මානවයාගේ රැකීරක්ෂා, ගමනාගමනය, ශාන්තිකර්ම, විනෝදාංශ, සිරිත් විරිත්, ඇදහිලි ක්‍රම ආදිය ඇසුරෙන් ජනිත වී ඇති ජනශ්‍රැතිවලින් පිළිබිඹුවන සාහිත්‍යමය ගුණාංග පිළිබඳව ද විශේෂයෙන් අධ්‍යයනය කිරීමට හැකි ය. ජනයා පිළිබඳ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ යුරෝපීය ජාතිකයන් අතිනි. ඔවුන් විසින් ජනශ්‍රැතිය යන වචනය මුලින් ම ජනශ්‍රැතිය යන්නට භාවිත කිරීම සුදුසු යැයි පිළිගෙන තිබේ. ඊට පෙර ජනශ්‍රැතිය යන්න හඳුන්වා ඇත්තේ ජන සම්මත පුරාවස්තු, ජන සම්මත සාහිත්‍ය වශයෙනි.

මීට ගෝත්‍රික මිනිසුන්ගේ ගති පැවතුම්, චර්යාධර්ම, සිරිත් විරිත්, පිරුළු, කවි, කතා ආදී සියල්ල ඇතුළත් වේ'' (රත්නපාල, 1986).

ජනශ්‍රැතිය තුළ මිනිසුන්ගේ සම්ප්‍රදායන් පිළිබඳ නොලියවුණු දෑ අන්තර්ගත වේ. එය තුළ මෙම සම්ප්‍රදායන්ගේ විවිධ අන්තර්ගතයන් සහ ප්‍රකාශිත විධී (හැඩතල) අන්තර්ගත වේ. එමෙන් ම එම සම්ප්‍රදායන් පුද්ගලයාගෙන් පුද්ගලයාට සන්නිවේදනය වන ආකාරය විලාසිතාව හෝ ශිල්පක්‍රමය ද මේ තුළ අන්තර්ගත වීම මෙහි විශේෂත්වයකි (බෲන්වාන්ඩ්, 1978).

ගීතයක්, ප්‍රසංගයක්, ඉදිරිපත් කිරීමක් හෝ නිර්මාණයක් ඒ හා බැඳි සංස්කෘතිය හෝ උප-සංස්කෘතිය පිළිබඳ වැටහීමකින් තොරව මනාව තේරුම්ගත නොහැක. එමෙන්ම කිසිම කලාත්මක නිර්මාණයක් ඒ හා බැඳි අඛණ්ඩව පවතින නිර්මාණ පරිභෝජන රටාවෙන් තොරව හඳුනාගත නොහැක (අයිවස්, 1978).

ජනශ්‍රැතිය යන පර්යාය පදය 1846 බිහිවුව ද මෙම 'ජන' යන්නට ඉමහත් දිගු ඉතිහාසයක් තිබේ. මෙහි ලා ඉදිරිපත්ව තිබෙන අර්ථකථන, නිර්වචන බොහෝ ය. නමුත් ඒ සියල්ලෙන් ම මානවයාගේ නිර්මාණශීලි සාමුහික ක්‍රියාකාරිත්වය පිළිබඳ පැහැදිලි අදහසක් ලබා දේ. ජනශ්‍රැතිය යනු සාම්ප්‍රදායික මෙන් ම වෙනස්වීම අනිවාර්යයෙන් ම සිදුවන නමුත් එය ඉතාම මන්දගාමීව ක්‍රියාත්මක වන දෙයකි. මතකය වෙනස් වීම හා අමතකවීම යන කරුණු මත ජනශ්‍රැතිය ක්‍රමිකව වෙනස්වන පදාර්ථයකි. නමුත් එය සාම්ප්‍රදායික මානව ප්‍රකාශනයකි (බේරියන්ස්, 1937).

ජනශ්‍රැතිය තරම් මානව ඉතිහාසය පුළුල්ව හදාරන එතරම් ඈතට දිවයන අන්දමේ විෂය ක්ෂේත්‍රයක් තවත් නොමැත. විවිධ සංස්කෘතික ප්‍රකාශන අතර, තිබෙන එකිනෙක සබඳතාව හදාරනු ලබන විෂය ක්ෂේත්‍රය වන්නේ ජනශ්‍රැතියයි. මානව ස්වරූපය මෙතරම් ගැඹුරින්

හඳාරනු ලබන්නේ ජනශ්‍රැතිය තුළ ය. අපගේ පොදු මානව ධර්මතාව, මානවීයත්වය, මානව අත්දැකීම් හා ගතිකතාවන් පුළුල්ව හඳාරනු ලබන්නේ ජනශ්‍රැතිය තුළය (විල්සන්, 1996).

''ජනශ්‍රැතිය'' යන පදයට සම්මත වූ නියත තේරුමක් ලබාදීම අසීරු බව උක්ත විග්‍රහයන්ගෙන් පැහැදිලි වෙයි. ජනශ්‍රැතිය යන්න පැහැදිලි කරන ශාස්ත්‍රඥයෝ වැඩි දෙනෙක් එය සමාජ මානව විද්‍යාවේ කොටසක් ලෙස හඳුන්වා දෙති. අද වන විට ජනශ්‍රැති පිළිබඳව අධ්‍යයනය කිරීම ලොව විවිධ රටවල් අතර, ඉතා දියුණු විද්‍යාවක් නොහොත් ශාස්ත්‍රයක් බවට පත්ව තිබේ. සිංහල ජනශ්‍රැතිය පිළිබඳ විවිධ අධ්‍යයනයන් සිදුකළ හෙන්රි පාකර් විසින් 'සිංහල ජනකතා' නම් ග්‍රන්ථයේ ජනකතා ක්‍රමානුකූල පදනමක් මත පරිවර්තනය කරමින් වර්ගීකරණය කොට ඉදිරිපත් කරන ලදී. ඔහුගේ පැරණි ලංකාව (ՙබජසැබඑ කැහකදබ) නම් කෘතියේ ලාංකේය ජනශ්‍රැතිය පිළිබඳ විවිධ අයුරින් විමසීමට ලක්කර ඇත. මීට අමතරව හියු නෙවිල්ගේ 'තැප්‍රොබේනියස්' නම් ශාස්ත්‍රීය සංග්‍රහය පැරණි ලංකාවේ ජනකවි, චාරිත්‍ර චාරිත්‍ර, උත්සව, නාට්‍ය ගීත, ජන නැටුම් හා කුලය ආදිය පිළිබඳව මානව වංශ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත ශාස්ත්‍රීය සංග්‍රහයකි.

ජනශ්‍රැතිය කිසියම් ජන කොටසකට ඍජුවම සම්බන්ධ වේ. මානව විද්‍යාව, සමාජ විද්‍යාව තුළ පමණක් නොව ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී සමාජයීය විද්‍යා හා මානව ශාස්ත්‍රයන් ඔස්සේ අධ්‍යයනය කෙරෙන විෂයයන්වල දී ජනශ්‍රැතිය පිළිබඳ අවධානය යොමු කරයි. මානව විද්‍යාවේ බොහෝ අධ්‍යයන පර්යේෂණයන්හි සිද්ධාන්ත තහවුරු කිරීම සඳහා ජනශ්‍රැති දැනුම උපයෝගී කරගන්නේ දහනව වන සියවසේ මැද භාගයේ සිට ය. ඊ.බී. ටයිලර්, සර් ජේම්ස් ෆ්‍රේසර්, බී මැලිනොවුස්කි, රැඩ්ක්ලිෆ් බ්‍රවුන්, ෆ්‍රාන්ස් බෝවාස් වැනි මුල් කාලීන මානව විද්‍යාඥයින් පමණක් නොව ඊ.ආර්. ලීච්, රේමන්ඩ් ෆර්ත්, එවන්ස්

ප්‍රිට්චාර්ඩ් ආදී විසිවන සියවසේ මානව විද්‍යාඥයින් ද මෙහි වැදගත්කම පෙන්වාදී ඇත. විශේෂයෙන් ම මෑතක සිට සමාජ හා සංස්කෘතික මානව විද්‍යාඥයන් ජනශ්‍රැතියේ නොයෙකුත් ස්වරූප හා එහි විවිධ අංගෝපාංග පිළිබඳ පැහැදිලි අර්ථකථනයන් ඉදිරිපත් කොට ඇත.

ජනශ්‍රැතියෙන් වර්තමාන සමාජයට උපදේශ ලබා දීම වෙළඳ දැන්වීම් තුළ සුලබව දක්නට ලැබේ. එයට හේතු වී ඇත්තේ ජනශ්‍රැතිය ජනයාට ඉතා සමීප මාධ්‍යයක් වීමය. ජනශ්‍රැතිය නිර්මාණාත්මක සන්නිවේදනයහි ලා භාවිත වෙමින් ක්‍රියාත්මක වන ආකාරය ද ප්‍රශස්තය, ජනශ්‍රැතිය එසේ ජනතාවගේ නිර්මාණ කෝෂ්ඨාගාරයක් ලෙස භාවිත කිරීමට හේතුවන ලක්ෂණ කිහිපයක් ජනශ්‍රැතිය හා නිර්මාණාත්මක සන්නිවේදනය කෘතිය තුළ අන්තර්ගතව ඇත. ජනශ්‍රැතිය කාලාන්තරයක් තිස්සේ ජන සමාජය තුළ භාවිත ව තිබීම,

1. ජනයා තුළ ජනශ්‍රැතිය කෙරෙහි තිබෙන සමීපත්වය.
2. මානවයාගේ සවිඥානික හා අවිඥානික වශයෙන් ජන විඥානය තුළ එය තැන්පත්ව තිබීම.
3. හුරුපුරුදු සංඥා, සංකේත හා අර්ථකථන සමුදායක් ජනශ්‍රැතිය තුළ තැන්පත්ව තිබීම.
4. ප්‍රතිඵල පිළිබඳව තිබෙන නියත විශ්වාසය, හුරුපුරුදු රසිකත්වය හා දිගුකාලීන වශයෙන් ගොඩ නැගී තිබෙන විනෝදාස්වාදන මාධ්‍යයක් වීම.
5. සක්‍රීය ප්‍රජා සහභාගිත්වය
6. ප්‍රජාවගේ නිර්මාණශීලීත්වය මත ජනශ්‍රැතිය තවදුරටත් සම්ප්‍රදාය තුළ විවිධ ආකාරයට අර්ථ නිරූපණය වෙමින් ඉදිරියට නිර්මාණය වීම.

7. ජනප්‍රිය සංස්කෘතිය තුළ බොහෝවිට ආකර්ෂණීය ලෙස වඩාත් කෙටි කාලයකින් ජනගත වීම කෙරෙහි ජන විඥානය, ජන රසිකත්වය බලපාන නිසා මාධ්‍ය හා තාක්ෂණය තුළ කලා කර්මාන්තය (ŕළඑ ෂබාමිඑරහ) වර්ධනය කෙරෙහි ජනශ්‍රැති චරිත, කතා, ප්‍රතිරූප දායක කර ගැනීම.

8. මානවයාගේ සැබෑ තත්ත්වය ගැබ්ව පවතින මූලාශ්‍රයක් ලෙස ජනශ්‍රැතිය සලකනු ලැබීම. මේ නිසා ජනශ්‍රැතිය තුළ බොහෝ මානව තත්ත්වයන් ගැබ්ව තිබීම සුවිශේෂී ලක්ෂණයන් ය (දනන්සූරිය, 2002).

**ජනකවිය**

ඉංග්‍රීසි ජන ගී (English Falk Songs) නමැති ග්‍රන්ථය රචනා කරන ලද සිසිල් ජේ. ෂාර්ප් ගේ අදහස නම්, ශිෂ්ට හෝ වේවා හෝ අශිෂ්ට හෝ වේවා මිනිසා තම සිතෙහි උපන් අදහස් අන්‍යයන්ට ප්‍රකාශ කිරීමේ ආශාව සහජයෙන් ම ගෙනෙන ලද්දක් වූ අතර, මේ සහජ ආශාව නිසා කවියේ උපත සිදුවන්නට ඇත යන්නයි. එපමණක් ද නොව මිනිසාගේත්, සතුන්ගේත් ඇති ප්‍රධාන වෙනස නම් ස්මරණ ශක්තියයි. සතුන් ජීවත් වන්නේ එදිනෙදා ලෝකයක ය. නැතහොත් එසැන ඇතිවන හැඟීම් මත ය. අතීත සිතුවිලි හෝ, අත්දැකීම් සතුන්ගේ මතකයෙහි නැත. සතුන්ගේ මනෝ ජීවිතය සම්බන්ධයෙන් තොරතුරු දැනීම් සමුදායකි. එහෙත් වනචාරී යුගයේ ජීවත් වූ මිනිසාගේ සිතෙහි පවා අතීත අත්දැකීම් ගබඩා වී තිබුණි. අවශ්‍ය වූ විට එම පින්තූර රාමුව උඩු හිතට ගෙන එයි. මෙකී මතක තබා ගැනීමේ ශක්තිය නිසා මිනිසා ආස්වාදයක් ලබයි. වනචාරී අවධියේ ජීවත් වූ මිනිසා පවා ඔහු මුහුණ පෑ අතීත ත්‍රාසජනක සිද්ධීන් මතකයට ගෙන රඟපෑමෙන් හෝ වචනයෙන් ප්‍රකාශ කිරීමේ ශක්තියක් තිබුණේ ය. ඒ සිද්ධිය රිද්මයක් හා තාලයක් ඇතිව ප්‍රකාශ

කිරීමෙන් කවියේ උපත සිදුවන්නට ඇතැයි ඔහු විශ්වාස කරයි" (ගමගේ,2002).

කෘෂිකාර්මික යුගයට පා තැබීමෙන් පසු, ඉර, හඳ, පොළොව ආදී ස්වාභාවික වස්තූන් දෙවියන් වශයෙන් ද, අව්ව, වැස්ස, සුළඟ දේව වරප්‍රසාදයෙන් ලැබෙන දේවල් වශයෙන් ද ප්‍රාථමික ජනයා සැලකී ය. යක්ෂ, භූත, යාග විධිවලට අමතරව දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමට ද මිනිසා පෙළඹුණේ ය. ගොවිතැන ආරම්භ කිරීමෙන් පසු ගොවිතැනේ සශ්‍රීකත්වය, පත්තිනි දේවතාවියගේ අනුග්‍රහයෙන් සිදු වන්නේ යන විශ්වාසය මත අතීතයේ සිට පත්තිනි දේවතාවිය සඳහා පුද පූජා පැවැත්වූහ. පොල් පූජාව, අං කෙළිය ඉන් සමහරකි. මේ යාග විධීන්හි භාවිත කරන කන්නලව් බොහෝ සෙයින් ම ගැමි ජනයා භාවිත කරන කන්නලව්වලට නෑකම් කියයි. එය පහත ජන කවියෙන් මනා ලෙස ගම්‍ය වේ.

සසරිබර - මෙසිරි ලක - කඳ කුමරු සාමිනේ-
දොළහ පත්තිනි දෙවියනේ රකිනු අප සැම දිනේ-
පත්තිනි සිරි කොමඟා- බැස දෙදෙන යන මගා-
විලක් දැක එහි යොදා - එවිල මැද සපුරුකා"

සිංහල ජනකවියේ උපත සෙවීමට මූලාශ්‍ර ග්‍රන්ථයන්ගෙන් ද එතරම් පිටුවහලක් නොලැබේ. බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද පාලි අටුවා ග්‍රන්ථයක් වූ "සාරත්ථප්පකාසිනියෙහි" ඇල් ගෙවිලියක විසින් ජාති, ජරා, මරණ යන ත්‍රිලක්ෂණය ප්‍රකාශ කරන ලද ගීයක් ගායනා කරනු අසා සිටි සිව් සැට නමක් භික්ෂූන් රහත් වූ හ' යි සඳහන් වේ. මේ ප්‍රවෘත්තිය සිංහල උගතුන් කාව්‍ය ග්‍රන්ථ රචනා කිරීමට ප්‍රථම වූ සිද්ධියක් සේ සැලකිය හැකි ය. ජන කවියේ උපත සෙවීමේ ආශාව නූතන විචාරකයන්ට මෙන් ම, පෙර විසූ ජන කවියන්ට තිබුණු බවට උදාහරණ වශයෙන් පහත සඳහන් ජන කවිය පෙන්වා දිය හැකිය.

අහස උපන් තැන් සකි නුඹ දන්නවද?
පොළොව උපන් තැන් සකි නුඹ දන්නවද?
මුහුද උපන් තැන් සකි නුඹ දන්නවද?
සිව්පද උපන් තැන් සකි නුඹ දන්නවද?

(තිලකරත්න,1971)

විද්‍යාත්මක දැනුමෙන් පෝෂණය නොවූ ආදී යුගයේ ජීවත් වූ මිනිසාට අහස, පොළොව, මුහුද ආදී ස්වාභාවික වස්තූන් ඇති වූ ආකාරය හා ඇතිවූ වකවානුව පිළිබඳ මහත් සැකයක් තිබුණු බව පුදුමයට කරුණක් නො වේ. ඒ ස්වාභාවික වස්තූන් ගේ නිර්මාණය මෙන් ම සිවුපදය ආරම්භය සිදු වූ වකවානුව ද එය සිදුවූයේ කෙසේ ද? යනාදී විස්තර ද දැන ගැනීමේ අවශ්‍යතාවක් තිබුණු බව ඉහත සඳහන් ජන කවියෙන් ප්‍රකාශ වේ.

ඉරුටත් එපිට ඉරු දෙවියන්ටත් එපිට
සඳුටත් එපිට සඳ දෙවියන්ටත් එපිට
රජුටත් එපිට රජ දරුවන්ටත් එපිට
ඊටත් එපිට සිව් පදයක් කියන් මට

(සිරිසේන,2014)

''ඉරුටත් එපිට, සඳුටත් එපිට'' යනුවෙන් සදහන් කළේ දීර්ඝ ඉතිහාසය සිහි ගැන්වීම පිණිස ය. එහෙත් තුන්වැනි පාදයෙන් කවියා, මානව ඉතිහාසය අපේ මතකයට ගෙන මේ කවියෙන් අපේ පැරණි ජන කවියා ද, කවියේ උපත සිදුවූයේ ග්‍රාම්‍ය යුගයේ දී ය යන ආකල්පය දැරූ බව පැහැදිලි වේ. අද පොදු ජනයා අතර ව්‍යවහාර වන ජන කවි විවිධ නම්වලින් හඳුන්වා ඇත. එසේ ව්‍යවහාරයේ පවත්නා නම් අතර, ජන කවි, ගැමි කවි, ගම්බද කවි යන ව්‍යවහාරයන් තුළ ජනකවිය ගමටම

සීමා වූවක් යන්න ආකල්පයක් ගොඩනැගුන ද ජනකවි ගමටත් නගරයට පමණක් නොව ජනතාවට ම පොදු වූවකි.

"ජන කවි මතු වූයේ සිත කය වෙහෙසීමත්, කටුක ජීවිතයක් නිසා ලබන දුක් පීඩා අමතක කරනු පිණිස ය. ඔවුන්ගේ කවි අධික දුක් පීඩාවෙන් වෙහෙසවූවන්ගේ හදින් නැගී පිටවුණු දොම්නස් සුසුම් හා සොම්නස් සුසුම් වැන්න. උගතුන් හා නූගතුන් ද, ධනවතුන් හා දිළින්දන් ද එකසේ පෙළෙන මෙකල සමාජයේ තතු දකින කවියකුගේ හදින් නගින හැඟීම හා පැතුම් කීමට උචිත බසක්, රීතියක්, කාලයත් සඳහා ජනකවියෙන් යම්කිසිවක් උගත හැකි ය. ''ඔවුනොවුන් නියැළී සිටින්නා වූ ජීවන වෘත්තීන් පිළිබඳ මෙන් ම, ඔවුන් ඇසූ පිරූ තැන් සහ ඔවුන්ගේ දුක, සතුට ආදී අනෙක් ආකාර අත්දැකීම් මෙකී නොකී සියලු දෑ ජන කවිය තුළින් පිළිබිඹු විය. ස්වාභාවික සෞන්දර්යයෙන් පෝෂිත වූ ජන කවිය මගින් ගැමි කවීන්ගේ සහජ කවිත්වය මෙන් ම නිර්ව්‍යාජ සිතුවිලි සමුදාය මැනැවින් හෙළිදරව් කෙරේ" (ගුණවර්ධන, 1996).

එලෙස සැකසුණු ජන කවිය එදා මෙදා තුර මුඛ පරම්පරාගතව පැවතුණු අතර, ව්‍යාප්ත සම්ප්‍රදායෙන් පද්‍ය මෙන් ග්‍රන්ථාරූඪ කිරීමක් සිදු නොවී ය. ජනකවිය ග්‍රන්ථාගත වූවක් නොව ක්ෂණයෙන් සිතට නැගෙන හැඟීම් ආශ්‍රයෙන් පබඳින ලද්දකි. ඔවුන් සතුව ඇත්තේ සහජ කවිත්වය පමණි. සිංහල ජනකවිය සිංහලයාගේ උත්පත්තියේ සිට මරණය දක්වා ම ජීවිතය හා සම්බන්ධ වූ සාහිත්‍යයක් බව පැවසීම අතිශයෝක්තියක් නො වේ. උපත ලබා රන්කිරි තොල ගා නැළැවිලි ගීයෙන් සුවය ලබන දරුවාගේ සිට මරණය තෙක් ජීවිතයේ විවිධ අවස්ථාවන් පිළිබඳ තේමා ජන කවියේ අන්තර්ගත වේ. වෙස්සන්තර ජාතකය, යශෝදරාවත වැනි ජන කවි පරපුරෙන් පරපුරට මරණයක දී ශෝකී වූවන්ගේ සිත් සනසාලයි. මහනුවර යුගය ආරම්භ වෙත් ම

සම්භාව්‍ය සාහිත්‍යයේ පිරිහීම ආරම්භ වී ජනකවි පෙරට ආ බව විද්වතුන්ගේ අදහස වී ඇත.

**උපදේශනය, මාර්ගෝපදේශනය සහ උපදෙස් දීම**

උපදේශනය (Counselling) යන්න අපට සමීප ක්‍රියාවලියක් නොවූව ද වර්තමානය වන විට එය ලාංකීය සමාජය තුළ ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතී. උපදේශනයේ දී පුද්ගලයා කෙරෙහි අවධානය යොමු කොට ඔහුගේ ගැටලු හඳුනාගැනීමත්, එතුළින් සිය ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම සහ ශක්තිය ලබා දීමත් සිදු කරනු ලබයි. මානසික ගැටලු සඳහා උපදෙස් ලබාදීම මනෝවිද්‍යාත්මක උපදේශනය (Psychological Counselling) නම් වේ. උපදේශනය විද්‍යාත්මක ක්‍රමවේදයකි. එහි දී පුද්ගලයා කෙබඳු තත්ත්වයක සිටිය ද ඔහු දෙස විවේචනාත්මකව නොබලයි. ඔහුගේ ගැටලු දෙස මානුෂවාදී මුහුණුවරකින් බැලීමත්, එම ගැටලු විද්‍යාත්මකව විශ්ලේෂණය කොට ගැටලුවලට මුහුණ දීම මෙන් ම නිරාකරණය කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සහ ශක්තිය ලබාදීමට උපදේශනයේ දී සිදු වේ.

''පුද්ගලයන් දෙදෙනකු අතර, අදහස් හා මතයන් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය උපදේශනය යි.''යන්න The Free Dictionary සඳහන් කරයි. Oxford Languages, (2010) මීට අමතරව ඇන් රොජර්ස්ට අනුව ''පුද්ගලයාට තම ජීවිත කාලය තුළ එළැඹෙන සෑම තීරණාත්මක අවස්ථාවකට උචිත ලෙස මුහුණ දීමේ ශක්තිය පුද්ගලයා තුළ ගොඩනැගීමට සහය වන ක්‍රියාවලිය උපදේශනය.'' ලෙසින් අර්ථ ගන්වා ඇත. මේ පිළිබඳව බර්කස් සහ ස්ටේපර්ගේ අදහස වන්නේ, '' උපදේශනය යනු පුහුණු උපදේශකයකු සහ උපදෙස් ලබාගන්නා හෙවත් සේවාලාභියා අතර ඇතිවන වෘත්තීය සම්බන්ධතාවකි.'' යන්න ය.

''කිසියම් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට හෝ මතුවන ගැටලුවක දී අත්දැකීම් සහිත පුහුණු උපදේශකයකුගේ සහය ඇතිව උණුසුම් පිළිගැනීමක් සහිත ව යෝග්‍ය පරිසරයක් තුළ තම ගැටලුවට විසඳුම් සොයා ගැනීමට උපදේශන ක්‍රියාවලියෙන් සහය ලැබේ.'' යනුවෙන් උපදේශනය පිළිබඳ ඊ.සී.ග්ලාන්ස්ගේ නිර්වචනය තුළ පෙන්වා දී ඇත.

''අධ්‍යාපනය යනු මාර්ගෝපදේශය යි 'මාර්ගෝපදේශය යනු අධ්‍යාපනය යි.'' හර්බට් හෝකිස්ගේ අදහසයි. ''ළමා ජීවිතයේ සෑම මට්ටමකදී ම ඔවුන්ගේ පෞද්ගලික අධ්‍යාපනය වෘත්තීය හා සමාජමය අත්දැකීම් ලබාගැනීමට මාර්ගෝපදේශය වැදගත් වන අතර, ඒ සඳහා ආධාර වන අංශ සතරක් ඇති බව රොබට් මැතිව්සන් දක්වා ඇත. පහත සඳහන් වන්නේ ඔහුගේ එම කරුණු දැක්වීම ය.

1. ආත්ම අවබෝධය

2. ස්වකීය පරිසර ඉල්ලීම්වලට හා යථාර්ථයට හැඩගැසීම

3. වර්තමාන සහ අනාගත තත්ත්වයන්ට හැඩ ගැසීම

4. පෞද්ගලික විභව්‍යතා සංවර්ධනය (මැතිව්සන්, 1962)

මෙකී කරුණු අනුව උපදේශනය සහ මාර්ගෝපදේශනය යනු එක් කාරණාවක් නොවුණ ද අතීත ගැමි සමාජයේ දී පුද්ගල සමාජනුයෝජනය උදෙසා සිදුවූයේ ද මෙය ම බව කිව හැකි ය. ඔවුන්ගේ එදිනෙදා ජීවන කටයුතු පහසු කරවා ගැනීමට වැඩිහිටි පරම්පරාව විසින් බාල පරම්පරාවට උපදෙස් ලබාදීම, අවවාද ලබා දීම සිදු කෙරිණි. අත්දැකීම් බහුල පුද්ගලයන් විසින් ඉදිරි පරම්පරාවට තමා ලද අත්දැකීම් ඇසුරෙන්, දැනුම ලබාදීම සිදුවිය. මෙය පුද්ගල සමාජානුයෝජනය සිදු වූ අවස්ථාවකි. අද වන විට උපදේශනය, මාර්ගෝපදේශනය, උපදෙස් ලබා දීම, සමාජානුයෝජනය ආදී ලෙස විවිධාකාරයෙන් හඳුන්වනු ලබන

ක්‍රියාවලීන් අතීත සමාජයේ එකම සංකල්පයක් ව පැවති බව ශාස්ත්‍රීය තොරතුරු අධ්‍යයනයේ දී මනාවට ප්‍රත්‍යක්ෂ ය. කෙසේ වුව ද එකී කාර්යයන් සියල්ල එකල සිදුවූයේ ජනශ්‍රැතිය තුළින් වීම සුවිශේෂත්වයකි.

ලිවීමේ හා කියවීමේ සාක්ෂරතාවය නොමැති අවධියේ පටන් පුද්ගල සමාජානුයෝජනය සිදු වූයේ ජනශ්‍රැතිය තුළිනි. පුද්ගල සමාජානුයෝජනය සිදුවන මුල් ම ඒකකය වන්නේ තම පවුල් සංස්ථාව ය. ගෘහය තුළින් ඉගෙනගනු ලබන දෑ පාදක කොටගෙන ඔහු සමාජය වෙත පිවිසේ. වැඩිහිටි පරම්පරාව විසින් තමා උගත් දේ, තමා අත්දැකීමෙන් ලත් දේ බාල පරම්පරාවට දායාද කිරීම මෙන් ම පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන ආ දැනුම ඉදිරි පරම්පරාවට දායාද කිරීමෙන් ඔවුන්ගේ ජීවන කටයුතු, ඔවුන්ගේ සමාජ කටයුතු පහසු කරලීමට අවශ්‍ය දැනුම උපදෙස් ලබා දීම මෙහි දී සිදු වන ක්‍රියාවලියකි. උපදෙස් ලබාදීම, අවවාද අනුශාසනා ලබා දීම, මගපෙන්වීම යනා දි උපදේශන කාර්යයන් ජනශ්‍රැතිකාංග ඔස්සේ පවරා දීම අතීත ගැමි සමාජය තුළ බහුලව දැකගත හැකි විය. වර්තමානය වන විට ද තවමත් එම ජනශ්‍රැතිකාංග නොනැසී පවත්වාගෙන යන ආකාරයක් ද මෙම අධ්‍යයනයේ දී තහවුරු වූ කරුණකි. ජනකවි, ජන කතාන්දර, සිරිත් විරිත් , අභිචාර විධි, ඇදහිලි විශ්වාස, පුරාකතා, පුරාවෘත්ත, ශාන්තිකර්ම ආදී මෙකී නොකී බොහෝ ජනගත ජනශ්‍රැතිකාංග තුළින් උපදේශාත්මක ලක්ෂණ පිළිබිඹු වන අවස්ථා හඳුනාගත හැකි වේ.

## ජනකවිය තුළ ප්‍රතීයමාන ස්ත්‍රීත්වය තේමාන්විත උපදේශාත්මක ජනකවි ස්වරූප

ගැමි ජීවිතයේ නොයෙකුත් අවස්ථා අළලා ගැමියන් ම නිර්මාණය කරන්නට යෙදුනා වූ කවි ලෙස හැඳින්වෙන ජන කවි බොහොමයකට ස්ත්‍රී චරිත වස්තුවිෂය වූ බව ඒවා විශ්ලේෂණයේ දී පැහැදිලි වේ. ලිඛිත මෙන් ම අලිඛිත වශයෙන් ද ඒවා වෙන්කොට හඳුනා

ගත හැකි ය. මුඛ පරම්පරාගතව පැවත එමින් ලිඛිත සාහිත්‍යයට එක් වූ යශෝදරාවත, වෙස්සන්තර ජාතක කාව්‍ය ආදිය ස්ත්‍රී චරිත ප්‍රධාන කොටගත් ජන කාව්‍ය ග්‍රන්ථයන් ද පවතී. ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ කාන්තාවට දියණියක, සොයුරියක, බිරිඳක. මවක වශයෙන් අනන්‍ය වූ භූමිකාවන් සතු ය.

## ළදරු අවදිය හා කාන්තාව

කාන්තාව සිය ජීවිතයේ පසුකරන තවත් එක් අවධියක් ලෙස ළදරු අවධිය දැක්විය හැකි ය. මෙම ළමා කාලය දරුවාගේ උපතෙන් ආරම්භ වන අතර, එය තරුණ වියට එළඹෙන විට අවසන් වේ. මෙය කාන්තාවකගේ ජීවිතයේ සුන්දර ම සහ සුරතල් ම අවධිය ලෙස දැක්විය හැකි ය. කෙළිදෙළෙන් ගතකරන මෙම අවධිය ජීවිතවල මතක ඉතිරි කරන අවධියකි. සුරතල් වත, මොළකැටි වදන් කුඩා දරුවන් කෙරේ ආකර්ෂණය ඇති කරවයි. කාන්තාවකගේ ළදරු අවධිය පිරිමි දරුවකුගේ ළදරු අවධියට එහා ගිය රැකවරණය සහ ආරක්ෂාව සපිරෙන්නක් වේ. "දුවෙකු නැති ගෙදර මල් ගසක් නැති වත්තක් වගෙයි" යන කියමන තුළ දුවකගේ අගය ඉතා හොඳින් ගම්‍ය වේ.'' කෙසේ නමුත් පහත සඳහන් ජන කවි විශ්ලේෂණයේ දී දියණිය ''රත්තරං'' ''මැණිකෝ'' යන අන්වර්ථ නාමයෙන් පවා හැඳින්වුව ද වත්මන් සමාජ යථාර්ථා ය තුළ බොහෝ විවාහකයන්ගේ ප්‍රමුඛ අවශ්‍යතාවය ලෙස පෙනී යන්නේ පුතෙකු බිහිකර ගැනීම ය. මෙය ලාංකේය සමාජයේ උපදේශාත්මක ළදරු අවදිය හා කාන්තාව තේමාන්විත ජන කවි වල ප්‍රතීයමාන නොවන සත්‍යයයි.

දුවෙනි උතුම් අත්තලාට
වැඳපන් දැතින් හනිකට
තෑගි බෝග තනාම ලබන්ට
මතුවට පින් සිද්ද වෙන්ට

(සිල්වා සහ මලලසේකර,1992)

ඇත්තු රෑන දුවයි දුවේ
කොක්කු ඉගිළ දුවයි දුවේ
අම්මා ගෙට ඒවි දුවේ
නුඹ නාඩන් සොඳුරු දුවේ

(වීරක්කොඩි,2018)

කිරි බීලා සැතපී ඉඳපන්න දුවේ
මම ලෙස කෙනෙක් ලැබෙනව රත්තරන් දුවේ
මම දුක් වුණත් අකුසල් නැත නුඹට දුවේ
මෙම ලෙස මරණ සිදු නොවෙන ලෙස පැතුවේ

(බණ්ඩා,2000)

අතට වළලු කොහෙන් දුවේ
පයට ගිගිරි කොහෙන් දුවේ
ඉනට හවඩි කොහෙන් දුවේ
නාඩා නිදියන්න දුවේ

(ගුණවර්ධන,2003)

දෑතේ වළලුත නැතිකෝ
දෙපයේ ගිගිරිත් නැතිකෝ
අම්මා දැන් එයි හනිකෝ
නාඩන් සුරතල් මැණිකෝ

(ගුණවර්ධන,2003)

රනේ රුවසෙ ඇති බාල ළමුන් නේ
කනේ තෝඩු දෙක දෙපිට වැනෙන් නේ
ඉනේ සලුව තද කර ඇඳ ගන් නේ
අනේ ළඳුනි ඔන්චිලි පැදපන් නේ

(පීරිස්,(2019),පි.8,කවිය.7)

**මාතෘත්වය හා කාන්තාව**

මාතෘත්වය, කාන්තාවක, තම ජීවිතයේ ලබන උතුම් ම පදවිය වේ. එමෙන් ම මව යන්න සෑම පුද්ගලයෙකුගේ ම ජීවිතයෙහි සමීපතම චරිතයක් නිසාවෙන් ජන කවියා තම මව ගැන කවි පබඳින්නේ මාතෘ ස්නේහය උතුරා යන පරිද්දෙනි. "අම්මා නැති ගෙදර එළිවෙනවා නොදනේ" යන මැයෙන් අම්මා යන්න ජීවිතය තුළ අත්‍යවශ්‍ය චරිතයක් යන්න ප්‍රකට කරයි. අම්මා යනු හුදු වචනයක් පමණක් නොව ගෙදර බුදුන් යන සංකල්පයක් ලෙසින් ජන සමාජයෙහි මුල්බැස ඇත. මාතෘත්වයේ උතුම් බව, අම්මාගේ ආදරය, සෙනෙහස, ''උල්පතේ උනන'' දිය මෙන් ජන කවියෝ දුටුවෝ ය. පවිත්‍රතාවයෙන් පිරුණු ඒ ආදරය,ළෙන්ගතුකම පිළිබඳ ජන කවියා අපූර්වත්වයෙන් වර්ණනාවට ලක්කොට තිබේ. උපදේශාත්මක ජන කවි අතර, සුලභ තේමාවක් ලෙස මාතෘත්වය හඳුනාගත හැකි ය. ජනශ්‍රැතිකාංග සමාජානුයෝජනයට ප්‍රබල පිටිවහලක් එක්කරනු ලැබූව ද වතමන් සමාජය තුළ ''ගෙදර බුදුන් අම්මා'' වැනි සංකල්ප සත්‍ය ද යන්න ගැටලු සහගත ය. එය ලාංකේය සමාජය තුළ ක්‍රමයෙන් බහුලව ව්‍යාප්ත වන කාන්තා වැඩිහිටි නිවාස ස්ථාපිතය තුළින් ග්‍රහණය කරගත හැකි ය. තමා තම මව ප්‍රසිද්ධියේ ම ප්‍රතික්ෂේප කරන අතර, මඟ සිඟමන් සඳහා දමා යන උගත්, ධනවත් පුතුන්ගෙන් ද සමාජයේ හිදැස් ඇති බව වටහා ගත යුතු සත්‍යයකි.

බිම ඉරි තළාලයි බිම්මල් පිපෙන්නේ
කඳ ඉරි තළාලයි කඳ රුව පිපෙන්නේ
දස මස පිරීලයි අම්මා වදන්නේ
එහෙව් අම්මාට ඇයි තොපි බනින්නේ

(දේවමුල්ල,2002)

මලේ මලේ නොබනින් අපෙ අම්මාට
උඹෙත් මගෙත් දෙන දේ නැත උන්දැට
වෙන දේ නැතත් දෙතනේ කිරි පෙව්වාට
බුදුන් සේම වැඳ වැඳ සිටු අම්මාට

(වික්‍රමරත්න,1999)

දිනේ පටන් මා උපන්න
මව් විඳි දුක් බැරි කියන්න
දොහොත් මුදුන් තබා මෙන්න
වඳිමි මව්නි පව් අරින්න

(සිරිපාල,2010)

අඹර කුරක්කන් කළුවේ
ගල යට පිටි කොයි කළුවේ
රොටී එකක් උය කළුවේ
අම්මට දීපන් කළුවේ

(සිල්වා සහ මලලසේකර,1992)

දුක් විඳ දස මස උහුලා වැදූ දැයි අපෙ අම්මා
අඳුන් නෙතින් නිති සරසා ඇති කළෙ දැයි අම්මා
රස පලවැල නෙළා දිදී රක්ෂා කළ අම්මා
සරත අපාවල නොඉපදව නිවන් දකින් අම්මා

(පීරිස්,2019)

පුංචි පේර ඉණ බැඳගෙන ඉණෙන් ගෙනෙති අම්මා
ගැට නාරන් ඉණ බැඳගෙන ඉණෙන් ගෙනෙති අම්මා
පැන් කොරහට පැන් ඇරගෙන අප නා වති අම්මා
සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා

(වික්‍රමරත්න,1999)

එක අතකින් තියෙන් ගගා දෙතනේ කිරි බොම්මා
දසෙකඩ මස දුක් විඳලා වැදුවේ අපෙ අම්මා
සැකක් නැතිව බණ ඇසුවොත් සසරින් ගොඩ යම්මා
දුකක් නැතිව නිවන් ලබන් පින්වත් අපෙ අම්මා

(පීරිස්,2019)

එල්ලිලා උනිම් අතු අග වවුලො මෙනි
සල්ලි නැති නිසා ගමඉන්ටත් නූනි
සල්ලි නැති වුනේ කෙනෙකුගේ දසාවෙනි
මල්ලියෙ උබට බාරයි අපෙ මව් සඳිනි

(වීරසුන්දර,2014)

ගසක දොඩම් මදෙයි කියා කෑදැයි අපේ අම්මා
අහස තරුත් මදෙයි සිතා විලිළු දැයි අම්මා
මුහුදු දියත් මදෙයි කියා රස කිරි දුන් අම්මා
සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා

(වීරසුන්දර,2014)

පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බොම්මා
වම්මා කඳුලැලි ඉස ඉස ඇවිදින්දැයි අම්මා
අම්මා අප නොදැක ඉතින් කෙලෙසක වැවෙම්මා
සම්මා සම්බුදු වන දා නිවන් දකින් අම්මා

(ඩයස්,2004)

**ප්‍රේමය, රාගය සහ යෞවන කාන්තාව**

සමාජයක සහජීවනය රඳවා තබා ගැනීම උදෙසා ඒ ඒ සමාජවල ජීවත් වන මිනිසා ඔවුනොවුන්ට ප්‍රේම කළ යුතු ය. එය විශේෂ සමාජ මට්ටමකට හෝ තරාතිරමකට සීමා නො වේ. ඒ අතරින් ද ස්ත්‍රී පුරුෂ ප්‍රේමය විශේෂ වැදගත් කමක් උසුලයි. ජන කවියා ද මෙකී ප්‍රේමය මහත්

ඉහළින් වර්ණනා කොට තිබේ. ජන කවි බොහොමයක් ම ප්‍රේමය හා රාගය පසුබිම් කරගෙන නිර්මාණ වී ඇත. ජනයා තම සිතෙහි උපන් සිතුවිලි පැවසීමට ගැයූ මෙම ජන කවි තුළ ප්‍රේමය රාගය වැනි තම සිත් තුළ උපදින්නා වූ සිතුවිලි නිසර්ගයෙන් කවියට නැගුනකි. තම සිත ගත් තරුණිය කෙරෙහි උපන් ප්‍රේමය ඇය වෙත නොවළහා පැවසීමට අතීත ගැමියා මෙම ජන කවිය උපයෝගී කර ගත්හ. බොහොමයක් ප්‍රේමණීය සහ රාගික කවි නිර්මාණය වූයේ යෞවන කාන්තාව තේමා කරගෙන ය. ප්‍රේමය පැවසීමට මෙන් ම ප්‍රේමය අහිමිවීමේ ශෝකය පැවසීමට ද පැරැන්නෝ මෙම ජන කවිය යොදා ගත්හ. මෙකී ශානරයෙන් නිර්මිත උපදේශාත්මක ජන කවි පහත උදාහරණවලින් හඳුනාගත හැකි ය. කෙසේ නමුත් ඇය අඥාන බවත්, ඇය සිය ආශාවන්ට මුල්තැන දී කටයුතු කරන බවත් පවසන පුරුෂ මූලික දෘෂ්ටිමය සමාජය, කාන්තාව දෙවන පන්තියෙහි ලා කටයුතු කරන බව අතීත සාහිත්‍ය මූලාශ්‍රවලින් පමණක් නොව නූතන සමාජ නිරීක්ෂණයෙන් පැහැදිලි වන කාරණයකි.

අහපන් නෑනෝ මගෙ හිත තුළ ඇතිකාරී
ගෙයි හිමි හට රඟ දෙනකොට ලෙඩකෙදිරි
හොර හිමි හට රඟ දෙනකොට හිතමිහිරි
මොන කරුමයද මගෙ හිත රටටමයිපිරි

(වීරසුන්දර,2014)

මැණිකේ ඇවිත් අද තිස්සේ නියරවට
මඩ ඩිංගක් ඉසුණයි නෙරි කැරැල්ලට
කමා වෙලා මාතින් වුණු වැරැද්දට
මැණිකේ ඉතින් යනවාදො වලව්වට

(දේවමුල්ල,2002)

එක් වෙන දාට රස මීයේ පැණිසේමා
වෙන් වෙන දාට වස දෙබරේ වදසේමා
උසින් උසින් කටු අත්තේ අගසේමා
ඉතින් ළඳේ කරවිල තිබ්බටු සේමා

(ගුණසෝම,2015)

බෝග ගොයම් ලියන කෙතේ
යාග ලෙසින් කවි ඇසෙතේ
රාග සිතින් කවි කියතේ
වේග නොවන් මෙනුඹ කතේ

(සිරිපාල,2002)

එරිලා මඬේ ඉඳගෙන කරන වැද වදේ
තෙමිලා නෙරිය ලෙළදෙති නුඹගෙ තුනු ඉගේ
වැටිලා අව්ව සැරබෝය වෙල මැදේ
නැමිලා ලඳේ නොකපන් නුබෙ කොන්ද රිදේ

(සිරිපාල,2002)

පස්ස බල බලා වෙල මැද යන්ට එපා
මූන බල බලා ලෙව්ගිනි දෙන්ට එපා
ඇතින් කියන වචනෙට යට වෙන්ට එපා
හීන් මැණිකෙ නුඹ නැවිත් ඉන්ට එපා

(ලොකුහේවා,1996)

කුරක්කන් කපන වාරෙත් ආපි ළමා
ඉණේ තිබෙන වත ඇඳපන් දෙපොට නමා
කනේ තිබෙන කොළ මැදපන් දියෙන් තෙමා
වට පිට නොබලන්න නුඹෙ අත කැපෙයි ළමා

(බණ්ඩා,සිල්වා,2002)

මෙහැමුන් තදේ කොට කර නදේ
නෙසතුන් ඔදේ වැද සිඳ සිදේ
සතොසින් හදේ වසනැම සදේ
මෙම රන් මැදේ බිය නොව ලදේ

(ඩයස්,2004)

කුරක්කන් රුසිරු රුසිරු කුරු දෙතනේ
මලක්කන් සේම ඇවිදින් තිබෙයි තනේ
නරක්කන් මෙහෙම නොකියන් මට ළඳුනේ
කුරක්කන් තදින් නොකොටන් වැටෙයි තනේ

(බණ්ඩා,සිල්වා,2002)

## ස්ත්‍රී වර්ණනා

ස්ත්‍රිය වනාහි අතීතයේ සිට ම සෞන්දර්යාත්මක චින්තාවන්ට පාදක වූ වස්තු විෂයකි. ස්ත්‍රියගේ රූප සොබාව විවිධ අයුරින් ජන කවියට වස්තු විෂයය විය. බොහෝ සෙයින් කාන්තාව වර්ණනා කරන්නට ජන කවියා යොදා ගත්තේ ස්වාභාවික පරිසරයේ ප්‍රතීයමාන වස්තූන් ය. කොණ්ඩය කිතුල් රැනකට ද, මුහුණ පුන් සඳට ද, පයෝධර යුග්මය රන තිසරුන්ට සහ තැඹිලි ගෙඩිවලට ද උපමා කර ඇත. මෙම වර්ණනාවන් පිරිමින් තමා දුටු කාන්තාවන් පිළිබඳ සිදු කළා වූ වර්ණනාවෝ වූහ. නාරි දේහයකින් හෙබි කාන්තාවක දකින පිරිමියෙකුගේ සිත තුළ රාගිකසිතුවිලි ඇති වන්නේ නිරායාසයෙනි. එකී රාගික හැඟීම් අසම්මත ලිංගික චර්යාවලට පෙළඹවීමකි. කාන්තාවට ඒ සඳහා ඇරයුම් කරන්නේ ද වාච්‍යාර්ථයෙන් නොව ව්‍යංග්‍යාර්ථයෙනි. සුන්දරත්වය වර්ණනා කළ ජන කවියා ඇයව ඇතැම් අවස්ථාවන්වල දී අසුන්දරාත්මකව ද ඇය පිරිහෙළන ලෙසින් ගයා ඇති අයුරු මෙම අධ්‍යයනයේ දී පැහැදිලි විය.

මලි මලි මලී නුඹෙ කොණ්ඩෙට බඳිනමලී
තැලි තැලි තැලී නුඹෙ කර වට බඳිනතැලී
රැලි රැලි රැලී නුඹෙ ඉණවට දමනරැලී
ලොලි ලොලි ලොලී නුඹ නාඬන්න රණමොලී

(සිල්වා,මලලසේකර,1992)

රන් වණින් විළිකුන් දෙළුම් එල මෙන් තිබූ මෙමගෙලයේ
රත්තරන් වටිනා සුපුන් තන දැන් මෙසේ වැරිසැල්වියේ
මත්වෙමින් මගෙ රූ සිරින් උන්යොවුන් කොල්ලන් මයෙපයේ
හැප්පෙමින් සිටියත් බැලුම් නැත දැන් අනේ හැටිලෝකයේ

(වික්‍රමරත්න,1999)

අහසට එළිය ඉර සඳ මඬලේ එළිය
රජෙකුට එළිය විමසා දෙන සැනසිලිය
මඟුලට එළිය නෑ මිතුරෝ ආකළය
ගෙදරට එළිය ගුණ නැණ යුත් තරුණිලිය

(පුස්සැල්ල,2006)

පින්සිරි කතක් නැත පොඩිමැණිකෝ උඹවගේ
එන් කරඬුවෙන් එළියට ගත් මැණිකවගේ
පෝය දාට පායන පුරා හඳවගේ
පින් කළ විශ්ණු රැක දෙන් පොඩි මැණිකමගේ

(ජයතිලක,2019)

බිරිඳක් සිටින ගෙට පහනක් නැතුවාට
ආලෝකයක් දෙයි පුන් සඳ මෙන්රෑට
ගැහැනිය ගෙදරකින් පිට වීගියදාට
තේරෙයි ඇගේ වටිනාකම සැමියාට

(පුස්සැල්ල,2006)

ලෝකෙට එළිය ඉරු සඳු විහිදෙන එළිය
රජගෙට එළිය සේනා පිරිවර එළිය
මඟුලට එළිය නෑ මිතුරන් ආ කළය
කුලගෙට එළිය සුචරිතවත් තරුණිලිය

(පුස්සැල්ල,2006)

## සමස්ත කාන්තා පරපුර අළලා නිර්මාණය වූ ජන කවි

කාන්තාවකගේ සුන්දරත්වය රඳාපවතින්නේ ඇයගේ රූසපුව මතයි. ඇඳුමෙන් පැළඳුමෙන් ඇයගේ බාහිර සුන්දරත්වය මතු වේ. එහෙත් කාන්තාව බාහිර ස්වරූපයෙන් කෙතරම් සුන්දර කාන්තාවක වුවත් චිත්තාභ්‍යන්තරයේ පවතින්නේ ද්වේෂ සහගත පව්ටු චේතනාවන්නම් ඇය කිසි විටක සුන්දර කාන්තාවක බවට පත් නො වේ. ස්ත්‍රියකගේ සැබෑ සුන්දරත්වය මතු වන්නේ ඇයගේ බාහිර පෙනුම මෙන් ම චිත්තාභ්‍යන්තරය ද පිරිසිදු වුවහොත් පමණක් බව වටහාගත් ජන කවියා ස්ත්‍රිය චරිතවත් කිරීමට අවශ්‍ය උපදේශයන් ද ජන කවිය තුළින් සමාජයට සම්ප්‍රේෂණය කිරීමට යත්න දරා ඇත.

ඉණ රෙදි අදිමින් පාරේ නොයන්නේ
රෙදි හඬ නගමින් පා නොතබන්නේ
තම රුව බලමින් උඩගු නොවන්නේ
හැඩ නිල බලමින් ගමන නොයන්නේ

(ගුණසෝම,1999)

එළිය වෙන්නට පෙර බැහැපන් ගෙන්දොරට
පිරිය වෙන්ට අතුගාපන් මිදුලවට
හීලට තිබුණ බත් දීපන් දරුවන්ට
රාලට ටිකක් දීපන් වැඩකටයන්ට

(වික්‍රමරත්න,1999)

කටින නූල් මිල වටිනා මිලහොඳමා
පදින ඔරුව බඳිනා රුවලක්සේමා
විඳින සැපට නොවිඳින සැපත බොහොසේමා
ගුණ නැති ලියන් ලුණු නැති මාළුවසේමා

(රත්නායක,2010)

ගමට එළිය ගම දියුණු වනවිටය
වෙලට එළිය නිල් වන් ගොයම් ඇතිවිටය
රටට එළිය රට රජ කරනවිටය
ගෙදරට එළිය ගුණ නැණයුත් තරුණලිය

(ගුණසෝම,1999)

අඳේ ගෙනත් වී අටුවට පුරවන්නේ
කඳේ තිබුණ ගිනි මදක් නිවෙන්නේ
ළදේ පරෙස්සම් හොඳට කරන්නේ
සොඳේ ලෙසින් ජීවිත රැකගන්නේ

(වික්‍රමරත්න,1999)

**සමාලෝචනය**

සාම්ප්‍රදායික දැනුම නූතන සමාජ අවශ්‍යතාවයකි. අතීත මුතුන් මිත්තෝ ස්වභාවධර්මය සමඟ පවත්වා ගත් සම්බන්ධතාව මත ඔවුන් ලබාගත් දැනුම, අත්දැකීම්, පරපුරෙන් පරපුරට ගලා යාමට සැලැවූහ. එලෙස කටවහරෙන් පවත්වාගෙන ආ බොහෝ දෑ අද වන විට ලේඛනගත වී ඇති නමුත් ඇතැම් ජනශ්‍රැතිකාංග පරම්පරාවත් සමඟ නැසීයමින් පවතී, ජනකවියා තම නිර්මාණශීලීත්වය උපයෝගී කොට ගනිමින් අදහස් හුවමාරු කරගත් බවත්, උපදෙස් ලබාදෙමින් පුද්ගල සමාජානුයෝජනයට අවශ්‍ය කාර්යයන් ඉටු කළ බවත් මනාවට පැහැදිලි වන කරුණකි. ජනතාව අතරේ ම ඇති වී, ජනතාව අතරේ ම ආරක්ෂා වී එන කවි පොදු වහරේ 'ජනකවි' නමින් හැඳින්වේ. මේ අනුව ජනකවි පිළිබඳව කරුණු ද්විත්වයක් හඳුනාගත හැකි ය. උගත් සාහිත්‍යයක් ඇතත් නැතත් ඕනෑම ජන කොටසක් අතර ජනකවි පහළ විය හැකි, සහ පහළ වන බව පළමුවන කරුණ ය. දෙවැන්න නම් උගත් සාහිත්‍යයක් පහළ වීමට පෙරාතුව ජනකවි පහළ වීම ස්වාභාවික බව ය. මව්ගුණ, බඩගින්න,

දරුවන් හා ඥාතීන් විසින් නොසලකා හරිනු ලැබුවන්ගේ දුක බලාපොරොත්තු සුන්වීම, අගෞරව විඳීම, අනපේක්ෂිත ව්‍යසනයන්ට පාත්‍රවීම යන ආදී විවිධ විෂයයන් මුල්කර ගත් ජන කවි බොහෝ ප්‍රමාණයක් ඇති බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලි විය.

එපමණක් ද නොව උපත, රන්කිරි කට ගෑම, ගුරු ගෙදර යෑම, වැඩිවියට පැමිණීම, අතිනත් ගැනීම, මරණය ආදී හැම අවස්ථාවක් ම සම්බන්ධ ජන ඇදහිලි, සිරිත් විරිත් මුල් කර ගත් කවි අතර, ද ස්ත්‍රීත්වයේ පිළිබිඹුව තීව්‍ර ය.

සිංහල ජනකවියේ භාෂා ස්වරූපය පිළිබඳ ලක්ෂණ දෙකක් මෙහි දී හඳුනාගත හැකි ය. එනම් විකල්ප ව්‍යවහාර ලක්ෂණ, කථා ව්‍යවහාර ලක්ෂණ ය. ජනකවිය මුඛපරම්පරා ගතව පැවත එන්නක් නිසා, ඊට අයත් පද නිතර නිතර වෙනස්කම්වලට හසුවෙමින් පවතී. මේ හේතුවෙන් එකම කවිය පවා නොයෙක් පුද්ගලයන් අතර ද නොයෙක් පළාත්වල ද, නොයෙක් ලෙසින් ව්‍යවහාරයට පත් ව ඇති අයුරු මෙම පර්යේෂණය තුළ පැහැදිලි විය. සිංහල ජනකවියා නිතැතින් භාවිතයට ගත් වචන රාශියක් මේ වචන කෝෂයට ඇතුළත් වෙයි. 'ගෝමර' යන පදය ද එහි එක් අවස්ථාවකි. ජනකවියා සුන්දර යැයි සලකනු ලබන ලිය 'ගෝමර' සහිත කාන්තාවකි. ලක්දිව ඒ ඒ පළාත්වලට පමණක් සීමා වුණු වචන රාශියක් ද, ජනකවියා විසින් භාවිත කොට තිබේ. ජනකවියා හුදෙක් ඥාතීන් පමණක් නොව, සිය හිතවතුන් ද ආමන්ත්‍රණය කළේ නෑකමක් මතිනි. මෙය පොදු ජන ව්‍යවහාරයේ ලක්ෂණයක් වෙයි. මෙසේ ඇමතීම පිණිස ජනකවියා යොදාගත් පද ද, පොත්පත්හි දක්නට ලැබෙන පද නොව, පොදු ජනයා අතරෙහි ම භාවිතා වන පදයි.

උපදේශ කාව්‍යවල උදාහරණ කීපයක් දක්වා උපදේශය අවසාන පදයෙන් ඉදිරිපත් කිරීම, කවිවල පාද දෙකකින් උදාහරණයක් ද කවි පාද

දෙකකින් උපදේශය ලබා දීම ද, කවිවල පද පේළි හතරෙන් උපදේශ හතරක් දක්වා තිබීම මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී පැහැදිලි වූ සුවිශේෂී කරුණකි. ජනකවි අතර, මෙවැනි උපදේශ කවි රාශියක් ඇත. එම උපදේශ පසු කාලීනව ප්‍රස්තාව පිරුළු ලෙස වහරට එක් වී ඇත. ''කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි'' ''දුවන මුවන් දැක නො දමවු නෙළු පලා....'' වශයෙන් ව්‍යවහාරයේ එන ප්‍රස්තාව පිරුළු රාශියක් මේ කවිවල අන්තර්ගත ය. ස්ත්‍රීත්වය නිරූපිත උපදේශාත්මක ජන කවි අතර, කුඩම්මා සහ මදසරු බව විෂය තේමාන්විත ජන කවිවල අතීත මෙන් ම වර්තමාන සත්‍යයන් ප්‍රති නිර්මාණය වී ඇති බව පැහැදිලිය. වයසට ගැලපෙන ලෙස කිසියම් නෑදෑකමකින් ආමන්ත්‍රණය කිරීම වර්තමාන සාමාජ ව්‍යූහය තුළ විද්‍යාමාන වන සාධනීය ගුණාංගයකි. බවට ද පත්වී ඇත.

**කුඩම්මා**

මවගේ මරණයෙන් හෝ මව දරුවන් සහ සැමියා අතහැර ගිය විට, පියා විවාහ කරගන්නා වූ තැනැත්තිය කුඩම්මා ලෙස හඳුන්වයි, කුඩම්මායැයි කියූ සැනින් සිහියට නැගෙන්නේ නපුරු, දුර්ජන තැනැත්තියකි. ඒ අතීතයේ පටන් ජනගත වූ ඈ සතුව පැවති ගති සිරිත් හා නොමනා ක්‍රියාවන් නිසාවෙනි. ඈ ඇයගේ දරුවන්ට ආදරයෙන් සැලකුව ද, ඇගේ නොවන ඈ යටතේ සිටින දරුවන්ට සිදුකරන්නේ නපුරුකම් ය. බොහෝ ජන කවිවලින් අසන්නට ලැබෙන්නේ කුඩම්මා ඔවුන්ට ලබා දුන් පීඩාකාරී තත්ත්වයන්හි ශෝකාකූලත්වය ය. දරු දුක නොහඳුනන කාන්තාවක ලෙස ගැමියා කුඩම්මා දුටුවේ ය. තම මවගේ ගුණ මෙන් ම කුඩම්මාගේ නුගුණ සිහිපත් කරමින් කුඩම්මා ගැන කවි පබඳින්නට කවියා සමත්විය. එහෙත් කුඩම්මා කුඩම්මෙකු නොවී මවක වන අවස්ථාවන් ද සමාජය තුළ දක්නට ඇත. මෙම ජනකවිවල

බොහෝවිට උපදේශය අවසාන පාදයෙන් ඉදිරිපත් කර ඇති බව පැහැදිලි වේ.

කයි මදුලු කයි මදුලු වැල මදුලු
මාත් ගෙදර එන්නා නම් කයි මදුලු
වැදූ මවක් නම් දීලා කයි මදුලු
පර අම්මේ මේ බලපන් එන කඳුලු

(බණ්ඩා,2000)

අප්පච්චී දොරකඩ කිතුල වාගේ
අපෙ අම්මා ඒ කිතුලේ මල වාගේ
පර අම්මා පරලොව හතුරෙක් වාගේ
පර අම්මා කහඹිලියා කොළ වාගේ

(බණ්ඩා,2000)

මදසරුබව සහ කාන්තාව

මාතෘත්වය ලොව උතුම් වූ දායාදය වේ. විවාහ වූ දිනයේ පටන් බහුතරයකගේ සිහිනය වන්නේ මාතෘත්වය ය. නමුත් අතළොස්සක් කාන්තාවන්ට මෙම මව් පදවිය දැරීමට ඇති හිමිකම අහිමිය. එය සිදුවන්නේ හුදෙක් ඔවුන්ගේ ශාරීරික දුබලතාවක් නිසා හෝ ස්වාමීත්වයේ ශාරීරික දුර්වලතා හේතුවෙනි. මෙලෙස දරුවන් දැරීමට අපොහොසත් වන කාන්තාව සමාජය තුළ අසුභ ලකුණක් ලෙසින් සංවාදයට ලක් වේ. සුභ ගමනක් යන අතරමග එවන් වඳ කතක දුටුවොත් එම ගමන අසාර්ථක වන බවට පැරැන්නෝ විශ්වාස කළෝ ය. ඒ අයුරින් දරුවන් නොලබන කාන්තාව සමාජය පහත් කොට සලකයි. මේ හේතුවෙන් ඇය බොහෝ මානසික පීඩනයට ගොදුරු වේ. පුරුෂ පක්ෂයේ අඩුපාඩු පැවතිය ද දෝෂදර්ශනයට ලක් වන්නේ කාන්තාව පමණි. ඔවුන් තුළ පවතින ශාරීරික දුබලතාවලට ද පීඩා විඳිනට සිදු

වන්නේ ද කාන්තා පාර්ශවයටයි. දරුවන් නොලබීමේ දුක මෙන් ම සමාජයෙන් එල්ල වෙන තාඩන පීඩනයට ද මානසික පීඩාවට ද ඔවුහු පත්වෙති.

දරුවෙකු නොදරන කුස ''මල් පිපෙන්නැති වනයක්'' මෙනැයි පවසති. මෙවන් ස්ත්‍රීන් දෙවියන්, බුදුන් ඉදිරියේ පවා සරණක් පිහිටක් අයදින්නේ දරුවන් නොමැති කමෙන් ඔවුන් විඳින්නා වූ පීඩාවෙන් මිදීම උදෙසා ය. කෙතරම් භවබෝග සම්පත්, ධන ධාන්‍ය සතු ජීවිතයක් ගත කළත් දරුවන් නොමැති කාන්තාව එල නොදරන ගසකට ජන කවියා උපමා කර ඇත. මේ ආදී වූ වශයෙන් මදසරු කාන්තාව විඳින දුක් වේදනාව, ඇයට සමාජයෙන් එල්ලවෙන්නා වූ නින්දා අපහාස මෙන් ම එවන් ''වඳ කතුන්'' දරුවන් අයදිමින් ගයා ඇති ජන කවි රාශියක් අපට ජන කවි සාහිත්‍යය තුළ දක්නට ලැබෙන අතර, ඒ අතරින් ද උපදේශාත්මක තත්ත්වයන් පවතින ජනකවි පහත දක්වා ඇත.

සැරි සිව් සැට බරණින් යසස  
සුරඟන මෙන් උනත් තිදස  
දරු නැති අඟනුන්ගේ කසස  
පල නැති මල් වෙනි වන පසස  
(වික්‍රමරත්න,(1999)

වඳ ගෑණිගෙ රෙදි පියලී  
රදවකු හට දුන්න කලී  
එක්ක අපුල්ලපු පිළී  
ඇඳි අයටත් වෙයි තැවලී  
(වික්‍රමරත්න,1999)

දරුවන් ඇති අම්මාලා  
දරු සුරතල් පෙන්නාලා  
දරුවන් නැති අම්මාලා  
නිකම් ඉඳිති බුම්මාලා  
(ඩයස්,2004)

## ස්ත්‍රීත්වයේ අපහාසාත්මක ස්වරූපය

කාන්තාවගේ රුව ගුණ ගැයූ ජනකවියා විසින් ඇය අපහාසයට පත් කිරීමට ද එම ජන කවිය ම යොදා ගෙන ඇත. තම ස්වාමියා සිටිය දී වෙනත් පිරිමින්ගේ පහස පතා යන, වෙනත් පිරිමින් සනසාලන කාන්තාව කවියා දකින්නේ වෙසගනක් ලෙසට ය. එලෙස ම ගැමියා තමන් ප්‍රිය කරන, ආදරය කරන කාන්තාවක තමන්ට අකමැති වුවහොත් ඇයට අපහාසාත්මක ලෙස හෙළාදකියි. යම් අවස්ථාවන්වල දී කුලය පදනම් කරගෙන ද කාන්තාව පහත් කර, ඇයට අපහාස කරන අවස්ථා ජන කවියෙන් හමු වේ. ඇඳුමෙන් පැලඳුමෙන් පමණක් අලංකාර වුව ද ගුණ යහපත්කම නොමැති නම් එවන් කතක නොවටීය යන්න ජන පිළිඹිබුවකි. සවැන්නක් වන පහත ජන කවි ස්ත්‍රීත්වයේ අපහාසාත්මක ස්වරූපය මතින් ගොඩනැගුණු උපදේශයන් ය.

ආ සා වෙලා කුමට ද නුඹ ඇවිදින්නේ
ආ සා උනත් වේසාලිය අනුන්ගේ
හී සානා එක මග ද යන්නේ
වේසා ලියන් සිටි අසලින් නොයන්නේ

(බණ්ඩා,2002)

වස්සා කිරට මෙන් අදරට විසුවලියෝ
උස්සා ගොදුරු ගහගෙන යන ලෙසටගියෝ
රස්සා කරපු හිමි මරවාපු හැතිරියෝ
විස් වහ නැත කවදත් වදකබාරියෝ

(බණ්ඩා,2002)

දෙනුවන් ඉඳු මිනෙව් වූ වත පුන්සඳසානූ
දෙලවන් සුරත් බිඹුපල තන හසදේනූ
රුසිරෙන් සිටින මුත් ලියවන් පසබානූ
නොපතන් ම දිවි යනතුරු පිටිසරගෑනූ

(ගුණසේකර,2007)

ගෙන් ගෙට ඇවිද අන් කේළම් කියානම්
ගෙදර ඇවිත් සැමියට දොස් පටවානම්
වත්ත පිටියේ කිසි වැඩකුත් නොකරානම්
වදකබාරි ලිය දැන ගන් එසේනම්

(ගුණසෝම,1999)

ඇඳුමෙන් පැලඳුමෙන් මිස තුනුරුවපානු
සලෙලුන් පොළඹවන රතිමායම්පූනූ
විලසන් හිරි ඔතප් නැති තිරිසන්දේනූ
පැතුමෙන කොද වැඩක් එළි මහරටගෑනු

(ගුණසේකර,2007)

ඇස් වපරැති දත් බොල්ලෑ ගෑනුන්
වක්ක ගසා කැසි මුස ඇති ගෑනුන්
අත්තුල් පත්තුල් ලොකුබර ගෑනුන්
නොගන්න කිව් ආවැඩුමට එළඳුන්

(ඩයස්,2004)

පුරුෂ මූලික දෘෂ්ටිමය සමාජය, කාන්තාව දෙවන තැන්හි ලා කටයුතු කර ඇතිබව ජනශ්‍රැතිය මඟින් මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රවලින් ද පෙනීයන කරුණකි. එය වඩාත් තීව්‍රව නූතන සමාජ නිරීක්ෂණයෙන් ගම්‍යවන කාරණයකි. ස්ත්‍රීත්වය තේමාන්විත බොහෝ ජනකවි ප්‍රවර්ග අන්තර්ගතයන් තුළ ප්‍රතීයමාන ජීවන දෘෂ්ඨිය වත්මන් මානව සමාජ යතාර්තයට දක්වන සම්බන්ධතාව යතාර්තයෙන් දුරස්ය.

## ආශ්‍රිත මූලාශ්‍ර


අත්තනායක. බී, (2005), *කාන්තාව හා සන්නිවේදනය*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, .

අතුරුගොඩ දෙ . සි. විදානගම, (2015), *ගැමි නළු ගී,* කොළඹ: ගුණසේන ප්‍රකාශකයෝ.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,(2009), *සිංහල ජනකවි සංග්‍රහය,* කොළඹ: ෆැස්ට් ප්‍රින්ටරි ප්‍රයිවට් ලිමිටට්

අමරසේකර, දයා, (1996), *ජන කවිය සහ ගැමි සමාජය,* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

ඉහළගම, ස්වර්ණා, (1997), *පැදුර හා සිංහල ජනජීවිතය*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එංගල්ස්, ෆ්‍රෙඩ්රික්, (1979), *පවුල පෞද්ගලික දේපල හා රජය ඇති වූ සැටි*, මොස්කව්, කොළඹ: ප්‍රගති ප්‍රකාශක මන්දිරය.

කොඩිකාර.වත්සලා, (2000), *බෞද්ධ කාන්තාවගේ සමාජ කාර්යභාරය*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත් සුචරිත, (1998), *මනමේ නාට්‍ය සේවනය, මරදාන*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ගමගේ, නිමල්, ජේ. (2002), *ජනකවියේ සාහිත්‍යමය අගය*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ගල්හේන, සුදත්, විකුම්, (2015), *හෙළ ජන ක්‍රීඩා,* කොළඹ: සඳුනි ප්‍රකාශකයෝ.

ගුණවර්ධන ඩබ්ලිව්.එෆ්, (1996), *වාක්‍ය සහිත මයුර සංදේශය.*

ගුණවර්ධන දඹානේ,(2002), *වැදි ගී විමසුම*, කොළඹ: පන්හිඳ ප්‍රකාශන.

ගුණවර්ධන, රුක්මණී, (1998), *සිංහල ජන කවිය සහ අවිධිමත් අධ්‍යාපනය*, සමයවර්ධන ප්‍රින්ටර්ස්, 53 මාලිගා කන්ද පාර, කොළඹ 10.

ගුණසේකර, බන්දුසේන, (2007), *ජනකවි සාහිත්‍ය විචාර ලිපි සරණිය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණසේකර.යූ, (2001), *ළඳුන් හා ළමුන්*, කතෘ ප්‍රකාශන.

ගුණසෝම, ගුණසේකර, (1999), *පානම් පත්තුවේ ජනකවි*, කොළඹ. එස්. ගොඩගේ.

ගුණසෝම, ගුණසේකර, (2015), *කල්තොට ජනකවි*, ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට් ලිමිටඩ්).

ජයනෙත්ති, දයාපාල, (2001), *බඹර කවි වරුණ*, කර්තෘ ප්‍රකාශන

ජයබාහු චන්දිමා ලක්ෂණි , (2008), *හින්දි සහ සිංහල ජන ගී පිළිබඳ තුලනාත්මක අධ්‍යනයක්*, කර්තෘ ප්‍රකාශනයකි

ඩයස්, හර්සන්, (2003), *ජන සාහිත්‍ය සම්ප්‍රදාය*, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.

ඩයස්, හර්සන්, (2004), *මහනුවර මාතර ජනකවි සාහිත්‍යය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දනන්සූරිය, ජිනදාස, (2002), ජනශ්‍රැති විද්‍යාව, කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අස්සජි හිමි, තල්පෙ. (1998), *ජනකවිය දෙවියෝ සහ යක්ෂයෝ*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකරත්න, මිණිවන්, පී,(1971), *ජන කවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ*, දීපානී මුද්‍රණ ශිල්පීන් ප්‍රකාශකයෝ

දේවමුල්ල උපාලි,(2002), *සිංහල ජන කවි*, ජනක්‍රී හා වන්නම්, සරසවි ප්‍රකාශකයෝ

නෙස්තුර්හ්.එම්.එෆ්, (1981), *මිනිසාගේ සම්භවය*, මොස්කව්,

පරණවිතාන රෝහිණී,(1990), *හියූ නෙවිල් රැස් කළ ජන ගී පිළිබඳ අධ්‍යනයක්*, ජන ගී මිහිර,සංස්කෘතික අමාත්‍යාංශය

පීරිස්, රැල්ෆ්, (1964), *රාජකාරිය හා කාර්යභාරය*, කොළඹ, සිංහල සමාජ සංවිධානය.

පීරිස්, ශාන්ත, (2019), *හෙළ ජන ගී, සීමාසහිත*, ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම.

පෙරේරා,කුසුම්, ජානකි, (1993), *කාන්තා ප්‍රතිරූපය හා සමාජ මුහුණුවර*, කර්තෘ ප්‍රනාශන.

පෙරේරා පද්මා,(1990), *ජන ගී මිහිර*, සංස්කෘතික අමාත්‍යාංශ

ප්‍රේමසිරි, එස්, (2019), *ජනශ්‍රැති විද්‍යා පර්යේෂණ : න්‍යායික හා ප්‍රායෝගික*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ

ප්‍රනාන්දු, මෝසස්, (2003), *බඹර කවි*, චතුර මුද්‍රණ ශිල්පියෝ.

බණ්ඩා, ස.ජ, සුමනසේකර, සිල්වා, ප්‍රියන්ජන්, සුරේෂ් ද, (2002), *පහළ ඌවේ ජන කවි. කර්තෘ ප්‍රකාශනය*

මනුරත්න.එම්.පී, (2004), *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල*, ආරිය ප්‍රකාශකයෝ,වරකාපොළ.

මානව හිතවාදී ලේඛක පර්ෂදය,(1998), *ජන කාව්‍ය සංග්‍රහය, මහරගම*, තරංජි ප්‍රින්ටර්ස්

යනූෂා, ලක්මාලි, (2014), *සිංහල කවියේ හැඩරුව රැගත් ජනකවි*, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

රණතුංග කෝලිත, (2017), *පරපුරක උරුමය හෙවත් අපේ ජනකවි*, අරටුව ප්‍රකාශන

රත්නපාල,නන්දසේන. (1999), *බුදු දහම. සමාජ විද්‍යාව හා ජන ජීවිතය*, ආරිය ප්‍රකාශකයෝ,වරකාපොළ.

රත්නායක, මනෝජ්, (2010), *සිංහල ජනකවි*, බුද්ධි ප්‍රකාශකයෝ.

රත්නායක, රුවන්, (2018), *ජන කවියෙන් උපන් කතා*, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

රාජපක්ෂ, එස්. එම්. ඩබ්ලිව්, (2019) *ජන කවි සාහිත්‍යය*, සී/ස තුසිත පොත්හල

ලියනගේ, ගැමුණු,(1995), *හෙළ ජන ගී,* රුහුණු පොත් ප්‍රකාශකයෝ, කොළඹ 11

ලොකුහේවා, සඳරුවන්, (1996), *බින්තැන්නේ ඇත්තෝ,* චතුර මුද්‍රණාලය.

ලොකුහේවා, සඳරුවන්, (1999), *බැද්දේ ජනකවි*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමරත්න, අමරසිරි, (1999), *ජන කවියෙන් හෙළිවෙන සිංහල ගෘහ ජීවිතය*, සී/ස දීපානී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්.

වීරක්කොඩි, ඉරංගා, සමින්දනී, (2013), *නැළවිලි ගීයෙන් නිරූපිත සිංහල ජනශ්‍රීය*, ජනමිහිර නිර්මාණ.

වීරක්කොඩි, ඉරංගා, සමින්දනී, (2017), *ජන සංගීත විමර්ශන*, ජනමිහිර නිර්මාණ.

වීරසිංහ, පී, (1986), *ජනකවි සාහිත්‍යය*, සමයවර්ධන ප්‍රකාශකයෝ

වීරසුන්දර, සිරිසේන, (2014), *ජන කවිය හා සමාජය*, සරසවි ප්‍රකාශකයෝ

සිරිපාල, නෝමන්, (2002), *ගොවිගෙදර ජනකවි*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

සිරිපාල, නෝමන්, (2010), *ගාලු කෝරලේ ජනකවි*, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

සිරිසේන, කොත්මලේ, (2011), *සිංහල ජනකවි*, සී/ස සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

සිල්වා, ඩබ්ලිව් ආතර් ද, මලලසේකර ගුණපාල, (1986) *සිංහල ජනසම්මත කාව්‍ය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුනිල්, එල්.බණ්ඩාර,(2012), *ජන කවිය හා සමාජ තොරතුරු,* නැණිල පබ්ලිකේෂන්

සේනාරත්න, පී.ඇම්, (2010), *ශ්‍රී ලංකාවේ ජනකවි*, සරසවි ප්‍රකාශකයෝ

හෙට්ටිගේ, එන්. අමරසිරි,(1995), *ජන කවියේ ධීවර ලකුණ*, කර්තෘ ප්‍රකාශනයකි

**ඉංග්‍රීසි**

බෲන්වාන්ඩ්. සී, (1978), *American folklore*, Glone pequor

බෙරියන්ස්, ඩී, (1937), *The study of American folklore*, www.norton.co.

විල්සන්, එන්.සී, (1996), *Theory and History of folklore*, university of califonia

ටෝල්කන්, බී.කේ. (1979), *Mexican Tales*, CVLTVRA

මැතිව්සන්, ආර්.එච්., (1962), *Guidance Policy and Practice*, Harper & Row, Publishers

**ශබ්දකෝෂ - ඉංග්‍රීසි**

Oxford Languages, (2010) Oxford Dictionary of English 3rd Edition, Oxford University Press

# ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ පාරිසරික සංජානන විෂමතා පිළිබඳ අධ්‍යයනය

ජේ. එන්. ඩී. ජයතුංග සහ එස්. යූ. කේ. ඒ. එන්. සුහර්ශන

## හැඳින්වීම

මිනිසා ස්භාවික පරිසරය ජය ගනිමින් තම අවශ්‍යතා සපුරා ගැනීමට අතීතයේ සිටම උත්සාහ ගෙන ඇත. පරිසරයෙහි කටුක බවින් මිදී තම ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කර ගැනීම උදෙසා මහත් පරිශ්‍රමයක් දැරූ මිනිසා සිය බුද්ධි මහිමය උපයෝගී කර ගනිමින් තම අරමුණු ජය ගත් අතර ස්ථිර ජනාවාස ආරම්භ වීම ද මේ සමඟ සිදුවිය. ශ්‍රී ලංකාව තුළ විජය කුමරුගේ ආගමනයට පෙර සිටම ජනාවාස පැවති බවටත් නාගරික ජනාවාස රාජ්‍යත්වයේ වර්ධනයත් සමඟ අනුරාධපුර රාජධානියෙන් ආරම්භ වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. නමුත් ශ්‍රී ලංකාවේ නගර සම්බන්ධයෙන් පැහැදිලි වාර්තාවක් හමුවන්නේ 1871 ඉංග්‍රිසි අධිරාජ්‍යවාදීන් විසින් සිදුකරන ලද ලංකාවේ පළමු සංගණනයෙන් ය. මේ ආකාරයට සෙමෙන් සහ ක්‍රමයෙන් ආරම්භ වූ ශ්‍රී ලාංකීය නාගරික වර්ධනය අද වන විට කුඩා නගර 8, මධ්‍යම නගර 30, මහනගර 17 ක් ලෙස මුළු නගර 55 කින් සමන්විත වන අතර නාගරික ජනගහන ප්‍රතිශතය 18.2% කි. ග්‍රාමීය ජන සංඛ්‍යා ප්‍රතිශතය 77.4% කි.

ගම සහ නගරය වෙන් කොට හඳුනා ගැනීම සඳහා ලෝකයම පිළිගත් පොදු නිර්ණායකයන් නොමැති අතර එක් එක් රටවල් විවිධ වූ නිර්ණායක මත පදනම්ව එය වෙන් කරනු ලබයි. ජන ඝනත්වය, ආර්ථික කටයුතු, පරිපාලන මායිම්, පළාත් මායිම් එම නිර්ණායකවලින් කිහිපයකි. මෙලෙස ගම සහ නගරය ව්‍යූහාත්මක ලක්ෂණ අනුව වෙන්කර හඳුනා ගත්තද ඒවා නිරන්තරයෙන්ම ඒකාබද්ධව ක්‍රියා කරයි (Jefferson, 1931). නගරවලට තනිව වර්ධනය විය නොහැකි අතර ග්‍රාමීය ප්‍රදේශවල

අනුග්‍රහය ඒ සඳහා අවශ්‍ය වේ (Douglas, 1998). ඒ අනුව ග්‍රාමීය පුද්ගලයෙකුගේ දෛනික ජීවිතයට ග්‍රාමීය හා නාගරික අවශ්‍යතා දෙකම ඇතුළත් වේ. පාරිසරික වශයෙන් ද මෙම ප්‍රදේශ අතර අන්තර් සම්බන්ධතාවයන් ඇතිවේ. නාගරික ප්‍රදේශ සිය නීත්‍යානුකූල මායිම් හෝ සීමාවෙන් ඔබ්බට ප්‍රසාරණය වීමේ දී ග්‍රාමීයව පවතින ස්වාභාවික සම්පත් (භූමිය, ජලය ආදිය) සඳහා ඉල්ලුමක් ඇතිවේ. මෙලෙස ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන භුවමාරු ක්‍රියාවලිය ප්‍රදේශ දෙකටම ප්‍රතිඵල ගෙනදෙනු ලබයි. මේ ආකාරයට ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශයන්ගේ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයන් රැසක්ම අද දක්වා සිදුකර ඇති නමුත් එම ප්‍රදේශවල ජනතාවගේ පාරිසරික සංජානනය කෙබඳු දැයි ගැටලු සහගතය. පාරිසරික සංජානනය යන්නෙන් අදහස් කරන්නේ මිනිසා සහ පරිසරය අතර පවත්නා වූ සංජානනය පිළිබඳ සංකල්පයකි. එනම් පුද්ගලයා තුළ පවතින පරිසරය සහ පරිසරයට සම්බන්ධ දේවල් (දේශගුණ විපර්යාස, පාෂාණ චක්‍රය ආදිය) පිළිබඳව පවත්නා වූ ධනාත්මක, සෘණාත්මක ආකල්ප, දැනීම ආදියයි. සංජානනමය පරිසරයෙන් වෙන් වූ පුද්ගලයෙකු නොමැත (Ingold, 2000). පුද්ගලයා යම් දෙයක් පිළිබඳව විවිධ වූ දෘෂ්ටි කෝණයන්ගෙන් බලනු ලබයි. ඔවුන් එය සංජානනය කරගන්නා ආකාරය මත ප්‍රතිචාර දැක්වීම ද සිදු වේ. නිදසුනක් ලෙස මිනිසුන් කණ්ඩායමක් වනාන්තරයක් දුටුවහොත් ජීව විද්‍යාඥයා එහි ජෛව විවිධත්වය පිළිබඳවත්, භූගෝල විද්‍යාඥයා එහි පස හෝ පාෂාණවල පොහොසත්කම පිළිබඳවත්, මනෝවිද්‍යාඥයා වනාන්තරයේ සිටින මිනිසුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳවත් උනන්දු වේ. මේ ඔවුන් එය ග්‍රහණය කර ගන්නා ආකාරයයි. ග්‍රහණය කරගත් ආකාරයට අනුව ඊට ප්‍රතිචාර දැක්වීම ද සිදුවේ. තවද ගංවතුර සංසිද්ධියක් ගතහොත් යම් පිරිසක් එය දේව කෝප වීමක් ලෙස දැකිය හැකි අතර ඔවුන් ඊට ප්‍රතිචාර වශයෙන් දෙවියන්ට පුද පූජා පැවැත්වීම,

බාරහාර වීම, කන්නලව් කිරීම සිදුකරනු ලබයි. තවත් පිරිසක් මෙය ස්වභාවික සංසිද්ධියක් ලෙස දැකිය හැකිය. ඔවුන් ගංගාවේ පළල වැඩි කිරීම, ගංගාව දෙපස බැමි ඉදිකිරීම ආදි ක්‍රියාවන් සිදු කරමින් ඊට ප්‍රතිචාර දක්වයි. මේ එක් එක් පුද්ගලයා සංජානනය කරගන්නා ආකාරය සහ ඊට අනුරූපව ප්‍රතිචාර දක්වන ආකාරයයි.

සංජානනය පිළිබඳ න්‍යායන් සහ සංකල්පයන් ද පවතී. ඒ අතින් පාරිසරිකවාදය, ගැඹුරු පාරිසරික විද්‍යාව, පාරිසරික ස්ත්‍රීවාදී සංකල්පයන් වැදගත් වේ. පාරිසරිකවාදයේ අරමුණ වන්නේ පරිසරය පිළිබඳව මහජනතාවගේ ආකල්ප වෙනස් කිරීම සහ පාරිසරික විඥානය ඉහළ දැමීමට කටයුතු කිරීමයි. සමහර විටෙක පාරිසරිකවාදය පරිසරික ව්‍යාපාර ලෙස ද හැඳින්වීමට පුළුවන (Cormic, 1992). ගැඹුරු පාරිසරික විද්‍යාව මඟින් ලොව පුරා සිටින සියලු ජාතීන්ගේ ආගමික විශ්වාස සහ ක්‍රියාකාරකම් පොදු සාමූහික ආචාරධර්ම පද්ධතියක් ඇති කිරීමට උත්සාහ දරන අතර මෙමඟින් නොදියුණු බිම් මට්ටමින් සිටින ප්‍රජාවගේ පරිසරය පිළිබඳ විශ්වාසය සහ ක්‍රියාකාරකම් සැළකිල්ලට ගනු ලබයි (Pepper, 1996). පාරිසරික ස්ත්‍රීවාදයට අනුව ඔවුන් විශ්වාස කරන්නේ පරිසරය සංරක්ෂණය කිරීම පිළිබඳව ආකල්ප කාන්තාව තුළ සහජයෙන්ම ඇති බවයි. මෙමඟින් පැහැදිලි වන්නේ පාරිසරික සංජානනය පිළිබඳ විවිධ මත පවතින බවත් ඒවායේ පරස්පරතා හඳුනාගත හැකි බවත් ය.

ගම සහ නගරය භෞතික සහ සංස්කෘතික වශයෙන් වෙන්කර හඳුනාගත හැකි වුවද ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පාරිසරික සංජානනයේ විෂමතාවයන් පවතී ද යන්න ගැටලුවකි. නගර ආශ්‍රිත පාරිසරික ගැටලු උද්ගත වන්නේ නාගරික ප්‍රජාවේ පාරිසරික සංජානනයේ පවත්නා දුර්වලතා නිසා ද යන්න කුතුහලයකි. Michel

Foucault ට අනුව පාරිසරික ගැටලු සහ පාරිසරික ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීම සඳහා ජනතාවගේ පාරිසරික දැනුම ඉතා වැදගත් වේ. තුන්වන ලෝකයේ සිදුවන පාරිසරික විපර්යාස අවම කිරීම සඳහා මිනිසුන්ගේ ස්වදේශික දැනුම තීරණාත්මක කාර්යයක් ඉටු කළ බව මොවුන්ගේ මතයයි. නූතනවාදී පාරිසරිකවාදයට අනුව මිනිසාගේ සංස්කෘතිය හා පාරිභෝගික රටා පාරිසරික ගැටලු ඇති කරන අතර ඒ තුළින් පාරිසරික අර්බුදයන් නිර්මාණය වෙයි. කෙසේ නමුත් මෙම තර්කයන් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කෙතරම් දුරට සාධාරණීකරණය කළ හැකි ද යන්න ගැටලුවකි.

මිනිසුන් තුළ පවත්නා පාරිසරික සංජානනය තිරසාරභාවය උදෙසා වැදගත් කාර්යයක් ඉටු කරනු ලබයි. මේ හේතුන් නිසා ග්‍රාමීය සහ නාගරික වශයෙන් ජනතාව තුළ පාරිසරික සංජානනයේ පවතින විෂමතා අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් වන අතර මේ තුළින් මිනිසුන්ගේ පාරිසරික සංජානනය සහ පාරිසරික ප්‍රතිචාර අතර සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකිය. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත සහ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් අන්දරවැව ග්‍රාම නිළධාරී වසම සහ අංක 255 තුන්වන පියවර 1 කොටස ග්‍රාම නිළධාරී වසම පාදක කොට ගනිමින් ජනතාවගේ පාරිසරික සංජානනයේ පවත්නා විෂමතාවයන් අධ්‍යනය කිරීමට මෙහිදී බලාපොරොත්තු වේ.

නූතන සමාජයේ දී නිතර අසන්නට ලැබෙන සංකල්පයක් ලෙස පාරිසරික අර්බුද සංකල්පය හඳුනාගත හැකිය. පාරිසරික අර්බුද යනු අතීතයේ පෙර නොවූ විරූ අර්බුදයක් ලෙස හඳුනාගත හැකිය. පෙර පරම්පරාවේ න්‍යෂ්ටික සහ ජීව විද්‍යාත්මක ආයුධවල තර්ජනය මූලික කරගනිමින් පාරිසරික අර්බුදයන් වර්තමානයේ දී අත්විඳිමින් පවතී.

පරිසර සාධකය අමතක කර දමා අත්තනෝමතික ලෙස කටයුතු කිරීම හේතුකොට ගෙන ලෝක ඉතිහාසයේ යම් යම් ශිෂ්ටාචාරයන් පවා විනාශයට පත් වූ ආකාරය හඳුනාගත හැකිය. භූගෝල විද්‍යාව පිළිබඳව මහාචාර්යයවරයෙක් වන ජැරඩ් ඩයමන්ඩ් මහතා මේ සම්බන්ධව පර්යේෂණාත්මක තොරතුරු අනුසාරයෙන් තොරතුරු දක්වා ඇත.

දීර්ඝ කාලයක පටන් ලෝකවාසී ජනතාවට යම් යම් මට්ටම් යටතේ දේශගුණික විපර්යයාස පිළිබඳව අදහස් ප්‍රකාශ කළත් ඒවායේ දිග පළල පිළිබඳවත් බහුතර ජනතාව ප්‍රතිචාර දැක්වීමක් හෝ ඊට අනුවර්තනය වීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් වෙත ගමන් කර නැත. ශ්‍රී ලාංකාවාසී ජනතාවගේ පැත්තෙන් බලන විට ද පෙනී යනුයේ විද්වත් මට්ටම්වලින් මේ දේශගුණික විපර්යයාස යන කතාව පැවතියත් එය පොදු ජනතාවගේ අවධානයට පත් නොවූ බව හඳුනාගත හැකිය. කාර්මීකරණ ක්‍රියාදාමයත් සමඟ මෙය තවත් තීව්‍ර වන්නට විය. 1986 යුක්‍රේනයේ සිදු වූ චර්නෝබිල් න්‍යෂ්ටික අනතුර, 1984 ඉන්දියාවේ මධ්‍යම ප්‍රදේශයේ බෝපාල් නගරයේ පිහිටි යුනියන් කාබයිට් කම්හලේ විෂ වායු කාන්දු වීම, ජපානයේ මිනමාටා නගරයේ සිදු වූ රසදිය කාන්දුවීම සිද්ධිය, ෆුකුෂිමාහී සිදු වූ විකිරණ කාන්දු වීම ආදිය මේ සඳහා ලෝක මට්ටමින් සපයාගත හැකි නිදසුන් වේ. මෙම සිදුවීම් සංවර්ධනය සහ පරිසරය අතර පවතින පරතරය තවදුරටත් පුළුල් කෙරෙන සහ නූතන සංවර්ධන මාධිලිය ගැන යළි යළිත් සිතන්නට ලෝක ප්‍රජාව පොළඹවාලන සංසිද්ධි දාමයකි.

2015 වර්ෂයේ දී කැනඩාවේ vitality air නම් සමාගමෙන් චීනයේ ජනතාවට හුස්ම ගැනීම සඳහා පිරිසිදු වායු බෝතල් ගෙන්වීම, ඉන්දියාවේ නවදිල්ලි නගරයට ඩීසල් වාහන ඇතුල් කිරීම තහනම් කිරීම ආදී සිදුවීම් හරහා ද මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ පාරිසරික අර්බුදයන්ගේ හානිදායක මට්ටම සනාථ කරයි. ලෝක සෞඛ්‍ය

සංවිධානයේ නවතම වාර්තාවේ සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ වායු දූෂණ තත්ත්වය ඉහළ ගොස් ඇති බවයි. අධික රථ වාහන ගමනාගමනය, බලශක්ති උත්පාදනය, කර්මාන්තවල වායු විමෝචනය ආදිය මෙම තත්ත්වයට හේතු සාධක බවත් මෙය ජනතාවට සෞඛ්‍ය ගැටලු ඇති වීමට හේතු විය හැකි බවටත් අනතුරු අඟවා ඇත.

පාරිසරික අර්බුදයන් රැසකටම හේතුව මානව ක්‍රියාකාරම් බවට පර්යේෂණ රැසකින් මේ වන විටත් සොයාගෙන ඇත. නමුත් මේ සඳහා මූලිකම හේතුව පුද්ගලයන් තුළ පවත්නා සාංජානනික වෙනස්කම් ද යන්න ගැටලුවකි. එසේත් නැතිනම් පුද්ගලයන් වශයෙන් ගත් කල පාරිසරික අර්බුදයන් සඳහා මූල බීජය වන පාරිසරික සංජානනයේ ග්‍රාමීය, නාගරික සහ ස්ත්‍රී පුරුෂ වශයෙන් පැහැදිලි වෙනසක් පවතී ද යන්න හඳුනා ගැනීම තුළින් පාරිසරික අර්බුදයන් සඳහා විසඳුම් සෙවීමේ දී මූලික අවධානය ලබා දිය යුතු පුද්ගල කාණ්ඩය සහ අවධානය ලබා දිය යුතු අංශයන් පිළිබඳව මනා අවබෝධයක් පවත්වා ගත හැකිය. ඒ තුළින් පාරිසරික අර්බුදයන් සඳහා ඉතා හොඳ විසමඳුම් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**පර්යේෂණ අරමුණු**

ප්‍රධාන අරමුණ

ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ පාරිසරික සංජානන විෂමතා පිළිබඳ අධ්‍යයනය කිරීම.

උප අරමුණු

ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත්භාවයේ පවතින විෂමතා පිළිබඳ පරීක්ෂා කිරීම

ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ ස්භාවික සම්පත් භාවිතයේ පවතින විෂමතා පිළිබඳ පරීක්ෂා කිරීම


ග්‍රාමීය සහ නාගරික ජනතාව පාරිසරික ව්‍යාපාර කෙරෙහි සිදු කරනු ලබන මැදිහත් වීම පිළිබඳව පරීක්ෂා කිරීම.

ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ පාරිසරික සංජානන විෂමතා අධ්‍යයනය

**අධ්‍යයන ප්‍රදේශය**

අධ්‍යයන ප්‍රදේශයේ අන්දරවැව ග්‍රාම නිළධාරී වසම අයත් නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරු අක්ෂාංශ 8.2926° ත් නැගෙනහිර දේශාංශ 80.226° අතර පිහිටා ඇත. අංක 255 තුන්වන පියවර 1 කොටස ග්‍රාම නිළධාරී වසම අයත්වන නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරු අක්ෂාංශ 8.3704° සහ නැගෙනහිර දේශාංශ 80.4007 ° අතර පිහිටා ඇත.

සිතියම 01: අධ්‍යයන ප්‍රදේශය




මූලාශ්‍රය: Arc GIS 10. 1 භාවිතයෙන් පර්යේෂක විසින් සකස් කරන ලදී, 2023

**පර්යේෂණ ක්‍රමවේදය**

අන්දරවැව ග්‍රාම නිළධාරී වසමෙහි සහ 255 තුන්වන පියවර 1 කොටස යන ග්‍රාම නිළධාරී වසම්වල වයස අවුරුදු 24 – 35 අතර පුද්ගලයින්ගෙන් 5% වඩා වැඩි කොටසක් නියෝජනය වන පරිදි අහඹු ලෙස එක් ග්‍රාම නිළධාරී වසමකින් පුද්ගලයින් 50 බැගින් තෝරාගැනීම සිදු කරයි. මේ යටතේ එක් ග්‍රාම නිළධාරී වසමකින් ස්ත්‍රී ප්‍රජාවෙන් 25 ක් පුරුෂ ප්‍රජාවෙන් 25 ක් ආදී ලෙස නියදි සාමාජිකයන් 50 සම්පූර්ණ කර ගැනීම සිදු කරයි. ඒ අනුව සමස්ත නියදි ප්‍රමාණය 100 කි.

ප්‍රාථමික දත්ත මූලාශ්‍ර ලෙස ව්‍යූහගත ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ඡාවක් ලෙස Google form හරහා කාණ්ඩ තුනක් යටතේ සකස්කර නියදි සාමාජිකයන්ට ලබා දෙන ලදී. ප්‍රශ්නාවලියේ පළමු කාණ්ඩයෙන් පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත්භාවයට අදාළ ප්‍රශ්න ද දෙවන කාණ්ඩයෙන් ස්භාවික සම්පත් භාවිතයට අදාළ ප්‍රශ්න ද තෙවන කාණ්ඩය යටතේ පාරිසරික ව්‍යාපාර කෙරෙහි දක්වන දායකත්වයට අදාළ ප්‍රශ්න ද ඇතුලත් කර ඇත. මෙම ප්‍රශ්නාවලිය ලිකට්ස් පරිමාණය (Likerts scale) අනුව සහ විවෘත ප්‍රශ්න ලෙස සකස් කරන ලදී. පර්යේෂණයට සහභාගී වන සාමාජිකයන්ට Google form පිළිබඳව දැනුමක් නොමැති අවස්ථාවල දී පර්යේෂකයා විසින්ම සාමාජික අදහස් අනුව එය සම්පූර්ණ කරන ලදී. ද්විතික දත්ත මූලාශ්‍ර ලෙස අධ්‍යයනට අදාළ දත්ත ලබා ගැනීම සඳහා නොච්චියාගම, නුවරගම පළාත ප්‍රාදේශීය ලේකම් වාර්තා, අන්දරවැව ග්‍රාම නිළධාරී වසම, 255 තුන්වන පියවර 1 කොටස ග්‍රම නිළධාරී වසම්වලට අදාළ සම්පත් පැතිකඩ, අනුරාධපුර දිස්ත්‍රික් මහලේකම් කාර්යාලීය දත්ත භාවිතා කරන ලදී. එසේම අධ්‍යයනට අදාළ කරගත හැකි ග්‍රන්ථ, පුවත්පත්, සඟරා සහ ලිපි භාවිතා

කරන ලදී. අධ්‍යයන ප්‍රදේශයට අදාළ සිතියම නිර්මාණය කර ගැනීම සඳහා Google Earth Pro මෘදුකාංගය භාවිතා කරන ලදී.

පර්යේෂණ දත්ත එකම ක්‍රමවේදයක් යටතේ එනම් ලිකට්ස් පරිමාණයට රැස් කරනු ලැබූ නිසා දත්ත විශ්ලේෂණය කිරීම ද එකම ක්‍රමවේදයක් යටතේ සිදු කරන ලදී. පර්යේෂණයට භාජනය වන පිරිසගේ අදහස් 1 සිට 5 දක්වා අංකනය කර එම අගයන්ට බර තබමින් සාපේක්ෂ වැදගත්කම් දර්ශකය (Relative Importance Index – IRR) ක්‍රමවේදය යටතේ Excel මෘදුකාංගය භාවිතා කර දත්ත විශ්ලේෂණය කරන ලදී.

$$RII = \frac{\sum w}{A \times n}$$

$$RII = \frac{\sum w}{A \times n} \times 100\ \%$$

W = එක් එක් සාධක සඳහා බර තැබූ අගය ( 5n5 + 4n4 + 3n3 + 2n2 + 1n1 )

A = භාවිතා කරනු ලැබූ විචල්‍ය සංඛ්‍යාව

n = මුළු ප්‍රතිචාරකයින් සංඛ්‍යාව

මූලාශ්‍රය : Rajgor et al. 2016

IRR ක්‍රමවේදය යටතේ සංඛ්‍යාන විද්‍යාත්මකව විශ්ලේෂණය කරන ලද දත්ත සහ විවෘත ආකාරයේ ප්‍රශ්න වාචිකව විස්තර කිරීම සහ දත්ත වගු, ප්‍රස්තාර සහ සිතියම් මඟින් විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී.

**සාහිත්‍යය විමර්ශනය**

ග්‍රාහක අවයව මාර්ගයෙන් ලබා ගන්නා ඉන්ද්‍රිය තොරතුරු පරිසරයේ පවත්නා සංවිධිත ප්‍රතිරූපයක් වශයෙන් සංජානනය

අර්ථකතනය කරනු ලබන ක්‍රියාවලිය වේ. මේ අදහසට සමාන තවත් නිර්වචනයක් නම් සංජානනය යනු ඉන්ද්‍රිය මගින් ලබා ගන්නා සංවේදන තෝරාගැනීමේ, සංවිධානය කිරීමේ සහ අර්ථකතනය කිරීමෙ ක්‍රියාවලියයි.

සංජානන ක්‍රියාවලිය සඳහා බලපාන සාධක කීපයක් පවතී.

අත්දැකීම්

අභිරුචි

ආකල්ප

අවශ්‍යතා

පරිකල්පන ශක්තිය (අබේපාල. 2021).

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ කෙරෙහි වික්ටෝරියානු සංජානනය

මෙකල කර්මාන්ත ශාලාවලින් සිදුවන පරිසර දූෂණය හා දරිද්‍රතාවයෙන් යුත් කම්කරු ජනතාව ඉහළ පාංතිකයන්ව හැරයාමට හේතු වූ අනතුරුදායක හා තර්ජනාත්මක ප්‍රදේශයක් ලෙස වික්ටෝරියානුවන් විසින් "නගරය" සැළකූහ. මේ නිසාම ධනවත් පාංතිකයන් බොහෝ දෙනෙක් "නව ආදර්ශ නගර" සැලසුම් කිරීමට පටන් ගත්හ. නිදසුන් ලෙස බටහිර යෝක්ෂර්හි පිප්ලිහි පිහිටි ගමක් වන සැල්ටෙයාර් යනු වික්ටෝරියානු ආදර්ශ නගරයකි.

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ පිළිබඳ වත්මන් සංජානනය

නූතන යුගයේ නාගරික ප්‍රදේශවල රැකියා අවස්ථා විශාල වශයෙන් වර්ධනය වී ඇති අතර එමඟින් නාගරික ප්‍රදේශ පිළිබඳ සංජානනය විශාල වශයෙන් වර්ධනය වී ඇත. ප්‍රධාන වශයෙන් නගර අභ්‍යන්තරයේ විශ්වවිද්‍යාල, රෝහල් තිබීම සහ අනෙකුත් උසස් තත්ත්වයේ සේවාවන් සඳහා ප්‍රවේශය ඔවුන්ට ජීවත් වීමට, වැඩ කිරීමට හා අධ්‍යයනය කිරීමට ආකර්ශණීය ස්ථාන බවට පත් කරයි.

පාරිසරික සංජානනය

භූගෝල විද්‍යායින්ගේ අදහසට අනුව පාරිසරික සංජානනය යනු මානව භූගෝල විද්‍යාවේ උප අංගයකි. ඔවුන්ට අනුව මේ යටතේ දී මානව ක්‍රියා, සංස්කෘතිය, සමාජය පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. කෙසේ වෙතත් පාරිසරික සංජානනය යනු බහු විෂයානුබද්ධ සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය. පාරිසරික මනෝ විද්‍යාව මඟින් උගත් පාරිසරික සංජානනය හරහා මිනිසා විසින් සැබෑ ලෝකයත් පරිසරයත් අවබෝධ කරගත් ආකාරය පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. ( Evans. 1980).

පාරිසරික සංජානනය සාමාන්‍යයෙන් නිර්වචනය කර අත්තේ පරිසරය පිළිබද දනුම්වත්භාවය හෝ ඉන්ද්‍රියන් මඟින් පරිසරය වෙත දක්වන ඇල්මක් ලෙස හඳුනාගත හැකිය. පුද්ගලයා සහ පරිසරය අතර ගණුදෙනු ක්‍රියාවලියක් ලෙස පාරිසරික සංජානනය බහුමානික සංසිද්ධියක් ලෙස මනෝ විද්‍යාඥ (Ittelson. 1973). විසින් වඩා සවිස්තරාත්මක සහ න්‍යායාත්මක රාමුවක් යටතේ සාකච්ඡාවට බඳුන් කරන ලදී.

අප ලෝකය පිළිබඳ හැඟීම් ඇති කරන ආකාරය සහ මිනිස් ජීවිතය හැඩගස්වන සංස්කෘතික සංදර්භයන් මඟින් හැඩගස්වා ඇති ක්‍රියාවලිය ලෙස පාරිසරික සංජානනය හඳුනාගත හැකිය. එනම් පුද්ගලයෙකු පරිසරය වටහා ගන්නා ආකාරය සහ පරිසරය පිළිබඳ ලැබෙන තොරතුරු ඇගයීම සහ ගබඩා කිරීමේ ක්‍රියාවලියකි. ( Mayhew. 2015).පාරිසරික සංජානනය පුද්ගලයා අවකාශය පිළිබඳව තීරණ ගැනීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියකි. එනම් එක් එක් පුද්ගලයාට ආවේණික වූ පෞද්ගලික ඉතිහාසය සහ අරමුණුවලට අනුව පුද්ගලිකව

ඔවුන් අල්ලා ගන්නා ලද වටපිටාවන් හරහා මිනිසුන් පරිසරයට ප්‍රතිචාර දක්වන බවයි. (lowenthal. 1967).

සංජානනය යනු තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාකාරී සහ ගවේෂණාත්මක ක්‍රියාවලියකි. දැනටමත් ලැබී ඇති සංවේදනයන් මත ක්‍රියා කරනවාට වඩා ප්‍රතිග්‍රාහක ඉන්ද්‍රියන් අඛණ්ඩව චලනය කිරීම, ගැලපීම හා නැවත දිශානතියට පත් කිරීම එයට ඇතුළත් වේ. (Ingold. 2000). ඉන්ගෝල්ඩ්ගේ පාරිසරික සංජානනය පරිසරය පිළිබඳ සංකල්ප 03ක් මත පදනම් වේ. එනම් පුද්ගලයන්, ජීවීන් හා පරිසරය වේ. මේවා එකිනෙකින් වෙන් කළ නොහැකි අංගයන් බව ඔහු දක්වාලයි.

කෙසේ වෙතත් පාරිසරික සංජානනය සංකල්පයක් ලෙස සාකච්ඡාවට බඳුන් වූයේ 1960 - 1970 දශකයේ වූ නමුත් ඒ පිළිබඳව මිනිසා තුළ පැවති උනන්දුව වසර ගණනාවක් අතීතයට දිවයයි. 1854 වසරේ මාර්තු මස එකොළොස් වන දින ඇමරිකානු ස්වදේශීකයන් සතු භූමිය එරට රජයට පවරා ගැනීම වෙනුවෙන් රැස්වීමකදී රතු ඉන්දියානු නායක සියැටල් විසින් කළ ප්‍රකාශයේ දී ඔවුන් තුළ තිබූ පාරිසරික සංජානනය කෙතරම් ගැඹුරුදැයි මනාව වැටහේ.

*"මේ මිහිතලයේ සෑම බිම් අඟලක්ම මගේ පරපුරට ශුද්ධ වූ වස්තුවකි. දිලිසෙන දේවදාර ගසක හැම කිනිත්තක්ම, වැලි තලාවෙන් පිරී ගිය සෑම වෙරළක්ම, අඳුරු වනාන්තරවල තිබෙන සෑම මිහිදුම් වලාවක්ම, සිහින් හඬින් ගී ගයන සෑම කුඩා ප්‍රණියෙක්ම මගේ මිනිසුන්ගේ මතකයේ සහ අත්දැකීම් සමුදායේ පූජනීය වස්තූන් වන්නේය. "*

පාරිසරික දැනුම වර්ධනය සහ පාරිසරික ව්‍යාපාරවල නැගීම

1970 වන විට බටහිර රටවල පාරිසරික ගැටලු පිළිබඳව උනන්දුවක් ඇති වීම සිදුවිය. මේ සඳහා ප්‍රධාන හේතුවක් වී ඇත්තේ

යුරෝපයේ සහ ඇමරිකාවේ පාරිසරික ගැටලු උත්සන්න තත්ත්වයකට පත්ව තිබීම සහ ජනතාවට ඒ පිළිබඳ පුළුල් අවබෝධයක් තිබීමත් වේ. දෙවන ලෝක යුත්ධයත් සමඟ බටහිර කාර්මික රටවල පරිසරය හා සම්බන්ධ පරිහානියක් සිදු වීම නිසා විවිධ පාරිසරික ගැටලු ඇති වූ බවත් 1960 පමණ වන විට මේවා තවත් වර්ධනය වූ බවත් සඳහන් වේ. එම නිසා 1970 පමණ වන විට විවිධ මහජන ප්‍රතිචාර මේ සම්බන්ධයෙන් ලැබෙන්නට පටන් ගනී. ඩන්ලැප් සහ ස්කාර්ස් මේ පිළිබඳව ඇමරිකාවේ දශක දෙකක් පුරා පර්යේෂණ සිදුකර ඇති අතර එම පර්යේෂණවලට අනුව සොයාගෙන ඇත්තේ පාරිසරික ගැටලු පිළිබඳව ඇමරිකානු බහුතර ජනතාව තුළ යහපත් අවබෝධ කර ගැනිමක් පවතින බවත් ය.

බටහිර යුරෝපයේ පාරිසරික ගැටලු පිළිබඳව පවතින අදහස්වලට අනුව එම ගැටලුවල බැරෑරුම් බව අනුව ජනතා ප්‍රතිචාර ද වෙනස් වන බව සොයාගෙන ඇත. නිදසුනක් ලෙස දකුණු ජර්මනිය, බෙල්ජියම ,උතුරු ප්‍රංශය වැනි රටවල ගංගා, වනාන්තර සහ පස දූෂණයට බෙහෙවින් ලක්ව ඇති නිසා එම රටවල පරිසරය පිළිබඳව ජනතාවගේ අවධානය ද වැඩි වී තිබීම දැක්විය හැකිය. ඒ අනුව පාරිසරික ගැටලුවල බරපතල බව අනුව නොයෙක් ව්‍යාපාර වර්ධනය වීම සිදු වන බවට ඇතැමුන් තර්ක කරයි. අනෙක් මතය වන්නේ 20 ශතවර්ෂය පුරාම යුරෝපය සහ ඇමරිකාවේ පාරිසරික ගැටලු පැවතිය ද මහජනතාව ඒ පිළිබඳව එතරම් උනන්දුවක් දක්වා නොමැත. නිදසුන් ලෙස 1960 ඇමරිකාවේ ඉසාක් වොට්සන් ලීග් පිරිසිදු වාතය පිළිබඳ සතියක් ප්‍රකාශයට පත් කර තිබුණ ද ඒ සඳහා ජනතා ප්‍රතිචාර එතරම් ලැබී නැත. මෙම අදහසට අනුව ජනතාව පාරිසරික ගැටලු සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වීම තීරණය වන්නේ විද්‍යාඥයන්, පරිසරවේදීන්ගේ අදහස් සහ ජන සන්නිවේදනයේ ස්වරූපය අනුව වේ.

මෙම අදහස් පසු කාලීනව විවේචනයට ලක් වූ අතර පරිසරවාදී ව්‍යාපාර ඇති වීම සම්බන්ධයෙන් නව මධ්‍යම පාංතික සංකල්ප බිහිවීම සිදු විය. පශ්චාත් භෞතිකවාදය, සමාජ සුබසාධනය යන සංකල්ප පදනම් කරගෙන පාරිසරිකවාදය, පාරිසරික් ස්ත්‍රීවාදය වැනි පාරිසරික ව්‍යාපාර බිහිවිම සිදු විය

**සංකල්ප**

පාරිසරිකවාදය

බටහිර පාරිසරික ආකල්පවලට අනුව පාරිසරිකවාදය වික්ටෝරියානු සංස්කෘතියේ සොබා දහමට ආදරය කළ අයගෙන් එකල ජීවත් වූ ධානපතීන්ගේ හා වෘත්තීයවේදීන්ගේ මැදිහත්වීමෙන් ඇති වූ බවට විශ්වාස කරනු ලබයි. පාරිසරිකවාදය හරහා මහජනතාවගේ පරිසරය පිළිබඳ ආකල්ප වෙනස් කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරමින් සිටී. නිදසුනක් ලෙස කාලගුණ විපර්යාස හෝ එමඟින් ඇතිවන හානි පිළිබඳ දැනුවත් කිරීමටත් ඒවා ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර සංවිධාන කරා ගෙන යාමටත් පාරිසරිකවාදය ප්‍රකට විය. (මහීස්. 2020).

පශ්චාත් නූතනවාදී පාරිසරිකවාදයට ප්‍රධාන දායකත්වයක් Michael Foucault විසින් ලබා දී ඇත. මොහුගේ අදහස්වලට අනුව පාරිසරික ගැටලු හා පාරිසරික ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමට ජනතාවගේ දැනුම ඉතා වැදගත් වේ. තුන්වන ලෝකයේ සිදුවන පාරිසරික විපර්යාස අධ්‍යයනය කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාවගේ ස්වදේශීය දැනුම බෙහෙවින් තීරණාත්මක කාර්යයක් ඉටුකරන බව මොහුගේ අදහසයි. පශ්චාත් නූතනවාදී පාරිසරිකවාදයට එක්කරගත හැකි තවත් තර්කයක් වන්නේ Harberm දක්වන පරිදි සංස්කෘතිය හා වෙනස්වන පාරිභෝගික රටා පාරිසරික ගැටලු ඇති කරන අතර එම නිසා පාරිසරික උද්ඝෝෂණ ඇති වේ. මොහු තවදුරටත් පෙන්වා දෙන්නේ සංස්කෘතිය

හරහා සමාජ ජීවිතයට එල්ලවන පීඩනය හරහා පරිසර ගැටලු වැඩි වශයෙන් ඇතිවන බවත් එම පීඩනයන්ගෙන් ගැලවීම සඳහා පාරිසරිකවාදය ප්‍රමුඛ කරගත් පාරිසරික ක්‍රියාකාරකම්වල නිරතවන බවත් ය. (මහීස්. 2020).

පාරිසරික ස්ත්‍රීවාදය

ස්ත්‍රීවාදී දේශපාලන පරිසර විද්‍යාඥයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පර්යාලෝකයන් අසුරින් පාරිසරික වෙනස්කම් දෙස බලනු ලබයි. පාරිසරික ස්ත්‍රීවාදීන් විශ්වාස කරනුයේ පරිසර සංරක්ෂණය කිරීම පිළිබඳ ආකල්ප කාන්තාවන් තුළ සහජයෙන්ම ඇති බවයි. පාරිසරික ස්ත්‍රීවාදය හරහා කාන්තාව පරිසරය සමඟ අන්තර් සම්බන්ධතා පවත්වන ආකාරය මෙහිදී සාකච්ජා වේ. මෙය පරිසර විද්‍යාවේ එක් අංගයකි. බොහෝ දුරට ප්‍රායෝගිකව කාන්තාව පරිසරය තුළ සාකච්ජාවට බඳුන්වන ආකාරය මෙහිදී ඉස්මතු වේ.

පාරිසරික ස්ත්‍රීවාදය කාන්තාවන්ගේ මෙන්ම පරිසරවේදීන් අතර ද දෝලනය වන සංකල්පයක් බවට පත්ව ඇත. Agarwal (1997) ට අනුව පාරිසරික ස්ත්‍රීවාදී තර්ක කරුණු හතරක් මුල් කොටගෙන ක්‍රියාත්මක වේ.

1. කාන්තාවන් මර්ධනය කිරීම හා සොබාදහම සූරාකෑම අතර සම්බන්ධතාවක් පවතී
2. කාන්තාවන් සොබාදහමට සමීපව ද පුරුෂයන් සංස්කෘතියට සමීපව ද සිටින බව. එම නිසා සොබා දහමට යටත්ව සිටින මෙන් කාන්තාව පුරුෂයින්ට ද යටත්ව සිටී යැයි සළකනු ලබයි.
3. සොබා දහම මෙන්ම කාන්තාව ද පුරුෂයින් විසින් යටත් කොටගෙන ඇත

4. ස්ත්‍රීවාදී ව්‍යාපාර සහ පරිසර ව්‍යාපාර මානව හා පාරිසරික අධ්‍යයනයන් වෙනුවෙන් කටයුතු කරන මතවාදයක් සහ ක්‍රියාවන් වේ (මහීස්. 2020).

පොදුවේ ගත් කල පාරිසරික ස්ත්‍රීවාදීන් "පාරිසරික සාමය" (Environmental peace) තිරසර සංවර්ධනය සඳහා පාරිසරික සැලකිලිමත්භාවයන් ප්‍රවර්ධනය කිරීම ආදී ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරයි. කෙන්‍යාවේ Green Belt ව්‍යාපාරය දියත් කරන ලද Vangari Mathai 2004 වර්ෂයේදී නොබෙල් ත්‍යාගය දිනාගන්නා ලදී. මෙය පරිසරය ආරක්ෂා කිරීමෙහිලා කාන්තාව පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් වර්ධනය කිරීමට බලපාන ලද අතර පාරිසරික හායනය වැළැක්වීමට, වනවගා කිරීම ප්‍රවර්ධනයට බලපාන ලදී. 1980 වන විට ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල ද මෙය වර්ධනය විය. ඊට එක් උදාහරණයක් ලෙස කාන්තාවන් 2000 ක් පමණ එකතු වී ඇමරිකාවේ න්‍යෂ්ටික බලයට විරුද්ධව ස්ථාපනය වීම දැක්විය හැකිය.

පාරිසරික සංජානනය පිළිබඳව මුල්වරට සමීක්ෂණයක් සිදුකර ඇත්තේ 1992 වසරේ දී ජෝර්ජ් එච්. ගැලප් ජාත්‍යන්තර ආයතනයක් සමඟ එක්වීමෙණි. මෙය පාරිසරික සංජානනය පිළිබඳව පුළුල් පරාසයක දත්ත ලබා ගත් ප්‍රථම ජාත්‍යන්තර සමීක්ෂණය වේ. මෙලෙස ආරම්භ වූ පාරිසරික සංජානන සංකල්පය සහ එය විෂය කරගනිමින් එතෙක් මෙතෙක් කාලයක් තුළ පර්යේෂණ වාර්තා ආදියෙහි සඳහන් වූ අවස්ථා කිහිපයක්ම හඳුනාගත හැකිය.

Student's Perception of Urban and Rural Environmental Protection Areas in Pernambuco Brazil – Wbaneide Martins, Hosa Sevarino,

Bento De Silva , Martins de Andrade, Marcelo Alves, Ferraz, Wedson et al. (2022).

බ්‍රසීලයෙහි Pernambuco ප්‍රදේශයේ අත්ලාන්තික් වැසි වනාන්තර ආරක්ෂණ ප්‍රදේශ අවට නාගරික සහ ග්‍රාමීය සිසුන්ගේ සංජානනය සහ සමාජ ආර්ථික සාධක අතර සම්බන්ධතාවය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කර ඇත. කලාප අටක පාසල් අටක සිසුන් 410 ක් පර්යේෂණයට ලක්කර ඇත. මෙහිදී නාගරික කලාපීය පාසල් සිසුන් 284 සහ ග්‍රාමීය කලාපීය පාසල් සිසුන් 186 ආදී ලෙස තෝරාගෙන ඇත. මෙම නියදි සංඛ්‍යාවේ වෙනසට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ ග්‍රාමිය කලාපීය පාසල්වලට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව අවම වීමයි. ප්‍රධාන කොටස් තුනකින් සහ ප්‍රශ්න විස්සකින් සමන්විත ප්‍රශ්නවලියක් හරහා දත්ත රැස් කිරීම සිදුකර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා Kruskal – wallis test සහ Newman – Keuls test යන ක්‍රමවේද භාවිතා කර ඇති අතර සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදුන් සිසුන්ගේ දත්ත විශ්ලේෂණය කර ඇත. මෙම පර්යේෂණයේ හඳුනාගත හැකි යම් දෝෂයක් වන්නේ සිසුන්ගෙන් 60%ක් රක්ෂිත ප්‍රදේශවල වැදගත්කම පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු ලබා නොදීමයි. මේ නිසා එම ප්‍රශ්නයට අදාළව වනාන්තර පිළිබද සංජානනය සහ ආරක්ෂිත ප්‍රදේශ අතර සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට අපහසු වී ඇත. පර්යේෂණ ප්‍රතිඵල ලෙස පර්යේෂණයට ලක් වූ ග්‍රාමීය සහ නාගරික කලාපයන්ගේ සිසුන්ගේ පාරිසරික සංජානන දර්ශකයේ සැලකිය යුතු වෙනස්කම් හඳුනාගැනීමට හැකි වී ඇත.

Enviromental Perception in Colombia’s P’aramo Protected Areas – Juliana Delgado (Louisiana State University 2008).

මෙම අධ්‍යයනයේ දී පැරමෝස් ආරක්ෂිත ප්‍රදේශ ඇසුරු කරගනිමින් කෘෂිකර්මාන්තය ජීවනෝපාය මාර්ගය කරගත් පුද්ගලයන්ගේ පාරිසරික සංජානනය පිළිබඳ පරීක්ෂණයක් සිදුකර ඇත. එහිදී Tequit නම් කුඩා ගම්මානයේ ගොවීන් අතර පවත්නා පාරිසරික සංජානනයේ වෙනස විශ්ලේෂණය කර ඇත. එහිදී, ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම දෙකක් ඇසුරින් පරීක්ෂණය සිදුකර ඇත. ඉන් පළමුවැන්න ද්විතීක දත්ත විශ්ලේෂණයක් ද දෙවැන්න ලෙස අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් හරහා රැස් කරන ලද දත්ත විශ්ලේෂණ ක්‍රමයක් ද වේ. කොරෝනා තත්ත්වය හේතුවෙන් මෙහි දත්ත රැස් කිරීම ඔන්ලයින් ක්‍රම හරහා සිදුකර ඇති අතර එම තොරතුරු පටිගත කිරීම ද සිදුකර ඇත. ප්‍රදේශයේ භූ දර්ශනය මත මිනිසාගේ සමාජ නිර්මාණය සහ මිනිසාගේ පරිසරය සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව මෙහිදී විශ්ලේෂණය කර ඇත. මෙමඟින් ඔහු හඳුනාගත්තේ ගොවියාගේ ජනාවාස සහ Gauna කඳු පන්ති අතර අන්තර් සම්බන්ධතාවයක් ඇති බවත් ඔවුන් බලශක්ති, ජීවනෝපාය මාර්ග, තීරණ ගැනීම ආදී සාධක මෙම කඳුවැටිය හා සම්බන්ධ බවත් ය. ඔවුන් තවදුරටත් අනාවරණය කරගෙන ඇත්තේ මෙම ගොවීන්ගේ ක්‍රියාකාරකම් පරිසරයට තර්ජනයක් වී ඇති බවත් මිනිසා සහ පරිසරය අතර සම්බන්ධය තීරණය වන්නේ ගොවීන්ගේ අධ්‍යාපනය සහ සංජානනය මත බවත් ය. මෙම විශ්ලේෂණය විස්තරාත්මක දත්ත සහ ප්‍රාථමික විශ්ලේෂණ ක්‍රම හරහා සිදු කර ඇත.

A Multi Country Examination of the Relationship Between Environmental Knowledge and Attitudes – Llisa M. Dechano Cook (Western Michigan University)

රටවල් කිපයක පුද්ගලයන්ගේ පාරිසරික දැනුම සහ පාරිසරික ආකල්ප අතර අන්තර් සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම මෙම


අධ්‍යයනයේ මූලික අරමුණ වී ඇත. එහිදී චිලී රාජ්‍ය, එංගලන්තය, ස්විස්ටර්ලන්තය සහ එක්සත් රාජධානිය පදනම් කරගෙන අධ්‍යයනය සිදු කර ඇත. සෑම රටකින්ම සිසුන් 60 - 80 අතර පිරිසක් නියදිය ලෙස තෝරාගෙන ඇත. දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලී ක්‍රමයට ඔන්ලයින් ක්‍රමවේදය යටතේ සිදුකර ඇත. අහඹු ලෙස තෝරාගනු ලබන පාසල් ශිෂ්‍යයන් පර්යේෂණයට ලක් කර ඇත. දත්ත විශ්ලේෂණය Kruskal – wallis test H සහ New Ecological Earadigm Ecale (NEP) ක්‍රමවේද හරහා සිදුකර ඇත. පර්යේෂණයේ උපකල්පනය වී ඇත්තේ පුද්ගලයන්ගේ පාරිසරික දැනුම සහ පාරිසරික ආකල්ප අතර ධනාත්මක සම්බන්ධතාවයක් පවතී යන්නයි. දත්ත විශ්ලේෂණයේ දී මෙම කල්පිතය ප්‍රතික්ෂේප වී ඇති අතර ඒ අනුව ශිෂ්‍ය කණ්ඩායම්වල පාරිසරික දැනුම සහ ධනාත්මක පාරිසරික ආකල්ප අතර වැදගත් සම්බන්ධතාවයක් හඳුනාගැනීමට හැකියාව ලැබී නැත.

**සාකච්ඡාව**

මූලික සංකල්ප පිළිබඳව ඇති දැනුම්වත්භාවය

ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත්භාවය පරීක්ෂා කිරීම අධ්‍යයනයේ පහසුව උදෙසා ප්‍රධාන කරුණු හතරකට ගොනු කරන ලදී. එනම් පුද්ගලයන් සතු දේශගුණික විපර්යාස පිළිබඳ දැනුම, පරිසර දූෂණය පිළිබඳ දැනුම, කසළ කළමණාකරණය සහ පාසල් විෂය මාලාව හරහා ලබා දෙන පාරිසරික අධ්‍යාපනය පිළිබඳව ඔවුන්ගේ සතුට හෝ නොසතුටු බව පරීක්ෂා කිරීම මෙහි දී සිදු විය. එහිදී නියදි ප්‍රතිචාරකයින් ලබා දුන් දත්ත අනුව ග්‍රාමීය සහ නාගරික වශයෙන් විෂමතාවයන් හඳුනාගත හැකිවිය.


ප්‍රස්තාර අංක 1: පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත්භාවය පිළිබඳව පුද්ගල ප්‍රතිචාරයන්




මූලාශ්‍රය : ක්ෂේත්‍රීය දත්ත මගින් සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

දේශගුණික විපර්යාස පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 2 : දේශගුණික විපර්යාස පිළිබඳ ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාර අංක 1 මගින් නිරූපිත දත්ත අනුව දේශගුණික විපර්යාස යන සංකල්පය පිළිබඳව ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරික ප්‍රජාවේ වඩා වැඩි දැනුම්වත්භාවයක් පවතින බව පැහැදිලි වේ. එය 20% පමණ ප්‍රමාණයක වෙනසකි. ග්‍රාමීය ප්‍රජාවගෙන් 30% ඉක්මවූ පිරිසක්

දේශගුණික විපර්යාස යන සංකල්පය පිළිබඳව කිසිදු දැනුම්වත්භාවයක් නොමැත.

ප්‍රස්තාර අංක 2 මගින් දැක්වෙන්නේ දේශගුණික විපර්යාස නිසා ඇතිවන ගැටලු පිළිබඳව පුද්ගල ප්‍රතිචාරයන් වේ. එහිදී දේශගුණික විපර්යාස නිසා ගෝලීය උණුසුම ඉහළ යයි යන ප්‍රකාශයට ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සියලුම දෙනා දැඩිව එකගවෙමි පිළිතුර ලබා දී ඇත. එනම් දේශගුණික විපර්යාස නිසා ගෝලීය උණුසුම ඉහළ යයි යන ප්‍රකාශයට තරා කිරීම් අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ ඉතා වැදගත් සංජානන මට්ටමක් පවතී.

දේශගුණික විපර්යාස හේතුවෙන් ජල හිගයක් ඇතිවේ සහ කෘෂි අස්වනු අඩුවේ යන ප්‍රකාශයන්ට ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව සමාන මට්ටමේ අදහසක් දරන බව කැපී පෙනෙයි. මෙම ප්‍රකාශයන් සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් 45% ඉක්ම වූ ප්‍රමාණයක් මධ්‍යස්ථ පිළිතුරු ලබා දී ඇති අතර ඒ අනුව දේශගුණික විපර්යාස හේතුවෙන් ජල හිගයක් ඇතිවේ සහ කෘෂි අස්වනු අඩුවේ යන ප්‍රකාශයන් තරා මට්ටම් අනුව සැළකිය යුතු මට්ටමේ වැදගත්කමක් උසුලනු ලබයි.


දේශගුණික විපර්යාස හේතුවෙන් සාගර ජල මට්ටම ඉහළ යයි යන ප්‍රකාශය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පරස්පර අදහසක් පවතින බව හඳුනාගත හැකිය. එනම් නාගරික ප්‍රජාවෙන් වැඩි පිරිසක් ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් වැඩි එකගතාවයක් දක්වා ඇති අතර ඊට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවේ එකගතාවය අඩුය. මේ නිසා තරා මට්ටම් අනුව නාගරික ප්‍රජාව ඉතා වැදගත් සංජානන මට්ටමක් දක්වන බවත් ග්‍රාමීය ප්‍රජාව සැලකිය යුතු සංජානන මට්ටමක් දක්වන බවත් කිව හැකිය.

දේශගුණික විපර්යාස ඇති වීමට හේතු සහ ඒවා අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද පුද්ගලයින්ගෙන් විමසීමක් විවෘත ප්‍රශ්න

ආකාරයෙන් සිදු කරන ලද අතර එහි දී ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරික ප්‍රජාව වඩා තාර්කික පිළිතුරු ලබා දී ඇති බව පැහැදිලි වේ. දේශගුණික විපර්යාස සඳහා පිළියම් ලෙස නාගරික ප්‍රජාවෙන් බහුතරයක් දෙනා සඳහන් කර ඇත්තේ පරිසර දූෂණය අවම කළ යුතුය යන්නයි. ඊට අමතරව තිරසාර සංවර්ධනයක් තහවුරු කිරීම, පොසිල ඉන්ධන පරිභෝජනය අවම කිරීම, පරිසර හිතකාමී පිළිවෙත් අනුගමනය කිරීම සහ පරිසරයට අහිතකර මානව ක්‍රියා පාලනය, නීති පද්ධතිය ශක්තිමත් කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම, දෙමුහුන් වාහන භාවිතා කිරීම, සංවර්ධිත රටවල් හා එක් වී ගෝලීය ප්‍රතිපත්ති සකස් කළ යුතු බව ආදීය සඳහන් කරන ලදී. ග්‍රාමීය ප්‍රජාවේ බහුතරයක් දෙනා නැවත වන වගා කළ යුතු බව පිළිතුරු ලෙස දක්වා ඇත. මීට අමතරව කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, කාබනික වගාවන් සිදු කිරීම, හරිත නගර ඇති කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීම, වාහනවල දුම් පරික්ෂාවන් නියමිත කාලවල දී සිදු කළ යුතු බව ආදිය සඳහන් කර ඇත. මේ අනුව ග්‍රාමීය සහ නාගරික යන දෙඅංශයේම ප්‍රජාවට දේශගුණික විපර්යාස පිළිබඳව සමාන මට්ටමේ දැනුම්වත්භාවයක් පවතින බව එහි දී හඳුනාගත හැකිවිය.

පරිසර දූෂණය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 3 : පරිසර දූෂණය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාර අංක 1 ට අනුව පරිසර දූෂණ සංකල්පය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික පුද්ගලයන් සතු සංජානනය සමාන වේ. එනම් පරිසර දූෂණය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික වශයෙන් පුද්ගලයන් තුළ විෂමතාවක් නොමැත. සමස්තයක් ලෙස පුද්ගලයින් 95% පමණ ප්‍රමාණයක් පරිසර දූෂණය සංකල්පය පිළිබඳව දැනුවත් වේ.


පරිසර දූෂණය සංකල්පය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ දැනුවත්භාවය සමාන මට්ටමක පැවතිය ද පරිසර දූෂණය වැඩි වශයෙන් ඇති වන්නේ ස්වභාවික සාධක නිසාද මානව සාධක නිසද යන්න පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ අදහස්වල යම් විෂමතාවයක් හඳුනාගත හැකිය. එනම් පරිසර දූෂණයට මූලික හේතුව වන්නේ ස්වභාවික සාධකයන් බව ග්‍රාමීය ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් ප්‍රකාශ කරන නමුත් ග්‍රාමීය ප්‍රජාවෙන් වැඩිම පිරිසක් ප්‍රකාශ කරන්නේ මානව ක්‍රියා හේතුවෙන් පරිසර දූෂණයක් සිදුවන බවයි. නාගරික ප්‍රජාවෙන් ද වැඩි පිරිසක් මානව ක්‍රියා හේතුවෙන් ප්‍රධාන වශයෙන් පරිසර දූෂණයක් සිදුවන බව පැවසූව ද එම ප්‍රමාණය ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව අඩු අගයකි. නමුත් මානව ක්‍රියා හේතුවෙන් ප්‍රධාන වශයෙන් පරිසර දූෂණයක් සිදුවේ යන ප්‍රකාශයේ දී ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ තරා අගයන් සමාන වීමෙන් පැහැදිලි වන්නේ මෙම ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය සැලකිය යුතු මට්ටමක පවතින බවත් සංජානන විෂමතාවයක් හඳුනාගත නොහැකි බවත් ය.

පරිසර දූෂණය සිදුවිය හැක ස්වභාවික ක්‍රියාවන් පිළිබඳ ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

පරිසර දූෂණය සිදු විය හැකි ස්භාවික ක්‍රියාවන්ට අදාළ සියලුම ප්‍රශ්න සඳහා සාපේක්ෂව අසමාන පිළිතුරු ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ලැබී ඇති බවට ප්‍රස්තාරයෙන් සනාථ වේ. නමුත් එහිදී සුළු ප්‍රමාණයන්ගේ

වෙනසක් පමණක් හඳුනාගත හැකිය. එහිදී අකුණු ගැසීම් නිසා පරිසර දූෂණයක් සිදු වේ යන ප්‍රකාශයට තරා කිරීම් අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවට හිමි වන්නේ මධ්‍යස්ථ මට්ටමේ වැදගත්කමකි. ගිනි කඳු පිපිරීම, එරසෝල්ස් තත්ව, අම්ල වැසි, එල්නිනෝ ලානිනෝ තත්ත්ව නිසා පරිසර දූෂණයක් සිදුවේ යන ප්‍රකාශයට තරා කිරීම් අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව සැලකිය යුතු මට්ටමේ වැදගත්කමක් ලබා දී ඇත.

ප්‍රස්තාර අංක 4 : පරිසර දූෂණය සිදුවිය හැකි ස්භාවික ක්‍රියාවන් පිළිබඳ ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මෙයින් සනාථ වන්නේ පරිසර දූෂණය සිදු විය හැකි ස්වභාවික ක්‍රියාවන් පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ යම් යම් සංජානන විෂමතා පවතින බවත් තරා කිරීම් අනුව එය එතරම් සැළකිය යුතු මට්ටමක් නොවන බවත් ය.

පරිසර දූෂණය සිදුවිය හැකි මානව ක්‍රියාවන් පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 5 : පරිසර දූෂණය සිදුවිය හැකි මානව ක්‍රියාවන් පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

පරිසර දූෂණය සිදුවිය හැකි මානව ක්‍රියා සම්බන්ධයෙන් ද ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ අදහස්වල වෙනසක් හඳුනාගත හැකිය. එනම් අවිධිමත් කර්මාන්ත කටයුතු සහ අවිධිමත් කසල කළමනාකරණය හේතුවෙන් පරිසර දූෂණයක් සිදු වේ යන ප්‍රකාශයට ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව සමාන අදහසක් දරයි. ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව ඒ සම්බන්ධයෙන් ඉතා වැඩි මට්ටමේ වැදගත්කමක් ලබා දී ඇත. රථ වාහන භාවිතයෙන් සහ නාගරීකරණය හේතුවෙන් පරිසරයට හානියක් වන බවට ග්‍රාමීය ප්‍රජාවෙන් සාපේක්ෂව වැඩි පිරිසක් ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධව තරා කිරීම් අනුව ග්‍රාමීය ප්‍රජාව සතුව ඉතා වැදගත් සංජානන මට්ටමක් ද  නාගරික ප්‍රජාව සතුව සැළකිය යුතු මට්ටමේ සංජානනයක් ද පවතින බව හඳුනාගත හැකිවිය. වක්‍රාකාරයෙන් වුව ද ජනගහන වර්ධනය නිසා පරිසර දූෂණයක් සිදු වේ යන්න පිළිබඳව ද ග්‍රාමීය ප්‍රජාව සහ නාගරික ප්‍රජාව සමාන අදහසක් දරන අතරම  කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් පරිසර දූෂණයක් වේ යන ප්‍රකාශය සමඟ වැඩි ප්‍රමාණයක් එකඟ වී ඇත්තේ ග්‍රාමීය ප්‍රජාවයි.  මේ සම්බන්ධව ග්‍රාමීය ප්‍රජාවට සැළකිය යුතු මට්ටමේ සංජානනයක් ද නාගරික ප්‍රජාවට මධ්‍යස්ථ

සංජානන මට්ටමක් ද පවතී. තවද ග්‍රාමීය සහ නාගරික ප්‍රජා කාණ්ඩ ද්විත්වයේම වැඩි පිරිසක් අවිධිමත් කර්මාන්ත කටයුතු හේතුවෙන් පරිසර දූෂණය සිදුවන බවට අදහස් දක්වා ඇත. කෘෂිකාර්මික ක්‍රියා හේතුවෙන් පරිසර දූෂණයක් සිදුවේ යන්න පිළිබඳව දෙපිරිසෙන්ම අඩු වශයෙන් එකඟ වී පැවතීම ද කැපී පෙනෙන ලක්ෂණයකි. ඉන් සනාථ වන්නේ බොහෝ දෙනා පිළිගනු ලබන්නේ අවිධිමත් කර්මාන්ත කටයුතු හේතුවෙන් මූලික වශයෙන්ම පරිසර දූෂණයක් සිදුවන බවත් සහ ප්‍රජාවෙන් සාපේක්ෂව අඩු පිරිසක් කෘෂිකාර්මික ක්‍රියා හේතුවෙන් පරිසර දූෂණයක් සිදුවන බවට පිළිගන්නා බවයි. මෙම කරුණුවලින් සනාථ වන්නේ පරිසර දූෂණය සිදුවිය හැකි මානව ක්‍රියා සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානන විෂමතා පවතින බවයි.

පරිසර දූෂණය සිදුවිය හැකි අංග පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 6 : පරිසර දූෂණය සිදුවිය හැකි අංග පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

පරිසර දූෂණය අංශ කීපයක් යටතේ සිදුවන අතර ඒ අතර ජල දූෂණය, වායු දූෂණය, පාංශු දූෂණය, ශබ්ද දූෂණය සහ ජෛව විවිධත්ව හායනය ප්‍රධාන වේ. මෙම සියලු කරුණු සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රජාවට ඉතා වැදගත් සංජානන මට්ටමක් පවතින අතර ඒ අතරින් ජල දූෂණය, ශබ්ද දූෂණය සහ වායු දූෂණය සම්බන්ධයෙන් නාගරික ප්‍රජාවට ඉතා වැදගත් මට්ටමේ සංජානනයක් පවතී. පාංශු දූෂණය සහ ජෛව විවිධත්ව හායනය සම්බන්ධයෙන් නාගරික ප්‍රජාවට ඇත්තේ සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පමණි. මින් සනාථ වන්නේ ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරික ප්‍රජාවේ අවම සංජානන මට්ටමක් පවතින බවයි.

කසළ කළමනාකරණය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 7 : කසළ කළමනාකරණය කළ හැකි ආකාර පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාර අංක 1 ට අනුව පරිසර දූෂණයට සමීප සංකල්පයක් වන කසළ කළමනාකරණ සංකල්පය පිළිබඳව ද ග්‍රාමීය සහ නාගරීක ප්‍රජාවේ සංජානනයේ විෂමතාවයක් නොමැති බව සනාථ වේ. ඒ පිළිබඳව ඔවුන් තුළ සමාන මට්ටමේ දැනුවත්කමක් මෙන්ම සමාන මට්ටමේ නොදැනුවත්කමක් ද ඇත. එනම් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ 90% ඉක්ම


වූ ප්‍රමාණයක් කසළ කළමනාකරණය පිළිබඳව දැනුවත් වේ. සමස්තයක් ලෙස පුද්ගලයින් 8% වැනි සුළු ප්‍රමාණයකට කසළ කළමනාකරණය පිළිබඳව දැනුවත්කමක් නොමැත.

ප්‍රස්තාර අංක 7 ට අනුව කසළ කළමනාකරණය කළ හැකි ප්‍රධාන ක්‍රමයක් වන ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ දැනුම්වත්භාවය තරා කිරීම් අනුව සමාන මට්ටමක පවතින බවත් ( ඉතා වැදගත් සංජානන මට්ටමක් ) ජීව කොටු සෑදීම සම්බන්ධව ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව වැඩි දැනුම්වත්භාවයක් පවතින බවත් ප්‍රස්තාරට අනුව පැහැදිලි වේ. එනම් ග්‍රාමීය ප්‍රජාවට ඉතා ඉහළ සංජානන මට්ටමක් ද නාගරික ප්‍රජාවට සැළකිය යුතු මට්ටමේ සංජානනයක් ද පවතී. මින් සනාථ වන්නේ ජීව කොටු සෑදීමේ ක්‍රියාවලිය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානන විෂමතාවයක් පවතින බවයි.

නියැදි සාමාජිකයින්ගෙන් ඔවුන්ගේ මාසිකව ජනිත අපද්‍රව්‍ය ප්‍රමාණයන් පිළිබඳව ද තොරතුරු මෙම පරීක්ෂණය මඟින් ලබා ගන්නා ලදී එහිදී විවිධ අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් $1 >$ , $1 - 10$ අතර සහ $10 <$ ආදී ලෙස ගණනය කරන ලදී ඒ අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව අසුරෙන් මාසිකව ජනිත වන කසළ ප්‍රමාණයන්ගේ ද වෙනසක් පවතින බව හඳුනාගත හැකි විය.

අංක 8 ප්‍රස්තාරයට අනුව කැපී පෙනෙන ලක්ෂණයන් වන්නේ ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන්ගෙන් කිලෝ එකට වඩා අඩුවෙන් වුවත් වැඩිම පුද්ගලයින් ප්‍රමාණයක් නිකුත් කරන අපද්‍රව්‍යය වන්නේ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බවයි. එයිනුත් ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරිකව ජීවත් වන පුද්ගලයින් වැඩි දෙනෙක් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය නිකුත් කරනු ලබයි.

ප්‍රස්තාර අංක 8 : ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ මාසිකව ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණයන්




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදි, 2023

ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හැරුණුකොට කිලෝ එකට අඩු ප්‍රමාණයකින් ජනිත වන අපද්‍රව්‍ය වන්නේ ප්ලාස්ටික් සහ කඩදාසි වේ. මෙම අපද්‍රව්‍යයන් ද ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරික ප්‍රජාවෙන් වැඩි දෙනෙක් මාසිකව නිකුත් කරනු ලබයි.

ග්‍රාමීය සහ නාගරික ජන කොට්ඨාසයන් ද්විත්වයේම වැඩි පිරිසක් කිලෝ 1 - 10 අතර ප්‍රමාණයන්ගෙන් ජනිත කරන්නේ ආහාරමය අපද්‍රව්‍ය වේ. මෙම ප්‍රජාවන්ගෙන් වැඩි පිරිසක් කිලෝ 10 ට වඩා වැඩියෙන් නිකුත් කරන අපද්‍රව්‍යය කාණ්ඩය වන්නේ ගෙවතු අපද්‍රව්‍යය වේ.

අංක 1 ප්‍රස්තාරයට අනුව පාසල් විෂය මාලාව හරහා ලබා දෙන පාරික අධ්‍යාපනය පිළිබඳව පුද්ගල තෘප්තිමත්භාවය පරීක්ෂාවට ලක් කරන ලදී. එහිදී ග්‍රාමීය ප්‍රජාවෙන් 65% පමණ ප්‍රමාණයක් පාසල තුළින්


ලබා දෙන පාරිසරික අධ්‍යාපනය පිළිබඳව තෘප්තිමත් වේ. නමුත් ඊට සාපේක්ෂව නාගරික ප්‍රජාවේ තෘප්තිමත් බව අඩුය. නාගරික ප්‍රජාවෙන් වැඩි කොටසක් එනම් 55% ඉක්මවූ ප්‍රමාණයක් පාසලෙන් ලබා දෙන පාරිසරික අධ්‍යාපනය පිළිබඳව තෘප්තිමත් නැත. මෙය සැළකිය යුතු විෂමතාවයකි.

සමස්තයක් ලෙස ගෙන බලන කල යම් යම් කරුණු සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සාමන දැනුවත්කම් පැවතිය ද පොදුවේ ගෙන බලන කල සුළු ප්‍රමාණයකින් හෝ පරිසරය පිළිබඳව වඩා වැඩි දැනුම්වත්භාවයෙන් යුතු පිරිසක් වාසය කරන්නේ ග්‍රාමීය ප්‍රදේශවල බව සංඛ්‍යා දත්ත අනුව පැහැදිලි වේ.

**ග්‍රාමීය සහ නාගරික ජනතාවගේ ස්භාවික සම්පත් භාවිතයේ පවත්නා විෂමතා අධ්‍යයනය කිරීම**

ස්භාවික සම්පත් සංරක්ෂණය පිළිබඳව ඇති දායකත්වය පරික්ෂාවට ලක් කිරීම

ප්‍රස්තාර අංක 9 : ස්භාවික සම්පත් සංරක්ෂණයට දක්වන දායකත්වය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාර අංක 9 ප්‍රස්තාරයට අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් 85% ඉක්ම වූ පිරිසක් පුරුද්දක් ලෙස කාමරයෙන් පිටවන විට විදුලි බුබුළු නිවා දැමීම සහ ජල කරාම වසා දැමීම සිදු කරනු ලබයි. එමඟින් පැහැදිලි වන්නේ සම්පත් මනා ලෙස පරිභෝජනය කිරීමේ මූලික ලක්ෂණ ගම සහ නගරය තුළින් හඳුනාගත හැකි බවයි. ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව අතරින් ද ඒ පිළිබඳව වඩා වැඩි සංජානන මට්ටමක් ඇත්තේ නාගරික ප්‍රජාවට බව ප්‍රස්තාරයට අනුව පැහැදිලි වේ. විකල්ප බලශක්ති ප්‍රභව පිළිබදව නොදැනුවත් නාගරික ප්‍රජාව සාපේක්ෂව ඉහළ වීම සහ දැනුවත් පිරිස අඩු වීමෙන් තව දුරටත් පැහැදිලි වන්නේ නාගරික ප්‍රජාව සතුව විකල්ප බලශක්ති ප්‍රභව පිළිබද දැනුවත් බව අඩු බවයි. ස්භාවික සම්පත් විනාශ කරන පුද්ගලයන්ට විරුද්ධව තමාට හැකි මට්ටමේ කිසියම් හෝ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේ ද යන ගැටලුවේ දී සාපේක්ෂව ධනාත්මක පිළිතුරු ලැබී අත්තේ නාගරික ප්‍රජවෙන් ය. එනම් නාගරික ප්‍රජාවෙන් 40% පිරිසක් ඒ සදහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරයි. ග්‍රාමීය ප්‍රජාවෙන් කිසියම් හෝ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේ පුද්ගලයන්ගෙන් 40% ට අඩු පිරිසකි. එසේ අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබදව විවෘත ප්‍රශ්න කිරීමක් සිදු කරන ලද අතර එහිදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, අවවාද ලබා දීම, වගකිව යුත්තන් දැනුවත් කිරීම යන පිළිතුරු ලැබීය.

ස්භාවික සම්පත්වල පවත්නා තර්ජනාත්මක බව පිළිබදව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 10 : ස්භාවික සම්පත්වල පවත්නා තර්ජනාත්මක බව පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

විවිධ ස්වභාවික සම්පත් විනාශ වීමේ තර්ජනයක පවතිනවා ද ප්‍රශ්නය නියදි සාමාජිකයන්ට පළමුවෙන්ම ඉදිරිපත් කරන ලදී. එහිදී සමස්තයක් ලෙස සෑම ස්භාවික සම්පතක්ම දැඩි අනතුරක පවතින බව වැඩි වශයෙන් පිළිගෙන ඇත්තේ ග්‍රාමීය ප්‍රජාව බව පැහැදිලි වේ. ග්‍රාමීය ප්‍රජාව වාතය, ජලය, පස, වන සම්පත, වන සතුන්, ඛනිජ ද්‍රව්‍ය, කොරල්පර යනාදිය දැඩි අනතුරක පවතින බව වැඩි වශයෙන් පිළිගෙන ඇති අතර නාගරික ප්‍රජාවට ඒ පිළිබඳව සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පවතී. ඒ අනුව විවිධ ස්වභාවික සම්පත්වල පවත්නා තර්ජනාත්මක බව පිළිබඳව නාගරික ප්‍රජාවට යම් මට්ටමක දැනුවත් බවක් පැවතිය ද එය එතරම් සතුටුදායක මට්ටමක් නොවේ. සමස්තයක් ලෙස ගත් කල ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන්ට ස්භාවික සම්පත් හී තර්ජනාත්මක බව පිළිබඳව මෙයටත් වඩා දැනුවත්භාවයක් පැවතීම ඉතා වැදගත් වේ.

## ස්භාවික සම්පත්වලට හානි කරන ක්‍රියාකාරකම්වල ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ නිරත වීම පිළිබඳ අධ්‍යයනය

ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව පරිසරය හා සම්බන්ධ ක්‍රියාවන් සඳහා දක්වන දායකත්වය

ප්‍රස්තාර අංක 11: ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව පරිසරය හා සම්බන්ධ ක්‍රියාවන් සඳහා දක්වන දායකත්වය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023


ප්‍රස්තාරයේ පලමු අක්ෂ තුනෙන් දැක්වෙන පරිදි කෘෂි රසායන ද්‍රව්‍යය භාවිතා කිරීම, ගස් කැපීම සහ සතුන් දඩයම් කිරීම යන ක්‍රියාවන්වල වැඩි වශයෙන් නිරත වන්නේ ග්‍රාමීය ප්‍රජාව බවට සනාථ විය. ඒ අනුව කෘෂි රසායන ද්‍රව්‍යය භාවිතා කිරීම සහ ගස් කැපීම යන ක්‍රියාවලි සඳහා ග්‍රාමීය ප්‍රජාව මධ්‍යස්ථ මට්ටමේ දායකත්වයක් ද නාගරික ප්‍රජාව කුඩා වැදගත්කමක් දක්වන මට්ටමක සිටින බවත් තරා කිරීම් අනුව ප්‍රකාශ කළ හැකිය. සතුන් දඩයම් කිරීම සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව කුඩා මට්ටමේ වැදගත්කමක් දක්වා ඇත. ඒ අනුව පරිසරය හා සම්බන්ධ ක්‍රියාවන්ගේ වැඩි වශයෙන් නිරත වන්නේ ග්‍රාමීය ප්‍රජාව බව පැහැදිලි වේ. පරිසරයේ ස්භාවික සම්පත් වැඩි වශයෙන්

භාවිතයට ගන්නේ සහ වැඩි වශයෙන් හානිකර ක්‍රියාකාරම්වල නිරත වන්නේ ද ග්‍රාමීය ප්‍රජාව වේ. නාගරික ප්‍රදේශවල පවත්නා ස්භාවික සම්පත්වල හිඟ බව මීට ප්‍රධාන හේතුවක් විය හැකි අතරම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය මාර්ගයන් ස්භාවික පරිසරයත් සමග බැඳී පැවතීම ද මේ සඳහා හේතු සාධක යැයි උපකල්පනය කළ හැකිය.

කළු දුම පිටවන වාහන භාවිතය සහ වැලි ගොඩ දැමීම යන ක්‍රියාවන් සඳහා ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව සමාන මට්ටමේ දායකත්වයක් දක්වන බව හඳුනාගත හැකිය. එනම් අවම මට්ටමේ වැදගත්කමක් ඒ සම්බන්ධයෙන් දක්වනු ලබයි. පොලිතීන් සහ ප්ලාස්ටික් ආදිය පිළිස්සීම සම්බන්ධව ග්‍රාමීය සහ නාගරික යන ප්‍රජා කොට්ඨාස ද්විත්වයම මධ්‍යස්ථ මට්ටමේ දායකත්වයක් දක්වනු ලබයි.

ප්‍රධාන ස්භාවික අමුද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සම්බන්ධව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 12 : ප්‍රධාන ස්භාවික අමුද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සම්බන්ධව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මෙම කාණ්ඩය යටතේ විවිධ ද්‍රව්‍ය භාවිතා කර අවසන් කිරීමෙන් පසුව ඒවා නැවත භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව ඔවුන් සිතනවා ද යන්න අධ්‍යයනට ලක් කර ඇත. එහිදී කඩදාසි සහ පොල් කටු යන

ද්‍රව්‍යයන් භාවිතා කර අවසන් වූ පසුව නැවත භාවිතා කිරිම සම්බන්ධව වැඩි පිරිසක් සිතනු ලබන්නේ නාගරික ප්‍රජාවයි. ඊට සාපේක්ෂව ග්‍රාමීය ජනතාවගෙන් අඩු පිරිසක් නැවත භාවිතා කළ හැකි ආකාරය පිළිබදව සිතනු ලබයි. මේ නිසා තරා කිරීම් අනුව නාගරික ජනතාව කඩදාසි සහ පොල්කටු නැවත භාවිතා කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු මට්ටමේ වැදගත්කමක් පවතින බවට තවදුරටත් සනාථ වේ. ග්‍රාමීය ජනතාව මධ්‍යස්ථ මට්ටමේ වැදගත්කමක් ලබා දී තිබේ. පිදුරු නැවත භාවිතා කිරීම සමබන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන් ද්විත්වයම සමාන මට්ටමේ වැදගත්කමක් ලබා දී ඇති අතර තරා කිරීම් අනුව මධ්‍යස්ථ මට්ටමේ වැදගත්කමක් ලැබී ඇත්තේ ඒ නිසාවෙණි. පොල් ලෙලි නැවත භාවිතා කිරීම සම්බන්ධව නාගරික ප්‍රජාවට වඩා ග්‍රාමීය ප්‍රජාවෙන් වැඩි පිරිසක් සැළකිලිමත් වන බව ප්‍රස්තාරයට අනුව පැහැදිලි වේ. නමුත් එම වෙනස සැළකිය යුතු මට්ටමේ වෙනසක් නොවන බව තරා කිරීමේ දී සනාථ වේ. එනම් ග්‍රාමිය සහ නාගරික ප්‍රජාවන් පොල් ලෙලි නැවත භාවිතා කිරීම සම්බන්ධව මධ්‍යස්ථ මට්ටමේ වැදගත්කමක් ලබා දී ඇත.

අනාගත සම්පත් පරිභෝජනය පිළිබදව ජනතාවගේ සංජානනය

ප්‍රස්තාර අංක 13 : ඉදිරි වසර සදහා ලංකාව තුළ භාවිතා කළ හැකි විකල්ප බලශක්ති ප්‍රභාව සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ඉදිරි වසර සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා කළ හැකි විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳව අධ්‍යයනයේ දී සුළඟ, ජලය, සූර්යයාලෝකය, ස්භාවික වායු, සාගර රළ යන විකල්ප බලශක්ති ප්‍රභව අතරින් සූර්යයාලෝකය වැඩි වශයෙන් භාවිතයට ගත හැකි බවට වැඩි පිරිසක් ප්‍රකාශ කර ඇත. මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් නාගරික ප්‍රජාවෙන් වැඩි දෙනෙක් එකඟ වී ඇති නමුත් ග්‍රාමීය ප්‍රජාවට සාපෙක්ෂව එය සැළකිය යුතු මට්ටමේ වෙනසක් නොවේ. මේ සඳහා තරා කිරීම් අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන් සියලු දෙනාටම ඉතා ඉහළ මට්ටමේ වැදගත්කමක් ලැබී තිබීමෙන් එය සනාථ වේ. ජලය, සුළඟ, සාගර රළ, ස්භාවික වායූන් යන විකල්ප බලශක්ති ප්‍රභව ඉදිරි වසර සඳහා භාවිත කිරීම සම්බන්ධව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන් සමාන අදහසක් දක්වා ඇති අතර තරා කිරීම් අනුව ඔවුන්ට සැළකිය යුතු මට්ටමේ වැදගත්කමක් ලැබී ඇත්තේ එබැවිනි.

ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව නිවසේ ආහාර පිසීම සඳහා භාවිතා කරන බලශක්ති ප්‍රභව

ප්‍රස්තාර අංක 14 : ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව නිවසේ ආහාර පිසීම සඳහා භාවිතා කරන බලශක්ති ප්‍රභව




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මෙහි දී ග්‍රාමීය සහ නාගරික වශයෙන් කැපී පෙනෙන වෙනස්කම් කීපයක්ම පවතින බව ප්‍රස්තාරයට අනුව පැහැදිලි වේ. ආහාර පිසීම සඳහා දර වැඩි වශයෙන් භාවිතා කරනු ලබන්නේ ග්‍රාමීය ප්‍රජාවයි. එය නාගරික ප්‍රජාවට සාපේක්ෂව 20% පමණ වැඩි ප්‍රතිශතයකි. එයින් පැහැදිලි වන තවත් කරුණක් වන්නේ වර්තමානය වන විට නාගරික ප්‍රජාවෙන් ද 60% වඩා වැඩි ප්‍රතිශතයක් ආහාර පිසීම සඳහා දර භාවිතා කරනු ලබන බවයි. මෙය නව ප්‍රවණතාවයකි. ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් ජීව වායු භාවිතා කරන්නේ 40% අඩු ප්‍රමාණයකි. එහි ග්‍රාමීය සහ නාගරික වශයෙන් සැළකිය යුතු වෙනසක් නොමැත. ගෑස් භාවිතයෙන් වැඩිම පිරිසක් ආහාර පිසීම සිදු කරන්නේ නාගරික ප්‍රදේශවලය. නාගරික ප්‍රජාවෙන් 90% පමණ ගෑස් භාවිතා කරන බව හඳුනාගන්නා ලද අතර ග්‍රාමීය ප්‍රජාවෙන් 70% පමණ ගෑස් භාවිතා කරනු ලබයි. ඒ අනුව ආහාර පිසීමේ ප්‍රභවයක් ලෙස ගෑස් භාවිතා කිරීමේ දී ග්‍රාමීය සහ නාගරික වශයෙන් විශාල වෙනසක් පවතින බව හඳුනාගත හැකිය. එම වෙනස 20% පමණ ප්‍රමාණයකි. ගෑස් භාවිතා කිරීම සම්බන්ධව තරා කිරීම් අනුව නාගරික ප්‍රජාවට ඉතා වැදගත් සංජානන මට්ටමක් ද ග්‍රාමීය ප්‍රජාවට සැළකිය යුතු සංජානන මට්ටමක් ද පවතී. විදුලිය භාවිතයෙන් ද වැඩිම පිරිසක් ආහාර පිසීම සිදු කරන්නේ නාගරික ප්‍රදේශවලය. ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව එම වෙනස 12% පමණ වේ. මේ නිසා විදුලිය භාවිතා කිරීම පිළිබඳව නාගරික ප්‍රජාවට ඉහළ සංජානන මට්ටමක් ද ග්‍රාමීය ප්‍රජාවට සැළකිය යුතු මට්ටමේ සංජානනයක් ද පවතී. මෙම ඉන්ධන ප්‍රභවයන් හැරුණුකොට ග්‍රාමිය සහ නාගරික ප්‍රජාවෙන් සැළකිය යුතු පිරිසක් වෙනත් ඉන්ධන ප්‍රභවයන් ආහාර පිසීම සඳහා භාවිතා කරනු ලබයි.

සමස්තයක් ලෙස ගත් කල ස්භාවික සම්පත් දැඩි තර්ජනයක පවතී ද යන්න පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවට ඉහළ සංජානන

මට්ටමක් පවතින නමුත් සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවෙන් වැඩි පිරිසකට ඉහළ සංජානන මට්ටමක් පවතින බව හඳුනාගත හැකිය.

ස්වභාවික සම්පත්වලට හානි කරන ක්‍රියාවන්වල නිරත වීමේ දී ග්‍රාමීය ප්‍රජාව මධ්‍යස්ථ මට්ටමේ දායකත්වයක් ලබා දෙන අතර නාගරික ප්‍රජාව ඊට සාපේක්ෂව කුඩා වැදගත්කමක් ලබා දෙනු ලබයි.

ස්වභාවික අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සම්බන්ධයෙන් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවට සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පවතී. නමුත් සාපේක්ෂව නාගරික ප්‍රජාවෙන් වැඩි පිරිසකට සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පවතී.

අනාගතයේ දී භාවිතා කළ හැකි විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව යන නියදි ද්විත්වයටම සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පවතින බවත් මින් සාපේක්ෂව නාගරික ජනගහන ප්‍රතිශතය වැඩි බවත් පැහැදිලි වේ.

ආහාර පිසීමේ දී භාවිතා කරන ඉන්ධන ප්‍රභවයන්ගේ ද ග්‍රාමීය සහ නාගරික වශයෙන් විශාල වෙනසක් පවතින බව ද හඳුනාගත හැකිය.


**ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව පාරිසරික ව්‍යාපාර කෙරෙහි දක්වන දායකත්වයේ පවතින විෂමතා අධ්‍යයනය කිරීම**

කිසියම් රටක පාරිසර ගැටලු ඇති වීම හා පාරිසරික ව්‍යාපාර අතර ඇත්තේ සමීප සම්බන්ධතාවයකි. මක් නිසාද යත් යම් රටක ජනතාව පාරිසරික ව්‍යාපර කෙරෙහි දක්වන දායකත්වය ඉහළ නම් එම රටේ පාරිසරික ගැටලු අඩුය. මෙහිදී අවධානයට ගත යුතු අනෙක් කරුණ වන්නේ මිනිසා පාරිසරික ව්‍යාපාර කෙරෙහි යොමුවන්නේ ද පාරිසරික ගැටලු පෙනෙන්නට පටන් ගත් අවධියක සිට ය.

මෙහි දී ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් ප්‍රශ්නාවලියක් හරහා පිළිතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිචාරකයින් දැක් වූ අදහස් අනුව RII පරීක්ෂණය සිදු කර දත්ත විශ්ලේෂණය කරන ලදී.

පාරිසරික ව්‍යාපාර පිළිබද ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ දැනුම සහ දායකත්වය

ප්‍රස්තාර අංක 15 : පාරිසරික ව්‍යාපාර සදහා ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ දායකත්වය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාරික දත්ත අනුව හරිත සංකල්පය පිළිබදව වඩා වැඩි දැනුවත්භාවයක් ඇත්තේ ග්‍රාමීය ප්‍රජාවට ය. ඊට සාපේක්ෂව තරමක අවම මට්ටමක වුවද නාගරික ප්‍රජාවට ද හරිත සංකල්පය පිළිබදව සැළකිය යුතු මට්ටමේ දැනුවත්භාවයක් පවතී. නමුත් තමා ජීවත් වන ප්‍රදේශයේ හරිත පරිසරයක් ඇති කිරීමට වැඩි වශයෙන් පුද්ගලිකව මුල පුරා ඇත්තේ සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාව වේ. නමුත් එම ප්‍රමාණය ද 25% ට අඩුය. මෙම විෂමතාවට හේතුව නාගරික ප්‍රදේශවල පවත්නා පරිසර

හිතකාමී බව අඩුවීම යැයි උපකල්පනය කළ හැකිය. තිරසාර සංවර්ධන සංකල්පය පිළිබඳව වඩා වැඩි දැනුම්වත්භාවක් ඇත්තේ සාපේක්ෂව නාගරික ප්‍රජාවට වේ. ඊට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවේ දැනුම්වත් බව අඩුය. පාරිසරික ව්‍යාපරවල සාමාජිකත්වයේ විශාල අඩුවක් ග්‍රාමීය සහ නාගරික කලාප දෙකෙන්ම හඳුනාගත හැකිය. සමස්ත ප්‍රජාවෙන් 95% වැඩි කොටසක් කිසිම පාරිසරික ව්‍යාපාරයක සාමාජිකත්වයක් නොදරයි. එයිනුත් ග්‍රාමීය ප්‍රජාවගේ දායකත්වය ඉතා අඩුය. මෙය සංවර්ධනය කළ යුතු අංශයක් යැයි හඳුනාගත හැකිය. මොවුන් සාමාජිකත්වය දරන පාරිසරික කණ්ඩායම් ලෙස ජයවර්ධනපුර භූගෝල විද්‍යා සංසදය, මධ්‍යම පරිසර අධිකාරිය යන පිළිතුරු ලැබිණ.

පරිසර සංරක්ෂණය වැඩසටහන් සඳහා ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව ලබා දී ඇති දායකත්වය පරික්ෂා කිරීම

ප්‍රස්තාර අංක 16 : ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා ලබා දී ඇති දායකත්වය අධ්‍යයනය කිරීම




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023


මෙහි දී පරිසර සංරක්ෂණ ව්‍යාපාරවලට ලබා දෙන දායකත්වය පිළිබඳව ඇගයීමකට ලක් කරන ලදී. එහිදී වෙරළ පවිත්‍රතා වැඩසටහන් සඳහා ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සමාන දායකත්වයක් හඳුනාගත හැකි

විය. රුක් රෝපණ වැඩසටහන් සඳහා තරමක වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ ග්‍රාමීය ප්‍රජාව වේ. දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වෙරළ පවිත්‍රතා වැඩසටහන් සඳහා සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාව වැඩි දායකත්වයක් දක්වා ඇත.

ඒ අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජා කාණ්ඩ ද්විත්වයම ගත් කල ඔවුන් වැඩිම දායකත්වයක් ලබා දී ඇත්තේ රුක් රෝපණ වැඩසටහන්වලට ය. එම දායකත්වය තරා කිරීම් අනුව සැළකිය යුතු මට්ටමේ දායකත්වයකි. සෙසු සංරක්ෂණ වැඩසටහන් සඳහා තරා කිරීම් අනුව මධ්‍යස්ථ මට්ටමේ දායකත්වයක් ප්‍රජා කාණ්ඩ ද්විත්වයම ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පරිසර සංරක්ෂණ පනත් සහ ප්‍රතිපත්ති පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ දැනුවත් බව අධ්‍යයනය කිරීම

ප්‍රස්තාර අංක 17 : ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පාරිසරික ප්‍රතිපත්ති පිළිබඳ දැනුම්වත්භාවය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මේ යටතේ දී. පාංශු සංරක්ෂණ පනත, වෙරළ සංරක්ෂණ පනත, තෙත් බිම සංරක්ෂණ පනත, ජාතික පරිසර පනත, වන සත්ත්ව හා වෘක්ෂලතා

ආරක්ෂණ පනත යන පනත් පිළිබඳව සාපේක්ෂව තරමක දැනුවත් බවක් ග්‍රාමිය ප්‍රජාව විසින් පෙන්නුම් කරයි. එනම් ග්‍රාමීය ප්‍රජාව මෙම සෑම පනතක් සහ ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන්ම සැළකිය යුතු සංජානන මට්ටමක් පෙන්නුම් කරයි. නාගරික ප්‍රජාව පාංශු සංරක්ෂණ පනත, තෙත් බිම් සංරක්ෂණ පනත සම්බන්ධයෙන් මධ්‍යස්ථ සංජානන මට්ටමක් ද සෙසු පනත් සහ ප්‍රතිපත්ති සම්බන්ධව සැලකිය යුතු සංජානන මට්ටමක් ද පෙන්නුම් කරනු ලබයි.

ලෝක පාරිසරික සම්මුති පිළිබඳව ග්‍රාමිය සහ නාගරික ප්‍රජාවේ දැනුවත් බව අධ්‍යයනය කිරීම

ප්‍රස්තාර අංක 18 : ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පාරිසරික සම්මුති පිළිබද දැනුම්වත්භාවය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මේ යටතේ දී කැපී පෙනෙන විෂමතාවයක් හඳුනාගත හැකි වූයේ රියෝ සම්මුතිය සහ පැරිස් සම්මුතියෙනි. මෙම සම්මුතීන් පිළිබඳව නාගරික ප්‍රජාවේ සාපේක්ෂව වැඩි සංජානන මට්ටමක් එනම් තරා කිරීම් අනුව සැළකිය යුතු මට්ටමේ සංජාජනයක් හඳුනාගත හැකි විය. ඒ සම්බන්ධව ග්‍රාමීය ප්‍රජාවට ඇත්තේ මධ්‍යස්ථ සංජානන මට්ටමකි. ග්‍රාමීය ප්‍රජාවේ අවම සංජානන මට්ටමක් පවතින්නේ ද පැරි සහ රියෝ

සම්මුතිය පිළිබඳව ය. සෙසු සියලුම සම්මුතින් සම්බන්ධයෙන් තරා කිරීම් අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව සැළකිය යුතු සංජානන මට්ටමක් නිරූපණය කළ ද ජන සංඛ්‍යාව අනුව නාගරික ප්‍රජාව ඉදිරියෙන් සිටියි.

'සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික කාර්යය සාධන වාර්තාව හරහා පරිසරය වැඩි දියුණු කිරීමට අවස්ථාවන් සලසාලයි ' යන ප්‍රකාශය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය

ප්‍රස්තාර අංක 19 : 'සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික කාර්යය සාධන වාර්තාව හරහා පරිසරය වැඩි දියුණු කිරීමට අවස්ථාවන් සලසාලයි ' යන ප්‍රකාශය පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ සංජානනය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

මෙහි දී සංවර්ධන ව්‍යාපෘතියන්ගේ පාරිසරික ඇගයීම් වාර්තාව හරහා පරිසර සංරක්ෂණයක් සිදූ වේ යැයි තමා අපේක්ෂා කරනවා ද යන්න විමසන ලදී. එහිදී ග්‍රාමීය ප්‍රජාවෙන් වැඩි කොටසක් ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත. නමුත් නාගරික ප්‍රජාවේ ප්‍රතිචාර සමඟ සැසදීමේ දී එය සැළකිය යුතු මට්ටමේ විෂමතාවයක් නොවේ. එම ගැටලුවට ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ තරා මට්ටම සමාන වීමෙන් එය සනාථ වේ. ඒ අනුව සංවර්ධන ව්‍යාපෘතීන්ගේ පාරිසරික ඇගයීම් වාර්තාව හරහා පරිසර සංරක්ෂණයක් සිදූ වේ ද යන ගැටලුවට ග්‍රාමීය සහ නාගරික ප්‍රජාව තරා කිරීම් අනුව සැළකිය යුතු මට්ටමේ සංජානනයක් පෙන්වයි.

**ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ පාරිසරික සංජානන විෂමතා අධ්‍යයනය කිරීම.**

ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් පවත්නා පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත්භාවයේ පවත්නා සංජානන විෂමතා අධ්‍යයනය කිරීම

ප්‍රස්තාර අංක 20 : ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් පාරිසරික සංකල්ප පිළිබඳ දැනුම්වත්භාවයේ පවත්නා සංජානන විෂමතා





මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ප්‍රස්තාරයට අනුව දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති විය හැකි ගැටලු සම්බන්ධයෙන් ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් යම් යම් විෂමතාවයක් හඳුනාගත හැකිය. පරිසර දූෂණය සමබන්ධයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නවල දී ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් විෂමතාවයක් පවතින බව කැපී පෙනෙයි. එනම් පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගෙන් 3%ට පරිසර දූෂණය සම්බන්ධයෙන් ඉහළ සංජානන මට්ටමක් ඇත. සමස්තයක් ලෙස ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයෙන්ම බහුතරයකටම පරිසර දූෂණය පිළිබඳ ඉහළ සංජානන මට්ටමක් පවතී. කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ද ස්ත්‍රීන්ට තරමක වැඩි දැනුවත්භාවයක් පවතින බව හඳුනාගත හැකිය. එම වෙනස 4% කි. ඒ අනුව පැහැදිලි

වන්නේ ප්‍රස්තාරයට අනුව පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වභාවය සම්බන්ධයෙන් ස්ත්‍රීන්ගෙන් සාපේක්ෂව වැඩි ප්‍රමාණයකට දැනුම්වත්භාවයක් පැවතිය ද තරා කිරීම්වලට අනුව ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම ඉහළ සංජානන මට්ටමකට උරුමකම් කියන බවයි.

අධ්‍යයන ප්‍රදේශයේ ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජාවට අදාළ ස්භාවික සම්පත් භාවිතයේ පවතින විෂමතා අධ්‍යයනය

ප්‍රස්තාර අංක 21 : ස්ත්‍රි සහ පුරුෂ වශයෙන් ස්භාවික සම්පත් භාවිතයේ පවත්නා විෂමතා පිළිබඳ අධ්‍යයනය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

ස්වභාවික සම්පත් භාවිතයේ දී ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් විශාල වෙනසක් පවතින බව හඳුනාගන්නා ලදී. ලංකාවේ විවිධ ස්භාවික සම්පත් දැඩි අනතුරක පවතී යන ප්‍රකාශයට ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයේම ඉහළ සංජානන මට්ටමක් පවතින බව පැහැදිලි වේ. එනම් ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජාවෙන් 70% ඉක්ම වූ පිරිසකට ස්වභාවික සම්පත්වලට පවත්නා තර්ජනාත්මක බව පිළිබඳව ඉහල මට්ටමේ සංජානනයක් ඇත.

පරිසරයට හානිකර ක්‍රියාකාරම්වල නිරත වීමේ පවත්නා විෂමතා පිළිබඳ අධ්‍යයනයේ දී සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවෙන් වැඩි පිරිසකට තරා කිරීම් අනුව පහළ සංජානන මට්ටමක් පවතින බව හඳුනාගත හැකිය. පුරුෂ ප්‍රජාවට ද තරා කිරීම් අනුව පහල සංජානන මට්ටමක් පැවතිය ද එය ජන සංඛ්‍යා ප්‍රමාණය අනුව සාපේක්ෂව අඩුය. එම වෙනස සාපේක්ෂව 6% පමණ වේ. මින් සනාථ වන්නේ පාරිසරයට හානිදායක ක්‍රියාවන්ගේ වැඩි වශයෙන් නිරත වන්නේ ස්ත්‍රී ප්‍රජාව බවයි.

පොල් කටු, පොල් ලෙලි, පිදුරු සහ කඩදාසි යන අපද්‍රව්‍ය භාවිතා කර ඉවත් කළ පසු ඒවා නැවත භාවිතා කළ හැකි ආකාරය සම්බන්ධයෙන් ද ස්ත්‍රී ප්‍රජාව ඉහළ සංජානන මට්ටමක් පවතී. පුරුෂ ප්‍රජාවට සාපේක්ෂව එම වෙනස 15% කි. එහිදී පොල්කටු නැවත භාවිතා කිරිම හැර අනෙක් සියලුම ද්‍රව්‍ය නැවත භාවිතා කළ හැකි ආකාරය සම්බන්ධයෙන් පුරුෂ ප්‍රජාව ඉතා අවම සංජානන මට්ටම් දරන බව හඳුනාගන්නා ලදී. මෙය සැළකිය යුතු විෂමතාවයකි.

ලංකාව තුළ ඉදිරි වසර සඳහා භාවිතා කළ හැකි බලශක්ති ප්‍රභව පිළිබඳ සිදුකළ අධ්‍යයනයේ දී ද සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවට තරමක වැඩි සංජානන මට්ටමක් පවතින බව හඳුනාගත හැකිය. නමුත් එම වෙනස 2% පමණ වේ. ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයෙන්ම වැඩි කොටසක් ප්‍රකාශ කර ඇත්තේ සූර්යයාලෝකය විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස භාවිතා කළ හැකි බවය. දෙවනුවට සුළඟ සහ සාගර රළ භාවිතා කළ හැකි බව දක්වන ලදී. සමස්තයක් ලෙස ගත් කල සියලුම ප්‍රජා කාණ්ඩයන්ගෙන් 70% ඉක්මවූ පිරිසකට විකල්ප බලශක්ති ප්‍රභව සමබන්ධයෙන් ඉහල සංජානන මට්ටමක් පවතින බව හඳුනාගන්නා ලදී.

ආහාර පිසීමේ දී භාවිතා කරන ඉන්ධන ප්‍රභවයන්ගෙන් ස්ත්‍රී සහ පුරුෂ දෙවර්ගයම වැඩි වශයෙන් ගෑස් සහ විදුලිය භාවිතා කරයි. එයිනුත්

වැඩි පිරිසක් ගෑස් භාවිතා කරනු ලබයි. මේ සම්බන්ධයෙන් ද දෙපාර්ෂවයම තරා කිරීම් අනුව මධ්‍යස්ථ සංජානන මට්ටමක් නියෝජනය කළ ද මධ්‍යස්ථ සංජානන මට්ටමක් සහිත පුරුෂ ප්‍රජාව සාපේක්ෂව අඩුය. ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් 70% ඉක්මවූ ප්‍රමාණයක් ආහාර පිසීමේ දී දර භාවිතා කරයි.

එනම් ස්වභාවික සම්පත් භාවිතයේ පවත්නා විෂමතාවය පරීක්ෂා කිරීම සඳහා ප්‍රතිචාර දක්වන්නන්හට ඉදිරිපත් කළ සියලුම ප්‍රශ්නවල දී පාහේ ස්ත්‍රී ප්‍රජාවේ සංජානන මට්ටම පුරුෂ ප්‍රජාවට සාපේක්ෂව ඉදිරියෙන් පවත්නා බවට ඉහත දත්තවලට අනුව පැහැදිලි වේ. එහිදී සුවිශේෂී විෂමතාවයන් හඳුනාගත හැකි අංශ ලෙස කඩදාසි, පිදුරු, පොල් ලෙලි, පොල් කටු යන ස්භාවික අපද්‍රව්‍යය භාවිතා කර අවසානයේ ඒවා නැවත භාවිතා කළ හැකි ආකාරය ගැන සිතන්නේ ද යන ගැටලුව හඳුනාගත හැකිය.


අධ්‍යයන ප්‍රදේශයේ ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජාව පාරිසරික ව්‍යාපාර කෙරෙහි දක්වන දායකත්වයේ විෂමතාවය අධ්‍යයනය

පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා දක්වා ඇති දායකත්වය අනුව වැඩිම පිරිසක් රුක් රෝපණ වැඩසටහන්වලට සහභාගී වී ඇත. දෙවනුව වැඩිම පිරිසක් සහභාගී වී ඇත්තේ අපවිත්‍ර ජලාශ පිරිසිදු කිරීමේ වැඩසටහන් සඳහා ය. සමස්තයක් ලෙස ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයේම පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා දක්වා ඇති දායකත්වය මධ්‍යස්ථ මට්ටමක පවතී. මෙයිනුත් සාපේක්ෂව පුරුෂ ප්‍රජාවේ ප්‍රමාණාත්මක දායකත්වය අඩුය. එම වෙනස 8% පමණ වේ.

පාරිසරික ප්‍රතිපත්ති පිළිබඳ දැනුම්වත්භාව සැළකූ විට සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාව මධ්‍යස්ථ සංජානන මට්ටමක් පවතින අතර

පුරුෂයන්ට ද මධ්‍යස්ථ සංජානන මට්ටමක් පැවතිය ද එම ප්‍රමාණය ස්ත්‍රීන්ට වඩා 60% න් අඩු මට්ටමකි.

ප්‍රස්තාර අංක 22 : ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් පවත්නා පාරිසරික ව්‍යාපාර කෙරෙහි දක්වන දායකත්වයේ විෂමතා පිළිබද අධ්‍යයනය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත සමීක්ෂක විසින් සකස් කරන ලදී, 2023

පාරිසරික සම්මුති සම්බන්ධයෙන් ද මෙවැනිම තත්වයක් පවතී. එනම් ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජාව පාරිසරික සම්මුති සම්බන්ධයෙන් මධ්‍යස්ථ සංජානන මට්ටමක් පැවතිය ද ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයන්ගේ දැනුම්වත් ප්‍රමාණය අඩුය. එම වෙනස 90% පමණ වේ.

සංවර්ධන ව්‍යාපෘතිවල දී ලබා දෙන පාරිසරික කාර්යය සාධන වාර්තාව හරහා පරිසරය වැඩි දියුණු වේ යන ප්‍රකාශයේ දී ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජා ද්විත්වයටම මධ්‍යස්ථ සංජානන මට්ටමක් පවතී. එනම් සංවර්ධන

ව්‍යාපෘතිවල දී ලබා දෙන පාරිසරික කාර්යය සාධන වර්තාව හරහා පරිසරය වැඩි දියුණු වේ යන ප්‍රකාශය සම්බන්ධයෙන් සමස්ත ප්‍රජාවෙන් බහුතරය මධ්‍යස්ථ මතයක් නියෝජනය කරනු ලබයි.

ප්‍රස්තාරයට සහ දත්ත වගුවලට අනුව සෑම අංශයකදී ම ස්ත්‍රී ප්‍රජාවේ සංජානන මට්ටම ඉහළින් පවතින බව හඳුනාගත හැකිවිය. රුක් රෝපණ වැඩසටහන්වලට සහභාගී වීම, ජාතික පරිසර පනත, වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත යන පනත් පිළිබඳව ඇති දැනුවත් බව සහ සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික ඇගයිම් වාර්තාව හරහා පරිසරය වැඩි දියුණු කිරීමට දායකත්වයක් සපයයි යන ප්‍රකාශ සමඟ පමණක් පුරුෂ ප්‍රජාව ස්ත්‍රී ප්‍රාජාවේ සංජානන මට්ටමට සමාන වේ. එහිදී තරා කිරීම් අනුව දෙපාර්ශවයම සැළකිය යුතු සංජානන මට්ටමක් නියෝජනය කරයි. නමුත් බොහෝ අවස්ථාවල දී දෙපාර්ශවයේම සංජානන මට්ටම් සමාන වුව ද සමස්තයක් ලෙස ප්‍රමාණාත්මකව ස්ත්‍රී ප්‍රජාවෙන් බහුතරයකගේ ඉහළ සංජානන මට්ටමක් පවතින බව හඳුනාගත හැකිවේ. මෙහි දී හඳුනාගත හැකි වූ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම පාරිසරික ව්‍යාපාර සඳහා දායකත්වය එතරම් සතුටුදායක මට්ටමක නොමැති බවයි.

මෙයින් සනාථ වන්නේ පාරිසරික ව්‍යාපාර සම්බන්ධයෙන් වඩා වැඩි සංජානන මට්ටමක් ස්ත්‍රීන් සතුවන බවයි.

Martins, W. Sevarino, H. De Silva, B., & De Andrade, D. et al. (2022). Student’s Perception of Urban and Rural Environmental Protection Areas in Pernambuco Brazil. Tropical Conservation Science. පර්යේෂණයේ සනාථ වී ඇති කරුණුවලට අනුව නාගරික සිසුන්ගෙන් බහුතරයක් (57.7%) වනාන්තරවලින්

ප්‍රයෝජනයක් නොමැති බවටත් විවේක කාලය ගත කිරීම සඳහා වනාන්තර භාවිත කරන බවත් දක්වා ඇත. තවද පරිසරයට අපද්‍රව්‍ය බැහැර නොකිරීම සහ පිරිසිදු කිරීම කළ යුතු බවට ග්‍රාමීය සිසුන්ට සාපේක්ෂව නාගරික සිසුන් 7 ගුණයක් වැඩි ප්‍රමාණයක් පිළිගෙන ඇත. ග්‍රාමීය සිසුන්ට නිතර දර අවශ්‍ය වන බවත් නාගරික සිසුන්ට කසළ විශාල ගැටලුවක් වී ඇති බවටත් හඳුනාගෙන ඇත. සමස්තයක් ලෙස සිසුන්ගේ පාරිසරික සංජානනය ධනාත්මක මට්ටමක පවතින බවත් ඒ තුළ යම් යම් විෂමතා පවතින බවටත් හඳුනාගෙන ඇත. මෙයට සමගාමීව ශ්‍රී ලංකාව ඇසුරෙන් සිදු කරන ලද මෙම පර්යේෂණය හරහා පරිසර දූෂණය, විකල්ප බලශක්ති භාවිතය, ස්භාවික සම්පත්වලට පවත්නා තර්ජනාත්මක බව, දේශගුණික විපර්යාස ආදීය පිළිබඳව වඩා වැඩි දැනුම්වත්භාවයක් සහ සංජානනයක් ග්‍රාමීය ප්‍රජාවට ඇති බව හඳුනාගන්නා ලදී. නමුත් දේශගුණික විපර්යාස මගින් ඇති වන ගැටලු පිළිබඳ වැඩි දැනුම්වත්භාවයක් නාගරික ප්‍රජාව ඇසුරෙන් හඳුනාගත හැකිය. එයින් සනාථ වන්නේ ශ්‍රී ලංකාව තුළ බහුතරයක් ප්‍රදේශයන්ගේ නාගරික ප්‍රජාවට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවේ පාරිසරික සංජානන මට්ටමෙහි ධනාත්මක බවක් හඳුනාගත හැකි බවයි. බ්‍රසීලය ආශ්‍රයෙන් සිදු කරන ලද පර්යේෂණයට අනුව ග්‍රාමීය ප්‍රජාවෙන් බහුතරයකට ඉන්ධනයක් ලෙස දර අවශ්‍ය බව හඳුනාගෙන තිබුණ ද ශ්‍රී ලාංකික පසුබිම තුළ ග්‍රාමීය සහ නාගරික යන ප්‍රජා කාණ්ඩ ද්විත්වයෙන්ම 50% ඉක්මවූ පිරිසක් ඉන්ධනයක් ලෙස දර භාවිතා කරන බව හඳුනාගත හැකිවීම සුවිශේෂී සහ අන් පර්යේෂණයන්ගෙන් වෙනස් වන කරුණකි.

Heciak, M.W. Suchocka, M., & Jonczy, J. K. (2020). Urban – Rural defferences in perception of trees described by bringing up children in Warsaw & Jedlinsk Poland. PMC PubMed Central. පර්යේෂණයෙන් සනාථ වී ඇත්තේ නාගරික ප්‍රජාවෙන් 75% ජීවත් වීමට,

වැඩ කිරීමට, විවේකය ගත කිරීමට පරිසරය අවශ්‍යය වන බවට අදහස් දක්වා ඇත. සමස්තයක් ලෙස ගත් කල සනාථ වී ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශවලටත් නාගරීකරණය ව්‍යාප්ත වී ඇති බවත් මේ හේතුවෙන් නාගරික සහ ග්‍රාමීය ප්‍රජාව අතර පාරිසරික වශයෙන් සංජානන වෙනස්කම් අඩු වෙමින් පවතින බවත් වේ. මෙම අධ්‍යයනයට අනුව ග්‍රාමීය ප්‍රදේශවලට ද නාගරික ලක්ෂණ ගමන් කර පැවතීම නිසා ග්‍රාමීය සහ නාගරික වශයෙන් විශාල වෙනස්කම් හඳුනාගත නොහැකි විය. එනම් ග්‍රාමීය සහ නාගරික වෙනස්කම් කැපී පෙනෙන අවස්ථාවක පුද්ගල පාරිසරික සංජානනයේ වෙනසක් පැවතීමත්, ග්‍රාමීය සහ නාගරික වශයෙන් කැපී පෙනෙන වෙනස්කම් අවම අවස්ථාවන්වල දී පුද්ගල පාරිසරික සංජානනයේ විශමතා අවම වීමෙන් ද සනාථ වන්නේ පුද්ගල සංජානනය කෙරෙහි භූමි ප්‍රදේශයේ ස්භාවය සෘජුවම බලපාන බවයි. ශ්‍රී ලාංකික මට්ටමින් සිදු කරන ලද මෙම පර්යේෂණය හරහා ද එම මූලික කරුණු මනාවට සාධනය විය. මින් උපකල්පනය කළ හැක්කේ යථා කාලයේ දී ලංකාව තුළ ද ග්‍රාමීය ලක්ෂණ හීන වූ කාලයක දී පුද්ගල පාරිසරික සංජානනයේ පවත්නා මෙම වෙනස ද කැපී පෙනෙන මට්ටමක නො පවතිණු ඇති බවයි.

ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් පාරිසරික සංජානන විශමතා පිළිබඳව සාකාච්ඡා කර ඇති Nishad, S., & Dr. Tripathi, H. G. R (2019). A Study of environmental perception among rural & urban females in India. International Journal of Multidisciplinary Reseaech Development. පර්යේෂණයට අනුව හඳුනාගෙන ඇත්තේ ග්‍රාමීය කාන්තාවන්ට සාපේක්ෂව නාගරික කාන්තාවන්ගේ පාරිසරික සංජානනය ඉහල මට්ටමක පවතින බවයි. මීට හේතු ලෙස ඔවුන් දක්වා ඇත්තේ නාගරික කාන්තාවන් දිනපතා පුවත්පත් කියවීම සහ ප්‍රවෘත්ති නැරඹීම නිසා ඔවුන්ට පාරිසරික ගැටලු පිළිබඳ ඉහල අවබෝධයක්

පැවතීමත් බවයි. Gokmen, A. (2021). The effect of gender on environmental attitude in Turkey. Gazi UNIVERSITY Faculty of Education. Journal of Pedagogical Research. පර්යේෂණයට අනුව පුරුෂ ප්‍රජාවට වඩා කාන්තාවන්ගේ පාරිසරික ආකල්ප ධනාත්මක මට්ටමක පවතින බවට සනාථ වී ඇත. ඔවුන් තවදුරටත් දක්වන්නේ මෙය කාන්තාවන්ගේ පාරිසරික අධ්‍යාපන මට්ටම හා සමපාතික වන බවයි. මෙම අධ්‍යයනයන් හා සැසඳීමේ දී මෙම පර්යේෂණ තුළින් ද සාකච්ඡාවට බඳුන් කළ පරිසර දූෂණය, ස්භාවික සම්පත් භාවිතය, පාරිසරික ව්‍යාපාර කෙරෙහි දක්වන දායකත්වය යන සාධක සම්බන්ධයෙන් ද පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවේ සංජානනය ධනාත්මක මට්ටමක පවතින බව හඳුනාගන්නා ලදී. පාරිසරික ස්ත්‍රීවාදී සංකල්පය තුළින් ද මතු කරන්නේ පුරුෂයා සංස්කෘතිය කෙරෙහි ද කාන්තාව සොබාදහම කෙරෙහි ද අවධානය යොමු කරන බවයි. මෙම සංකල්පය ශ්‍රී ලාංකික සන්දර්භයට ද උචිත බවට මෙම පර්යේෂණය හරහා සනාථ වී ඇත.

**නිගමන**

**ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවේ පාරිසරික සංජානන විෂමතා තුළින් එළඹිය හැකි නිගමන**

- නාගරික ප්‍රජාවට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවේ දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් ඇති දැනුම්වත්භාවය අඩුය.
- පාසල් විෂය මාලාව හරහා ලබා දෙන පාරිසරික අධ්‍යාපනය සම්බන්ධයෙන් නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවෙන් 50% වත් තෘප්තිමත්භාවයක් නොමැත.
- දේශගුණික විපර්යාස සමබන්ධයෙන් ඇතිවන ගැටලු පිළිබඳව මූලික අදහසක් ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවට පැවතිය ද ඒ පිළිබඳව වඩා ඉහළ සංජානනයක් ඇත්තේ සාපේක්ෂව නාගරික ප්‍රජාවට වේ.

- පරිසර දූෂණය සිදුවන අංශ සම්බන්ධයෙන් වඩා වැඩි දැනුම්වත්භාවයක් ඇත්තේ ග්‍රාමීය ප්‍රජාවට වන අතර සාපේක්ෂව නාගරික ප්‍රජාවේ දැනුම්වත් බව අඩුය.
- ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් වැඩි පිරිසක් මාසිකව ජනනය කරන අපද්‍රව්‍ය වර්ගය ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය වේ. මෙයින් ද නාගරික ප්‍රජාව විශාල වශයෙන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය නිකුත් කරයි. එම ප්‍රමාණය එක් ගෘහ ඒකකයකින් කිලෝ 1 ට අඩු ප්‍රමාණයක් වුවද වැඩිම පිරිසක් මාසිකව ජනනය කරන අපද්‍රව්‍ය වේ.
- විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳව සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවෙන් වැඩි පිරිසකට හොඳ දැනුම්වත්භාවයක් ඇත. එය ග්‍රාමීය ප්‍රජාවෙන් 80% වඩා වැඩි ප්‍රමාණයකි.
- දෛනිකව පුරුද්දක් ලෙස කාමරයෙන් පිටවන විට විදුලි බුබුළු, ජල කරාම ආදිය ග්‍රාමීය නාගරික යන දෙවර්ගයෙන්ම 98% පමණම වසා දැමීම සිදු කරයි. මෙය නව ප්‍රවණතාවයකි.
- ස්වභාවික සම්පත්වලට හානිකර ක්‍රියාකාරකම්වල වැඩි වශයෙන් නිරත වන්නේ ග්‍රාමීය ප්‍රජාව වන අතර එම ස්භාවික සම්පත්වලට පවත්නා තර්ජනාත්මක බව පිළිබඳව ද වඩා වැඩි දැනුම්වත්භාවයක් ඇත්තේ සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවට වේ.
- නාගරික ප්‍රජාවෙන් 50% වඩා වැඩි පිරිසක් ආහාර පිසීම සඳහා ඉන්ධනයක් ලෙස දර භාවිතා කිරීම නව ප්‍රවණතාවයකි. ග්‍රාමීය ප්‍රජාවෙන් ද වැඩි කොටසක් ආහාර පිසීමට දර ද නාගරික ප්‍රජාවෙන් වැඩි කොටසක් ගෑස් ද භාවිතා කරනු ලබයි.
- පාරිසරික සංකල්පයන් පිළිබඳව ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් 60% ඉක්මවූ පිරිසකට දැනුම්වත්භාවයක් ඇත. නමුත් තමා ජීවත් වන ප්‍රදේශයේ හරිත පරිසරයක් ඇති කිරීම සඳහා පුද්ගලිකව මුල පුරා ඇති ප්‍රමාණය අදාළ පිරිසෙන් 50% වත් නොමැත.
- ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවෙන් 98% ම පාරිසරික කණ්ඩායම් සහ ව්‍යාපාරවල සාමාජිකත්වයක් ලබා නොමැත.

**ස්ත්‍රී සහ පුරුෂ ප්‍රජාවේ පාරිසරික සංජානන විෂමතා තුළින් එළඹිය හැකි නිගමන**

- පරිසර දූෂණය සිදුවන ක්‍රියාකාරකම් සමබන්ධයෙන් පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවෙන් වැඩි පිරිසකට දැනුම්වත්භාවයක් ඇත. මෙය 2% පමණ වෙනසකි.
- ස්භාවික සම්පත් භාවිතයේ දී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවෙන් වැඩි පිරිසකට දැනුම්වත්භාවයක් ඇත. මෙය 7% පමණ වෙනසකි.
- පාරිසරික ව්‍යාපාරවලට දක්වන දායකත්වය අනුව ද සමස්තයක් ලෙස පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී ප්‍රජාවෙන් වැඩි පිරිසකට දැනුම්වත්භාවයක් ඇති නමුත් දෙපාර්ෂවයේම දායකත්වය එතරම් සතුටුදායක මට්ටමක නොමැත.

**ආශ්‍රිත මූලාශ්‍ර**


අබේපාල, ආර්. (2021). අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම. කොට්ටාව: සාර ප්‍රකාශන.

ගුණතිලක, ආර්. එන්. (2016). පර්යේෂණ විධික්‍රම (දෙවන මුද්‍රණය). කර්තෘ ප්‍රකාශනයකි.

නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2021). සම්පත් පැතිකඩ. 2021 නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2021). සම්පත් පැතිකඩ. 2021 නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

ද සිල්වා, අයි. (2016). ජනගහන අධ්‍යයනය ශ්‍රී ලංකාව ඇසුරින් (දෙවන මුද්‍රණය). නුගේගොඩ: දීපානි ප්‍රකාශන.

දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය. (2021). අනුරාධපුර දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත. අනුරාධපුර දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය.

ධනපාල, ඒ. එච්. (2017). අසිරිමත් මිහිතලය (දෙවන මුද්‍රණය). නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

මහීස්, එම්. (2020). පාරිසරික දේශපාලනය (ප්‍රථම මුද්‍රණය). බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

සිරිසේන, ඩබ්. එම්. (2016). පාරිසරික සමාජ විද්‍යාව (දෙවන මුද්‍රණය). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Defra Rural Statistics. (2017). The 2007 Rural & Urban Classification for Output Areas in England. Government Statistical Service. Retrieved May 10, 2023, from

rural.statistics@defra.gsi.gov.uk

Delgado, J. (2021). Enviromental Perception in Colombia's P'aramo Protected Areas. Tropical Conservation Science. Retrieved June 28, 2022, from

https://digitalcommons.lsu.edu/gradschool_theses/5381/?utm_source=digitalcommons.lsu.edu%2Fgradschool_theses%2F5381&utm_medium=PDF&utm_campaign=PDFCoverPages

Llisa, M., & Cook, D. (December 2008). A Multi Country Examination of the Relationship Between Environmental Knowledge and Attitudes. International Research in Geographical & Environmental Education. Retrieved February 13, 2023, from https://www.tandfonline.com/doi/abs/10.2167/irgee/184.0

Uduporuwa, R. J. M. (June, 2015). Rural Urban Linkages & Theoretical Underpinnings of Regional Development. Sri Lanka Journal of Social Sciences. Retrieved December 22, 2022, from https://sljss.sljol.info/articles/abstract/10.4038/sljss.v38i1.7382/

Martins., Sevarino, H. & De Silva, B. et al. (September 2015). Student's Perception of Urban and Rural Environmental Protection Areas in Pernambuco Brazil. SAGE Publishing. Retrieved June 15, 2022, from https://journals.sagepub.com/doi/full/10.1177/194008291500800316

Fang, S. C. (April 2019). Environmental Perception of Climate Perceived by University Students on Vegetarian Behavioral Intention. Journal of Baltic Science Education. Retrieved May 11, 2023, from http://www.scientiasocialis.lt/jbse/?q=node/750

Nahar, N., Hossain, Z. & Mahiuddin, S. (May 2022). Assessment of the Environment Perception Attitudes and Awareness of City Dwellers Regarding Sustainable Urban Environmental Management. Environment Development & Sustainability. Retrieved February 18, 2023, from https://link.springer.com/article/10.1007/s10668-022-02354-y

# ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදය වී වගාකරුවන්ට ඇතිකරන ලද සමාජ, ආර්ථික බලපෑම

එන්. පී. පෙරේරා සහ පී. කොඩිතුවක්කු

## හැදින්වීම

### ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය

1970 දශකයේ අඩු ආදායම්ලාභී ජාතියක් සඳහා වන සංවර්ධන සාර්ථකත්වයට ප්‍රශංසාවට ලක් වූ ශ්‍රී ලංකාව 2019 සිට අද දක්වා මූල්‍ය හා ආර්ථික ව්‍යසනයක ගිලී ඇත. ආර්ථිකයේ ව්‍යුහාත්මක ඌනතා දීර්ඝ කාලයක් තිස්සේ පැවතුන ද, ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ආරම්භ වූයේ 2019 වසරේ දීය. එය 1948 නිදහසින් පසු ශ්‍රී ලංකාව අත්පත් කරගත් දරුණුතම ආර්ථික ව්‍යසනය වේ. 2013 සිට 2019 දක්වා බොහෝ දුරට පැවති ස්ථාවර වර්ධන වේගය බිඳ වැටී වර්තමානයේ පවතින ආර්ථික බිඳ වැටීමට හේතු වී තිබෙන්නේ මුදල් උත්පාදනය,බදු කප්පාදුව , ජීවවිද්‍යාත්මක හෝ කාබනික ගොවිතැනට මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ඇතුළු වැරදි කළමනාකාරීත්ව ආර්ථික ක්‍රියාමාර්ග හා 2019 පාස්කු බෝම්බ ප්‍රහාරය (covid-19) වසංගතය හා යුක්රේන රුසියා ගැටුම ඇතුළු බාහිර සාධක වේ.

පවතින අර්බුදය වාර්තාගත මට්ටමේ උද්ධමනය, විදේශ සංචිත ක්ෂය වීම, වේගයෙන් අවප්‍රමාණය වන මුදල්, ආනයන සඳහා ගෙවීමට නොහැකි වීම සහ මහ බැංකුව විසින් පොලී අනුපාත වැඩි කිරීම ඇතුළත් වේ. 2022 මැයි මාසයේදී ශ්‍රී ලංකාව සිය ඉතිහාසයේ ප්‍රථම වතාවට ණය පැහැර හැරියේය. පාරිභෝගික මිල උද්ධමනය 50% ඉක්මවා ගිය අතර ආහාර, ඖෂධ සහ ඉන්ධන වැනි මූලික භාණ්ඩවල දැඩි හිඟයක් පවතී.රටේ ඉහළ යන විදේශ ණය, (COVID-19) සහන ක්‍රියාමාර්ග

ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ වියදම් ඉහළ යාමත් සමඟ දේශීය ආර්ථිකය ව්‍යුහාත්මකව තවදුරටත් දුර්වල කර ඇත. රටේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2010 දී සියයට 8.01 සිට 2020 දී 3.56 දක්වා - 3.56 දක්වා පහත වැටී ඇත.

2019 අග භාගයේදී සහ 2020 මුලදී වසංගතයට පෙර, මැතිවරණ පොරොන්දුවක් ඉටු කිරීම සඳහා රජය ගැඹුරු බදු කප්පාදුවක් ක්‍රියාත්මක කළේය. මෙය 2020 සහ 2022 අතර දළ වශයෙන් බදු ගෙවන්නන් මිලියනයක් අහිමි වීමට හේතු විය. දැනටමත් පැතිරුණු බදු පැහැර හැරීම්වලින් පීඩා විඳි ආර්ථිකයකට දැවැන්ත අභියෝගයකි. මෙම බදු අඩු කිරීම් වලට පෙර, ශ්‍රී ලංකාව දැනටමත් කලාපයේ අඩුම බදු ආදායම්-ද.දේ.නි. මෙම කප්පාදුව මහා භාණ්ඩාගාරය මත තවත් බරක් ඇති කළේය. 2019 සහ 2020 හි සැලසුම් නොකළ බදු කප්පාදුවෙන් පසු 2021 දී අනුපාතය සියයට 7.7ක් දක්වා පහත වැටුණි.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වශයෙන් ආර්ථික මට්ටම අතින් තවමත් සංවර්ධනය වන රටක් වශයෙන් හඳුනාගත හැකිය. කෘෂිකර්මාන්තය මූලික කරගත් ශ්‍රී ලංකාව තුළ වී වගාව ප්‍රධාන ආර්ථික බෝගයක් වන අතර එය ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික හා සමාජ ක්‍රමය කෙරෙහි බලපෑනු ලබයි. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ වී වගාව කෙරෙහි සිදුවන විචලනයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වන අතර ග්‍රාමීය ප්‍රදේශවල බහුතර ගොවීන් විසින් වගා කරන ප්‍රධාන බෝගය සහල් වන අතර එය ශ්‍රී ලංකාවේ මිලියන 20 ක පමණ වැසියන්ගේ ප්‍රධාන ආහාරය වේ (Karunanayake & Aponsu, 2019). කෘෂිකාර්මික දළ දේශීය නිෂ්පාදිතයට (GDP) බෝග අංශයේ දායකත්වයෙන් 30% ක් පමණ සහල් අංශයෙන් වේ

ශ්‍රී ලංකාවේ වී ගොවිතැන මහා වාරිමාර්ග,සුළු වාරිමාර්ග හා වර්ෂා ජලය භාවිතා කරමින් සිදුකරනු ලබයි. වාරිමාර්ග ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටියයි. මක්නිසාද යත්, වගා කළ හැකි ඉඩම්වලින් 25% ක් සහ ගොවි පවුල් මිලියන දෙකක් (ග්‍රාමීය පවුල්වලින් 65% ක්) ඔවුන්ගේ ප්රධාන ෘකියාව ලෙස කුඹුරු ගොවිතැනෙහි නිරත වන බැවිනි (Shantha, 2011). අධික ජල අවශ්‍යතා සහිත වී වගාව රටේ ආහාර නිෂ්පාදනය සඳහා වෙන් කර ඇති මුළු ජලයෙන් සියයට 70කට වඩා පරිභෝජනය කරයි (Henegedara, 2002).ලංකාවේ වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රධාන, මධ්‍යම සහ කුඩා යෝජනා ක්‍රමවලට බෙදා ඇත්තේ භූමි ප්‍රමාණය හෝ අණදෙන ප්‍රදේශ පදනම් කරගෙනය (Thiruchelvan, 2009). ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්රම හෙක්ටයාර් 1,000 ට වැඩි විධාන ප්‍රදේශයක් ඇති ඒවා ලෙස අර්ථ දක්වා ඇති අතර, හෙක්ටයාර 80 ත් 1,000 ත් අතර පද්ධති මධ්‍යම වාරි යෝජනා ක්‍රමය ලෙස සැලකේ. සුළු වාරිමාර්ග යෝජනා ක්රම යනු හෙක්ටයාර 80ක් හෝ ඊට අඩු ප්‍රදේශයක් සහිත ඒවාය. ප්‍රධාන වාරි භෝග වන වී වගාව හෙක්ටයාර් 730,000කට ආසන්න භූමි ප්‍රමාණයක වගා කෙරෙන අතර, මෙයින් හෙක්ටයාර් 389,000ක් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේද, මෙම සමස්තයෙන් හෙක්ටයාර් 170,000ක් මධ්‍යම හා සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේද වගා කෙරේ (IWMI, 2005). ඉතිරි හෙක්ටයාර් 171,000, එනම් වාරි ජලය නොලැබෙන කුඹුරු ඉඩම් කුඩා පරිමාණ වී ගොවීන් විසින් වර්ෂා පෝෂිත වගාව යටතේ වපුරනු ලැබේ.

## ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය වී ගොවිතැනට බලපා ඇති ආකාරය

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වන අතර එහි භූමියෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරයි. එය රුපියල් මිලියන 237411ක දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වයක් සපයන අතර එය

රැකියාවලින් 37%ක් නිර්මාණය කර තිබේ (Razmy & Ahmed, 2005). ශ්‍රී ලංකාවේ වී වගාව රට පුරාම ව්‍යාප්ත වූ කෘෂිකාර්මික ක්ෂේත්‍රයකි. තනි බෝගයක් ලෙස වී වගාවට වැඩි බිම් ප්‍රමාණයක් යොදවා ඇති අතර එය ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 42% කි. ශ්‍රී ලංකාවේ වැඩිම වී වගා බිම් ප්‍රමාණයක් හඳුනාගත හැක්කේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර අඩුම බිම් ප්‍රමාණයක් හඳුනාගත හැක්කේ නුවරඑළිය දිස්ත්‍රික්කයේය. වියළි කලාපයේ ගොවි ජනපදකරණය හේතුවෙන් කුඹුරු ඉඩම් සංඛ්‍යාව ඉහළ යාමෙන් වී නිෂ්පාදන හෙක්ටයාර් ප්‍රමාණය වැඩි වී තිබේ. හෙක්ටයාර් 431455 සිට හෙක්ටයාර් 990190 දක්වා වසර තිස්පහක් තුළ 130%කින් වැඩි වී තිබේ (Razmy & Ahmed, 2005).

ශ්‍රී ලංකාවේ වී වගාව වර්ෂා ජලයෙන් මෙන්ම වාරිමාර්ග ක්‍රම ඔස්සේ ජලය ලබා ගෙන සිදුකරන අතර කන්න දෙකකට අනුව වගා කරයි. වාරිමාර්ග ක්‍රම සුළු වාරි මාර්ග හා මහා වාරිමාර්ග යනුවෙන් කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. සුළු වාරිමාර්ග යටතේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 22.06%ක් වන අතර මහා වාරිමාර්ග ක්‍රම යටතේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 23.4%ක් වගා කරනු ලබයි (Razmy & Ahmed, 2005). තෙත් කලාපයේ උස් බිම් කුඹුරු බොහෝ දුරට සුළු වාරිමාර්ග ක්‍රමය යටතේ පවත්වන අතර වියළි කලාපයේ ජල අර්බුදය හේතුවෙන් මහා වාරිමාර්ග ක්‍රම යටතේ වැඩි වශයෙන් සිදු කරයි ( Yoshino & Suppiah, 1984). අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා යල කන්නය ලෙසත්, ඔක්තෝම්බර් සිට මාර්තු දක්වා මහ කන්නයත් වශයෙනි. යැපුම් කෘෂිකර්මාන්තයට අයත් වන වී වගාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන කලාප තුනක සිදුවේ. එනම් පහතරට වියළි කලාපය, පහතරට තෙත් කලාපය, කඳුරට බිම් වශයෙනි. එසේම ශ්‍රී ලංකාවේ වී වගාව තැනිතලා බිම්වල මෙන්ම හෙල්මළු ක්‍රමයට ද

සිදුකරන අතර දේශගුණය අනුව සලකා බලන කල වී වගාව සඳහා යෝග්‍යම ප්‍රදේශය වශයෙන් වියළි කලාපය හඳුනාගත හැකිය. පැළ සිටුවීම, වී වැපිරීම යන ක්‍රම ඔස්සේ ශ්‍රී ලංකාවේ වී වගාව සිදු කරයි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කුඹුරු විවිධ නම්වලින් හඳුන්වා දී තිබේ. අකරහ කුඹුරු, අගාර කුඹුරු, අගම්පඩි කුඹුරු, අග්‍රහාර, අටවරල, උතු කුඹුරු, ඔවිලාන්, කරමාරු කුඹුරු, ගම්පංගුව ආදිය ඇතුළත්ව නම් රාශියකින් හඳුන්වනු ලැබේ. වී වගාව තුළ දී යොදාගන්නා වී වර්ග ද විවිධ වෙයි. රත්දැල්, සුවදැල්, කළු හීනටි, මා වී, කුරුළුතුඩ, මඩතවාලු ඇතුළු ශ්‍රී ලංකාවටම ආවේණික වූ වී වර්ග 3500 ඉක්මවූ ප්‍රමාණයක් පැවත තිබේ. අස්වැන්න ලබා ගැනීමට ගත වන කාලය ඉහළ වීම හා අස්වැන්න අඩු වීම වැනි හේතු සාධක මත වර්තමානය වන විට මෙම පැරැණි වී වර්ග වගා කිරීමෙන් ඉවත් වී නව දෙමුහුන් වී වර්ග ඒ වෙනුවට වගා කිරීම සිදුකරයි. ශ්‍රී ලංකාවේ ගොවිතැන හා බැඳුණු සමාජ ආචාර විධි මෙන්ම ක්‍රීඩා ඇතුළු විවිධ ක්‍රියාකාරකම් හඳුනාගත හැකිය. ලංකාවේ අතීතයේ පටන් වර්තමානය වන තෙක්ම වී ගොවිතැන තුළ සමුපකාර ක්‍රමය හෙවත් අත්තම් ක්‍රමය නොනැසී පවතින බව හඳුනාගත හැකිය. මෙහිදී මුදලට සේවය සැපයීමකින් තොරව එකිනෙකා වෙනුවෙන් උදව් කිරීම සිදුවේ. ශ්‍රී ලංකාවේ වී ගොවිතැන චිත්‍ර කර්මය හා බැඳී පැවති බවට සාක්ෂි පවතී. සිංහලයා පළමුවෙන්ම සිතියම් අඳින ලද්දේ කමතේය. වංකගිරිය, නයිදරණය, අටමගල යනාදිය ඇඳීම මේ තුළ සිදුවිය. ඒවා ඇඳ දෙවියන් කන්නලව් කිරීම සිදුවිය (විමලකීර්ති හිමි, 2002). එසේම ගොවිතැන හා බැඳුණු නෘත්‍යක් ද හඳුනාගත හැකිය. ගොවිතැන් කටයුතු තාලයකට අනුව සිදුකරන ලද අතර එය සිංහල තාල ශාස්ත්‍රයට අනුග්‍රහය සපයන ලදි (විමලකීර්ති හිමි, 2002). එසේම වී ගොවිතැන හා බැඳුණු ඖෂධ භාවිතයක් ද පැවතිණි. තණහාල්, හී වැලේ ඇලුණු මඩ ආදිය බෙහෙත් සඳහා වී ගොවිතැන ආශ්‍රයෙන් යොදාගනී.

කමත හා බැඳුණු ආචාර විධි, ජන ක්‍රීඩා මෙන්ම නෘත්‍යය, සෞඛ්‍යය ආදී සෑම අංශයක් ඔස්සේ ම වී ගොවිතැන සමාජය හා බැඳී පවතී.


**ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය**

ප්‍රධාන වශයෙන් වී නිෂ්පාදනය කෙරෙහි ස්වභාවික සාධක ලෙස ගංවතුර, නියඟය වැනි අංශ බලපෑම් කරනු ලබයි ( Yoshino & Suppiah, 1984). වියළි කලාපයේ ප්‍රධාන වී නිෂ්පාදනය කරන කන්නය, මහ කන්නය වන අතර තෙත් කලාපයේ කන්න අනුව වී නිෂ්පාදනයේ වැඩි වෙනසක් හඳුනාගත නොහැක. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය පිළිබඳ තක්සේරු කිරීම මෙන්ම ප්‍රතිපත්ති සකස් කිරීම දුර්වල මට්ටමක පවතී (Razmy & Ahmed, 2005).

වී නිෂ්පාදනය තීරණය වීමට විවිධ සාධක බලපා තිබේ. වපුරන ප්‍රමාණය, අස්වනු ප්‍රමාණය සහ සාමාන්‍ය අස්වැන්න වෙනස් වීම නිසා එක් එක් වර්ෂයේ සහ කන්නයේ වී නිෂ්පාදනය උච්චාවචනය වී තිබේ (Razmy & Ahmed, 2005). වී වගාව උපනතියක් වශයෙන් මහ කන්නයේ අස්වැන්න යල කන්නයේ අස්වැන්නට වඩා 5%ක ප්‍රමාණයක් වැඩි වශයෙන් හඳුනාගත හැකිය. ඊට යල කන්නය සහ මහ කන්නය සඳහා බලපානු ලබන වර්ෂාපතන කාල සීමාවන් හේතු සාධක වේ ( Yoshino & Suppiah, 1984). වී වගාවේ නිෂ්පාදනය කෙරෙහි වර්ෂාපතනය, උෂ්ණත්වය, සූර්ය කිරණ, වාෂ්පීකරණය, සුළඟ සහ සාපේක්ෂ ආර්ද්‍රතාව වැනි අංශ බලපානු ලබයි. වර්ෂාපතනය සෘණාත්මක මට්ටමක පැවතීම මෙන්ම ඉහළ මට්ටමක පැවතීම වී නිෂ්පාදනය කෙරෙහි සෘණාත්මකව බලපානු ලබයි. මහා කන්නයේ ඇතිවන ධාරානිපාත වර්ෂාව වී නිෂ්පාදනය කෙරෙහි සෘණාත්මක ලෙස

බලපානු ලබයි. අධික වර්ෂාව හේතුවෙන් කුඹුරු යට වීමෙන් වී අස්වැන්න ලබා ගැනීමට නොහැකි මට්ටමකට පත්වේ. කොළඹ, ගාල්ල, මාතර, කළුතර ආදී තෙත් කලාපීය දිස්ත්‍රික්කවල කුඹුරුවල මේ තත්ත්වය වැඩි වශයෙන් හඳුනාගත හැකිය. වී නිෂ්පාදනය කෙරෙහි ඉහළ උෂ්ණත්වයක් අවශ්‍ය වේ. 20°c ට වැඩි හා 35° - 40° අඩු උෂ්ණත්වයක් පැවතීම අවශ්‍ය වේ (Yoshino & Suppiah, 1984). සමාජ ආර්ථික සාධක ද වී නිෂ්පාදනය කෙරෙහි බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය විවිධ වර්ෂවල විවිධ මට්ටම්වලින් විචලනය වීමක් හඳුනාගත හැකිය. එය පහත ප්‍රස්තාරය ආශ්‍රයෙන් පැහැදිලි කරගත හැකිය.

**ප්‍රස්තාරයඃ ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් දහස්)**




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, 2021

ශ්‍රී ලංකාවේ වී වගාව දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය ද විවිධ වර්ෂවල වෙනස් වෙමින් ගමන් ගන්නා ආකාරයක් හඳුනාගත හැකිය. ඒ අනුව 2014 - 2019 කාලය තුළ පවත්නා

වෙළෙඳපොළ මිල අනුව වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය පහත පරිදි හඳුනාගත හැකිය.

**වගුව: 2014 - 2019 කාලය තුළ( පවත්නා වෙළෙඳපොළ මිල අනුව) වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය**

| වර්ෂය | දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් මිලියන) |
|---|---|
| 2014 | 100931 |
| 2015 | 118098 |
| 2016 | 72811 |
| 2017 | 88565 |
| 2018 | 132726 |
| 2019 | 114420 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2021


ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකමක් වන වී වගාව මුල් කාලීනව යැපීම් බෝගයක් වශයෙන් පමණක් වගා කලද වර්තමානය වන විට එය වෙළඳ භෝගයක් බවට පත් වී දේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයයි. වී ගොවිතැන සඳහා තරුණ ප්‍රජාවගේ දායකත්වය අවම මට්ටමක පවතින අතර පාරම්පරික උරුමය මත බොහෝ පිරිසක් මෙම වී වගාව තම ජීවනෝපාය මාර්ගය බවට පත්කරගෙන තිබේ. මෙම වී නිෂ්පාදනය ග්‍රාමීය මෙන්ම ජාතික වශයෙන් ආර්ථික මට්ටම තීරණය කිරීමටත් දළ දේශීය ආදායම තීරණය කිරීමටත් බලපානු ලබයි. වී නිෂ්පාදනය වී වගාකරුවන්ගේ ආර්ථිකය, සමාජ මට්ටම තීරණය කිරීමට බලපානු ලබන බැවින් මෙම අධ්‍යයනය තුළින් ඉහත ආකාරයට පවතින ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය කෙරෙහි ආර්ථික අර්බුදය බලපාන

ආකාරයත් එය වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම කෙරෙහි බලපාන ආකාරයත් පෙන්වා දී තිබේ.

**වී වගාවට උඩවලව පළාතේ දායකත්වය**

ගොවිතැන සම්බන්ධයෙන් වෙල්ලස්ස හෙවත් කොටුසර වශයෙන් හැඳින්වූ ඌව පළාත නම් දරා ඇත (විමලකීර්ති හිමි, 2002). මෙම ප්‍රදේශයේ වැඩි පිරිසකගේ ජීවන වෘත්තිය වශයෙන් වී වගාව හඳුනාගත හැකි අතර වාරිමාර්ග ක්‍රම යටතේ මෙන්ම වර්ෂා ජලය භාවිතයෙන් ද වී වගාවේ නිරතවනු ලබයි. ඌව පළාත අතීතයේ පටන් ම වී වගාව සඳහා ඉහළ වැදගත්කමක් මෙන්ම ප්‍රසිද්ධියක් උසුලන අතර ගොවි පවුල් ලක්ෂ දෙකක් පමණ වාසය කරයි. ඌව පළාතේ ඉඩම් වලින් 8%ක්ම භාවිතා කරනු ලබන්නේ වී වගාව සඳහාය. එය අනෙක් වගාබිම් සමඟ සසඳන කල ඉහළ අගයක් ගනියි.

**ප්‍රස්තාරය: ඌව පළාතේ ඉඩම් භාවිතය**




මූලාශ්‍රය : ඌව පළාත් ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, 2021

ජාතික වී නිෂ්පාදනයෙන් 8%ක් පමණ ම නිෂ්පාදනය කරන්නේ ඌව පළාතේ වී වගාවෙන් වීම විශේෂ වේ. පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2017 වසරේ දී පමණක් ඌව පළාතේ වී වගාව මගින් සිදුකල දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 7484කි. එම වසරේ වී වගාවෙන් වූ දළ දේශීය නිෂ්පාදිතය වන රුපියල් මිලියන 88564 න් රුපියල් මිලියන 7484ක් ම නිෂ්පාදනය කර තිබෙන්නේ ඌව පළාතේ වී වගාව මගිනි (මහ බැංකු වාර්තා, 2020). 2016 දී ඌව පළාත තුල වී වගාවෙන් දළ දේශීය නිෂ්පාදිතයට රුපියල් මිලියන 5583 ක දායකත්වයක් ලබා දී තිබේ. ඌව පළාතේ වී නිෂ්පාදනය පිළිබඳ විමසා බලන කල 2014 සිට 2018 දක්වා වර්ෂවල ක්‍රමයෙන් ඉහළ පහළ බසින විචලනයක් හඳුනාගත හැකිය.

**වගුව: 2014-2018 ඌව පළාතේ වී නිෂ්පාදනය**

| වර්ෂය | වගා කළ ශුද්ධ බිම් ප්‍රමාණය (හෙක්ටයාර දහස්) | ඵලදාව (හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම්) | වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් දහස්) |
|---|---|---|---|
| 2014 | 64.8 | 4457 | 289.0 |
| 2015 | 86.5 | 4388 | 379.5 |
| 2016 | 82.4 | 4178 | 344.4 |
| 2017 | 46.2 | 4354 | 201.2 |
| 2018 | 69.4 | 4227 | 293.2 |


මූලාශ්‍රයː ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2021

ඌව පළාත තුළ හෙක්ටයාරයකට වී නිෂ්පාදනය ඉහළ මට්ටමක පවතී. ජාතික වී නිෂ්පාදනයට වාර්ෂිකව මෙට්‍රික් ටොන් ලක්ෂ දෙක ඉක්මවා ඌව පළාතේ වී නිෂ්පාදනය මගින් එක් කරනු ලබයි. මේ අනුව බලන කළ ඌව පළාතේ වී වගාව සංවර්ධනීය මට්ටමක පවතින බව පැහැදිලි කරගත හැකිය.

## පර්යේෂණ ක්‍රමවේදය

### අධ්‍යයන ප්‍රදේශය


අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගත් බඩල්කුඹුර ප්‍රාදේශීය




ලේකම් කොට්ඨාසය ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකොළහෙන් එකකි. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඌව පලාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ බටහිර දෙසට මායිම්ව පිහිටා ඇත. වර්තමානය වන විට ග්‍රාමය නිලධාරී වසම් 41 කින් සමන්විත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාලත්වය හෙක්ටයාර 25480.01 වේ. **සිතියම : බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම**

අධ්‍යයනයේ දී නියැදි ප්‍රදේශය වශයෙන් තෝරාගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටීම පහත පරිදි හඳුනාගත හැකිය.

**සිතියම: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නියැදි ප්‍රදේශයේ පිහිටීම.**




## නියැදිය තෝරාගැනීම

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 41 කින් සමන්විත වන අතර මුළු ජනගහනය 50332ක් වේ. එහි මුළු පවුල් සංඛ්‍යාව 15860 කි. නියැදි ප්‍රදේශය වන කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමෙහි ජන සංඛ්‍යාව ද ස්ත්‍රී පුරුෂ වශයෙන් කොපමණ ප්‍රමාණයක් ද යන්න වගුව ඇසුරෙන් පැහැදිලි වේ.

**වගුව: ජන සංඛ්‍යාව**

| | මුළු ජනගහනය | ස්ත්‍රී | පුරුෂ | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 50332 | 25774 | 24558 | 15860 |
| කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම | 2196 | 1164 | 1032 | 540 |

මූලාශ්‍රය: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2023


එහිදී අධ්‍යයන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 41න් ප්‍රධාන වශයෙන් වී ගොවිතැන ජීවනෝපාය මාර්ගය කරගත් කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී වගාකරුවන් සංගහනය වශයෙන් තෝරා ගන්නා ලදී. සංගහනය වන මුළු වී ගොවි පවුල් සංඛ්‍යාව 139කි. මෙමගින් නියැදිය තෝරා ගැනීම සඳහා සම්භාවිතා නියැදි ක්‍රමය යටතේ සරල අහඹු නියැදිය තෝරාගෙන ඉන් සමස්ථ ජනගහනයෙන් 25%ක නියෝජනයක් ලෙස නියැදිය සකසකර ගන්නා ලදී.

කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී ගොවි පවුල් සංඛ්‍යාව = 139

$=139 \times 25 \div 100 \quad =34.75$ ඒ අනුව සමස්ථ නියැදිය ලෙස වී ගොවි පවුල් 35ක් යොදාගන්නා ලදි.

**වගුව: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදායම් මාර්ගය අනුව පවුල් බෙදීයාම**

| ආදායම් මාර්ගය | මුළු පවුල් සංඛ්‍යාව |
|---|---|
| ගොවිතැන | 7807 |
| රාජ්‍ය අංශය | 2267 |
| පෞද්ගලික අංශය | 2077 |
| තාවකාලික රැකියා | 1735 |
| ස්වයං රැකියා | 1254 |




මූලාශ්‍රයඃ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2023

**අධ්‍යයන සොයාගැනීම් සහ සාකච්ඡාව**

**ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය වී ගොවින්ට බලපා ඇති ආකාරය සහ මුහුණ පා ඇති ගැටලු**

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදයක් නිර්මාණය වීම සමඟ කෘෂි කර්මාන්තය මුලිකකරගනිමින් සිදුවූ ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් විශාල ගැටලු රැසකට මුහුණදීමට වි ගොවියන්ට සිදුවිය. ආර්ථික අර්බුදය සමඟ කාබනික පොහොර භාවිතය සහ රාසයනික පොහොර ආනයනය නැවැත්වීම හා තහනම් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් වි ගොවිතැනට බලපාන ලද අතර පසුව පොහොර වෙළඳපොලට නිකුත් කළ ද පොහොර මිලකරන ප්‍රතිපත්තිය යටතේ එම අර්බුදය තවදුරටත් දීර්ඝ වීම සිදුවිය. එය ශ්‍රී ලංකාවේ පොහොර මූලික

කරගනිමින් සිදුවන වාණිජමය වී ගොවිතැන කෙරෙහි බලපෑම් එල්ල කරන ලදී.

## වී ගොවිතැන සිදුකරන පවුල්

අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වී ගොවිතැන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමක් වශයෙන් සිදු කරන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. මෙම බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් අතරින් ද කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම වී ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුල් වැඩි ප්‍රමාණයක් වෙසෙන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. ඒ හේතුවෙන් මෙම අධ්‍යයනය සඳහා කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම පසුබිම් කරගනු ලැබීය. ඒ අනුව මෙම කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම තුළ වී ගොවිතැනෙහි නිරත පවුල් සංඛ්‍යාව පහත පරිදිය.

**වගුව: වී ගොවිතැනෙහි නිරත වන පවුල් සංඛ්‍යාව**

| කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ මුළු පවුල් සංඛ්‍යාව | කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී ගොවිතැනෙහි නිරත පවුල් සංඛ්‍යාව | වී ගොවිතැනෙහි නිරත ප්‍රතිශතය |
|---|---|---|
| 234 | 139 | 59.4% |

මූලාශ්‍රයඃ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,2023

එහිදී නියැදිය ලෙස තෝරාගත් පවුල් (35) තුළ සාමාජිකයන් ප්‍රමාණය ද මෙම ප්‍රදේශයේ වී ගොවිතැන කෙරෙහි බලපානු ලබයි. නියැදියේ සමාජික සංඛ්‍යාව වගුවෙන් දැක්වේ.

**වගුව: පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව**

| පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1 - 2 | 3 | 8.571% |
| 3 - 4 | 26 | 74.285% |
| 5 - 6 | 5 | 14.285% |
| 6 ට වැඩි | 1 | 2.857% |
| එකතුව | 35 | 99.7% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

පවුල් සංඛ්‍යාව ද වී ගොවිතැනෙහි ක්‍රියාවලියට බලපානු ලබයි. ශ්‍රමය අවශ්‍ය වන වී ගොවිතැන සඳහා පවුලක සිටින සංඛ්‍යාව ප්‍රමුඛ වශයෙන් වැදගත් කොට සැලකිය හැකිය. මෙම ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාව විමසා බලන විට (5.2) වගුව අනුව වැඩිම පවුල් සංඛ්‍යාවක සාමාජිකයන් සංඛ්‍යාව (3-4) මට්ටමේ පවතී. එය මුළු ප්‍රමාණයෙන් (74.285%) තරම් ඉහළ ප්‍රමාණයකි. පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව 6ට වැඩි එක් පවුලක් පමණක් පවතින අතර එහි දරුවන් සංඛ්‍යාව ඉහළ වේ. එය පසු කාලීනව වී ගොවිතැනෙහි ප්‍රගමනයට හේතු විය හැකිය. වැඩිම පවුල් ප්‍රමාණයක් නියෝජනය කරන පවුලේ සාමාජිකයන් ගණන 3-4 වන විට පවුලේ දුවා දරුවන් ප්‍රමාණය උපරිම දෙකකට හෝ තුනකට සීමා වූ තත්ත්වයක් හඳුනා ගත හැකිය. එය වී ගොවිතැනෙහි ශ්‍රම සැපයීමට පවුල තුළින් වන දායකත්වය අතීතයට සාපේක්ෂව අවප්‍රමාණ වීමකි.

පවුලක සාමාජිකයන් ගණන මෙන්ම ඔවුන්ගේ වයස් ප්‍රමාණය ද මෙම ප්‍රධාන ආර්ථිකමය වී ගොවිතැන කෙරෙහි හේතුවේ. සේවය සැපයීමට හැකි පිරිස් වැඩි වශයෙන් සිටීම වී ගොවිතැනෙහි ශ්‍රමය සපයා ගැනීම හා ඒ ඔස්සේ වී ගොවිතැනෙහි කාර්යභාරය පහසු කරවා ගැනීමට හේතුවේ.

## ආර්ථික අර්බුදය තුළ වර්ධනය වූ පොහොර අර්බුදය හා වී නිෂ්පාදනය


වාණිජමය වශයෙන් සිදුකරන වී ගොවිතැනෙහි අස්වැන්න ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා රසායනික පොහොර භාවිතය ඉහළ මට්ටමක පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන මට්ටමට වර්තමානය වන විට පත්ව තිබේ. වී අස්වැන්නෙහි ප්‍රමාණය තීරණය වීමට ප්‍රධාන වශයෙන් වගාව සඳහා යොදන රසායනික පොහොර ප්‍රමාණය බලපානු ලබයි.

හරිත විප්ලවය හේතුවෙන් 1960 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ ඉහළ කෘෂි රසායනික පොහොර භාවිතයක් හඳුනාගැනීමට හැකි විය. ඒ හේතුවෙන් අතීතයේ දී හෙක්ටයාරයකට භාවිතා කරන ලද කෘෂි රසායනික පොහොර ප්‍රමාණයට වඩා ඉහල පොහොර ප්‍රමාණයක් මෙම අවධියෙන් පසුව වී වගාව සඳහා යොදා ගෙන තිබේ (විජේබණ්ඩාර, (2004). වී වගාවේදී පසේ සාරවත්භාවය ඉහල මට්ටමකට පත් කර ගැනීමටත්, එලදාව වැඩි කරගැනීමටත්, ශාක වර්ධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් පොහොර භාවිතා කරයි. දේශීය වී වගාව තුළ කාබනික පොහොර හා රසායනික පොහොර යන දෙවර්ගයම භාවිතා කරන අතර ඉන් වැඩි පරිභෝජනයක් ඇත්තේ රසායනික පොහොර වේ. නයිට්‍රජන්, පොස්ෆරස්, පොටෑසියම් ලෙස මෙම කෘෂි රසායනික පොහොර භාවිතා කරන අතර ඒ අතරිනුත් නයිට්‍රජන් අඩංගු යූරියා භාවිතය ඉහළ මට්ටමක පවතී (විජේබණ්ඩාර, (2004).

ශ්‍රී ලංකා රජය මගින් 2021 අප්‍රේල් මාසයේ සිට රසායනික පොහොර ආනයනය කිරීම තහනම් කළ අතර ඒ වෙනුවට කාබනික පොහොර ප්‍රතිපත්තියක් ඇති කිරීමට කටයුතු කරන ලදී. 2021 අප්‍රේල් 21 වන දින ගෙන එන ලද මෙම තහනම 2021 මැයි 6 වන දින මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලද ගැසට් පත්‍රයක් මගින් නීතියක් බවට පත්විය (අබේසිංහ ,2021). ඒ මත වී වගාවට ප්‍රබල තර්ජනයක් එල්ල විය. පොහොර තහනමෙන් දීර්ඝ කාලයකට පසුව වුවද පොහොර මිලකරණය යටතේ වී වගාකරුවන්ට අපේක්ෂිත පොහොර ප්‍රමාණය මිලදී ගැනීමේ ගැටලු මතුවීම හේතුවෙන් වී නිෂ්පාදනය පහළ වැටීමට එය හේතු සාධක වී තිබේ.

2021 වසර තුළ පොහොර හා අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍යවල සැපයුමෙහි අඩුවීම හේතුවෙන් 2020 වසරේ යල, මහ කාල පරිච්ඡේදවලට සාපේක්ෂව 2020 (/2021) මහ කන්නය 2021 යල කන්නයේ වී එලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4492ක් දක්වා (6.8%) කින් සහ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් (4692) දක්වා (1.6%) කින් අඩුවිය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2021). ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් මෙලෙස සෘජුවම වී නිෂ්පාදනය කෙරෙහි බලපෑම් ඇති කර තිබේ. පොහොර අර්බුදයට පෙර හා පසු වී නිෂ්පාදනයේ වෙනස ප්‍රස්තාරය මගින් හඳුනාගත හැකිය.

**ප්‍රස්තාරය: පොහොර අර්බුදය නිෂ්පාදනයට බලපෑම**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව,2021

පොහොර නිකුත් කිරීම අවම මට්ටමකට පත් වීම ප්‍රධාන වශයෙන්ම වී නිෂ්පාදනයට බලපාන බව අධ්‍යයන ප්‍රදේශය වන බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පොහොර නිකුත් කිරීමේ හා වී අස්වැන්න පිළිබඳ දත්ත හා සසඳා බලන විට හඳුනාගත හැකිය. ගොවීන්ට ප්‍රධාන වශයෙන් පොහොර සහනාධාර ලබාදීම වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට පවත්වා ගැනීමට හේතුවේ. නමුත් පොහොර අර්බුදය හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් පොහොර නිකුත් කිරීම ඊට පෙර වසරවලට සාපේක්ෂව අඩු මට්ටමකින් සිදු කරන තත්ත්වයක් හඳුනාගත හැකිය. පහත වගුව මගින් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වී වගාව සඳහා රසායනික පොහොර නිකුත් කිරීමේ ප්‍රමාණයන් හඳුනාගත හැකිය.

**වගුව: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොහොර නිකුත් කිරීම.**

| කන්නය | යූරියා (මෙ. ටොන්.) | TSP (මෙ. ටොන්.) | MOP (මෙ. ටොන්.) | එකතුව |
|---|---|---|---|---|
| 2019 යල | 55.859 | 14.60 | 16.026 | 86.485 |
| 2019/20 මහ | 95.622 | 24.58 | 27.260 | 147.462 |
| 2020 යල | 81.063 | 13.40 | 22.588 | 117.051 |
| 2020/21 මහ | 100.11 | 13.60 | 22.873 | 136.583 |
| 2021 යල | 62.98 | 7.24 | 22.418 | 92.638 |
| 2021/22 මහ | 21.9 | - | 11.412 | 33.312 |
| 2022 යල | - | - | - | - |
| 2022/23 මහ | 76.942 | - | 4.516 | 81.458 |

මූලාශ්‍රය : ගොවිජන සේවා මධ්‍යස්ථානය, 2023

මෙහිදී වී නිෂ්පාදනය පොහොර අර්බුදයත් සමග අඩු වී ඇති ආකාරය Justus von Liebig ගේ Low of the minimum (අවමකීරණයේ නීතිය) ඔස්සේ යමින් ද හඳුනාගත හැකිය. මෙම නීතියට අනුව අත්‍යවශ්‍ය ශාක පෝෂ්‍ය තත්වය ඌන නම්, අනෙකුත් පෝෂ්‍ය පදාර්ථ බහුල වුවද ශාක වර්ධනය දුර්වල වන බව දක්වයි. පොහොර මිළකරණය හා පොහොර හිගය ඇතුළු පොහොර අර්බුදය හේතුවෙන් වී වගාව සඳහා භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීමක් හඳුනාගත හැකිය. එය වී නිෂ්පාදනය දුර්වල කිරීමට හේතු වන බව මේ අනුව පැහැදිලි කරගත

හැකිය. වී අස්වැන්න කෙරෙහි හේතු වන සාධක අතරින් ප්‍රධාන සාධකයක් වන පොහොර භාවිතය සෘණාත්මක මට්ටමක පැවතීමෙන් වී නිෂ්පාදන ප්‍රමාණය සෘණාත්මක වේ. වගුව මගින් වී ගොවීන් (35) දෙනෙකු පොහොර අර්බුදයට පෙර හා පසු පොහොර භාවිතා කිරීමේ සිදු වූ වෙනස හඳුනාගත හැකිය.

**වගුව: පොහොර අර්බුදයට පෙර හා පසු පොහොර භාවිතය**

| **පොහොර ප්‍රමාණය (kg)** | **පොහොර අර්බුදයට පෙර පොහොර භාවිතය** | | **පොහොර අර්බුදයට පසු පොහොර භාවිතය** | |
|---|---|---|---|---|
| | ගොවින් ගණන | ප්‍රතිශතය | ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-50 | - | - | 15 | 42.85% |
| 50-100 | 3 | 8.57% | 16 | 45.71% |
| 100-150 | 7 | 20% | 3 | 8.57% |
| 150-200 | 7 | 20% | - | - |
| 200-250 | 5 | 14.28% | - | - |
| 250-300 | 5 | 14.28% | 1 | 2.85% |
| 300ට වැඩි | 8 | 22.85% | - | - |
| එකතුව | 35 | 99.98% | 35 | 99.98% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

පොහොර භාවිතය අඩුවීම හේතුවෙන් සිදු වූ අස්වැන්නෙහි වෙනස වගුව මගින් හඳුනාගත හැකිය.

**වගුව: පොහොර අර්බුදය ට පෙර හා පසු ගොවීන්ගේ වී අස්වැන්න (kg)**

| වී අස්වැන්න (kg) | පොහොර අර්බුදයට පෙර වී අස්වැන්න | | පොහොර අර්බුදයට පසු වී අස්වැන්න | |
|---|---|---|---|---|
| | ගොවින් ගණන | ප්‍රතිශතය | ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-3000 | 7 | 20% | 25 | 71.42% |
| 3000-6000 | 20 | 57.14% | 6 | 17.14% |
| 6000-9000 | 7 | 20% | 4 | 11.42% |
| 9000ට වැඩි | 1 | 2.85% | - | - |
| එකතුව | 35 | 99.99% | 35 | 99.98% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

ප්‍රාදේශීය වී ගොවීන් ප්‍රධාන වශයෙන් වාණිජමය වී වගාව තුළදී රසායනික පොහොර භාවිතා කරයි. ඊට සහයක යෙදවුමක් ලෙසත් අතිරේකයක් වශයෙනුත් කාබනික පොහොර සුළු ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. එහිදී විවිධ පුද්ගලයන් කාබනික අපද්‍රව්‍යාල ශාක කොටස් ආදී විවිධ දෑ කාබනික පොහොර වශයෙන් භාවිතා කිරීම සිදු කරයි. එහිදී ප්‍රධාන වශයෙන් පිදුරුල ග්ලීරසීඩියාල ගොමල කුකුල් අපද්‍රව්‍යාල කෙසෙල් බඩ හා පතුරු කාබනික පොහොර වශයෙන් සුළු පරිමාන වලින් වී වගාව සඳහා භාවිතා කරනු ලබයි (ක්ෂේත්‍ර සමීක්ෂණය 2023). පොහොර අර්බුදයට පෙර ප්‍රධාන වශයෙන් රසායනික පොහොරත්, අවශේෂ වශයෙන් කාබනික පොහොරත් භාවිතයක් සිදු කළ ද භාවිතයත්

සිදුකළද, පොහොර අර්බුදය හා පසුකාලීන රසායනික පොහොර ඕලකරනය හමුවේ ප්‍රධාන වශයෙන් කාබනික පොහොර වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීම සඳහා යොමුවිය. වගුව මගින් නියැදි ප්‍රදේශය ආශ්‍රිතව පොහොර අර්බුදයට පෙර හා පසු කාබනික පොහොර භාවිතා කිරීමේ ස්වරූපය හඳුනා ගත හැකිය.

**වගුව: පොහොර අර්බුදය ට පෙර හා පසු කාබනික පොහොර භාවිතය**

| කාබනික පොහොර ප්‍රමාණය (kg) | පොහොර අර්බුදයට පෙර කාබනික පොහොර භාවිතය | | පොහොර අර්බුදයට පසු කාබනික පොහොර භාවිතය | |
|---|---|---|---|---|
| | භාවිතා කරන ගොවින් ගණන | ප්‍රතිශතය | භාවිතා කරන ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-100 | 11 | 37.93% | 3 | 9.67% |
| 100-200 | 8 | 27.58% | 5 | 16.12% |
| 200-300 | 6 | 20.68% | 8 | 25.80% |
| 300-400 | - | - | 2 | 6.45% |
| 400-500 | 3 | 10.34% | 7 | 22.58% |
| 500ට වැඩි | 1 | 3.44% | 6 | 19.35% |
| එකතුව | 29 | 99.97% | 31 | 99.97% |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

නියැදි ප්‍රදේශයේ කාබනික පොහොර භාවිතා කරන පිරිස පොහොර අර්බුදයට පෙර පැවති තත්ත්වයට වඩා පොහොර අර්බුදයෙන් පසු වර්ධනය වීමක් හඳුනාගත හැකිය.

අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රසායනික පොහොර අර්බුදයට පිළියමක් හා ආදේශකයක් වශයෙන් කාබනික පොහොර භාවිතයට යොමුවී තිබේ. ඒ ඔස්සේ වී වගාවට, මානව සෞඛ්‍යයට සිදුවූ බලපෑම නියැදිය ආශ්‍රයෙන් හඳුනාගත හැකිය. රජය මගින් සහනාධාර ලෙස ලබාදෙන පොහොර භාවිතයේ දී මුහුණ දීමට සිදුවන විවිධ ගැටලු හඳුනා ගත හැකිය.

"ගොයම් පැළ කාලෙට යෙදීම අපහසු ය. රසායනික පොහොර තරම් සරු බවක් නෑ. කාබනික පොහොර වැඩි ප්‍රමාණයක් ඒ නිසා යෙදීමට වෙනවා." (පුරුෂ - 42)

මෙම කාබනික පොහොර, ඝන පොහොර හා දියර පොහොර වශයෙන් ලබා දීම සිදු කරයි. ඝන පොහොර ගොයම් පැළ සිටුවීමට පෙර පමණක් භාවිතා කිරීමට හැකියාව පවතී. ගොයම් පැළ සිටුවීමෙන් පසු ඝන පොහොර භාවිතා කලහොත් ගොයම් පැල යටවීම, ගොයම් පැළ මැරීම, ගොයම් පැළ බිඳ වැටීම ආදී ගැටලු ඇතිවේ. නමුත් වී වගාවට සිටුවීමට පෙර යොදන පොහොර පමණක් ප්‍රමාණවත් නොවේ. ගොයම් පැළ විවිධ අවධියේ පවතින විට එහි පෝෂණ තත්වය හා වර්ධනය නඟාසිටුවීමට අදාල කාල වකවානුවලදී පොහොර යෙදීම අත්‍යවශ්‍ය වේ. බණ්ඩි ගොයමේ සිට කිරි වැදුණු ගොයම දක්වා ඉහළ පොහොර අවශ්‍යතාවයක් පෙන්නුම් කරයි. මෙම කාබනික පොහොර රසායනික පොහොර තරම් වී වගාවේ වර්ධනයට හේතු නොවන නිසා වැඩි වශයෙන් කාබනික පොහොර යෙදීම සිදුවේ. නමුත් අත්‍යවශ්‍යතාවය තෘප්ත කිරීමට හැකි වන සේ කාබනික පොහොර ද යෙදීමට අපහසු වේ. ඊට හේතුව මෙම පොහොර භාවිතා කළ හැකි වන්නේ පැළ සිටුවීමට පෙර පමණක් වීම හේතුවෙනි. එබැවින් මෙම කාබනික පොහොර මඟින් වී ගොවිතැන වර්ධනයට ප්‍රමාණවත් තරම් පෝෂණයක් ලබා නොදීම ගැටළුවකි. ලබාගත් නියැදියට අනුව කාබනික පොහොර භාවිතා කිරීම

තුලින් වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට නගාසිටුවීමට රුකුලක් නොලැබෙන නිසා ගොවි පවුල් (35) ට අයත් කුඹුරු ඉඩම් වල වී නිෂ්පාදනය පහත වැටී තිබේ (ක්ෂේත්‍ර සමීක්ෂණය,2023). එය මෙම කාබනික පොහොර භාවිතය හා සම්බන්ධව හඳුනාගත හැකි ගැටලුවකි. මෙම රජය මගින් සහනාධාර වශයෙන් ලබාදෙන කාබනික පොහොර වී නිෂ්පාදනය කෙරෙහි තවත් ගැටලුකාරී බලපෑම් ඇතිකරනු ලබයි.

"අස්වැන්න ඉතාම පහළ මට්ටමක පවතී. ගොයම් කහ පැහැ ගැන්වෙයි. නිසි වේලාවට පොහොර නොලැබෙයි" (ස්ත්‍රී -56)

මෙම කාබනික පොහොර භාවිතා කිරීම තුළ රසායනික පොහොර භාවිතා කරන විට මෙන් වී නිෂ්පාදනය ඉහළ යාමක් හඳුනාගත නොහැකිය. මේ තුළින් අස්වැන්න අඩුවීම හඳුනාගත හැකිය. ඊට අමතරව මෙම කාබනික පොහොර භාවිතයෙන් ගොයම් කහ පැහැයට හැරීම ප්‍රධාන ගැටලුවකි. එය ගොයමේ වර්ධනයට සෘණාත්මක අයුරින් බලපානු ලබයි. එසේම වී ගොවිතැනේ දී නිසි කාල වකවානුව තුළ පොහොර යෙදීම අවශ්‍ය වේ. ගොයම් පැළ අවධියේ, බණ්ඩි ගොයම් අවධියේ, වී ඉසින අවස්ථාව ඇතුළු විවිධ කාල වකවානුවලදී නියමිත කාලයට පොහොර යෙදීම වී වගාවේ වර්ධනයට හේතු වේ. නමුත් මෙම කාබනික පොහොර සහනාධාරය නිසි කලට නොලැබීම හේතුවෙන් වී වගාවට අවශ්‍ය කාල වකවානු අනුව පොහොර යෙදීමේ ගැටළු පවතී. එය මගින් වී නිෂ්පාදනය පහත වැටීම සිදුවේ. එය ප්‍රධාන ගැටලුවකි.

එසේම මෙම පොහොර කාබනික අපද්‍රව්‍ය හා ජෛව අපද්‍රව්‍ය භාවිතා කරමින් නිපදවීම හේතුවෙන් ද එම පොහොර භාවිතා කිරීමෙන් වි වගාවට වන බලපෑම ඉහළ මට්ටමක පවතී.

"දුර්ගන්ධය හේතුවෙන් වගාවට සතුන්ගෙන් බාධා එල්ලවීම හා කුඹුරු ඉඩම ගොඩ වීම සිද්ධ වෙනවා"(පුරුෂ - 60)

මෙම කාබනික ඝන පොහොර, දියර පොහොර හා ජෛව දියර පොහොර දුගඳින් යුක්ත වීම ද ගැටලුවකි. එම පොහොර භාවිතා කළ විට එම පොහොර වලින් දැනෙන දුගඳට බල්ලන්, තලගොයන්, කබරගොයන් වැනි සතුන් වගාවට පැමිණීම සිදුවේ. එවිට වගාවේ ගොයම් පැළ පොඩි වීම ඇතුළුව වගාවට හානි සිදු වේ. එසේම මෙම කාබනික ඝන පොහොර යනු කාබනික පස් වේ. ඒවා වී ගොවිතැනට භාවිතා කිරීම තුළ කුඹුරු ඉඩම් ගොඩ වීම සිදුවේ. එය කාබනික පොහොර භාවිතය ආශ්‍රිත ගැටලුවකි.

මෙම රජය මගින් ලබාදෙන කාබනික පොහොර භාවිතය තුළ සෞඛ්‍යමය ගැටලු ද හඳුනාගත හැකිය. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේදී සත්ව වසුරු, කාබනික අපද්‍රව්‍ය ආදිය භාවිතා කිරීම නිසා එම කාබනික පොහොර භාවිත කරන්නන්ට විවිධ සෞඛ්‍යමය ගැටලු ඇතිවී තිබේ.

"එම පොහොර පාවිච්චි කිරීමේදී අත් තුවාල වෙනවා.කකුලේ නියපොතු වණවීම, දුර්ගන්ධය නිසා වමනය, ඔලුව රිදීම සිද්ධ වෙනවා" (පුරුෂ - 56)

සත්ව අපද්‍රව්‍ය හා කාබනික ද්‍රව්‍ය යොදා නිපදවන රජයේ සහනාධාර කාබනික පොහොර වල ඇතිවන දිලීර, බැක්ටීරියා ඇතුළු විෂබීජ හේතුවෙන් ඒවා අතින් ඇල්ලීමේදී අත් තුවාල වීම, එම පොහොර කුඹුරුවලට යෙදීමේදී පාදවල නියපොතු වණවීම ආදී අහිතකර සෞඛ්‍ය බලපෑම් ඇතිවේ. එසේම සත්ව අපද්‍රව්‍ය ආදිය හේතුවෙන් එම පොහොරවල පවතින දුර්ගන්දය හේතු කොටගෙන ඒවා භාවිතා කරන ගොවීන්ට වමනය, හිසේ කැක්කුම් ආදී රෝගී තත්ත්වයන් ඇතිවී තිබේ. මෙම ඝන හා දියර කාබනික පොහොර භාවිතා කිරීම තුළ ආර්ථිකමය වශයෙන් අලාභ හානි සිදු වීම, වී නිෂ්පාදනය පහළ වැටීම, වගාවට

සතුන්ගෙන් වන බලපෑම්, දුර්ගන්ධය, ගොයම කහ පැහැවීම, කුඹුරු ඉඩම් ගොඩ වීම වැනි ගැටලුත් අත්පා තුවාලවීම, වමනය, හිසේ කැක්කුම ආදී සෞඛ්‍ය ගැටලු ද ඇති වේ. මේ අයුරින් රසායනික පොහොර වෙනුවට භාවිතා කරන කාබනික පොහොර භාවිතා කිරීම තුළ තුළ විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවේ.

පොහොර සහනාධාරය පිළිබඳ වී ගොවීන් විවිධ ආකල්ප දරයි.

"පොහොර සහනාධාරය ලබාදීම වී වගාවට අවශ්‍යයි. ගොවීන්ට වැඩි මිලට පොහොර ලබාගන්න බැරි නිසා වී අස්වැන්න අඩු වී තියෙනවා. ඊට පිලියමක් විදියට පොහොර සහනාධාරය ලබා දිය යුතුයි" (පුරුෂ-62)

රසායනික පොහොර මිලකරණය හේතුවෙන් වී නිෂ්පාදනයේ යෙදෙන ආර්ථික මට්ටම අඩු වී ගොවීන්ට වගාවට අවශ්‍ය පොහොර ප්‍රමාණවත් පරිදි ලබාගැනීමට නොහැකි වේ. එයට විසඳුමක් ලෙස වී ගොවීන් පොහොර සහනාධාරය අපේක්ෂා කරන අතර ඒ තුළින් තම වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට පවත්වා පවත්වා ගැනීම අපේක්ෂා කරයි. ආර්ථික මට්ටම අඩු, වී ගොවීන්ට සහනාධාර මිල යටතේ පොහොර ලබාදීම මගින් ඔවුන්ට අවශ්‍ය අතිරේක පොහොර ප්‍රමාණය පමණක් වැඩි මිලට ලබා ගැනීමට හැකිවේ. පොහොර සහනාධාරය ලබාදීම සම්බන්ධයෙන් වී ගොවීන්ගේ යහපත් ප්‍රතිචාර මෙන්ම විවේචනද හඳුනාගත හැකිය. ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ලබාගත් තොරතුරු අනුව ඔවුන් පොහොර සහනාධාරය පිළිබඳව විවිධ අදහස් දරයි.

"වැඩසටහන හොඳයි. නමුත් ක්‍රමානුකූලව නොකෙරෙයි. මේ නිසාත් ගොයමට නිසි කලට අවශ්‍ය පොහොර ප්‍රමාණය නොලැබෙයි." (ස්ත්‍රී - (56)

පොහොර සහනාධාරය ලබා දීම සෑම ගොවියෙක්ම තම වී අස්වැන්න ඉහළ මට්ටමකට පවත්වා ගැනීමට වැදගත් වන බව හඳුනාගෙන තිබේ. නමුත් මෙම වැඩසටහන ආශ්‍රිතව දුර්වල කළමනාකාරීත්ව ගැටලු ද පවතින බව හඳුනාගෙන තිබේ. ක්‍රමානුකූලව නිසි කාලයට පොහොර ලබා නොදීමත්, පොහොර සහනාධාරය ප්‍රමාදවී ලබාදීමත් වැනි ගැටලු හේතුවෙන් ගොයමට නිසි කලට අවශ්‍ය පොහොර නොලැබීම ගැටලුවක් වශයෙන් පොහොර සහනාධාරය ආශ්‍රිතව හඳුනාගෙන තිබේ.

"පොහොර සහනාධාරය ලබා දීමෙන් හොඳට වී වගාව පවත්වා ගන්න පුළුවන් වගේම වී අස්වැන්න ඉහළ වේ. පොහොර සහනාධාරය නොමැතිවීමෙන් පොහොර භාවිතා කරන ප්‍රමාණය අඩුවීම හේතුවෙන් අස්වැන්න අඩු වේ."(පුරුෂ-53)

පොහොර සහනාධාරය ප්‍රාදේශීය වී ගොවීන්ගේ වී වගාව නගා නගාසිටුවීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව අධ්‍යයනය කරන ලද තොරතුරු අනුව පැහැදිළි වේ. පොහොර සහනාධාරය ලබාදීම හෝ නොදීම මත ගොවීන් වගාවට යෙදෙන පොහොර ප්‍රමාණය තීරණය වේ. පොහොර සහනාධාරය නොලැබී යාමෙන් වගාවට භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීම නිසා එය වී අස්වැන්න පහත හෙලීමට හේතු වී තිබේ. වී ගොවීන්ගේ අධ්‍යයන ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු අනුව වී ගොවීන් බහුතරයකගේ අදහස පොහොර සහනාධාරය ලබාදීම ප්‍රයෝජනවත් බවයි. ඇතැම් පුද්ගලයින් ඊට ප්‍රතිවිරුද්ධව අදහස් දරනු ලබයි.

"සහනාධාරය අවශ්‍ය නොමැත. පහසු මිලකට මිලදී ගැනීම සඳහා වෙළඳපොලට පොහොර ලබා දිය යුතුය."(පුරුෂ - 62)

ඇතැම් පුද්ගලයින් පොහොර සහනාධාරය ලබා ගැනීමට අපේක්ෂා නොකරන බව අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව සිදුකරන ලද සමීක්ෂණ තුළින් හඳුනා ගැනීමට හැකි විය. ඒ වෙනුවට ඔවුන් අපේක්ෂා කරන්නේ ප්‍රමාණවත් තරම් පොහොර මිලදී ගත හැකි මට්ටමකට පොහොර මිල අඩුකර වෙළඳපොළට පොහොර නිකුත් කළ යුතු බවයි. එමගින් අඩු මුදලකට තමන්ට වගාවට ප්‍රමාණවත් තරම් පොහොර ගැටලුවකින් තොරව ලබා ගැනීමට හැකි වන බව පවසයි.

"අපිට පොහොර සහනාධාර උවමනා නැහැ. ඒත් බෙහෙත් පොහොර උවමනා වෙලාවට කඩවල් වල මිල දී ගැනීමට තියනව නම් හොඳයි. පොහොර සහනාධාරය දුන්නත් ඉතා අඩු ප්‍රමාණයක් තමයි ගොවියන්ට ලබා දෙන්නේ."(පුරුෂ - 42)

අධ්‍යයනය තුළින් ඇතැම් ගොවීන් පොහොර සහනාධාරය අපේක්ෂා නොකරන බව හඳුනාගත හැකිය. පොහොර සහනාධාරය අඩු ප්‍රමාණයක් ලබාදීම නිසා පොහොර සහනාධාර අපේක්ෂා නොකරන අතර ඒ වෙනුවට වෙළෙඳපොළ ක්ෂේත්‍රය පොහොර හා ඖෂධ වලින් පූර්ණය කිරීම අපේක්ෂා කරයි.

මේ අයුරින් ගොවීන් පොහොර සහනාධාරය තම වී වගාව නගා සිටුවීමට අවශ්‍ය සම්පතක් ලෙස මෙන්ම, ප්‍රමාණවත් නොවීම නිසාම නොවැදගත් ක්‍රියාවලියක් ලෙසත් හඳුනා ගනී. ක්ෂේත්‍ර සමීක්ෂණය තුළින් පොහොර සහනාධාරය ආශ්‍රිත ගැටලු ද හඳුනාගත හැකිය. එනම් ක්‍රියාවලිය නිසි ආකාරයට සිදු නොවීම, ප්‍රමාණවත් තරම් පොහොර ප්‍රමාණයක් නොලැබීම ආදී ගැටලු පොහොර සහනාධාරය ලබාදීම ආශ්‍රිතව පවතින බව අධ්‍යයන ප්‍රදේශ ආශ්‍රිතව ගොවීන්ගේ අදහස් අනුව පෙනෙයි. මෙම පොහොර සහනාධාරය ලබාදීම පිළිබඳ ධනාත්මක

මෙන්ම සෘණාත්මක ආකල්ප ද ගොවීන් තුළ පවතින බව හඳුනාගත හැකිය.

පොහොර අර්බුදයත් සමග වී නිෂ්පාදනය අඩු වීම මෙම පිරිසගේ ආර්ථික මට්ටම පසුබෑමට ලක් වීමට හේතු වේ. පොහොර අර්බුදයත් සමග වී නිෂ්පාදනය පහළ වැටීම මෙම ආදායම් මට්ටම පහත දැමීමට හේතුවේ. පොහොර අර්බුදයෙන් පසු වී නිෂ්පාදනය පහත වැටීමත් සමඟ ආදායම් තත්ත්වයේ අඩුවීමක් ද හඳුනාගත හැකිය. වගුව මගින් ආදායම් මට්ටමේ අඩුවීම නියැදිය ආශ්‍රයෙන් හඳුනාගත හැකිය.

| අඩු වූ ආදායම් ප්‍රමාණය (රුපිල්ය) | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| 25000-50000 | 4 | 11.42% |
| 50000-100000 | 14 | 40% |
| 10000-150000 | 9 | 25.7% |
| 150000-200000 | 6 | 17.14% |
| 200000-250000 | 2 | 5.71% |
| එකතුව | 35 | 99.98% |

| වී අස්වැන්න (kg) | පොහොර අර්බුදයට පෙර වී අස්වැන්න | | පොහොර අර්බුදයට පසු වී අස්වැන්න | |
|---|---|---|---|---|
| | ගොවීන් ගණන | ප්‍රතිශතය | ගොවීන් ගණන | ප්‍රතිශතය |
| 0-3000 | 7 | 20% | 25 | 71.42% |
| 3000-6000 | 20 | 57.14% | 6 | 17.14% |
| 6000-9000 | 7 | 20% | 4 | 11.42% |
| 9000ට වැඩි | 1 | 2.85% | - | - |
| එකතුව | 35 | 99.99% | 35 | 99.98% |

මූලාශ්‍රයඃ ක්ශේත්‍ර සමීක්ෂණය, 2023

ශ්‍රී ලංකාවේ මෑත කාලීනව ඇති වූ පොහොර අර්බුදය වී ගොවිතැන වෙත සෘජු බලපෑම් එල්ල කරන ලදී.රසායනික පොහොර තහනමත්, පසුව ඇති වූ රසායනික පොහොර මිලකරණය හේතුවෙන් පොහොර භාවිතයේ දී වැයවන පිරිවැය වැඩිවීමත් හඳුනාගත හැකිය. ඒ හේතුවෙන් වී ගොවිතැන ආශ්‍රිතව සියලුම ප්‍රපංචයන්ට හිමිවූ වටිනාකම ඉහළ ස්ථලයක පැවතිණි. පොහොර අර්බුදයට පසු පොහොර මිල ඉහළ යාම නිසා වී ගොවිතැනට භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩු වීම සිදුවිය. එය වී නිෂ්පාදනය පහත වැටීමට හේතු විය (ක්ෂේත්‍ර සමීක්ෂණය,2023). ඒ හේතුවෙන් ඉතා අඩු අස්වැන්නක් වී වගාව තුලින් ලැබුණු අතර ඒ හේතුවෙන් බිත්තර වී ඇතුළු අනෙකුත් ප්‍රපංචවල ද මිල ඉහළ යන ලදී. එය වී ගොවීන්ගේ ආර්ථික තත්වය කෙරෙහි ප්‍රබලවම බලපානු ලබයි. වී ගොවිතැනේ දී පොහොර සඳහා වැයවන මිල

ඉහළයාම වී ගොවීන්ගේ ආර්ථික මට්ටම දුර්වල කිරීමට හේතු වී ඇති බව හඳුනාගත හැකිය.

වී ගොවිතැන සම්බන්ධ අනෙකුත් සියලුම ක්‍රියාකාරකම්හි වියදම් ඉහළ යාම වී වගාකරුවන්ගේ ආර්ථිකයට ඍණාත්මක බලපෑම් එල්ල කරන්නකි. අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව වී ගොවීන්ට වී වගා කිරීමට බිම් සකස් කිරීමේ සිට වී වැපිරීම, පොහොර යෙදීම, අස්වනු නෙළීම දක්වා වූ සෑම ක්‍රියාවලියකටම වැයවන පිරිවැය ඉහළ යාම නිසා පොහොර අර්බුදය සමග වී නිෂ්පාදනය අවම වීමෙන් ආර්ථිකය බිඳ වැටුණු වී වගාකරුවන්ට එම වියදම් දැරීමට නොහැකි වේ. අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත ගොවීන්ගේ ප්‍රකාශ මගින් එය තහවුරු වේ. නියැදිය වශයෙන්තෝරාගත් පවුල් තිස්පහෙහිම වී වගාකරුවන්ට පොහොර අර්බුදය සමඟ අස්වැන්න අඩුවීම නිසා වී වගා කිරීමේ සිට අස්වනු නෙළීම දක්වා වැයවන පිරිවැය ගෙවීම අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති බව හඳුනාගැනීමට හැකි විය (ක්ෂේත්‍ර සමීක්ෂණය, 2022).

"ඔව් පෝරු ගෑම, බිත්තර වී මිලදී ගැනීම, අස්වනු නෙළීම සඳහාත් දැන් වන විට පෙර මෙන් දෙගුණයක් පමණ මුදල් අවශ්‍ය වී තිබේ. දැන් වී අස්වැන්න අර්ධයකින් පමණ අඩු වී ඇති නිසා වී විකුණා එම පිරිවැය ගෙවීමට නොහැකි වී තිබේ." (පුරුෂ- 56)

මෙම ප්‍රකාශ අනුව වී වගාවේ නිෂ්පාදනය පොහොර අර්බුදය සමඟ අර්ධයකින් පමණ පහළ බැසීම නිසා වී විකුණා වී වගාව සඳහා අවශ්‍ය වන පිරිවැය ගෙවන පුද්ගලයන්ට එම මුදල් ගෙවීමේදී ගැටලු පැන නැගී ඇත. වී අස්වැන්න පහළ යාම නිසා පරිභෝජනයට අවශ්‍ය වී ප්‍රමාණය ඉතිරි කර අනෙකුත් වී ප්‍රමාණය විකුණා මෙම පිරිවැය ගෙවීම අපහසු වී ඇත. වී නිෂ්පාදනය පහළ යෑමත්, පිරිවැය වැඩි වීමත් නිසා එම පිරිවැය ගෙවීමේදී අර්බුධකාරී තත්වයන්ට පත්ව තිබේ. ඒ අයුරින්

වියදම් වැඩිවීම නිසා ඔවුන් එම වියදම් පියවීමට ණය හා උකස් තැබීම වැනි වෙනත් ක්ෂේත්‍ර වෙත යොමුවීම ඔවුන්ගේ ආර්ථික මට්ටම පහළ හෙළීමට හේතුවේ.

"අස්වැන්න අඩු වීමත්, බෙහෙත්, පොහොර, ඉන්ධන මිල වැඩි වීමත්, යන්ත්‍ර උපකරණ මිල වැඩි වීමත් සහ මිනිසුන්ගේ කුලිය වැඩිවීම ගොවියාට දරා ගැනීමට අපහසුයි." (පුරුෂ -42)

ප්‍රධාන වශයෙන්ම පොහොර අර්බුදය හේතුවෙන් වී වගාවේ අස්වැන්න අඩුවීම නිසා වී වගාව ආශ්‍රිතව සෑම කාර්යයක්ම මිල ඉහළ ගොස් තිබේ. වී නිෂ්පාදනය ප්‍රධාන ජීවන වෘත්තිය කරගත් වී වගාකරුවන්ට වී නිෂ්පාදනය පහළ යාමෙන් තම ආදායම් ප්‍රමාණය අඩුවී තිබේ. ඒ හා සමගම පොහොර මිල ඉහළ යාම නිසා පොහොර මිලදී ගැනීමට නොහැකිවීමත්, යන්ත්‍ර වලට අය කරන මිල ගෙවීමට නොහැකිවීම, ජීවන වියදම් වියදම ඉහළ යාම නිසා මිනිස් ශ්‍රමය ඉහළ යාම හේතුවෙන් වී ගොවිතැනට අවශ්‍ය එම ක්ෂේත්‍ර යොදා ගැනීමේදී ගැටලු ඇතිවේ. එය චක්‍රාකාරව වී නිෂ්පාදනය අඩු වීමට, වී ගොවීන් ණය කරුවන් වීමට, වී ගොවීන්ගේ ආර්ථික මට්ටම පහළ යාමට හේතු වේ. පොහොර අර්බුදය සමග වී අස්වැන්න අඩුවීම වී වගාවට වැයවන පිරිවැය ගෙවීමට අපහසු කරවන බව නියැදි ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රකාශ තුළින් තවදුරටත් හඳුනාගත හැකිය.

"ඔව් පෙර අස්වැන්න නෙලීමට රුපියල් (10000) ක් පමණ වැයවුවත් වර්තමානයේ එය 30000ක් බවට පත් වී තිබේ. සියලු වගා කටයුතු වල මිල ඉහළ ගොස් තිබේ. එය ගෙවීමට අපහසු වී තිබේ." (පුරුෂ - 53)

ඉහත ප්‍රකාශය අනුව පොහොර අර්බුදයට පෙර හා පසු අස්වනු නෙලීමේදී වැයවන මිල වෙනස් වී ඇති බව පැහැදිලිව හඳුනාගත හැකිය.

පොහොර අර්බුදයට පෙර වී අස්වනු නෙලීමට රුපියල් 10000ක පමණ මුදලක් වැය වුවත් පසුව පොහොර අර්බුදය සෑම අංශයකටම බලපෑම් කිරීම නිසා ආර්ථික අර්බුද පැමිණීම හේතුවෙන් පසුව අස්වනු නෙලීම සඳහා රුපියල් 30000ක පමණ මුදලක් වැය වී තිබේ. එය වී නිෂ්පාදනය පහළ වැටුණු අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ද විශාල මුදලක් වැය වන පුද්ගලයකුට ගෙවීමට අපහසු ය. වී නිෂ්පාදනය අඩුවීම නිසා ආර්ථික අර්බුදයන් සමග වී ගොවිතැන ආශ්‍රිත ව සෑම ක්‍රියාවලියකම මිල ඉහළයාම සිදු වී තිබේ. එය වී ගොවීන්ගේ ආර්ථිකයට සෘණාත්මක බලපෑම් එල්ල කරන්නකි.

"ඔව් බිත්තර වී මිලදී ගැනීමත්, රොටරි කිරීම, අස්වනු නෙලීම ආදිය පෙර සිදු කරන ලද්දේ වී අස්වැන්නෙන් යම් ප්‍රමාණයක් විකුණා ලැබෙන මුදලිනි. වර්තමානයේ වී අඩුවීම නිසා එය සිදු කිරීමට අපහසු වී තිබේ." (පුරුෂ - 47)

උක්ත ප්‍රකාශය අනුව ද පැහැදිලි වන්නේ පොහොර අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහළ තත්ත්වයකට පත්වීම හා විකුණා එම මුදලින්ම කෘෂිකාර්මික කටයුතු සිදුකරන වී වගාකරුවන්ට එම කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන පිරිවැය ගෙවීමට අපහසු වී තිබේ. මේ අයුරින් පොහොර අර්බුදයෙන් පසු කෘෂිකාර්මික කටයුතු සඳහා වන පිරිවැය ඉහළ යාම ද වී ගොවීන්ගේ ආර්ථිකය තුළ පසුගාමී තත්වයක් ඇති කිරීමට හේතුවී තිබේ.

**විධිමත් හා අවිධිමත් ණය ලබා ගැනීම**

මෑතකාලීනව ආර්ථික අර්බුදයත් සමග තම වගා කටයුතු, දෛනික කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා ගැනීමේ ගැටලුවක් වී වගාකරුවන්හට ඇති වී තිබේ. පොහොර අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහළ යාම නිසා තම දෛනික කටයුතු ඇතුළු

විවිධ කාර්යයන් සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබේ. එහිදී විධිමත් හා අවිධිමත් ප්‍රවේශ යටතේ ණය ලබාගැනීමට වී වගාකරුවන් පෙළඹී ඇත. අධ්‍යයන ප්‍රදේශයේ ද වී වගාකරුවන් මෙම පොහොර අර්බුදයත් සමග වී වගා කටයුතු, නේවාසිකව ඉදිකිරීම්, අධ්‍යාපන ඇතුළු දෛනික ජීවිතයේ කටයුතු සඳහා ණය ලබාගෙන තිබේ. වගුව මගින් නියැදිය වශයෙන් තෝරා ගත් පිරිස පොහොර අර්බුදය හමුවේ ණය ක්ෂේත්‍ර වෙත යොමු වී ඇති ප්‍රමාණය හඳුනාගත හැකිය.

**වගුව: ආර්ථික අර්බුදය හමුවේ ණය ලබා ගැනීම**

| ණය ලබාගත්තා ද? නැද්ද? යනවග | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 28 | 80% |
| නැත | 7 | 20% |
| එකතුව | 35 | 100% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

මෙම පිරිස වී නිෂ්පාදනය පහළ වැටීමත් සමග විවිධ අරමුණු හේතුවෙන් විධිමත් හා අවිධිමත් ක්‍රම යටතේ ණය ලබා ගැනීමට පෙළඹී ඇත. ඒ අතරින් ද ණය ලබා ගැනීමේදී ඇති වන දුෂ්කරතා මගහරවා ගැනීමට අවිධිමත් ණය ලබා ගැනීමට බොහෝ පිරිසක් යොමු වී තිබේ. පොහොර අර්බුදය හමුවේ ලබාගත් ණය තවදුරටත් වී නිෂ්පාදනය අවම මට්ටමක පැවතීම හේතුවෙන් ගෙවීමේ අපහසුතා ඇති වී තිබේ. එය අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රකාශ අනුව තහවුරු කරගත හැකිය.

"වගාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය වී ඇත. රත්‍රං බඩු උගස් කර ඇත. ඒවා නිදහස් කිරීමට අපහසු වී ඇත."(පුරුෂ-50)

ආර්ථික අර්බුදය සමඟ වී වගා කරුවන්ට තම වී වගාවට අවශ්‍ය පොහොර ලබා ගැනීමේ දුෂ්කරතා ඇතිවිය. පසුකාලීනව පොහොර මිලකරණය හේතුවෙන් ගොවීන්ට අවශ්‍ය පොහොර ප්‍රමාණය මිලදී ගැනීමට නොහැකි වීමෙන් භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීම හේතුවෙන් වී අස්වැන්න පහළ වැටිණි. ඒ හේතුවෙන් වගාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට වී වගාකරුවන්ට ණය ලබා ගැනීමට සිදුවී තිබේ. එහිදී ලබාගත් ණය නැවත ගෙවීමට අපහසු වීම වී නිෂ්පාදනය පහත වැටීම හමුවේ සිදු වී ඇත. ඊට අමතරව අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපුරා ගැනීම උදෙසා රත්‍රන් බඩු උකස් කිරීම නිසා වී අස්වැන්න අඩු වීමෙන් මූල්‍යමය තත්ත්වය ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඒවා නිදහස් කර ගැනීමේ ගැටලු මතුවී තිබේ. පොහොර අර්බුදය හේතුවෙන් ණය ලබා ගැනීම නිසා වී වගාකරුවන් ඒවා නැවත ගෙවීමට යාමේදී මූල්‍යමය අර්බුධකාරී තත්ත්වයට පත්ව තිබේ.

"ග්‍රාමීය සුභසාධක සමිතිය මගින් ණය ලබා ගත් අතර එහි පොලිය හා වාරික ගෙවීමට අපහසු වී තිබේ" (පුරුෂ - (52)

උක්ත ප්‍රකාශයට අනුව වී වගාකරුවන්ට සමිති සමාගම් ඇතුළු සුළු මූල්‍ය ආයතන ඔස්සේ ණය ලබාගෙන ඇති අතර ඒවායේ පොලිය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් එම ණය මුදල් හා පොලී මුදල් නැවත ගෙවීමේදී ගැටලුකාරී තත්වයන්ට පත්ව ඇත. මෙම ගොවින් ණය ලබාගන්නේ වී වගාවේ අස්වනු නෙලීමෙන් පසු අස්වනු විකුණා ණය ගෙවීමේ අපේක්ෂාවෙනි. පොහොර අර්බුදයත් සමගම වී නිෂ්පාදනය පහළ වැටීම නිසා වී විකුණා ලබාගන්නා මුදල දෛනික කටයුතුවලට හෝ ප්‍රමාණවත් නොවන නිසා ණය වාරික ගෙවීමේ දුෂ්කරතා ඇති වී තිබේ.

"ආහාර හා එදිනෙදා අවශ්‍යතා සඳහා ණය ලබාගෙන ඇත.අවිධිමත් ලෙස ණය ලබා ගැනීම නිසා ඒවා ගිනි පොලී වී ඇත. (ස්ත්‍රී-49)

බැංකු මගින් ණය ලබා ගැනීමේදී විශාල නීතිරීති මාලාවක් හා ක්‍රියා පටිපාටියකට පසුව ණය ලබා ගැනීමට සිදුවීම නිසා බොහෝ ගොවින් වෙනත් ආයතන මගින් ණය ලබා ගැනීමට කටයුතු කර තිබේ. අවිධිමත් ප්‍රවේශය යටතේ ණය ලබා ගැනීම හේතුවෙන් ඒවායේ පොලිය වැඩිවීමත්, පොලිය නොගෙවීමෙන් වැල්පොලිය රැස් කිරීමත් නිසා ගොවීන් ණය ගෙවීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී තිබේ.

"ළමුන්ට අධ්‍යාපන කටයුතුවලට හා කුඹුරට අවශ්‍ය රසායනික පොහොර හා කෘමි නාශක ලබාගැනීමට ණය වී තිබේ. වී අස්වැන්න නෙලීමේ යන්ත්‍රවල ණය වී තිබේ. ඒවා පියවීමට තවත් ණය ගැනීමට සිදුවී තිබේ." (පුරුෂ - (47)

ආර්ථික මට්ටමට පහත වැටීම නිසා එය වක්‍රාකාරව ළමුන්ගේ අධ්‍යාපනයට බලපා තිබේ. ළමුන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය වියදම් සපයා ගැනීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබේ. නමුත් වී නිෂ්පාදනය අවම මට්ටමක පැවතීම නිසා මෙම ලබාගත් ණය ගෙවීමේ අපහසුතා ඇති වී තිබේ.

"වගා කටයුතු වලට හා නේවාසික සංවර්ධනයට ණය ලබාගෙන ඇත. එය ලබා ගත්තේ වී අස්වනු නෙලීමෙන් පසු අස්වනු විකුණා ණය පියවීමට ය. නමුත් පොහොර අර්බුදය නිසා අස්වනු අඩු වීමෙන් ණය ගෙවීමට අපහසු වී ඇත." (පුරුෂ - 63)

වී ගොවීන් තම ආර්ථික කටයුතු සිදුකරන්නේ වී විකිණීම තුළින් ලැබෙන ලාභය ඔස්සේය. පොහොර අර්බුදය හේතුවෙන් වී අස්වැන්න අඩුවීම නිසා ලාභයක් ලබා ගැනීමට නොහැකිව පවතී. ගොවීන් ඒ හේතුවෙන් වගා කටයුතුවලට අවශ්‍ය මුදල් සොයා ගැනීමට ණය ලබා

ගැනීමට පෙළඹී තිබේ. එසේම මෙම ආර්ථික පසුබෑම හමුවේ වී ගොවීන් තම වගාවට අවශ්‍ය ණය මෙන්ම තම නේවාසිකව තත්ත්වයන් සංවර්ධනයට ලබාගත් ණය ගෙවීමට අපහසු වී ඇත. වී අස්වැන්න අඩුවීම නිසා වී විකුණා ණය පියවීමේ අරමුණින් ලබාගත් ණය ගෙවීමට අපහසු වී ඇත. මෙම ණය ලබාගැනීම හමුවේ පුද්ගල බද්ධ ගැටුම් ඇති වී තිබේ. එනම් ණය ලබාගත් පුද්ගලයන් හා ණය ලබාදුන් පුද්ගලයන් අතර, ඇපකරුවන් අතර ආදී වශයෙන් විවිධ ගැටුම් ඇතිවේ. අධ්‍යයන ප්‍රදේශය තුළ ද මෙවැනි තත්ත්වයක් හඳුනා ගත හැකිය.

**වෙනත් රැකියා සඳහා යොමුවීම සහ වී ගොවිතැන ආශ්‍රිත ශ්‍රම හිඟය**

ආර්ථික අර්බුදය- වී නිෂ්පාදනය පහත වැටීම වී ගොවීන්ගේ ආර්ථිකයට බලපාන ලද අතර එය සෘජුවම ඔවුන්ගේ සමාජ තත්වය කෙරෙහි බලපාන ලදී. පොහොර අර්බුදයත් සමග ආර්ථිකමය අස්ථාවර මට්ටමකට පත්වීම ප්‍රධාන වශයෙන් වී ගොවීන්ගේ සමාජ මට්ටම ද පහත වැටීමට බලපා තිබේ. වී ගොවිතැන ප්‍රධාන ජීවන වෘත්තිය කරගත් මෙම අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත වී වගාකරුවන් වී ගොවිතැනින් ඔබ්බට ගමන් කිරීමක් හඳුනාගත හැකිය.

**වගුව: පොහොර අර්බුදයෙන් පසු රැකියා වෙනස්වීම**

| රැකියාවේ ස්වරූපය | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| වී ගොවිතැනෙහි නියැලීම | 20 | 57.14% |
| වෙනත් රැකියාවක් සඳහා යොමුවීම | 3 | 8.57% |
| රැකියා විරහිත වීම | 12 | 34.28% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

රැකියා විරහිත තත්ත්වයට පත්වීම සමාජීය ජීවිතය පවත්වාගෙන යාමේදී මූලික අවශ්‍යතා වල සිට සෑම අංශයක් කෙරෙහිම ගැටලු ඇතිකරවන්නකි. නියැදිය වශයෙන් තෝරාගත් පුද්ගලයින් පවුල් 35න් 12

ක්ම රැකියා විරහිත තත්ත්වයට පත්වීම යනු වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ ප්‍රබල සමාජයීය පසුබෑමකි.

වී ගොවිතැන ජීවිකාව කරගත් ඉඩම් හිමි වී වගාකරුවන්ට පොහොර අර්බුදය සමඟ ආර්ථික මට්ටම පහළ වැටීම නිසා ඇතැම් අවස්ථාවලදී තම කුඹුරු ඉඩම් අඳයට වෙනත් පාර්ශවයන් වෙත ලබා ලබාදීම හඳුනාගත හැකිය. වගුව මගින් අධ්‍යයන ප්‍රදේශයේ වී ගොවීන් තම කුඹුරු ඉඩම් මෙරට මුහුණ පා ඇති ආර්ථික සහ කෘෂිකර්මාන්තයේ අර්බුදය හේතුවෙන් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමේ ස්වරූපය හඳුනා ගත හැකිය.

**වගුව: කුඹුරු ඉඩම් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීම**

| ඉඩම පවත්වාගෙන යන ස්වරූපය | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| තනි අයිතිය යටතේ | 30 | 85.71% |
| බදු පදනම මත | 1 | 2.85% |
| අඳයට ලබාදීම | 4 | 11.42% |
| එකතුව | 35 | 99.98% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය ,2023

**ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අධ්‍යාපනය සිදුවන බලපෑම සහ ළමා ශ්‍රමිකත්වය**

ආර්ථික ගැටලු, විකුණුම් ගැටලු, වී නිෂ්පාදනය පහළ මට්ටමකට පත් වීම ඒ හේතුවෙන් වී වගාකරුවන්ගේ ආර්ථික මට්ටම පහත වැටීම සිදු විය. ආර්ථික මට්ටම පහත වැටීම මත සමාජීය ක්ෂේත්‍රවලට එය ප්‍රබල වශයෙන් බලපාන ලදී. ආර්ථික මට්ටම පහත වැටීම නිසා සමාජයීය අංශවලට යෙදිය යුතු මුදල් ප්‍රමාණය අවම වීමෙන් සමාජීය අංශය තුළ විවිධ ගැටලු පැන නැගී තිබේ. ප්‍රධාන වශයෙන්ම සමාජයක්

ඉදිරියට ගමන් කිරීමේ ගාමක බලවේගයක් වන අධ්‍යාපනය කඩා වැටීමට ද මෙම පොහොර අර්බුදය වක්‍රාකාරව බලපා තිබේ. එනම් පොහොර අර්බුදයත් සමග ආර්ථික මට්ටම පහත වැටීම නිසා වී වගාකරුවන්ට අධ්‍යාපන අංශය වෙත යෙදවිය යුතු මුදල් ප්‍රමාණවත් නොවීම නිසාත්, ආර්ථිකය බිඳ වැටීම හේතුවෙන් ජීවන වියදම අධික වීම නිසා ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී රැකියා වෙත යොමු වීමත් නිසා පොහොර අර්බුදයෙන් පසු අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් බිඳවැටීමක් හඳුනාගත හැකිය.

**වගුව: අධ්‍යාපනයට බාධා එල්ලවීම**

| ස්වරූපය | පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| අධ්‍යාපනයට බාධා එල්ල වී නැත | 11 | 31.42% |
| අධ්‍යාපනයට බාධා එල්ලවීම | 24 | 68.57% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

මේ අයුරින් වී ගොවි පවුල් වැඩි ප්‍රමාණයක අධ්‍යාපනයට බාධා එල්ලවීම එම වී ගොවි සමාජය තුළ අනාගත සමාජීය තත්ත්වය වර්ධනයේදී ගැටලුවක් බවට පත් වේ. වී අස්වැන්න අඩුවීම නිසා වී ගොවි පවුල්වල ආර්ථික මට්ටම පහළ වැටීමෙන් අධ්‍යාපනය වෙනුවෙන් දැරිය හැකි පිරිවැය අවමවීම මේ අයුරින් විශාල පිරිසකගේ අධ්‍යාපන මට්ටම පහළ වැටීමට හේතු වී තිබේ. අධ්‍යාපනය ලබන ළමුන්ට ප්‍රවාහන වියදම්, උපකාරක පන්ති වියදම් ඉහළ යාම මත වී අස්වැන්න අඩු වීමෙන් ආර්ථික මට්ටම පහළ යාම නිසා එම වියදම් සැපයීම වී වගාකරුවන්ට අපහසු වී තිබේ. එය අධ්‍යාපනය ලබන ළමුන්ගේ අධ්‍යාපනයට බාධා

එල්ල වීමකි. ඉදිරි අනාගතයේ අධ්‍යාපනය සම්බන්ධ ඌණතා ඇති කිරීමට හේතු විය හැක.

"අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පොත්පත් ආදියෙහි මිල ඉහළයාම නිසා ද වී නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් වී විකුණා සෑම ක්‍රියාවක්ම සිදු කිරීමට නොහැකිය. එම නිසා අධ්‍යාපනයට ද බලපා තිබේ" (පුරුෂ - (58)

ආර්ථික අර්බුදය හා පොහොර අර්බුදය සෘජුවම මෙම ප්‍රදේශය තුළ ළමුන්ගේ අධ්‍යාපනයට බාධා එල්ල කර ඇති බව බව උක්ත ප්‍රකාශය අනුව පැහැදිලි වේ. අධ්‍යාපනික උපකරණවල මිල ඉහළයාමත්, ඒවා සපයා ගැනීමට තරම් වී අස්වැන්න විකුණා ලැබෙන මුදල් ප්‍රමාණවත් නොවීමත් මත මෙම ප්‍රදේශයේ වී ගොවීන්ගේ පවුල් තුළ අධ්‍යාපනයට බාධා එල්ල වී තිබේ. පොහොර අර්බුදයත් සමග වී ගොවි පවුල් තුළ ඇති වූ අස්ථාවර ආර්ථික මට්ටම හේතුවෙන් අධ්‍යාපනයට බාධා එල්ලවීම පමණක් නොව අධ්‍යාපනයෙන් ඉවත් වීමේ තත්ත්වය ද හඳුනාගත හැකිය.

"දියණිය පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා හදාරමින් සිටියා. පොහොර අඩු උනාම වී අඩු වුන නිසා මුදල් හිඟ වීමෙන් එම පාඨමාලාව නවතා දැමීය."(පුරුෂ - 52)

වී අස්වැන්න අඩුවීම නිසා වී වගාකරුවන්ගේ ආර්ථික මට්ටම අඩු වී තිබේ. එය සෘජුවම වී ගොවි පවුල්වල අධ්‍යාපනයට බලපා තිබේ. පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා සම්පූර්ණයෙන්ම මුදල් මත පදනම් වීම නිසා ඒවාට අවශ්‍ය මුදල් සපයා ගැනීමට නොහැකි වීමෙන් එම අධ්‍යාපන කටයුතුවලින් ඉවත් වී තිබේ. එය සමාජීය තත්ත්වය පහත වැටීමට හේතු වේ.

"අධ්‍යාපනයට බාධා එල්ල එල්ලවී තිබේ. දෙවන වර උසස් පෙළ විභාගයට මුහුණ දීමට අපේක්ෂාවෙන් සිටි දියණිය මුදල් නොමැතිකම හේතුවෙන් එය අතහැර දැමීය." (පුරුෂ - 60)

උක්ත ප්‍රකාශයට අනුව ආර්ථික අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහත වැටීම මත අධ්‍යාපනය ලබන ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී ඇති බව හඳුනාගත හැකිය. උසස් පෙළ විභාගයට මුහුණ දීමෙන් ඉවත්වීම එම අධ්‍යාපනය ලබන ළමුන්ට තම සමාජ තත්ත්වය වර්ධනය කර ගැනීමට ඇති ඇතැම් අවස්ථා මඟ හැරීමකි. එය මෙම සමාජය තුළම ප්‍රාථමික වී නිෂ්පාදනයේ යෙදෙන පුද්ගලයන් පමණක් ඇති කිරීමට හේතු විය හැකිය. එසේම මෙම අධ්‍යයනය ප්‍රදේශය ආශ්‍රිතව අධ්‍යාපනය ආශ්‍රිත ගැටලුවක් ලෙස අධ්‍යාපනය ලබන වයසේ ළමුන් රැකියා සඳහා යොමුවීම පෙන්වා දිය හැකිය.

" සතියට දවස් 4ක්වත් කුලී වැඩ කරනවා." පුරුෂ - 14)

උක්ත ප්‍රකාශයට අනුව ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී වෙනත් රැකියා වලට යොමුවීම අධ්‍යාපනයට ප්‍රමාණ ගැටලුකාරී තත්ත්වයක් ඇති කරයි. මෙම ප්‍රදේශය තුළ වී වගාවේ නිරත, වී වගාකරුවන්ගේ පවුල්වල ළමුන් වී අස්වැන්න අඩුවීම නිසා ආදායම් මට්ටම පහළ යාමෙන් පවුලේ ආදායම් මට්ටම නගාසිටුවීම අරමුණු කරගෙන අධ්‍යාපනයෙන් ඉවත් වී වෙනත් සුළු රැකියා සඳහා යොමු වී තිබේ. එය එම ළමුන්ගේ මෙන්ම එම පවුල්වල සමාජ තත්ත්වය පසුබෑමට ලක්වීමට හේතු වී තිබේ.

" කුඹුරු කාලෙට කුඹුරු වැඩ" පුරුෂ - 16)

ශ්‍රම හිඟය පියවා ගැනිමට පවුලේ සියලු දෙනා වි ගොවිතැනට යොමුවිම තුල ළම ශ්‍රමිකත්වයක් හදුනාගත හැකි අතර පාසල් යා යුතු දරුවන් වි ගොවිතැන ආශ්‍රිත ශ්‍රම කටයුතුවල නිරතවන අතර ඒ සදහා

වේතනයක් ද හිමි නොවේ. ශ්‍රමය සූරාකෑමක් නිරූපණයවේ. පිරිමි ළමුන් කෘෂි භූමිවලද ගැහැනු ළමුන් නිවෙස්වල කටයුතු සඳහා ද යොදාගෙන ඇත. මේ හේතුවෙන් අඛණ්ඩ පාසල් අධ්‍යාපනයක් නොලබයි.

**කේන්ද්‍ර පරිධිය ශ්‍රම ගලනය**

මෑත කාලීනව ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය වී ගොවිතන ගැටලුකාරි මට්ටමකට පත් වීමට හේතු වූ අතර එය සෘජුවම ග්‍රාමීය කෘෂි පවුලේ ආර්ථිකයට බලපාන ලදී. කෘෂි ආර්ථිකයට බලපෑම් ඇතිවීම කෘෂි ආර්ථිකය මත පදනම් වන රටේ ආර්ථිකයට ද බලපානු ලබයි. ආර්ථික ගැටලු හේතුවෙන් ග්‍රාමීය වි ගොවිතැන අතහැර නාගරික කර්මාන්ත සහ සේවාවලට තල්ලුවිමක් හදුනාගත හැකිය. කේන්ද්‍ර පරිධිය සබදතාව හදුනාගත හැකිය. නාගරික සේවා හා කර්මාන්තවල ශ්‍රම හිඟය සඳහා මෙම කොටස තල්ලුවිමක් හදුනාගත හැකිය.

**වගුවඃ රැකියා අපේක්ෂාවෙන් ශ්‍රම සංක්‍රමණය වීම**


| ස්වභාවය | පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| පවුල තුළම රැඳී සිටීම | 24 | 68.57% |
| රැකියා අපේක්ෂාවෙන් පවුලෙන් ඉවත්වීම | 11 | 31.42% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් ඉවත්වීමට ප්‍රධානතම හේතුව ලෙස ආදායම් හා අලෙවි ප්‍රශ්නය හඳුනාගත හැකිය. හොද මිලක් ලබා ගැනීමට නොහැකි වීම ,ජල ගැටලු, දේශගුණික ගැටලු , ඉඩම්වල ගැටලු සහ පොහොර යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමේදී මූල්‍යමය ගැටලු සහ පැරණි බැංකු ණය ආදිය හේතුව ඇත. එසේම යටිතල පහසුකම් සංවර්ධනයේ අඩුව, තාක්ෂණික හිඟය සහ සේවා සහ අධ්‍යාපන හා රැකියා ඉලක්ක

සඳහා තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය අතහැර ගමින් නගරයට සංක්‍රමණය වූ අතර කෘෂිකාර්මික හා වැවිලි ක්ෂේත්‍රයේ පැහැදිලි ආර්ථික ප්‍රතිලාභයක් හඳුනා ගැනීමට නොහැකි වීම සහ කෘෂිකර්මාන්තය ස්ථිර නොවන ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස තරුණ ප්‍රජාව නිර්වචනය කිරීමේ පසුගාමීත්වය තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් වෙනත් ආර්ථික කටයුතුවලට යොමු වීමට බලපාන ප්‍රධාන සාධකයයි.


**විහීනතා උගුල : රොබට් චෙම්බර්**



අවිධිමත් ණය ගැනීම, ඉඩම් අහිමිවීම , වී ගොවිතැන තුල දීර්ඝ කාලීන මුහුණ පානු ලබන අලාභය ආදී තත්වයන් හේතුවෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම ගොවි පවුල් තුල ආර්ථික ශක්‍යතාවය ගිලිහී යාම තුල දරිද්‍රතාවයෙන් පෙළෙන බව හඳුනා ගත හැකිය. රොබට් චෙම්බර් විසින් සම්පාදිත *Rural Development* කෘතියේ පෙන්වා දෙන විහිනතා උගුල නම් සංකල්පය මෙම ගොවි පවුල් තුලින් නිරූපණය වේ. දරුවන්ගේ අධ්‍යාපනට අඩාලවීම තුල වර්තමාන පරම්පාරව මෙන්ම ඊළඟ පරම්පරාවගේ ද දරිද්‍රතාවය හඳුනා ගත හැකිය. පෝෂයදායි ආහාර අවමවීම සහ ගොවිබිම්වල ශ්‍රමය සැපයීම තුල කාන්තාවන් සහ දරුවන්ගේ පෝෂණ ගැටලු සහ රෝග හඳුනාගත හැකිය.

**දරිද්‍රතාවයේ සංස්කෘතියඃ ඔස්කා ලෙවිස්**

එමෙන් ම වී ගොවිතැන පිලිබඳ පවතින ඍණාතමක ආකාල්ප සහ වී ගොවිතැන වර්තමානයේ ආර්ථික අර්බුදය හමුවේ මුහුණ පා සිටින ගැටලු හමුවේ මෙම ප්‍රජාව ආන්තිකරණයවීමක් හඳුනාගත හැකිය. ආර්ථික ශක්තිය ගිලි හි යාම තුල සමාජ බලයද ගිලිහියාමක් සහ වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ අවදානකම්සහගත කණ්ඩායමක් ලෙස වී ගොවිතැන සිදුකරන මෙම සමාජ කණ්ඩායම හඳුනාගත හැකිය. එනම් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම ප්‍රජාව තුල දරිද්‍රතාවයේ විෂම චක්‍රයක් ගොඩනැගි ඇති අතරම ඒතුල ඔස්කා ලෙවිස් වැනි චින්තකයන් හදුන්වා දුන් දිළිදුකමේ සංස්කෘතියක් ගොඩනැගිමට ආර්ථික අර්බුදය හේතුවෙමින් පවතින බව හඳුනාගත හැකිය. "දරිද්‍රතාවයේ සංස්කෘතිය" පිළිබඳ න්‍යාය නිර්මාණය කරන ලද්දේ මානව විද්‍යාඥ ඔස්කාර් ලුවිස් විසින් (1959) දී ඔහුගේ *Five Families: Mexican Case Studies in the Culture of Poverty* යන කෘතියෙනි.




දරිද්‍රතා සංස්කෘතිය න්‍යායේ පවසන්නේ දරිද්‍රතාවයේ පැතිරී යන තත්ත්වය තුළ ජීවත්වීම එම තත්වයන්ට අනුවර්තනය වූ සංස්කෘතියක් හෝ උප සංස්කෘතියක් වර්ධනය වීමට හේතු වන බවයි. මෙම සංස්කෘතිය අසරණ භාවය, යැපීම, ආන්තිකභාවය සහ බල රහිතභාවය පිළිබඳ පුළුල් හැඟීම් වලින් සංලක්ෂිත වේ. තවද, ලුවිස් විස්තර කළේ දරිද්‍රතාවයේ සංස්කෘතියක් තුළ ජීවත් වන පුද්ගලයන් ඉතිහාසය පිළිබඳ අඩු හෝ හැඟීමක් නොමැති අය ලෙසත්, එබැවින් සාමූහික ක්‍රියාකාරකම් තුළින් තමන්ගේම තත්වයන් සමනය කර ගැනීමට දැනුමක් නොමැති බවත්, ඒ වෙනුවට ඔවුන්ගේම කරදර කෙරෙහි පමණක් අවධානය යොමු කරමිනි. මේ අනුව, ලුවිස්ට, දරිද්‍රතාවයේ සංස්කෘතියක් වර්ධනය කිරීමේ ව්‍යුහාත්මක හේතුව වූයේ දරිද්‍රතාවයේ සංස්කෘතියක් වර්ධනය වීමට

ලුවිස්ගේ ව්‍යුහාත්මක හේතුව වන අතර, එය පසුව ස්වාධීන බවට පත්වන අතර, දරිද්‍රතාවයේ සංස්කෘතියක් තුළ වර්ධනය වන හැසිරීම් සහ ආකල්ප සමාජකරණ ක්‍රියාවලීන් හරහා පසු පරම්පරාවන්ට සම්ප්‍රේෂණය වේ.

## නව මාක්ස්වාදී තර්කය

රටක සංවර්ධන ක්‍රියාවලියේ මුඛ්‍ය පරමාර්ථය ලෙස ආර්ථික වෘද්ධිය ළඟාකර ගැනීම හඳුනාගත හැකිය. ආර්ථික සාධකය ග්‍රාමීය සමාජයේ වෙනස්වීම සඳහා ප්‍රබල බලපෑම් කරනු ලබන බව ඒ ආශ්‍රිතව ගොඩනැගුනු සංකල්ප හා න්‍යායත්මක පසුබිම අධ්‍යනය මගින් විද්‍යාමාන වේ. දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව ද ග්‍රාමීය ශිෂ්ඨාචාරයකින් බිහිවී ඇති රාජ්‍යය කි. අතීතයේ පමණක් නොව වර්ථමානයේ ද ශ්‍රී ලංකා ජන සමාජය තුළ ග්‍රාමීය සමාජ ඒකක හඳුනාගත හැක. මෙහිදී ගැමි සමාජයේ ආර්ථික පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් නව මාක්ස්වාදී තර්කය වැදගත් වේ. එහිදී ගුන්ඩර් ෆ්‍රැන්ක්, පෝල් බරාන් , සමීර් අමීන් වැදගත් වේ. මොවුන් ප්‍රධාන වශයෙන් තුන්වන ලෝකයේ රටවල ගැමි සමාජ පසුගාමී තත්වයක පසුවන්නේ අධිරාජ්‍යයවාදී රටවල් නව මුහුණුවරකින් සූරා කෑමට ලක් කරන නිසා බව දක්වයි. *Peasant and peasant societies* කෘතිය මගින් තියඩෝර් ශයිනි ග්‍රාමීය සමාජය ආර්ථිකය සමග පවතින සම්බන්ධය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහයක යෙදී ඇත. ආර්ථිකය තුළ අන්තර්ගත වී ඇත්තේ නිෂ්පාදනය බෙදාහැරීම හා පරිභෝජනයයි.

## කේන්ද්‍ර පර්යන්ත සබඳතාවය

ගම නම් සංකල්පය නවීකරණය වී වෙනස්කම් වලට භාජනය වී ඇත. එහෙත් ග්‍රාමීය සංකල්පය තවමත් සමාජයේ පවතින සංකල්පයකි. එනම් ග්‍රාමීය ප්‍රදේශයක් යනු ප්‍රාථමික ගෝත්‍රික සමාජයක් සහ නූතන

නාගරික ප්‍රජාව අතර පවතින අතරමැදි තත්වයක් ලෙස සඳහන් කරයි. (රෙඩ්ෆීල්ඩ්,1930) එමෙන්ම ගැමි සමාජයේ සූරාකෑමේ ක්‍රියාවලිය පිළිබඳ ෆෑන්ක් අදහස් දක්වන අතර සම්පත් සූරාකෑමට පාදක වූ කරුණු ලෙස වෙළඳපොළ, ඉඩම් හිමිකම, ප්‍රවාහනය, පොදු පහසුකම් වේ. ෆ්‍රෑන්ක් පෙන්වා දෙන්නේ කේන්ද්‍ර පර්යන්ත සම්බන්ධතාවය මගින් ගැමි සමාජයන්හි අතිරික්තය අහිමි කිරීමක් සිදුවන බව හා එමනිසා දිගින් දිගටම ඌණ සංවර්ධිතභාවයකට ගොදුරුව ඇති බවයි. එමනිසා මෙම කේන්ද්‍ර පර්යන්ත සබඳතාවය බිඳවැටීම තුළ ගැමි සමාජයන්හි අතිරික්තය අහිමි නොවේ.(හඳරාගම,2011) මෙහිදී ප්‍රධාන කථිකයෙකු වන අන්ඩර් ගුන්ඩර් ෆෑන්ක් ප්‍රධාන වශයෙන් "සංවර්ධනයේ ඌන සංවර්ධනය" (Development of Underdevelopment) සහ "පද්ධතික සූරාකෑම" (model of metropolis satellite exploitation)වැනි ආකෘතීන් මගින් නව මාක්ස්වාදී විග්‍රහයේ යෙදෙයි. එහිදී ඔහුගේ ප්‍රසිද්ධ කෘතිවන, *Capitalism and underdevelopment of Latin America (1967) / Latin America : Underdevelopment or Revolution (1969)* මගින් පෙන්වා දෙන ආකාරයට ආර්ථික සංවර්ධනය හා ඌණ සංවර්ධනය එකම කාසියක දෙපැත්තක් වැනිය.

අතීතයේ ගම්වාසින්ගේ ජීවන රටාව පරිභෝජන රටාව නිෂ්පාදන කියාවලිය ගොඩනැගී ඇත්තේ හේන් වගාව - වී ගොවිතැන මූලික කොටගත් සාම්පදායික කෘෂිකර්මාන්තය මත පදනම්වය'අතීතයේ ගොවියා තමා විසින්ම නිෂ්පාදනය කෙරෙන එම නිෂ්පාදනයන් පරිභෝජනය කරන ලැබුවේද ඔවුන් විසින්මය' එම නිසා ඒ සමය තුළ නිෂ්පාදනය කරන ලබන දෑ ගමයෙන් පිටතට බෙදා හැරීම දැකගත නොහැකි විය' ඒ කාලය තුළ නගරය හා ගම තුළ පැවතියේ ඉතා දුරස්ථ සම්බන්ධතාවයකි


නමුත් වි ගොවිතැන ආශිතව ජීවන උපාය මාර්ගයක් ගොඩනගා ගැනීමත් සමග ගම තුළ නිෂ්පාදනය කරන ලබන දෑ පරිහරණය නොවී ගමෙන් පිටතට බෙදා හැරිමත් ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය නගරයෙන් මිලදී ගැනීමත් සිදු වේ' මෙම කියාවලිය හමු වේ ගුන්ඩර් ෆෑන්ක් විසින් හඳුන්වා දෙනු ලැබූ කේන්ද්‍රය විසින් පරිධිය සූරාකෑමේ න්‍යායාත්මක සංකල්පයේ සත්‍යතාවයක් වි ගොවිතැන ආශිතව දැක ගැනීමට හැකි වේ' මෙහිදි කේන්ද්‍රය වන නගරය විසින් පරිධිය වන ගම සතු සම්පත් "නිෂ්පාදනය සූරා කෑමට ලක් කරයි' ලෝකයේ සංවර්ධිත රටවල් විසින් ඌන සංවර්ධිත රටවල් වල සම්පත් සූරා කෑම පදනම් කරගෙන කේන්ද්‍ර පරිධි න්‍යාය ලෙස ගොඩනැගී ඇත' මෙම සූරාකෑමේ කී්‍රයාවි,ය ජාතික මට්ටමින්ද දැකගත හැකි අතර රාජ්‍ය අභ්‍යන්තරයේ පවතින ගම සහ නගරය අතර පවතින සම්බන්ධතාවය තුළින්ද ඉස්මතු වී ඇති බව ඉහත කරුණු තුළින් පැහැදිලි වේ' මෙය අවසානයේ අන්තර්ජාතික වෙළඳපළ දක්වා විකාශනය වී ගොස් අන්තර්ජාතික වෙළඳපල ශක්තිමත් කරනු ලබයි

**තල්ලුකිරිමේ Push සාදක සහ ඇදගැනිමේ Pull සාධක**

Everett Leeගේ Push & Pull Factor සංක්‍රමණය පිළිබඳ න්‍යාය මගින් විශ්ලේෂණය කිරිමේ දි හඳුනා ගත හැකිවන්නේ වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ වි ගොවිතැන ආශ්‍රිත ශ්‍රමය වෙනත් සේවා හා කර්මාන්ත වෙත තල්ලුවිමකි. මෙහිදි වි ගොවිතැනෙන් ගොවින් ඉවත්විමට බලපාන ලබන තල්ලුකිරිමේ Push සාදක සහ ඇදගැනිමේ Pull සාධක පිළිබඳ අවධානය යොමු කිරිමේ දි

**තල්ලුකිරීමේ සාධක**

- ආර්ථික අර්බුදය හමුවේ ජීවන වියදම ඉහලයාම
- වී ගොවිතැන ආශ්‍රිත තාක්ශණික (පොහොර , යාන්ත්‍රෝපකරණ මිල අධිකබව) සහ මූල්‍යමය ගැටලු(ණය)
- දේශගුණික හා කාලගුණික අයහපත් තත්වයන්
- ඉඩම් පිළිබඳ ගැටලු
- රාජ්‍ය අවම මැදිහත්වීම් සහ සහනාධාර , වගා හානි නොගෙවීම
- ආර්ථික වාසි අවමවීම
- කායික රෝගවලට ගොදුරුවීම(මී උණ)
- ගොවිතැන පිළිබඳ තරුණයින්ගේ සෘණාත්මක ආකල්ප




**ඇදගැනීමේ සාධක**

- ආර්ථිකමය වාසි ( හොඳ වේතනයක්, රක්ෂණ ආවරණ,ප්‍රවාහන සහ නවාතැන් පහසුකම්)
- බැංකු ණයගැනීමට
- නගරය පිළිබඳ සංවර්ධිත ආකල්පය
- අධ්‍යාපන අවස්ථා සහ රැකියා අවස්තා බහුලවීම
- රැකියාව පිළිබඳ ධනාතමක ආකල්ප
- යටිතල පහසුකම්

ලෙස විශ්ලේෂණය කල හැකිය.

## නිගමන සහ යෝජනා

මේ අනුව ආර්ථික අර්බුදය හමුවේ තරුණ ගොවියන් වෙනත් විකල්ප ආර්ථික ක්‍රියාකාරකම් වෙත ගමන්කිරිම හරහා වී ගොවිතැන අර්බුදයට ලක්විම නොවැළක්විය හැකි තත්වයට පත්ව ඇත. ශ්‍රම හිගය නිර්මාණය විම සහ ආර්ථික අර්බුදයේ බලපෑම තුල මෙම ප්‍රජාවගේ පවුලේ සිට සමස්ත රටේ ආර්ථිකයට සහ සමාජයට අහිතකර ලෙස එය සෘජුව සහ වක්‍රව බලපානු ලබයි.

ප්‍රාදේශීය වශයෙන් වී ගොවිතැනේ නියැලෙන වී වගාකරුවන්ගෙන් නියැදියක් භාවිතා කරමින් වී වගාකරුවන් ප්‍රමාණයක් තෝරාගෙන ඒ යටතේ වැඩි දුරටත් විමර්ශනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජ, ආර්ථික පසුබිම විමර්ශනය කරමින් අධ්‍යයනය සඳහා පවතින

යෝග්‍යතාව හඳුනාගෙන ඒ අනුව වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම අධ්‍යයනය කරමින් පර්යේෂණය සිදුකරන ලදි. මෑතකාලීන පොහොර අර්බුදයත් සමග රසායනික පොහොර ලබා ගැනීමට නොහැකි වීම හා පසුකාලීන රසායනික පොහොර මිලකරනය හමුවේ වී අස්වැන්න පහත වැටීම වී වගාකරුවන්ගේ වී නිෂ්පාදනය කෙරෙහි දක්වූ බලපෑම, ඒ මත ආර්ථිකමය වශයෙන් සිදු වූ බලපෑම හා ණය ප්‍රවේශ වෙත යොමුවීමෙන් ඇති වූ ගැටළු, සමාජයීය වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සබඳතා ආදී සමාජ පසුබිම කෙරෙහි ඇති වූ බලපෑම අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිගමනයන්ට එළඹීමට හැකි විය.

**නිගමනය**

2021 අප්‍රේල් මස ක්‍රියාත්මක කරන ලද රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් වී නිෂ්පාදනය ඉහළ මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍යවන එක් ප්‍රධාන සාධකයක් වන පොහොර භාවිතය රසායනික පොහොර අර්බුදයත් සමඟ ඌන මට්ටමකට පත්වීම නිසා වී නිෂ්පාදනය අඩු වී තිබේ.

පොහොර අර්බුදයට පෙර ප්‍රධාන වශයෙන් වී ගොවිතැන සඳහා රසායනික පොහොර භාවිතා කළ අතර අවශේෂ වශයෙන් කාබනික පොහොර භාවිතයක් සිදුකර ඇත. පොහොර අර්බුදය හා පොහොර මිලකරණය හමුවේ වී අස්වැන්න අඩුවීම නිසා ආර්ථික මට්ටම පහළ වැටීමෙන් වී වගාකරුවන් විධිමත් හා අවිධිමත් ණය ප්‍රවේශ වෙත යොමුවී ඇති අතර ඒ මත වාරික හා පොලී මුදල් ගෙවා ගැනීමට නොහැකි වීමෙන් ආර්ථික අර්බුදකාරී තත්වයකට පත්ව තිබේ. 80%ක් පමණ වී වගාකරුවන් ණය ලබා ගැනීම සඳහා යොමුවී ඇති අතර එය වී වගාකරුවන්ගේ ආර්ථිකය තුළ අර්බුදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවී තිබේ. ණය ලබා ගැනීම මත ඒවා නැවත ගෙවීමට අපහසු වීමෙන් සමාජමය ගැටුම් ඇතිවී තිබේ.

වී ගොවිතැනෙහි නියැළුණු පවුල්වලින් පවුල් 12ක් එනම් 34.28%ක් රැකියා විරහිත තත්ත්වයට පත් වී ඇත. එය එම වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම කෙරෙහි සෘණාත්මකව බලපානු ලබයි. වී වගාකරුවන්ගේ පවුල්වල අධ්‍යාපනයට බාධා එල්ලවීම අනාගත සමාජ පසුබෑම් කෙරෙහි හේතු වේ. මෙම පවුල්වල සෘණාත්මක අධ්‍යාපන මට්ටමක් ඇති පිරිසක් ඇතිවීමට ඇති ඉඩකඩ වැඩිය. පොහොර අර්බුදයෙන් පසුව ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී කුලී රැකියා සඳහා යොමුවීම මෙම පවුල්වල සමාජ තත්ත්වයට ඇති වී ඇති සෘණාත්මක බලපෑමකි. එසේම සැමියා, බිරිඳ පවුල් හැරයාම්, දෙමාපිය දූදරු ගැටළු, මූලික අවශ්‍යතා සපයා ගැනීමේ ගැටලුව, පවුල්වල සෞඛ්‍යයට බලපෑම් ඇතිවීම වැනි සමාජ ගැටළු ඇතිවී තිබේ.

මේ අනුව නිගමනය වන්නේ ආර්ථික අර්බුදයට ප්‍රථවම මුහුණදුන් පොහොර අර්බුදය හමුවේ වි ගොවින්ගේ ආර්ථික ස්ථාවරභාවය බිදවැටි තිබුන බවත්, එම නිසා වර්තමාන ආර්ථික අර්බුදය කලමණාකරණය ගැනිමේ ආර්ථික ශක්‍යතාවය ගිලිහියාම තුළ වී ගොවිතැනෙන් ඉවත් වි සේවා සහ කර්මාන්ත අංශයේ රැකියාවෙත ශ්‍රමය සංක්‍රමණය වීම තුළ මෙරට ආර්ථිකයේ වැදගත්ම අංශයවන කෘෂිකර්මාන්තයේ වි ගොවිතැන විශාල ශ්‍රම හිගයක් හේතුවෙන් අර්බුදයට ලක්ව ඇති බව සහ එම ප්‍රජාව දරිද්‍රතාවයේ උගුලක සිරව සිටින බවය.

**යෝජනා**

- වාණිජමය වශයෙන් සිදුකරන වී ගොවිතැන ප්‍රධාන ආර්ථික කටයුත්තක් ලෙස වර්ධනය කිරීමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සිදු කළ යුතුය. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ගොවීන් දිරිගන්වමින් ගොවීන් වී වගාව තුළ රඳවා ගැනීමට අවශ්‍ය උපකරණ, මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීම. පොහොර

සහනාධාරය ගොවීන්ට ප්‍රමාණවත් පරිදි සපයාදීම ඔස්සේ වැඩි වී අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කිරීම.

- ගොවීන්ගේ වී නිෂ්පාදන ඉහළ මිල යටතේ මිලදී ගැනීමට රාජ්‍ය අංශය මගින් ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කිරීම.
- වී වගා නොකරන කාලසීමාව තුළ ගොවීන්ගේ ආර්ථිකය නගා සිටුවීමට වෙනත් කව්පි, මුං ආදී කෙටිකාලීන බෝග වගා කිරීම ප්‍රවර්ධනයට කටයුතු සැලසීම හා අඩු මිලට බීජ සැපයීම.
- ගොවීන් රසායනික පොහොරවලට අමතරව කාබනික පොහොර භාවිතා කිරීම වෙත දිරිගැන්වීම. කාබනික පොහොර දිරිගැන්වීම සඳහා ගොවීන් විසින්ම කාබනික පොහොර නිපදවා අලෙවි කිරීමේ ප්‍රවේශ ඇති කිරීම හා ගොවීන්ට පුහුණුව හා දිරිමත් කිරීම් ලබාදීම.
- වී ගොවි පවුල්වල සමාජ තත්ත්වය නගාසිටුවීම උදෙසා වී ගොවි පවුල්වල අධ්‍යාපනය නගා සිටුවීමට ග්‍රාමීය පාසල් දියුණු කිරීම හා ළමුන් අධ්‍යාපනය ලැබිය යුතු කාලයේ වෙනත් ගොවිතැන් කටයුතුවල නිරත වීම වැළැක්වීමට පාසල් තුළ පැමිණීමේ දීමනා ක්‍රමයක් ඇති කිරීම. ර
- මුල්‍ය හා බැංකු කලමණාකරණය හා ණය පිලිබඳ විධිමත් ක්‍රියාවලියක් සකස් කිරිම
- වගා හානි සඳහා ආධාර සහ ගොවින්ට ආර්ථික වශයෙන් ස්ථාවර විමට ගොවි සමිති මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- දේශිය වී ගොවිතැන සහ දේශිය ඥානය යොදාගැනීමට ගොවීන්ට පුහුණුව හා දිරිමත් කිරීම් ලබාදීම.

## ආශ්‍රිත මූලාශ්‍ර

ඉන්ද්‍රකීර්ති, එස්. (1993) ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඌව පළාත් ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව. (2021) ඌව පළාතේ ඉඩම් භාවිතය

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. Retrieved from: https:// www.statistics .gov.lk/home_si.asp.

බඩල්කුඹුර ගොවිජන සේවා මධ්‍යස්තානය. (2023) රසායනික පොහොර නිකුත් කිරීම

බඩල්කුඹුර ගොවිජන සේවා මධ්‍යස්ථානය. (2023) කාබනික පොහොර නිකුත් කිරීම

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2023) සම්පත් පැතිකඩ. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

විජයබණ්ඩාර,කේ. (2004) දුප්පත් බතට විස. කර්තෘ ප්‍රකාශන.

විමලකීර්ති,එම්. (2002) සිංහල ගොවිතැන. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2021) 2014 - 2019 කාලය තුළ පවත්නා වෙළෙඳපොළ මිල අනුව වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2023) වී නිෂ්පාදනය. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව. (1982) අංක 70 මොනරාගල මෙට්‍රික් සිතියම

හදරාගම එස්. සහ රස්නායක එස්. (2011) සංවර්ධන සමාජවිද්‍යාව, සමීර ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, යු. (1998).) ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය. පුබුදු ප්‍රින්ටර්ස්.

Begum, A. A., & Manos, B. (2005). Impacts of fertilizer pricing policy in Bangladesh:

A multicriteria analysis. *Agricultura Tropical et Subtropical*, 38(2), 6-18.6

Bonilla Cedrez, C., Chamberlin, J., Guo, Z., & Hijmans, R. J. (2020). Spatial variation

in fertilizer prices in Sub-Saharan Africa. *PloS one*, 15(1), e0227764.

Department of Census & Statistics. (2009). *Sri Lanka Demographic & Health survey 2018*, Colombo. Retrieved from; https:// www.statistics,gov.lk Accessed on 20 December 2022

Department of Census and Statistics. (2022). Poverty Indicators 2019.Retireved from http://www.statistics.gov.lk/Poverty/StaticalInformation/PovertyIndicators-2019 Dulanjani, P. A., & Shantha, A. A. (2021). Micro-economic impact of fertilizer subsidy in paddy cultivation in Sri Lanka. *Am. J. Hum. Soc. Sci. Res.*, *5*(4), 86-95.

Ekanayake, H. K. J. (2009). The impact of fertilizer subsidy on paddy cultivation in Sri Lanka. *Staff studies*, 36(1).

Emmanuel, D., Owusu-Sekyere, E., Owusu, V., & Jordaan, H. (2016). Impact of agricultural extension service on adoption of chemical fertilizer: Implications for rice productivity and

development in Ghana. *NJAS-Wageningen Journal of Life Sciences*, 79, 41-49.

Fahmid, I. M., Jamil, A., Agustian, A., Hatta, M., Aldillah, R., Yofa, R. D., & Susilowati, S. H. (2022). Study of the impact of increasing the highest retail price of subsidized fertilizer on rice production in Indonesia. *Open Agriculture*, 7(1), 348-359.66

Harris, D. R., & Fuller, D. Q. (2014). Agriculture: definition and overview. *Encyclopedia of global archaeology*, 104-113.

Hashimi, R., Matsuura, E., & Komatsuzaki, M. (2020). Effects of cultivating rice and wheat with and without organic fertilizer application on greenhouse gas emissions and soil quality in Khost, Afghanistan. *Sustainability*, 12(16), 6508.

Henegedara, G. (2002). Agricultural Policy Reform in the Paddy Setor in Sri Lanka: An Overview. *Sri Lanka Journal of Agriculture, 10*(1), 1-25.

Herath, H. M. K. V., Gunawardena, E. R. N., & Wickramasinghe, W. M. A. D. B.(2015). The impact of "Kethata Aruna" fertilizer subsidy programme on fertilizer use and paddy production in Sri Lanka. *Tropical Agricultural Research, 25*(1).

International Water Management Institute (IWMI), (2005). *Development Strategy for the Irrigation Sector in Sri Lanka 2006-2016.* Colombo: International Irrigation Management Institute.

Jayne, T. S., Mather, D., Mason, N., & Ricker-Gilbert, J. (2013). How do fertilizer subsidy programs affect total fertilizer use in sub-

Saharan Africa? Crowding out, diversion, and benefit/cost assessments. *Agricultural economics*, 44(6), 687-703.

Karunanayaka, K. J., & Aponsu, G. M. L. M. (2019). Forecasting Paddy Production in Yala And Maha Seasons in Sri Lanka.

Rahman, K. A., & Zhang, D. (2018). Effects of fertilizer broadcasting on the excessive use of inorganic fertilizers and environmental sustainability. *Sustainability*, 10(3), 759.

Ramli, N. N., Shamsudin, M. N., Mohamed, Z., & Radam, A. (2012). The impact of fertilizer subsidy on Malaysia paddy/rice industry using a system dynamics approach. *International Journal of Social Science and Humanity*, 2(3), 213.

Ranathunga, L. N., Wijemanna, W. M. D. I. S., Sathsara, M. G. S., & Gamage, R. G. B. K. (2018). Agriculture in Sri Lanka: The Current Snapshot. International Journal of Environment. *Agriculture and Biotechnology*, 3(1), 118-125.

Razmy, A. M., & Ahmed, A. N. (2005). Trends in Paddy Production in Sri Lanka. *Journal of Management*, 26-33.

Rodrigo, C., & Abeysekera, L. (2015). Why the fertilizer subsidy should be removed: key factors that actually derive the fertilizer demand in paddy sector of Sri Lanka. *Econ Res*, *3*, 71-98.

Shantha, A. (2011a). Technical Efficiency in Stochastic Frontier Production Model: A case Study of Irrigated Paddy Farming Under Village Tanks in Sri Lanka. *Eight International Conference on*

*Business Management* (pp. 9-26). Colombo: University of Sri Jayawardanepura.

Shantha, A. A., & Ali, B. A. (2014). Economic value of irrigation water: a case of major irrigation scheme in Sri Lanka. *Journal of Agricultural Sciences–Sri Lanka*, *9*(1).

Sisirakumara, M. P. S. S., Karunarathna, M., & Athukorala, W. (2018). An Economic Evaluation of Fertilizer Subsidy on Paddy Production in Sri Lanka. *MODERN SRI LANKA STUDIES*, 47.

Suppiah, R., & Yoshino, M. (1986). Some agroclimatological aspects of rice production in Sri Lanka. *Geographical review of Japan, Series B.*, *59*(2), 137-153.

Wanninayake, S., & Semasinghe, M. (2014). Economic and Social Cost of Fertilizer Subsidy on Paddy Farming in Sri Lanka. *International journal of Science and Research (IJSR)*, *Vo*, *3*, 1261.

Weerahewa, J., Kodithuwakku, S. S., & Ariyawardana, A. (2010). The fertilizer subsidy program in Sri Lanka.

Wijetunga, C. S., & Saito, K. (2017). Evaluating the fertilizer subsidy reforms in the rice production sector in Sri Lanka: A simulation analysis. *Advances in Management and Applied Economics*, *7*(1), 31.

Wu, Y., Wang, E., & Miao, C. (2019). Fertilizer use in China: The role of agricultural support policies. *Sustainability*, 11(16), 4391

Yogarajah, B. (2003). *Forcasting the Paddy Production in Sri Lanka* (Doctoral dissertation, University of Sri Jayewardenepura, Nugegoda).

Yoshino, M. M., & Suppiah, R. (1984). Rainfall and paddy production in Sri Lanka. *Journal of Agricultural Meteorology*, *40*(1), 9-20.

# සමාජ වැඩ හා පද්ධති න්‍යාය

ඕමල්පේ සෝමානන්ද හිමි

## හැදින්වීම

"පද්ධතිය" (System) යන සංකල්පය සමාජ වැඩ ඇතුළු සියළුම සමාජයීය විද්‍යාවන් ලබාගෙන ඇත්තේ ජීව විද්‍යාවෙනි. එය කිසියම් ප්‍රපංචයක් අධ්‍යනය කිරීමට හා තේරුම් ගැනීමට ඇති න්‍යායකි. පද්ධති න්‍යාය වර්තමානය වන විට විවිධ ක්ෂේත්‍රවල භාවිතා කරනු ලැබේ. සමාජ පද්ධතියක් සකස් වන්නේ පුද්ගලයන් හා සමාජ සංස්ථා වලිනි. එහෙයින් සමාජ පද්ධතියක් ලෙස හඳුන්වන්නේ පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් වලින් සැකසුණු එකිනෙකා අතර සම්බන්ධතා පවත්නා, එම සම්බන්ධතා එකිනෙකාගේ හැසිරීම කෙරෙහි බලපෑමක් කරන සමස්ථයකි. අන්‍යෝන්‍ය සම්බන්ධතාවය කාලය හා අවකාශය මත රඳා පවතී. පද්ධතියක් නිරතුරුවම වෙනස් වෙයි. එසේ වුවද කිසියම් අවස්ථාවක එය ස්ථිර බවින්ද යුතුය (සෝමානන්ද, 2018. 85). මේ නිසා පද්ධතියේ වෙනස් වීම ම එහි ස්ථාවර බවට හේතු වෙයි. සමස්ථය සැකසී තිබෙන කොටස් උප පද්ධති ලෙස හඳුන්වනු ලැබේ. සෑම උප පද්ධතියකට ම විශේෂිත වූ කාර්යයක් තිබෙන අතර, ඒවායේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සමස්ථයේ පැවැත්ම සඳහා වේ.

මෙම සම්බන්ධතාවය ශක්තිය හා තොරතුරු හුවමාරුව මත රඳා පවතී. කිසියම් උප පද්ධතියක ඇතිවන වෙනසක් මුළු පද්ධතියටම බලපෑමක් ඇති කිරීමට සමත්ය. පද්ධති එක් වී අධි පද්ධතියක් (Supersystem) සෑදේ. සමාජය අධි පද්ධතියකි. එය සකස්ව ඇත්තේ සමාජයේ මූලික ඒකකය වන මිනිසා, පවුල හා විවිධ ආයතන හා සංවිධානවල එකතුවෙනි. ඒවා පද්ධතීන්ය. පද්ධතියක කොටස් ද එනම්,

උප පද්ධතියක්ද සමහර විට පද්ධතියක් සේ සැලකීමට පුළුවන. පවුල පද්ධතියක් සේ සැලකිය හැකිය. එවිට එහි කොටස් වන සාමාජිකයින් එනම් මව-පියා, දරුවන් උප පද්ධතීන්ය. එහෙත් සාමාජිකයින් වෙන් වෙන් වශයෙන් ගතහොත් ඔවුන්ද පද්ධතීන් ලෙස සැලකිය හැකිය. සෑම පද්ධතියකමට කඩඉම් නැතහොත් සීමාවක් තිබේ. පද්ධතිය ක්‍රියාකරනුයේ එම සීමාව තුළ නැතහොත් කඩඉම තුළය.

පවුල පමණක් නොව ඕනෑම පද්ධතියක සම්බන්ධතාවයන් පද්ධතියේ සාමාජිකයින්ට අනුග්‍රහසම්පන්න නොවන සෑම විටම එම පද්ධතියේ බිද වැටීමක් සිදුවෙයි. එවැනි අවස්ථාවකදී එම පද්ධතියේ පැවැත්ම සපුරාලීම සදහා වෙනත් පද්ධතියක ආධාර අවශ්‍ය වේ. සමාජ වැඩ මැදිහත් වීම සිදුවන්නේ මෙම අවස්ථාවේදීය. සමාජ වැඩ නිරතුරුවම පද්ධතීන් අතර අනුග්‍රහසම්පන්න සම්බන්ධතාවයක් ගොඩනගනු ලැබේ. මෙම ලිපියේ අරමුණ වන්නේ පද්ධති න්‍යාය සමාජ වැඩ විෂයයේදී සහ ප්‍රායෝගිකව භාවිත වන ආකාරය විග්‍රහ කිරීමයි.

**පද්ධති න්‍යාය හා සමාජ පද්ධති පිළිබඳ සාහිත්‍යමය විග්‍රහය**

ආවෘත පද්ධති පරිසරය සමග සම්බන්ධතාවයක් නොපවත්වයි. විවෘත පද්ධති මෙන් පරිසරයෙන් යෙදවුම් ලබා නොගන්නා අතර බාහිර පරිසරය වෙත නිමවුම් ද ලබා නොදේ. වෙනත් අයුරකින් කිවහොත් ආවෘත පද්ධති, පරිසරය නිසා බලපෑමකට හෝ පද්ධතිය නිසා පරිසරය බලපෑමකට හෝ ලක් නොවේ. එවන් පද්ධති සංකීර්ණ භාවයෙන් අඩු වන අතර ක්‍රමයෙන් අක්‍රීය භාවයට පත් වේ. ප්‍රාථමික ජන සමාජවලට අත්ව ඇත්තේ මෙම ඉරණමයි. කෙසේ වුවද සම්පූර්ණයෙන්ම විවෘත හෝ ආවෘත පද්ධතිය (කොම්ප්ටන් හා ගැලවේ, 1979), පවුලක් පළමුවැන්නට නිදසුනක් වශයෙන්ද, නාගරික ජන සමූහයක් දෙවැන්නට නිදසුනක් වශයෙන්ද දක්වා තිබේ. පද්ධතියේ කොටස් අතර අන්‍යෝන්‍ය

සම්බන්ධතාවය යථා පරිදි නොමැති විට විසංවිධානයක් ඇති වේ. එය පද්ධතියක පැවැත්මට බාධකයකි. පවුලක අර්බුධයක් වේ නම් එවිට එය විසංවිධානය වූ පද්ධතියකි. අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වේ ( Monane, 1976).

සමාජ පද්ධතියක සිදුවන්නේ මිනිසුන් ද, කණ්ඩායම් ද අතර ශක්තිය හුවමාරු වීමකි. මෙම ගණිත ක්‍රියාවලියේදී ශක්තිය කෙලින්ම දැක ගැනීමට නුපුළුවන. එහෙත් ශක්තිය පවත්නා බව දැනගත හැකිය. එසේ දැනගක හැකි වන්නේ පද්ධති හා එහි කොටස් ක්‍රියාකරන අන්දම මගිනි. ඒ නිසා ශක්තිය යනු ක්‍රියා කිරීමට ඇති හැකියාව, ක්‍රියා කිරීම හෝ වෙනසක් සදහා ඇති බලය ලෙස විස්තර කළ හැක (ඇන්ඩර්සන් හා කාටර්, 1975). පුද්ගල පද්ධතියක ශක්තිය ආහාර, ශරීරයේ සැකැස්ම (සාමාන්‍ය ද, අසාමාන්‍ය ද) බුද්ධිමය හෝ සගයන්ගෙන් ලැබෙන මානසික ආධාර, සිය විශ්වාස හා ක්‍රියාවලට ලැබෙන සංස්කෘතික අනුමැතිය, සිය සමාජය විසින් හා සංවිධානයක නම් එහි සාමාජිකයන් විසින් පිළිගැනීම තම වටිනාකම හා ඒකාග්‍රතාවය පිළිබඳ තමාගේම හැගීම යන මුලාශ්‍රවලින් ලැබෙන බව පෙන්වා දෙයි (Anderson and Cater, 1975).

මේ අනුව පැහැදිලි වන්නේ පද්ධති න්‍යාය යනු සමාජ පද්ධති අතර අන්තර්ක්‍රියා ක්‍රියාවලීන්ගේ න්‍යායක් වන අතර ඒවා යම් විශාල සමස්තයක අඛණ්ඩ පැවැත්මට ඉඩ දීම සඳහා කාලයක් සමග එකිනෙකාට බලපෑම් කරන ආකාරය පැහැදිලි කරන න්‍යායක් බවය. පද්ධති වෙනස් වන්නේ තමන්ගේ ම තුලනයක් (balance) ප්‍රශස්ත නොවන නිසා හෝ වෙනත් පද්ධතිවල බලපෑම නිසා ය.

**සමාජ වැඩ හා පද්ධති න්‍යාය**

සමාජ වැඩවල දී පුද්ගල හැසිරීම් මෙන්ම පුද්ගලයා ජීවත්වන සමාජ පද්ධතියේ හැසිරීම්වල වෙනස්කම් හා චර්යාවන් පිළිබඳව අධ්‍යනය සඳහා සමාජ පද්ධති න්‍යාය යොදා ගනු ලැබේ. පින්කස් හා මිනහම් (1973) විසින් හඳුන්වා දී ඇති පද්ධති හතරකි.

1. විපර්යකාරක පද්ධතිය (Change Agent System)
2. සේවාලාභී පද්ධතිය (Client System &)
3. ඉලක්ක පද්ධතිය (Target System)
4. ක්‍රියාකාරී පද්ධතිය (Action System)

කොම්ප්ටන් හා ගැලවේ (1979) විසින් මෙම පද්ධති හතරට අමතරව තවත් පද්ධති දෙකක් එකතු කොට ඇත. ඒවා නම් වෘත්තීය පද්ධතිය (Professional System) හා ගැටළු හඳුනා ගැනීමේ පද්ධතිය (Problem Identification System) යනුවෙනි. මෙය විශේෂිත පද්ධතියක් ලෙස මෙම ලේඛයන් සලකා ඇත්තේ සමාජ වැඩකරුගේ පරිච, වෘත්තිය සාරධර්ම, දැනුම හා උප සංස්කෘතිය ද විසින් තීරණය කරන හෙයිනි. ගැටළු හඳුනා ගැනීමේ පද්ධතිය යනු සමාජ වැඩකරුගේ අවධානය සඳහා සේවාලාභියෙක් විය හැකි පුද්ගලයෙකු යොමුකරන පද්ධතියයි (Compton and Galaway, 1979). සාමාන්‍ය තත්ත්වයක් තුළ සමාජ වැඩ ක්‍රමය අවබෝධ කර ගැනීම සඳහා සාමාන්‍ය පදධති න්‍යායේ දායකත්වය සලකා බලනු ලැබේ ( Pincus and Minaham , 2023).

පද්ධති න්‍යාය, මූලික වශයෙන් සෑම පුද්ගලයෙකුම විවිධ පද්ධති තුල පැවැත්මක් ඇත. මෙම පද්ධති පුද්ගලයන්, පවුල, අසල්වැසියන්, පාසල, රැකියාව, නගර සහ අවසානයේ ජීවත්වන රට සහ සමස්තයක් ලෙස පෘථිවිය අයත් වේ. මෙම පද්ධති හැසිරීම් සහ අභිප්‍රේරණ පැහැදිලි

කිරීමට උපකාරී වන අතර එක් පද්ධතියක වෙනස් වීම් අනෙකුත් පද්ධතිවල සමතුලිතතාවයට බලපෑම් කළ හැක. මෙම අවබෝධය සමාජ වැඩකරුට සිය සේවාව කරගෙන යාමට උපකාරී වේ (ජෙරිකා මෝගන, 2022). සමාජ පද්ධතියක් යනු ඒකකයක් ලෙස සැලකිය හැකි සංස්කෘතික හා ව්‍යුහාත්මක මූලද්‍රව්‍ය වල අන්තර් පරායත්ත සමූහයකි. සමාජ පද්ධතියක් පිළිබඳ සංකල්පය වඩාත් වැදගත් සමාජ විද්‍යාත්මක මූලධර්ම වලින් එකකි. සමස්තය එහි කොටස්වල එකතුවට වඩා වැඩි බව පෙන්නුම් කෙරේ (ඇෂ්ලි ක්‍රොස්මන්). සමාජයක මිනිසුන් සම්බන්ධතා ලක්ෂණයන්ගෙන් හා රටාවකින් සංවිධානය වූ පද්ධතියක් ලෙස සැලකේ (සමාජ වැඩ වචන මාලාව කොම් ශබ්දකෝෂය).

සමාජ පද්ධතියක් යනු පුද්ගලයන්, කණ්ඩායම් සහ ආයතන අතර පවතින සුසංයෝගී සමස්ථයක් ගොඩනැගෙන සම්බන්ධතා ජාලයකි (විකිපීඩියා). සමාජ වැඩ වල පද්ධති න්‍යාය පදනම් වී ඇත්තේ පද්ධතියක් ලෙස එකට ක්‍රියා කරන විවිධ සාධක මගින් හැසිරීමට බලපෑම් ඇතිවේ යන අදහසිනි. මෙම සාධකවලට පවුල, මිතුරන්, සමාජ සැකසුම, ආර්ථික පන්තිය සහ නිවසේ පරිසරය ඇතුළත් වේ (සමාජ වැඩ බලපත්‍ර සිතියම). පවුල් පද්ධති න්‍යාය යනු පවුලක පුද්ගලයන් අතර සහ එම පවුල තැන්පත් වී ඇති සන්දර්භය අතර අන්තර්ක්‍රියා කෙරෙහි අවධානය යොමු කරන මානව ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගැනීමේ ප්‍රවේශයකි (වොට්සන්, 2012). පද්ධති න්‍යාය හෝමියස්ථිතික පද්ධති විස්තර කිරීම සඳහා ප්‍රබල ක්‍රමයක් සපයයි, එනම් ප්‍රතිපෝෂණ පාලිත නියාමන ක්‍රියාවලීන් මගින් නියාමනය වන බැවින්, මනොවිද්‍යාත්මක පර්යේෂණ සඳහා පද්ධති න්‍යාය ද ඉතා ප්‍රයෝජනවත් වේ (Schneider, 2001).

**සාකච්ඡාව**

## සමාජ පද්ධති (Social System)

සමාජ පද්ධතියක් වෙනත් පද්ධතියකින් වෙන් කර දක්වන්නේ කෙසේද? එහි සැකැස්ම හා ක්‍රියාකාරීත්වය මේ අතර ප්‍රධාන තැනක් ගනී. සමාජ පද්ධතියක් සකස් වන්නේ පුද්ගලයන්ගෙනි. එම පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතී. එහෙයින් සමාජ පද්ධතියක් ලෙස හඳුන්වන්නේ පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම්වලින් සැකසුනු, එකිනෙකා අතර සම්බන්ධතා පවත්නා, එම සම්බන්ධතා එකිනෙකාගේ හැසිරීම කෙරෙහි බලපෑමක් කරන සමස්ථයකි. මිනිසුන් අතර පවත්නා සම්බන්ධතා. අවශ්‍යතා අනුව වෙනස් කළ හැකි පරිදි විවිධ හේතු නිසා වෙනස් වන සම්බන්ධතා ය. ඔල්සෙන් (1968) “පද්ධතියක් එකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරීත්වයෙන් සැදුම්ලත් එක් සමස්තයක් වශයෙන් හඳුන්වයි.” සමාජ පද්ධතිවලට නිදසුනක් ලෙස පවුල, සංවිධාන ජන කොටස් සහ සංස්කෘතීන් පෙන්වා දිය හැක.

## විවෘත හා ආවෘත පද්ධති (Open and Closed System)

පද්ධති න්‍යාය විවෘත හා අවෘත පද්ධකි පිළිබඳව ද විස්තර කරයි. විවෘත පද්ධති තම කඩ ඉම් නැතහොත් සීමාවන්ගෙන් ඔබ්බට ගොස් පරිසරය සමග සම්බන්ධතා පවත්වන නමුදු ආවෘත නැතිනම් වැසුණු පද්ධතියකට එසේ කළ නොහැක.

- යෙදවුම් (Input)
- ක්‍රියාවලිය (Process)
- නිමවුම් (Output)
- ප්‍රතිපෝෂණය (Feedback)

පද්ධති න්‍යායේ වැදගත් සංකල්පයකි. විවෘත පද්ධතියක් පරිසරයෙන් යෙදවුම් ලබාගෙන ක්‍රියාවලියකට ලක්කොට, පරිසරයට නිමවුම් ලබාදෙයි. පරිසරය හා පද්ධති අතර පවත්නා සම්බන්දතාවය පද්ධතියේ පැවැත්මට මුලික වේ. මෙය නිදසුනකින් වඩාත් පැහැදිලිව විස්තර කිරීමට පුළුවන. රෝහලක් පද්ධතියක් සේ සලකා එම උදාහරණය සාකච්ඡා කළ හැක.

මෙහිදී පරිසරයේ යෙදවුම් ලෙස රෝගීන් (පරසරයේ යෙදවුම් අතර රෝහලට ලැබෙන සම්පත් ද වේ. එහෙත් මෙහිදී නිදර්ශනය සරල කිරීම පිණිස රෝගීන් පමණක් ගෙන ඇත. ඔවුනට ප්‍රතිකාර කිරීම පද්ධතියේ ක්‍රියාවලිය වේ. එම ක්‍රියාවලිය තුළින් නිමැවුමක් ඇති වේ. එනම් රෝගීන් නිරෝගී පුද්ගලයන් වීම. එම නිමැවුම් යළි පරිසරයට එක් වේ. ඒ අනූව පරිසරයෙන් පද්ධතියට පෝෂණයක ලැබේ. රෝගීන් නිරෝගී කිරීම නිසා රෝහලේ ක්‍රියාකාරීත්වය පරිසරය විසින් අගය කිරීමට පටන් ගනී. ඒ අනූව තව තවත් සම්පත් රෝහල කෙරෙහි යොමු කරනු ලැබේ. එමගින් පවත්නා තත්ත්වයට වඩා යහපත් සේවයක් ලබා දීමට හැකිවේ. මේ නිසා පද්ධතියේ ක්‍රියාවලියට ප්‍රතිපෝෂණය බලපෑමක් වේ. පද්ධතියේ කඩඉම් වලින් ඔබ්බට ගොස් විවෘත පද්ධතියක් ශක්තිය හා තොරතුරු හුවමාරු කරගනී. මානව පද්ධති වර්ධනය වී ක්‍රමික බවට හා සංකීර්ණ බවට පත්වන්නේ මේ හේතුවෙනි.

> “ආවෘත පද්ධති පරිසරය සමග සම්බන්ධාවයක් නොපවත්වයි. විවෘත පද්ධති මෙන් පරිසරයෙන් යෙදවුම් ලබා නොගන්නා අතර බාහිර පරිසරය වෙත යෙදවුම් ලබා නොගන්නා අතර බාහිර පරිසරය වෙත නිමවුම් ද ලබා නොදේ වෙනත් අයුරකින් කිවහොත් ආවෘත පද්ධති, පරිසරය නිසා බලපෑමකට හෝ පද්ධතිය නිසා පරිසරය බලපෑමකට හෝ ලක් නොවේ. එවන් පද්ධති සංකීර්ණ භාවයෙන් අඩුවන අතර ක්‍රමයෙන් අක්‍රීය

භාවයට පත් වේ. "ප්‍රාථමික ජන සමාජවලට අත්ව ඇත්තේ මෙම ඉරණමයි. කෙසේ වුවද සම්පූර්ණයෙන්ම විවෘත හෝ ආවෘත සමාජ පද්ධති නොමැත. ඇත්තේ සාපේක්ෂ වශයෙන් විවෘත හෝ ආවෘත පද්ධතිය (Compton and Galaway, 1979)"

ආවෘත පද්ධතියකට යෙදවුම් පරිසරයෙන් ලැබෙන නිසා පරිසරයෙන් පද්ධතියට, නිමැවුම් පද්ධතියෙන් පරිසරයට යැවෙන නිසා පද්ධතියෙන් පරිසරයට යැවෙන නිසා පද්ධතියෙන් පරිසරයටද බලපෑමක් ඇති වේ. එසේ වුවද මෙහිදී පද්ධතියේ අන්තර් ක්‍රියාකාරීත්වය සඳහා පරිසරයෙන් හෝ පරිසරයේ ක්‍රියාකාරීත්වය සඳහා පද්ධතියෙන් හෝ පූර්ණ බලපෑමක් ඇති වන බවක් අදහස් නොවේ. පද්ධතියේ ක්‍රියාකාරීත්වය එහි උප-පද්ධති අනුව සිදුවෙයි. ක්‍රියාකාරීත්වය හරි හැටි අවබෝධ කර ගැනීම සඳහා පරිසරය මෙන්ම පද්ධතිය ද අධ්‍යයනය කළ යුතුය.

පරිසරයට අයත් වන්නේ කාලය, අවකාශය, ද්‍රව්‍යය, අවස්ථාව, චර්යා සහ සිද්ධීන්ය. පරිසරයේ සමහර අංශ පද්ධතියට බෙහෙවින් වැදගත් වන්නට පුළුවන. තවත් සමහර ඒවා අවැදගත් විය හැක. නූගත් ජන සමාජයකට පාසලක් නොවැදගත් වීමක්, රෝහලක් වැදගත් වීමත් නිදසුනකි. පද්ධතිය හා පරිසර යන දෙකම අධ්‍යයනය කිරමෙන් පද්ධතිය කෙසේ පරිසරයට අනුරූප වන්නේ ද වඩා සාර්ථක හැසිරීම කුමක්ද එය කෙසේ ඇති කළ හැකි ද යන කරුණු ද දැනගත හැකි වේ.

## සංවිධානය (Organization)

සංවිධානය යනුවෙන් අදහස් කරන්නේ සමස්ථයක් වීම සඳහා කොටස් (උප පද්ධති) කිසියම් පිළිවෙලකට සැකසීමය. එනම් පද්ධතිය ක්‍රියාකාරී වන සේ සැකසීමයි. මානව පද්ධතිවල මෙම සැකසීම මිනිසුන් විසින් හිතාමතාම කරනු ලැබේ. උදාහරණයක් ලෙස සෞරග්‍රහ මණ්ඩල

පද්ධතිය එසේ හිතාමාතා සැකසුවක් නොවේ. ස්වභාව ධර්මයා විසින් සංවිධානය කරනු ලැබුවකි.

මෝටර් රථයක් සැකසී ඇත්තේ කොටස් රාශියකිනි. මෙම කොටස් ක්‍රමානුකූලව අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇතිවන සේ නොතැබුවහොත් එය පණගැන්විය නොහැක. මෝටර් රථය පණගැන්වීමකට නම් අදාළ කොටස් වලට සිය නියමිත කාර්යය ඉටු කිරීමට හැකිවන අයුරින්ද, අනෙක් කොටස් සමග සම්බන්ධතා පැවැත්විය හැකි වන අයුරින් ද කළ යුතුය. මෙසේ සැකසීම මෝටර් රථයේ කොටස් සංවිධානය කිරීමයි. මිනිසාගේ ශරීරයේ ද පද්ධති කිහිපයක එකතුවකි. ස්වසන පද්ධතිය එයින් එකකි. උප පද්ධති වලට නාසය, ස්වසනාලය, පෙනහළු ආදිය අයත් වේ.

ස්වසනය හරිහැටි ක්‍රියාත්මක වී පුද්ගලයා නිරෝගී ශක්තිමත් පුද්ගලයකු වශයෙන් සිටින්නේ එම උප  පද්ධති සියල්ලක්ම සිය කාර්යයන් නිසි ලෙස ඉටු කරන විට පමණි. එසේ කිරීමට ඒවා සංවිධානය වී තිබිය යුතුය. දැඩි සංවිධානයකින් යුතු පද්ධතියක කොටස් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ද එකිනෙකා කෙරෙහි යැපීම ද වැඩි වන අතර අඩු සංවිධානයකින් යුතු පද්ධතියක කොටස් අතර සම්බන්ධතාවය හා එකිනෙකා අතර යැපීම ද ලිහිල් ය. මොහාන් (1976) විසින් "පවුලක පළමුවැන්නට නිදසුනක් වශයෙන් ද, නාගරික ජන සමූහයක් දෙවැන්නට නිදසුනක් වශයෙන් ද දක්වා තිබේ." පද්ධතියේ කොටස් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය යථා පරිදි නොමැති විට විසංවිධානයක් ඇති වේ. එය පද්ධතියක පැවැත්මට බාධකයකි. පවුලක අර්බුදයක් වේ නම් එවිට එය විසංවිධානය වූ පද්ධතියකි. එවිට පද්ධතියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට නොහැකි වේ.

**මායිම් (Boundaries)**

පද්ධතියක මායිම් නොහොත් සීමාවන් විස්තර කළ හැකි වන්නේ එම පද්ධතියේ කොටස් අතර හා පරිසරය සමග ඇති අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමෙනි. පද්ධතියේ මායිම් එහි ක්‍රියාකාරීත්වය තීරණය කරයි. එය එක්තරා අන්දමක පාලනයකි. සමාජ පද්ධතිවල මායිම් එහි ක්‍රියාකාරීත්වය තීරණය කරයි. එය එක්තරා අන්දමක පාලනයකි. සමාජ පද්ධතිවල මායිම් නොහොත් සීමාවන් තීරණය කිරීම අසීරුය. මන්ද ඒවා විවිධ අන්දමේ හා විවිධ තරාතිරමේ සම්බන්ධතා පරිසරය සමග පවත්වන හෙයිනි. සමාජ පද්ධතියක පරිසරය තීරණය කිරීම ද අසීරු ය. කෙසේ වුවද මායිම් හැඳින ගැනීම පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා පරිසරය සමග පවත්නා සන්බන්ධතා දැනගැනීමට උපකාරී වේ. මායිම් බල ප්‍රදේශයක් බඳුය. උදාහරණයක් ලෙස ඕනෑම ආගමික පූජක සංවිධාන මෙයට නිදසුනකි. සමාජ වැඩ වෘත්තිය තවත් නිදසුනකි.

මෙම පද්ධතීන්හි හැසිරීම තීරණය කරන නිශ්චිත නීතිරීති තිබේ. සම්බන්ධතා පැවැත් වෙන අන්දම ද තොරතුරු හුවමාරු කරන අන්දම ද පද්ධතියේ නීති රීති මගින් පැහැදිලි කර ඇත. එම නීති රීති පද්ධතිය තුළ මෙන්ම ඉන් පිටතට ශක්තිය හෝ තොරතුරු පහසුවෙන් ගලා නොයයි. විවෘත පද්ධති මායිම් වලින් ඔබ්බට ගොස් ශක්තිය හා තොරතුරු හුවමාරු කරගනී. පවුලේ සාමාජිකයයින් අතර ශක්තිය හා තොරතුරු හුවමාරුව පහසුවෙන් සිදු වේ. එම තොරතුරු හා ශක්තිය පවුල් පද්ධතියේ ක්‍රියාකාරීත්වය ප්‍රමාණවත් නොවන විට වෙනත් පද්ධතියක පිහිට පැතීමට සිදුවේ. එසේ වුවද එහිදී තොරතුරු හා ශක්තිය ගලා යාම තුළ තරම් පහසුවෙන් සිදුවන්නේ නැත.

**ශක්තිය (Energy)**

ඇන්ඩර්සන් හා කාටර් යන ලේඛකයන්ට අනුව සමාජ පද්ධතියක ශක්තිය;

> "සමාජ පද්ධතියක සිදුවන්නේ මිනිසුන් ද, කණ්ඩායම් ද අතර ශක්තිය හුවමාරු වීමකි." මෙම ගණිත ක්‍රියාවලියේදී ශක්තිය කෙලින්ම දැකගැනීමට නුපුළුවන. එහෙත් ශක්තිය පවත්නා බව දැන ගත හැකිය. එසේ දැනගත හැකි වන්නේ පද්ධති හා එහි කොටස් ක්‍රියාකරන අන්දම මගිනි. එනිසා ශක්තිය යනු ක්‍රියා කිරීමට ඇති හැකියාව, ක්‍රියා කිරීම හෝ වෙනසක් සඳහා ඇති බලය ලෙස විස්තර කළ හැක ( Anderson and Cater, 1975)."

පද්ධතිය හෝ එහි කොටස් නිසියාකාරව ක්‍රියා කිරීමට ශක්තිය සංවිධානය වී තිබිය යුතුය. ශක්තිය හුවමාරුව ක්‍රමානුකූලව විය යුතුය. එසේ වූ විට පද්ධතියේ ශක්තිය තව තවත් වැඩිවේ. නොඑසේ නම් ශක්තිය හීන වී පද්ධතිය අකර්මන්‍ය වේ. පද්ධතියකට ශක්තිය ලැබෙන මූලාශ්‍ර ගණනාවක් තිබේ.

> "පුද්ගල පද්ධතියක ශක්තිය ආහාර, ශරීරයේ සැකැස්ම (සාමාන්‍ය ද, අසාමාන්‍ය ද) බුද්ධිය හෝ සගයන්ගෙන් ලැබෙන මානසික ආධාර, සිය විශ්වාස හා ක්‍රියාවලට ලැබෙන සංස්කෘතික අනුමැතිය, සිය සමාජය විසින් හා සංවිධානයක නම් එහි සාමාජිකයන් විසින් පිළිගැනීම තම වටිනාකම හා ඒකාග්‍රතාවය පිළිබඳ තමාගේම හැඟීම යන මූලාශ්‍ර වලින් ලැබෙන බව පෙන්වා දෙයි ( Anderson and Cater, 1975)."

මේ අනුව ඉහත දැක්වූ පුද්ගලයකුට ලැබෙන ශක්තිය ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ. එනම්

1. ජීව විද්‍යාත්මව ලැබෙන ශක්තිය - ශරීරයේ සැකසීම, බුද්ධිය හා චිත්තවේගීය හැකියා.
2. පුද්ගලයා තුළින් ලැබෙන ශක්තිය - විශ්වාසය, ඇදහිලි හා ආත්ම විශ්වාසය.
3. බාහිර පරිසරයෙන් ලැබෙන ශක්තිය - ආහාර, තමාට සමාජයෙන් ලැබෙන අනුබලය, පිටුවහල හා පිළිගැනීම, බුද්ධිමය හා චිත්තවේගීය හැකියා.

**ආතතිය (Tension)**

මිනිසුන් අතර හෝ සංවිධානය තුළ ආතතිය ඇතිවීම අනර්ථකාරී දෙයක් සේ සැලකුවද පද්ධති න්‍යායේ "ආතතිය" සංකල්පය එයට වඩා වෙනස්ය. ඒ අනුව ආතතිය, සජීවි, අනුරූප වීමේ හැකියාව ඇති ඕනෑම පද්ධතියක තිබිය යුතු ලක්ෂණයක් සේ සැලකේ. ආතතියක් ඇති වන්නේ මන්ද, කෙසේද යන්න විමසිය යුතුය. කඩඉම් හරහා ශක්තිය හා තොරතුරු හුවමාරුව හේතුකොටගෙන ආතතිය ඇති වේ. එනම් ආතතිය ඇති වන්නේ පරිසරයේ යෙදවුම් හේතුවෙනි. එනිසා විවෘත පද්ධතියකට ආතතියෙන් මිදීමට නොහැක. "සෑම මිනිස් හැසිරීමකට තේරුමක් ඇත" පිළිගැනීම පද්ධති න්‍යායේ ආතතිය පිළිබඳ සංකල්පය හා සමග කොතරම් සමීප වන්නේ දැයි සලකා බැලීම වටී.

**සන්නිවේදනය (Communication)**

පද්ධතිය තුළ කොටස් අතර හෝ පද්ධතිය හා පරිසරය සමග හෝ පද්ධතිය හා තවත් පද්ධතියක් පද්ධති සමග තොරතුරු හුවමාරු කරගැනීම සන්නිවේදනය සේ සාමාන්‍ය සැලකේ. එහෙත් එය තවත් පුළුල් ව සලකන කල පද්ධති ව්‍යුහයේ ශක්තිය හුවමාරු කරගැනීම ද සන්නිවේදනයට ඇතුලත්ය. මේ අනුව සන්නිවේදනය එක්තරා අන්දමක ශක්තියක් ලෙස ද සැලකේ. පද්ධතියක ක්‍රමානුකූලව බව නැතිනම්

සංවිධිත බව සන්නිවේදනය මත රඳා පවතී. පද්ධතියේ කොටස් අතර සුහදතාවය හා සම්බන්ධතාවය ඇති වන්නේ එමඟිනි.

## ප්‍රතිපෝෂණය (Feedback)

ප්‍රතිපෝෂණය පද්ධතියක ක්‍රියාකාරීත්වයට බෙහෙවින් වැදගත් ය. එමෙන්ම අවශ්‍ය ය. එය කිසියම් ක්‍රියාවකට ලැබෙන ප්‍රතිචාරය පමණක් නොව එම ප්‍රතිචාරය අනූව පද්ධතියේ අනුරූප වීම ද ඇතුළත්ය.

> “පද්ධති න්‍යාය හෝමියස්ටීතික පද්ධති විස්තර කිරීම සඳහා ප්‍රබල ක්‍රමයක් සපයයි. එනම් ප්‍රතිපෝෂණ පාලිත නියාමක ක්‍රියාවලීන් සිදුවන පද්ධති. මානව ඉලක්ක මෙහෙයවන හැසිරීම් එවැනි ක්‍රියාවලීන් මගින් නියාමනය වන බැවින්, මනෝවිද්‍යාත්මක පර්යේෂණ සඳහා පද්ධති න්‍යාය ද ඉතා ප්‍රයෝජනවත් වේ Schneider, 2001).”

මේ නිසා පද්ධතිය සිය අරමුණ ඉටු කර ගැනීම සඳහා ස්වයං යොමුවීමක් ඇති කරගනුයේ ප්‍රතිපෝෂණයෙනි.

## අනුගතවීම (Adaption)

පද්ධතියක ඇති සුවිශේෂ ලක්ෂනයක් වන්නේ පවතින තත්ත්වයට ගැලපෙන අන්දමට ක්‍රියා කිරීමට එයට ඇති හැකියාවයි. මෙම හැකියාව විවෘත පද්ධතිද බෙහෙවින් දක්නට ලැබේ. එහෙත් මෙසේ අනුගත වීමට ඇති හැකියාව කිසියම් සීමාවක් තුල පමණක් සිදුවේ. අනුගත වීමට නොහැකි තත්ත්වයකට පත්වුවහොත් පද්ධතිය විනාශ වෙයි. පවුලේ ආදායම් උත්පාදකයා ලෙස කටයුතු කර පියා මිය ගියහොත් මව හෝ වෙනත් දරුවෙක් ඒ වගකීම් බාරගනු ඇත. එසේ නොකළහොත් එම පවුල බිඳ වැටේ. එහෙත් මවට හෝ දරුවාට එම වගකීම බාරගත හැකි වන්නේ කිසියම් සීමාවක් තුළය. සමාජයන්ද පවතින තත්ත්වයන්ට ගැළපෙන අයුරින් සකස් වෙමින් බිඳ නොවැටී

ආරක්ෂා වීමට උත්සාහ දරයි. එහෙත් එසේ නොහැකි අවස්ථාවලදී විප්ලව ආදිය මගින් සම්පූර්ණ වෙනස්වීමක් ඇති වේ. මෙයින් පැහැදිලි වන්නේ කිසියම් සීමාවක් තුළ ඕනෑම පද්ධතියකට වෙනස් වී අනුගත වීමට ඇති හැකියාවයි. සමාජ වැඩ වෘත්තියේ දී එක් උපකල්පනයක් වන්නේ පුද්ගලයාට වෙනස් වීමට ඇති හැකියාවයි. සමාජ වැඩ වෘත්තියේදි ද එක් උපකල්පනයක් වන්නේ පුද්ලගයාට වෙනස් වීමට ඇති හැකියාවයි. සමාජ වැඩ මැදිහත්වීම සිදුවන්නේ මෙම උපකල්පනය පදනම් කරගෙනය.

## සමතුලිතතාවය (Equilibrium)

පද්ධතියක් සෑමවිටම සමතුලිතතාවය රැකගැනීමට උත්සාහ ගනී. එසේ කරනුයේ පද්ධතියේ මනා පැවැත්ම සමතුලිත අවස්ථාවේදී තහවුරු වන බැවිනි, කෙසේ වුවද සමතුලිතතාවයට බාධාවක් වේ නම් සමතුලිතතාවය ඇති කර ගැනීම සඳහා පද්ධතිය අවස්ථානුකූලව අනුගත වෙයි. එහෙයින් අනුගත වීම සමතුලිතතාවය රැක ගැනීමේ ක්‍රියාදාමයකි. සමාජ වැඩ වෘත්තිය පද්ධති න්‍යාය උපයෝගි කර ගැනීමේදී උපකාර කරනුයේ සේවා ලාභියා කිසියම් හේතුවක් නිසා අසමතුලිතතාවයට පත්ව සිටින්නේ නම් යෝග්‍ය ක්‍රියා මාර්ගයක් තුළින් සමතුලිතතාවය ඇතිකර ගැනීම සදහාය.

## සමාජ වැඩ හා පද්ධති න්‍යාය (Social Work and System Theory )

සමාජ වැඩ යනු ගැටළු වලින් පීඩා විඳින සහ අවදානමකට ලක්විය හැකි පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන අභියෝග කළමණාකරණය සිය ජිවිතය පවත්වාගෙන යාමට උපකාර කරන වෘත්තියකි. සමාජ වැඩ කරුවෝ පුද්ගල, පවුල්, ප්‍රජා කණ්ඩායම් සහ ප්‍රජාව වෙනුවෙන් පෙනීසිටීම සහ ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා කැපවෙමින් කටයුතු කරන වෘත්තිකයන් පිරිසකි. සමාජ වැඩ

වෘත්තිකයන් සිය විද්‍යා විෂයයන් තුළින් ලබාගත් න්‍යායාත්මක දැනුම පදනම් කොටගෙන මිනිස් හැසිරීම අධ්‍යයනය කරනු ලැබේ. පද්ධතිය යන සංකල්ප සමාජ වැඩකරුවන්ට වැදගත් වන්නේ මන්දැයි පිචාඩ් (Pichard) නැමැති ලේඛකයා විස්තර කර ඇත. ඔහුට අනුව

> "(පද්ධති) සංකල්පය සමාජ වැඩකරුවන් ට ප්‍රයෝජනවත් වන්නේ අදහස් හා වස්තූන් අතර පවත්නා සම්බන්ධතාව කාලය හා අවකාශය අනුව දැකීමට එමඟින් ඉඩකඩ සැලසන හෙයිනි. සමාජ වැඩකරුවන් කුමන කාර්ය කොටසක් (භූමිකාවක්) යටතේ සිය සේවාලාභීන් සමග කටයුතු කළද ඔවුන් සමග පවත්නා සම්බන්ධතා දැනගැනීම සඳහා පද්ධති න්‍යාය විශේෂයෙන්ම උපකාරී වෙයි (Pichard, 1979)."

සමාජ වැඩ පරිචයේදී සමාජ වැඩකරු ක්‍රියාකරන පද්ධති හතරක් (4) පින්කස් හා මිනහන් විසින් හඳුනාගෙන තිබේ. ඒවා නම්,

1. විපර්යකාරක පද්ධති (Change Agent System)
2. සේවාලාභී පද්ධතිය (Client System)
3. ඉලක්ක පද්ධතිය (Target System)
4. ක්‍රියාකාරී පද්ධතිය (Acion System), ( Pincus and Minaham, 1973)

කොම්ප්ටන් හා ගැලවේ (1979) විසින් මෙම පද්ධති හතරට (4) අමතරව තවත් පද්ධති දෙකක් එකතු කොට ඇත. ඔවුන් පවසන්නේ සමාජ වැඩ පරිචයේදී සමාජ වැඩකරුට පද්ධති හයක (6) ක්‍රියාකිරීමට සිදුවන බවයි. ඔවුන් එකතු කර ඇති පද්ධති දෙක වන්නේ,

5. වෘත්තීය පද්ධතිය හා (Professional System)
6. ගැටළු හඳුනාගැනීමේ පද්ධතිය (Problem Identification System)

සමාජ වැඩ පරිචය වී තිබෙන්නේ සැලසුම් කළ වෙනසක් උදෙසාය. එම පරමාර්ථය ඉටුකරගැනීමට කටයුතු කරනුයේ සමාජ වැඩකරුවෝය. ඔහු කිසියම් නියෝජිත ආයතනයක හෝ සංවිධානයක සාමාජිකයෝ වෙති. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තීරණය වන එක් ප්‍රධාන සාධකයක් වන්නේ සංවිධානයක සාමාජිකයෝ වෙති. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තීරණය වන එක් ප්‍රධාන සාධකයක් වන්නේ සංවිධානය හෝ නියෝජිායතනයයි. ඒවායේ ප්‍රතිපත්ති, සම්පත්, පරිචය සඳහා දැඩි බලපෑමක් වෙයි. විපර්යකාරක පද්ධතිය ලෙස සැලකෙන්නේ සමාජ වැඩකරු හා ඔහු සාමාජිකයෙකු හෝ කොටස්කරුවෙකු වන යට කී ඔහු සේවයේ යොදවන සංවිධානය හෝ නියෝජිතායතානයන්ය. සමාජ වැඩකරුගේ හෝ ඔහුගේ සංවිධානයේ හෝ නියෝජිතායතනයේ සේවය අපේක්ෂා කරන පුද්ගලයා, පවුල, කණ්ඩායම හෝ ප්‍රජාව සේවාලාභී පද්ධතිය වේ.

ඉලක්ක පද්ධතිය වන්නේ විපර්ය කාරකයා පද්ධතිය විසින් වෙනසකට ලක් කරන පුද්ගලයන්ය. මේ නිසා බොහෝ අවස්ථාවල ඉලක්ක පද්ධතිය හා සේවාලාභී පද්ධතිය එකක්ම වෙයි. එහෙත් වෙනස් සේවාලාභී පද්ධතියෙන් ඔබ්බෙහි වෙනත් ජන කණ්ඩායමක් වෙත යොමු වූ විට එය ඉලක්ක පද්ධතිය බවට පත්වේ. උදාහරණයක් ලෙස, බාලාපචාරියෙකු සමාජ වැඩකරු වෙත අධිකරණයක් විසින් යොමු කරනු ලැබේ. ඔහුගේ අපචාරී තත්ත්වය වෙනස් කිරීම අරමුණු කරගෙන මැදිහත් වීම ඇරඹේ. මෙම ක්‍රියාවලියේදී අපචාරී බවට ළමයාගේ පවුලේ සාමාජිකයන් ද බෙහෙවින් සම්මාදම් වී ඇති බව සමාජ වැඩකරුට පෙනී යයි. ඒ නිසා පවුල් පද්ධතියේ ද වෙනසක් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. සමාජ වැඩකරු ඒ සඳහා ද යොමු වේ. මෙම නිදර්ශනයේ මුල් අවස්ථාවේදී සේවාලාභියා ඉලක්ක පද්ධතිය වී සිටියද අනතුරුව පවුල් පද්ධතිය ඉලක්ක පද්ධතිය බවට පත්වෙයි. විශේෂයෙන්ම සමාජ

සංවර්ධන ප්‍රවේශයකදී සමාජ වැඩ පරිචය සේවාලාභී පද්ධතිය සමග කටයුතු කරන්නේ ඒ තුළින් එයට වඩා පුළුල් වෙනත් පද්ධතියක වෙනසක් ඇති කිරීම පිණිස ය. මේ නිසා බොහෝ සෙයින්ම සමාජ වැඩ පරිචය ඉලක්ක පද්ධතිය වෙත යොමු වී තිබේ.

වෙනස ඇති කිරීම සදහා සමාජ සහාය ලබා ගන්නා සියළුම පුද්ගලයන් හා කණ්ඩායම් ක්‍රියාකාරී පද්ධතියට අයත් වේ. සමාජ වැඩකරු ද එයට අයත් ය. මේ අනුව සේවාලාභී පද්ධතිය හා ඉලක්ක පද්ධතියේ වෙනසක් ඇති කිරීම සඳහා කටයුතු කිරීමට හවුල් වන සියළුමදෙනා ක්‍රියාකාරී පද්ධතිය වේ. සමහර විට මෙම පද්ධතිය සමාජ වැඩකරුට පමණක් සීමා විය හැකි තරම් සීමිත විය හැකි අතර තවත් වරක පවුල, පාසල, පන්සල, ප්‍රජා සංවිධාන හෝ දේශපාලන පක්ෂ වැනි පුළුල් සංවිධාන කෙරෙහි විහිදෙන තරම් විශාලද විය හැකිය. සමාජ වැඩකරුවන්ගේ වෘත්තීය සංගමය, ඔවුන් පරිචය සඳහා සූදානම් කරන අධ්‍යාපන පද්ධතිය, සාරධර්ම හා වෘත්තීය පරිචය සඳහා අනුමැතිය ද වෘත්තීය පද්ධතියට අයත් වේ.

කොම්ප්ටන් හා ගැලවේට අනුව, “මෙය විශේෂිත පද්ධතියක් ලෙස මෙම ලේඛකයන් සලකා ඇත්තේ සමාජ වැඩකරුගේ පරිචය, වෘත්තීය සාරධර්ම, දැනුම හා උප සංස්කෘතිය ද විසින් තීරණය කරන හෙයිනි (Compton and Galaway, 1979).”

ගැටළුව හදුනාගැනීමේ පද්ධතිය යනු සමාජ වැඩකරුගේ අවධානය සඳහා සේවාලාභියෙක් විය හැකි පුද්ගලයෙකු යොමුකරන පද්ධතියයි. මේ නිසා මෙම පද්ධතියට පුද්ගලයෙකු හෝ කණ්ඩායමක්, සංවිධානයක් හෝ නියෝජිතායතනයක් අයත් විය හැක. ඉහත සඳහන් කළ නිදසුනේ බාලාපචාරියා සමාජ වැඩකරුගේ අවධානය සඳහා සේවාලාභියෙක් විය හැකි පුද්ගලයෙකු යොමුකරන පද්ධතියයි. මේ නිසා

මෙම පද්ධතියට පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් සංවිධානයක් හෝ නියෝජිතායතනයක් අයත් විය හැක. ඉහත සඳහන් කළ නිදසුනේ බාලාපචාරියා සමාජ වැඩකරු වෙත යොමු කළ අධිකරණය වෙත යොමු කළ ගැටළුව හඳුනා ගැනීමේ පද්ධතියයි.

සමාජ පද්ධති න්‍යාය සමාජ වැඩ පරිචය සඳහා නව පර්යාලෝකයක් ලබා දී ඇත. ඉහත සඳහන් කළ නිදසුනේ බාලාපචාරියා සමාජ වැඩකරු වෙත යොමු කළ අධිකරණය ගැටළුව හඳුනාගැනීමේ පද්ධතියයි.

සමාජ පද්ධති න්‍යාය සමාජ වැඩ පරිචය සඳහා නව පර්යාලෝකයක් ලබා දී ඇත. ඉහත සදහන් කළ පරිදි මැදිහත්වීම් සිදු කරන හා එයට සහභාගී වන හා සහභාගී කරවා ගන්නා අංශ, පද්ධති වශයෙන් හඳුනා ගැනීමෙන් ලබා ගන්නා තොරතුරු හා දැනුම සම්භාරය අවශ්‍ය හා ප්‍රමාණවත් පරිදි සකසා ගැනීමට පහසු වේ. පරිසරයට අනුරූපවීමේ වැදගත්කමක්, විවෘතභාවය පද්ධතියේ පැවැත්මට බලපවත්වන අන්දමත් මෙම න්‍යායේ පැහැදිලි කර දී ඇත. සමාජ සම්බන්ධතා පැවැත්වීමේදී මෙම සංකල්ප දෙකම උපකාරී වේ. සාර්ථක සමාජ සම්බන්ධතා නොමැති වීම නිසා පුද්ලගයෙකුගේ, කණ්ඩායමකගේ හෝ ප්‍රජාවකගේ සමාජීය ක්‍රියාකාරීත්වය දුර්වල වෙයි. එවන් අවස්ථාවකදී මැදිහත් විය යුතු අන්දම නිර්ණය කිරීම සමාජ වැඩකරුට පද්ධති න්‍යාය අනුසාරයෙන් පහසුවනු ඇත. ආතතිය රෝගයක් නොව එය පද්ධතියක අත්‍යවශ්‍ය අංගයක් සේ සැලකීම සමාජ වැඩ පරිචයේ පිළිගැනීම හා සිය සේවාලාභියා සිටින තැන ඉදිරියට ගෙන යාම යන සංකල්පය සමග සැසදේ.

**සාරාංශය**

පද්ධතියක් යනු කොටස් එකකට වැඩි ගණනකින් යුතු එම කොටස් අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයක් හා රැඳියාවක් ඇති එක් එක් කොටසට සුවිශේෂ කාර්යභාරයක් හිමි සමස්ථයකි. සමාජ පද්ධති න්‍යාය අනුව සමාජ සංවිධානය සලකා බැලීමත්, සමාජ වැඩ පරිචය සකසා ගැනීමත් වඩා පහසුය. පද්ධති න්‍යායේ හඳුන්වා ඇති විවෘත පද්ධති, ආවෘත පද්ධති, සංවිධානය, කඩ ඉම්, ආතතිය, ශක්තිය, සන්නිවේදනය, ප්‍රතිපෝෂණය, වෙනස, ස්ථාවර බව, කාලය, අවකාශය යන සංකල්ප සමාජ වැඩකරුගේ මැදිහත්වීමේ ක්‍රියාවලියේදී බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. තවද එම සංකල්ප සමාජ වැඩ මූලධර්ම සමග සැසඳේ. සමාජ වැඩ වෘතිය විවිධ ක්ෂේත්‍රයන්ගෙන් ලබාගෙන ඇති දැනුම අවශ්‍ය පරිදි ගොනු කර ගැනීමේ පහසුව පද්ධති න්‍යාය තුළින් සමාජ වැඩකරුට ලැබේ.

## ආශ්‍රිත මූලාශ්‍ර

සෝමානන්ද, ඕ. (2018) *සමාජ සංවර්ධන පරිචය සඳහා බෞද්ධ ප්‍රවේශයක්.* ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල

Anderson, Ralph. E., Cater Irle E. (1975) *Human Behavior in the Social Environment.* Aladine Publishing Co. Illinois.

Crossman, Ashley. (2017) *Research Gate.* Accessed 23 October, 2023. From

https://www.thoughtco.com/social-system-3026595

Compton, B. R., Galaway, B. (1979) *Social Work Processes Revised Edition*. The Dorsey Press, Homewood, Illinois.

Monane, J. H. (1976) *A Sociology of Human System Appleton*. Century – Croft, NY

Pincus, Allen., Minaham, Anne. (1973) *Social Work Practice, Model and Methods*. Peacock Publishers, Itasea, Illinois.

Pichard, Betty, J. (1979). *A Printer Revised Edition*, The Dorsey press, Homewood, Illinois.

"Social System" Vocabulary.com Dictionary, Vocabulary.com, Accessed 22 Oct. 2023. From https://www.vocabulary.com/dictionary/social system.

Social Work License Map, Accessed 22. Oct. 2023. From. https://socialworklicensemap.com/social-work-resources/theories-and-practice-models/systems-theory/

Schneider, M. E. (2001) *International Encyclopedia of the Social & Behavioral Sciences*. Accessed 22 Oct. 2023. https://www.sciencedirect.com/topics/psychology/systems.

Wikipedia, Accessed 22. Oct. 2023. From https://www.google.com/search?q=social+system+definition&oq=social+system+&gs_lcrp=EgZjaHJvbWUqBwgDEAAYgAQyBggAEEUYOTIHCAEQABiABDIHCAIQABiABDIHCAMQABiABDIHCAQQABiABDIGCAUQRRg8MgYIBhBFGDwyBggHEEUYPNIBCTM0MTM4ajBqN6gCALACAA&sourceid=chrome&ie=UTF-8#ip=1

Watson, W. H. (2012) *Encyclopedia of Human Behavior* (Second Edition), Accessed 22. Oct. 2023. From. https://waraqa.org/wp-content/uploads/2021/04/Encyclopedia-of-Human-Behavior-Second-Edition.pdf

# අද්‍යතන පවුල් සංස්ථාවෙහි මාතෘ භූමිකාව සහ සිංහල ගීතයඃ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්

ඩබ්ලිව්. එම්. නදීශා දර්ශනී වීරසිංහ

## හැඳින්වීම

පුද්ගලයා උපතේ සිට මරණය දක්වා යාවජීව සබඳතා පවත්වන පවුල මානව සමාජයේ කේන්ද්‍රීය සමාජ ඒකකයයි. පවුල නිර්මාණය වී ඇත්තේ මව සහ පියා යන භූමිකා යුගලය ප්‍රධාන කොට ගෙනය. එයින් පෙරදිග සමාජයේ මාතෘත්වයට හිමි වන්නේ සුවිශේෂ ආස්ථානයකි. පවුල් සංස්ථාවේ ප්‍රධාන සංරචකයක් වන මව පිළිබඳ අවධානය යොමු කිරීමට පෙර පවුල් සංස්ථාවේ ව්‍යුහය පිළිබඳ අවධානය යොමු කිරීම යෝග්‍යය.

පුද්ගලයාගේ ප්‍රභවාත්මක සාධකයක් වන පවුලේ ප්‍රභවය පිළිබඳ නිශ්චිත අනාවරණයක් නොමැති වුවද, එය මානව පරිණාමයේ සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස සැලකෙයි. පුද්ගල සමාජානුයෝජනයේ ප්‍රධාන කාරකයක් වශයෙන් භෞතික සහ ආධ්‍යාත්මික වශයෙන් පුද්ගලයා වෙනුවෙන් නෛතිකව බැඳී සිටින ක්ෂුද්‍ර සමාජ ඒකකය පවුලයි. පවුල, ව්‍යුහමය වශයෙන් මූලික පවුල සහ විස්තෘත පවුල වශයෙන් ප්‍රධාන ප්‍රවර්ග යුගලයකි. ගෝලීය සහ ජාතික වශයෙන් සිදු වූ සමාජ, ආර්ථික, දේශපාලන ගතිකතා හේතුවෙන් පවුලේ කාර්ය කොටස් සංකෝචනය සහ විමෝචනය වීමෙන් පවුලේ ව්‍යුහාත්මක විවිධතා ඇති විය. සිංහල සමාජයේ නූතන පවුල් සංස්ථාවෙහි නෛසර්ගික වටිනාකම පිළිබඳ අභියෝගාත්මක තත්වයක් නිර්මාණය වීම එහි ප්‍රබලම ගැටලුවයි. පවුල එහි ප්‍රභවය සහ විකාශනය පිළිබඳ සමාජ විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක අර්ථකථන සහ අද්‍යතන පවුල පිළිබඳ නිරීක්ෂණ ඇසුරින් අධ්‍යයනයට ප්‍රස්තුත වන පවුල පිළිබඳ මෙහිදී අවධානයට ලක් කෙරිණි.

ඒ ඒ සමාජවල භාෂාවල පවුල හැඳින්වීමට විවිධ නාම ව්‍යවහාර කරයි. සිංහල භාෂාවේ පවුල හැඳින්වීම සඳහා යොදන පර්යාය අතර කුටුම්භය, කුලගෙදර, පතිකුලය (අභයසුන්දර, 2003) වෙයි. ඉංග්‍රීසි භාෂාවෙහි "ෆැමිලි" ලෙස ද ද්‍රවිඩ භාෂාවෙන් "කුඩුම්බම්" ලෙස ද පවුල හඳුන්වයි.

පවුල යනු විවාහය ලේ ඥාතීත්වය හෝ දරුකමට හදාගැනීම යන බැඳීම්වලින් බැඳුණු පුද්ගල කණ්ඩායමකි. තනි නිවසක් පිහිටුවා ගනිමින්, සාමාන්‍යයෙන් අඹු සැමියන් දෙමාපියන් දරුවන් සහ සහෝදර සහෝදරියන් සමාජීය තත්තවයන්ට ගරු කරමින් එකිනෙකා සමග ක්‍රියා කරයි. පවුලේ සංවිධානාත්මක බව සහ අන්‍යොන්‍ය වගකීම යන ප්‍රධාන කරුණු යුගලය පවුල පිළිබඳ බ්‍රිටැනිකා විශ්වකෝෂ අර්ථකථනයෙහි සංක්ෂිප්තාර්ථයයි. පවුල සංවිධානාත්මක පුද්ගල එකතුවක් බව දක්වන්නේ එය විවාහය හෝ ලේ ඥාතීත්වය පදනම් කර ගත්තක් ලෙස දැක්වීමෙනි. නූතනයේ කුටුම්භයක් සකස් වීමෙහි ලා විවාහය නෛතික පදනම ලෙස සැලකෙන අතර අතීතයේ දී නෑනා- මස්සිනා විවාහය සහ විවාහක යුවලගේ දරුවන් පවුල් සංස්ථාවක් නිර්මාණයට පාදක වන ලේ ඥාතීත්ව සාධක විය. මෙහි අර්ථ දක්වන්නේ මූලික පවුල හෙවත් පවුල් සංස්ථාවෙහි කේන්ද්‍රීය අවයවලින් පමණක් සමන්විත න්‍යෂ්ටික පවුල පිළිබඳවයි. පවුල ව්‍යුහාත්මක පුද්ගල එකතුවක් පමණක් නොවේ. එය අන්‍යොන්‍ය යුතුකම් වගකීම්වලින් සැදුම්ලත් ඒකකයකි. අනෙකාගේ සමාජ තත්වය ගරු කිරීම සහ අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාකාරී වීම වැනි සමාජ ධර්මතා පවුලෙහි පැවැත්ම තහවුරු කරයි.

උක්ත අර්ථකථනයට බොහෝ දුරට සමානාර්ථයක් ඔක්ස්පර්ඩ් විශ්වකෝෂ  නිර්වචනයෙන් ද දක්වා තිබේ. ඒ අනුව දෙමව්පියන් එක් අයෙකු හෝ දෙදෙනෙකු සහ ඔවුන්ගේ දරුවන්ගෙන් සමන්විත කණ්ඩායම පවුල ලෙස පෙන්වා දී ඇත.  පවුලේ ව්‍යුහාත්මක සැකසුම

ස්ත්‍රී- පුරුෂ යුවලක් සහ ඔවුන්ගේ දරුවන් යන්න මින් සංක්ෂිප්ත ව විග්‍රහ කරයි. බ්‍රිටැනිකා විශ්වකෝෂ අර්ථකථනයේ සඳහන් පවුල සකස් වීමේ පදනම මෙහි ඍජුව ඉස්මතු නො කරයි. එහෙත්, දෙමව්පියන් බවට පත් වීමෙහි ලා සමාජය විසින් නෛතික හෝ සදාචාරාත්මක ව පිළිගත් ආකෘතියක් අවශ්‍ය හෙයින් විවාහයක් මගින් විධිමත් ව සංවිධානගත වීමද මෙහි අන්තර්ගතය. දෙමව්පියන් දෙදෙනෙකු හෝ එක් අයෙකු ලෙස දැක්වීමෙන් පරම්පරා දෙකකින් යුතු පවුලේ විස්තෘත ස්වරූපයක් ප්‍රකට කරයි.

පවුල මූලික සමාජ සංස්ථාව වශයෙන් සමාජ විද්‍යාවේ පර්යේෂණාත්මක අර්ථ දැක්වීම්වලට පදනම් වූවකි. ජෝර්ජ් පී. මර්ඩොක්ගේ අර්ථ දැක්වීම් ඒ අතර ප්‍රමුඛය. අවම වශයෙන් ලිංගික සබඳතා පැවැත්වීම සඳහා සමාජ අනුමැතිය ලත් ලිංග දෙකකට අයත් දෙදෙනෙක් ඔවුන්ගේ දරුවන් හෝ දරුකමට හදාගත් දරුවන්ගෙන් යුතු සමූහයකි (මර්ඩොක්, 1949).

පවුල යනු අවම වශයෙන් ලිංගික සබඳතා පැවැත්වීම සඳහා සමාජ අනුමැතිය ලත් ලිංග දෙකකට අයත් දෙදෙනෙක් ලෙස අර්ථ දක්වා ඇත්තේ, සමාජ සම්මතයට අනුව විවාහයෙන් සම්බන්ධ වන ස්ත්‍රී- පුරුෂ දෙපාර්ශවයයි. මෙරට සමාජ පරිසරය අනුව 'සමාජ අනුමැතිය ලත්' යන්නෙන් අදහස් කරන්නේ, නිසි වයස ප්‍රධාන ව සමාජ, සංස්කෘතික වශයෙන් සලකා බලන වෘත්තිය, කුලය වැනි සාම්ප්‍රදායික සහ අනන්‍ය සමාජ සංස්කෘතික පිළිගැනීම්වලින් සමන්විත යන්න යි. ජීවවිද්‍යාත්මක අවශ්‍යතාවක් වන ලිංගික සබඳතා පැවැත්වීමෙහි අයිතිය නීත්‍යානුකූල ව තහවුරු කරන්නේ ද සමාජ පිළිගැනීම ගොඩනැගෙන්නේ ද විවාහයෙනි.

ලිංගික සබඳතා පැවැත්වීම, ප්‍රජනනය සහ දරුවන්ගේ නීත්‍යනුකූල භාරකාරත්වය, අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙහි ආරක්ෂාව, සෞඛ්‍යය සුරක්ෂිත කිරීම උදෙසාද චින්තනමය වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන් වාරණයක් පැවතීම ශිෂ්ටාචාරවත් සමාජයක අවශ්‍යතාවක්ය යන්න ආසියාතික සංස්කෘතියේ පිළිගැනීමයි. නූතන ප්‍රවනතා සහ පුද්ගල නිදහස වැනි මතවාදවලින් මෙම තත්වය විවේචනය කළද මර්ඩොක් දක්වන ආකාරයට පවුල විධිමත් ලෙස ගොඩනගා ගත යුත්තකි. පවුල සමන්විත වන්නේ ස්වාමියා, භාර්යාව සහ ඔවුන් බිහි කළ හෝ දරු කමට හදා ගත් දරුවන්ගෙන් යුතු සමූහයකිනි. පවුලෙහි ක්ෂුද්‍රම අවස්ථාව වන න්‍යෂ්ටික පවුල මර්ඩොක් පවුල ලෙස දක්වයි. මෙම අධ්‍යයනයෙහිදී අවධානය යොමු වූයේද න්‍යෂ්ටික පවුල වෙතයි.

ඥාතීත්ව ලෙස අදහස් කරන්නේ මව, පියා, දූ දරුවන් සහ ආච්චි, සීයා, නැන්දා, මාමා වශයෙන් දැක්වෙන මූලික පවුලෙහි සහ විස්තෘත පවුලෙහි ලේ ඥාතීත්ව සහ විවාහය වැනි විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සම්බන්ධ වන සම්බන්ධතා ලෙස හැඳින්විය හැකිය. පුද්ගලයින් දෙදෙනා යනු පවුලක් නිර්මාණය වීමට බලපාන අත්‍යවශ්‍ය ස්ත්‍රී- පුරුෂ දෙපාර්ශවය වන ස්වාමියා සහ භාර්යාවයි. මේ අනුව ස්වාමි-භාර්යා දෙදෙනා පමණක් හෝ අවශේෂ ඥාතීන්ගෙන්ද සමන්විත ඒකකය පවුල වශයෙන් හැඳින්විය හැකිය. මෙම පාර්ශව එක්වී ගොඩනගන සංවිධානය සමාජය විසින් පිළිගනු ලබන තත්වයට පත් කිරීමට කිසියම් නෛතික හෝ සංස්කෘතිකමය යාන්ත්‍රණයක් මගින් එකිනෙකා සම්බන්ධ විය යුතු බව ද මෙයින් අදහස් කරයි.

උක්ත අර්ථ දැක්වීම් සියල්ලගේම පවුල ලෙස සඳහන් කර තිබෙන්නේ, මව, පියා, දූදරුවන්ගෙන් සැදුම්ලත් ව්‍යුහාත්මක ඒකකයකි. මූලික පවුල ලෙස දැක්වෙන මෙය නූතන ප්‍රවනතාවක් වන න්‍යෂ්ටික පවුල ලෙසද හැඳින්වේ. පවුලෙහි වාස්තවික සැකසුම මෙන්ම අභ්‍යන්තර

ක්‍රියාකාරීත්වය කැත්ලීන් ගෆ්, විලියම් ජේ. ගුඩ් සහ පීටර් මර්ඩොක් යන සමාජ විද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට ලක් විය.

"මානව සමාජයේ විධිමත් ආකාරයට වර්ධනය වන එකම සමාජ සංස්ථාව පවුල වේ"(ගුඩ්, 1964). සාපේක්ෂව සෑම නිර්වචනයකම පාහේ දැක්වෙන පවුලෙහි විධිමත් ස්ථාපනය මෙන්ම, එහි විකාසනය කෙරෙහිද අවධානය යොමු කෙරිණි. මූලික පවුල වශයෙන් පැවතියද, විස්තෘත ඒකකයක් වුවද එකිනෙකා අතර ගොඩනැගෙන අන්‍යොන්‍ය සබඳතාවලින් සහ ජීවිතානුභූතිවලින් සුසංවිධිතව පවත්වාගෙන යාම පවුල් සංස්ථාවක විධිමත් බවෙහි ලක්ෂණයකි. පවුලේ කෘත්‍යාත්මක අනන්‍යතා සහ අරමුණු එහි විධිමත් බව ඇති කරන සාධක වශයෙන් සමාජ විද්‍යාවේ සහ මානව විද්‍යාවේ සඳහන් කරයි. සංස්කෘතික සමාජවල සමාජ සම්මත මගින් පවුලෙහි අරමුණු තීරණය කිරීම සහ කාර්යය පැවරීම සිදු කරයි.

පවුල භාවමය සහ කාර්යමය වශයෙන් බැඳුණු සංස්ථාවක් වශයෙන් එහි විවිධ කෘත්‍යාත්මක පැවරීම් සම්බන්ධව ඒ ඒ නිර්වචනවල සංක්ෂිප්ත ව සඳහන් කර තිබිණි. පවුලේ කෘත්‍යයන් පිළිබඳ මැක් අයිවර්, කිංස්ලි ඩේවිස්, ඔක්බර්න් සහ නිම්කොෆ් වැනි සමාජ විද්‍යාඥයන් කිහිප දෙනෙකුම විශේෂයෙන් අදහස් දක්වා ඇත.

මර්ඩොක් විසින් පර්යේෂණාත්මකව සිදු කරන ලද අර්ථ දැක්වීම සුවිශේෂය." පවුල යනු පොදු වාසය, ලිංගික කෘත්‍යය, ප්‍රජනනය, සමාජානුයෝජනය සහ ආර්ථික සංයෝගීතාවය කාර්යය කොටගත්තකි"(මර්ඩොක්, 1949). පවුලේ කෘත්‍ය පිළිබඳ සාපේක්ෂ ව සාර්ථක කරුණු දැක්වීමක් මර්ඩොක් සිදු කර තිබේ. ටැල්කොට් පාර්සන්ස්, මර්ඩොක්ගේ අර්ථකථනයේ සාරාංශගත අරුතක් වශයෙන් පවුලේ ප්‍රධාන කාර්යභාර 4ක් දක්වා ඇත. ජීව විද්‍යාත්මක කාර්යය,

ආර්ථික කාර්යය, සංස්කෘතික කාර්යය සහ මනෝවිද්‍යාත්මක කාර්යය වශයෙන් එය සඳහන් කරයි (Parsons,1971ඃ උද්ධෘතයඃ පෙරේරා, 2014).

පාර්සන්ස් දක්වන සංස්කෘතිකමය සහ මනෝවිද්‍යාත්මක කාර්යය ඔස්සේ දෙවන පරපුර වෙත සංස්කෘතිය සම්ප්‍රේෂණය කළ යුත්තේ පුද්ගල සමාජානුයෝජන කාරකය වන පවුල මගිනි. "...පවුලේ සාමාජිකයන් භෞතික වශයෙන් නඩත්තු කිරීම දරුවන්ට සමාජ අනන්‍යතාව පැවරීම සමාජානුයෝනය සහ සමාජ පාලනය එහි කාර්යය වශයෙන් ඕනෑම සමාජයක පවතී යි (ගුඩ්, 1964). 1971 දී ටැල්කොට් පාර්සන්ස් සමාජයේ මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරන පවුලේ විශ්වීය කාර්යයන් දෙකක් ලෙස සමාජානුයෝජනය සහ පෞරුෂ වර්ධනය පිළිබඳ දක්වා තිබේ (Parsons,1971ඃ උද්ධෘතයඃ පෙරේරා, 2014). දෙමව්පියන් ප්‍රධාන පවුලේ වැඩිහිටියන්ගේ ජීවන පරිචය ඇසුරින් දෙවන පරම්පරාව වෙත ඉටු කරන සමාජානුයෝජනය ප්‍රධාන පවුලේ කෘත්‍යයන්ගේ සාධනීය ඵලාප්ති ලෙස සැලකිය හැකිය.

සිංහල සමාජයේ පවුල් සංස්ථාව පිළිබඳ අධ්‍යනයේදී පැහැදිලි වන්නේ සංස්කෘතික පැවරීම් මගින් මෙම කාර්යය සහ අරමුණු බලපැවැත්වෙන බවයි. සංස්කෘතික නියාමන අනුව සාරධර්ම, සම්මත වශයෙන් ද ආගමික වශයෙන් ගත් කල යුතුකම්- වගකීම් ලෙස ද මෙම පැවරීම් සිදු වෙයි.

පවුලේ සම්භවය පිළිබඳ අධ්‍යයන සමාජ විද්‍යා, මානව විද්‍යා සහ මනෝ විද්‍යා විෂයයන් සමග බැඳී පවතියි. එම අධ්‍යයන අනුව පවුල බිහි වී ඇත්තේ ගෝත්‍රික වනගත ජීවිත ගත කළ අවධිය නිමා කරමිනි. ප්‍රාග් මානවයාගේ ජීවිත සීමිත අවශ්‍යතා සහිත සරල සහ අවිධිමත් එකකි. වස්ත්‍ර, ස්ථිර වාසස්ථාන, විධිමත් මානව සබඳතා පිළිබඳ එකල අවධානය යොමු නොවිණි. ගණ ගෝත්‍ර ක්‍රමයට පෙර පැවති ආදි කල්පිත

අවධියේ දී ස්ත්‍රී- පුරුෂ සම්බන්ධතා අක්‍රමික ව පැවති බැවින් පවුලක් යැයි හැඳින්විය හැකි ඒකකයක් නොවිණි. " පවුල සමාජමය අංගයක් ලෙස පළමුවෙන්ම පැන නැංගේ ආදි කල්පිත සමාජයේදී ය" (කරුණාතිලක, 2011) යන්න ඇතැමෙකුගේ මතයයි. පවුලේ ස්වරූපයකට සමාන ආකෘතියක් එකල නිර්මාණය වන්නට ඇති අතර පසුකාලීනව ක්‍රමිකව වර්ධනය වන්නට ඇත.

ප්‍රාථමික සමාජානුයෝජනයේ මූලික සමාජානුයෝජනය සිදු වන්නේ මවගෙනි. පවුලක් තුළ පවතින මානව සබඳතා අතුරින් මව- පියා- දූ දරුවන් අතර වන සම්බන්ධතාව සුවිශේෂ ය. විවාහයේ අරමුණ වන්නේ ද ස්ත්‍රිය මවක වීම සහ පුරුෂයා පියෙකු වීම යි. මානව පරපුරේ පැවැත්ම තහවුරු කරන "මාතෘ පීතෘත්වය විවාහ ජීවිතයෙහි පරමාථීය යි"(ආරියපාල, 2014:296). යන්න තුන්කල්හි ම පවතින්නකි. දෙමව්පියන් සහ දරුවන් අතර නිර්මාණය වන සබඳතාව කායික සබඳතා අභිභවා ගිය භාවාත්මක සහ මානුෂීය බැඳීමකි. එය අන්‍යොන්‍ය වශයෙන් පවතින්නකි. ආගමික සහ සංස්කෘතික සදාචාරධර්ම අනුව දෙමාපියන් විසින් දරුවන් කෙරෙහි පැවතිය යුතු ක්‍රමවේදයක් ද, දරුවන් දෙමව්පියන් විෂයෙහි පැවතිය යුතු ක්‍රමවේදයක් ද වෙයි. මව සහ දරුවන් අතර ගොඩනැගෙන සබඳතාව පියා සහ දරුවන් අතර ගොඩනැගෙන සබඳතාව ජීවවිද්‍යාත්මක සහ සංස්කෘතික අනන්‍යතා සහිත වූවකි (රාමණායක, 2006). දරුවන් දෙමව්පියන් කෙරෙහි දක්වන ආකල්පය ද පවුල් සංස්ථාවේ සාරාර්ථය ඉස්මතු කරයි. නූතන සමාජ විපරිවර්තන හමුවේ එම බැඳීම බොහෝ දුරට උපකරණීය තත්වයට පත් වී තිබේ. ගීත රචකයින් ස්වකීය අනුභූති සඳහා ප්‍රස්තුත කර ගත් මව්-පිය දූදරු සබඳතාවයෙහි ස්වරූපය මානසික සහ ජීවවිද්‍යාත්මක තත්ව කෙරෙහි අවබෝධයෙන් යුතු ව සාකච්ඡා කිරීම මෙහි දී සිදු කරයි.

දරුවා මෙලොවට බිහි වීමටත් පෙර කළල අවධියේ දී ම ගොඩ නැගෙන මව්- දරු සබඳතාවය දරුවාගේ අභාෂක ලෝකයේ සියලු සංවේදන වටහා ගැනීමට තරම් සියුම් වූවකි. සිග්මන් ෆ්‍රොයිඩ් දක්වන පරිදි මානවයාගේ පැවැත්මේ සහ සංවර්ධනයේ සුවිශේෂ කායික මානසික සබඳතාවක් නිර්මාණය වන්නේ මව සමඟය (රාමණායක,2006). මානව දරුවෙකු බහ තෝරන වියේ දී පළමුව උච්චාරණය කරන්නේ ද 'අම්මා' යන පදය යි. ඇගේ ස්වභාවික කායික සැකසුම ද, මානසික සංවේදීතාව ද මිනිසාගේ ආරම්භක සංවේදන කෙරෙහි බලපෑම් කරයි. පූර්ව ප්‍රසව අවධියේ සිටම මව සමග පවතින සබඳතාව දරුවාගේ සාමාන්‍ය පැවැත්මට උපකාරයක් වන බව ද මනෝවිද්‍යාත්මක මෙන් ම ජීවවිද්‍යාත්මක අනාවරණයකි (පෙරේරා, 2002). ගීත රචකයා මෙම කරුණු පිළිබඳ සංවේදී වෙමින් ද, විචාරශීලී වෙමින් ද ගීත නිර්මාණය කර ඇත. මව දරුවා විෂයෙහි දක්වන ආදරය, සිදු කරන පරිත්‍යාග සහ සුරක්ෂිත කරන රැකවරණය වැනි මාතෘත්වයේ බහු විධ මාන ගීත මගින් හෙළි වන ආකාරය විග්‍රහ කරයි.

ජාතක කථා පොතෙහි සෝනන්ද ජාතකයෙහි මවගේ වගකීම ප්‍රකට වන වචන සතරක් දක්වයි. ඒ අනුව, දරුවා කෙරෙහි පළමුවෙන් ම ආදරය දක්වන්නී හෙයින් අම්මා ලෙස හඳුන්වයි. කාන්තාවක තුළ ප්‍රථම දාරක ස්නේහය හට ගන්නේ ඇය පිළිසිඳගෙන දොළදුක ඇති වීමත් සමග ය. ඇය දරුවා බිහි කරන හෙයින් ජනෙත්ති නමින් ද, දරුවා සතුටු කරන හෙයින් තෝසෙන්ති නමින් ද, දරුවාට කිරි ලබා දී නිසි කායික පෝෂණය ඇති කරන හෙයින් පෝසෙන්ති නමින් ද හැඳින් වේ. මව සහ දරුවෙකු අතර ගොඩනැගෙන සබඳතාවයෙහි සංකීර්ණත්වය ඉන් පැහැදිලි ය (උඩුහාවර, 2013).

ගීත රචකයින් ස්වකීය අනුභූති සඳහා ප්‍රස්තුත කර ගත් මව්- දූදරු සබඳතාවයෙහි ස්වරූපය, අද්‍යතන මුහුණුවර කෙරෙහි බලපාන

මානසික, ජීවවිද්‍යාත්මක සහ සමාජයීය තත්ව කෙරෙහි අවබෝධයෙන් යුතු ව සාකච්ඡා කිරීම මෙහිදී සිදු කරයි. සමාජ විපරිවර්තනයේ සංධිස්ථානයක් වූ ද, ගීත සාහිත්‍යයේ දියුණු අවධියක් වූ ද 70-80 දශකද්වය ප්‍රමුඛව වර්තමානය තෙක්ම කුටුම්භ තුළ මාතෘ භූමිකාව ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා ගීත රචකයින් යොමු වී ඇත.

## නූතන පවුල් ආකෘති සහ ගැටලු

පවුල් සංස්ථා සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්වීම් හේතුවෙන් පවුල් සංස්ථාවේ ව්‍යුහාත්මක සහ කාර්යමය වශයෙන් ගතික බවක් ඇති විය. මුල් අවධියේ ගණ ගෝත්‍ර වශයෙන් ඒකරාශී වූ මිනිසා පවුල් සංස්ථාවක් පිහිටවා ගත් පසුවද, විවාහක යුවල පමණක් නොව අවශේෂ ඥාති සමූහයාගෙන්ද සමන්විත විය. මර්ඩොක් දක්වන පරිදි විස්තාරිත පවුල යනු න්‍යෂ්ටික පවුල් දෙකකට වැඩි ගණනක් දරුවන් සමග එක්ව ජීවත් වීමයි (පෙරේරා, 2014: 90). ගෝලීය සමාජ වෙනස්වීම වික්ටෝරියානු සංස්කෘතිය සමග ලාංකීය සමාජයටද අන්තර්ග්‍රහණය වුවද, ලංකාවේද නූතන යුගයේ මුල් අවධියේදී පවා වැඩි වශයෙන් පැවතියේ විස්තෘත පවුල් ඒකකයි. "දීර්ඝ යටත්විජිත අවධියේදී මෙරට න්‍යෂ්ටික පවුල් ක්‍රමය ස්ථාපිත වුවද 1948 නිදහස ලබන විටත් ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල මුළුමනින්ම න්‍යෂ්ටික පවුල් නිර්මාණය වී නොතිබිණි" (Yalman, 1971). එහෙත්, මර්ඩොක් සිය පර්යේෂණයේ දක්වන පරිදි ලොව බහුලවම පැවති පවුල් වර්ගය ලෙස න්‍යෂ්ටික පවුල හඳුනා ගැනීමෙන් පැහැදිලි වන්නේ, ගෝලීය වශයෙන් පවුලේ න්‍යෂ්ටික ස්වරූපය සමකාලීනවම ව්‍යාප්ත වී තිබූ බවයි. 'එදාහෙළදිව', 'මධ්‍යකාලීන ලංකා සමාජය' වැනි ග්‍රන්ථවල දැක්වෙන ලාංකීය ඓතිහාසික සමාජයේ සුලබව පැවති විස්තෘත පවුල වර්තමානයේදී ඉතාමත් දුලබව නමුදු දක්නට ලැබේ.

ලිබරල්වාදයේ ප්‍රතිඵලයක් වූ ගෝලීයකරණයේ බලපෑම ගෝලීය වශයෙන් නව ලිබරල්වාදී සමාජ පරිවර්තන කෙරෙහි බලපෑම් කළේය. එහි ප්‍රතිඵලය වූයේ පවුලේ කෘත්‍යයන් ක්‍රමිකව ආයතනගත වගකීම් ලෙස විතැන් කර වැඩ ලෝකයේ තරුණ ශ්‍රම බලකාය පුළුල් කිරීමයි. සමාජානුයෝජනය, ආර්ථික සහයෝගීතාව වැනි අවශ්‍යතා නිල වශයෙන් පවුලෙන් දුරස් කෙරිණි. ඇතැම් විට සංස්කෘතික සමාජවලද ජීවවිද්‍යාත්මක අවශ්‍යතා පවා නොනිල වශයෙන් පවුල් සංස්ථාවෙන් පරිබාහිරව ඉටු කර ගන්නා තත්වයට පත් විය. ශ්‍රම විභජනය සහ ලිබරල් සමාජ ආකෘතිය සමග පවුලේ ව්‍යුහය කුඩා කිරීම අරමුණු කර ගත් නව ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලය වූයේ පවුලේ න්‍යෂ්ටික ආකෘති සකස් වීමයි. බොහොමයක් විචාරකයින්ගේ මතය වන්නේ "ඒක විවාහය සහ න්‍යෂ්ටික පවුල් ගොඩනැගීම යනු මානව චර්යාවේ අරටුව" (හරාරි, 2021:67) බවයි.

න්‍යෂ්ටික පවුල් ආකෘතිය විස්තෘත පවුලට සාපේක්ෂව සමාජගේ ගුණාත්මක සුබසිද්ධිය උදෙසා කළ බලපෑම සීමිතය. න්‍යෂ්ටික පවුල බිහි වීමෙන් සිංහල සමාජයේ පැවති පවුලේ විධිමත් ආකෘතිය වූ විවාහයේ ස්වරූපද වෙනස් විය. මුල් අවධියේ බහු භාර්යා, බහු පුරුෂ, බද්ධ විවාහය, එකගෙයි කෑම වැනි සංකල්ප පැවති බවට ඓතිහාසික මූලාශ්‍රයයවලින් අනාවරණය වෙයි (පීරිස්,2005, නොක්ස්, 2021). එම ක්‍රමවේද ඉවත් වී ඒක භාර්යා- ඒක පුරුෂ වශයෙන් විවාහ සංස්ථාව නියාමනය කෙරිණි. විශේෂයෙන් 1822 වර්ෂයේදී ප්‍රථම වරට විවාහය නීතිගත කිරීම සිදුවූයේද මේ යටතේ ය. න්‍යෂ්ටික ආකෘතියෙහි විවාහක යුවල සහ ඔවුන්ගේ දරුවන් පමණක් එක් නිවසක වාසය කිරීම සිදු විය. කාර්මික විප්ලවය මගින් යාන්ත්‍රීකරණය වූ සමාජ පරිස්ථිතිය තරගකාරී අවශ්‍යතා සහ ශ්‍රම බලකායක් වෙත සීඝ්‍රයෙන් ගමන් කිරීම මෙයට බලපෑ ප්‍රධාන හේතුවකි. ජීවින්ගේ මානව අවශ්‍යතා ද්විතියක තත්වයක ලා

සලකන පරිභෝජනවාදී ක්‍රමවේදයේ කාල්මාක්ස් පැවසූ ධනේශ්වරය බලයට ඒමත් සමග පවුලේ අනවරත බලාපොරොත්තු සහ සංකීර්ණතා ඇති විය.

නූතන න්‍යෂ්ටික පවුල ස්ථාපනය කාර්මික සමාජ අවශ්‍යතා කෙරෙහි පිටුබලයක් වුවද විවිධ අභියෝගයන්ට මිනිස් සමාජයට මුහුණ දීමට හේතුවක් වූ බව පෙනෙයි. විස්තෘත පවුලට සාපේක්ෂව න්‍යෂ්ටික පවුලේ ගණය සහ ගුණය අවම අගයක් ගන්නා බව විචාරක මතයයි. නිදහස් මතවාද සහ නව ලිබරල්වාදී සමාජ ප්‍රවේශය මගින් පවුලේ අගයයන් ද්විතික තත්වයක ලා සැලකීම මෙයට හේතුවයි. වර්තමානය සමාජ ප්‍රවනතා හමුවේ පවුලේ අරමුණු සහ කෘත්‍යයන්ගේ වෙනස්කම් ඇති වී තිබේ. පුද්ගලයාගේ ජීවන ශෛලිය යාන්ත්‍රිකකරණයත් වීමෙන් පවුලේ ව්‍යුහාත්මක වෙනස්කම්ද නිර්මාණය වී ඇත.

මානව පරිණාමයේ ඉතිහාසය අන්වේෂණය කළ යුවාල් නෝවා හරාරි දක්වන්නේ න්‍යෂ්ටික පවුල පිළිබඳ නූතන සංකල්පයේ පදනම වන ඒක ස්ත්‍රී- ඒක පුරුෂ විවාහයේ ස්වරූපය හේතුවෙන් ජෛවීය අවශ්‍යතා වාරණය කෙරෙන බවයි. "සදාකාලික ඒක විවාහය" පිළිබඳ ගුරු කුල අතර මත පදනම් වී ඇත්තේ දුබල සාධක මතය (හරාරි, 2021:68). ගුරු කුල මතය විවාදාපන්න වන්නේද මානවයාගේ ස්වරූපය සහ එම ආකෘතිය අතර ගැළපීමේ රික්තයක් පවතින හෙයිනි. එක් ස්ත්‍රියක් හෝ පුරුෂයෙකුගෙන් සිය කායික අවශ්‍යතා සංතෘප්ත කර ගැනීමට මිනිසාට නොහැකි බව ඓතිහාසික ලක්ෂණ ඔස්සේ මෙහි අවධාරණය කරයි. එහෙත්, මනසින් උසස් යන අර්ථය රැගත් මිනිසාගේ අසංතෘප්ත භාව ශිෂ්ට සම්පන්න මානව පරිණාමයේ වනචාරී බවින් මිදීමෙන් තහවුරු කරගත් අගනා තත්වයක් ලෙස සැලකිය යුත්තේ හුදෙක් සත්වයෙකු නොවී මිනිසෙකු වීම උදෙසාය. අවිධිමත් සහ අනාරක්ෂිත සමාජයක් වෙනුවට සපත්නිරෝෂයෙන් සහ වෛරී ආකල්ප රහිත මානව

පැවැත්මක් නිර්මාණයට කුටුම්භ සංරක්ෂණයේ විවාහ ආකෘතියට හැඩ ගැසීමට පෙරදිග සමාජයේ බොහෝ දෙනෙක් නැඹුරුව සිටිති. එහෙත් න්‍යෂ්ටික ඒකකයක සිදු වන නූතන බහුකාර්යතාව සමග එහි පැවතීමේ ධාරිතාව ඉක්මවා ගොස් ඇති බව නම් පැහැදිලිය.

න්‍යෂ්ටික පවුල් සංස්ථාව සමාජ, ආර්ථික, දේශපාලන ආදී තත්වයන්ටද බලපෑම් කරන්නකි."රාජ්‍ය බලය පියාගෙන් පුතාට උරුම වීම, පවුලේ සාමාජිකයන් කෙරෙහි එකිනෙකා කෙරෙහි දැඩි අයිතියක් පල කිරීමද න්‍යෂ්ටික පවුල් ආකෘතියේ ඵලයකි" (හරාරි, 2021:67). නූතන සමාජයේ ප්‍රබල අභියෝගයක් වී ඇති පෞද්ගලිකකරණයද මෙහි අතුරුඵලයකි. පෞද්ගලික අයිතිය ලිබරල් න්‍යායට පක්ෂපාතී වුවද මානව පැවැත්මට අභියෝග කරන තත්ව මෙරටද දෘශ්‍යමානය.

වර්තමානයේ න්‍යෂ්ටික පවුල මුහුණ දෙන සමාජ ආර්ථික දේශපාලන සංස්කෘතික අධ්‍යාපන සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර රාශියක පැතිරුණු ගැටළු රාශියකි. මානව සබඳතා හුදෙක් උපකරණීය තත්තවයට (අමරකීර්ති, 2017) පත් වීමට එම අභියෝගද හේතු වී ඇත. විසිවන සියවසේ මෙරට ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග සමාජයේ අධෝ ව්‍යුහය ලෙස කාල්මාක්ස් දැක්වූ ආර්ථිකයේ ප්‍රබල බලපෑම්වලට න්‍යෂ්ටික පවුල ලක් වී තබේ. පවුල් සංස්ථාව සංකීර්ණ වීමෙන් කෘත්‍යයන් විසරණය විය. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව වෘත්තීන්හි නියැලීමට සිදු වීම, මව්වරු විදේශගත වීම, කාර්යබහුල ජීවන රටාව හේතුවෙන් දෙමව්පිය දූදරු ස්වාමි භාර්යා සබඳතා දුරස් වීම, අනාරක්ෂිත බව, විවාහ සබඳතා පලුදු වීම වැනි උග්‍ර සමාජ ගැටලු ඇති වී තිබේ. දරුවන් සමාජානුයෝජනය කිරීම, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි ගැටලු රාශියකට පොදුවේ සමාජයක් ලෙස මුහුණ දෙමින් සිටියි.

**න්‍යෂ්ටික පවුලක පවතින මානව සබඳතා**

මානව සබඳතාවල පෘථුල සහ ප්‍රාරම්භක අවස්ථාව පවුල් සංස්ථාව ලෙස සැලකිය හැකිය. සමාජානුයෝජනයේ ප්‍රමුඛ කාර්යය ද හිමි ආයතනය වශයෙන් පවුල සබඳතා නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීමේ විශේෂඥතාව සහිත ආයතනයයි. වයස් භේදයකින් තොරව සමාජ සම්මතය අනුව සබඳතා ගොඩනැංවීමට එහි අවකාශය විවර වෙයි. භාව මූලික සබඳතා පද්ධතියක එකතුවක් වන පවුල් සංස්ථාවේ නියෝජිතයන් වන්නේ ද එකී පුද්ගලයන් ය. අතීත පවුලෙහි සහ නූතන න්‍යෂ්ටික පවුලෙහි මානව සබඳතා අතර පවතින්නේ විවිධත්වයකි. පවුලේ ස්වරූපය මෙන්ම සබඳතා රටාවේ ද විශේෂතා කාලානුරූපීව ඇති වී තිබේ.

මූලික පවුලෙහි ප්‍රභව අවස්ථාව වන විවාහය පදනම්ව එක් වන පුරුෂයා සහ ස්ත්‍රිය ස්වාමියා සහ භාර්යාව වශයෙන් ප්‍රථමයෙන් බැඳීම් ඇති කර ගනියි. පවුලේ අරමුණු පෙළ ගැසීම ආරම්භ වන්නේ ඒ සමගය. පසුව විස්තෘත පවුලකදී විවාහක යුවල සහ ඥාතීන් අතර කුටුම්භ සබඳතා නිර්මාණය වෙයි. මූලික පවුලක ඥාති සබඳතා අවශේෂ වශයෙන් පවුලෙන් පරිබාහිරව ක්‍රියාත්මක වෙයි. මව්පියන් සහ දූ දරුවන් අතර රුධිරමය සබඳතා ඇති වීම පවුලේ මානව සබඳතා වඩාත් හරයාත්මක තත්වයට පත් කිරීමට සමත්ය. දරුවන් සහ මව අතර ද, දරුවන් සහ පියා අතර ද වශයෙන් මෙම සබඳතාවය වර්ග කළ හැකි ය. ජීව විද්‍යාත්මක ව මව සහ පුතුන් අතර ගොඩ නැගෙන සබඳතාව සහ පියා සහ දූවරු අතර සබඳතාව වශයෙන් විරුද්ධ පාර්ශව අතර සබඳතා වඩාත් සමීප බව පෞරුෂ වර්ධනය සහ මානව සංවර්ධන අවධි පිළිබඳ දක්වන සිග්මන් ෆ්‍රොයිඩ් සඳහන් කරයි (රාමණායක, 2001). එය ජීවවිද්‍යාත්මක ස්වභාවයකි. දරුවන් දරුවන් අතර සහෝදර සබඳතා නිර්මාණය වෙයි. මූලික පවුලක ගොඩ නැගෙන මෙම මානව සබඳතා

පවුල තුළ පමණක් නො ව ඉන් පිටත පොදු සමාජය කෙරෙහි ද බලපෑම් කරයි.

පවුලේ කෘත්‍යයක් වන සමාජානුයෝජනයය පවුල් පරිස්ථිතයෙහි පවත්වන බන්ධූත්ව උපකෘතය. පවුල් සංස්ථාවක පවත්වන මානව සබඳතා භාවමය සහ කෘත්‍යමය වශයෙන් බැදෙයි. සමාජ විද්‍යාවේ තත්වය සහ කාර්ය කොටස් වශයෙන් දක්වන මෙම බන්ධූත්වය සංස්කෘතිය අනුව යුතුකම් සහ වගකීම් ලෙස අර්ථකථනය කරයි. සමාජයේ මනා පැවැත්ම තහවුරු කිරීමේ අරමුණින් ක්ෂුද්‍රම සමාජ ඒකකය විධිමත් සහ සහයෝගී සබඳතා ගොඩනැගීම වැදගත්ය.

දරුවා සහ දෙමව්පියන් අතර සබඳතාව නිර්මාණය වන්නේ කළල අවධියේ සිට ම ය. මව සමග කායික වශයෙන් පවතින බැඳීම සහ මව-පියා දෙදෙනා ම සමග ගොඩනැගෙන ජීවවිද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක සබඳතාවක් එහි පවතියි. දරුවා සමාජානුයෝජනය කිරීමේ ප්‍රමුඛ ම වගකීම දෙමව්පියන්ට පැවරෙයි. එයින් මව කෙරෙහි පවතින වගකීම ප්‍රබලය. දෙමව්පිය සබඳතාවය ළදරුවාගේ වර්ධනය, පරිණතිය, සමාජ චර්යාව, ලිංගික භූමිකා, ප්‍රජානන සංවර්ධනය යන සෑම අවධියක දී ම අත්‍යවශ්‍ය ය.

ළදරුවාගේ පරිසරයේ වැදගත්ම පුද්ගලයන් වන්නේ මව හා පියා යි. එබැවැන් මාපියන් හා ගත කරන ගුණාත්මක කාලය දරුවන්ගේ සමාජ ජීවිතයට මහෝපකාරී වෙයි. ... දරුවන් හා දෙමාපියන් අත ඇති වන යහපත් චිත්තවේගී බැඳීම (Attachment) ප්‍රධාන වශයෙන් ළදරුවාට කෑම්- බීම් දීම මත නො ව ඔහු කෙරෙහි දක්වන දයාව හා උණුසුම පදනම්කොට පවති යි (රාමනායක, 2001:132).

බුදු දහමෙහි සිඟාලෝවාද සූත්‍රය දෙමව්පියන් සහ දරුවන් අතර සිදු වන යුතුකම් සහ වගකීම් පිළිබඳ ව ද දක්වා ඇත. දෙමාපියන් විසින්

දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් ලෙස, දරුවන් පාප ක්‍රියාවලින් මුදවා ගැනීම, දරුවන් යහපත් ක්‍රියාවල යෙදවීම, දරුවන්ට හොඳින් ඉගැන්වීම, සුදුසු කල ආවාහ විවාහ කර දීම, සුදුසු කල දායාද පවරා දීම යන යුතුකම් ද, දරුවා විසින් දෙමව්පියන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් වශයෙන්, මවුපියන් පෝෂණය කිරීම, මව්පියන්ගේ සියලු කටයුතු කරදීම, මවුපියන්ගේ සිරිත් විරිත් සහ කුලපරපුර රැක ගැනීම, මව්පියන් මියගිය පසු ව පින් අනුමෝදන කිරීම ගැන දීඝ නිකාය 2-3 හි දක්වා තිබේ.

වර්තමානය වන විට දෙමව්පියන් සහ දරුවන් සබඳතා හුදෙක් පෝෂණය, කායික රැකවරණය වැනි තත්වවලට සීමා වී තිබේ. ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොර ව වෘත්තීය තත්ව මත පැවතීමට සිදු වීම දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැනි ආයතනගත හෝ බාහිර පුද්ගල ඇසුරක රැකවරණයට තබා යාමට සිදු වී තිබේ. දරුවන් සමග දෙමව්පියන්ගේ සබඳතා ඉතාමත් පටු සීමාවක රැඳුණකි. රට තුළ ඇති ජීවන අර්බුද විසඳා ගැනීමට සඳහා මානව ශ්‍රමයට ඇති වූ අධික ඉල්ලුම සමග ශ්‍රම සංක්‍රමණ සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. එයින් සිදු වූයේ පවුල් සංස්ථාවේ මානව සබඳතා දුරස් වීම හෝ අහිමි වීම යි.

විශේෂයෙන් මව විදේශගත වීම දරුවන් කෙරෙහි නිශේධාත්මක බලපෑම් ඇති කිරීමට හේතු විය. දරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය නිසි අවධානයට ලක් නො වීමෙන් ළමා අපචාර, ලිංගික අතවර වැනි තත්ව සමාජයේ සුලබ විය. සමාජ අනාරක්ෂිත බව සහ අවිධිමත් බවක් ඉන් ඇති විය. බිඳුණු පවුල් නැතහොත් දෙමාපියන්ගේ රැකවරණය ආරක්ෂාව අහිමි වූ පවුල් සංඛ්‍යාව ද ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමට මෙම තත්වය බලපා තිබේ (දැඩිගමුව, 2012).

වර්තමාන සමාජ ප්‍රවනතා හමුවේ න්‍යෂ්ටික පවුල අභියෝගයට ලක් වූවා සේ ම, පවුලේ සබඳතාවල හරයාත්මක බවද ප්‍රහීන විය. සමාජ

විද්‍යාත්මක නිර්ණ අනුව නූතන පවුල් සංස්ථාවෙහි පාර්සන්ස්, මර්ඩොක් සඳහන් කළ මානව අවශ්‍යතා නිසි අයුරින් සාධනය නොවීම මෙයට හේතුවයි.

1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග ධනේශ්වරය නැගී සිටීමෙන් මෙරට පංති විෂමතාව තදබල ලෙස නිර්මාණය විය. කුලය වැනි සමාජ විෂමතා වෙනුවට මතු වූ නව තත්වය මානව පැවැත්ම කෙරෙහි ගැටලුකාරී විය. පුද්ගලිකවාදය විසඳුමක් ලෙස හඳුන්වාදීමෙන් සියල්ල වෙළඳපළකරණය වීම නො නවත්වා සිදුවිය. ආර්ථික සහයෝගීතාව පවත්වා ගැනීමේ අරමුණින් නිදහස් වෙළඳපල ආර්ථිකය විසින් මෙහෙයවන ලාංකීය සමාජය අනවරත ප්‍රෝත්සාහයක නිරත වෙයි. ජීවන තත්වය ගොඩනංවා ගැනීමට වෘත්තීන් සහ ව්‍යාපාර වෙත දැඩි ව නැඹුරු වීමෙන් පොදු වාසය අත්හිටුවන ලද අවශ්‍යතාවක් බවට පත් විය. මානව ධර්මතා, සමාජානුයෝජනය දෙවන පරපුරේ ඌණ වූ අවශ්‍යතා බවට පත් වී තිබේ. පවුල් ව්‍යුහයන් සතු ව පැවති ආර්ථික සහයෝගීතාව පිළිබඳ ලීච් පුල්එළිය කෘතියේ දී දක්වන්නේ අතීත ලංකා සමාජයේ ශ්‍රම සහයෝගීතාවය උදෙසා කයිය නම් ක්‍රමවේදයක් පැවති බවයි.

නිදහස් සමාජ ක්‍රමයේ නිදහස් මතධාරීන් විසින් පවුල ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පවුලේ මූලික කාර්යයක් වන ලිංගිකත්වයද අවම සාධකයක් ලෙස සීමා රහිත වී තිබේ. ස්ත්‍රී- පුරුෂ භේදයකින් තොරව අත්විඳින සමාජ පීඩනය සහ කාර්යබහුලත්වයද පොදු වාසය පාලනය වීමද මෙයට හේතුවකි.

පුරාණ කොමියුන න්‍යාය පිළිබඳ යෝජකයන් තර්ක කරන ආකාරයට නූතන විවාහවල ලක්ෂණයක් බවට පත් වී ඇති බහු අනියම් සබඳතා සහ ඉහළ දික්කසාද අනුපාත පමණක් නොව, ළමයින් සහ

වැඩිහිටියන් යන දෙපිරිසම පෙළෙන විශාල ප්‍රමාණයක මානසික සංකූලතා යන මේ සියල්ල ඇති වී තිබෙන්නේ අපගේ ජීව විද්‍යාත්මක සැකැස්මට නොගැලපෙන ආකාරයේ න්‍යෂ්ටික පවුල් සහ ඒක විවාහක සම්බන්ධකම් තුළ ජීවත් වීමට මානවයන්ට බල කෙරී ඇති හෙයිනි (හරාරි, 2021:67).

ගැටලු තනි ව විසඳා ගැනීමට සිදු වීම සහ පුද්ගලයා බලාපොරොත්තු වන සාමූහිකත්වය අහිමි වීම මෙයට හේතු වී ඇත. සමාජ යාන්ත්‍රිකකරණය, පුද්ගල වාදය, නාගරීකරණය, ධනවාදය වැනි සමාජ විපරිනාම සියල්ල ම සමාජයේ පවුල් සංස්ථාවේ ස්ථාවරත්වය අභියෝගයට ලක් කරයි. පොදු වාසය මෙන්ම, ලිංගික අවශ්‍යතා, සමාජානුයෝජනය වැනි තත්වය හුදෙක් වාණිජමය අත්පත් කර ගැනීම්වලට සීමා විය. නාගරීකරණය සහ පරිභෝජනවාදී සංස්කෘතිය මානව සබඳතාවල ගුණාත්මක බව වෙනුවට වාස්තවික තත්ව මත පදනම් වීම සිදු විය.

විසිවන සියවසේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමඟ සමාජයේ අධෝ ව්‍යුහය ලෙස ආර්ථිකය ප්‍රබල තත්වයට පත් විය. පවුලෙහි මූලික අවශ්‍යතා සංකීර්ණ වී පවුල් සංස්ථාවෙහි කාර්යමය විස්තෘතියක් ඇති විය. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව වෘත්තීන්හි නියැලීමට සිදු වීම, මව්වරු විදේශගත වීම, කාර්යබහුල ජීවන රටාව හේතුවෙන් මව්පිය- දූ-දරු සබඳතා දුරස් වීම මත අනාරක්ෂිත බවක් නිර්මාණය වීම, විවාහ සබඳතා පලුදු වීම වැනි ගැටලු රාශියක් සමාජයේ ඇති වී තිබේ. දරුවන් සමාජානුයෝජනය කිරීම, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි ගැටලු රාශියකට ද සමාජයක් වශයෙන් මුහුණ දෙමින් සිටියි.

මෙම ලිපියෙහි දෙවනුව පර්යේෂණ ක්‍රමවේදය සහ නියැදිය ද, තෙවනුව අධ්‍යයනයේ සාකච්ඡාව යටතේ ගීතයෙන් ප්‍රතිනිර්මිත මාතෘ

භූමිකාවෙහි සාම්ප්‍රදායික ස්වරූපය, අද්‍යතන ස්වරූපය සහ නූතන සමාජයේ මාතෘ භූමිකාවත්, සිව්වනුව එයට හේතු වූ සාධකත්, පස්වන කොටසෙහි අධ්‍යයනයේ සමාලෝචනය සහ නිර්දේශත් අන්තර්ගත වෙයි.

**සාහිත්‍ය විමර්ශනය**

සිංහල ගීත සාහිත්‍යය පිළිබඳ පුරෝගාමී අත්හදා බැලීම් සහ න්‍යායාත්මක අවකාශ සලසමින්, ඓතිහාසික තොරතුරු අධ්‍යයනයන් සිදුකළ සුනිල් ආරියරත්නයන්ගේ 'ග්‍රැමෆෝන් ගී යුගය' (2017) ග්‍රන්ථයෙහි ගීතයේ විකාශනයේ සුවිශේෂ හැරවුම් ලක්ෂ්‍ය වූ ග්‍රැමෆෝනයේ ආගමනය, එහි විකාශනය සහ එකල ගීතයේ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්, ග්‍රැමෆෝන් ගීතයේ දුර්වලතා ආදිය පිළිබඳ පර්යේෂණාත්මක විග්‍රහයක් අන්තර්ගත වී ඇත. සිංහල ගීතයේ මූලාරම්භය, පවුල පිළිබඳ ලියවුණු ගීතයේ භාෂාව සහ ගී පද රචනය කෙරෙහි සංගීතයේ බලපෑම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඉවහල් විය. 'කැරොල් පසම් කන්තාරු' (1987) කෘති ද මෙම අධ්‍යයනය දිශාගත විය යුතු ආකාරය මෙන්ම, ඓතිහාසික කරුණු විග්‍රහ කර ගැනීමට උපකාර විය.

ගීතයේ ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රමුඛ අවශ්‍යතාවක් නොවූව ද ගීතයේ වස්තු විෂයාත්මක විකාශනය සහ එයට බලපෑ හේතු අධ්‍යයනය තුළින් නූතන ගී පද රචනයේ සාධනීය සහ නිෂේධනීය භාෂා භාවිතයන් සංසන්දනාත්මක ව අධ්‍යයනයට අවශ්‍ය පරිඥානය ලබා ගැනීමේ අවශ්‍යතාව පූරණය කරයි.

ලියනගේ අමරකීර්තිගේ 'පහන සහ කැඩපත' (2010) කෘතිය නවකතාව, කෙටිකතාව, ගීතය වැනි නූතන සාහිත්‍යයාංග කිහිපයක් පිළිබඳ න්‍යායික සහ තුලනාත්මක විග්‍රහයක් ද, පඨිතය ඔස්සේ සිදු කරන

සාහිත්‍යයමය කියවීම ද, කේමදාස සංගීතයේ ශිෂ්ටාචාරමය කාර්යභාරය විග්‍රහ කරමින් සංගීත රචනය සහ ගී පද රචනයේ විශේෂතාව විග්‍රහ කිරීම සහ ජනප්‍රියත්වය හේතුවෙන් ගීතයේ ගුණාත්මක බව අභියෝගයට ලක් වන ආකාරය පිළිබඳ කේමදාස සංගීතය ඇසුරින් සිදු කරන විග්‍රහය ද නිර්දිශ්ට නිබන්ධයේ ගීතයේ සාධනීය සහ නිෂේධනීය ලක්ෂණ තුලනාත්මක ව විමර්ශනයෙහි ලා උපකෘත විය.

ඔහුගේම 'නව කවි සලකුණ' (2017) කෘතිය කවිය සහ ගීතය අතර ඇති වෙනස විග්‍රහ කරගැනීමටත්, නූතන මානව සබඳතාවල ඇති යාන්ත්‍රික බව විග්‍රහ කරන සාහිත්‍යයේ ස්වරූපය න්‍යායාත්මක ව විමර්ශනය උදෙසා උපකල්පන ගොඩනගා ගැනීමටත් මග පෙන්වීම් සිදු කරන්නකි. ගීතය කවියේ දිගුවක් ය යන මතවාදය මෙන් ම, සෑම ගීතයක් තුළ ම කවියක් තිබේ ය, යන රත්න ශ්‍රී විජේසිංහයන්ගේ අදහස ද මත කවිය ආශ්‍රිත සක්‍රීය රසිකත්වය, කවියේ භාෂාව සහ නූතන සමාජ සන්දර්භය තුළ කවියේ සෞන්දර්යාලෝකය සහ මහජන තර්කනය පිළිබඳ සිදු කරන න්‍යායික සහ නූතන කවිය ඇසුරෙන් කෙරෙන සනිදර්ශනාත්මක විමර්ශනය ගීතය විචාරාත්මක අධ්‍යයනය උදෙසා මාර්ගෝපදේශකත්ව සපය යි.

කවිය සහ ගීත රසවින්දනය පිළිබඳ දුරවබෝධ සාහිත්‍යමය අධ්‍යයනයක් ලෙස සරත් විජේසූරියගේ 'කවිකම් මනරම්' (2019) කෘතියෙහි සන්දර්භය තුළ "අද ලියවෙන කවියක් නැත" යන විවේචනය සමස්ත නිර්මාණාවලිය කෙරෙහි යොමු කිරීම සැහැසි ය යන්න දක්වමින් නිර්මාණාත්මක කාව්‍ය අගයමින් කාව්‍ය රසවින්දනයෙහි ලා වැදගත් වන මූලික සිද්ධාන්ත පිළිබඳ සිදු කරන විවරණය සහ කවිය ඇසුරෙන් නිර්මිත ගීතය පිළිබඳ කෙරෙන සෞන්දර්යාත්මක විවරණ ප්‍රස්තුත නිබන්ධයේ නිර්මාණකරුවන්ගේ ගීත ද විග්‍රහයට හසුකරගත්තක් හෙයින්

පූර්ව අධ්‍යයනයක් ලෙස පර්යේෂණයේ දී නිර්මාණ විචාරය සඳහා න්‍යායාත්මක ශික්ෂණය කෙරෙහි වැඩි නැඹුරුතාවකින් සමන්විත වූවකි.

කවිය සිංදු සහ ගී වැනි විවිධ පද්‍යමය නිර්මාණයන්ගෙන් වෙන් වූ සාහිත්‍යාංගයක් ලෙස ගීතයේ අනන්‍යතාව වෙන් කර හඳුනා ගැනීමේ දී, පර්යාය නාම අර්ථ විවරණය උදෙසා 2015 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවක් ආශ්‍රයෙන් සකස් කරන ලද මනෝරි මනම්පේරිගේ සින්දු විමසුම' (2017) අධ්‍යයනයට ලක් කර ඇති මෙරට කලාංගයන්ගේ විකාශනය කෙරෙහි බලපෑම් කළ ආක්‍රමණ සංක්‍රමණ සහ සංස්කෘතික සංස්පර්ෂ ඇසුරින් කාව්‍ය ක්ෂේත්‍රයේ සිදු වූ විපරිනාම ද, ගීතය හැඳින්වීමේ දී යොදා ගන්නා සිංදු යන්නෙහි ප්‍රභවය ප්‍රශස්ති ගායනාවන්හි වන ගායනා විශේෂයක් හැඳින්වීම සඳහා යොදාගන්නා ලද්දක් බව ද, නර්තනය සහ දෙමළ භාෂාව ඇසුරින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කරමින් සිදු කරන නිරවුල් ව ගීතය යන්න විග්‍රහ කිරීමෙහි ලා උපයුක්ත විය.

සිංහල ගීතය, සංස්කෘතික නිරූපණයක් ලෙස ක්‍රියාකළ ආකාරය සහ ගීතයේ වෙනත් ශානරයක් ලෙස එය අධ්‍යයනය කළ ආකාරය පරිශීලනයෙන් ප්‍රස්තුත අධ්‍යයනය සිදුකළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පාතේගම ඤාණිස්සර හිමිගේ 'සිංහල ගීතය සහ අපේ සංස්කෘතිය' (2015) කෘතිය ද, ගීත පද රචනය ගීතයක සිදු කරන කාර්ය භාරයේ උත්කෘෂ්ටතාව අධ්‍යයනය උදෙසා සංගීතය සහ පද රචනය පිළිබඳ සංක්ෂිප්ත අවබෝධයක් වෙනුවෙන් ගීතය සහ එහි සංගීතය පිළිබඳ විස්තර කරන මඩවල එස්. රත්නායකගේ 'ගී සිංදු සාහිත්‍යය' (2017) කෘතිය ද වැදගත් විය.

මෙම අධ්‍යයනය භාෂා සාහිත්‍යය කේන්ද්‍ර කරගනිමින් සිදු වුව ද, ගීත පද රචනා නිර්මාණය සහ ඒවාට වස්තු විෂය වූ පවුල් සංස්ථාවේ විකාශනය, පවුල් සංස්ථාවක් තුළ වන මානව සබඳතා අධ්‍යයනයට අවශ්‍ය සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කිරීමට අවශ්‍ය වූ හෙයින් සමාජ විද්‍යා මූලාශ්‍ර සහ ඓතිහාසික මූලාශ්‍රය ද අධ්‍යයනය කිරීම අවශ්‍ය බව ආරම්භයේ සිට ම හැඟිණි.

මෙහිලා භාවිත සමාජ විද්‍යා මූලාශ්‍ර අතර සාහිත්‍යය සහ සමාජය අතර ඇති අවියෝජනීය බැඳීම, සාහිත්‍යයෙන් සමාජය යථාර්ථවාදී ලෙස නිරූපණය කරන ආකාරය සහ නූතන සමාජ අර්බුද සාහිත්‍යය තුළින් නිරූපණය කළ යුතු අකාරය සහ සමාජීය සාහිත්‍ය අධ්‍යයන ප්‍රවේශයේ ආරම්භය වැනි තොරතුරු අන්තර්ගත 'සාහිත්‍යය සමාජ විද්‍යාව' (2016) කෘතිය, සාහිත්‍යය සහ සමාජය අතර අන්‍යෝන්‍ය බැඳීම ඇසුරින් ගීතය විග්‍රහ කිරීම සඳහා න්‍යායාත්මක ප්‍රවේශ පිළිබඳ අවබෝධය ලැබීමට මූලික වශයෙන් වැදගත් වෙයි. පවුල නිර්වචනය සහ පවුලේ කෘත්‍යාත්මක වෙනස් වීම් පිළිබඳ නිලූකා විජේබණ්ඩාර විසින් ලියන ලද නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණයක් ලිපිය සමාජ විද්‍යාාත්මක ව පවුල නිර්වචනය, පවුලේ කාර්යභාරය සහ කාලානුරූපී ව සිදු වූ සමාජ විකාශනය සමග ප්‍රකට කළ නව්‍ය ස්වරූප ද නූතන පවුල පිළිබඳ ශාස්ත්‍රීය තොරතුරු සඳහා වැදගත් වූ පර්යේෂණ පත්‍රිකාවකි.

සමාජයේ කේන්ද්‍රීය සංස්ථාවක් වන පවුල පිළිබඳ ඓතිහාසික පසුබිම හා ලාංකේය සමාජ පසුබිම පිළිබඳ අධ්‍යයනයේ දී ඇම්. බී. ආරියපාලගේ 'මධ්‍යකාලීන ලංකා සමාජය' (2014) 13 වන සියවස වැනි අතීතයක මෙරට සමාජ, දේශපාලන, ආර්ථික තොරතුරු විග්‍රහ

කරන්නකි. මවගේ භූමිකාව පිළිබඳ ඉන් අවබෝධයක් ලබා ගත හැකි විය. එයින් මෙරට ගෘහස්ත ජීවිතය, විවාහය, විස්තෘත පවුල් පසුබිම සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි ය. පුරාණ ලාංකේය සමාජයේ ඇඳුම් පැළඳුම්, ආගම ධර්මය, භාෂාව, කෑම බීම, වෘත්තීන් වැනි විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින් රචනා කර ඇති රොබට් නොක්ස්ගේ එදා හෙළ දිව ඩේවිඩ් කරුණාරත්න පරිවර්තනය (2021) පුරාණ සමාජ ක්‍රමය ක්‍රමයෙන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ලෙස සකස් වීම තෙක් ගමන් මාර්ගය සහ ඉන් සිදු වූ සමාජ චලයතා සහ මාතෘ භූමිකාව පිළිබඳ සංසන්දනාත්මක ව විශ්ලේෂණයට සුලබ ව භාවිතයට ගනු ලබන මූලාශ්‍රයකි.

## ක්‍රමවේදය සහ නියැදිය

ගීතයේ ප්‍රාරම්භක අවධියේ සිට ම කේන්ද්‍රීය සමාජ සංස්ථාව වන පවුලෙහි පවතින මාතෘ භූමිකාව වස්තු විෂය ලෙස යොදා ගෙන ඇති බව පැහැදිලිය. එම සියලු ගීත රචකයින් මෙහි සාකච්ඡා කිරීම දුෂ්කර කර්තව්‍යයකි. එහෙයින් අවධීන් කිහිපයකට අයත්, ගම සහ නගරයද, වෘත්තීය විවිධත්වයද, ස්ත්‍රී- පුරුෂ වශයෙන්ද නියෝජනය වන පරිදි ගීත යමුනා මාලිනි පෙරේරා, සුනිල් සරත් පෙරේරා, රත්න ශ්‍රී විජේසිංහ යන රචකයින් තිදෙනා නියැදිය වශයෙන් තෝරාගෙන තිබේ.

## සාකච්ඡාව

### මාතෘ භූමිකාවෙහි සමාජයීය ආනුභවිකත්වය සහ අගනාකම්

මෙම තත්ව සාම්ප්‍රදායික මාතෘ භූමිකාවේ දැකිය හැකි සහ මාතෘ භූමිකාව මගින් අපේක්ෂිත චර්යාව යි. එය අද්‍යතනයේ පූර්ණ වශයෙන් දැකීම අපහසු ය. දරුවා මෙලොවට බිහි වීමටත් පෙර කළල අවධියේ දී ම ගොඩ නැගෙන මව්- දරු සබඳතාවය දරුවාගේ අභාෂක ලෝකයේ සංවේදන වටහා ගැනීමට තරම් සියුම් වූවකි. සිග්මන් ෆ්‍රොයිඩ් දක්වන පරිදි මානවයාගේ පැවැත්මේ සහ සංවර්ධනයේ සුවිශේෂ කායික

මානසික සබඳතාවක් නිර්මාණය වන්නේ මව සමඟ ය (රාමණායක,2006). මානව දරුවෙකු බහ තෝරන වියේ දී පළමුව උච්චාරණය කරන්නේ ද 'අම්මා' යන පදය යි. ඇගේ ජීවවිද්‍යාත්මක අනන්‍යතා ද, මානසික සංවේදීතාව ද මිනිසාගේ ආරම්භක සංවේදන කෙරෙහි බලපෑම් කරයි. පූර්ව ප්‍රසව අවධියේ සිට ම මව සමග පවතින සබඳතාව දරුවාගේ පැවැත්මට උපකාරයක් වන බව මනෝවිද්‍යාත්මක මෙන් ම ජීවවිද්‍යාත්මක අනාවරණයකි (පෙරේරා,2002). ගීත රචකයා මෙම කරුණු පිළිබඳ සංවේදී වෙමින් ද, විචාරශීලී වෙමින් ද ගීත නිර්මාණය කර ඇත. මව දරුවා විෂයෙහි දක්වන ආදරය, සිදු කරන පරිත්‍යාග සහ සුරක්ෂිත කරන රැකවරණය වැනි මාතෘත්වයේ බහු විධ මාන ගීත මගින් හෙළි කරයි.

ජාතක කථා පොතෙහි සෝනන්ද ජාතකයෙහි මවගේ වගකීම ප්‍රකට වන වචන සතරක් දක්වයි. ඒ අනුව, දරුවා කෙරෙහි පළමුවෙන් ම ආදරය දක්වන්නී හෙයින් අම්මා ලෙස හඳුන්වයි. කාන්තාවක තුළ ප්‍රථම ආදරය හට ගන්නේ ඇය පිළිසිඳගෙන දොළදුක ඇති වීමත් සමග ය. ඇය දරුවා බිහි කරන හෙයින් ජනෙත්ති නමින් ද, දරුවා සතුටු කරන හෙයින් තෝසෙන්ති නමින් ද, දරුවාට කිරි ලබා දී නිසි කායික පෝෂණය ඇති කරන හෙයින් පෝසෙන්ති නමින් ද හැඳින් වේ. මව සහ දරුවෙකු අතර ගොඩනැගෙන සබඳතාවයෙහි සංකීර්ණත්වය ඉන් පැහැදිලි ය (උඩුවාහර, 2013).

මව සහ පියා අතර ජීවවිද්‍යාත්මක ව ගොඩනැගෙන සබඳතාවේ ප්‍රතිඵලයක් වශයෙන් දරුවෙකු බිහි වෙයි. මව සහ දරුවා අතර පළමු සබඳතාව නිර්මාණය කරන දරු කළලයක් පිහිටීම ස්ත්‍රියක කෙරෙහි ජීවවිද්‍යාත්මක ව අනන්‍ය වූ ශක්‍යතාවකි. ගීතයට පමණක් සීමා නොවනතථ්‍ය ලෝකයේ දී ද දර්ශනය වන ගැබිණි මවකගේ කැපවීමෙහි

දර්ශන මාත්‍රයක් 'මිණි බැඳි දොර' ගේය පද සංග්‍රහයෙහි ඇතුළත් පහත ගීතයෙන් රත්න ශ්‍රී විජේසිංහ ප්‍රතිනිර්මාණය කරයි.

මහරහත් ගමනින් යනෙන
දරු බර දරා කුසිනේ
පරපුරක අමරස පුරා
ළැම කිරි බරිනි නැමුනේ (විජේසිංහ, 2018)

දරුවෙකු පිළිසිඳ ගැනීම කායික මෙන්ම මානසික වශයෙන් ද ස්ත්‍රියකට විශේෂ අවස්ථාවකි. ඇය වෙනුවෙන් සිංහල සිරිත්විරිත් අනුව දොළදුක, ගබපෙරහර, අංගුලිමාල පිරිත වැනි විශේෂ සංස්කෘතිකමය පිළිවෙත් සමුච්ඡයක් පවති යි (ආරියපාල, 2014). සමාජයෙන් ඇයට විශේෂ අවධානයක් සහ ගෞරවයක් ලැබෙයි. වෛද්‍ය විද්‍යාත්මක ව පූර්ව ප්‍රසව අවධිය නමින් හඳුන්වන මෙම අවධියේ දී කායික සහ මානසික වශයෙන් මවක තුළ සිදු වන වෙනස්කම් සමුදායක් දක්වයි. ගෙදර බුදුන් ලෙස වන්දනා කරන මාතෘත්වය වෙනුවෙන් ඇය කායික ව මෙන්ම, මානසික ව ද සූදානම් වෙයි. දරු කළලයක් පිහිටි පසු ඇයගේ ආහාර පාන, ගමන් විලාසය තමන් වෙනුවෙන් නො ව දරුවාගේ සෞඛ්‍ය වෙනුවෙන් හැඩගස්වා ගනි යි. මවක විෂයෙහි පවතින පූජනීයත්වය "මහරහත් ගමනින්" ප්‍රතියමාන කරයි.

ස්ත්‍රියගේ ශරීරයේ කායික වශයෙන් වන අංගලක්ෂණ ඇයගේ සුන්දරත්වයට පමණක් නො ව මානව පරපුරේ පැවැත්ම වෙනුවෙන් සිදු වූ පිහිටීම් ය. පුත් කුමරු මවගෙන් කිරි බොනු දකින සිදුහත් කුමරුගේ මුවට යසෝදරාවත කවියා නංවන "මැණික් කරඬු කට ලා කිරි බොන කුමරු" (ගම්ලත් සහ වික්‍රමසිංහ, 1998) යන යෙදුම මාතෘත්වයේ උත්තම බව කැටිකොට ගත්තකි. "ගීත රචකයා දක්වන "ළැම කිරි බරිනි නැමුනේ" යන යෙදුමෙහි දාරක ස්නේහයේ අපරිමිතය ගැබ් වෙයි. "

පරපුරක අමරස" යනු ළදරුවාට අවශ්‍ය සියලු පෝෂක කොටස් මවගේ රුධිරයට මුසු වී කිරි බවට හැරීම යි. "ළයේ ගලා යන රුහිර කිරට හරවාලා, ලොව ම නිවන අම්මා" (පෙරේරා, 2019) ගීයෙහි අර්ථය ද මෙයට සාම්‍යය ය. මව් කිරි රසභාව පූර්ණ පෝෂකයකි. දරුවාගේ ස්නායු පද්ධතියේ සක්‍රීය බව ද කිරි උරා බීමෙන් සිදු වෙයි.

නූතන ගර්භිණියක මුහුණ දෙන කටුකාමය යථාර්ථය ගීතයේ දක්වන කරුණුමය යථාර්ථයට ගැළපිය නො හැකි ය. දෛනික ජීවිතය පවත්වා ගැනීමට වෙහෙසෙන කාන්තාවකට සාපේක්ෂ ව නූතන ගර්භිණියකගේ චර්යාව සුවිශේෂ නො වන හෙයින් ආනුභවික තත්වයක තැබිය නො හැකි ය. දෛනික වේතනය හෝ මාසික වේතනය වෙනුවෙන් දිවා-රාත්‍රී නො බලා වැඩෙහි යෙදිය යුතු යාන්ත්‍රණයේ ගර්භිණියට යැයි සුවිශේෂ නිදහසක් හිමි නොවෙයි. මව සහ දරුවා වෙනුවෙන් කාර්මික සමාජයෙන් විවේකයක් ලැබෙන්නේ ප්‍රසූතිය සඳහාය. වෙළඳපළ ආර්ථිකයක මවගේ සහ දරුවාගේ අවශ්‍යතා ස්වාමියාට තනිව සාධනය කළ නොහැකි අවස්ථා තිබේ. ඇය දරුවා බිහි වූ පසු ජීවන තත්වය සුසංවාදී ව පවත්වා ගෙන යාම වෙනුවෙන් ස්වකීය ශක්තියෙන් වාණිජ සමාජයේ සක්‍රිය විය යුතුය. තාක්ෂණික නූතනත්වය දරුවාගේ හදගැස්ම මසකට හෝ මාස කිහිපයකට වරක් නිරීක්ෂණය කරයි. එහෙත්, කිරි බරින් නැවෙන ගර්භිණියක යන්න සුපෝෂණීය තත්වයකට සංකේතයකි. ඔහුගේම නිර්මාණයක දැක්වෙන "කිරි ශිරාවෝ ඉල්පී කෘෂ ළැමට ඇදී එත්මැ යි" යන්න ප්‍රස්තුත යෙදුම අභිභවා තථ්‍ය යථාර්ථයට සමීප ගෝචර වන යෙදුමක් ලෙස අද්‍යතනයට සමීපය. මවකගේ අවිඥාන ලෝකය රචකයා ස්පර්ශ කළද, ඇයගේ විඥානය සමග තුලනය කළ හැකි තාත්වික ලෝකය ගීතයෙන් නිරූපණය කිරීමට උත්සුක නොවූ බව කිව යුතුය.

මවට දරුවා කෙරෙහි සෙනෙහසක් හටගැනීමට ඇයගේ සන්තුෂ්ටියද හේතු වේ. ගීත රචකයින්ට සුලබ තේමාවක් වන මව් ගුණ මෙහිද සාම්ප්‍රදායික දෘෂ්ටියෙන් විග්‍රහ කරයි. මවගේ කැපවීම සංවාදාත්මක ස්වරූපයෙන් නිර්මාණය කරන අවස්ථාවක් "මව සහ දුව" ගීතයේ නිරූපණය කරයි.

එන්නට පෙර ඔබ මෙලොවට
අම්මා හිටිය ද කියන්න
ඒ හින්දා දුවේ ඔබයි
ඒ රැජිනට හිමි ඔටුන්න ( විජේසිංහ,2018)

ස්ත්‍රියක් දියණියකව සිට මාතෘත්වය ලබන්නේ දරුවකුගේ උපත සමඟය. මාස නවයක් හෝ ආසන්න කාලයක් කුසෙහි ආරක්ෂා කර ලොව දරුණුතම වේදයිත මධ්‍යයේ මෙලොවට බිහි කළ ප්‍රේමයෙන්ද, තමන්ගේ මාතෘ පදවිප්‍රාප්තිය සනිටුහන් කළ හෙයින්ද ඇයට දරුවා කෙරෙහි පවතින්නේ තදාත්මීයත්වයකි. මවකගේ දාරක ස්නේහය ප්‍රමාණය කළ නොහැකිය. "මා වෙනුවෙන් වින්ද නොයෙක් -දුක් ගිනි නැත නිම්මා"(පෙරේරා, 1985) යන්න මවක දරුවෙකු වෙනුවෙන් දරුවා නොදරු අවධියේ සිදු කරන කැපවීම් හඟවයි. දරුවෙකුට දැකිය හැකි වන්නේ මවක දරුවෙකු වෙනුවෙන් සිදු කරන කැපවීම්වලින් අඩක් පමණි.

දිව රෑ දෙක නැතිව නින්ද
ළඟ හිටියා දැක්කෙ නැද්ද
මගෙ කෙහෙරැළි නිල් ඇස් දෙක
දැන් තියෙන්නෙ දුවට නේද ( විජේසිංහ,2018)

මාතෘත්වය යනු පරිත්‍යාගයකි. රත්න ශ්‍රී ගීතය පුරාම පිළිඹිබු කරන්නේ එයයි. දරුවා නොදත් මවගේ පරිත්‍යාගය මව ලවාම සියලු

දරුවන් වෙනුවෙන් ප්‍රකාශ කරවයි. දරුවන් වෙනුවෙන් මවගේ කැපවීම දිවා-රාත්‍රී භේදයකින් තොරය. " උදේ දිවා රැය කඳුළුවලින් ඉපදිලා..." (පෙරේරා, 2019) දරුවන්ගේ වේදනාව වඩාත් සංජානනය වන්නේ මවකටය. ජීවිතයෙන් ජීවිතයක් ගෙනදී ආකර්ෂණීය පරිද්දෙන් වැඩෙන විට මවගේ ශක්තීන් ක්‍රමෙන් හීන වෙයි. දන්ත, කේෂ, ඡවි ආදී පංච කල්‍යාණය ස්ත්‍රියකගේ සුරූපී බව නිර්ණය කිරීමෙහි ලා අතීතයේ සිට පැවති අංගය. තාරුණ්‍යයේදී කාන්තාවක් සිය කායික සෞන්දර්යය වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කරයි. එහෙත් මාතෘත්වය වෙනුවෙන් ඇය සියල්ල පරිත්‍යාග කරයි. මාතෘත්වය සියලු ආශාවන් අත්හැරීමට තරම් පාරමිතාවක් වශයෙන් සලකති. මාතෘත්වය පිළිබඳ පූජනීයත්වයක් පවතින්නේද එහෙයිනි.

මවකගේ දාරක ප්‍රේමය සංවාදයෙන් හෝ විවාදයෙන් තීරණය කළ නොහැකිය. සමස්ත මානව ප්‍රජාවම ජීවිතය ලබන්නේ මාතෘත්වයේ කැපවීම් හේතුවෙනි. එහෙත්, අද්‍යතන පීඩාකාරී ජීවන ශෛලිය සෑම මවකටම උක්ත සද්භාවී ලක්ෂණ ප්‍රකට කිරීමට අවකාශ ලාබ නොදෙයි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ආයම්මලා ඇසුරෙහි දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නට මව්වරුන්ට සිදු වී තිබේ. ශිෂ්ටාචාරයේ බැඳීම තහවුරු කළ ආධ්‍යාත්මික ගුණය වෙනුවට, නූතන කාර්මික ධනේශ්වරය ශ්‍රමය සූරා ගැනීමට අනවරත ප්‍රෝත්සාහයක නිරත වෙයි. මාතෘත්වය ද්විතියික කොට, වෘත්තීය තත්වය ප්‍රමුඛ කරවීම කාර්මික සමාජයේ පෙළඹවීම් මගින් සිදු වන්නකි. ඇරිස්ටෝටලියානු ප්‍රතිනිර්මාණවාදී කලාව විසින් නිර්මාණය කර ගත් අනුකාරකත්වය ගීතයෙන් ද ප්‍රතිනිර්මාණය කිරීම ආනුභවික තත්වයක් ගීතයෙන් නිරූපණය වීමට බලපා තිබේ (අමරකීර්ති, 2017). එහෙයින් ගීතයේ යථාර්ථ ප්‍රතිනිර්මාණයට අවකාශ සීමා වෙයි. පරිභෝජනවාදය විසින් ස්ත්‍රියට පවරනු ලැබූ ප්‍රදර්ශනාත්මක ස්වරූපය ඇය පවත්වා ගත යුතු ය.

වියපත් වීම, රුව ගුණ හීන වීම කෘත්‍රිම ආලේපන, වියපත් බව ඖෂධ මගින් තාවකාලිකව සඟවා තබා ගැනීමට බොහෝ ස්ත්‍රීන්ගේ අවධානය යොමු වෙයි. නූතනයේ ඇතැම් මව්වරු තම දරුවන්ට නිසි කාල සීමාවෙහි නිසි පරිදි මව්කිරි හෝ ලබා දීමට මැළි වෙති. පරිභෝජනවාදී ලක්ෂණ උසස් කොට සලකන සමාජයක ආධ්‍යාත්මික මානව බැඳීම් තර්ජනයට ලක් වන්නේ නිතැතිනි. නූතන සමාජ විපරිවර්තනය විසින් ඇති කළ බලපෑම ගීත රචකයා ගීතයට අන්තර්ග්‍රහණය කර ගත්තේ නම් යථාර්ථයට වඩාත් සමමිතික වෙයි. හුදෙක් තථ්‍ය මාතෘත්වයේ ගෞරවනීය ප්‍රතිනිර්මාණයක් නොවී ප්‍රදර්ශනාත්මක භූමිකාවක් වශයෙන්ද නූතන මාතෘත්වය අවභාවිත වෙයි. මෙම ගීතයේදී රචකයාගේ සමාජ අන්වේෂණ ශක්‍යතාව යටපත් කර ඇත්තේ මාතෘත්වය පිළිබඳ රචකයා සම්ප්‍රදායික ගරු කිරීම හෝ පෞද්ගලික විඥානයයි.

මව ස්වකීය දරුවන් සැමටම එක සමානව සෙනෙහස පරිත්‍යාග කරන්නීය. සංස්කෘතිය හෝ සම්ප්‍රදායේ බාධක හේතුවෙන් මාතෘත්වය අභියෝගයට ලක් වෙයි. ඇතැම් ගෝත්‍රික සමාජවල ස්ත්‍රිය මුහුණ දෙන කටුකම අද්දැකීම වන්නේ දරුවන් බිහි වුණු පසු ඔවුන්ගේ ජන්ම නැකතෙහි අවාසනාව යැයි සලකා දරුවන් මරා දැමීම හෝ වෙනත් නිවසකට පිටුවහල් කිරීමේ ගෝත්‍රික ආකල්පයයි. මෙම තත්වයට සමාන තත්වයක් ලංකාවේද ගැහැණු දරුවන් සම්බන්ධව පැවති බව එදා හෙළදිව කෘතියේ දක්වා තිබේ (නොක්ස්, 2014). මාතෘත්වය තමන් බිහි කළ සැම දරුවෙකුටම සමානව සෙනෙහස දක්වන බව "හෙට ලොව ජයගනිමු" ගීයෙන් දැක්වෙයි.

පෙත්තෙන් පෙත්ත පිපි කුසුමකී
පෙති අතර දිසි හිඩැසකී
සුවඳින් එනමුදු අඩු නැතී
නුඹ මට කිසිදා වැඩි නැතී (පෙරේරා, 2015)

මවකගේ මාතෘත්වයේ අපේක්ෂාව සෞඛ්‍යවත් දරුවෙකු බිහි කිරීමයි. ස්වාධීනව ජීවිතය පවත්වා ගත හැකි පරිපූර්ණ කායික ස්වරූපය සහ යහපත් මානසිකත්වය දරුවෙකු සතු නොවීම මවට මානසික ව්‍යාකූලතා ඇති කරයි. දරුවා අසම්පූර්ණ කායික මානසික අවශ්‍යතා සහිත වීහ මවට අනාගතය අවිනිශ්චිතතාවක් ඇති කරයි. සමාජ අපවාදද භුක්ති විඳීමට සිදු වෙයි. එහෙත්, සතර බ්‍රහ්ම විහරණ දරන මාතෘත්වය කුමන ඌනතා පැවතිය දරුවෙකුට වුවද, උපේක්ෂාවෙන් දාරක ස්නේහය පරිත්‍යාග කරයි.

හැමදාම අම්මා පාරමිතාවට
පින් පුරවන්නට ආ
දේව දූතියකි නුඹ දියණි
ඒ මා මහ පින් කළ බැවිනි (පෙරේරා, 2015)

කායික වශයෙන් දුර්වලතාවක් සහිත දියණියක සිටින මවකගේ සංවේදී භාව සමුච්ඡයක් ගීත ඛණ්ඩයෙහි අන්තර්ගත ය. ඇය සිය දියණිය පිළිබඳ අනාගත අපේක්ෂාවක් දල්වා ගැනීමට දූරදර්ශී වන්නේ ඇයගේ අනාගත අභියෝගය වැටහෙන හෙයිනි. "පින් පුරවන්නට ආ, දේව දූතියක" ලෙස මාතෘත්වයෙන් දියණියව ආමන්ත්‍රණය කරයි. ආගමික ඉගැන්වීම් අනුව මෙවන් තත්වයක් කුශලාකුශල කර්ම විපාක මත පවරයි. ගතානුගතික සමාජය මෙය මවගේ වරදක් ලෙස සලකා ඇයට නින්දා කරයි. මව සහ දරුවා කෙරෙහි ලෝකයාගේ දෘෂ්ටිය ඍණාත්මක වුවද මව දරුවා ව ධනාත්මක ව උපේක්ෂාවෙන් දකියි. සමාජයේ පූර්ණ වශයෙන් තහවුරු කළ හැකි ළමා ආරක්ෂණයක් කිසිඳු යුගයක නොවීය. දරුවෙකුගේ පූර්ණ ආරක්ෂාව තහවුරු වන්නේ මවගෙනි. යමෙකුගේ කායික- මානසික ගැටලු සමාජයේ උපහාසයට ලක් වුවද, මව දරුවා සනසයි. සාගර පලන්සූරියගේ "අන්ධ ළමයා"කවි පන්තිය ගීතය සමඟ සිහිපත් වන්නකි.

ඇයි අම්මේ අඬන්නේ මේ කඳුළු සලා
මට දැනෙනවා යයි මගෙ අත් දිගට ගලා
නාඬන් අම්මෙ නාඬන් මම විහිළු කළා ...(පලන්සූරිය, 1967)

මව නිහඬව තම දරුවාගේ අඳ බව හේතුවෙන් පශ්චාත්තාප වෙයි. එහෙත්, දරුවාගේ මානසිකත්වය යහපත් අයුරින් පවත්වා ගැනීම වෙනුවෙන් ඇය ඍජු ආත්මවිශ්වාසයක් පවත්වා ගනියි. සමාජ යථාර්ථයේ විග්‍රහ නොකළ අඳුර ඇය ඉදිරියේ දෘශ්‍යමානය.

නූතනත්වය හමුවේ නොසැලෙන, මාතෘත්වයේ කෘතඥතාව අගයන උත්තමාවරු සැම තැන්හිම සිටිත් ද? යන්න තථ්‍ය යථාර්ථය සමග ගනුදෙනු කිරීමේදී නැගෙන පැනයකි. මානව සමාජ විඥානයේ සුභවාදී තත්වයක් ගීතයෙන් නිරූපණය කරයි. පොදු සාහිත්‍යයේ විශ්වීයත්වය ගීතයේ ගැබ් නොවන්නේ කවිකාවගේ මනෝභාව නිරූපණය කෙරෙහි අවකාශය වෙන් කර ගෙන තිබීමෙනි. "ගොළු දරුවෙක් වුණා කියලා අනේ අම්මේ මාව" ගීතය ප්‍රතිනිර්මාණය කරන රූපමය යථාර්ථය සමාජයේ යථාර්ථයයි. නූතනයේ ශේෂ වී පවතින සම්ප්‍රදායේ පෙළඹවීම් ඔස්සේ මාතෘත්වය තථ්‍ය වටිනාකම් අභියෝගයට ලක් කරයි. පෘථග්ජන මානසිකත්වය විසින් ප්‍රතික්ෂේප කරන කායික හෝ මානසික දුර්වලතා මාතෘත්වයේ උපේක්ෂාවෙන් වුවද දරා ගැනීමට අද්‍යතන සමාජ විපරිවර්තන හමුවේ මව්වරු අපොහොසත් වෙති. අතළොස්සක් මව්වරු ධනාත්මක ආස්ථානයක පැවතුණද, තරගකාරීත්වය සමඟ ධාවනයේ යෙදීමට අවශක්තියක් සහිත දරුවන්ගේ ඉරණම ළමා නිවාසයක හෝ අනාථ නිවාසයකට සීමා වන අවස්ථා ඉහළ යාම නූතන ප්‍රවනතාවකි. පරත්වාවරෝපණය මෙබඳු දරුවන්ගේ ජීවන ඛේදයිතයේ උච්ඡතම තත්වයයි. ගීතයෙන් සාදෘශ්‍ය සමාජ යථාර්ථය නිරූපණය නොකළ ද මෙවන් අවස්ථාවක ළමුන්ගේ අනාරක්ෂිත බව, සාක්ෂරතාව, ස්වාධීන පැවැත්ම තහවුරු කර ගැනීමට මාර්ගෝපදේශනය

ලබන්නන්ගේ ප්‍රවනතාව සීමා වීම වැනි ගැටලු රාශියක් සමාජයේ ඇති වෙයි. එය පැවැත්ම කෙරෙහි වන අර්බුදයකි.

ප්‍රබුද්ධ කෘතියේ අම්මා වෙනුවෙන් පිදෙන උපහාරයෙහි දැක්වෙන මවගේ ජීවිත පරිඥානය ගීත රචකයින් රසකටම අනුභූති සැපයීය.

ඇවිද ලඳු දෙනි කැලෑ බිම්වල
රැගෙන විත්තුන්හිරිය පන් කොළ
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිට ම මට කියා දුන් අම්මාට (සේකර, 1977)

ගමෙන් ඔබ්බෙහි ලෝකය පිළිබඳ අවිඥානික වුද, ඇය සතු ජීවිත පරිඥානය අපරිමිත විය. සේකරයන්ගේ ආභාසය ලද කවියෙකු මෙන්ම ගීත රචකයෙකු වන රත්න ශ්‍රී කවියාගේ ගීතවල ද, සේකරගේ අම්මාට සමාන මවක් හමු වෙයි.

අම්මා වැළලුතැන
හේනේ දෙණිකඩ ළඟ
මා හැඬුව කඳුළු ඇති
මට පෙවූ කිරිත් ඇති තවමත් ( විජේසිංහ, 2018)

මව මිය ගොස්ය. දරුවා වියපත්ය. එහෙත් මව් සෙනෙහස ජීවමාන ලෙස මතකයේ රැඳී තිබේ. ඇය සිදු කළ කැපකිරීම් එකිනෙක මනසට නැගෙයි. එහෙත් සිත වික්ෂිප්තව හැසිරෙයි. මාතෘ ස්නේහය කාලය සමඟ අමතක කළ නොහැකි අපරිමිත වූවක් බව කවියා ප්‍රකාශ කරන්නට උත්සාහ කරන්නේ,

ඇයි දෝ හොයන්න බැරි
ඇයි මට හඬන්න බැරි ( විජේසිංහ, 2018)

යන සංවේගජනක ප්‍රකාශයෙනි.

සොහොන පා මුල පැන් වැඩූ තැන
බිම බලාගත් නා ගහක් ඇති
කාත් කවුරුත් නැතැයි හිතුණම
නා ගහට දුක හිතෙනවා ඇති (විජේසිංහ, 2019)

මවගේ උණුසුම සදාකාලිකවම ප්‍රාර්ථනා කරන පෘථග්ජන මානසිකත්වය සුසානය අසල රැඳෙයි. අම්මාගේ සෙනෙහස ගායනා කරන්නට හෝ ආචාර පුදන්නට නොහැකිව නිහඬ ව සිටින්නේ නාග වෘක්ෂයක් මෙන් ගෞරවනීයවය. මානව සබඳතා උපකරණීය තත්වයට පත් වී ඇති හෙයින් ඇයගේ මානවීය ලක්ෂණ යාන්ත්‍රික සමාජයේ ප්‍රකට නොවේ. සමාජයේ කාර්මික සංකල්ප, යාන්ත්‍රික වීම මනුෂ්‍යත්වය කෙරෙහි සිදු කර ඇති බලපෑම පවුල් සංස්ථාව කෙරෙහි ඍජුව බලපා ඇත.

දරුවන් සමාජානුයෝජනය කිරීමේ පවුලේ කෘත්‍ය මව ඉටු කරන්නේ නැළවිලි ගීයේ සිටමය.

ඔබේ නැළවිලි ගීයදෝ
මා මුවින් ගිලිහෙන්නේ (විජේසිංහ, 2019)

"ළදරුවාගේ පරිසරයේ වැදගත්ම පුද්ගලයින් වන්නේ මව සහ පියායි" (හේමන්ත, 2001). මවගේ සෙනෙහස, දයාව සංලක්ෂිත නැළවිලි ගීය දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය සාධනය කරන්නේ නිතැතිනි. නැළවිලි ගීතය මාතෘත්වය සමඟ සංයෝජනය වන්නේ අතීතයේ සිටය. අම්මා දරුවා නිදන තුරු ගයන "දෝයි අම්මා-දොයි දොයියා, බායි අම්මා-බයි බයියා" (විජේසිංහ, 2019). නැළවිලි ගීයෙන් ලොවට ආදරය උගන්වයි. නිර්ව්‍යාජ සහ අල්ලසින් තොර ආදරයක් ලබා දෙන මවගේ නැළවිලි ගීය දරුවාට නිර්ව්‍යාජව ජීවත් වීමේ පූර්වාදර්ශය සංජානනය කරයි. කවියා ජනකවියේ ආභාසය ලබමින් ස්වකීය පබැඳුම නිර්මාණය

කිරීමෙන් ගීතයේ නව්‍ය ස්වරූපයක් ප්‍රකට වෙයි. ජංගම දූරකථනය හෝ රූපවාහිනිය වැනි විද්‍යුත් මාධ්‍යය සමඟ වඩාත් සමීප නූතන පරම්පරාවේ මව, නැළවිල්ල හෝ නැළවිලි ගීයේ හිමිකාරියක් බවට පත් නොවේ. මවගෙන් උරුම වූ ගීයක් අවිඥානයෙන් ගෙන ගයන්නට නොහැකි ය. නූතන මවට දිවා කාලය කාර්යබහුලය. එහෙයින්ම, රාත්‍රිය වෙහෙසකරයඃ නිදි බරය. තාක්ෂණයේ ආශිර්වාදයෙන් ළදරුවා නිදි සුව ලබයි. ආහාර ගනියි. මවට එහි නිනව්වක් නොමැත. විශේෂයෙන්ම දූරකථනය සහ රූපවාහිනිය වර්තමාන දරුවාගේ තනි නොතනියට හිඳියි. ගීතයෙන් නිරූපණය වන්නේ දශක කිහිපයකට පෙර යථාර්ථවත් වූ තත්වයක් හෙයින් එය වර්තමානයට හාත්පස වෙනස් සහ දුර්ලභ අවස්ථාවකි.

මව දරුවාව සිය උපරිම ශක්තියෙන් ආරක්ෂා කරයි. සමාජය පිළිබඳ උගන්වයි. ජීවිතයේ සත්‍ය ස්වභාවය ඇයට හෝ ඔහුට පහදා දෙයි.

ජීවිතයේ හැමදාමත්
මා ළඟ ම යි හිතන්න
ඒත් ඔබට සිදු වෙනවා
තනිව ම ලෝකය දිනන්න ( විජේසිංහ, 2018)

මව නොමැති ව තනිව ජීවත් වන ලෝකය පිළිබඳ සිතීමට හෝ බිය වන තරමට මව දරුවන්ට සමීප ය. එහෙත් ඇයගේ අවධාරණය පූර්ව සූදානමකි. දරුවන්ට අනන්‍ය වූ ජීවිතය නිර්මාණය කර ගැනීමට ඇය නිදහස ලබා දෙයි. තථ්‍ය යථාර්ථයේ මවකගේ අපේක්ෂාවද එයයි. නිදහස් සමාජයට කුඩා කල පටන් ම දරුවා අනුගත කිරීම සිදු වෙයි. මවකගේ සමාජානුයෝජන කාර්ය භාරයේ විශ්වීයත්වය රචකයා මෙහිදී විස්තර කරයි.

**මවගේ දූරදර්ශී බව**

මව දරුවාව නැණ සහ ගුණයෙන් වර්ධනය කරයි. දරුවාගේ ජීවිතය සුනිසි මගකට යොමු කරයි.

ගුරු ගෙදර යන පාර අහගෙන
පුංචි මා උකුලට වඩාගෙන
පයින් ගිය අම්මේ
හෝඩි පොත්වල පිපුණු මල් මට
ඔබ නෙළා දුන්නේ (විජේසිංහ, 2019)

දරුවන් මිනිසුන් කිරීම පමණක් නොව වියතුන් කිරීමටද මව උත්සාහවත් වෙයි. ඇයට අභියෝගයක් වී ඇති ලෝකය, නොදත් ශිල්පය දරුවන්ට සුහුරු කිරීම මවගේ අපේක්ෂාවයි. රචකයා දක්වන මව "ගුරු ගෙදර යන පාර අහගෙන" යන්නෙන් මවට ආගන්තුක අධ්‍යාපන මාර්ගයේ දරුවා රැගෙන යන බව කියවෙයි. ජීවන ගැටලු මධ්‍යයේ ස්වකීය ධෛර්යයෙන් දරුවාගේ සුබ විහරණයත්, ශිල්පයත් පිහිටු වීමට, කටුක බව වළඳන මව්වරු අද්‍යතනයේ දුලබ නො වෙති. දරුවන්ගේ හෙට දිනය පිළිබඳ චෛතසික ගැටුම් ඇති කරගනිමින් සංකීර්ණ කල්පනා මව දරයි. සාපේක්ෂ ව සුසංවාදී බවින් අඩු සමාජයක දරුවන්ට තනි ව ජීවත් වීමට සිදු වන හෙයින් සත්‍යය පහදා දීම මව වගකීමක් ලෙස සලකන්නේ එහෙයිනි. ඇය ස්වභාව සෞන්දර්ය ද, මානව දයාව ද ඉගැන්වූ පළමු ආචාර්යවරිය ලෙස සාහිත්‍යයේ වර්ණනයට ලක් කරයි. අද්‍යතනයේ පෙරපාසල, පාසල, විශ්වවිද්‍යාලයද ඉන් ඔබ්බටද දරුවන් සමඟම රැඳෙන මව ශිල්පයේ පරතෙරට ගිය විශිෂ්ටයෙකු නිර්මාණයට උත්සුක වෙයි. රචකයාගේ මෙම නිර්මාණය හුදෙක් මවක පිළිබඳ ආනුභවික යථාර්ථය ග්‍රහණයට දැරූ තැතක්ම නොවේ. සමාජ

නිරීක්ෂණය ඔස්සේ නිර්මාණය කරන මාතෘ භූමිකාවේ රූපමය යථාර්ථය ගැබ් කරමින් මවගේ ආධ්‍යාශය සමාජ විද්‍යාත්මකව ග්‍රහණය කර ගනියි.

සම්භාව්‍යය සාහිත්‍යයේද විවිධ මාතෘ භූමිකා සම්මුඛ වෙයි. පටාචාරා වෘත්තාන්තය ඒ අතුරින් සුවිශේෂය. සිය දෙමව්පියන්ගේ අණට අකීකරුව විවාහ වූ පටාචාරා ඛේදවාචක රැසකට මුහුණ දෙයි. පටාචාරා නව්‍යාකාරයෙන් ප්‍රතිනිර්මාණය කරන රචකයා "දිරිය මව- දියණිය" වශයෙන් ඇයව නම් කරයි.

කටුත් එක්ක පොර බදලා
මල් පෙති දැන් යකඩ වගේ
ලේ කිරි වන දවස ඒවි
නාඩා ගෙට වරෙන් දුවේ (විජේසිංහ, 2021)

දරුවන්ට ඉගැන්වීමට, අනන්‍ය වූ ජීවිතය සුතිසි පරිදි අත්කර දීමට මෙන්ම, අනවබෝධයෙන් සිදු කළ වරදට සමාව දීමටද මව පසුබට නොවේ. දියණිය ජීවන ගැහැට රැසකට මුහුණදී පීඩිතව පැමිණි විගස ඇයව නිවසට භාර ගන්නේ දිරිය කාන්තාවක් වශයෙනි. ස්වාමියෙකු නොමැතිව විවාහක දියණියක් යළි නිවසට පැමිණීම සංස්කෘතික සමාජයක ගැටලු රාශියක ආරම්භයකි. අම්මා විමසුවේ තනිව පැමිණීමට හේතුව පමණි. එයද දියණියගේ ආරක්ෂාව වෙනුවෙනි. ඇයට "නාඩා ගෙට වරෙන් දුවේ" යන ප්‍රකාශය නිර්ව්‍යාජව ප්‍රකාශ කළේ දියණිය පිළිබඳ සෙනෙහසිනි. ලෝකයෙන් කිසි විටෙක බලාපොරොත්තු විය නොහැකි කාරුණික සෙනෙහසක් මවක සතු වීම දෙවරක් නොසිතා ක්ෂමා කරවන එකම ශාන්තිවාදිනිය මව වීමට හේතුවයි. පවුල් සංස්ථාවක සුරක්ෂිතතාව ගොඩනැගෙන්නේද එබැවිනි. වර්තමාන සමාජයට අවශ්‍ය වන්නේද එවැනි මාතෘ භූමිකාය.

## මාතෘ භූමිකාවේ නූතන ස්වරූපය

නූතන මවගේ භූමිකාව සම්ප්‍රදායෙන් දුරස් වූවකි. ඇයගේ අභියෝග, අරමුණු නවයාකාරය. නූතන මව ගීතවලට වස්තු විෂය කරගෙනතිබෙන්නේ අල්පවය. "අම්මේ" යන තේමාවෙන් රචිත රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ගීතය අද්‍යතන මවගේ යථාර්ථයේ ප්‍රතිනිර්මාණයකි.

පලවැල පිරී- එළවළු පැසේ
පිටිකිරි එරී වැල් කූඩයේ
වැඩ ඇරී එයි ගොම්මන් වෙලේ
අම්මා පුරා හඳ සේ (විජේසිංහ, 2021)

න්‍යෂ්ටික පවුලක මව හා දරුවා අතර සබඳතාවය මූලික වේ (අමරසේකර, 1984, උද්ධෘතයඃ කරුණාතිලකඃ55). එහෙත්, කාර්මික සමාජයේ මව්වරුන්ට බහුවිධ භූමිකා නියෝජනය කළ යුතුව ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය අභිභවනය කළ ලිබරල් සමාජයේ මාතෘත්වයද වාණිජ්‍යය යථාර්ථය සමග සට්ටනය විය යුතු තත්වයට පත් කර තිබේ. දරුවන්ගේ ආශ්‍රයේ රැඳෙමින් උණුහුම, රැකවරණය ලබා දීම හෝ පරිසරය පිළිබඳ උගන්වන්නට මවට අවකාශය හිමි කර දී නැත. දරුවන්ගේ පෝෂණය සරි කරන පවිත්‍ර චේතනාවෙන් ඇය මිල දී ගත් පලතුරු සහ එළවළු කූඩයක් නිවසට ගෙන එන්නී ය. පියයුරු පුරා කිරි නො මැත. සංවර්ධනයේ දුෂ්පෝෂණය එයයි. ඇයට දරුවන්ගේ පෝෂණයට කිරි වර්ග වෙළඳපළෙන් මිල දී ගැනීමට සිදු වී තිබේ. " පිටිකිරි එරී වැල් කූඩයේ" යන්න නූතන සමාජය කෙරෙහි සියුම් උපහාසයක් හෙළයි. වැල් කූඩය රික්ත බහුල ධනේශ්වරයේ සංකේතයයි. එරුණු මව් කිරි පෝෂණ ගුණයෙන් හීනයඃ ද්‍රාව්‍ය බවින් යුක්තය. එහෙයින් ආර්ථික දිළිඳු බවෙහි සිදුරු අතරින් කූඩයේ නොරැඳී ගලා යයි. මානුෂීය හර පද්ධති ධනේශ්වරය අභියස පරිභෝජනය නොකර විනාශ

වන ආකාරය එයින් විශද වෙයි. නූතන ජීවන අර්බුදය මවගෙන් ලෝකයට සිදු විය යුතු කුටුම්භ සංරක්ෂණයට මානුෂික නොවෙයි.

වාණිජ ආර්ථිකය විසින් සියල්ල හික්මවන සමාජ පසුබිම මව-පියා භූමිකා නොව සේවකයා, ශ්‍රමිකයා ඇගයීමට ලක් කරයි. එයින් සිදු වන්නේ, කුටුම්භ සංරක්ෂණය ද්විතියික අපේක්ෂාවක් වීම යි. දෛනික පැවැත්ම උදෙසා අවශ්‍ය මූල්‍යමය ශක්තිය නොමැතිව දරුවාගේ අවශ්‍යතා සපුරා ගත නොහැකි ය. දිවා කාලය පූර්ණ වශයෙන් වෘත්තියට කැප කරන්නේ එහෙයිනි. "වැඩ ඇරී එයි ගොම්මන් වෙලේ" සාම්ප්‍රදායික පියාගේ භූමිකාව මව වෙතද ආරෝපණය වී ඇති විපරිවර්තිත සමාජ ශෛලියෙහි නිරූපණයකි. ලිබරල් ආර්ථිකය විසින් මෙහෙය වන ආරූඪ ජීවිතය වාස්තවික අභිවර්ධනය ඉලක්ක කරගත්තකි. මවට එහි ගොදුරක් වීමට සිදු වී තිබේ. විඩාව, දවසේ කාන්සිය සමඟ නිවසට පැමිණෙන ඇය නිවසට සඳක් වෙයි. රචකයා සමාජය දෙස හෙළන උපහාසාත්මක දෘෂ්ටිය බිඳ දැමිය නො හැකි මාතෘත්වය උත්තීර්ණ ආස්ථානයක තබයි.

විසඳුම් පිඹී රිය වියරු වී
පුර වංකගිරි මහ මාවතේ
මරු වැලින් පැන සංසාරයේ
අසපුවට එන අම්මේ (විජේසිංහ, 2021)

ඝනීභූත සමාජ සංස්ථිතිය භෞතික සංවර්ධනය මුඛ්‍ය ව ක්‍රියා කරන්නකි. අධිවේගී ජීවන ශෛලිය දුෂ්කරය. මව ඊනියා සංවර්ධනයෙහි මුළා වූ සමාජයේ විඩාපත් වී පැමිණෙයි. ගොරතර ධනේශ්වරයේ බාධක ඉවත් කිරීමට ඇයට නොහැකිය. ඇය ඒ මතින් පැන නිවසට පැමිණෙයි. රචකයා මව නිවසට පැමිණීම දක්වන්නේ අසපුවට පැමිණීමක් ලෙසය. අසපුව භාවනා යෝගීන් හෝ ධ්‍යාන වඩන්නන්ගේ නවාතැන හඳුන්වන නාමයකි. මිල මුදල්, කුරිරු බව, අයුක්තිය ආදියෙන් නැගෙන සෝෂාව

නගරය පුරා පිරී තිබේ. උපයාගත් වේතනය සහ මිල දී ගත් අවශ්‍යතා මවගේ ජීවිතයෙහි සතුට නිර්මාණය කරන්නේ නිවසේදීය. නූතන මවගේ නිවුණු, දැමුණු බව ඇයට කෘෘර සමාජයේ නිරූපණය කළ නොහැකිය.

යයි දිවාකර අමනාප වී
කළුවරට භාරයි ජීවිතේ
හා පැටව් නො තියා හාමතේ
උණුසුම් කරන අම්මේ (විජේසිංහ, 2021)

ශක්තිය උපරිමයෙන් කැප කිරීමට මවට සිදු වෙයි. දිවාකර අමනාප වීමත්, කළුවරට ජීවිතය භාර කිරීමත් යථාර්ථ ලෝකයෙහි මව් දරු සබඳතාවට ලක් වී ඇති ඉරණම පවසයි. දහවල් කාලය සේවයට කැප වී නිවසට පැමිණෙන මවට දරුවන් සමග සතුටු වීමට කායික සුවතාවක් නොවෙයි. උදෑසන නිවසින් පිටත් වී, රාත්‍රියේ නිවසට පැමිණ නින්දට යන ජීවිතයේ තම දරුවන්ට සමීප වීමට කාලය අහිමි කරයි. සමාජානුයෝජනය, ආදරය දරුවා වෙනුවෙන් මවක විසින් සැපයිය යුතු වුවද, එකී කෘත්‍යය නූතන ප්‍රවාහයෙහි අර්බුදයට ලක් වී ඇත. යාන්ත්‍රික මිනිසුන් සමග ගනුදෙනු කරන දහවල රාත්‍රිය තෙහෙට්ටුවට කැප කිරීමට සිදු වීම මනුෂ්‍යත්වයේ වින්දනය දුරස් කරන්නකි. නූතන මව දරුවන් උණුසුම් කරන්නේ නිදන විට තුරුළෙහි තබා ගැනීමෙනි. දරුවන්ට ආදරය දක්වන්නේ විසිතුරු දේ සහ රසවත් ආහාර මිල දී ගෙනය. දරුවන් හා දෙමාපියන් අතර යහපත් චිත්තවේගී බැඳීමක් ස්ථාපනයට මින් අවස්ථාව සීමා වෙයි. දරුවාගේ පෞරුෂ සංවර්ධනයට මෙය බලපෑම් කරන බව දක්වන කරුණාතිලක,

පිබිදෙන කුසුමකට හිරු එළිය මෙන් කුඩා දරුවාට සෙනෙහස අවශ්‍ය ම දෙයකි. ... පරිණත පුද්ගලයෙකු වූ විට කරුණාව දයාව යන මානව ගුණාංගයන්ගෙන් හෙබි පුද්ගලයන් වන්නේ කුඩා අවධියේ දී

මෙකී අවශ්‍යතාව නිසි ලෙස සම්පූර්ණ කළ දරුවන් බව සමාජ විද්‍යාඥයින්ගේ අදහස යි (කරුණාතිලක. 2011).

පවුල, දරුවන්, දරු සෙනෙහස, සම්ප්‍රදාය, වගකීම, ස්ත්‍රීත්වය, ජීවන අර්බුද වැනි ප්‍රශ්න ගැටලු රාශියක් නූතන මවගේ වගකීම් අතරට එක් වී තිබේ. ඇය සියල්ලටමනො  පසුබට වී පිළිතුරු සෙවිය යුතුය. ඇයගේ තත්වයට හෝ කාර්යයට විකල්පයක් නො වන බව යාන්ත්‍රික සමාජයේ අවධානයට ලක් නොවීම මාතෘ භූමිකාව ව්‍යාකූල කරවන්නට හේතුවකි. මවකගේ ආදරය, සෙනෙහස සහ පොදු සමාජයේ සංවාදයට ලක් වන සාම්ප්‍රදායික තේමා පමණක් පූර්ව ගීතවලට වස්තු විෂය වී තිබිණි. මෙම ගීතය කාල්පනික තත්වය අභිභවා ගිය යථාර්ථයට සමමිතික වන නිර්මාණයකි. රචකයාගේ සමාජ නිරීක්ෂණයේ සූක්ෂමතාව ප්‍රදර්ශනය කරන මෙබඳු අවස්ථා මාතෘත්වය ආශ්‍රිතව තවද තිබේ.

දුස් ස්වප්න දෑස රිදවා
කඳුළින් ම යාවි සේදී
එන රෝග ව්‍යාධි පළවා
දරු රකිමි ධෛර්‍ය්‍ය පේවී (විජේසිංහ, 1990)

ස්වාමියා නිවසින් නික්ම යන්නේ දිනකට හෝ දෙදිනකට පමණක් නොවේ. මාස ගණනක් දුර බැහැර රැකියාවට යාමකි. ඇය දරුවන් සමඟ නිවසේ තනිව වාසය කළ යුතුය. රාත්‍රියේ නිවසින් බැහැරට ගොස් ඖෂධ හෝ ලබා ගැනීමට නොහැකි සංස්කෘතික සීමා මධ්‍යයේ ඇය ප්‍රබල අභියෝග රැසකට මුහුණ දීමට සූදානම් විය යුතුය. "දුස් ස්වප්න" යනු නරක හෙවත් අසුබ සිහින යන්නයි. ස්වාමියා නිවසින් නික්ම ගිය පසු ඇය ජීවත් වන්නේ චකිතයෙනි. ස්වාමියාගේ ආරක්ෂාව මෙන්ම දරුවන්ගේ රැකවරණය පිළිබඳවද ඇය පසු වන්නේ බියෙනි. මන්ද්‍රි දේවිය දරුවන් දන් දීමට පෙර දින රාත්‍රියේ දුටු සිහිනය සිහිපත්

කරවන රචකයා නූතන සිහිනයේ සංකීර්ණතාව පාරමිතා පූරණය කළ බෝසතුන්ගේ බිරිඳගේ සිහිනයට වඩා හාත්පසින් වෙනස් වූවක් බව පහදයි. නපුරු සිහින දුටුව ද ඇය ව සනසන්නට ස්වාමියා ළඟ නොමැත. ඇය ස්ව ශක්තියෙන් කටුක ජීවනයට මුහුණ දිය යුතුය. එය පෞරුෂය ලෙස විග්‍රහ කළද දරුවන්ගේ ලෝකයේ එය ඌනතාවකි.

පුංචි පැටව් ගම් දොර තනියේ- ඉඳ
පාර බලාගෙන රෑ වෙන්නේ
අප්පා නැති මේ ගේ දොර පාලුයි
මොන රන් කඳ දෝ වැවෙන්නේ (විජේසිංහ, 2014)

ස්ත්‍රියක දරුවන් සමඟ තනිව ජීවන අරගලයට මුහුණ දීම අතිදුෂ්කරය. රැකියාවේ සුව පහසුව නොව කුසගින්නේ ප්‍රමාණය මත රැකියාව තීරණය කර ගැනීමට පියාට සිදු වී තිබේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හෝ වෘත්තිය තත්ව සමාජ සම්මත වැනි සංස්කෘතික සීමා අනායාසයෙන් බණ්ඩනය වූයේ මෙවන් ජීවන අර්බුද හේතුවෙනි. ස්වාමියා මිය යාම හෝ හැර යාම ස්ත්‍රියකට උරුම කරන කටුක ජීවනයේ අභියෝගාත්මක බව තීව්‍ර වන්නේ මවකටය. ගීත රචකයා විටින් විට මෙම ගීතය පිළිබඳ සිදු කර ඇති විග්‍රහ සහ ජීවන ප්‍රවෘත්ති අනුව ඔහුගේ පුළුල් ජීවිත පරිඥානයේ අංශුවක් නූතන සමාජයේ සාදෘශ්‍ය ස්වරූපය ගීතයේ අන්තර්ගත කිරීමට පිටුබලයක් වී තිබේ. ස්වකීය සමාජ අනුභූති විශ්වීය පරිචයෙන් ප්‍රතිනිර්මාණය කළ රත්න ශ්‍රී ගීත රචකයා ද සමාජයේ ගැටෙන සජීවී මිනිසෙකු බව යථාර්ථවත් නිර්මාණ ඔස්සේ ප්‍රකට කළ ගේය පද රචකයෙකි.

**මාතෘ භූමිකාවේ විපරිවර්තන කෙරෙහි බලපෑ තත්ත්ව**

සමාජයේ සෑම වෙනස්වීමක්ම පූර්වයෙන් සන්නිවේදනය වන්නේ එහි ක්ෂුද්‍රම සහ කේන්ද්‍රීයම ආයතනය වන පවුලටයි. ඉන් මාතෘ

භූමිකාවට සිදු කරන බලපෑම විශේෂයෙන් ගණනය නොකළද ප්‍රබලව සංජානනය කරවයි.

නුඹ චන්ද්‍ර මඬල වැන්නේ
සා පැටව් එහි නිදන්නේ
හාමතේ නො ලා දරුවෝ
නවතින්න බිසව් නගරේ (විජේසිංහ, 1990)

ධනේශ්වර සමාජ ප්‍රවාහය මානව අවශ්‍යතා අර්ධ වශයෙන් හෝ ඉටු කර ගත හැකි අවකාශයක් ලබා දෙන්නේ සීමිතවය. දරුවන් මවගේ ඇකයෙහි ලබන උණුසුමට සීමා වී සිටියි. පියා නිවසින් බැහැරව රැකියාවේ නිරත වීම ධනේශ්වරයේ නියෝගයක් හෙයින් ව්‍යර්ථ වුවහොත් ජීවිතය පවත්වා ගැනීමට නොහැකිය. මව සහ දරුවන් අතර පවතින සබඳතාව නිරූපණය කරන්නේ විචිත්‍රවය. "නුඹ චන්ද්‍ර මඬල වැන්නේ සා පැටව් එහි නිදන්නේ" යන්නෙන් බිරිඳගේ කටුක ජීවනය මධ්‍යයේ වුවද දරුවන් සහ මව අතර සුසංයෝගය විශිෂ්ටය. දරුවන් පෝෂණය කිරීම, උණුහුම් කරමින් නිසි මග පෙන්වීම ඇයට භාරය. ස්ත්‍රියගේ වගකීම් සමුදාය සංකීර්ණ වී තිබේ. එය ප්‍රශ්න නොකරම භාර ගැනීමට සමාජය හුරු වී ඇති බව ගීතයෙන් අනාවරිතය. සමාජ ක්‍රමය චින්තන ඌනතා ඇති කරන්නකි.

පිය සෙනෙහස මෙන්ම මව් සෙනෙහසද ලබා දිය නොහැකි ව මව්පියවරු තැවෙති. ආර්ථිකය එයට අභියෝගයකි.

පොඩි පුතා නැගිට රෑ මැදියම
හඬන වෙලාවේ
කිරි මවක වෙලා හීනෙන්
එනු මැනවි දේවියේ (විජේසිංහ, 1990)

දාරක ස්නේහය ලබා දෙන්නට ඇයට දෙවනුව සිතන්නට සිදු විය. පළමුව මුදල් පෙරට පැමිණ අවසන්ය. දරුවා තවම මව්කිරෙන් පෝෂණය ලබන දරුවෙකි. ආර්ථිකය විසින් නිවසේ කිරි සුවඳ පිටුවහල් කර අවසන්ය. "අම්මා එතෙර ගිහින්" ගීතයෙන් ප්‍රකාශ වන්නේද මව විදේශගත වූ පවුලක යථාර්ථයයි. වර්තමාන සමාජයේ ප්‍රබලම අර්බුදයයි.

රෑ හීනෙන් බය වෙලා අඬන
පුංචි මළණුවන්
ගී සිංදු කියා නළවගන්න
අපට බැරි තරම් (විජේසිංහ,2013)

මව්වරු විදේශගත වීම දරුවන් දැඩි අසරණ තත්වයකට පත් කරයි. දරුවන්ට ආහාර, සෙනෙහස, මවගේ රැකවරණය අහිමි වීම පූරණය කිරීමට විකල්පයක් නොමැත. ස්වාමියාටද අත් කරන තත්වය සුබදායක නොවේ. පවුල් සංස්ථාවක බිරිඳ සතු වී ඇති වගකීම් සමුදායම පියා මත යෙදවීමෙන් පවුල් සංස්ථාව ව්‍යාකුල වන අවස්ථා සුලබය. මව්වරු විදේශගත වීමෙන් රට සංවර්ධනයට විදේශ විනිමය ලැබුද, පවුල් ඒකකයේ ගුණාත්මක බව පරිහානියට පත් වීම ගණනය කළ නොහැකිය.

අතට වළලු බර වැඩිව නොවේ
උගස් කටට සින්න කළේ
කරට මාල ගොරහැඬි ද නොවේ
ණයට හිලව්වට ලිහී ගියේ (පෙරේරා, 1995)

ආදරය, සෙනෙහස පමණක් ජීවිතය පවත්වා ගෙන යන්නට ප්‍රමාණවත් නොවෙයි. පාලන රටා මගින් නිර්මාණය කර ඇති ආර්ථික විෂමතාව හේතුවෙන් මූලික අව්‍යශතාද සපුරා ගැනීමට නොහැකිව තැවෙයි. ස්ත්‍රිය විලාසිතා, ආභරණවලට ප්‍රියය. අතට වළලු, කරට මාල ස්ත්‍රියකගේ ආභරණ අතර සුවිශේෂ ය. එහෙත්, මැයට ඒවා අවශේෂ

අවශ්‍යතා ය. මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විසිතුරු විලාසිතා කැප කරයි. ආශාවට නොව අවශ්‍යතාවට ප්‍රමුඛත්වය ලබා දීම උපයෝගීතාව වුවද, පරිභෝජනවාදී ආර්ථික ක්‍රමවේද ඔස්සේ ගොඩ නගන ආටෝප සමාජය වෙලා ගෙන තිබේ. රටින් අඩකට වැඩි ජනතාවක් මූලික අවශ්‍යතා හෝ සපුරා ගැනීමට ක්‍රියා කරන්නේ සමස්ත සමාජයක් විසින් ක්‍රියාවට නගන ලෞකික අවශ්‍යතාවලින් පුද්ගල වටිනාකම තීරණය කරන පසුබිමකය.

අහස පොළොව යට ඉරට හඳට යට
නොලද සතුට නම් උයන් කොනේ
නුඹට උරුම ඇති පුංචි ඉඩක් ඇති
එතැනට යන මග සොයන් දුවේ (පෙරේරා, 1995)

නොලද සතුට නම් උයන් කොනේ යන්න සමාජයේ යථාර්ථය ගීත රචකයාගේ දෘෂ්ටියට ගෝචර වන බව පසක් කරන අපූරු යෙදුමකි. ජීවිතය විඳිනු වෙනුවට විඳවන්නට පරිධියේ මිනිසුනට මූලික අවශ්‍යතාද අරුමයකි. "නොලද සතුට නම් උයන් කොනේ- නුඹට උරුම ඇති පුංචි ඉඩක් ඇති- එතැනට යන මග සොයන් දුවේ" රචිකාව දක්වන්නේ තමන්ට සාධනය කර ගත නොහැකි වූ ජීවනාභිලාෂ තම දරුවන්ට හෝ සාධනය කර දීමට දෙමව්පියන් උත්සුක වන බවයි. අපටත් දවසක ඉර පායාදෝ යන බලාපොරොත්තුවෙන් යුතුව සිටින්නන් ගණනින් විශාලය. ධනවාදී සමාජය අපේක්ෂා කරන පුද්ගල සංවර්ධනය මානව ධර්මතා ද්විතීයික ස්ථානයක ලා සලකයි. ධනය, බලය, ශරීර වර්ණය, අධ්‍යාපනය, වෘත්තීය, සමාජ තත්වය මත තීරණය කරන පුද්ගල සංවර්ධනය විෂම සමාජයෙහි ළඟා කර ගැනීමේ හැකියාව සියල්ලන්ටම හිමි නොවේ. තම දරුවන්ට ජීවිතයේ දියුණුව ලබා දීමට දෙමව්පියන් වශයෙන් නොයෙක් ප්‍රයත්න දරයි. බොහෝ දෙනෙකුට රැකියාව යනු සතුට උත්පාදනය කරන්නක් නො ව ජීවිතය පවත්වා ගන්නට අත්වැලක් පමණි. තරගකාරී

සමාජයක සතුට ළඟා කර ගැනීමට උත්සාහය ප්‍රමාණවත් නො වන අවස්ථා සුලබය. ජීවන තෘප්තිය සපුරා ගන්නන් සාපේක්ෂ ව බලවතුන් වීම 1974 න් පසු ලාංකීය සමාජයේ ගීත රචකයින්ට වස්තු විෂය වී ඇති සමාජ පරිස්ථිතියෙහි දුර්ගම වූවකි.

දබර වෙවී බත ඉදෙනා කුල ගෙයි
කුස ගිනි මැඩ හිත ගිනි ඇවිලේ
ඈ ඉවසාගෙන සිටින තුරා ලොව
මේ තරමින්වත් ලිප මෙලොවේ (විජේසිංහ,2014)

පවුල් සංස්ථාවේ පැවැත්ම විෂයෙහි මෙම තත්ව සිදුකළ වාස්තවික මෙන්ම මානවීය බලපෑම් රාශියකි. ස්ත්‍රිය පීඩනයට පත් කරන සමාජ, සංස්කෘතික සීමාව ගීතය හෝ මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කලාංගයක් ලෙස නිරූපණයට කිසි අවකාශයක් නොවේ. ස්ත්‍රිය පුරුෂාධිපත්‍යය නඩත්තු කරන්නියක වශයෙන් පවත්වා ගැනීම නොකළ යුතුය.

**සමාලෝචනය**

අද්‍යතන සමාජ විපරිවර්තන හමුවේ ද පුද්ගලයා මුහුණ දෙන ජීවිතය විෂම ස්වරූපයක් ගෙන තිබේ. ගීත රචකයින් මව සහ දරුවන් අතර පවතින සබඳතාව සාම්ප්‍රදායික තත්වයේ සිට සුසංවාදී ව විග්‍රහ කිරීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත. මව පිළිබඳ පවතින භාවමය සංවේදීතාව එයට හේතුව වූ බව ගීතවලින් අනාවරිත ය. එහෙත්, නූතන මවගේ අර්බුදකාරී භූමිකාව ඇයගේ කාර්ය කොටස් ඉටු නො වන තත්වයට පත් කර තිබේ. පවුල් සංස්ථාවක මානව බැඳීම් ගොඩනගන ප්‍රධාන ශක්තිය වශයෙන් ඇය මුහුණ දෙන අභියෝග සංවාදයට ලක් කළ යුතු ම ය. යමුනා මාලිනී පෙරේරා ද පුරුෂ මූලිකත්වය සහ සම්ප්‍රදාය අගයමින් ගීත රචනා කළ බව ප්‍රකට වන්නේ ස්ත්‍රී කාරකත්වය ඇය

භාවිත නොකළ අවස්ථා හේතුවෙනි. සුනිල් සරත් පෙරේරාගේ ගීත සාහිත්‍යාත්මකව ඉහළ අගයක් සහිත රූපක භාෂාවකින් යුතු ය. එහෙත්, සාම්ප්‍රදායික මාතෘ භූමිකාව නිරූපණයට වැඩි අවකාශයක් වෙන් කර ඇත. රත්න ශ්‍රී නූතන සමාජ අර්බුද ආශ්‍රිත ව පවුල මුහුණ දී ඇති අභියෝග තථ්‍ය ස්වරූපයෙන් නිරූපණය කර ඇත. සුනිල් සරත් පෙරේරා සහ යමුනා මාලිනී පෙරේරාගේ ගීත මගින් ප්‍රතිනිර්මාණය කළ ආනුභවිකත්වය, රත්න ශ්‍රී විජේසිංහ ගී පද රචනා මගින් අභිභවනය කළ බව අධ්‍යයනයේ දී හෙළි විය. ස්ත්‍රීවාදීන්ට අනුව සමාජයේ ලිබරල් සංකල්ප සමග ගොඩනැගී ඇති ස්ත්‍රී විමුක්තිය සම්ප්‍රදාය අභිභවා පවතින්නක් බව කථිකාමය යථාර්ථයේ ක්‍රියාන්විත ය. එය සාහිත්‍ය ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීමේ කර්තව්‍යය සාහිත්‍ය මගින් වඩාත් ප්‍රශස්ත අයුරින් නිරූපණය කළ යුතු ම ය. මාතෘත්වයේ යථාරර්ථය ප්‍රතිනිර්මාණය කෙරෙහි පිළිවෙළින් රත්න ශ්‍රී, යමුනා, සුනිල් සරත් වශයෙන් පෙළ අනුක්‍රමික ව පෙළගැස්විය හැකි ය. මෙයට සුනිල් සරත් පෙරේරාගේ ප්‍රස්තුත ගීත සංග්‍රහ ලිබරල්වාදී යුගයට අයත් වීමත් රත්න ශ්‍රී සහ යමුනාගේ ගීත පර්යේෂණයට ආසන්න ම 2020 සහ 21 වර්ෂවල කෘති ද ඇතුළත් හෙයින් නව ලිබරල්වාදී සමාජ විපරිනාම වඩාත් සූක්ෂ්ම ව ග්‍රහණය වී ඇති බව නිර්ණය කළ හැකි ය. අද්‍යතන ගී පද රචකයින්ට භාෂාව, සාහිත්‍යය සුභාවිතයෙන් ගීත නිර්මාණය කිරීමට මෙම නිර්මාණවලින් මාර්ගෝපදේශනය ලබා ගත හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍ර

<u>ප්‍රාථමික මූලාශ්‍ර</u>

පෙරේරා, යමුනා මාලිනි (2009). *බැබළීම වාගෙම බැස යාම අයිති සඳටයි.* කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, යමුනා මාලිනි (1995). *මා නෙතු මග හැර.* කොට්ටාව: සාර ප්‍රකාශන

පෙරේරා, යමුනා (2019). *සඳ පහන දැල්වී.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

පෙරේරා, යමුනා මාලිනි (2005). *සුවඳ මට දී.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, සුනිල් සරත් (1995). *මහකන්ද.* කොළඹඃ දයාවංශ ජයකොඩි සහ සමාගම

පෙරේරා, සුනිල් සරත් (2017). *සඳකත්මිණ.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

විජේසිංහ, රත්න ශ්‍රී (2014). *ආලකමන්දා* . නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

විජේසිංහ, රත්න ශ්‍රී (2021). *ගංගා ගීතය* . කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (2018). *මිණි බැඳි දොර* . කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (1994). *සුදු නෙළුම.* (සිව්වන මුද්‍රණය- 2018). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (2019). *සුවඳ මුවරද.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

<u>ද්විතියික මූලාශ්‍ර</u>

අබේසිංහ, මයුරි (2017). *ගීත රචනා කලාවේ විකාශනය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර,ගුණදාස (1996). *සිංහල කාව්‍ය සම්ප්‍රදාය.* බොරලැස්ගමුවඃ විසිදුණු ප්‍රකාශකයෝ.

අමරසේකර, දයා (2009). *සරල සමාජ විද්‍යාව.* කොළඹඃගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර, දයා (2016). *සාහිත්‍යය සමාජ විද්‍යාව.* කොළඹ:ගොඩගේ සහ සහෝදරයෝ.

අමරකීර්ති, ලියනගේ (2017). *නව කවි සලකුණ.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ආරියපාල, එම්.බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනත්තුව.

ආරියරත්න, සුනිල් (1986). *ග්‍රැමෆෝන් ගී යුගය.* (සය වැනි මුද්‍රණය- 2017). කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියරත්න, සුනිල් (2005). *නූතන ගේය කාව්‍ය සංහිතා.* (සය වැනි මුද්‍රණය- 2018). කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියරත්න, සුනිල් (2014). *විරුද සහ විරිඳු.* ගොඩගේ: කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ඊරියගම, තිස්ස (2007). *සංක්ෂිප්ත ආර්ථික විද්‍යාව.*

කරුණාතිලක, ආර්.කේ. (2011). *පෞරුෂ සංවර්ධනය කෙරෙහි පවුලේ බලපෑම:* සමාජ මනෝ 23. විද්‍යාත්මක අධ්‍යයනයක්. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතිලක, සී ද එස්. (1974). *ලංකාවේ සංගීත සම්භවය.* කොළඹ: ලේක්හවුස්.

ගුණතිලක, ලයනල් (2013). *කතා පෙට්ටියේ ගී.* (දෙවන මුද්‍රණය). කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණිස්සර, පාතේගම (2010). *සිංහල ගීතය සහ අපේ සංස්කෘතිය.* කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මහින්ද. *සිංහල ගීතයේ පුරාණෝක්ති භාවිතය.* නුවණ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සිංහල භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ ප්‍රකාශන: 1 වෙළුම.

පීරිස්, රැල්ෆ් ( 2005). *සිංහල සමාජ සංවිධානය.* බොරලැස්ගමුව.

පීටර්, කේ. ඒ.ඩී. (2019). *දෙමාපිය දූ දරු සබඳතා.* බොරැල්ලː විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පෙරේරා, ටෙනිසන් බී.ඒ. (2014). *සමාජ විද්‍යාව සමාජය සහ සංස්කෘතිය.* කඩවත

පෙරේරා, ටෙනිසන් බී. ඒ. (2002). *මානව විද්‍යාව හා සමාජ විද්‍යා ප්‍රවේශය*-කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

බැද්දගේ, රෝහණ (2015). *ගම්මානෙන් උපන් ගීය.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

මනම්පේරි, මනෝරි (2017). *සින්දු විමසුම.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

මල්ලිකාරච්චි, ඩෙස්මන්ඩ් (2010). *මාක්ස්වාදය සහ සාහිත්‍යය විචාරය.* නුගේගොඩː සංහිඳ ප්‍රකාශන.

මස්සිඹුල, මහින්ද (2013). *ඇහි පියන් ඇහැරිලා.* සත්ථව ප්‍රකාශන

මල්ලිකාරච්චි, රේමන්ඩ්. ජේ (2010). *කාල් පොපර්- මාක්ස්වාදයේ ව්‍යාජ විවේචකයෙක්.* නුගේගොඩː සංහිඳ ප්‍රකාශන.

මැකියාවෙලී, නිකොලොයි (1513). *කුමාරයා* (The prince සිංහල පරිවර්තනය-ප්‍රේමචන්ද්‍ර අල්විස්) කොළඹː සූරිය ප්‍රකාශකයෝ.

මුතුතන්ත්‍රි, අචලා. (2019). *සිංහල ගීත සාහිත්‍යයේ විකාශය පිළිබඳ සෞන්දර්යාත්මක විමසුමක්.* කොළඹː ෆාස්ට් ප්‍රින්ටඩ්.

මුණසිංහ, චාමික (2008). *සිංහල ගීතයේ නූතන ප්‍රවණතා.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ

නොක්ස්, රොබට් (1681), *එදා හෙළදිව* (An History Relation of the Island o Ceylon සිංහල පරිවර්තනය- ඩේවිඩ් කරුණාරත්න) කොළඹː ගුණසේන සහ සමාගම

රත්නපාල, එන්. 1990, *අපරාධ විද්‍යාවේ මූලධර්ම*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

රත්නායක, මඩවල එස්. (1996). *ගී සින්දු සාහිත්‍යය.* (දෙවන මුද්‍රණය-2017). කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

විජේතුංග, නවනැලියේ (2011). *අපේ ජනකවි.* කර්තෘ ප්‍රකාශන

විජේසුන්දර, අසේල (2019). *ගීතයකින් ජීවිතය කියවමු.* යක්කලː සන්ථව ප්‍රකාශකයෝ.

විජේසූරිය, සරත් (2009). *කවිකම් මනරම්.* (හතර වන මුද්‍රණය- 2019). බොරැල්ලː විජෙසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

වෙත්තසිංහ, සමුද්‍ර. (2005). *නව කවියේ චන්ද්‍රෝදය.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ

වේරගල, අරුණ (2008). *අත්දැකීම්, ගීතය සහ රත්න ශ්‍රී විජෙසිංහ.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

සරච්චන්ද්‍ර, එදිරිවීර (1998). *සාහිත්‍ය විද්‍යාව.*( තෙවැනි මුද්‍රණය 1998). කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ. වී. (2005). *සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

සේකර, මහගම (2014). *ප්‍රබුද්ධ.* (දහහතරවන මුද්‍රණය). පන්නිපිටියː සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්ගලික) සමාගම.

සේකර, මහගම (2018). *සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ.* (තෙවන මුද්‍රණය). කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත, වැලිවිටියේ (2005). (සංස්). එළුසඳැස් ලකුණ. කොළඹ.

හරාරි, යුවාල් නෝවා (2011), සේපියන්ස්ලා (Sapiens සිංහල පරිවර්තනය- උපාලි රත්නායක) නුගේගොඩː සරසවි ප්‍රකාශකයෝ.

හේරත්, සමන්ත (2016) (සංස්). *මහගම සේකර හදවතේ ගීතය.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Anderson, Michel (1971). Family Security and Family Breakdown. Penguin Book

Doxiadge, Spros (1979). The Child in the World of Tomorrow. Oxford: Pergamon Press.

**<u>අන්තර්ජාල</u>**

එදා මෙදා තුර ගීතයේ මිහිරි මතක- ජ'පුර ගී කලාලය.( 2020-02-27). ලබා ගත්තා 2021. 05. 07. http: // www. fhss.sjp.ac.lk

"ගීත සාහිත්‍යයට නැවත ජීවය" (2019). ලබා ගත්තා 2021. 07. 29. සත්මඬල. http: // www. sathmadala. lk

තිලකරත්න, ප්‍රවීන්. (2020). සිංහල ගීතයේ හා කාව්‍යයේ දේශපාලනය, ලබා ගත්තා 2021 ඔක්තෝම්බර් 19. http: // www. patitha.lk

පෙරේරා, සුනිල් සරත්. (2016). සුනිල් සරත් පෙරේරා ගී පබැඳුම්, ලබා ගත්තා 2021 ඔක්තෝම්බර් 13. http: // www. sunilsarath.blogspot. com

සිරිනාථ, රසික. (2018-03-10). "සුනිල් සරත් පෙරෝ නම් මහා ගීත රචකයා". ලබා ගත්තේ 2021. 08. 07. සිළුමිණ නිවස

Murdock, G.P. (1949). Social Structure New York: The MacMillan Company.

**ශබ්ද කෝෂ**

සෝරත, වැලිවිටියේ. (1952). ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (ප්‍රථම භාගය) කොළඹː මහා බෝධි මුද්‍රණාලය.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1963) (සංස්.) සිංහල විශ්වකෝෂය, 1 වැනි කාණ්ඩය. කොළඹ.

**පුවත්පත්**

ආනන්ද, උඩුහාවර (2013, සැප්තැම්බර් 12). ප්‍රායෝගික ජීවිතයට බුදු දහම 05- මව්පිය දූ දරු සබඳතාව, http://www.budusarana.lk/budusarana/2013/09/12/tmp.asp?ID=vision06

**ශාස්ත්‍රීය සඟරා**

විජේබණ්ඩාර, නිලූකා. (2018) නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම පිළිබඳ විශ්ලේෂණයක් E- Journal of Social Work-. 3(1):38-48 https://nisd.ac.lk

වීරසේකර, ප්‍රියංකා ආර්. ඒ. ඩී. (2018- දෙසැම්බර්). *ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්දාර්ථ රස නිශ්පත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්*, සබරගමු විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, නවවැනි කලාපය 10-16. https://www.sab.ac.lk

හේමචන්ද්‍ර බී. එම්. එම්. එච් සහ යාපා එල්. ජී. ඩී. එස් (2018) *'ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ග්‍රාමීය- නාගරික සබඳතාවන්ගේ බලපෑම දඹුල්ල නගරය සහ එහි තදාසන්න ප්‍රදේශ ඇසුරින්'* සබරගමු විශ්විද්‍යාලයීය ශාස්ත්‍රීය සඟරාව(49-59). https://www.sab.ac.lk

සඳරුවන් කේ.ඩී එම්; විජේවර්ධන බී. වී. එන්.; ප්‍රේමරත්න, එල්.ඩී. එම්. (2017-දෙසැම්බර්). *ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ පුරුයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යයනයක්:* Proceedings of 7th International Symposium" SEUSL (628-634), https://www.sab.ac.lk

**වෙනත්**

කෝපරහේවා, සඳගෝමි (2019). *සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

කෝපරහේවා, සඳගෝමි (2020). *ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍ර දැක්වීමේ විධික්‍රම.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ (2016). *පර්යේෂණ නිබන්ධ අත්පොත.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.